ජනගද හඳුනන

මහජන බැංකුව

# සැමගේ යහපත උදෙසා

මහජන බැංකුව
වාර්ෂික වාර්තාව
2013

# අන්තර්ගතය

වැදගත් තොරතුරු ..................................004
සභාපතිතුමාගේ පණිවුඩය ........................007
ප්‍රධාන විධායක නිලධාරි/
සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය .....013
අධ්‍යක්ෂ මණ්ඩලය ..................................021
ආයතනික කළමනාකාරිත්වය .....................027
විධායක කළමනාකාරිත්වය හා
කලාපීය කළමනාකාරිත්වය ....................035
ව්‍යාපාර සමාලෝචනය...............................039
මූල්‍ය සමාලෝචනය..................................063
තිරසාරතාවය පිළිබඳ අතිරේකය................077
2013 සේයාරූ දසුන් පෙළක් .......................108
අනුකූලතා වාර්තාව .................................111
ආයතනික පාලනය ..................................117
අවදානම් කළමනාකරණය..........................127

**මූල්‍ය වාර්තා**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ............... 152
මූල්‍ය වාර්තාකරණය සඳහා
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම................ 155
අභ්‍යන්තර පාලනය පිළිබඳ
අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය............... 156
ස්වාධීන තහවුරු කිරීමේ වාර්තාව .......... 158
තථ්‍ය සොයාගැනීම් හා
ආයතනික පාලනය පිළිබඳ වාර්තාව .... 160
මාණ්ඩලීය විගණන කමිටු වාර්තාව ......... 180
විගණකාධිපතිගේ වාර්තාව ................. 183
ආදායම් ප්‍රකාශය ............................ 185
විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය ........ 186
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය............ 187
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........................ 188
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය ............... 189
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ................. 191

**ඇමුණුම්**

එකතුකළ අගයන් පිළිබඳ ප්‍රකාශනය....... 264
ආදායම් මූලාශ්‍ර හා උපයෝජනය ........... 265
ආදායම් ප්‍රකාශනය ඒ.ජ.ඩො. ............... 266
මූල්‍ය තත්ත්වය පිළිබඳ
ප්‍රකාශනය ඒ.ජ.ඩො........................ 267
ත්‍රෛමාසික මූල්‍ය සුවිශේෂතා................ 268
ශාඛා ජාලය .................................. 269
තෝරාගත් සේවාවන් සහිත ශාඛා .......... 274
ලොවපුරා හවුල්කරුවන් ..................... 279
දශක පිළිබඳ කෙටි විවරණයක් ............ 281
කාර්යසාධන සමාලෝචනය 2004 - 2013 ... 284
මූල්‍ය/බැංකුකරණ යෙදුම්
පාරිභාෂික ශබ්ද මාලාව ................. 286

# සැමට සෞභාග්‍යය උදාකරදීම අපගේ පැවැත්මෙහි අරමුණවේ.

අපි හොඳින් මුල් බැසගෙන සිටින්නෙමු. භාග්‍ය සම්පන්න කාලයෙහි මෙන්ම දුර්භාග්‍යයෙහිදීද අපි තිරසාරව පවතින්නෙමු. බැංකුකරණය පිළිබඳ සියලු දැනුම අප සතුය. අපගේ ව්‍යාපාරය නම් වෘක්ෂයෙහි ඵල සියලු පාර්ශ්වකරුවන්ද පෝෂණය කරයි. සැමට සෞභාග්‍යය උදාකරදීම අපගේ පැවැත්මෙහි අරමුණවේ.

අපි මහජන බැංකුව වන්නෙමු.

# අපගේ දැක්ම

අගය නිර්මාණය කරන්නා වූ, තරගකාරී හා ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරන්නා වූ ස්වභාවයෙන් යුතුවීම පිණිස ජනතාව සවිබල ගන්වමින් ශ්‍රී ලංකාවේ උන්නතිකාමී ජනතාවගේ බැංකුව බවට පත්වීම.

# අපගේ මෙහෙවර

**අපගේ ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන්**

වඩාත්ම මානුෂික, සංවේදී හා වෘත්තීයමය ආකාරයෙන් අති විශිෂ්ට සේවාවක් සැපයීමේ අභිමානය අත්කර ගැනීම

**අපගේ හිමිකරුවන් වෙනුවෙන්**

ස්වාධීනව ක්‍රියාත්මක වෙමින් වාණිජමය වශයෙන් ශක්‍යතාවයෙන් යුතුවන අතරම ජාතික ආර්ථිකය උදෙසා ප්‍රතිලාභ ජනිත කරවීම

**අපගේ සේවකයන් වෙනුවෙන්**

කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කිරීමේ හැකියාව ද සහිත, අප අගය කරන්නා වූ කුසලතාවන්ගෙන් පිරිපුන්, ආත්ම විශ්වාසයෙන් යුතු, වෘත්තීයමය දක්ෂතා දක්වන තැනැත්තන් බවට පත්වීම මගින් ඔවුන්ගේ උසස් කාර්යසාධනයෙන් ප්‍රතිලාභ අත්කරගැනීම පිණිස අපගේ සේවකයන් වෙනුවෙන් අවස්ථා නිර්මාණය කිරීම.

**අපගේ සමාජය වෙනුවෙන්**

දීප ව්‍යාප්ත වශයෙන් අධ්‍යාපනයේ, සංස්කෘතියේ හා පරිසරයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායක වීම තුළින් සමාජය සවිබල ගැන්වීමට හා තිරසාර සංවර්ධනයට සහාය ලබාදීම.

# අපගේ වටිනාකම්

- අපගේ පැවැත්ම සඳහා පාදක හේතුව ජාතියේ ජනතාව වෙනුවෙන් වටිනාකම් ජනිත කරවීම බව අප පිළිගන්නෙමු.
- අපගේ සියළු කාර්යයන්හි දී අපගේ තැන්පතුකරුවන්ගේ සුබසෙත සැලසීම පිණිස අතිශය සැලකිලිමත් ආකාරයෙන් අපි අපගේ වගකීම ඉටු කරන්නෙමු.
- සත්‍ය හා සාධාරණ ගනුදෙනු හරහා අපි අපගේ ගනුදෙනුකාර භවතුන් සමග දිගුකාලීන සදාචාරවත් සබඳතා ප්‍රවර්ධනය කරන්නෙමු.
- නිලධාරිවාදය අවම කිරීම මගින් හා කාර්යක්ෂම කළමනාකාරිත්වය, කඩිනම් තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම අනිවාර්ය අවශ්‍යතා බවට පත්කිරීම මගින් අපි සියළු කාර්යයන්හි දී අපගේ ගනුදෙනුකාර භවතුන්ට මුල්තැන දෙන්නෙමු.
- අපි අපගේ කාර්ය මණ්ඩලය සවිබල ගන්වන අතර ඔවුන්ගෙන් වගවීම අපේක්ෂා කරන්නෙමු.
- පුද්ගල අවශ්‍යතා අභිබවා බැංකුවේ යහසාධනයට මුල්තැන දෙමින් විවිධ තරාතිරම්වල සේවකයන් වෙතින් සියළු මට්ටම්වල දී අපි ඉහළම අවංකභාවය අපේක්ෂා කරන්නෙමු.
- සේවකයන්ට සිය කාර්යසාධනය ප්‍රදර්ශනය කරමින් සිය පූර්ණ විභවය සාක්ෂාත් කරගැනීමේ හැකියාව ලබා දෙන්නා වූ අන්‍යොන්‍ය ගෞරවය හා විශ්වාසය රජයන පරිසරයක් අපි නිර්මාණය කරන්නෙමු.
- සෑම සේවකයෙකුගේම කුසලතා, කැපවීම හා ප්‍රඥාව සමග ඇති සබඳතා පිළිගන්නා හා ඒවාට සහාය වන ඉහළ කාර්යසාධනයෙන් යුත් කණ්ඩායම් දිරිගැන්වීම මගින් අපි අපේ ව්‍යාපාරය සංවර්ධනය කරන්නෙමු.
- සියලුම නීති හා නියමයන්ට මෙන්ම ඒවායේ හරයන්ටද අනුකූල වීමටත් ආයතනික පාලනය, විනිවිදභාවය, හෙළිදරව් කිරීම හා සදාචාර සම්පන්න චර්යාව යන කරුණුවලට අදාළ ඉහළම ප්‍රමිතීන් ස්ථිරසාරව පවත්වා ගැනීමට ද අපි කැපවී සිටින්නෙමු.
- පරිසරය සුරැකීම හා තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරමින් අපි යහපත් පුරවැසියන්ට ඔබින චර්යාවෙන් යුක්ත වන්නෙමු.

# බැංකුව පිළිබඳ තතු

ග්‍රාමීය ඉතුරුම් ඒකරාශීකර එය සංවර්ධන ක්‍රියාවලිය කරා යොමු කිරීම පිණිස 1961 දී මහජන බැංකුව පිහිටුවන ලදී. එයට පෙර මූල්‍ය සේවා කර්මාන්තයෙන් බැහැර කරනු ලැබ සිටි ජන කණ්ඩායම්වලට බැංකු සේවාවන් සැපයීම සඳහා එය ස්ථාපනය කරනු ලැබිණි. මෙලෙස වසර පනහකට වැඩි ප්‍රමාණයක් මුළුල්ලේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සංවර්ධනය උත්ප්‍රේරණය කිරීමට හා පරිවර්තනයට භාජනය වෙමින් පවතින ආර්ථිකයට සහාය වීමට අප මූල්‍ය නිපැයුම් භාවිතාකර ඇත.

බැංකුව ව්‍යාපාර කටයුතු ආරම්භ කළේ ඉතාමත් වෙනස් ආර්ථික පරිසරයක් තුළදීය. ඒ වන විට රටට නිදහස ලැබී වසර 13 ක් පමණක් ගතවී තිබූ අතර මූල්‍ය සේවා කර්මාන්තයෙහි බොහෝ කොටස් සංවර්ධනයෙහි මුල් අදියරක පැවතිණි. රාජ්‍යය විසින් මූලිකත්වය ගත් ආර්ථික වර්ධනය අවධාරණය කිරීමක් පැවති අතර රජය සතු ව්‍යාපාර ආර්ථිකයෙහි ගාමක බලය ලෙස දක්නා ලදී.

අද අප ක්‍රියාත්මක වන්නේ අතිශයින් ම වෙනස් පරිසරයක් තුළවේ. රටේ ඒක පුද්ගල ද.දේ.නි. එ.ජ.ඩො. 2,500 සීමාව ඉක්මවා ගොස් ඇති අතර සංවර්ධනය පෙරට ගෙන යාම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකම එක්ව කටයුතු කරයි. ‘ෂඩ් කේන්ද්‍රීය උපාය මාර්ගය’ සංවර්ධනය කිරීම සඳහාවන රජයේ පරමාර්ථය ලෝකයේ නැගී එන ආර්ථිකයන් මට්ටමට එක් වීමට රටට හැකියාව ලබාදෙමින් 2016 වනවිට එ.ජ.ඩො. 4,000 ක ඒක පුද්ගල ද.දේ.නි. ශාක්ෂාත් කරගැනීම සමඟ මනාව පෙළ ගැසී ඇත.

රටේ වර්තමාන වර්ධන වේගය තිරසාරව පවත්වා ගැනීමට නම් එයට අති නවීන මූල්‍ය සේවා කර්මාන්තයක් තීරණාත්මකවේ. මේ මොහොතේ අවශ්‍ය වන්නේ නවීකරණය, නව වෙළෙඳපොළ අංශ සමඟ සක්‍රීය මූල්‍ය සේවාවන්හි නිරතවීම හා අවබෝධයෙන් යුතුව අවදානම් බාර ගැනීමයි. මෙම නව භූමිකාව තුළ සිය කාර්යභාරය ඉටු කිරීමට මහජන බැංකුව අද සූදානමින් සිටී. හොඳින් අභිප්‍රේරණයවූ සේවක සමූහයක්, ශක්තිමත් අවදානම් කළමනාකරණ උපායමාර්ගයක්, මිලියන 15 ඉක්මවූ ගනුදෙනුකාර භවතුන්ගෙන් සැදි පදනමක්, ශාඛා 735 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 460 ක් හා රුපියල් බිලියන 931 ක වත්කම් පදනමක් එය සතුව ඇත. අපි නිරන්තරයෙන්ම අපගේ සේවා කළඹ ශක්තිමත් කිරීමෙ හි හා ගනුදෙනුකාර සේවා වැඩි දියුණු කිරීමේ යෙදී සිටින්නෙමු. 2013 වසරේ අපගේ බදුවලට පෙර ලාභය රුපියල් බිලියන 10.3 ක්වූ අතර බදුවලට පසු ලාභය රුපියල් බිලියන 7.5 ක් විය.

# වැදගත් තොරතුරු

## වැදගත් මෙහෙයුම් තොරතුරු

# බැංකු සේවයෙහි වසර 50කට අධික කාලයක්

සමස්ත ශාඛා ජාලය
**ශ්‍රී ලංකාවේ ඉහළම සංඛ්‍යාව**
වන 735 තෙක්
පුළුල් කරනු ලැබීම

**බැංකුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 460 දක්වා ව්‍යාප්ත කළ අතර,**
ජාතික පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරු ව්‍යාපෘතියට සම්බන්ධවූ පළමු ජාලය එය විය.

**මිලියන 15 ඉක්මවූ ගනුදෙනුකාරභවතුන්ගේ ගිණුම්**

විදේශ රැකියා නියුක්ති කාර්යාංශය
සමග හවුල්කාරිත්වයෙන්
**'විගමනික භර කාඩ්පත'**
හඳුන්වාදීම

**බැංකුවේ ෆිච් තත්ත්වාගණනය AA+ ලෙස යළි තහවුරු කරන ලදී**

අයබදු, ලාභාංශ හා විවිධ බදු ආකාරයෙන් ශ්‍රී ලංකා රජය වෙත

**රු. බිලියන 10 ක්**

ගෙවන ලදී.

බැංකුව

**රු. බිලියන 7.5 ක**

බදුවලට පසු ලාභයක් වාර්තා කළේය.

## වැදගත් මූල්‍ය තොරතුරු

| | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | වෙනස | 2013 | 2012 | වෙනස |
| | රු. මිලියන | රු. මිලියන | % | රු. මිලියන | රු. මිලියන | % |
| **වර්ෂය සඳහා ප්‍රතිඵල** | | | | | | |
| දළ ආදායම | 120,456 | 94,777 | 27.1 | 139,957 | 109,974 | 27.3 |
| මුළු මෙහෙයුම් ආදායම | 46,530 | 43,310 | 7.4 | 55,576 | 49,618 | 12.0 |
| බදුවලට පෙර ලාභය | 10,304 | 15,249 | (32.4) | 13,412 | 17,671 | (24.1) |
| බදු සඳහා වෙන් කිරීම | 2,816 | 4,355 | (35.3) | 4,248 | 5,775 | (26.4) |
| බදුවලට පසු ලාභය | 7,488 | 10,894 | (31.3) | 9,164 | 11,897 | (23.0) |
| **වර්ෂය අවසානයේදී** | | | | | | |
| දළ ණය හා ලැබිය යුතු මුදල් | 681,467 | 660,624 | 3.2 | 773,251 | 740,675 | 4.4 |
| තැන්පතු | 762,249 | 683,951 | 11.4 | 789,225 | 708,897 | 11.3 |
| මුළු වත්කම් | 930,585 | 873,296 | 6.6 | 1,031,473 | 960,860 | 7.3 |
| මුළු ස්කන්ධ ප්‍රමාණය | 36,537 | 29,205 | 25.1 | 55,088 | 45,749 | 20.4 |
| **ප්‍රධාන කාර්යසාධන දර්ශක** | | | | | | |
| වත්කම් මත ප්‍රතිලාභ (%) - බදුවලට පෙර | 1.1 | 2.0 | | 1.3 | 2.1 | |
| - බදුවලට පසු | 0.8 | 1.4 | | 0.9 | 1.4 | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (%) | 22.8 | 41.7 | | 18.2 | 28.2 | |
| ආදායම්/පිරිවැය අනුපාතය (%) | 48.4 | 55.8 | | 49.1 | 55.0 | |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | | | | |
| **ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය (%)** | | | | | | |
| පළවන ස්තරය - ප්‍රාග්ධන අනුපාතය - අවම අවශ්‍යතාවය 5% | 10.4 | 9.8 | | 12.5 | 12.0 | |
| මුළු ප්‍රාග්ධන අනුපාතය - අවම අවශ්‍යතාවය 10% | 15.0 | 14.0 | | 15.9 | 15.7 | |
| **ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය - (%)** | | | | | | |
| දේශීය බැංකුකරණ ඒකකය - අවම අවශ්‍යතාවය - 20% | 25.2 | 21.8 | | | | |
| අක්වෙරළ බැංකුකරණ ඒකකය - අවම අවශ්‍යතාවය - 20% | 22.3 | 21.8 | | | | |

# සභාපතිතුමාගේ පණිවුඩය

**මහජන බැංකුව සිය ආරම්භයෙහි සිට සියළු ජීවන මට්ටම්වලට අයත් ශ්‍රී ලාංකිකයන් මිලියන ගණනකට සේවා සපයා ඇත.**

රාජ්‍ය බැංකුවක් වන හෙයින්
රටේ දැක්මට අනුකූලව
අපගේ පාර්ශ්වකරුවන්
සංවර්ධනය කිරීමේ වගකීම
අප වෙත පැවරී ඇති අතර
මෙතෙක් ඒ සඳහාවූ අරමුණු
ඉටුකර ගැනීමට හා
සාක්ෂාත්කර ගැනීමට
අප සමත්වී ඇත.





බැංකුව සිය දිවියෙහි පනස් තුන්වැනි වසර ගෙවමින් සිටින අතරතුර මගේ ධුරය දෙවැනි වසරටත් දරමින් අපගේ වැදගත් පාර්ශ්වකරුවන්වන ඔබ ඇමතීමට හැකිවීම මට ඉමහත් ප්‍රීතියක් ගෙන දෙයි.

'සැමට ප්‍රතිලාභ පිණිස' යන්න අපගේ සියළු පාර්ශ්වකරුවන් සවිබල ගන්වන පරිසරයක් නිර්මාණය කරමින් අනාගතයේදී අප තවදුරටත් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරන චින්තන දහර වේ.

## ආර්ථික සුසමාදර්ශයන්

ලෝක ආර්ථිකයෙහි කාර්යසාධනයෙහි හදිසි වෙනස්වීමක් කවර මොහොතක හෝ සිදුවෙතැයි අපේක්ෂා කළ නමුදු මේ වසරේදී එය දුර්වල මට්ටමක පැවතිණි. ආර්ථික වර්ධනය අඛණ්ඩව අධීක්ෂණය කරන ලද නමුත් එහි කිසිදු දියුණුවක් දක්නට නොවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වඩාත්ම දියුණු ආර්ථිකයන් ශක්තිමත් නොවෙද්දී සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශ පවා මන්දගාමී ව්‍යාප්තියක් පෙන්වූ තත්ත්වයක් තුළ වසර තුළදී දෙවරක් පුරෝකථනයන් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2013 වෙනුවෙන් 2.9% වර්ධනයක් පමණක් අපේක්ෂා කරන අතර එය මුලින් පුරෝකථනය කරන ලද 3.1% ට වඩා අඩු වන්නාක් මෙන්ම 2009 සිට වඩාත්ම මන්දගාමී වර්ධනයද වේ. කෙසේ වෙතත් සුබවාදී දැක්මක් රඳවා ගනිමින් ජා.මූ.අ., 2014 වර්ෂය 3.6%ක වර්ධනීය ප්‍රවණතාවක් දක්වනු ඇතැයි විශ්වාසය පළ කරයි.

## ශ්‍රී ලාංකික ආර්ථිකය පිළිබඳ අනාගත දැක්ම

ශ්‍රී ලංකාව බාහිර ආර්ථික පසුබෑම් මගින් ඇති කෙරෙන නිෂේධාත්මක බලපෑම්වලට ප්‍රත්‍යස්ථතාව ප්‍රදර්ශනයකර ඇත. පසුව දැක්වෙන මූල්‍ය සමාලෝචන පරිච්ඡේදයෙහි ශ්‍රී ලංකාව ඔප්පුකර ඇති ප්‍රත්‍යස්ථතාව පිළිබඳ වැඩිදුර විස්තර සාකච්ඡා කෙරේ.

කලාපයේ බොහොමයක් රටවලට ඉදිරියෙන් සිටිමින් සාමාන්‍ය ගෝලීය වර්ධනයට වඩා සැලකිය යුතු ඉහළ අගයක් දක්වමින් රට විශිෂ්ට ප්‍රගතියක් අත්කර ගැනීම මේ වර්ෂයේදීද වෙනස් නොවිණි. ද.දේ.නි. හි 7.2% ක වර්ධනයක් වාර්තා කරමින් මතුපිට උද්ධමනය ඇතුළු රටේ මූලික දර්ශක තනි ඉලක්කමක පැවති අතර මාස 59 ක් අඛණ්ඩව පැවති 4.7% වාර්තාගත අගයක් විය. මූලික උද්ධමනය දෙසැම්බර් මසදී එහි පහළම මට්ටමවූ 2.1% පැවතිණි. ආයෝජන මට්ටම ද.දේ. නිෂ්පාදිතයෙන් 30% ඉහළ මට්ටමක පවත්නාගනු ලැබූ අතර විරැකියාව දිරිගන්වන සුළු පහළ මට්ටමක්වූ 4.5% තවදුරටත් රැඳී පැවතිණි.

ජාතියේ දියුණුව හා සංවර්ධනය කෙරෙහි දායක වීමෙන් අපගේ විදේශගත ශ්‍රී ලාංකිකයන් සපයන මහඟු සේවාව සැලකූ කල බැංකුවේ අවධානය තවදුරටත් විශාල වශයෙන් කේන්ද්‍රගත වන එක් විශාලතම ගනුදෙනුකාර පදනමක් වන්නේ අපගේ විදේශගත ජනතාවයි. 2013 වසරේ අවසානය වන විට මෙම ශ්‍රී ලාංකිකයන් එ.ජ.ඩො. බිලියන 6.7 ක අති විශාල මුදලක් ප්‍රේෂණය කරනු ඇතැයි අපේක්ෂා කෙරිණි.

මෙය 2012 දී වාර්තා වූ එ.ජ.ඩො. බිලියන 6 සිට වර්ධනය වීමක් වන අතර මෙම වර්ධනය සඳහා පාදකවූ හේතු ලෙස ගුණාත්මක රැකියා හා වඩා විශාල පාරිශ්‍රමික පැකේජ කෙරෙහි අවධානය යොමුකර එම වෘත්තික හා පුහුණු කාණ්ඩ යටතේ 28% ක වර්ධනයක් දක්වා ඇති, ශ්‍රම සංක්‍රමණය, විධිමත් මාර්ග හරහා මුදල් ප්‍රේෂණය කිරීම පිළිබඳ වැඩිදියුණුවූ දැනුවත්භාවය හා ශ්‍රී ලංකාව තුළට වේගවත් හා කාර්යක්ෂම පැවරීම් සඳහා පහසුකම් සැපයීම පිණිස වෙබ් පාදක මුදල් පැවරීමේ ක්‍රම හඳුන්වාදීම දක්වනු ලැබ ඇත.

විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් 2013 සැප්තැම්බර් වනතුරු ආසන්න වශයෙන් 220,000 දක්වා 5.6% කින් වර්ධනය විය. ප්‍රේෂණ අපගේ ආර්ථිකයෙහි සංකලිත අංගයක් ලෙස සැලකීම සඳහා මෙම කැපී පෙනෙන විදේශ විනිමය ප්‍රමාණය ජාතික සංවර්ධනය සඳහා භාවිතා කිරීමට ස්ථාවර අරමුදල් සංචිතයක් පැවතීම සහතික කරන අතරම ගෝලීය ආර්ථික කම්පනයක් වෙතින් නික්මෙන බලපෑම්වලට ඔරොත්තු දීමට දිගින් දිගටම පිටිවහල්වී ඇත යන කරුණ ඇතුළුව හේතු විශාල සංඛ්‍යාවක් ඇත. 2017 වන විට මෙම ප්‍රේෂණ එ.ජ.ඩො. මිලියන 10 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය

මෙම වාර්තාවෙහි දැක්වෙන මෙහෙයුම් පිළිබඳ ප්‍ර.වි.නි.ගේ සමාලෝචනය හා ගිණුම් ප්‍රකාශනය මෙම වර්ෂයෙහි අප බැංකුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, මෙම වසරෙහි වටිනා ප්‍රතිඵල ලබා දීමේදී බැංකුවේ කණ්ඩායම දක්වන ලද ගතිකත්වය පිළිබඳව ඔවුනට මා ප්‍රශංසා නොකළහොත් එය මාගේ වගකීම පැහැර හැරීමක් වනු ඇත. වර්ෂය අභියෝගවලින් තොර නොවූවක් මෙන්ම එහිදී අවස්ථා උදා නොවූයේද නොවේ. අද අප ලබා ඇති යහපත් ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා ආධාරක ලෙස හඳුනාගෙන උපයෝගී කරගන්නා ලද්දේ මෙම උදාවූ අවස්ථාවන්ය.

බැංකුව බදු වලට පෙර ලාභය ලෙස රු. බිලියන 10.3 ක් වාර්තා කරද්දී සමූහය බදු වලට පෙර ලාභය රු. බිලියන 13.4 දක්වා ඉහළ නංවමින් සමස්ත කාර්යසාධනය සංගතව පැවත ඇති බව දැකීම මා හට ප්‍රීතියකි. ලාභදායිත්වය වර්ධනයකර ගැනීම සඳහා

අපගේ හැකියාව කෙරෙහි බලපෑම් ඇති කරමින් වර්ෂය තුළදී පැන නැගුණු අභියෝග ගණනාවක් හේතුවෙන් පසුගිය වසර හා සැසඳූ කළ අපගේ ලාභ අඩුවීමක් ඔබට පෙනී යනු ඇත. වෙනස්වන සුළු පොලී අනුපාත සහ රන් මිලෙහි දැඩි අවදෝලන සර්පිලය බැංකුවේ කාර්යසාධනය කෙරෙහි දැඩි බලපෑම් ඇති කළ සාධක දෙකක් විය.

කෙසේ වෙතත්, බැංකුව හා සමූහය යන දෙකම පසුගිය වසරට වඩා 27.3% ක වර්ධනයක්වූ රු. බිලියන 140 ක පිරිවැටුමක් වාර්තා කරනු අපි දුටුවෙමු. මහජන බැංකුව හැමවිටම ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය තුළ අතිශයින්ම සක්‍රිය හවුල්කරුවෙකුව සිට ඇත යන කරුණ සැලකිල්ලට ගත් කළ, මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු. බිලියන 4.5 ක්වූ බදු රටේ සංවර්ධනය සඳහා අවශ්‍යවන අරමුදල් තර කරනු ඇතැයි යන්න සම්බන්ධයෙන් අපි අතිශයින්ම සතුටු වන්නෙමු.

## සෑමට ප්‍රතිලාභ සැලසීම

සෑමට ප්‍රතිලාභ සැලසීම මහජන බැංකුව ආරම්භ කිරීමේ පදනම මෙන් ම මහජන බැංකුව යන අපගේ නාමයෙහි සාරාර්ථය වෙයි. සෑම පාර්ශ්වකාර කණ්ඩායමකටම නොමසුරුව සේවා සපයන අතරම අප සැමවිටම නැගී එන පරම්පරාවන්හි අවශ්‍යතා පිළිබඳව සවිඥානකව සිටීමේ දර්ශනය අනුව ක්‍රියාකර ඇත්තෙමු. අප සමග සබඳතා ගොඩනගාගන්නා අනාගත පරම්පරාවන්ට ගාමක බලය එක්කරන්නාවූ පහසුකම් ස්ථාපනය කිරීමට මෙම චින්තනය අපව පොළඹවා ඇත. විවිධාකාරවූ හා අද දිනයේ අභියෝගවලට වෙනස් වූ අභියෝගවලට අනාගත පරම්පරාව මුහුණ දෙනු ඇති බවද අප දන්නා අතර එම අභියෝගවලට මුහුණදී ඒවා ජය ගැනීමට ඔවුනට සහායවන පද්ධති, ක්‍රියාවලි හා රාමු ස්ථාපනය කිරීමට මෙම අවබෝධය අපව යොමු කර ඇත.

ශිෂ්‍යත්ව, ප්‍රදාන හා මූල්‍ය සහාය මගින් බැංකුව යොවුන් ජනතාවගේ අධ්‍යාපනික හා විෂය බාහිර කුසලතාවන්ට සහායවී ඇති අධ්‍යාපනික සවිබල ගැන්වීම මෙයට අයත්ය. අධ්‍යාපනය වෙනුවෙන් සැපයෙන මෙම සහාය සමග ඔවුන්ගේ පෞද්ගලික අභිලාෂයන් ඉක්මවා යාමට සම්ප්‍රදායික සීමාවන් බිඳ දමා පෙරට යාම සඳහා බැංකුව ඔවුනට හැකියාව ලබාදී ඇත. මහජන බැංකුවේ ශිෂ්‍යත්වලාභීන්වන උසස් ජයග්‍රහණ ලත් තරුණ තරුණියන් රැසක් ඔවුන්ගේ සම වයස් කණ්ඩායම් අතර බැබලෙමින් ලෝකයේ සමාජ වගකීම් දරණ යොවුන් පුරවැසියන් බවට පත්වීමට අඛණ්ඩව පෙරට ගමන් කර තිබීම සම්බන්ධයෙන් අපි ආඩම්බර වන්නෙමු.

ජාතික ආර්ථිකය ගොඩනැගීමේදී හා තිරසාර කිරීමේදී අප ඉටු කරන කාර්යභාරය පිළිබඳවද අපි අතිශයින්ම සවිඥානකව සිටිමු. නියම කරගෙන ඇති දැක්ම සාක්ෂාත්කර ගැනීමේදී රටට සහායවීමට මෙම දැක්ම කරා යන ගමනට සහායවන අත්‍යවශ්‍ය දේ ක්‍රියාත්මක කරමින් හා රට පුරා හා ලෝකයේ අවශ්‍යයැයි අප විශ්වාස කරන කවර හෝ තැනක අපගේ පැවැත්ම ශක්තිමත් කිරීමේදී ජාතික ආර්ථිකය වෙනුවෙන් තිරසාර පදනමක් ඉදිකිරීමේ කාර්යයෙහි අපි අනවරතව නිරතව සිටින්නෙමු. මාර්ග, වාරිමාර්ග, වරාය හා බලශක්ති සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව යටිතල පහසුකම් සංවර්ධනයේදී රාජ්‍යයෙහි හවුල්කරුවෙකුවීම මගින් රට ආසියාවේ ආශ්චර්යය බවට පත්වීම කරා මෙහෙයවීමෙහි අපි පෙරමුණෙහි වන්නෙමු.

එයට අමතරව, යටිතල පහසුකම් සංවර්ධනය හරහා පමණක් නොව තිරසාර ක්ෂුද්‍ර හා කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත හඳුනාගැනීමෙන්, ගොඩනැගීමෙන් හා ශක්තිමත් කිරීමෙන් ගාමක බලය එක් කරමින් රටේ උතුර හා නැගෙනහිර සංවර්ධනය කිරීමේදී අපි වෙහෙස නොබලා ක්‍රියාකර ඇත්තෙමු. ආරම්භයේ සිටම මෙය මහජන බැංකුවට ආවේනික ලක්ෂණයක්වී ඇති අතර, ඉතාමත් ඉහළ සමාජ ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමට රට ස්ථානගතවී සිටිනා තත්ත්වයක් තුළ මෙම කාර්යය වඩාත් වේගවත්ව සිදු කෙරේ. මහජනයා වෙනුවෙන් වන බැංකුව ලෙස, මෙම ඉලක්ක සාක්ෂාත්කර ගැනෙන බවට සහතික වීමේ සුවිසල් වගකීම අප වෙත පැවරී ඇත.

2016 වන විට දකුණු ආසියාවේ ආර්ථික කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ අරමුණ හේතුවෙන් ෂඩ් කේන්ද්‍රීය සංකල්පය වඩ වඩාත් ක්‍රියාත්මකවීම පමණක් නොව සහායක හා අනුයාත කර්මාන්ත ගාමක බලය අත්කර ගැනීමද සිදුවී තිබේ. වඩාත් විශාල සහායක කර්මාන්ත පමණක් නොව මෙම වර්ධන කර්මාන්තවල දියුණුව වේගවත් කිරීම සඳහා සමීකරණයට එක් කෙරෙන විවිධ ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත විශාල සංඛ්‍යාවක්ද මෙයට අයත්වේ. මෙම සමාන කිරීමේ ක්‍රියාවලියට අපගේ හැකියාවද එක් කිරීම මගින් රටේ සියළු පෙදෙස්වල ව්‍යවසාය ප්‍රයත්නයන්ට අතහිත දෙමින් අඛණ්ඩ ලෙස ව්‍යවසායකයන් විශාල සංඛ්‍යාවක් මහජන බැංකුව උපදවා ඇත. මෙය, මෙතෙක් තිරසාර බවට පත්වීමට ප්‍රමාණවත් සහායක් නොලද කර්මාන්තවල නව පිබිදීමක් ඇති කිරීමට හේතුවූ අතර බැංකුවේ මැදිහත්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස නව කර්මාන්තද බිහිවී ඇත. විවිධ මට්ටම් කරා ගලා යන ආකාරයේ මෙම බලපෑම හේතුවෙන් සියළුම ප්‍රජාවන්ට ජාතියේ සංවර්ධනයට කැපී පෙනෙන ලෙස දායක වීම සඳහා සම්පත්, හැකියාවන් හා කුසලතා ලබා දෙමින් ඔවුන්ව සවිබල ගැන්වීමට හැකිවීම මහජන බැංකුවට සැබැවින්ම ගෞරවයකි.

කෙසේ වෙතත්, අපගේ ජයග්‍රාහී කණ්ඩායම විසින් ප්‍රදර්ශනය කරන ලද ගතිකත්වය හා නොසැලෙන අභිප්‍රේරණය නොවන්නට අපගේ පාරිභෝගික හවතුන්, ප්‍රජාවන් හා ජාතිය කෙරෙහි වන අපගේ වගකීම් මෙතරම් ජවසම්පන්න ලෙස ඉටු කිරීමට අපට හැකි නොවනු ඇත. 'සෑමට ප්‍රතිලාභ සැලසීම' යන අන්තර්ගත ආකල්පය තවත් විෂයපථයක් කරා සැබැවින්ම රැගෙන යමින් ඔවුහු දිගින් දිගටම බැංකුවේ මෙහෙයුම්වල කොඳුනාරටියව සිටිති. දැනට එහි අවසන් වසරෙහි පවතින අපගේ 2009 - 2014 උපායමාර්ගික සැලැස්මෙහි දක්වා ඇති අපගේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී අතිශයින්ම සාර්ථකවී ඇත. බැංකුවෙහි

කාර්යසාධනයෙහි පමණක් නොව ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කරගැනීමේදී හා සමස්තයක් වශයෙන් ත්‍රිත්ව පදනම් සත්‍යයන්හිද දක්නට ලැබෙන්නේ මෙම සාර්ථකත්වයයි.

තියුණු ලෙස තරගකාරී පරිසරයක ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින අභියෝගවලට ශක්තිමත්ව මුහුණදීම පිණිස මහජන බැංකුවට හැකියාව ලබා දෙමින් අපගේ තාක්ෂණික සිතියමද වඩාත් කාර්යක්ෂම ඵලදායී හා නව නිර්මාණාත්මක බැංකුවක් උපදවා ඇත. අන්තරායකට පත්වීමට කිසිදු ඉඩක් නොතබන තොරතුරු තාක්ෂණ පද්ධති හා ක්‍රියාවලි මගින් ලැබෙන මනා සහායද සමග පාලන හා නියාමන නියෝග මැනවින් ක්‍රියාත්මක කෙරේ. සාම්ප්‍රදායික සීමාවන්ගෙන් ඔබ්බට යමින්, එනමුත් ස්ථාවර හා තිරසාර බැංකුවක් පවත්වා ගැනීම පිළිබඳව දැඩි ලෙස සවිඥානිකව සිටිමින් අපි අනුකූලතාව ඉක්මවන පරිසරයක් නිශ්චිතවම පවත්වා ගන්නෙමු.

## කෘතඥතා පූර්වක අදහස්

කෙසේ වෙතත්, මෙම ස්ථාවර හා තිරසාර බැංකුව ගොඩනැංවීම සැම විටම අපගේ කණ්ඩායමේ වගකීමව තිබී ඇති අතර, මම ඔවුනට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමි. එමෙන්ම අපගේ දැඩි අනුකූලතා සංස්කෘතිය සහතික කිරීමේදී සැම විටම අවවාද හා උපදෙස් ලබාදීමට සැදී පැහැදී සිටීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාට හා නිලධාරීන්ට මම අතිශයින්ම කෘතඥ වෙමි. ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීම පිණිස සංවර්ධනය හා ජාතියේ සෞභාග්‍යය උච්චතම ස්ථානයකම පවතින යුගයකට මෙම බැංකුව මෙහෙයවීම පිණිස අවශ්‍ය ශක්තිය මා කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය තුළින් මට ලබා දෙන මාගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්තුතියි. එබැවින්, අපගේ සියලු පාර්ශ්වකරුවන් අපගේ සැලසුම්ගත ප්‍රගතියෙහි කොටසක් බවට පත් කිරීම වැදගත් වන අතර, ප්‍රගතිය කරා වන අපගේ මාර්ගයෙහි සැම විටම අපගේ ගනුදෙනුකාර භවතුන් හා අගනා ව්‍යාපාරික හවුල්කරුවන් කැපී පෙනෙන ලෙස දක්නට ලැබෙන්නේ ඒ හේතුවෙනි.

බැංකුකරණ අවකාශය තුළ පැන නගිනු ඇත්තා වූ වඩාත් නව ප්‍රවණතාවන්ට මනා ලෙස හැඩගැසෙමින් පවතින අතරම අඛණ්ඩ ප්‍රතිපෝෂණය, සංවාදය හා අන්තර් ක්‍රියාකාරකම් සමග ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීමට අපට හැකි වී ඇත. දිගින් දිගටම ප්‍රදර්ශනය කරන ලද නොසැලෙන විශ්වාසනීයභාවය පෙරට යාම සඳහා අපට බලය හා ශක්තිය ලබා දෙන බැවින් අපගේ ගනුදෙනුකාර භවතුන් හා අගනා ව්‍යාපාරික හවුල්කරුවන් යන දෙපාර්ශ්වයටම මාගේ ස්තුතිය පිරිනමමි. මහජන බැංකුවේ ගමන් මග කෙරෙහි තියුණු ඇසක් යොමු කරමින් අප අවට සිටින ප්‍රජාවන් අපගේ ප්‍රගතිය පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටින අතර, එම සීමාරහිත අවධානය තවදුරටත් ඉහළ මට්ටමකට අවතීර්ණ වීමටත් වඩා උසස් අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් අප පෙළඹවීම අතිශයින් වැදගත් බව අපි දන්නෙමු. මගේ හෘදයාංගම ඇගයීම අපගේ ප්‍රජාවන් වෙත මෙසේ පළ කර සිටිමි.

මහින්ද චින්තනය මත පදනම් වූ රජයේ දස අවුරුදු දැක්ම සමග අපගේ සැලසුම් මනාව පෙළගැසී ඇත. අනාගතය කරා අපගේ මාර්ග සිතියම බවට පත්ව ඇති මෙම දැක්ම තුළට ප්‍රධාන කර්මාන්ත, යටිතල පහසුකම් හා සමාජ වර්ගීකරණය අන්තර්ගත කරනු ලැබ තිබේ. රාජ්‍ය බැංකුවක්වන හෙයින්, රටේ දැක්මට අනුකූලවන පරිදි අපගේ පාර්ශ්වකරුවන් සංවර්ධනය කිරීම අපට පැවරී ඇති වගකීමවන අතර, මෙතෙක් දුරට ඒ හා සම්බන්ධ අපගේ අරමුණු ඉටුකර ගැනීම හා සාක්ෂාත් කරගැනීම අපි අත්දැක සිටින්නෙමු. සැමට ප්‍රතිලාභ යන සංකල්පය වැළඳගෙන ඒ අනුව කටයුතු කිරීමේදී බැංකුවක් ලෙස අපි නිසැක වශයෙන්ම මහජනයා හා ජාතිය තිරසාර සංවර්ධනයෙහි හා සෞභාග්‍යයෙහි එකම වේදිකාවකට ඒකරාශී කර ඇත්තෙමු.



**ගාමිණී සෙනරත්**
සභාපති

2014 මාර්තු 26 වැනි දින.

# ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

**අපි අපගේ නාමය වන 'මහජන බැංකුව' යන්නෙන් දැක්වෙන පරිපූර්ණ අර්ථය අනුව ක්‍රියාකරමින් සැමට ප්‍රතිලාභ ලබාදීමට ක්‍රියාකර ඇත්තාක් මෙන්ම ඉදිරියටද එසේ කිරීමට යොමුව සිටින බැංකුවක් වන්නෙමු.**





2013 වර්ෂයේ
අභියෝගාත්මක වර්ෂයක් වීම
සැලකිල්ලට ගත් කළ,
තැන්පතු ඒකරාශී කිරීම
එම වර්ෂයේ
අපගේ වඩාත් කැපී පෙනෙන
ජයග්‍රහණය බවට පත් විය.

මූල්‍ය සේවා කර්මාන්තයෙහි යෙදී සිටින ආයතන තමන් විවිධ කණ්ඩායම්වලට අයත් ගනුදෙනුකාර භවතුන්ට සහාය වන බවත්, තමන් කරා ප්‍රවේශය ඇති බවත්, නම්‍යශීලී බවත්, තමන්ගේ ගනුදෙනුකාරභවතුන්ට වාසි සහගත විය හැකි විවිධ ක්ෂේත්‍ර ගණනාවක විශේෂඥභාවය තමන් සතු බවත් ප්‍රකාශ කිරීම අසාමාන්‍යවූවක් නොවේ. එනමුත් මෙම කරුණු බොහොමයක් සත්‍ය වනවිට මහජන බැංකුවට ඉහත සඳහන් සියල්ල හා තවත් ගුණාංග තමන් සතු බව ප්‍රකාශ කිරීමට වඩාත් මූලික හේතුව වන්නේ අප භූගෝලීය පිහිටීම, සමාජ ස්ථරය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සංස්කෘතිය හා ආගම යන කිසිවකුත් නොසලකා මහජනයාගේ ජීවිතයේ සියළු අංශ ස්පර්ශ කරන බැංකුවක් වීමයි. බැංකුකරණ අවශ්‍යතා වෙනුවෙන් සිටීමෙන් පමණක් නොව දැන් පරම්පරා ගණනාවක් කරා ව්‍යාප්තව ඇති සබඳතා පෝෂණයකර ජීවිත කාලය පුරාවට ඒවා ශක්තිමත් කිරීමෙන් අප මහජනයා පරිපූර්ණ ආකාරයෙන් ස්පර්ශ කරන්නෙමු.

'මහජනයාගේ බැංකුව' වීමේ සංකල්පය අපි භාරදූර කාර්යයක් ලෙස සලකන්නෙමු. සැබැවින්ම මහජනයා සමඟ ඒකාත්මිකවීම අප ගන්නා සෑම ක්‍රියාමාර්ගයක් තුළින්ම පිලිබිඹුවීම අපගේ නාමයෙහි අර්ථය බව අපි අදහන්නෙමු. අපට මහජනතාව යනු සියළුම පාර්ශ්වකාර කණ්ඩායම්වල එකතුවක් වනඅතර සමාජයේ සියළු මට්ටම්වල ජනයා කරා බැංකුව සිය සේවය ව්‍යාප්ත කිරීම එම චින්තනය අපට වරම් ලබා දෙයි. අප ගොඩනගාගෙන ඇති සබඳතා ශක්තිමත් හා තිර පදනමින් යුතුවන අතර ඒවා රටේ සෑම පෙදෙසකටම හා ඉන් ඔබ්බට ප්‍රවේශවීමට හැකියාව අප බැංකුවට ලබා දෙයි.

2013 වර්ෂය සඳහා මාගේ මෙහෙයුම් සමාලෝචනය ලිවීමේදී, සිය දැක්ම ඉක්මවා යමින් මෙම කලාපයේ බලවේගයක් බවට පත්වීම කරා ගමන් කළ හැකි ජාතියක් නිර්මාණය කිරීම පිණිස අපගේ විශේෂඥභාවය හා හැකියාවන් තුළින් සෑම අයෙකුටම ප්‍රතිලාභ ලබාදෙමින් අපගේ පාර්ශ්වකරුවන්ට ශක්තිමත් ආධාරකයක් වීමේ උසස් අරමුණ අප සාක්ෂාත් කරගෙන ඇති බව මම දැඩි ලෙස විශ්වාස කරමි. එය සරල බසින් කිවහොත් අපි අපගේ නාමය වන 'මහජන බැංකුව' යන්නෙන් හැඟවෙන දෙය පරිපූර්ණ ආකාරයෙන් ක්‍රියාවට නංවමින් සැමට ප්‍රතිලාභ ලබාදීම පිණිස පෙරත් ක්‍රියා කළ ඉදිරියටත් අඛණ්ඩව ක්‍රියා කරන බැංකුවක් වන්නෙමු.

## මෙහෙයුම් පරිසරය පිළිබඳ ලුහුඬු සමාලෝචනය

සාර්ව අර්ථයකින් ගත් කළ බැංකු කර්මාන්තයට ක්‍රියාත්මකවීම සඳහා වාසි සහගත වේදිකාවක් නිර්මාණය කළ සාධනීය කරුණු තිබුණද බැංකු මෙහෙයුම් සඳහාවූ වෙළෙඳපොළ තත්ත්වයන් සැළකිය යුතු ලෙස අභියෝගාත්මකව පැවතී ඇත. ආයතනික බදු 28% දක්වාද, මූල්‍ය එකතු කළ අගය මත බදු (වැට්) 12% දක්වාද අඩු කරනු ලැබීමත් සමඟ ප්‍රගතිශීලී බදු පරිසරයක් නිර්මාණය කරනු ලැබිණි. කෙසේ වෙතත් 2014 ජනවාරි මස සිට සියළු බැංකු ව්‍යාපාර මත 2% ක ජාතිය ගොඩනැගීමේ බද්දක් පැනවෙනු ඇත. බදුකරණ සිද්ධාන්තයෙන් අධ්‍යාගාරවන පරිදි ජා.ගො.බ. වෙතින් උපයා ගන්නා අරමුදල් රටේ සංවර්ධන න්‍යායපත්‍රය ක්‍රියාත්මක කිරීමට යොදවනු ඇති බැවින් මෙම බදුකරණ සංරචකය ජාතියට යහපත් පෙරනිමිති පළ කරයි.

විශේෂයෙන්ම උතුරේ සහ නැගෙනහිර පෞද්ගලික අංශයේ ආයෝජන වර්ධනය කිරීම සඳහා සාමූහික ප්‍රයත්නයක් ඇති අතර එම තත්ත්වය හේතුවෙන් මෙම ප්‍රදේශවල ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘති සම්බන්ධයෙන් කැපී පෙනෙන උනන්දුවක් ඇතිවී තිබේ. රජය රට පුරා සංවර්ධන ව්‍යාපෘති ආරම්භකර උතුරේ හා නැගෙනහිර ආර්ථික සංවර්ධනයට අත හිත දෙන සංවර්ධන ව්‍යාපෘති මූලික වශයෙන් ඉලක්ක කරද්දී 2015 ට සූදානම් වෙමින් ෂඩ් සංකල්පයට ජවය සපයන සත්කාරක කර්මාන්තය කෙරෙහි තවදුරටත් විශ්වාසය වැඩි කරමින් එම කර්මාන්තයෙහි කැපී පෙනෙන ආයෝජන සිදුවී ඇත. වඩාත් යහපත් ප්‍රවේශ හැකියාව සලසමින් මාර්ග ජාලය ඇතුළු යටිතල පහසුකම් ජාලය වඩාත් උද්යෝගිමත් ලෙස සංවර්ධනය කෙරිණි. ශ්‍රී ලංකාව ආයෝජකයන් වැඩි කැමැත්තක් දක්වන ස්ථානයක් බවට වේගයෙන් පත් වෙමින් සිටින බව ඔප්පු කරමින් පිට පිටම තෙවන වසරටත් සෘජු විදේශ ආයෝජන එ.ජ.ඩො. බිලියන 1 ක ඉහළම මට්ටමේ පැවතිණ.

ගෝලීය වශයෙන්, එ.ජ. යම් ප්‍රමාණයක උපරි සංචලනයක් පෙන්නුම් කළ නමුදු එය නිසැක වශයෙන්ම අපේක්ෂා කළ මට්ටමට නොවූ අතර යුරෝපා කලාපයේ අලස ස්වභාවයෙන් දක්නට ලැබුණු ආකාරයට අවනතියෙහි බලපෑමට ලක්වූ අනෙකුත් රටවල්ද අක්‍රියව පැවති බවද එයින් අදහස් විය. ගෝලීය ආර්ථිකය 2014 සිට වර්ධනයක් අත්කරගැනීමට සූදානමින් සිටින බව පෙනී ගියද 2013 වර්ෂය ආසියාවේ ස්වාභාවික ව්‍යසන හා මැදපෙරදිග ප්‍රදේශය පුරා ව්‍යාප්ත වෙමින් සිරියාවේ අඛණ්ඩව පැවති අර්බුදය ඇතුළුව අනෙකුත් සීමාන්තික තත්ත්වයන් සමඟ පොර බැදුවේය.

වෙළෙඳ හා වාණිජ හා සම්බන්ධිත ආර්ථික දර්ශක කෙරෙහි නිෂේධාත්මක බලපෑමක් ඇතිවූ බැවින් මෙම සිදුවීම් සියල්ලම ආර්ථිකය මත සාර්ව බලපෑමක් ඇති කළේය. විශේෂයෙන්ම 2013 අවසන් මාස කිහිපය තුළදී ශ්‍රී ලංකාවද වෙනස්වන සුළු පොළී අනුපාතික හා විනිමය අනුපාතික සමග පොර බැදුවාය. රන් මිළ හදිසියේ දැඩි පහළ බැසීම සිය ලාභදායිත්වයෙන් වැඩි කොටසක් ලබාගැනීමට උකස් කළඹ මත සැලකිය යුතු මට්ටමකට විශ්වාසය රඳවන මූල්‍ය සේවා කර්මාන්තයෙහි බොහෝ ආයතන කෙරෙහි අතිශය විපත්තිදායක බලපෑමක් ඇති කළේය.

## කාර්යසාධන සමාලෝචනය

මෙලෙස, අපගේ ව්‍යාපාරයෙහි සෑම අංශයකටම බලපෑම් ඇති කළ ඉහත සඳහන් සියළු නිෂේධකයන් තිබියදීත් බැංකුව මෙම ප්‍රතිඵල අත්කරගත් බව සැලකූ විට බැංකුව විසින් අත්දකින ලද

ප්‍රතිඵල සැබැවින්ම අසාමාන්‍යය. 2013 සඳහා බදුවලට පෙර ලාභය රු. බිලියන 10.3 ක් ලෙස වාර්තා වූ අතර එය පෙර වර්ෂයේ වූ රු. බිලියන 15.2 සිට 32.4% ක නිෂේධ වර්ධනයක් විය. අභියෝග රාශියකට මුහුණ දීමට සිදුව තිබියදීත් මෙම ලාභදායිත්වය වාර්තා කිරීමට බැංකුවට හැකිවීමට, විශේෂයෙන් කැළඹුම් සහගත සමයන්හිදී වඩාත් සඵලදායක ලෙස ක්‍රියාත්මක වූ 2009 - 2014 උපායමාර්ගික සැලැස්මෙහි මූලික ප්‍රතිපත්ති විශේෂයෙන්ම හේතු විය. මෙම පස් වසරක කාලපරිච්ඡේදය තුළ පැන නැගිය හැකි අපගේ ශක්තීන්, දුර්වලතා, තර්ජන හා අවස්ථා හඳුනා ගැනීම සඳහා පදනම අප මෙම උපාය මාර්ගික සැලැස්ම තුළින් ඒ වන විටත් දමා තිබුණි.

නිෂේධාත්මක සාර්ව බලපෑම් තිබියදීත්, ඵලදායකව, කාර්යක්ෂමව හා ප්‍රශස්ත ප්‍රතිඵල සහිතව ක්‍රියාත්මක වීමට අපට හැකියාව ලබා දෙන මනා ලෙස සැලසුම් කරන ලද සිතියමක් සැකසීම පිණිස අපි සුසමාදර්ශයන් විශ්ලේෂණයකර අතීතයෙන් පාඩම් උගත්තෙමු. අප ඉදිකළ පදනම නොසැළෙනසේ ශක්තිමත්, හොඳින් සිතා මතා සැළසුම් කරන ලද, අභියෝගවලට මුහුණදීමට සූදානම සහිතවූවක් විය. මේ වසරේ, අපගේ වර්ධන සුසමාදර්ශයන් හා සංගතක වූ ප්‍රතිඵල ගෙන හැර පාමින් මෙම පදනම තිරසාර එකක් බව අපි සැබැවින්ම තහවුරු කළෙමු.

ණය හා අත්තිකාරම් කළඹ වර්ධනය කිරීම පිණිස පොදුවේ කර්මාන්තයට අභියෝග එල්ල වී තිබියදීත් මෙම ව්‍යාපාරික අංශයෙහි වර්ධනයන් අත් දැකීමට හේතු පාදකවූ අපගේ බැංකුව අන්තර්ගත කරගෙන ඇති උපායමාර්ග සියළු ගැටළුවලට ප්‍රතිකර්ම සපයන ආකාරයේ ඒවා බව තහවුරු විය. මෙම කළඹ රු. බිලියන 681.5 ක් දක්වා වර්ධනයක් අත් කරගත් අතර 2012 දී වූ රු. බිලියන 660.6 සමග සැසඳූ කළ එය 3.2% වැඩිවීමකි. කෙසේ වෙතත් රන් මිළ පහළ බැසීමේ ප්‍රතිඵලයක් ලෙස අපගේ ව්‍යාපාරයටත් සැලකිය යුතු අහිතකර බලපෑමක් සැබැවින්ම ඇතිවූ අතර එම තත්ත්වය අපගේ අක්‍රිය ණය අනුපාතය ඉහළ නැංවීමට හේතු විය. එසේ වුවද මෙම තත්ත්වය කෙරෙහි දැඩි අවධානය යොමුව පවතින අතර හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා ණය අනුපාතය අඩු කිරීම පිණිස දැනටම උපාය මාර්ග යොදා ගෙන ඇත.

## අපගේ ජයග්‍රහණ සැමට ප්‍රතිලාභ සපයයි

2013 අභියෝගාත්මක වර්ෂයක්වීම අනුව ගත් කළ තැන්පතු ඒකරාශී කිරීම එම වර්ෂය සඳහා අපගේ වඩාත්ම කැපී පෙනෙන ජයග්‍රහණයක් බව ඔප්පු විය. අප විසින් පිරිනමනු ලබන විවිධ නිපැයුම් හා සේවා රාශියකින් සහාය ලැබ අපගේ ඉතුරුම් කළඹ සිත් බඳනා සුළු 11.4% කින් වර්ධනය විය.

නිපැයුම් දෘෂ්ඨිකෝණයකින් බැලූ කල තාක්ෂණය නියත වශයෙන්ම මෙම ප්‍රයත්නයට ආධාරකවූ බව කිව හැක්කේ අපගේ ගනුදෙනුකාර භවතුන් වැඩි සංඛ්‍යාවක් දැන් අපගේ අන්තර්ජාල හා කෙටි පණිවුඩ බැංකුකරණය, අත්ල මත බැංකුකරණය, ජංගම බැංකුකරණය හා අළුතින් හඳුන්වා දෙන ලද සේ.අ.අ., සේ.භා.අ. හා රේගු බදු ගෙවීම් සඳහා අන්තර්ජාලය මගින් ගෙවීම් කිරීමේ දොරටු පවා භාවිතා කරන බැවිනි. වඩා හොඳින් ප්‍රජාවන් තුළට කාවැදීම හා වැඩි අගය එකතු කිරීම සඳහා අපගේ සුවිසල් හිමිවත් කාඩ්පත් පදනම වීසා හර කාඩ්පත් බවට පරිවර්තනය කිරීමද බැංකුව අරඹා ඇති අතර එය අපගේ කාඩ්පත් පදනම තවදුරටත් ව්‍යාප්ත වීමට හේතු වනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු.

දැනට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක මධ්‍යගත බැංකුකරණ පද්ධතිය, සංඛ්‍යාවෙන් 735 ක් වන අපගේ ශාඛා ජාලයද එයට එක් කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 460 ද හරහා අපගේ කාර්යක්ෂමතා සහ ඵලදායීතාව වැඩි දියුණු කර ඇති අතර දිවයින පුරා විසිරී සිටින ගනුදෙනුකාරභවතුන් කරා ළඟා වීමට දැන් අපට හැකියාව ලැබී ඇත.

රට පුරා විවිධ ප්‍රදේශ වෙත තිරසාර සංවර්ධනය ගලා යාම කෙරෙහි පූර්ණ අවධානය සහිතව වර්ෂය අතරතුරදී යොදා ගන්නා ලද අතිශයින්ම උපක්‍රමශීලී මූලාරම්භයන් කිහිපයක් ණය පොතෙහි 3.2% ක සිත් බඳන සුළු වර්ධනයට හේතු විය. මහජන බැංකුව උත්තර අර්ධද්වීපයෙහි මෙහෙයුම් ශක්තිමත් කිරීම හා ව්‍යාපාර දියුණුවට ගාමක බලය සැපයීම සමග උතුරු ප්‍රදේශය වර්ධන තීව්‍රතාව අත්කර ගත්තේය. ඒ අනුව විශේෂයෙන්ම රටේ මේ ප්‍රදේශයෙහි ප්‍රධාන කර්මාන්ත වන කෘෂිකර්ම, කිරි නිෂ්පාදන හා ධීවර ක්ෂේත්‍ර තුළ ව්‍යවසායක ප්‍රයත්නයන් කැපී පෙනෙන සංඛ්‍යාවක් ආරම්භ කෙරිණි. ප්‍රදේශයෙහි ව්‍යවසායකයන්ට හා කර්මාන්තවලට අතහිත දෙනු වස් බැංකුව සහනදායී පොළී අනුපාත යටතේ ප්‍රාදේශීය සංවර්ධන පහසුකම් සැපයීම අරඹා ඇප අවශ්‍යතා ලිහිල් කළේය.

සමාජ සවලකරණ වේදිකාවක් මත රටේ අනෙකුත් ග්‍රාමීය ප්‍රදේශය කරා ව්‍යාප්ත කරනු ලැබූ ව්‍යවසායකත්ව සංවර්ධනය අවධාරණය කිරීම සැලසුම් කරන ලද්දේ කර්මාන්ත නිර්මාණය කිරීම, නවෝත්පාදනය සඳහා පෙළඹවීම, විශේෂයෙන්ම කාන්තාවන් සවිබලගැන්වීම හා ග්‍රාමීය රැකියා උත්පාදනය අරමුණු කර ගනිමිනි. ග්‍රාමීය අංශය වෙත ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් හා සංවර්ධන ණය ලබාදීම හේතුවෙන් මෙම ආර්ථිකයන් ප්‍රධාන ප්‍රවාහ ආර්ථිකය වෙත කැපී පෙනෙන දායකත්වයක් ලබාදී ඇති අතර මෙම මැදිහත්වීමෙහි ඵලදායී ලක්ෂණයක්වී ඇත්තේ මේතාක් කල් අරමුදල්, තාක්ෂණික විශේෂඥභාවය හෝ දැනුම නොමැතිකමින් අක්‍රියව පැවති නව කර්මාන්ත ගණනාවක උපතයි. මහජන බැංකුව අවස්ථා හා විභවය වෙනුවනේ අනුබලදීම හේතු කොටගෙන මෙම කර්මාන්ත දැන් පුනර්ජීවයක් අත් දැක ඇත.

අපගේ තවත් විශිෂ්ටතම ජයග්‍රහණයක් වන්නේ 2012 ට වඩා 11% වැඩිවීමක් පෙන්නුම් කළ අපගේ ප්‍රේෂණ ව්‍යාපාරයෙහි උඩත් සංචලනයයි. අපගේ බහුවිධ ප්‍රේෂණ විසඳුම් සමූහය දැන් අන්තර්ජාලය හරහා/තථ්‍ය කාල සංක්‍රාම සඳහා ක්‍රම ගණනාවක්

යොදා ගත හැකි බව සහතිකකර ඇති අතර ක්ෂණිකවම අරමුදල් කරා ප්‍රවේශ හැකියාව ලබා දෙන විගමනික හර කාඩ්පත විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමග හවුල්කාරිත්වයෙන් දියත් කිරීමත් සමග වෙහෙස මහන්සියෙන් උපයාගත් මුදල් කරා ප්‍රවේශය ස්වයංක්‍රීය ප්‍රේෂණ මාර්ග භාවිතා කරමින් තවදුරටත් දියුණු කෙරිණි. විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන ස්ථාවර හා සුරක්ෂිත විවිධ ආයෝජන මෙවලම් සමගින් විදේශ මුදල් තැන්පතුද තවදුරටත් ඉහළ නැංගේය. අප ලොව පුරා පිහිටුවාගෙන ඇති හවුල්කාර සබඳතා ජාලය විදේශගත ශ්‍රී ලාංකිකයන් සවිබල ගැන්වීම සඳහාවන අපගේ සියළු මූලාරම්භයන් මනා ලෙස ක්‍රියාත්මක කිරීමට පිටිවහල් වේ.

ණය අය කර ගැනීම් වඩාත් හොඳින් අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා උපාය මාර්ග යොදාගැනීමේ දැඩි ප්‍රයත්නයක්ද බැංකුව දරා ඇති අතර වර්තමාන සන්දර්භය තුළ එය අනිවාර්ය බව අපි විශ්වාස කරමු. කෙසේ වෙතත් අපගේ ගනුදෙනුකාර භවතුන් ක්‍රියාත්මකවන සහන අවශ්‍ය කරන තත්ත්වයන් පිළිබඳ අප සත්‍ය ලෙසම අතිශයින් සවිඥාණකව සිටින අතර බැංකුව හා ගනුදෙනුකාර භවතුන් යන දෙපාර්ශ්වයටම ප්‍රතිලාභ සලසන ණය අයකර ගැනීමේ ව්‍යුහගත සැලසුමකට අනුව අපි ක්‍රියා කරන්නෙමු.

## අභියෝගාත්මක පරිසරයක් තුළ ක්‍රියාත්මකවීම

නියාමන දෘෂ්ටිකෝණයකින් බැලූ කල, 2011 දී බලාත්මක වූ මහ බැංකුවේ ආයතනික පාලන සංග්‍රහය සහ 2012 දී හඳුන්වා දෙන ලදුව 2013 දී වැඩි දියුණු කරන ලද නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS හා SLFRS) යන දෙකම සමඟ අනුකූලතාව සහතික කිරීම උදෙසා අභ්‍යන්තර මූලාරම්භයන් කිහිපයක් ස්ථාපනය කිරීමටද බැංකුවට සිදු විය. බාසල් III සඳහා සූදානම් සහිත වීමද සිදු කෙරෙමින් පවතී.

අපගේ බැංකුකරණ ව්‍යුහය තුළ පුද්ගල බැංකුකරණය මූලික වගකීමක්වන අතර ජාතික සංවර්ධන අරමුණු ඉටු කිරීමේදී පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකටම හවුල්කාරිත්වය සැපයීම පිළිබඳව අප අතිශයින්ම උනන්දුවන තත්ත්වයක් තුළ ආයතනික බැංකුකරණය අවශ්‍ය අංගයකි. ආයෝජන කේන්ද්‍රියව වාණිජ ව්‍යාපාර උනන්දු කරවීමේදී අපගේ කාර්යභාරය මෙම ව්‍යාපාර තුළට ජීව්‍යතාව හා ලාභදායිත්වය එක් කර ඇත. දැන් පෞද්ගලික අංශයේ විශාල හා මධ්‍ය පරිමාණ ආයතන ඇතුළත් මෙම ව්‍යාපාර ක්ෂේත්‍රය ගොඩ නැංවීමට අප කණ්ඩායමේ වෘත්තික හා පුළුල් දැනුම කැපී පෙනෙන ලෙස දායකවී තිබේ. මෙම වසරේදී ආයතනික බැංකුකරණය බැංකුවේ ලාභදායිතාව කැපී පෙනෙන ලෙස වර්ධනය කරන මූලික ගතිකයක් වෙමින් බැංකුවේ ශුද්ධ ආදායමට රු. බිලියන 6.5 ක් එක් කළ අතර මුළු ණයදීම් රු. බිලියන 234 ක් විය.

අපගේ භාණ්ඩාගාර ඒකකයට අතිශයින්ම අභියෝගාත්මක වසරකට මුහුණ දීමට සිදුවී තිබියදීත් එම ඒකකය එ.ජ. ඩොලර්/ලංකා රුපියල් විෂය ක්ෂේත්‍රය තුළ වෙළෙඳපොල තනන්නකු ලෙස සිය තත්ත්වය තහවුරු කරගැනීම තවදුරටත් සිදු කළ බව සැලකිල්ලට ගැනීම වටිනා කරුණකි. තත්කාලීන හා පෙරටු වෙළෙඳපොළ යන දෙකෙහිම මිළෙහි වාසිය ලබාගැනීමට ඒකකය සමත් වූයේය යන කරුණ ගනුදෙනුකාර භවතුන්ගේ වාසිදායක තත්ත්ව අත් කර ගැනීමට හා ආනයනකරුවන්ට හා අපනයනකරුවන්ට තරඟකාරී මිළ ගණන් ඉදිරිපත් කිරීමට පාදකවී ව්‍යාපාර පරිමාවේ වර්ධනයක් පෙන්නුම් කළේය. මූලික වශයෙන්ම අපගේ භාණ්ඩාගාරය දැන් අත්කරගෙන ඇති විශේෂඥභාවය හා දක්ෂතාව හේතුවෙන් ව්‍යවහාර මුදල් තත්ත්වයන්ද සාර්ථකව කළමනාකරණය කරගැනීම හා වෙළෙඳපොළ අවදානම අවම කිරීම සිදුකරන ලදී. එයට අමතරව, ආයතනික ණය නිකුත් කරන්නන් හා ආයෝජකයන් විශාල සංඛ්‍යාවක් වෙනුවෙන් සාර්ථකව ගනුදෙනු අවසන්කර ඊර්ෂ්‍යා උපදවන සුළු වෙළෙඳපොළ කොටසක් අත්කර ගෙන සිටින අපගේ ආයෝජන බැංකුකරණ ඒකකය (IBU) සැලකිය යුතු ගාස්තු ආදායමක් ලබා දෙමින් ණයකර හා වාණිජ නෝට්ටු හරහා මේ වසරේ රු. බිලියන 7.4 ක් රැස් කළේය.

2015 තෙක් රටේ ආර්ථික කේන්ද්‍ර දැක්ම හා මහින්ද චින්තන දැක්ම වෙනුවෙනේ ගාමක බලය සැපයීමට සැලසුම් කරන ලද ප්‍රධාන කර්මාන්තවලට අතිරේක ශක්තිය ලබාදිය යුතුය යන කරුණ පිළිබඳවද අප සවිඥානකවන අතර ඒ හා සබැඳි ව්‍යාපෘතිවලට සහාය ලබාදීම කෙරෙහි අවධානය කේන්ද්‍රගත කිරීමට එම අවබෝධය අපට හැකියාව ලබාදී ඇත. එබැවින් අපි ජාතික සංවර්ධන ව්‍යාපෘතිවලින් ආසන්න වශයෙන් 25% කට පමණ අරමුදල් සපයා ඇති අතර කාර්මික දෘෂ්ටිකෝණයකින් බැලූ කල අපි ජාතික ඛනිජතෙල් අවශ්‍යතාවෙන් 50% ක් වෙනුවෙන් අරමුදල් සපයා, මාර්ග, දුම්රිය හා නැව් මගින් ප්‍රවාහන සේවාවන් සඳහා මූල්‍යමය සහාය ලබා දී තිබේ. වාර්ෂික ගල් අඟුරු ආනයනය වෙනුවෙන් අරමුදල් සැපයීමට වෙන් කරන ලද අතිරේක රු. බිලියන 10 ක් සමග රාජ්‍ය විදුලිබල අංශයෙහි කළඹ සැකසී ඇත. සත්කාරක, ඖෂධ, සෞඛ්‍යය ආරක්ෂණ හා පොහොර කර්මාන්ත වෙනුවෙන්ද අපි අරමුදල් සපයන මූලික ආයතනයක් වෙමු.

බැංකුවේ තොරතුරු තාක්ෂණ කොඳු නාරටිය ශක්තිමත් කරන දූරදර්ශී තොරතුරු තාක්ෂණ සැලසුමක් ස්ථාපනය කරමින් සියළු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ පිණිස වන තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වුණු බැංකුවක් නිර්මාණය කිරීමෙහි සිය ප්‍රයත්නයෙහි තොරතුරු තාක්ෂණ අංශය වෙහෙස නොබලා ක්‍රියාකර ඇත. මෙයට පෙරද සඳහන් කරන ලද පරිදි, රටේ අපනයන/ආනයන වෙළඳාම පිළිබඳ පුරාවතෙහි සැබැවින්ම විප්ලවකාරී ව්‍යාපෘතියක් වන අන්තර්ජාලය හරහා රේගු බදු හා බදු ගෙවීමේ පුරෝගාමී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. රේගු බදු ගෙවීමේ දොරටුව මෙන්ම සේ.අ.අ. හා සේ.භා.අ. ගෙවීම් අන්තර්ජාලය හරහා කිරීම පිණිස අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද පහසුකම අපගේ තොරතුරු තාක්ෂණ සංවර්ධනය විදහා දක්වන අනෙකුත් මූලාරම්භයන් වේ. අපගේ තො.තා. පුරාවතෙහි කැපී පෙනෙන සිදුවීමක් වූයේ රට පුරා පුළුල් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයකට

අපේ ගනුදෙනුකාර භවතුන් ජාලගත කරන ජාතික පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භුවමාරු ව්‍යාපෘතියකට සම්බන්ධ වූ ප්‍රථම බැංකුව බවට මහජන බැංකුව පත්වීමයි.

## තිරසාර සංවර්ධනය සහතික කිරීම

බැංකුවෙහි ආයතනික වගකීම් වේදිකාව තෙවැදෑරුම්, එනම් සංස්කෘතික හා ජාතික උරුමය සුරැකීම, වෘත්තීයමය සංවර්ධනය හා කර්මාන්ත හා අධ්‍යාපනික නගාසිටුවීම තුළින් මහජනයා සවිබල ගැන්වීම යන කරුණු කෙරෙහි කේන්ද්‍රගත වූවක් වේ.

රටේ අතිශය පැරණි ඓතිහාසික, ආගමික හා සංස්කෘතික උරුමය සුරැකෙන බව සහතික කිරීම සඳහා ජාතික වගකීමක් රාජ්‍ය බැංකුවක් වන හෙයින් අප වෙත පැවරී ඇති බව අපි විශ්වාස කරන්නෙමු. ඉදිරි පරම්පරාවන්ට රටේ ප්‍රෞඪ අතීතය පිළිබඳව දැනුවත්ව ඒ පිළිබඳව ආඩම්බරවීමට හා බහු සංස්කෘතික, බහු ආගමික හා බහු වාර්ගික රටක දිවි ගෙවීම හේතුවෙන් මුහුණපෑමට සිදුවන එකිනෙක හා බැඳුණු සංකීර්ණ තත්ත්වයන් පිළිබඳව දැනුවත්ව සිටීමට හැකිවන පරිදි මෙම උරුමයන් සුරැකීම අත්‍යවශ්‍යවූවකි. මෙලෙස, ශ්‍රී දළදා මාළිගාව විසින් සංවිධානය කෙරෙන අඳ දක්වාම ආසියාවේ විශාලතම සංස්කෘතික සංදර්ශනය ලෙස සැළකෙන ඇසල පෙරහැර ඇතුළු ආගමික හා සංස්කෘතික උත්සව වෙනුවෙන් දීර්ඝකාලීන හවුල්කාරිත්වයක් පවත්වාගැනීම කෙරෙහි අප අවධානය යොමු කර ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පිහිටි වසර 2,200 කට අධික ඉතිහාසයකට හිමිකම් කියන සිතුල්පව්ව රජ මහා විහාරයෙහි පොසොන් උත්සවයට හා හුණුපිටිය ගංගාරාම විහාරයෙහි බුද්ධ රශ්මි වෙසක් උත්සවයටද අපි සහාය වන්නෙමු. ඉපැරණි රුහුණු රාජධානියෙහි පුරාවිද්‍යාත්මක බිමක් හා පෞරාණික පූජනීය ස්ථානයක් වන පොතුවිල් මුහුදු මහා විහාරයෙහි ප්‍රතිසංස්කරණය සඳහා බැංකුව සහායවීම සමග තවත් සංස්කෘතික හා ආගමික උරුමය සුරැකීමේ මූලාරම්භයක් ඉදිරිපත් කෙරිණි.

රට, මධ්‍යම ආදායම් ආර්ථිකයක් ලෙස සිය තත්ත්වය ස්ථාවර කරගනිද්දී එබඳු ඉහළ තත්ත්වයක් තුළින් මතුවන අභියෝගවලට මුහුණදීමට හා ඒ සමගම පැන නගින අවස්ථාවන් හඳුනාගෙන ඒවා රටට වාසිදායක ආකාරයට හසුරුවා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මානව සම්පතට හැකියාව තිබීම අත්‍යවශ්‍යය. එබැවින් වෘත්තිකභාවය වර්ධනය කිරීම පරම අවශ්‍යතාවක්වන අතර බැංකුව, වාර්ෂික පුවත්පත් කලා සම්මාන උළෙලේදී ශ්‍රී ලංකා කර්තෘ සංසදය හා ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සමග හවුල්වීම ඇතුළුව විවිධ වාත්තීන්හි වෘත්තිකභාවය ප්‍රගුණ කරවීම සඳහා විවිධ ආයතන ගනු ලබන ප්‍රයත්නයන්හිදී ඔවුන්ගේ හවුල්කරුවකු ලෙස කටයුතු කිරීම සිදුකර ඇත. රටේ යොවුන් ජනතාව අතරින් විශිෂ්ටතමයන් අතර උසස් ජයග්‍රහණ ලැබුවන්ට සම්මාන පිදූ විශ්වවිද්‍යාල වර්ණ රාත්‍රියට බැංකුව අරමුදල් සම්පාදනය කිරීම තුළින් විශ්වවිද්‍යාල උපාධිධාරීහුද අපගේ සහාය ලැබූහ. ඉදිරි වර්ෂයේදී අපගේ මැදිහත්වීම් අනෙකුත් වෘත්තීන් කරාද ව්‍යාප්ත කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

අපගේ පාර්ශ්වකාර කාණ්ඩ අතර කාන්තාවන්ට හැම විටම උසස් තත්ත්වයක් ලැබී ඇත. කාන්තාවන් වෙනුවෙන් වෙන්වූ, ඔවුනට උසස් අධ්‍යාපනය ලබාගැනීමට හෝ ක්ෂුද්‍ර හෝ සුළු ව්‍යාපාර ආරම්භ කිරීමට හැකියාව ලබාදෙන වනිතා වාසනා නිපැයුමේ සිට අපගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මැදිහත්වීම් කිහිපයක්, අරමුදල් සහාය සැපයීමේදී කාන්තාවන් ප්‍රමුඛත්වය ලබා දීම සහතික කරයි. කාන්තා ව්‍යවසායිකාවන් හා වෘත්තිකයන් වෙනුවෙන් බැංකුවේ නිර්ලෝභී සහාය විදහා දක්වමින් බැංකුව මේ වසරේදී කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේ වාර්ෂික සමුළුවට හවුල්කරුවෙකු වූයේය.

පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේදී විශිෂ්ට දස්කම් දක්වන සිසුන්ට මෙන්ම අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස. (උ.පෙ.) විභාගවලදී උසස් ජයග්‍රහණ අත්කර ගන්නා සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන බැවින් අධ්‍යාපනයද අපගේ තිරසාර සවිබලගැන්වීමේ මූලාරම්භයන්ට කා වැදී පවතී. රණවිරුවන්ගේ දරුවන්ට නිවාස, වෛද්‍ය ප්‍රතිකාර හා ශිෂ්‍යත්ව සැපයීම සඳහා වූ අරමුදල් රැස් කිරීමේ ප්‍රයත්නයකට බැංකුව ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකක සමග හවුල්වීමෙන් තවදුරටත් අගය එකතු කිරීම සිදු කරන ලදී.

## අනාගතය වෙනුවෙන් සැමට ප්‍රතිලාභ සැලසීම

අපගේ ආරම්භයේ සිටම මහජන බැංකුව සැමට ප්‍රතිලාභ සැලසීමේ සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වී ඇත. අප එහි අරුත ලෙස දුටුවේ අප ගන්නා සෑම තීරණයක්ම සෑම ක්‍රියාමාර්ගයක්ම හා ඒවායේ ප්‍රතිඵල ලෙස ඇතිවන සෑම බලපෑමක්ම අපගේ පුළුල් ව්‍යාප්තියක් සහිත හා විවිධාකාරවූ පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබාදිය යුතු බවයි.

ආයතනයෙහි අභ්‍යන්තරික කටයුතු දෙස හැරී බලන විට, අපි දැන් 2009 දී ආරම්භ කළ පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මෙහි අවසානයට පැමිණ සිටින්නෙමු. මෙම සැලසුම අවස්ථා හඳුනාගනිමින් ඒවායේ උපරිම වාසිය අත්කරගන්නා අතරම අභියෝග ජයගැනීම සඳහා අපට හැකියාව ලබා දෙන පැහැදිලි හා සරල එකක් විය. නැගී එන ප්‍රවණතාවන් පිළිබඳව විමසිලිමත් වෙමින් හා විශේෂයෙන්ම තවදුරටත් දිග හැරෙන සාර්ව පරිසරය හා ගෝලීය සමාජ ආර්ථික පරිසරයට අනුව අප අවිනිශ්චිත යුගයක සිටින්නේය යන කරුණ පිළිබඳවද සවිඥානකව සිටිමින් 2014 දී මෙම සැලැස්ම තවදුරටත් වැඩි දියුණු කිරීමට අපි අරමුණු කරන්නෙමු.

තො.තා. හා මානව සම්පත් යන අංශ දෙක බැංකුව නම් සිරුරෙහි කොඳු නාරටිය සාදන හෙයින් පරිපූර්ණ තො.තා. හා මානව

සම්පත් සැලැස්මක්ද සැකසෙමින් පවතී. අප දැනටමත් ක්‍රියාත්මක කර ඇති ප්‍රගතිශීලී අංග තවදුරටත් ඉදිරියට ගෙන යමින් නව මූලධර්මයන් හා නවීනතම තො.තා. සහාය ලබන යටිතල පහසුකම් එක් කරමින් තො.තා. වේදිකාවට ගාමක බලය එක් කිරීම පිණිස සැලකිය යුතු තල්ලුවක් ලබා දෙමින් පවතී.

තමන් ජයග්‍රහණ අත්කර ගත හැකි කණ්ඩායමක් බව නිසැකවම ඔප්පුකර ඇති අපගේ කණ්ඩායම කවර හෝ අභියෝගයක් හමුවේ පසුබාන එකක් නොවන අතර අනාගතයේදී අනිවාර්යයෙන්ම පැන නගිනු ඇත්තාවූ වඩාත් අසීරු අභියෝග ජය ගැනීම සඳහා උචිත මෙවලම් හා කුසලතා ඔවුන්ට තිබීම අවශ්‍යය. සැඟවුණු හා පවත්නා කුසලතා මුවහත් කිරීම සඳහා සැලසුම්කර ඇති පරිපූර්ණ පුහුණු හා සංවර්ධන ලිතක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින්නේ අනාගත නායකයන් නිර්මාණය කිරීමේ, කණ්ඩායම් හැඟීම ප්‍රගුණ කිරීමේ හා ඒකාවන්ව ක්‍රියා කළ යුතුය යන හැඟීම හා ව්‍යවසායක නිර්මාණශීලී බව පිළිබඳ හැඟීම කණ්ඩායමේ වර්ණදේහ තුළට කාවැද්දීමේ අවශ්‍යතාව අනුවය.

2020 වන විට, ශ්‍රී ලංකාව කලාපයේ පෙරමුණ ගත් රටක් ලෙස ස්ථානගත කිරීමට සැලසුම් කරන ලද ආක්‍රමණශීලී ක්‍රියාකාරී සැලසුමක් දක්වන රජයේ දස අවුරුදු සංවර්ධන සැලැස්ම සහ මහින්ද චින්තනයට අනුකූලවන පරිදි අපගේ සැලසුම් හා ප්‍රගතිය මෙහෙයවෙනු ඇත. උසස් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා නියම කරන ලද කාලරාමුවලට මනා ලෙස අනුකූලව, අවසාන වශයෙන් ශ්‍රී ලංකාව ගතික ගෝලීය කේන්ද්‍රයක් බවට පරිවර්තනය කිරීම පිණිසවන ප්‍රධාන කර්මාන්ත හයක් ඇතුළත් මෙම ගමනට ගාමක බලය සපයන ප්‍රධාන කර්මාන්ත වෙනුවෙන් ශක්තිය සැපයීමට බැංකුව අපේක්ෂා කරයි. ඒ හා සමාන වේගයෙන්ම ග්‍රාමීය ආර්ථිකයන්හි සංවර්ධනය දිරිගන්වන අතරම සවිබලගැන්වීම හා ඇතුලත්කර ගැනීම සඳහා වන රජයේ සංවර්ධන සැලැස්මෙහි තවත් අංශයක් වන ක්ෂුද්‍ර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායද අපි ප්‍රබෝධමත් කරමින් සිටින්නෙමු.

## ඇගයීම්

2013 ට වඩා හොඳ දියුණු වීමේ අවස්ථා ගෙන එනු ඇතැයි අප අපේක්ෂා කරන වසරක එළිපතට අපි දැනටමත් එළඹ සිටින්නෙමු. ආර්ථික වශයෙන් ගත් කළ ලොව ප්‍රගමනය කරා යොමුවන අවස්ථාවකට පැමිණ ඇතැයි පෙනී යන අතර නියම කරගෙන ඇති කාල රාමුවලට අනුකූලව ශ්‍රී ලංකාව තවදුරටත් සිය උසස් ඉලක්ක සාක්ෂාත් කරගනිමින් සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරනු ඇත. මෙබඳු පසුබිමක, සැමට ප්‍රතිලාභ සැලසීම කෙරෙහි කේන්ද්‍රගතවීම බැංකුව දිගින් දිගටම පවත්වා ගන්නා බව තහවුරු කරමින් මා හට සැම විටම ලබාදුන් මගපෙන්වීම හා නායකත්වය වෙනුවෙන් සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මම කෘතඥ වෙමි. දුෂ්කර පරසරයක ක්‍රියාත්මක වෙද්දීත් සැලකිය යුතු ප්‍රතිඵල ඉදිරිපත් කිරීම පිණිස කණ්ඩායමක් මෙහෙයවීම සඳහා මෙම භාරකාරත්වය මා හට හැකියාව ලබාදී ඇත. බැංකුව රඳා පවතින ආධාර ස්ථම්භ ලෙස දිගින් දිගටම ක්‍රියාත්මක වන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා අපගේ ගතික කණ්ඩායම මම අගයමි.

මහජන බැංකුව වෙත ලබාදුන් මගපෙන්වීම හා සහාය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්තුමාට, මුදල් අමාත්‍යාංශ නිලධාරීන්ට, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමාට, මහ බැංකු බලධාරීන්ට, මුදල් හා නියාමන මණ්ඩලවලට සහ විගණකාධිපතිතුමාට හා එතුමාගේ කාර්ය මණ්ඩලයටද මම ස්තුතිය පුදකර සිටිමි.

අප කෙරෙහි නොසැලෙන පක්ෂපාතීත්වය හා කැපවීම ප්‍රදර්ශනය කරමින් අපගේ ගනුදෙනුකාර භවතුන් හා අගනා ව්‍යාපාරික හවුල්කරුවන් අඛණ්ඩ ලෙස අප කෙරෙහි විශ්වාසය රඳවා ඇති අතර ඒ සම්බන්ධයෙන් මාගේ කෘතඥතාව පළ කරමි. අපගේ පාර්ශ්වකරුවන්ට හා අප අවට සිටින ප්‍රජාවන්ට ප්‍රතිලාභ ලබාදීමේ නිත්‍ය වේදිකාව මත බැංකුව ගොඩනැගී ඇති අතර ඔබට හා බැංකුවට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබාදෙනු ඇත්තාවූ දිගුකාලීන සබඳතා ඇති කරගෙන වර්ධනය කරගැනීම සහතික කරමින් අප සමග රැඳී සිටීම හා දියුණුව අත්කර ගැනීමට අපට ශක්තිය ලබාදීම වෙනුවෙන් ඔබට ස්තුතියි.

අපගේ පැවැත්ම සැමවිටම සැමට ප්‍රතිලාභ සලසනු ඇතැයි යන අවශ්‍යතාව මත ආරම්භ කරන ලදුව, දැනෙන හා නොදැනෙන ආකාරයට ජීවිත ස්පර්ශ කරමින්, අපගේ ගමන සාර්ථක කරවූ සෑම පාර්ශ්වකරුවෙකුට ප්‍රතිලාභ පිණිස අපගේ දැක්ම හා අරමුණ හැම විටම සැලසුම්කර ඉදිරිපත් කෙරෙන බවට සහතික වෙමින්, අපි ඉදිරියටත් මහජන බැංකුවම වන්නෙමු.



**එන්. වසන්ත කුමාර්**
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

2014 මාර්තු 26 වැනි දින.

# අධ්‍යක්ෂ මණ්ඩලය

**මුළු අධ්‍යක්ෂ මණ්ඩලයම විශිෂ්ට ආයතනික පාලන පරිචයන් තන්ත්‍රය තුළ උසස්ම ආචාරධර්ම සම්මතයන් කාවැද්දූ පරිපූර්ණ සේවා සැපයුමකට බැංකුවට මඟපෙන්වීම සඳහා කැපවී සිටී.**

**පියදාස කුඩාබාලගේ මහතා**

අධ්‍යක්ෂ

**ගාමිණී එස්. සෙනරත් මහතා**

සභාපති

**ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය**

අධ්‍යක්ෂිකා

**ආර්. එම්.  පී. රත්නායක මහතා**

අධ්‍යක්ෂ






**පී. කේ. ඩී. අමරවර්ධන මහතා**
අධ්‍යක්ෂ

**ජෙහාන් පී. අමරතුංග මහතා**
අධ්‍යක්ෂ

**පවර දසනායක මහතා**
අධ්‍යක්ෂ

**ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය**
අධ්‍යක්ෂිකා

## 01. ගාමිණී එස්. සෙනරත් මහතා
සභාපති

ගාමිණී එස්. සෙනරත් මහතා 2013 පෙබරවාරි 14 වැනි දින මහජන බැංකුවේ සභාපතිවරයා ලෙස වැඩ භාර ගත්තේය. ඔහු, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම, සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්, සී/ස පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලප්මන්ට්, සී/ස පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් හා සී/ස පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් යන ආයතනවල ද සභාපතිවරයා වේ.

සෙනරත් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියෙකු වන අතර, දැනට අතිගරු ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී ලෙස කටයුතු කරයි. එයට අමතරව ඔහු රජය සතු සී/ස ලිට්‍රෝ ගෑස් ලංකා සහ සී/ස ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) ආයතනවලද සභාපතිවරයා වේ.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක්ද ඔහු සතුව ඇත.

සෙනරත් මහතා උප දිසාපතිවරයෙකු හා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක හා නියෝජ්‍ය පාලක ලෙස කටයුතුකර ඇති අතර, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙහි ලේකම් සහ මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් යන ධූරයන්ද හොබවා ඇත.

## 02. ජෙහාන් පී. අමරතුංග මහතා
අධ්‍යක්ෂ

ජෙහාන් අමරතුංග මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු හා වරලත් කළමනාකරණ ගණකාධිකරණ අධි සාමාජිකයෙකුද වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන මට්ටමේ විභාගයේදී ඉහළම දක්ෂතාව වෙනුවෙන්වන ත්‍යාගය ලබා ඇත.

අමරතුංග මහතා දැනට කොළඹ කොටස් වෙළෙඳපොළේ ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත මුල් පෙළේ යටිතල පහසුකම්, සංවර්ධන සමාගමක්වන MTD වෝකර්ස් ශ්‍රී ලංකා පොදු සමාගමේ විධායක නියෝජ්‍ය සභාපතිවරයා ලෙස සේවය කරයි. ඔහු පීපල්ස් ඉන්ෂුවරන්ස් පොදු සමාග මෙහි වර්තමාන සභාපතිවරයා මෙන්ම පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකුද වේ.

මූල්‍ය හා කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වසර 26කට වැඩි පුළුල් පළපුරුද්ද ඔහු සතු වන අතර, සංස්ථා හා පෞද්ගලික ආයතන විශාල සංඛ්‍යාවක උපදේශකවරයෙකු හා අධ්‍යක්ෂවරයෙකුව සිට ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි ජාතික සමුළුවේදී 'මුදලට අගය ගණකාධිකරණය' යන මැයෙන් ලේඛනයක් ඉදිරිපත් කිරීම ඔහුගේ බොහෝ ජයග්‍රහණ අතරින් එකකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි පාලක සභාවෙහිද ඔහු සාමාජිකයෙකුව සිට ඇත.

## 03. ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය
අධ්‍යක්ෂිකා

2010 මැයි මසදී එල්. කේ. සංගක්කාර මහත්මිය මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවාය. ඇය මහජන බැංකුවේ පරිපාලිත සමාගමක් වන සී/ස පීපල්ස් ට්‍රැවල්ස් පුද්ගලික සමාගමෙහි වර්තමාන සභාපතිනිය වන අතර, සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම හා ශ්‍රී ලංකන් එයාලයින්ස් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙසද සේවය කරන්නීය. ඇය නීතිඥවරියකි.

සංගක්කාර මහත්මිය, සෙලර්ස් ස්පෝට්ස්වෙයාර් ගාමන්ට්ස්, රොන්බ්‍රෝ ඉන්ටර්නැෂනල් ගාමන්ට්ස් හා සන් අයිලන්ඩ් විලේජ් හොලිඩේ රිසෝට් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවලද සේවය කළාය. නීතිය, කළමනාකරණය, අලෙවිකරණය, සත්කාරක කර්මාන්තය හා ඇඟලුම් යන ක්ෂේත්‍රවල වසර 32කට අධික කාලයක පමණ සුවිසල් අත්දැකීම් සම්භාරයක් සංගක්කාර මහත්මිය සතුය.

## 04. ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය
අධ්‍යක්ෂිකා

ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය 2010 මැයි මසදී විධායක නොවන අධ්‍යක්ෂවරියක ලෙස මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවාය. ඇය සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක්ද වන්නීය.

ගම්මන්පිල මහත්මිය පළමු පන්තියේ ගෞරව සාමාර්ථයක් සහිතව නීතිඥවරියක ලෙස සුදුසුකම් ලැබුවාය. ඇය ප්‍රසිද්ධ නොතාරිස්වරියක් හා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් ලේකම්වරියක්ද එංගලන්තයේ හා වේල්සයේ සොලිසිටර්වරියක්ද වන්නීය. එංගලන්තයේ හා ශ්‍රී ලංකාවේ වසර 36කට වැඩි පළපුරුද්දක් ඈ සතුය. ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් ලිමිටඩ්හි සමාගම් ලේකම් ධූරය දරා ඇති ඇය වසර දහතුනක කාලපරිච්ඡේදයක් මුළුල්ලේ ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් සමූහයේ පරිපාලිත සමාගම්වල නීති හා මානව සම්පත් අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරඇත. දැනට වැවිලි, සංචාර,

සංචාරක හා සත්කාරක ක්ෂේත්‍රවලට සම්බන්ධ පුද්ගලික ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කරන අතරම, ආයතනික නීතිය, රැකියා නීතිය හා හිමිකරකරණය යන ක්ෂේත්‍රවල ගම්මන්පිල මහත්මිය සක්‍රීයව කටයුතු කරන්නීය.

## 05. පවර දසනායක මහතා

අධ්‍යක්ෂ

පවර දසනායක මහතා 2011 පෙබරවාරි මසදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවේය.

ඔහු, මහජන බැංකුවේ පරිපාලිත සමාගමක් වන පිපල්ස් ට්‍රැවල්ස් (පුද්.) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකුද වෙයි.

ඔහු ව්‍යාපාර ක්ෂේත්‍රයෙහි වසර 16කට වැඩි පළපුරුද්දක් සතු සුප්‍රකට ව්‍යවසායකයෙකි. දසනායක මහතා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපතිවරයාද වේ.

## 06. ජී. කේ. ඩී. අමරවර්ධන මහතා

අධ්‍යක්ෂ

ගාමිණී කිත්සිරි ඩයස් අමරවර්ධන මහතා 2013 මාර්තු මසදී මහජන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබුවේය. අමරවර්ධන මහතා පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියද කොළඹ විශ්වවිද්‍යාලයෙන් පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයෙන් පොදු ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත.

ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අතර, දැනට සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ඔහුගේ වසර 29ක සේවා කාලය තුළ ඔහු රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, සංවර්ධන පරිපාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ උපදේශක, වෘත්තීය පුහුණු හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්), තරුණ කටයුතු අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සහකාර ලේකම්, මාතර අකුරැස්සේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ යන විවිධ තනතුරු ගණනාවක් හොබවා ඇත.

අමරවර්ධන මහතා ඉතාලිය, ජපානය, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, ඉන්දියාව, නේපාලය, තායිලන්තය, ස්විට්සර්ලන්තය හා කොරියාව යන රටවලදී විදේශීය අත්දැකීම් ලබා ඇත.

දැනට ඔහු අපනයන සංවර්ධන මණ්ඩලයෙහි හා මහජන බැංකුවෙහි පරිපාලිත සමාගමක්වන සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පුද්.) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු මෙන්ම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලෙහි භාරකරු ලෙසද සේවය කරයි.

## 07. ආර්. එම්. පී. රත්නායක මහතා

අධ්‍යක්ෂ

රත්නායක මහතා නෝර්වේහි කෘෂිකර්ම විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු (2000) මෙන්ම ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිධාරියෙකුද (1992) වෙයි.

ඔහු දැනට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන අතර, වසර 19ක් පමණම රාජ්‍ය සේවයෙහි යෙදී සිට ඇත.

රත්නායක මහතා 1994 දී සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට එක්වූයේය. ඔහු ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටි අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස උසස්වීම් ලබා ඉන් අනතුරුව මානව සංවර්ධන පොකුර භාර අධ්‍යක්ෂවරයා ලෙස පත් වූයේය.

2011 ජනවාරි මසදී ඔහු බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ ආසියානු සංවර්ධන බැංකු අංශය භාර අධ්‍යක්ෂවරයා ලෙස වැඩ භාර ගත්තේය. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස හා ශ්‍රී ලංකා ජාතික ජලජ ජීවී වගා සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා සභාවෙහි සාමාජිකයෙකු ලෙසද රත්නායක මහතා සේවය කරයි. දැනට රත්නායක මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි බාහිර උපදේශකවරයෙකු/කථිකාචාර්යවරයෙකු හා ශ්‍රී ලංකා ආර්ථික සංගමයෙහි සාමාජිකයෙකුද වෙයි.

රත්නායක මහතා පර්යේෂණ පත්‍රිකා ගණනාවක්, දේශීය හා ජාත්‍යන්තර සඟරාවල පළ කර ඇත.

## 08. පියදාස කුඩාබාලගේ මහතා

අධ්‍යක්ෂ - වාණිජවේදී (ගෞරව - කැළණිය විශ්වවිද්‍යාලය - *FCA , FCMA, FCPM*

කුඩාබාලගේ මහතා 2013 අප්‍රියෙල් 26 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මහජන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබිණි.

පියදාස කුඩාබාලගේ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි අධි සාමාජිකයෙකි. ඔහු කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී ගෞරව උපාධිධාරියෙකුද වේ. ඔහු ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ හා ශ්‍රී ලංකා සහතික ලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයෙහිද අධි සාමාජිකයෙකි.

කුඩාබාලගේ මහතා සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා, සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික), සීමාසහිත කැන්විල් හෝල්ඩින් (පුද්ගලික), සීමාසහිත සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික), සීමාසහිත ටැප්‍රොබේන් හොටේල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික), සීමාසහිත හෙලැන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සහ කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) යන සමාගම්වල කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී වන අතර පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගමේ සභාපතිවරයා ද වේ. හෙතෙම සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා (පුද්ගලික) හා සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) යන සමාගම්වල විධායක අධ්‍යක්ෂ ධූරයද හොබවයි. ඒ මහතා කලම්බු ඩොක්යාර්ඩ් පොදු සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (පුද්ගලික) සමාගම - මාලදිවයින, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලොප්මන්ට් සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටිස්, සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලවලද සේවය කරන අතර, පී. කුඩාබාලගේ සහ සමාගම, වරලත් ගණකාධිකාරී සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවෙකු ද වේ.

වෙළඳ ක්ෂේත්‍රයෙහි වසර 30කට අධික පලපුරුද්දක් ඔහු සතු වන අතර, ඉහත සමාගම්වල ධූරයන් භාර ගැනීමට ප්‍රථමයෙන් විවිධ ජ්‍යෂ්ඨ තනතුරු ගණනාවක් හොබවා ඇත.

* *මහජන බැංකු පනත යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.*

# ආයතනික කළමනාකාරිත්වය

**අපගේ ආයතනික කළමනාකාරිත්වයෙහි විශිෂ්ට කැපවීම බැංකුව අපේක්ෂා කරන ආයතනික වටිනාකම් වර්ධනය කෙරෙහි විශාල ලෙස දායක වෙයි.**







### එන්. වසන්ත කුමාර් මහතා

**ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි**

එන්. වසන්ත කුමාර් මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකු වන අතර, භාණ්ඩාගාර කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් වසර 32කට වැඩි පළපුරුද්ද ඔහු සතුය. ඔහු 2001 මාර්තු මසදී මහජන බැංකුවේ සේවයට බැඳුණු අතර, එයට පෙර වසර ගණනාවක් කොළඹ ඒඑන්ඉසෙඩ් ග්‍රින්ඩ්ලේස් බැංකුවේ භාණ්ඩාගාරික ලෙස සේවය කළේය.

2011 පෙරබවාරි 22වන දින ඔහු මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි තනතුරට පත්වූයේය.

ඔහු පීපල්ස් ලීසිං පොදු සමාගම, සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් හා සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) යන සමාගම්වලද ණය තොරතුරු කාර්යාංශයේ හා ජාතික ගෙවීම් සභාවේද අධ්‍යක්ෂවරයෙකි. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි පාලන මණ්ඩලයෙහි ඔහු සාමාජිකයෙකි. වර්තමානයේ ඔහු ලංකා මූල්‍ය සේවා කාර්යාංශයේ, සී/ස ෆයිනෑන්ෂල් ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා (ඇපයෙන් සීමිත) සහ සී/ස ශ්‍රී ලංකා බැංකු සංගමය (ඇපයෙන් සීමිත) යන ආයතනවලද සභාපතිවරයා වේ.

ඔහු ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ හිටපු සභාපතිවරයෙකු වේ.

### අහමඩ් සබ්රි ඉබ්‍රාහිම් මහතා

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - අවදානම් කළමනාකරණ**

දේශීය හා විදේශීය වශයෙන් මූලික වශයෙන්ම ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය හා අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර 30කට වැඩි බැංකු සේවා පළපුරුද්දක් ඉබ්‍රාහිම් මහතා සතුය. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ගෞරව උපාධිධාරියෙකු වන අතර, එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (FCIB) අධි සාමාජිකයෙකුවේ.

### දීපාල් අබේසේකර මහතා

**අලෙවි, මහජන කටයුතු හා ආයතනික සමාජ වගකීම් අංශ ප්‍රධානී**

බැංකුවේ අලෙවි හා මහජන කටයුතු භාර ප්‍රධානියා වඩාත් ප්‍රසිද්ධව සිටින්නේ සන්නම් ගොඩනැගීම හා උපායමාර්ගික ව්‍යාපාරය සංවර්ධනය සඳහා ඔහු සතු හැකියාව සම්බන්ධයෙනි. මූල්‍ය අංශයේ ආයතනවල අලෙවිකිරීම් සංවිධානය කිරීම් හා අලෙවි ප්‍රවර්ධන හා උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධන මෙහෙයුම්වල වගකීම ඔහු දරා ඇති අතර, ආයතනික සන්නාම අගයෙන් ඒවායේ ඉහළම තත්ත්වයට සාර්ථක ලෙස මෙහෙයවා ඇත. ඔහු වරලත් අලෙවි ප්‍රවර්ධන නිලධාරියෙකු මෙන්ම එ.ජ. වරලත් අලෙවිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු සහ වරලත් කළමනාකරණ අධ්‍යයන ආයතනයේ (CMI - UK) සහ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CMA) සාමාජිකයෙකු ද වේ.

ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත. දැනට ඔහු කළමනාකරණ සංගමයේ (TMC) කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධුරය හොබවන අතර, වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සභා සාමාජිකයෙකු හා එක්සත් රාජධානියේ ගෝලීය අලෙවිකරණ ජාලයෙහි මෙරට උපදේශක හා සභා සාමාජිකයෙකු වෙයි.



## චාන්දනී වේරපිටිය මහත්මිය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයතනික බැංකුකරණය**

අක්වෙරළ බැංකු කටයුතු ඒකකයද ඇතුළුව සමස්ත බැංකුවේ ආයතනික ණය අංශ, චාන්දනී වේරපිටිය මහත්මිය යටතේ පවතී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක්ද, කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක්ද ඇය ලබා ඇති අතර, AIB ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරණ සුදුසුකම්ද ඈ සතුය.

1987 ජූනි මස දී කළමනාකරණ පුහුණුව ලබන්නෙකු ලෙස බැංකුවට එක් වූ ඇය සතුව ගනුදෙනුකාර සේවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය/ව්‍යාපෘති ණයදීම්, ශාඛා මෙහෙයුම්, ආයතනික හා ජාත්‍යන්තර බැංකුකරණය හා ණය කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර 25කට ආසන්න පළපුරුද්ද ඇත.

ඇය දැනට බැංකුවෙහි ආයතනික බැංකුකරණයට නායකත්වය දෙන්නීය.



## කේ. බී. රාජපක්ෂ මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දේශීය ණය**

රාජපක්ෂ මහතා දේශීය ණය දෙපාර්තමේන්තුව භාරව සිටී. කළමනාකරණ පුහුණුව ලබන්නෙකු ලෙස ඔහු බැංකුවේ සේවයට එක්වූ අතර, මහජන බැංකුවේ වසර 26 ක පළපුරුද්ද ඔහු සතුය.

රාජ්‍ය පරිපාලනය පිළිබඳ දෙවන පෙළ ගෞරව (විද්‍යාවේදී) උපාධිධරයකු වන ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයෙකුද ශ්‍රී ලංකාවේ නීතිඥවරයෙකුද ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාධාරියෙකුද වේ.

බැංකුවේ කළමනාකරණ මට්ටමේ විවිධ තනතුරුවල පුළුල් පළපුරුද්දක් ලබා ඇති ඔහු වර්තමානයේ බැංකුවේ දේශීය ණය හා ණය කාඩ්පත් කටයුතු අංශයේ ප්‍රධානියා ලෙස සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධ්‍යක්ෂවරයෙකු හා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙහි ප්‍රත්‍යාවර්ථ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.



## එස්. ඒ. ආර්. එස්. සමරවීර මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්**

සමරවීර මහතා මානව සම්පත් අංශය භාරව සිටියි. කළමනාකරණ පුහුණු නිලධාරියෙකු ලෙස බැංකුවට බැඳුණු ඔහු සතුව 26 වසරකට වැඩි සේවා පළපුරුද්ද ඇත. ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන බැංකුකරණය හා ණය ආපසු අයකර ගැනීම යන ක්ෂේත්‍රවල ඔහු මෙම කාලය තුළ සේවයකර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී උපාධිය ලබා ඇති ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයෙකුද වෙයි.

දේශීය හා විදේශීය වශයෙන් ඔහු ලබා ඇති විවිධ නිරාවරණ අවස්ථා අතර, කළමනාකරණ සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කළමනාකරණය, දුර්වල ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම හා උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ අවස්ථා වේ.



## ටී. ඒ. ආරියපාල මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – සමුපකාර හා සංවර්ධන බැංකුකරණය**

ආරියපාල මහතා සමුපකාර හා සංවර්ධන බැංකුකරණය භාරව සිටී. බැංකුවේ ඔහුගේ සේවා පළපුරුද්ද වසර 35ට අධිකය.

ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරියෙකු හා නීතිවේදී උපාධිධාරියෙකු වේ.

නීතිඥවරයෙකුවන ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (FIBSL) අධි සාමාජිකයෙකි. හෙතෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණවේදීන්ගේ ආයතනයේ (MAAT) ආශ්‍රිත සාමාජිකයෙක්ද වේ.

සමූපකාර, ව්‍යාපෘති ණය, ක්ෂුද්‍ර මූල්‍ය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, මානව සම්පත් කළමනාකරණය සහ ශාඛා ව්‍යාපාර/බැංකුකරණය යන ක්ෂේත්‍රවල පුහුණුව හා ඊට නිරාවරණයවීම ඔහු දේශීය හා විදේශීය වශයෙන් පුළුල් ලෙස ලබා ඇත. ඔහු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුද, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි පාලන මණ්ඩලයෙහි ප්‍රත්‍යාවර්ථ අධ්‍යක්ෂවරයකුද මෙන්ම සමුපකාර ග්‍රාමීය බැංකු නියාමන ජාතික කමිටුවේ සාමාජිකයෙකුද වේ.



## රොහාන් පතිරගේ මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

පතිරගේ මහතා 2010 අගෝස්තු මසදී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත්කරන ලදී. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිධාරියෙකුද (L.L.B.), නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයෙන් බැංකුකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකු හා බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකුද වේ. ඔහු නීතිඥවරයෙකි.

ඔහු සී/ස පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම, සී/ස පීපල්ස් මර්ලිට් මැනේජ්මන්ට්, සී/ස පීපල්ස් ප්‍රොපටි ඩිවලප්මන්ට්, සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් හා සි/ස පීපල්ස් ට්‍රැවල්ස් යන සමාගම්වල සමාගම් ලේකම්ද වේ.

බැංකුවේ වසර 18 කට අධික සේවා පළපුරුද්ද ඔහු සතුව ඇත.



## ශ්‍රීමා අර්සකුලරත්න මහත්මිය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අනුකූලතාව**

අර්සකුලරත්න මහත්මිය දෙවැනි ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරිනියක වශයෙන් බැංකුවේ සේවයට පත්වී එහි වසර 28 කට වැඩි සේවා කාලයක් සපුරා ඇත.

පසුගිය වසර 32 මුළුල්ලේ ඇය එක්සත් රාජධානි කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ වරලත් ආයතනයේ සම සාමාජිකාවක්ව සිට ඇත. ඇය වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරියක් වන අතර ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බලපත්‍ර ලාභිනියකද වන්නීය. නීතිඥවරියක වන ඇය ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිය ලබා සිටින්නීය.

කළමනාකරණ/මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ තොරතුරු, මෙහෙයුම් හා පරිපාලන යන ක්ෂේත්‍රවල ඇය පුළුල් අත්දැකීම් ලබා ඇත. බැංකුවේ සේවයට එක්වීමට පෙර ලංකා පිඟන් සංස්ථාවේදී ඇය වෘත්තීය පුහුණුව ලැබුවාය.

ඇය ලංකා ධීවර සංස්ථාවේ හා ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනයෙහි ගණකාධිකාරී ලෙසද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ විශේෂ ශ්‍රේණියේ ගණකාධිකාරී ලෙසද සේවය කළාය.



### ජී. පී. ආර් . ජයසිංහ මහත්මිය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -**
**සිල්ලර බැංකුකරණ බැංකු කටයුතු**

රේණුකා ජයසිංහ මහත්මිය 1987දී කළමනාකරණ පුහුණුවන්නියක ලෙස බැංකුවේ සේවයට එක්වූ අතර මහජන බැංකුවේ වසර 26කට වැඩි සේවා පලපුරුද්දක් ඇය සතුව ඇත.

ඇයගේ සේවා කාලයේදී ඇය ශාඛා බැංකුකරණ ක්ෂේත්‍රයෙහි ශාඛා කළමනාකරු, කලාපීය ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු සහායක සේවා) මට්ටම්වල සේවය කර ඇත. 2011 සිට ඇය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සිල්ලර බැංකු කටයුතු ලෙස කටයුතු කර ඇත.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පළමු පෙළ ගෞරව වාණිජ උපාධිධාරිනියක වන අතර, ශ්‍රී ලංකා AIB වෘත්තීය බැංකුකරණ සුදුසුකම් ඈ සතුය. ශ්‍රී ලංකා වෘත්තිය බැංකුකරුවන්ගේ සංගමයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ඇය යාවජීව සාමාජිකාවකද වන්නීය.

ඇයගේ බැංකු සේවය අතරතුර දී ඇය විවිධ දේශීය හා විදේශීය වැඩසටහන්වලට සහභාගිවී ඇත.



### ක්ලයිව් ෆොන්සේකා මහතා

**භාණ්ඩාගාර හා ආයෝජන**
**බැංකුකරණ ප්‍රධානී**

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි සාමාජිකයෙකු වන ෆොන්සේකා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. තවද ACI ගනුදෙනු සහතිකය වෙනුවෙන් විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇති ඔහු සතුව භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳව වසර 20කට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු 2002 දී මහජන බැංකුවේ සේවයට බැඳුණු අතර, එයට පෙර ඇමෙරිකන් එක්ස්ප්‍රස් හා ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවල සේවය කළේය.



### එම්. ඒ. බොනිෆස් සිල්වා මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -**
**මෙහෙයුම්**

සිල්වා මහතා 1987දී කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස බැංකුවට බැඳුණු අතර මහජන බැංකුවේ වසර 25කට වැඩි කාලයක් සේවය කර ඇත.

ඔහුගේ වසර 25කට වැඩි පළපුරුද්ද ශාඛා කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු, කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී යන මට්ටම්වලින් ශාඛා ව්‍යාපාර බැංකුකරණ ක්ෂේත්‍ර ආවරණය කරන අතර දැනට ඔහු මහජන බැංකු ශාඛා ජාලය භාරව සිටී.

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් හා AIB - ශ්‍රී ලංකා වෘත්තිය බැංකුකරණ සුදුසුකම් ද ලබා ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වෙයි.

ඔහුගේ සේවා කාලය තුළදී ඔහු ශාඛා ව්‍යාපාර/බැංකුකරණය පිළිබඳව පුළුල් වශයෙන් දේශීය හා විදේශීය පුහුණුව හා නිරාවරණ අවස්ථා ලබා ඇත.



## බී. එම්. ප්‍රේමනාත් මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
බැංකු සහායක සේවා**

බී. එම්. ප්‍රේමනාත් මහතා මහජන බැංකුවේ වසර 26කට අධික කාලයක් සේවය කර ඇත. කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස ඔහු 1987දී බැංකුවට බැඳුණු අතර, කළමනාකරු වශයෙන් තණමල්විල, හසලක, අකුරණ, පිළිමතලාව හා පේරාදෙණිය ශාඛාවලද, සහකාර ප්‍රාදේශීය කළමනාකරු ලෙස මාතලේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේද, ප්‍රාදේශීය කළමනාකරු ලෙස පොළොන්නරුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේද, සහකාර සාමාන්‍යාධිකාරී (මධ්‍යම කලාපය) ලෙස ද බැංකුවට සේවයකර ඇත. 2012 ජූලි 16 වැනි දින සිට ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු සහායක සේවා ලෙස උසස් කරන ලදී.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් දෙවැනි පෙළ ඉහළ පංති සාමාර්ථයක් සහිතව වාණිජවේදී උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර් පරීක්ෂණයෙන්ද සමත්ව සිටී.

ඔහුගේ බැංකු වෘත්තීය කාලසීමාව තුළදී දේශීය හා විදේශීය යන දෙවර්ගයේම විවිධ නිරාවරණ වැඩසටහන්වලට සහභාගි වී ඇත.



## එන්. එස්. තිලකරත්න මහත්මිය

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

2012 ජුනි 15 දින සිට නන්දනී තිලකරත්න මහත්මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත්කරනු ලැබුවාය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක වන ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දෙවන පෙළ ගෞරව (විද්‍යාවේදී කළමනාකරණ) උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකාවක වන්නීය. ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ තාක්ෂණික සහයෝගිතාව ඇතිව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිරිනැමෙන තොරතුරු පද්ධති ආරක්ෂක පාලන හා විගණන ඩිප්ලෝමාව ඇය ලබා සිටින්නීය.

1990 මාර්තු මසදී සහකාර මූල්‍ය නිලධාරිනියක ලෙස ඇය බැංකුවේ සේවයට එක්වූ අතර, ව්‍යාපෘති ණයදීම් හා විගණන ක්ෂේත්‍රයේ ආසන්න වශයෙන් වසර 24ක පළපුරුද්දක් ලබා සිටින්නීය.



## ජී. ඒකනායක මහත්මිය

**ප්‍රධාන නීති නිලධාරිනී**

ශ්‍රදානා ඒකනායක මහත්මිය නීතිඥවරියක වන අතර, ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය (L.L.B.) ලබා ඇත.

වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ලද (L.L.M.) උපාධියද, ජාත්‍යන්තර වෙළඳ නීතිය, බැංකුකරණය හා රක්ෂණය පිළිබඳව ඩිප්ලෝමා දෙකක් හා එක්සත් රාජධානියේ සොලිසිටර් අවසාන පරීක්ෂණ සාමාර්ථයද ඇය සතුය.

විජේසිංහ සහ ජයසේකර හා ද සිල්වා සහ ගුරුසිංහ නීතිඥ සමාගම්වල වෘත්තීය සහායිකාවක ලෙස ඇය ඇගේ වෘත්තීය දිවිය ඇරඹුවාය. නීති නිලධාරිනියක ලෙස ඇය ශ්‍රී ලංකා සීනි සංස්ථාවට එක් වූවාය.

ඉන් අනතුරුව 1985දී මහජන බැංකුවට එක්වූ ඇය ගාල්ල, මාතර හා කොළඹ පිටත කලාපවල ආයතනික බැංකු අංශයෙහි සේවයකර දැනට ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව සිටින්නීය.

ඇගේ පළපුරුද්ද, බැංකුකරණ නීතිය, ණය, ආපසු අයකර ගැනීම්, ආයතනික නීතිය හා කම්කරු නීතිය සහ වාණිජ ගිවිසුම් යන ක්ෂේත්‍ර ආවරණය කරයි.







### ජී. බී. ආර්. පී. ගුණවර්ධන මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –**
**ණය පාලන සහ අවදානම්**

රසිත ගුණවර්ධන මහතා වසර 26කට වැඩි කාලයක් බැංකුවේ සේවයකර ඇත. ඔහු 1987දී ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරියෙකු ලෙස බැංකුවේ සේවයට බැඳුනේය.

බැංකුවේ කටයුතුවලදී ඔහු අත්දැකීම් ලත් ක්ෂේත්‍ර අතරට මූල්‍ය, කාර්යසාධන කළමනාකරණ, ආයතනික සහ වාණිජ ණය, භාණ්ඩාගාර මෙහෙයුම් සහ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ණය පාලන කාර්යයන් හා අවදානම අයත්වේ.

මහජන බැංකුවේ සේවයට බැඳීමට ප්‍රථමයෙන් ඔහු පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම සංචාරක සහ හෝටල්, වැවිලි කළමනාකරණ සහ ඉදිකිරීම් යන ක්ෂේත්‍ර ආවරණය කරමින් පළපුරුද්ද ලබා ඇත.

ඔහු එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වේ. ඔහු ACI භාණ්ඩාගාර මෙහෙයුම් සහතිකයෙන් විශිෂ්ට සාමාර්ථ ලබා ඇත.

### ලයනල් ගලගෙදර මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –**
**ණය අය කරගැනීම්**

ලයනල් ගලගෙදර මහතා බැංකුවේ ණය අය කරගැනීම් අංශය භාරව සිටී. ඔහු කළමනාකරණ පුහුණුවන්නකු ලෙස බැංකුවේ සේවයට බැඳුණු අතර වසර 26කට අධික කාලයක් සේවයකර ඇත. ඔහු පළපුරුද්ද ලැබූ විවිධාකාර ක්ෂේත්‍ර අතරට සිල්ලර බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ණයදීම්, ණය පාලන සහ අය කරගැනීම් අයත්වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීති උපාධියක් ඔහු ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු මෙන්ම නීතිඥවරයෙකුද වේ.

### ජී. ජී. මංගල මහතා

**මූල්‍ය අංශයේ ප්‍රධානී**
**(2014 මාර්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි)**

ජී. ජී. මංගල මහතා 2014 මාර්තු මසදී මූල්‍ය අංශයේ ප්‍රධානී ලෙස බැංකුවට එක් වූයේය. බැංකුකරණය පිළිබඳ වසර 24කට අධික පළපුරුද්දක් ඔහු සතුවන අතර ඉන් වැඩි ප්‍රමාණයක් ලබා ඇත්තේ විදේශයන්හිදීය. ඔහු ඕමාන්හි HSBC බැංකුවේ මූල්‍ය පාලක වූ අතර ඕමානයේ සොහාර් බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ පෑන් ඒෂියා බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර හොබවා ඇත.

ඔහු විශේෂඥභාවය දක්වන ක්ෂේත්‍ර අතරට වත්කම් බැරකම් කළමනාකරණය, උපාය මාර්ගික සැලසුම්කරණය, මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය, අයවැය සැකසීම හා කාර්යසාධන විශ්ලේෂණය අයත්ය.

ඔහු, එක්සත් රාජධානියෙහි කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ වරලත් ආයතනයෙහි අධි සාමාජිකයෙකි.



**සෝභිත වීරසේකර මහතා**

**වැඩබලන ප්‍රධානී -**
**තොරතුරු තාක්ෂණ**

2007 වර්ෂයේදී සෝභිත වීරසේකර මහතා මහජන බැංකුවේ සේවයට එක්වූ අතර 2010 සැප්තැම්බර් මාසයේදී ඔහු තොරතුරු තාක්ෂණ අංශයේ වැඩබලන ප්‍රධානී තනතුරට පත් විය.

වීරසේකර මහතාට බැංකු අංශයේ වසර 26ක පළපුරුද්දක් ඇත. බැංකු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට ඔහු ලද පුළුල් නිරාවරණ අවස්ථා හැරුණු කොට ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ විද්‍යා ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියද, FBCS, MACS හා වෘත්තීය බැංකුකරණය (ACBF) උපාධියද ලබා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික ගෙවීම් සභාව, බැංකු තාක්ෂණික උපදේශක කමිටුව ඇතුළු විවිධ තාක්ෂණික ඇගයීම් කමිටුවල වීරසේකර මහතා මහජන බැංකුව නියෝජනය කරන අතර, SWIFT භාවිතා කරන්නන්ගේ කණ්ඩායමේ උප සභාපති ලෙස කටයුතු කරයි.



**සුනිල් වන්නිආරච්චි මහතා**

**වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -**
**ජාත්‍යන්තර බැංකුකරණය**

සුනිල් වන්නිආරච්චි මහතා 1987දී කළමනාකරණ පුහුණුව ලබන්නෙකු ලෙස බැංකුවට එක්වී ශාඛා බැංකුකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජන ණයදීම්, ජාත්‍යන්තර බැංකුකරණය, වෙළඳ මූල්‍ය හා කල්බදු ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක කටයුතු කළේය. ණයදීම් හා අක්වෙරළ බැංකුකරණ ක්‍රියාකාරකම් සම්බන්ධ විශාල පලපුරුද්දක් ඔහු අත්කරගෙන ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (විශේෂ) උපාධිධරයෙකු වන ඔහු උපාධිය ලබා නොබෝ කලකින්ම එම විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා නිදර්ශකයෙකු සහ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළේය.

ඔහුද කොළඹ විශ්ව විද්‍යාලයෙන් සිය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. හෙතෙම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයෙකි.

බැංකු සේවා කාලය අතරතුරදී ඔහු, සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජන හා ව්‍යාපෘති ණයදීම්, ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් තක්සේරුව, යටිතල පහසුකම් ව්‍යාපෘති මූල්‍යකරණය, වෙළඳ මූල්‍ය අවදානම් කළමනාකරණය යනාදිය ඇතුළුව දේශීය හා විදේශීය වැඩසටහන් ගණනාවකට සහභාගිවී හැදෑරීම් කර ඇත.



**යොහාන් ඒ. සෝසා මහතා**

**2014 මාර්තු දක්වා මූල්‍ය අංශයේ ප්‍රධානී**

2007 මැයි මස සිට බැංකුවේ මූල්‍ය අංශයේ ප්‍රධානියා ලෙස සෝසා මහතා බැංකුවට එක් වූයේය.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකි. මූල්‍ය, කළමනාකරණ තොරතුරු, උපාය මාර්ගික සැලසුම් කිරීම සහ හිමිකරු ප්‍රාග්ධනය පිළිබඳ පර්යේෂණ යන විෂය ක්ෂේත්‍රයන්හි පලපුරුද්ද ඔහු සතුය. LOLC සමූහ ව්‍යාපාරයට එක්වීමට පෙර අර්නස්ට් ඇන්ඩ් යංග් වෙතින් ඔහු මෙම වෘත්තීය පුහුණුව ලැබූ අතර, මහජන බැංකුවට එක් වීමට පෙර සී/ස AMBA රිසර්ච් ලංකා සමාගමේ උපසභාපතිවරයා ලෙස සේවය කළේය.

# විධායක කළමනාකාරිත්වය හා කලාපීය කළමනාකාරිත්වය

**වඩාත්ම තීරණාත්මක දේ. එනම්, කැපී පෙනෙන සේවාවන් හා වඩාත්ම අභියෝගාත්මක කාර්යයන් ඉටු කිරීම සඳහා විසඳුම් බැංකුව සපයන බව සහතික කිරීමෙහි සක්‍රියව යෙදී සිටී.**



**එස්. ප්‍රතාපසිංහ මිය**

සහකාර සාමාන්‍යාධිකාරිනී -
ණය ආයතනික බැංකු අංශය



**එස්. ඩබ්ලිව්. ඒ. ඩී. එස්. කළ්‍යාණි මිය**

සහකාර සාමාන්‍යාධිකාරිනී -
මූල්‍ය හා කළමනාකරණ ගිණුම්



**එච්. සී. ප්‍රනාන්දු මයා**

සහකාර සාමාන්‍යාධිකාරී -
අලෙවිකරණ හා නිමැවුම් සංවර්ධන



**ඩබ්ලිව්. කේ. එස්. බී. නන්දන මයා**

නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී -
අය කිරීම්



**ඒ. ඩබ්ලිව්. විපුලගුණ මයා**

නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී -
මානව සම්පත් හා මෙහෙයුම්



**ජී. ඒ. ඩී. ජේ. ප්‍රියශාන්ත මයා**

නියෝජ්‍ය ප්‍රධාන අභ්‍යන්තර විගණක



**පී. ආර්. මදුරාවල මිය**

සහකාර සාමාන්‍යාධිකාරිනී -
ණය පාලන



**එන්. සී. මුදලිගේ මිය**

සහකාර සාමාන්‍යාධිකාරිනී -
ශාඛා මෙහෙයුම්



**ටී. කේ. නාරන්ගොඩ මිය**

සහකාර සාමාන්‍යාධිකාරිනී -
ණය ඒකක I - ආයතනික බැංකු අංශය



### ඒ.එස්. ලියනාරච්චි මිය

සහකාර සාමාන්‍යාධිකාරිනී -
ණය ඒකක II - ආයතනික බැංකු අංශය



### එස්. ජේ. කරුණාරත්න මයා

සහකාර සාමාන්‍යාධිකාරී - බැංකු සහායක සේවා
(2013.10.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගාල්ල
ප්‍රා.ප්‍ර.කා. ට තාවකාලිකව අනුයුක්ත කර සිටී.)



### ඩී. වයි. එස්. මෙන්ඩිස් මිය

සහකාර සාමාන්‍යාධිකාරිනී -
මෙහෙයුම්



### කේ. එන්. සේනාරත්න මිය

සහකාර සාමාන්‍යාධිකාරිනී -
වත්කම් නිමැවුම්



### පී. ආර්. එස්. ජයතිස්ස මයා

සහකාර සාමාන්‍යාධිකාරී -
මානව සම්පත් පරිපාලන



### පී. එස්. ජේ. කුරුකුලසූරිය මිය

සහකාර සාමාන්‍යාධිකාරිනි -
මානව සම්පත් සංවර්ධන



### ආර්. එම්. ඒ. කේ. බණ්ඩාර මයා

සහකාර සාමාන්‍යාධිකාරී -
මෙහෙයුම්



### ජී. එම්. ආර්. පී. විජේරත්න මිය

ප්‍රාථමික වෙළෙඳ අංශය නියෝජ්‍ය ප්‍රධානී -
භාණ්ඩාගාරය



### එල්. විතාන මයා

වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී -
විමර්ශන සහ විමසීම්



**ආර්. එම්. එස්. බී. රත්නායක මයා**

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරි -
මධ්‍යම පළාත



**ආර්. රණතුංග මයා**

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරි -
බස්නාහිර කලාපය I



**ඩබ්ලිව්. එම්. එස්. වීරකෝන් මයා**

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරි -
උතුරු මැද කලාපය



**ටී. ඩී. ද ඉසෙඩ්. ගුණවර්ධන මයා**

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරි -
බස්නාහිර කලාපය II



**එන්. ජී. දිසානායක මයා**

කලාපීය සහකාර සාමාන්‍යාධිකාරි -
වයඹ කලාපය

# ව්‍යාපාර සමාලෝචනය

**මහජනයා සමග සිටින මහජනයා වෙනුවෙන්වූ බැංකුවක්වීමේ අන්තර්ගත ආකල්පයට අපි අතිශයින් ම කැපවී සිටින අතර එය 'සියළු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ සලසන' අපගේ නිපැයුම් හා සේවා කළඹ සැකසීමට අපව යොමුකර ඇත.**

**එනමුත් අප කේන්ද්‍රගතවී සිටින්නේ හුදෙක් සහාය සැපයීමෙන් ඔබ්බට ගිය අරමුණක් කෙරෙහිය. එනම් අප්‍රමාණ ප්‍රජාවන්, කර්මාන්ත හා සාර්ව අර්ථයෙන් ජාතිය වෙත ප්‍රතිලාභ ගලා යාමට සලස්වන අතරම අපගේ පාර්ශ්වකරුවන් සමග අපගේ මැදිහත්වීම් ඔවුනට සෘජුවම ප්‍රතිලාභ සලසන බවට වගබලාගැනීම කෙරෙහිය.**

දශක පහකට මඳක් වැඩි කලකට පෙර මහජන බැංකුව උපත ලැබූ අවස්ථාවේදී එය පිහිටුවන ලද්දේ බැංකු විසින් සැපයෙන සහාය භාවිතා කරමින් මහජනයාට තමන් වෙනුවෙන් සවිබලගැන්වීමේ පරිසරයන් නිර්මාණය කරගැනීමට ඔවුන්ගේ ශක්තීන් යොදා ගන්නා අතර ඔවුන්ගේ ජීවිත නගා සිටුවීම උදෙසා අවස්ථා ඉදිරිපත් කරමින් රටේ මහජනයාට හවුල්කරුවෙකු වීමේ අන්තර්ගත ආකල්පය මතය. එනමුත් අප කේන්ද්‍රගත වී සිටින්නේ හුදෙක් සහාය සැපයීමෙන් ඔබ්බට ගිය අරමුණක් කෙරෙහිය. එනම් අප්‍රමාණ ප්‍රජාවන්, කර්මාන්ත හා සාර්ව අර්ථයෙන් ජාතිය වෙත ප්‍රතිලාභ ගලා යාමට සලස්වන අතරම අපගේ පාර්ශ්වකරුවන් සමඟ අපගේ මැදිහත්වීම් ඔවුනට සෘජුවම ප්‍රතිලාභ සලසන බවට වගබලාගැනීම කෙරෙහිය.

අපගේ පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් සමඟ සක්‍රියව සම්බන්ධව කටයුතු කිරීම, පරම්පරා ගණනක් තිස්සේ අපගේ පාර්ශ්වකරුවන් සමඟ ජීවිත කාලයටම පවතින සබඳතා ගොඩනගා ගනිමින් ඔවුන්ගේ ගමන හා අපද වෙන් කළ නොහැකි අයුරින් බැඳී පවතින පරිදි අපගේ ගමන සැලසුම් කිරීම සඳහා අපට දුර දක්නා නුවණ හා ශක්තිය ලබා දෙයි. මෙය අපගේ පැවැත්ම සඳහා හේතුපාදක කරුණාවේ. මන්ද, අප මහජනයා වෙනුවෙන්වූ මහජනයා විසින් ක්‍රියාත්මක කෙරෙන හා 'සැමට ප්‍රතිලාභ පිණිස' පැවතීමේ ආකල්පය මත ගොඩනගන ලද බැංකුවක් වනබැවිනි.

## පුද්ගල බැංකුකරණය

සෑම ජන වින්‍යාසයක්ම, වයස් මට්ටමක්ම, භූගෝලීය පිහිටීමක්ම, ස්ත්‍රී හා පුරුෂ සමාජභාවයක්ම, දැනුම් මට්ටමක්ම හා සමාජ ආර්ථික මට්ටමක්ම ඇතුළත්කර ගනිමින් අසමසම සේවා විශිෂ්ටත්වයෙන් වර්ධනය කරන ලද අපගේ නිපැයුම් කළඹ පුළුල් හා විවිධාකාරවේ. සැමට ප්‍රතිලාභ සලසනු ඇත්තාවූ ආයතනයක් නිර්මාණය කිරීමට වෙරදරා ඇති බැංකුවක්වන හෙයින් බැංකුවේ තරඟකාරී භාවය දශක පහක් තිස්සේ අඛණ්ඩව මුවහත්වී ඇත. ජනතාව සමග සිටින ජනතාව වෙනුවෙන්වන බැංකුවක්වීමේ අන්තර්ගත ආකල්පයට අප තවදුරටත් අතිශයින්ම කැපවී සිටින අතර අපගේ ගනුදෙනුකාර භවතුන්ගේ ඉලක්ක හා අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමට පෙළගැසී සිටිමින් ගනුදෙනුකාර භවතකුගේ දිවියේ තොටිල්ලේ සිට සැඳෑ සමය තෙක්ම හවුල්කරුවෙකු වීමේ අංග ඒකාබද්ධකර ගැනීම පිණිස පුද්ගල බැංකුකරණ නිපැයුම් කළඹක් සංවර්ධනය කිරීමට එම අන්තර්ගත ආකල්පය අපව මෙහෙයවා ඇත.

ණය කාඩ්පත්වල සිට පුද්ගල ණය දක්වා, ඉතුරුම් තැන්පතුවල සිට ස්ථාවර තැන්පතු දක්වා හා බාල වයස්කාර ඉතුරුම් ගිණුම්වල සිට විශ්‍රාම සැලසුම් දක්වා අපගේ නිපැයුම් කළඹ සකස්කර ඇත්තේ අපගේ ගනුදෙනුකාර භවතුන්ට ඔවුන්ගේ බැංකුකරණ අවශ්‍යතා හොඳම අයුරින් ඉටුකර ගැනීමට සහාය වීමටයි. දශක ගණනාවක් පුරා බැංකුවේ විශිෂ්ටත්වයෙහි සලකුණක් බවට පත්ව ඇති ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් සේවාව, නැගී එන ප්‍රවණතා හා අපේක්ෂාවන් පිළිබඳව

සවිඥානකව සිටින අතර ඔවුනගේ විවිධාකාර අවශ්‍යතා සක්‍රියව ඉටු කරමින් දිගුකාලීන සබඳතා ගොඩනගා ගැනීමට අපට සහාය වන විශේෂඥභාවය වේ.

තාක්ෂණය නූතන බැංකුකරණයෙහි කොඳුනාරටිය වීමත් සමග වසර ගණනක් මුළුල්ලේ තාක්ෂණය වෙනුවෙන් අප කරන ලද නුවණැති ආයෝජන හේතුවෙන් ඕනෑම වේලාවක ඕනෑම තැනකදී බැංකුකරණය වෙනුවෙන් පහසු, කාර්යක්ෂම, ප්‍රවේශය සහිත, කාවැදුණු හා කරදරවලින් තොර නිපැයුම් අපගේ ගනුදෙනුකාර භවතුන් වෙත ඉදිරිපත් කරනු ලැබේ. අන්තර්ජාල බැංකුකරණය, අත්ල මත බැංකුකරණය, වීසා හර කාඩ්පත්, ජංගම බැංකුකරණය හා කෙටි පණිවුඩ බැංකුකරණය මෙයට ඇතුළත්වේ. විදේශගත ශ්‍රමිකයන් සඳහා වන සහතික කළ ආධාරකයක් වන 'විගමනික හර කාඩ්පත' නිකුත් කිරීම සඳහා මේ වසරේදී අප විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමග හවුල්වීමත් මෙය මනාව තහවුරු කරන කරුණකි.

ආයතනික ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් සේ.අ.අ. හා සේ.භා.අ. මෙන්ම රේගු බදු ගෙවීම් අන්තර්ජාලය මඟින් කිරීමේ පහසුකම් එක් කරනු ලැබ තිබේ.

## කාඩ්පත් ව්‍යාපාරය

මෙම වසර තුළ මිලියනයකට අධික හර කාඩ්පත් නිකුත් කිරීමේ සැතපුම් කණුව ජයග්‍රාහීව සමරමින්, සහ ශ්‍රී ලංකාවේ කාඩ්පත් ව්‍යාපාරයෙහි දශක දෙකකට අධික කාලයක් ක්‍රියාකාරීව නිරතවෙමින්, පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා, සැලසුම් කරන ලද උපාය මාර්ග ක්‍රියාත්මක කරමින් බැංකුව අතිශයින්ම සක්‍රියව කටයුතුකර ඇත. ගනුදෙනුකාරභවතුන්ට වැඩි වටිනාකමක් සහිත සේවාවන් ලබා දීම පිණිස බැංකුව සිය සුවිසල් අප බැංකුවට පමණක් සීමාවූ හිමිකරු කාඩ්පත් පදනම වීසා හර කාඩ්පත් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටියි. පෙරමුණ ගත් ජාත්‍යන්තර ගෙවුම් සන්නාමයන් සමඟ හවුල්වීම මඟින් බැංකුව සිය සැලසුම් හරහා වඩාත් පහසුකම්වලින් යුත් හා ගුණාත්මක නිමැවුමක් සැපයීමෙන් වෙළෙඳපොළට වඩාත් හොඳින් අවතීර්ණ වීම සඳහා වන අපගේ අරමුණ සාක්ෂාත් කිරීමට සැලසුම්කර ඇත. මෙම සැලසුම් කරන ලද උපක්‍රම, ගෙවීම් කාඩ්පත් පදනම ව්‍යාප්ත වීමද උපකාරී වනු ඇති අතර එය දිවයිනේ ප්‍රමුඛ ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නා බවට පත්වීමට බැංකුවට මං පෙත් හෙළි කරනු ඇත.

වර්තමාන කළඹ යටතේ, අවම ගාස්තු වලින් යුතුව තරඟකාරී නිපැයුම් ගුණාංග ඇතුලත්කර අප බැංකුව පුළුල් පදනමක් ඇති ගනුදෙනුකරුවන් හට වීසා ක්ලැසික් හා ගෝල්ඩ් ණය කාඩ්පත් නිකුත් කරයි. අපගේ කාඩ්පත්, වෙළෙඳපොළේ සියළුම ආදායම් ආවරණය වන පරිදි කාණ්ඩ නිකුත් කරනු ලබන අතර වෙළෙඳපොළ තුළට අවතීර්ණ වීම සුවිශේෂී ලක්ෂණයක් වශයෙන් ණය කාඩ්පත් නිකුත් කරන්නන් අතර අවම ගාස්තු ව්‍යුහය අප සතුවීම විශේෂ ශක්තියකි. එයට අමතරව, විශේෂිත කාලවල ප්‍රවර්ධන වැඩසටහන් හරහා ප්‍රමුඛතම පාරිභෝගික භාණ්ඩ අලෙවිකරුවන්, හෝටල් සහ ආපන ශාලා, නිම් ඇඳුම් අලෙවි ආයතන වෙතින් ආකර්ෂණීය වට්ටම් ලැබීමට අපගේ කාඩ්පත් හිමියන්ට හිමිකම ඇත. අයදුම්කරුවෙකුගේ ඉල්ලීම මත එක් ව්‍යාපාර දිනයක් ඇතුළත කිසිදු අතිරේක ගාස්තුවකින් තොරව අපගේ කාඩ්පත් නිකුත් කෙරෙන අතර පීපල්ස් වීසා ජාත්‍යන්තර හර කාඩ්පත් හා පෙර සකස් කරන ලද හර කාඩ්පත් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් එම අවස්ථාවේදීම කවුන්ටරයෙන් ලබාගැනීමේ හැකියාව ඇත.

මෙම කාඩ්පත්, ලොව පුරා වීසා අනුමැතිය ලත් වෙළෙඳුන් මිලියන තිහකට අධික සංඛ්‍යාවක් මෙමඟින් භාවිතා කිරීමට හැකියාව ද ජාත්‍යන්තර වශයෙන් මුදල් ආපසු ගැනීම් වෙනුවෙන් මිලියන දෙකක්වන වීසා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයක් භාවිතා කිරීමට හැකියාව ද සලසයි. ශ්‍රී ලංකාවේ 3,000ට අධික ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා 25,000ක් වන වීසා අනුමත වෙළෙඳසැල්, පීපල්ස් ණය හා හර කාඩ්පත් පිළිගනී. ශාඛා 735කින් සමන්විත දීප ව්‍යාප්ත ශාඛා ජාලයක් තිබීමේ පහසුවට අමතරව වීසා කාඩ්පත්හිමියන්ට අන්තර්ජාලය හරහා මුදල් ගෙවීම් කිරීමේ හැකියාව ද ඇත.

බැංකුවේ වීසා ණය හා හර කාඩ්පත් අනුමැතිය ලත් වෙළෙඳුන් ජාලයෙහි සංඛ්‍යාත්මක වර්ධනයක් සිදුවී ඇති අතර එම ජාලය තවදුරටත් වර්ධනය කිරීම පිණිස බැංකුව ප්‍රයත්නයක් දරනු ලැබේ. ජාලයට එක්වීමේ අභිලාෂයෙන් සිටින වෙළඳුන්ට අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ සලසන කොටස් අනුපාතික ඉදිරිපත් කිරීම තුළින් මෙය ක්‍රමානුකූලව ක්‍රියාත්මක කෙරෙමින් පවතී. සියළුම කාඩ්පත් හිමියන්ට වඩා හොඳ සේවයකට අවස්ථාව සලසමින් බැංකුවේ පුළුල් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ජාත්‍යන්තර ගෙවීම් සන්නම් හා සමගද සම්බන්ධ කරනු ලැබ ඇත.

දැඩි සුපරීක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම මගින් අවදානමට නිරාවරණයවීම විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කරනු ලැබේ. කාඩ්පත් ව්‍යාපාරය පොදුවේ වංචාවන් හේතුවෙන් සැලකිය යුතු අලාභවලට මුහුණපායි. එසේ වුවත්, අප එම ගැටළුව විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම හේතුවෙන් ඒ හා සබැඳි අවදානම අවම කරනු ලැබ ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ කාඩ්පත්හිමියන් කෙරෙහි මෙ මඟින් ඇති කරන අවදානමේ බලපෑම අවම විය.

## එතෙර ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් සේවාවන්

සැමට ප්‍රතිලාභ සැලසීම කෙරෙහි කේන්ද්‍රගතව සිටිමින්, අපගේ පුළුල් නිපැයුම් කළඹට වැඩි පහසුව එක් කිරීම සඳහා අපගේ මූලාරම්භයන් ක්‍රියාත්මක කරන ලද අතර එතෙර ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් සේවා අංශය නිපැයුම් හා සේවා විශිෂ්ටත්වය වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙය අපගේ ලාභදායිත්වයෙහි වර්ධනයට සැලකිය යුතු ආකාරයෙන් දායක වෙමින් වසර ගණනක් මුළුල්ලේ විශිෂ්ට සාර්ථකත්වය අත්කරගනු ලැබ ඇත.



## ඉසුරු උදාන

තොටිල්ලේ සිට සුසානය දක්වා අපගේ ගනුදෙනුකාර භවතුන් සමග සිටීමේ අපගේ ආකල්පය හේතුවෙන් අළුත උපන් බිළිඳුන් 'ඉසුරු උදාන' ගිණුම් සමඟ අපගේ රැකවරණය යටතට පැමිණේ. අවම රු. 100/- ක මුදලකින් ඇරඹිය හැකි ඉසුරු උදාන, චමත්කාරජනක ත්‍යාග හා සමගම වෙළෙඳපොළ අනුපාතිකයන්ට වැඩි පොළී අනුපාතික ලබා දෙයි. තවත් සුවිශේෂී ප්‍රතිලාභයක් වන්නේ නව ගිණුමක් විවෘත කිරීමට හෝ පවත්නා ගිණුමකට බැර කිරීමට භාවිතා කළ හැකි අතිරේක වාසියක් වන 'ඉසුරු උදාන' ත්‍යාග සහතික පත්‍රය. ඉසුරු උදාන ගිණුම්හිමියෙකුට වයස අවුරුදු 5 එළැඹි විට, ගිණුම ස්වයංක්‍රීයව 'සිසු උදාන' ගිණුමක් බවට පරිවර්තනය වේ.

## සිසු උදාන

අපගේ ගනුදෙනුකාර භවතුන්ට ප්‍රතිලාභ සැපයීමේ ඊළඟ පියවර ඇත්තේ වයස අවුරුදු 6 - 18 අතර ගිණුම්හිමියන් වෙනුවෙනි. ඉසුරු උදාන හා සමානවම මෙම ගිණුමද අවම රු. 100/- ක මුදලකින් විවෘත කළ හැකි අතර, චමත්කාර ජනක ත්‍යාග, විශේෂ මුදල් ත්‍යාග හා පහ වසර ශිෂ්‍යත්ව විභාගයේදී හා සාමාන්‍ය පෙළ විභාගයේදී ජයග්‍රහණ අත් කරගන්නා දරු දැරියන් වෙනුවෙන් ත්‍යාග මෙම ගිණුම සමග ඉදිරිපත් කෙරේ. වයස 18 දී ගිණුම් හිමියා, ස්වයංක්‍රීයවම යොවුන් පිරිස් ඉලක්ක කරගත් අපගේ ඊළඟ ගිණුම වන 'YES' ගිණුම කරා මාරු වෙයි.





## YES

සැබෑ ලොවට පිය තබන තරුණ තරුණියන්ට ඔවුන් වෙනුවෙන් පැනනගින විවිධාකාර අවස්ථාවන්ගෙන් ප්‍රශස්ත ඵල ලැබීමට සහායවීම සඳහා සැලසුම් කරන ලද ‘YES’ ගිණුමක් රු. 2000/- ක තැන්පතුවකින් ඇරඹිය හැකි අතර, නොමිලේ ස්ථාවර නියෝග, ණය කාඩ්පත් පහසුකම්, කල්බදු පහසුකම් මෙන්ම නිවාස, වාහන මිළදී ගැනීම් හා උසස් අධ්‍යාපනය වෙනුවෙන් ණය එයට අයත් වාසිවේ. ශේෂය රු. 25,000/- ඉක්මවූවිට 1% ක ප්‍රසාද පොළියක්ද එය පිරිනමයි.







## පරිණත

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන්ම සකස්වූ, වඩා ඉහළ පොළී අනුපාතික, තායිලන්තයට වන්දනා ගමන් හා රු. 10,000/-ක් වටිනා මුදල් ත්‍යාග ඇතුළු ආකර්ෂණීය ප්‍රතිලාභ සහිත මෙම ගිණුම ඔවුන්ගේ ජීවිතයේ සැඳෑ සමයේදී ස්ථාවරත්වය, සුරක්ෂිතභාවය හා ගෞරවනීය බව අත්විඳීමට හැකියාව සලසන ආශීර්වාදයකි.



## වනිතා වාසනා

සාමාන්‍ය ඉතුරුම් අනුපාතිකවලට වැඩි පොළී අනුපාතික ලබා දෙන මෙම ගිණුම මගින් කාන්තාවන්ගේ විවිධවූ භූමිකාවන් කෙරෙහි ගෞරවාචාර පුද කරනු ලැබේ. රු. 500/- ක මූලික තැන්පතුවකින් ගිණුම ඇරඹීමෙන් කාන්තාවන්ට සුළු ව්‍යවසායකත්ව ප්‍රයත්නයන්, දේපල හෝ නිවාස මිලදී ගැනීම හා උසස් අධ්‍යාපනය වෙනුවෙන් ණය පහසුකම් ලබා ගත හැකිය.

## අස්වැන්න

කන්න අනුව ලැබෙන ආදායම අනුව කටයුතු කරන හෙයින් ගොවීහු අස්වැන්න ගිණුමෙන් සවිබල ගන්වනු ලබති. රු. 1,000/- ක මූලික තැන්පතුවකින් ඇරඹෙන ගිණුමෙහි ශේෂය රු. 10,000/- ඉක්මවූවිට එයට 1%ක ප්‍රසාද පොළී අනුපාතිකයක් එක් කෙරෙන අතර, සහනදායී පොළී යටතේ කෘෂිකාර්මික ණය ලබාගැනීමට හැකියාව සපයයි.



## ජය නිවස

සිහින නිවස ඉදිකරගැනීමට සහායවීම පිණිස සැලසුම් කරන ලද පරිපූර්ණ නිවාස ණය ක්‍රමයක්වන මෙම පහසුකම එක් එක් පුද්ගලයන්ගේ අවශ්‍යතා අනුව සැකසුන නම්‍යශීලී ණය පහසුකම් තරඟකාරී පොළී අනුපාතික යටතේ ලබා දෙයි. මෙම ණය යටතේ දේපලෙහි/නිවසෙහි වටිනාකමින් 75% ක උපරිමයක් ඉඩම් මිලදී ගැනීම, ඉදිකිරීම, ඉදි කර ඇති නිවසකට අළුතින් කොටසක් එක්කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා පිරිනැමේ.

## මහජන බැංකු ත්‍යාග වවුචර

ත්‍යාග දීමේ හොඳම විකල්පයක්වන මාස හයක වලංගු කාලයක් සහිත මහජන බැංකු ත්‍යාග වවුචර රු. 500/- සහ රු. 1,000/- වටිනාකම්වලින් ලබා ගත හැකි අතර, ඕනෑම ශාඛාවකින් මිලදී ගැනීම හෝ ඕනෑම ගිණුමක තැන්පත් කිරීම සිදුකළ හැකිය.







## එතෙර ඉසුර

විදේශ ඉපයීම් වෙනුවෙන් වඩා ඉහළ පොලියක් පිරිනමන අතර දීපව්‍යාප්තව පිහිටි බැංකුවේ ශාඛා 735 ජාලය හේතුවෙන් එතෙර සිට එවනු ලබන මුදල් ලබාගැනීමේ වේගවත්ම ක්‍රමයද වන මෙම අනේවාසික විදේශ මුදල් තැන්පතු ගිණුම විදේශගත ශ්‍රී ලාංකිකයන්ට වඩාත්ම ආකර්ෂණීය වූවකි.






## ජනජය

රු. 2,000/- ක අවම තැන්පතුවකින් ආරම්භ කළ හැකි මෙම ගිණුම ස්ථිර මාසික ආදායමක් ලබන තැනැත්තන් වෙනුවෙන් විශේෂ ණය හා කල්බදු පහසුකම්, විදේශ සංචාර සඳහා සහනදායී ණය පොළී අනුපාතික සහ ආකර්ෂණීය පොළී අනුපාතික පිරිනමයි.





## පීපල්ස් නෙට්

අන්තර්ජාල බැංකුකරණයට තවත් වාසි එක් කරමින්, ඕනෑම වේලාවක ඕනෑම තැනක සිට බැංකුකරණය සඳහාවූ අපගේ දොරටුව මගින් ගිණුම් ගණනාවක් පහසුවෙන් කළමනාකරණය කිරීමට හා විවිධ බැංකු ගනුදෙනු සිදුකිරීමට පීපල්ස් නෙට් අවකාශ සලසයි.



## මහජන ජංගම බැංකුකරණය (පීපල්ස් මෝබයිල් බෑංකින්)

අතිශයින්ම බහුකාර්ය ජංගම දුරකථනය එක් ස්පර්ශ කිරීමකින් පමණක් දින 365ම පැය 24 පුරා බැංකුකරණ පරිසරයක මවිත කරවනසුළු පහසුව අපගේ ගනුදෙනුකාර භවතුන්ට ලබා දෙයි. ගිණුම් ශේෂ හා ගනුදෙනු ඉතිහාසය පරික්ෂාකිරීම, තම ගිණුමට හෝ තෙවන පාර්ශ්ව මහජන බැංකු ගිණුම්වලට මෙන්ම ශ්‍රී ලංකාවේ වෙනත් බැංකුවල ඇති තෙවන පාර්ශ්ව ගිණුම්වලට අරමුදල් මාරුකිරීම, ණය කාඩ්පත් හා උපයෝගිතා බිල්පත් ගෙවීම්, චෙක්පත් හා ගිණුම් ප්‍රකාශන ඇණවුම්කිරීම, උකස් කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු විමසීම සහ සමීපතම බැංකු ශාඛා හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිළිබඳව විමසීම අපගේ අගනා ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් මෙමගින් පිරිනැමෙන පහසුකම්වේ.

## පීපල්ස් වීසා ඉන්ටනැෂනල් හර කාඩ්පත

ගෝලීය වශයෙන් මිලියන තිහකට අධික වෙළෙඳසැල් හා මිලියන දෙකක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයක් කරා ප්‍රවේශය සහිත මෙම හර කාඩ්පත සුරක්ෂිත එකක්වන අතර, විවිධ පහසුකම් ගණනාවක් එයට ගොනුකරනු ලැබ ඇත.





## දූ දරු එතෙර ඉසුර

දෙමවුපියන්/භාරකරුවන් විදේශ රැකියාවන්හි නියුතු දරුවන් වෙනුවෙන් විශේෂයෙන් සැලසුම් කරන ලද මෙම බාලවයස්කාර ගිණුම අනේවාසික/නේවාසික විදේශ මුදල් ගිණුම් වෙනුවෙන් පවතින පොළී අනුපාතිකවලට අතිරේක 1% ක් එක් කළ ප්‍රතිලාභය පිරිනමයි. එ.ජ.ඩො. 25 ක් හෝ කවර හෝ නියමිත විදේශ මුදල් වර්ගයකින් ඊට සමාන අගයක අවම තැන්පතුවකින් ඇරඹෙන මෙම ගිණුම එ. ජ. ඩො. 1,000 ක් හෝ කවර හෝ නියමිත විදේශ මුදල් වර්ගයකින් එයට සමාන අගයක ශේෂයක් සහිතව ස්ථාවර තැන්පතුවක් ලෙස පවත්වාගැනීමේ විකල්පයද සපයයි.





## ස්වර්ණ ප්‍රදීප

හදිසි මුදල් අවශ්‍යතා ඇතිවිට පිළිතුර වන්නේ ස්වර්ණ ප්‍රදීපයි. රන් භාණ්ඩ පමණක් සුරැකුම ලෙස තබාගෙන ඉක්මන් ණය පහසුකම් සැලසීම මෙමගින් ඉටු කෙරේ.

## ප්‍රේෂණ

අපගේ ගනුදෙනුකාරභවතුන් සමග අප පවත්වාගන්නා සමීප සම්බන්ධතාව හා නිරන්තර අන්තර් ක්‍රියාකාරකම්, අපගේ ගනුදෙනුකාරභවතුන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් පිළිබඳව අපගේ අවබෝධය ශක්තිමත්කර ඇති අතර එය අපගේ ප්‍රේෂණ ව්‍යාපාරයට වැඩි නවීකරණය එක් කිරීමට අපව මෙහෙයවා ඇත. මෙම ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් බහුවිධ පරාසයක, ප්‍රේෂණ විසඳුම් සපයන විශ්වාසනීය ආයතනයක් ලෙස අප ඉස්මතුවී ඇත්තෙමු. තත්පර ගණනක් තුළ මුදල් ලබාගැනීමේ හැකියාව ලබාදෙන පරිදි විදේශගත ප්‍රජාව වෙනුවෙන් අන්තර්ජාලය හරහා තත්කාල ස්වයංක්‍රීය ප්‍රේෂණ මාර්ග ක්‍රියාත්මක කිරීම ඇතුළුව මූලාරම්භයන් ගණනාවක් මෙයට අදාලව ක්‍රියාත්මක කරන ලදී. මෙම සාර්ථක සමීකරණයට ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් ගුණාත්මක සේවයද එක් කෙරෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2012 කාර්යසාධනය අභිබවා රට තුළට ප්‍රේෂණවල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබිනි.

## විදේශ මුදල් තැන්පතු

අපගේ විදේශ මුදල් නිපැයුම් කළඹ, එකිනෙකට වෙනස් ආයෝජන විකල්ප ගණනාවක් හරහා අපගේ විදේශගත ජනතාවගේ ආර්ථික මට්ටම් ඔසවා තැබීමට විශේෂයෙන්ම සැලසුම් කළ විවිධාංගීකෘත කළඹකි. රටින් පිටත්ව යාමට පෙර ලබා දෙන ණය හා රක්ෂණ යෝජනා ක්‍රම මගින් තහවුරුවන පරිදි සවිබල ගැන්වීමේ පරිසරයක් නිර්මාණය කිරීම පිණිසවන අගය එකතු කිරීම තුළින් මෙය තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. තාක්ෂණික විකල්පයන් කෙරෙහි බැංකුව කේන්ද්‍රගතවීම හේතුවෙන් අන්තර්ජාල බැංකුකරණ සේවය, කෙටි පණිවුඩ බැංකුකරණය හා වෙනත් විවිධ මාර්ග ඔස්සේ ලොව කවර හෝ ස්ථානයක සිට අරමුදල් කරා ප්‍රවේශවීමේ හැකියාව ලැබී ඇත. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමග හවුල්කාරිත්වයෙන් පුළුල් පරාසයක වන විදේශ මුදල් තැන්පතු නිපැයුම් පෙළක් හරහා ආයෝජන අවස්ථා ඉදිරිපත් කිරීම අඛණ්ඩව සිදුකිරීම, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට සුරක්ෂිත හා ස්ථාවර මාර්ග හරහා ඔවුන්ගේ අරමුදල් ආයෝජනය කිරීමට මග සලසා තිබේ.

## ලොව පුරා විසිරී සිටින හවුල්කරුවන්

ශක්තිමත් හා ස්ථාවර රාජ්‍ය බැංකුවක් ලෙස බැංකුව සතු කීර්තිනාමය, සැමට ප්‍රතිලාභ සැලසීමේ අපගේ ඉලක්කයට අගය එක්කරනු ඇත්තාවූ ගෝලීය හවුල්කාරිත්වයන් ඇතිකර ගැනීමට අවශ්‍ය තත්ත්වය අපට අත්කරදී තිබේ. අපගේ ව්‍යාපාරික සංකල්පයට වාසිදායක වන හවුල්කරුවන් නිරතුරුව සොයා යමින් අප මෙලෙස මෙම අරමුණු ඉටු කරගැනීමට නිසැකව දායකවනු ඇත්තාවූ බැංකු හා විනිමය සමාගම් විශාල සංඛ්‍යාවක ජාත්‍යන්තර සබඳතා ජාලයක් ඒකරාශී කරගෙන ඇත. එබඳු සමාන අදහස් දරන හවුල්කරුවන් සෙවීමේ කාර්යයෙහි අප තවදුරටත් නිරතව සිටින්නේ මැද පෙරදිග කලාපයට අපගේ පුහුණු හා පළපුරුදු කණ්ඩායම් සාමාජිකයන් සේවයට යෙදවීම හරහා අපගේ පැවැත්ම හා සේවා සැපයුම තවදුරටත් ශක්තිමත් කරන අතරය. මෙසේ සේවයට යෙදවීම දැන් කොරියාව කරාද ව්‍යාප්ත කරනු ලැබ ඇත්තේ දිනෙන් දින ඉහළ නගින කොරියාවේ රැකියාවේ නියුතු විදේශගත ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමිනි.

## වෙස්ටන් යූනියන්

අපගේ ප්‍රේෂණ ඉහළ නැගීම හා ප්‍රවේශය සඳහා අවශ්‍යතාව මෙලෙස ව්‍යාප්තවීම සමග වෙස්ටන් යූනියන් සමග අපගේ සබඳතාව තවදුරටත් ශක්තිමත් කෙරෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස පහසු ප්‍රවේශ හැකියාව ලබාදීම හා අපගේ මෙම ගනුදෙනුකාරභවතුන් කාණ්ඩයෙහි හදිසි අවශ්‍යතා ඉටුකිරීම පිණිස අපගේ බැංකු ප්‍රවේශ ස්ථාන මුළුල්ලේ වෙස්ටර්න් යූනියන් ජාලය ව්‍යාප්ත කිරීම සිදුකරනු ලැබ ඇත.

# දේශීය ණය අංශය

අඛණ්ඩව අත්දකින ලද අභියෝගාත්මක ආර්ථික හා ව්‍යාපාරික පරිසරය තිබියදීත්, මෙම වර්ෂය තුළදී අපගේ දේශීය ණය කළඹ වැඩි දියුණු කිරීම කෙරෙහි අපි දැඩි ලෙස අවධානය කේන්ද්‍රගතකර සිට ඇත. මෙය අපගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලය හරහා එකිනෙක හා සම්බන්ධවූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුළත් කරගන්නා කළඹකි. එයට අමතරව, මාසික පාරිශ්‍රමිකයක් ලබන්නන්ගේ පුද්ගල අවශ්‍යතා සඳහා මූල්‍ය සම්පාදනයද දේශීය ණය හා සම්බන්ධවේ. ණය පහසුකම් අවශ්‍ය කරන තැනැත්තන්ට එම ණය වාසි සැපයෙනු ලබන බව සහතික කිරීමට අවශ්‍ය ප්‍රමාණය තුලනය කරන අතරම ගුණාත්මක ණය කළඹක් කෙරෙහි අපගේ අවධානය අප තවදුරටත් වැඩි දියුණුකර ඇත. මෙලෙස මනා සේ විවිධාංගීකෘත ණය කළඹ විවිධ අංශ කරා විහිදෙන්නේ ඉදිකිරීම්, සංචාරක, නිෂ්පාදන හා සේවා ඇතුළත්කර ගනිමින්, අවම අවදානම හා ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාව සහිතව මනා සමතුලිතතාවයෙන් යුතු ණය කළඹක් ස්ථාපනය කිරීමේ හැකියාව ලබා දෙමිනි.

2015 වෙනුවෙන් රජය විසින් දිරිගැන්වෙන කඩිනම් සංවර්ධන න්‍යාය පත්‍රය හා දැක්ම යටිතල පහසුකම් සංවර්ධනය තුළ නැගී එන නියත මෙහෙයුම් බලයක් දක්වා ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක කර්මාන්තය හා දේශීය ව්‍යාපාර හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය ප්‍රබෝධමත් කරනු ලැබ ඇත. එකී ප්‍රවර්ධනය සැලසුම් කරනු ලැබ ඇත්තේ හැකි සෑම අවස්ථාවකම ආනයනික ආදේශක මත යැපීමෙන් තොරව ජාතියට අවශ්‍ය නිපැයුම් හා සේවාවන් සැපයිය හැකි ස්වයංපෝෂිත කර්මාන්ත ලෙස දියුණු වීමට දේශීය කර්මාන්තවලට සහාය ලබා දීමට මගපෑදීම අරමුණු කරගෙනවේ. 2012 වසරේදී පනවන ලද ණය උපරිම සීමාවට පරස්පර වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013 වසර තුළදී අනුගමනය කරන ලද අඩුකළ පොලී අනුපාතික ප්‍රතිපත්ති මගින් මෙය තවදුරටත් ශක්තිමත් කෙරිනි. මෙම තත්ත්වය දේශීය ණය කළඹෙහි වර්ධනයට ගෝචරවන අවස්ථා නැගී ඒමට හේතුවූ අතර බැංකුව ප්‍රායෝගිකව එය අපගේ වාසිය පිණිස යොදා ගත්තේය.

වර්ෂය තුළදී අප දියත් කළ නවෝත්පාදක ණය යෝජනා ක්‍රම, අප ඉදිරිපත් කළ අරමුදල් සම්පාදන මාර්ග භාවිතා කරමින් තම අභිලාෂයන් ඉටු කරගැනීමට අපගේ ගනුදෙනුකාර භවතුන්ට හැකියාව ලබා දුන්නේය. ජන වින්‍යාසයෙහි, සමාජ ස්ථරයන්හි, ආදායම් මට්ටම්වල හා පොදුවේ ජීවන රටාවන්හි සුසමාදර්ශ වෙනස පිළිබඳව සවිඥානක වෙමින්, කාලීන අවශ්‍යතාවන්ට, වඩා හොඳින් ගැලපෙන අයුරින් පවත්නා යෝජනා ක්‍රම තුළට නම්‍යශීලී බව ස්ථාපනය කිරීමට අපි මෙම පරාමිතීන් යොදා ගන්නෙමු.

පරිවර්තනයට ලක්වූ ඇතැම් යෝජනා ක්‍රම අතරට, රාජ්‍ය හා පෞද්ගලික අංශවල වෘත්තිකයන්ගේ පුද්ගල අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය සම්පාදනය පිණිස සකස් කරනු ලැබ ඇති වෘත්තිකයන් වෙනුවෙන් වන විශේෂ ණය යෝජනා ක්‍රමය මෙන්ම ගුරු සෙත, සුව සෙවන, පහසු හා දැය විරු යෝජනා ක්‍රම අයත් වේ. තවත් කැපී පෙනෙන යෙදවුමක්වූයේ වර්තමාන අවශ්‍යතාවන්ට වඩාත් උචිත පරිදි කාලීන අවශ්‍යතා වැඩියෙන් ඇතුළත් කරගත් පීපල්ස් විස්ඩම් අධ්‍යාපන ණය යෝජනා ක්‍රමය යළි දියත් කිරීමයි.

පෙර නොවූ විරූ වෙනස්වන සුළු ස්වභාවයක් පෙන්නුම් කළ රන් මිල ගණන්වලට අදාළව ඉතිහාසයේ අහිතකරම වර්ෂ අතරින් එකක් පැවති අතර බැංකුව විසින් සපයනු ලබන පහසුකම්වල වාසිය ලබා ගැනීමට අවශ්‍ය ගනුදෙනුකාර භවතුන්ට එම විකල්පය විවෘතව තබන අතරම අපගේ උකස් කළඹ වෙනුවෙන් ස්ථාවර හා සුරක්ෂිත පදනමක් සැපයීම පිණිස සංකල්පනය කරන ලද රන් සහන ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම සමග බැංකුවේ උපයෝගිතාව නැවත වතාවක් විදහා දැක්විණි.

සහශ්‍ර සංවර්ධන ඉලක්ක තුළ නිවාස සඳහා ප්‍රමුඛත්වය ලැබීමත් සමග රාජ්‍ය අංශයේ සේවකයන් වෙනුවෙන් දියත් කරන ලද බැංකුවේ නිවාස ණය යෝජනා ක්‍රමය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හවුල්කාරිත්වය ඇතිව තව දුරටත් වැඩි දියුණු කරන ලදී. අපගේ පාර්ශ්වකරුවන්ට තම අභිවෘද්ධිය අත්කර ගැනීම සඳහා ආධාරකයවීම තුළින් ජාතිය සවිබල ගැන්වීම සඳහා අප අවධානය කේන්ද්‍රගත කිරීම අනුව සාර්ව ආර්ථික ඉලක්කක සාක්ෂාත්කර ගැනෙන බව සහතික කිරීමේදී රජය සමග හවුල්කාරිත්වයෙන් කටයුතු කරන අතරම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමග හවුල්කාරිත්වයෙන් මෙම නිවාස ණය යෝජනා ක්‍රමය සැලසුම් කරනු ලැබ ඇත්තේ නිවාස වෙනුවෙන් වන ජාතියේ මූලික අවශ්‍යතාව ඉටු කිරීම පිණිසය. එයට අතිරේකව, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, කලාකරුවන් හා ලේඛකයන් වෙනුවෙන් සහනදායී කොන්දේසි මත වාහන ණය යෝජනා ක්‍රමයද වර්ෂය තුළදී වැඩි කරන ලද්දේ ඔවුන් විසින් සපයන ලද සේවයට පිළිගැනීමක් ලබා දීමේ රජයේ දැක්මට සහාය දක්වමිනි.

අපගේ ණය පදනම වෙනුවෙන් ගුණාත්මක පදනමක් සඳහා පහසුකම් සපයනු ඇත්තාවූ සක්‍රිය ක්‍රියාමාර්ග සලකා බලන අතර නිසි පාලනයන් ස්ථාපිතව ඇති බව තහවුරු කරමින් අපි හැම විටම අපගේ ණය කළඹ අධීක්ෂණයේදී තීක්ෂණ අවධානයෙන් යුතුව ක්‍රියා කර ඇත්තෙමු. විශාල ලෙස විවිධාංගීකෘතව පවතින හා මනා සමතුලිතභාවයෙන් යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක පදනමක් කෙරෙහි කේන්ද්‍රගතව පවතින ශක්තිමත් ණය කළඹක් පවත්වා ගැනීම පිණිස අපගේ ඉලක්ක ප්‍රශස්තීකරණයට හේතුවන තීරණ හා පද්ධති ක්‍රියාත්මක කිරීම සිදු කරන අතර ණය ක්‍රියාවලියට ගාමක බලය සපයන හා එය කෙරෙහි බලපෑම් ඇති කරන බාහිර හා අභ්‍යන්තර සුසමාදර්ශයන් පිළිබඳ අපි හැමවිටම දැඩිසේ දැනුවත්ව සිටින්නෙමු.

## ආයතනික බැංකුකරණය

අපගේ ආයතනික සේවාලාභීන්ට හොඳම නිපැයුම් හා සේවා සැපයෙන බව තහවුරු කිරීමේදී විවිධ කර්මාන්ත හා ශක්තිමත් සංවර්ධන න්‍යායපත්‍ර සම්බන්ධව අප සතු දශක පහක පළපුරුද්දෙන් අප ප්‍රයෝජන ගන්නේ ආයතනික සේවාලාභීන් අපගේ ගනුදෙනුකාර පදනමෙහි සැලකිය යුතු ඛණ්ඩයක් සාදන තත්ත්වයක් තුළදීය. මෙම පුළුල් පරාසය, ජාතික සංවර්ධනයෙහි සාර්ව දසුන කරා දායක වෙමින් ලාභදායීතාව හා වාණිජ වශයෙන් ජීව්‍යතාව සහිත ආයතන දිරිගන්වන අපගේ විවිධ නිපැයුම් හා සේවාවන් භාවිතා කරමින් සිය ආයෝජන ඉලක්ක කිරීමේදී තීක්ෂණභාවයෙන් ක්‍රියා කිරීමට වාණිජ ව්‍යාපාර පොළඹවයි.

ව්‍යාපෘති ණය දීම්, ව්‍යාපාරික කාණ්ඩ, වෙළඳ මූල්‍යකරණය ඇතුළු භාරකාර සේවා, ජාත්‍යන්තර බැංකු කටයුතු හා උපදේශක සේවාවන්, ඉහළ ලාභාංශ ගෙවන සමාගම්, විවිධ ව්‍යාපාර එක්වූ සංස්ථා, බහු ජාතික සමාගම්, ඉදිකිරීම්, විනෝදාස්වාද, කෘෂිකර්මය යනාදියෙහි යෙදී සිටින පෞද්ගලික අංශයේ විශාල හා මධ්‍ය පරිමාණ ආයතන හා විශාල රාජ්‍ය අංශ ආයතන යන, ශක්තිමත් හා ස්ථාවර මූල්‍ය සම්පාදන හවුල්කරුවෙකුගේ එක සෙවන යටතේ එක්වූ ආයතනවල අවශ්‍යතා ඉටු කිරීම කරා අපගේ ආයතනික බැංකුකරණ විෂය පථය ව්‍යාප්තවේ. පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයටම අයත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, ආනයන ආදේශක කර්මාන්ත හා විනෝදාස්වාද අංශය ඇතුළු මහින්ද චින්තන ආර්ථික සංවර්ධන සැලැස්මට අනුකූලව මග සැලසුම් කරගෙන ඇති විවිධ අංශ හරහා සමාන ලෙස අරමුදල් සම්පාදනය විසිරියාම පවත්වා ගැනීම පිණිස දැඩි ප්‍රයත්නයක් දරනු ලැබේ. ඒකකය මගින් සැපයෙන පුළුල් යෙදවුම අරමුදල් සම්පාදනයෙන් ඔබ්බට ගොස් උපදේශක, කළඹ කළමනාකරණ, ව්‍යාපෘති ණය පුනරුත්ථාපනය හා ප්‍රතිව්‍යුහගත කිරීම, ව්‍යාපාරික කාණ්ඩ සැකසීම හා ව්‍යාපෘති ණයදීම ආදී සහායක සේවා සැපයීම දක්වා ව්‍යාප්තවේ.

ආයතනික බැංකුකරණයෙහි ඉලක්කගත ගමන බැංකුවේ ශුද්ධ ආදායමට රු. බිලියන 6.5ක දායකත්වයක් ලබා දී ඇත. රු. බිලියන 136ක් වන අරමුදල් නොසැපයූ කළඹට අතිරේකව රු. බිලියන 234ක මුළු ණයදීම් කළඹ බැංකුවේ මුළු අරමුදල් නොසැපයූ ආදායමෙන් ආසන්න වශයෙන් 33%ක් උපදවයි. ශාඛා ජාලය කරා ව්‍යාප්ත කිරීමේ අනාගත ඉලක්කයක් සහිත මෙම ඒකකය ජාත්‍යන්තර අංශය හා භාණ්ඩාගාර ඒකකය ඇතුළු බැංකුවේ අනෙකුත් ඒකකවල ලාභදායිත්වය ශක්තිමත් කිරීමට උපකාරකවන හෙයින් එහි දායකත්වය විවිධ මට්ටම් කරා ගලා යන බව කිව හැකිය.

අති විශාල සංවර්ධන ව්‍යාපෘතිවලට කැපී පෙනෙන ආකාරයෙන් දායක වෙමින් 2013 වසර තුළදී ආයතනික බැංකුකරණය සැලකිය යුතු වර්ධනයක් වාර්තාකර ඇත. මූලික වශයෙන්ම රජය මගින් ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘති වෙත මාර්ග, රෝහල් හා ජල ව්‍යාපෘති යටිතල සංවර්ධනය සඳහා රු. බිලියන 25ක වෙන් කිරීම් ලැබී ඇත. බැංකුවේ මුළු ණයදීම් කළඹින් ආසන්න වශයෙන් 37%ක් ජාතික සංවර්ධන ව්‍යාපෘති ඇතුළු රජයේ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් අරමුදල් සම්පාදනය සඳහා බැංකුව යෙදවූයේය.

සැමට ප්‍රතිලාභ යන මෙම වසර සඳහා අපගේ ආදර්ශ පාඨය අනුව බෙල්ජියානු හා ඉන්දීය සහාය සහිතව ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන කොළොන්න-බලංගොඩ හා මහ දඹුල්ල ජල ව්‍යාපෘති සඳහා එකම බැංකුකරු ලෙස පත්කරනු ලැබීමද අප ලද ගෞරවයක් විය. තවද, හම්බන්තොට හා නුවරඑළිය යන රෝහල් දෙක නෙදර්ලන්තය සමඟ ඒකාබද්ධව දියුණු කිරීමට මූල්‍ය සම්පාදනය සඳහා එකම දේශීය බැංකුකරුද අපි වන්නෙමු. අනුරාධපුරය-ත්‍රිකුණාමලය, නාරම්මල-ගිරිඋල්ල, කටුවන-අළුපොත්දෙනිය හා ඉබ්බාගමුව-කුඹුක්ගැටේ මාර්ග ජාලය වෙනුවෙන්ද ආයතනික බැංකුකරණ ඒකකය අතිශය තරගකාරී අනුපාතික යටතේ පූර්ණ මූල්‍ය සහාය ලබාදී ඇත. එයට අමතරව, රජය සතු පොහොර ආයතන දෙකට එකම මූල්‍ය සහාය සපයන්නා ලෙස මෙම ඒකකය රජයේ පොහොර සහනාධාර යෝජනා ක්‍රමයට සහාය විය.

ජාතික ඛනිජතෙල් අවශ්‍යතාවන්ගෙන් 50%ක් සපයමින් ආයතනික බැංකුකරණ ඒකකය ඛණිජතෙල් ආනයන වෙනුවෙන් දෙවැනි විශාලතම දායකවන්නාවන අතර ඒ හා සබැඳිව පෞද්ගලික හා රාජ්‍ය යන ප්‍රවාහන සේවාවන් දෙකටම මූල්‍ය සහාය සපයයි. රජය සතු නැව් සේවාව, දුම්රිය හා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සඳහාද එකම බැංකුකරු වෙමින් මෙම ඒකකය ප්‍රධාන දායකත්ව කාර්යභාරයක් ඉටු කරයි.

ලංකා විදුලිබල මණ්ඩලයද අපගේ යෙදවුම්වලින් සවිය ලබන්නේ බලශක්ති ක්ෂේත්‍රයෙහි මෙම දැවැන්තයාට එකම බැංකුකරු ලෙසින් ආයතනයෙහි ණය කළඹින් ආසන්න වශයෙන් 8%ක් පමණ වෙනුවෙන් අරමුදල් සම්පාදනය සිදු කරන බැවිනි. ගල් අඟුරු ආනයනය සඳහා අරමුදල් සම්පාදනය ලෙස බැංකුව වාර්ෂිකව රු. බිලියන 10ක් පමණ සැපයීමත් සමග බලශක්ති ක්ෂේත්‍රයට අතිරේක ගාමක බලයක් එක් කෙරේ. රටේ ආර්ථික කේන්ද්‍ර දර්ශනය අනුව ප්‍රධාන වශයෙන් බලගැන්වීමට නියමිත කර්මාන්තයක්වන බලශක්ති අංශය එම අරමුණු ඉටුකර ගැනීමට කර්මාන්තයක් ලෙස තෝලනයවන විට එයට තවදුරටත් සහාය සැපයීම සිදුවනු ඇත.

අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් ආනයනය කිරීම හා බෙදා හැරීම සඳහා ආයතනික බැංකු ඒකකය සෞඛ්‍ය හා ඖෂධ කර්මාන්තයට මූල්‍ය සම්පාදනය කරන අතර එය රට පුරා සෞඛ්‍ය ආරක්ෂණය වැඩි දියුණු කිරීම තෙක් ව්‍යාප්ත වෙයි.

ආර්ථික කේන්ද්‍ර දැක්මෙහි තවත් ප්‍රධාන ගාමක බලයක වන සත්කාරක කර්මාන්තයට, රට පුරා විසිරුණු හෝටල් සඳහා අරමුදල් සම්පාදනය ඇතුළුව විවිධ ව්‍යාපෘති ගණනාවකට අපගේ අරමුදල් එක් කිරීම සිදුවී ඇත.

## අක් වෙරළ බැංකුකරණ ඒකකය

ප්‍රාග්ධන වියදම් හා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති මත කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය යන දෙකම වෙනුවෙන් ව්‍යාපෘති ණයදීම් ඉලක්ක කරමින් ණය සැපයීමෙන් මූලික වශයෙන්ම කාර්මික සංවර්ධනයට දායක වෙමින්, අක් වෙරළ සහයෝගිත්වය සහිත සේවාලාභීන් ශක්තිමත් කිරීම කෙරෙහිවූ මෙම ඒකකයෙහි නොසැලෙන ඉලක්කය එහි මූලික ප්‍රතිපත්තියක්ව පවතී. විදේශ ආයෝජකයන් සමඟ වැඩියෙන් ඒකාබද්ධ සහයෝගිත්වයන් ඉදිරිපත් කිරීමට සේවාලාභීන්ව දිරිමත් කරමින් අවශ්‍යවිට සේවාලාභී පුනරුත්ථාපනය කිරීම තෙක්ද අපගේ මැදිහත්වීම් ව්‍යාප්තවන අතර ව්‍යාපෘති හා ව්‍යාපාර වෙනස් කිරීම්වලදී සහාය වීමට සැලසුම් කරන ලද උපදේශක සේවාවන් ලබා දීමද සිදු කෙරේ. 2013 වසරේදී අක්වෙරළ බැංකුකරණ ඒකකය වෙතින් බැංකුවේ ශුද්ධ ලාභයට දායකත්වය රු. බිලියන 2.0ක් විය.

රජය සතු බැංකුවක් ලෙස, මහින්ද චින්තන වැඩසටහන යටතේ සත්කාරක, සෞඛ්‍ය ආරක්ෂණ, යටිතල පහසුකම් සංවර්ධන, අපනයන හා ආනයන ආදේශක ඇතුළු විවිධ කර්මාන්ත ගණනාවක් ආවරණය කරමින් ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා මූලිකවම ප්‍රමුඛත්වය දෙනු ලැබේ. ජාතික සංවර්ධන න්‍යායපත්‍රය සියළු කාර්යයන්හිදී අදාළවන මූලික කරුණක්ව පවතිද්දී, විනෝදාස්වාද හා පුනර්ජනනීය අංශ මෙන්ම මහා පරිමාණ ව්‍යාපෘති හා සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සංවර්ධනය කිරීම බැංකුව වෙතින් ප්‍රබෝධය ලබයි. ඒ හා සමගම අපගේ ශාඛා ජාලය හරහා ග්‍රාමීය ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කෙරේ. අපගේ ඉලක්ක කරා අප සමීප කරවන අපගේ අති නවීන තොරතුරු තාක්ෂණ වේදිකා, පද්ධති හා ක්‍රියාවලි මඟින් මෙම මූලාරම්භයන් මනා සහායක් ලබයි.

## සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය බැංකුකරණය

සැළකිය යුතු පරාසයකවන සංවර්ධන මූල්‍ය හා ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම සඳහා මූල්‍යකරණය මෙන්ම අපගේ අවසාන අරමුණට අගය එකතු කිරීම පිණිස විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරමින් වසර තුළදී සංවර්ධන බැංකුකරණයෙහි කැපී පෙනෙන මං සලකුණු සනිටුහන් කරන ලදී.

අභියෝගාත්මක හා තරගකාරී පරිසරයක් තිබියදීත් යොදාගන්නා ලද උපායමාර්ග හේතුවෙන් රජය විසින් දියත් කරන ලද සිත් බඳනාසුලු සංවර්ධන වැඩසටහන්වලට කැපී පෙනෙන ලෙස දායක වීමට මෙම ඒකකයට හැකිවී ඇත.

## ප්‍රාදේශීය සංවර්ධනය

පිබිදෙන උතුර, නැගෙනහිර උදානය, කුඩා වැවිලිහිමියන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සහ පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ වැඩසටහන ඇතුළුව රටේ සංවර්ධන න්‍යායපත්‍රය තුළට උද්‍යෝගිමත් බව එක් කරවන ණය යෝජනා ක්‍රම විවිධ ප්‍රදේශ පුරා උපායමාර්ගිකව ක්‍රියාත්මක කරන ලදී. සහනදායී පොළී අනුපාතික හා ලිහිල් කරන ලද ඇප හේතුවෙන් ණය පහසුකම් ප්‍රදානය කිරීමේ ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ඉක්මවා යන ලද්දේ මෙම ණය යෝජනා ක්‍රමවල ජනප්‍රියත්වය දියුණු කරවමින්වන අතර විරැකියාව අවම කරමින් හා දරිද්‍රතාව දුරු කරමින් ප්‍රාදේශීය සම්පත් උපයෝජනය උපරිම මට්ටමට ගෙන ඒම තෙක් එය ව්‍යාප්ත විය.

සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය කරමින් මූලිකවම දරිද්‍රතාව දුරු කිරීම අරමුණු කරගත් සමාජ සවලකරණ ක්‍රියාකාරකම් හා ණය පහසුකම් ගෙවීම දිවයින පුරා විහිදුණි. මූල්‍ය විනය පිළිබඳව ප්‍රතිලාභීන්ට පුහුණුව ලබා දෙන ලද අතර ආර්ථික සංවර්ධනයට මූලික දායකත්වය සපයන බවට බැංකුව දැඩි ලෙස විශ්වාස කරන ඉලක්ක ඛණ්ඩයක්වන කාන්තාවන්ව සවිබල ගැන්වීම අවධාරණය කරන ලදී.

## ක්ෂුද්‍ර මූල්‍ය ගම්මාන වැඩසටහන

මහජන බැංකු ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ ගම්මාන 239කට බැංකුව ණය පහසුකම් සපයමින් 2013දී කැපී පෙනෙන මං සලකුණක් සනිටුහන් කෙරිණි. හඳුනාගත් ව්‍යවසායකයන්ගේ විභවය මත පමණක්ම රඳා පවතින මෙම සහාය සමග, සජාතීය කර්මාන්තවල යෙදී සිටින ගම්මාන ඉලක්ක කරනු ලැබේ. ණය පහසුකම් ප්‍රදානය කිරීම, ග්‍රාමීය විරැකියාව අවම කරන අතර ගෘහ කර්මාන්තවල යෙදී සිටින ග්‍රාමීය ව්‍යවසායකයන්ගේ සංවර්ධනය කරා දායකවීමට බැංකුවට මග පෑදුවේය.

## කර්මාන්ත ප්‍රවර්ධනය

නව සීඝ්‍ර ණය (පීපල්ස් ෆාස්ට්) සහ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය හරහා අභිනවයෙන් අරඹන ලද කර්මාන්තවලට මෙන්ම ව්‍යාප්තවීමට හා දියුණුවීමට දිරිගන්වමින් පවත්නා කර්මාන්ත වලටද අරමුදල් සම්පාදන සහාය ලබා දෙන ලදී. පවත්නා කර්මාන්තවල පුනර්ජීවයක් අත් දකින අතරම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගෙන් සෑදුම්ලත් නව ව්‍යවසායක ප්‍රජාවක උපතටද මෙය මග පාදා ඇත. ඉලක්කගත අරමුදල් සම්පාදනය මගින් සාර්ව ආර්ථික ඉලක්ක සාක්ෂාත් කරගැනීම කරා රට ගෙන යන අතර රැකියා උත්පාදනය සහ ආදායම් අසමානතාව අවම කිරීම මෙමගින් සහතිකකර ඇත.

## මහවැලි ජනපදිකයන්ට සංවර්ධනය අත්කරදීම

කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හා ඒ හා සබැඳි කර්මාන්ත වැඩි දියුණු කිරීම හා ව්‍යාප්ත කිරීම ඉලක්ක කරමින් මේ වසරේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක අවධානය කේන්ද්‍රගත වූයේ මහවැලි ජනපදිකයන් කෙරෙහිය. මහවැලි අධිකාරිය විසින් නිර්දේශිත ව්‍යවසායකයන්ටද මූල්‍ය සහාය ලබාදෙමින් නව ණය යෝජනා ක්‍රමයවූ මහවැලි අරුණ දියත් කරන ලදී.

## සමුපකාර අංශය

ග්‍රාමීය සංවර්ධන සමීකරණයේදී සමුපකාර අංශයෙහි වැදගත්කම හැමවිටම පිළිගෙන ඇති බැංකුව, ජාත්‍යන්තර සමුපකාර සම්මේලනය හා ජාත්‍යන්තර සමුපකාර දිනය වෙනුවෙන් මූල්‍ය අනුග්‍රාහකත්වය දක්වමින් සමුපකාර ව්‍යාපාරය සමග සිය ප්‍රතිරූපය හා සබඳතාව තවදුරටත් වර්ධනයකර ගත්තේය.

සමුපකාර ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම ප්‍රධානතම ඉලක්කයක්වන බැවින් බැංකුව මෙගා කෝප් සිටි ක්‍රියාකාකරම් වෙනුවෙන්ද දීර්ඝ කාලීන මෙන්ම කෙටිකාලීන මූල්‍ය පහසුකම් ලබා දුන්නේය. සමුපකාර ව්‍යාපාරය තුළ සේවකයන්ගේ පුහුණුව හා සංවර්ධනය වෙනුවෙන් බැංකුව අරමුදල් සැපයීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනුකාර භවතුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමේ මට්ටම්වලට හා සේවා මට්ටම්වලට නියත වශයෙන්ම අගය එකතු කිරීමක් සිදු විය.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුකරණය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි විවිධ හා අභියෝගාත්මක මූල්‍ය හා මූල්‍ය නොවන අවශ්‍යතාවන්ට ඉඩ සැලසීම පිණිස සුසමාදර්ශී වෙනසක් දිරිගැන්වූ ආකල්පමය පරිවර්තනයක් සමග, මනා පුහුණුවක් ලද පිරිස් සේවයෙහි යෙදවූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන හා ඒකක 23 ක් දියත් කරමින් රට පුරා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුකරණයෙහි වෙනසක් ඇති කරන ලදී. රටේ ආර්ථික දැක්ම තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් අවසානයේදී ඉටු කරනු ඇති කාර්යභාරයෙහි වැදගත්කම හඳුනාගෙන සහනදායී අනුපාතික සහිතව ප්‍රාග්ධන ආයෝජන හා කාරක ප්‍රාග්ධන ආයෝජන යන දෙකම වෙනුවෙන් පහසුකම් සැපයීම පිණිස ශාඛා ජාලය සමග එක්ව ක්‍රියා කරමින් මෙම මධ්‍යස්ථාන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඔවුන් අපේක්ෂා කරන ප්‍රබෝධමත් කිරීම ලැබෙන බව සහතික කිරීමේදී වෙනසට මුල පුරන්නකු ලෙස පවතී. ආපසු ගෙවීම සඳහා සැපයෙන දිගු කාල පරිච්ඡේදයද, මෙම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථානයන්හි පුහුණු ශාඛා කළමනාකරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන උපදේශක සේවාවන්හි අගය එකතු කිරීම සමග ක්ෂුද්‍ර ව්‍යාපාර කළඹ යටතේවූ ව්‍යාපාර වැඩි ප්‍රමාණයක් සුළු හා මධ්‍ය පරිමාණ අංශය තෙක් ඉහළ නැංවීමට සහායකවී ඇත.

වර්ෂය තුළදී බැංකුව යාපනය, වන්නි, මඩකලපුව, අම්පාර හා කළුතර යන ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන දියත් කළේය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කළඹ හඳුනාගත් වර්ධන අංශවලට විශාල ලෙස විවිධාංගීකරණයවී ඇති තත්ත්වයක් තුළ, සැලකිය යුතු වර්ධනයක් සහතික කිරීම පිණිස එය උපාය මාර්ගික ලෙස ගොනු කර ඇත. එහිදී රජයේ සංවර්ධන අරමුණුවලට අනුකූලවන පරිදි කේන්ද්‍රගතවීම සිදුකර ඇති අතර එයට අමතරව බැංකුව නිෂ්පාදන, කෘෂිකර්ම, කිරි නිෂ්පාදන, සංචාරක හා වෙළඳ යන අනිවාර්යයෙන් වර්ධනයවන අංශ කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් සිටී. කාන්තා ව්‍යවසායක මූලාරම්භයන්ද අපගේ උපාය මාර්ගයට එක් කරනු ලැබ ඇති අතර එය අපගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඉලක්කවල ප්‍රධාන අත්‍යවශ්‍ය කරුණක්ව පවතී.

අපගේ බැංකුව සමග කටයුතු කිරීමේදී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මහත් නම්‍යශීලීබව සමග ඉදිරිපත් කෙරෙන මූල්‍ය පහසුකම් කරා පහසු ප්‍රවේශය ලැබෙන අතර මූල්‍යකරණ පිරිවැයද වාණිජ ණයදීම් අනුපාතිකවලට සාපේක්ෂව වඩාත් යහපත් මට්ටමක පවතී. ආයෝජන හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් අඩු ණය මුදල් ප්‍රමාණ සඳහා අවස්ථාව උදා කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශ හා පොල් සංවර්ධන අධිකාරිය ඇතුළු ණය දෙන නියෝජිත ආයතන සමග ගිවිසුම් ගණනාවකට බැංකුව එළඹ ඇත. රජයේ උපදෙස් අනුව ආයෝජන අරමුදල් ගිණුම මත පිපල්ස් ඉන්වෙස්ට්මන්ට් පවර් ණය යෝජනා ක්‍රමය සකස් කරන ලද අතර අඩු පොළී අනුපාතික, ආපසු ගෙවීමට ලැබෙන දිගු කාලපරිච්ඡේද හා පහසු සහන කාලය හේතුවෙන් එය අතිශය ජනප්‍රියවී තිබේ.

දිස්ත්‍රික්ක විශාල සංඛ්‍යාවක් ආවරණය කරමින් ව්‍යවසායකයන් අරමුණු කරගත් ආක්‍රමණශීලී පුහුණු වැඩසටහනක් වන 'ඔන්ට්‍රප්‍රෙනූරියල් ග්ලෝරි' බැංකුව ක්‍රියාත්මක කළේය.

## භාණ්ඩාගාරය

මේ වසරේදී භාණ්ඩාගාරය සඳහා බොහෝ අභියෝග මෙන්ම වැඩි විෂය පථයද ඉදිරිපත්වූයේ වැඩි ලාභ බොහෝ දුරට වර්ධිත පරිමාව මත රඳා පැවති සංවර්ධිත වෙළෙඳපොළවල් පිලිබිඹු කරන පරිසරයක ක්‍රියාත්මකවූ බැවිනි. කෙසේ වෙතත්, එ.ජ. ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් වෙළෙඳපොළ තනන්නෙකු ලෙස බැංකුවෙහි තත්ත්වය ස්ථානික හා පෙරටු යන වෙළෙඳපොළ දෙකෙහිම තවදුරටත් තදින් කාවැදී සිටියේ ගනුදෙනුකාර තත්ත්වයන් අත්කර ගැනීම පිණිස මිළ නියම කිරීමේ වාසි පරිවර්තනය කිරීමේ හැකියාව ලබා දෙමිනි. ආනයන හා අපනයනකරුවන්ට ලබාදුන් තරගකාරී අනුපාතික මගින් මෙය ක්‍රියාත්මක කරන ලද අතර එය ව්‍යාපාර පරිමාවන්හි ස්වාභාවික නැග්මකට හේතුවිය. ඉලක්ක සාක්ෂාත්කර ගැනීමට ඉඩ සලසනුවස් අභ්‍යන්තර විශේෂඥභාවය හා පළපුරුද්ද යොදාගැනීම තුළින් වෙළෙඳපොළ අවම කරමින් බැංකුව ව්‍යවහාර මුදල් තත්ත්වයන්ද සාර්ථක ලෙස කළමනාකරණය කළේය. දැන් බැංකුවට මහත් ප්‍රසිද්ධියක් ලැබීමට හේතුවී ඇති මෙම අභ්‍යන්තර විශේෂඥභාවය ආදායම වැඩි දියුණු කිරීම සැලසුම් කරමින් වෙළෙඳපොළ කියවීමේදී, කලට වේලාවට වෙළෙඳපොළට ඇතුළුවීමේදී හා ව්‍යාපාර කොටස් හෝ විදේශ විනිමය විකිණීමේ අවස්ථා උපයෝගී කරගැනීමේදී සැලකිය යුතු වාසියක් සලසයි.

## ප්‍රාථමික වෙළෙඳ ඒකකය

ප්‍රාග්ධන ලාභ හා ණය වෙළෙඳාම් කිරීම මගින් පොළී ඉපයීම් හරහා සැලකිය යුතු ආදායමක් දායකකරමින් 2013 වසරේදී මෙතෙක් ලද වැඩිම ලාභය වාර්තා කළේය. ස්ථාවර උද්ධමනය හේතුවෙන් වෙළෙඳපොළේ පොළී අනුපාතික ව්‍යුහය වෙනස්වීම සමග, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර කළඹ කැපී පෙනෙන ප්‍රාග්ධන ලාභ අත්කරගත්තේය. ලංකා රුපියල් එළදා වක්‍රයෙහි වෙනස්වීම් මත ප්‍රශස්තතම ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා තෝරාගත් උපාය මාර්ගවලට එක්වූ වෙළඳපොළ නිවැරදිව කියවා නිසි කලට වේලාවට එයට ඇතුල්වීමට කණ්ඩායම සතු විශේෂඥභාවය, මෙසේ උපදවන ලද සිත් බඳනාසුලු ආදායමට නිසැක වශයෙන්ම දායක විය.

අපගේ ණය ව්‍යුහගත කිරීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කරමින්, ආයතනික ණය නිකුත් කරන්නන් හා ආයෝජකයන් විශාල සංඛ්‍යාවක් වෙනුවෙන් සාර්ථක ගනුදෙනු අවසන් කරන ලදුව ඊර්ෂ්‍යා දනවන වෙළෙඳපොළ කොටසක් අත්පත් කරගෙන ඇති අපගේ ආයෝජන බැංකු ඒකකය මෙම වසරේදී සැලකිය යුතු ගාස්තු ආදායමක් උපදවමින් ණයකර හා වාණිජපත්‍ර මගින් රු. බිලියන 7.4ක් ඉපයුවේය. වෙළෙඳාම හරහා පුළුල් පොළී ආදායමක් හා ප්‍රාග්ධන ලාභ උත්තේජනයකර ඇති ශක්තිමත් ණය සුරැකුම් කළඹක්ද මෙම ඒකකය ගොඩ නගා ඇත.

අතිශයින්ම තරගකාරී අනුපාතික යටතේ මූල්‍ය ආයතන හරහා දේශීය හා විදේශීය අරමුදල් ඉපයීම අඛණ්ඩව සිදුවූ අතර එය බැංකුවේ ලාභදායිකත්වය කෙරෙහි සත්‍ය ලෙසම ධනාත්මක බලපෑමක් ඇති කළේය.

## තොරතුරු තාක්ෂණය

අභියෝගාත්මකවුවත් අතිශයින්ම ප්‍රතිලාභ ලබාදෙන වසරක එළඹීම හඟවමින්, උපායමාර්ගික ඉලක්ක සාක්ෂාත් කරගැනීමේදී බැංකුවේ තොරතුරු තාක්ෂණ කොඳු නාරටිය ගාමක බලයක්වනු ඇති බව තහවුරු කිරීම පිණිස තොරතුරු තාක්ෂණ කණ්ඩායම සතුවූ දූරදර්ශී සැලසුම මනා ලෙස සකස්කර තිබිණි. වසර සඳහා පුරෝගාමී ව්‍යාපෘතියවූයේ බැංකුවට පැමිණෙන ගනුදෙනුකාරභවතෙකු විසින් ශ්‍රී ලංකා රේගුව වෙත රේගු බදු හෝ බදු ගෙවීම ක්ෂණිකව දැනුම්දීමට ඉඩ සලසමින් සම්පූර්ණයෙන්ම බැංකු තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින්ම සකස් කරන ලද අන්තර්ජාලය මගින් රේගු බදු හා බදු ගෙවීමේ ව්‍යාපෘතියයි.

වේගවත් භාණ්ඩ නිෂ්කාශනය සඳහා මෙමගින් හැකියාව ලබාදීම සිදු කෙරේ. මහජන බැංකු අන්තර්ජාල බැංකුකරණ දොරටුව මගින් සතියේ දින 7 පුරා පැය 24ම මෙම පහසුකම ලබාගත හැකිවේ.

අන්තර්ජාලය මගින් සේ.අ.අ. හා සේ.භා.අ. ගෙවීම් සිදුකිරීමට පහසුකම් සලසමින් මේ හා සමාන ව්‍යාපෘති දෙකක් සම්පූර්ණ කරන ලදී. අන්තර්ජාල බැංකුකරණය හරහා බලය නොලත් තෙවන පාර්ශ්ව ගනුදෙනු ක්‍රියාත්මකවීම වළක්වන ද්විත්ව සාධක සත්‍යාපන සංරචකයකින් සුරක්ෂිත කළ, කුමන හෝ බැංකුවක තෙවන පාර්ශ්ව ගිණුම්කට අරමුදල් මාරු කිරීමේ හැකියාව සලසන තවත් මුලාරම්භයක්ද හඳුන්වා දෙනු ලැබිණි. මෙම ගනුදෙනුව සිදුවන විට කෙටි පණිවුඩයක් මගින් දැනුම් දීමක් සිදු කෙරේ.

ව්‍යුහගත නොකළ පරිපූරක සේවාදත්ත (USSD) කේත #488# යෙදවීමෙන් බහුවිධ සේවා දියත් කිරීම සමග ජංගම බැංකුකරණ පියවරක් ඉදිරියට තැබුවේය. කුමන හෝ ගිණුමකට හෝ කුමන හෝ බැංකුවකට අරමුදල් මාරුකිරීම, උපයෝගිතා බිල්පත් ගෙවීම හා උකස් ශේෂ විමසුම සේවාවන් අතරට අයත් වේ. 2014 දී සිත් බඳිනා සුළු අගය එකතු කිරීම් සිදුකිරීමත් සමඟ ජංගම බැංකුකරණ ක්‍රියාදාමය තවත් ප්‍රබෝධමත් වනු ඇත.

ජාතික පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරුවට සම්බන්ධ අනෙකුත් බැංකු විසින් ක්‍රියාත්මක කෙරෙන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා ගනුදෙනු කිරීමට ගනුදෙනුකාරභවතුන්ට හැකියාව ලබාදෙමින් ජාතික පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරු ව්‍යාපෘතියට සම්බන්ධවූ ප්‍රථම බැංකුව වූයේ මහජන බැංකුවයි. මෙම සේවා සඳහා කලින් අය කරන ලද ගාස්තුව රු. 75/-ක්වූ නමුත් බැංකුව දැන් මෙම පොදු හුවමාරු ව්‍යාපෘතියට සම්බන්ධව සිටීම හේතුවෙන් එම ගාස්තුව ආන්තික රු. 15/-ක් තෙක් අඩුවී ඇත. තවද බැංකුවේ පාලනය ක්‍රියාත්මක සීමාව යටතේ පවතින 460ක්වූ වර්තමාන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයට අළුතින් යන්ත්‍ර හතළිහක් එක් කරන ලදී.

තොරතුරු තාක්ෂණය ඒකාබද්ධ කිරීම උකස් ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් අගය එකතු කිරීම ගෙනඒමත් සමග උකස් ක්‍රියාවලිය සැලකිය යුතු ඉලක්කගතවීමක් අත් දුටුවේය. බොත්තමක් එබීමෙන් පමණක් කෙටි පණිවුඩ බැංකුකරණය හරහා උකස් කරන ලද භාණ්ඩයේ තත්ත්වය පිළිබඳව විමසීමටත් ඕනෑම ශාඛාවක් හරහා මුදලින් කොටසක් ගෙවීමටත් මෙමගින් හැකියාව ලැබේ. නව කේන්ද්‍රිය බැංකුකරණ පද්ධතිය හරහා මෙම ස්වයංක්‍රීයකරණය මනා සහායක් ලබයි.

සුරක්ෂිතභාවය පාලනය කිරීම උපරිම තත්ත්වයට ගෙනඒම පිණිස තොරතුරු තාක්ෂණ කණ්ඩායම බාහිර හා අභ්‍යන්තර ජාල සුරක්ෂිතභාවය අවදානමට ලක්වීමේ හැකියාව තක්සේරු කිරීමේ පරීක්ෂණ ගණනාවක් පැවැත්වූ විට, ටෙක් සර්ට් (TECH-CERT) සහාය ඇතිව සුරක්ෂිතභාවය සඳහා වැඩි බරක් දෙන ලදී. දේශීය හා විදේශීය යන දෙආකාරයෙන්ම ලබාදෙන ලද පුළුල් පුහුණුව හා සංවර්ධනය කණ්ඩායමේ දැනුම හා කුසලතා උත්ශ්‍රේණිගත කළ අතර ඒ සියල්ලම බැංකුව අවසානයේදී අත්කරගන්නා සාධනීය ප්‍රතිඵල සඳහා ප්‍රබල ලෙස දායක වෙයි.

## පර්යේෂණ

### ආර්ථික විමසුම (Economic Review) සඟරාව

පෙරමුණ ගත්, සංවර්ධන නැඹුරුවක් සහිත අර්ධ අධ්‍යාපනික සමාජ ආර්ථික සඟරාවක් වන ආර්ථික විමසුම දශක හතරක් පමණ තිස්සේ සංවර්ධන නැඹුරුවක් සහිත පර්යේෂණ පාදක හෙළිදරව් කරගැනීම් හා නවෝත්පාදනයන් විසුරුවා හැරීමේ වඩාත්ම වැදගත් හා ඵලදායක මාර්ගයක්වී ඇත. පර්යේෂණ අංශය විසින් 1975 සිට අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන ලද මෙම සඟරාව පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයට පමණක් නොව එහි ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියට බැංකුව දක්වන ලද සිත් බඳනා සුළු දායකත්වයට සාක්ෂි දරයි. අනෙකුත් අවධානය පැහැර ගන්නා තොරතුරු අතර ආර්ථික විමසුම සඟරාව අදාළ විශේෂඥයන් විසින් කාලීන වැදගත්කමකින් යුතු ජාතික හා ජාත්‍යන්තර සමාජ හා සංවර්ධන ගැටළු හා ප්‍රශ්න පිළිබඳව තීරු, සම්මුඛ සාකච්ඡා, ග්‍රන්ථ සමාලෝචන හා සිසු පිටුවක්ද පළ කිරීම සැලකිල්ලට ගත්කළ මෙම ප්‍රකාශනයේ සුවිශේෂීභාවය සමග රටේ, කලාපයේ පමණක් නොව බොහෝ විට ලෝකයේම සියළු වාණිජ බැංකු ප්‍රකාශන අතර එය අසමසම තත්ත්වයක පවතී. පර්යේෂකයන්, සැලසුම් සකසන්නන්, ප්‍රවෘත්ති සම්පාදකයන්, ව්‍යවසායකයන් හා ආර්ථිකයට හා මාතෘකාවට අදාළ ක්ෂේත්‍රවල සිසුන් ඇතුළු අධ්‍යාපනඥයන් හා වෘත්තිකයන් විසින් අත්දැකීම්, දැනුම හා උනන්දුව දක්වන කරුණු බෙදා හදා ගැනීම හා ප්‍රවර්ධනය සිදු කරමින් එය ජාතික සංවර්ධනය කෙරෙහි මිනිය නොහැකි සේවයක් සපයයි.

කාලීන ගැටළුවක් හෝ තේමාවක් මත පදනම්වූ විශේෂ වාර්තා අතිරේකයක් යටතේ පරිපූර්ණ විශ්ලේෂණයක්ද සෑම කලාපයකම අන්තර්ගතවේ. වර්ෂය තුළදී විද්‍යාව හා තාක්ෂණය, ආයතනික පාලනය, ආර්ථිකයෙහි කාන්තා සහභාගිත්වය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, ප්‍රාදේශීය සංවර්ධනය හා 2013 පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව යන තේමා මත පදනම්ව ආර්ථික විමසුම කලාප හයක් ප්‍රකාශයට පත් විය.

## අලෙවි සහ ප්‍රවර්ධන

අලෙවි හා ප්‍රවර්ධන කණ්ඩායම බැංකුවේ එදිනෙදා මෙහෙයුම්වල ඉතා සක්‍රිය හා ගතික මූලික කොටසක් ලෙස සිටින අතර නිසැක වශයෙන්ම අපගේ සාර්ථකත්වය හා තදින් බැඳී සිටී. පවත්නා නිපැයුම් පිළිබඳව සන්නම් දැනුවත් බව ඇති කිරීමේ සිට නව නිපැයුම් හා සේවා දියත් කිරීම තෙක්, මහජනයා දැනුවත්වීම අවශ්‍ය කරන ශාඛා විවෘත කිරීම් හා අලුත් තැනක පිහිටුවීම්

ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව අතිරේක ප්‍රවර්ධන හා අගය එකතු කිරීම් ඇරඹීම, අතිශයින්ම තීක්ෂණ හා දූරදර්ශී ආකාරයට සිදු කරනු ලැබේ.

## ශාඛා ජාලය පුළුල් කිරීම

ආණමඩුවේ හා විල්ගමුවේ මහජන බැංකු හා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් නව ශාඛා උත්සවාකාරයෙන් විවෘත කිරීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහභාගිවීම බැංකුවට ගෞරවයක්වූ අතර එම ශාඛා දෙකම අති නවීන තාක්ෂණයෙන් සමන්විතව ආයතන දෙකෙන්ම සැපයෙන මූළු සේවා හා නිපැයුම් කළඹ ඉදිරිපත් කිරීමට සැලසුම් කරනු ලැබ ඇත. විල්ගමුවේ උත්සවයේදී, මහජන බැංකුව වෙත අතිමහත් පක්ෂපාතිත්වය ප්‍රදර්ශනය කරඇති ප්‍රධාන ගනුදෙනුකාරහවතුන් දස දෙනෙකුට ප්‍රතිලාභ පිරිනමන ලද අතර එයට සමගාමීව ග්‍රාම සේවා කොට්ඨාශ 39ක පදිංචිකරුවන් 1,100ට ඉතුරුම් ගිණුම් හිමි විය. තෝරාගත් ගනුදෙනුකාරහවතුන් සංඛ්‍යාවකට ණයද බෙදා හරිනු ලැබූ අතර ඔවුනට වෙනත් ප්‍රතිලාභද හිමි විය.

යාපනය මහවීදියේ හා කයිතඩිහිද දැන් මහජන බැංකු සේවා මධ්‍යස්ථාන පිහිටුවනු ලැබ ඇති අතර ඒවා මඟින් ණය, උකස් පහසුකම්, ආරක්ෂිත සේප්පු හා දින 7ම පැය 24 පුරාම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් ඇතුළු සාමාන්‍ය බැංකු සේවාවන්ට අගය එකතු කිරීම් සැපයේ. ගනුදෙනුකාරහවතුන්ගේ පහසුව පිණිස පවත්නා ශාඛාව වෙනත් ස්ථානයක පිහිටුවන ලදුව මේ වසරේ විවෘත කරන ලද රත්තොට නව දෙමහල් ගොඩනැගිල්ලේදීද මෙම සාමාන්‍ය බැංකුකරණ සේවාවන් මෙන්ම ණය, උකස් පහසුකම් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම්ද දැන් ලබාගත හැකිය.

රටේ වඩාත්ම සංකේතාත්මක යටිතල සංවර්ධන ව්‍යාපෘති අතරින් එකක් වන දක්ෂිණ අධිවේගී මාර්ගයට අතිරේක අගයක් එක් කරනු ලැබූයේ බැංකුවේ අති නවීන තාක්ෂණය හා කාලීන නිපැයුම් හා සේවා හඳුන්වා දෙමින් කැනොවින් ආකේඩ්හි මහජන බැංකුව ශාඛාවක් හා සේවා කවුළුවක් විවෘත කිරීම සමඟිනි.

## ප්‍රවර්ධන

මෙම වසරේ මාර්තු මසදී අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය අසල ආගමික උත්සවයක්, ඉමහත් ප්‍රසිද්ධියක් ලබාඇති ඉතුරුම් වැඩසටහනක් වන ජනප්‍රිය ජය ශ්‍රී 2013 දියත් කිරීම සලකුණු කළ අතර සියළු ශාඛාවල සහභාගිත්වය ඇතිව දොරින් දොරට වැඩසටහනක් තවදුරටත් සිදු කරගෙනයනු ලැබිනි. නුවරවැව ශාඛාවේදී ජය ශ්‍රී පාගමන සමඟ දොරින් දොරට ව්‍යාපාරය උත්සවාකාරයෙන් ආරම්භවූ අතර දීප ව්‍යාප්තව පිහිටි ශාඛා 735ම එයට සමගාමීව එම වැඩසටහන ආරම්භ කළේය. ඉතිරිකිරීමේ වැදගත්කම මෙන්ම මහජන බැංකුව මඟින් පිරිනැමෙන නිපැයුම් හා සේවා පිළිබඳව ජනතාව අතර දැනුවත්බව ඇති කිරීම පිණිස මෙම ව්‍යාපාරය අතිශයින්ම විශිෂ්ට සන්නිවේදන මාර්ගයක් විය.

සැමට ප්‍රතිලාභ සැලසීම හේතුවෙන් දැඩි ප්‍රසාදයට ලක්ව සිටින මුල් පෙළේ මූල්‍ය ආයතනයක් ලෙස බැංකුවේ තත්ත්වය යළි තහවුරු කරගනිමින්, ධීවර, කෘෂිකර්ම, වාණිජ හා රෙදිපිළි ක්ෂේත්‍රවල ස්වයං රැකියා ප්‍රයත්නයන් සඳහා සූදානමින් සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙනුවෙන් සැපයෙන ණය පහසුකම් පිළිබඳව තොරතුරුද මෙම ව්‍යාපාරය බෙදා හැරියේය. ජය ශ්‍රී දිනුම් ඇදීම මගින් ගිණුම්හිමියන්ට, මෝටර් රථ, මුදල් ත්‍යාග සහ සුඛෝපභෝගී නිවාස වැනි ආකර්ෂණීය ත්‍යාග පිළිවෙලින් මාසික හා වාර්ෂික දිනුම් ඇදීම් මගින් ලබා දෙන අතර ජය ශ්‍රී ගිණුමෙහි ශේෂය අනුව දිනුම් අවස්ථා වැඩිකර ගැනීමට අවස්ථාවද සළසයි.

ශ්‍රී ලංකාවේ නිදහසේ 65වැනි සැතපුම් කණුව උත්සවාකාරයෙන් සමරමින් මහජන බැංකුව එහි වාර්ෂික නිදහසේ උපත වැඩසටහන අඛණ්ඩව පැවැත්වූයේය. මෙම අතිශය වැදගත් අවස්ථාවේදී රටේ ජනතාව තුළ අභිමානවත් හැඟීම් ඇති කිරීමේ ක්‍රමයක් ලෙස මෙම වැඩසටහන සංවිධානය කරන ලද අතර පෙබරවාරි 1 වැනි දින සිට 7 වැනි දින දක්වා ශ්‍රී ලංකාව තුළ උපන් සෑම බිළිඳෙකුට ඉසුරු උදාන ත්‍යාග සහතික ත්‍යාග කිරීමේ සාර්ථක වැඩසටහන ක්‍රියාත්මක කිරීමද සැලසුම් කරන ලද්දේ අනාගත පරම්පරාවන් වෙතටද අභිමානවත් හැඟීම ව්‍යාප්ත කරනු පිණිසවේ.

රටේ ප්‍රමුඛතම අනේවාසික විදේශ මුදල් ගිණුම් අතරින් එකක් වන එතෙර ඉසුර වඩාත් උත්තේජනයක් ලද්දේ සුපිරි ත්‍යාගය ලෙස රු. මිලියන 1ක් ද රු. 100,000 බැගින්වූ ත්‍යාග දහයක්ද රු. 50,000 බැගින්වූ ත්‍යාග 15ක්ද සහිත සුපිරි දිනුම් ඇදීමක්ද මාසික දිනුම් ඇදීම්ද එතෙර ඉසුර අනේවාසික විදේශ මුදල් හිමියන් වෙනුවෙන් බැංකුව පැවැත්වීමත් සමඟය. මෙම වසරේදී ජංගම දුරකථන හා මුදල් ත්‍යාග ඉදිරිපත් කරමින් 'රට සල්ලි වාසනා' නමින් නව දිනුම් ඇදීමක් ක්‍රියාත්මක කරන ලද්දේ පීපල්ස් බෑන්ක් ස්විෆ්ට්, පීපල්ස් ඊ රෙමිටන්ස් හා ටෙලෙක්ස් හරහා ගිණුම්වල තැන්පත් කරන ලද විදේශ විනිමයට වැඩි අගයක් එක් කරමිනි.

## අනුග්‍රාහකත්ව

### ආගමික හා සංස්කෘතික උරුමය රැක ගැනීම

රාජ්‍ය බැංකුවක් ලෙස, රටේ පුළුල් ඉතිහාසය හා සංස්කෘතිය ආරක්ෂාකර පවත්වාගෙන එය අනාගත පරම්පරාවන්ට දායාද කිරීම සහතික කිරීමෙහිලා අප සතු වගකීම පිළිබඳව අපි සවිඥානකව සිටින්නෙමු. වසර ගණනක් මුළුල්ලේ අඛණ්ඩව අපි අනුග්‍රාහකත්වය දරා ඇති ශ්‍රී ලංකාවේ වඩාත්ම ඓතිහාසික සංදර්ශන හා සංස්කෘතික උත්සවවල හවුල්කරුවෙකුවීමට එම සවිඥානක බව අපව දිරිගන්වයි. එබඳු එක් උත්සවයක් වන්නේ වාර්ෂිකව මහනුවරදී පැවැත්වෙන ආසියාවේ විශාලතම සංස්කෘතික සංදර්ශනය වන ඇසළ මහ පෙරහැරයි. ඇසළ මහ පෙරහැර ශ්‍රී ලංකාවේ අති පූජනීය ස්ථානයවන බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතුව තැන්පත්කර ඇති ශ්‍රී දළදා මාළිගාවේ

ප්‍රධාන උත්සවය වේ. මෙම උත්සවයෙහි නිල බැංකුකරු වීමෙන් මෙම උදාර අවස්ථාවට වඩාත් සමීපව සම්බන්ධ වීමට අපට අවස්ථාව උදාවේ.

ඒ හා සමාන සංදර්ශනයක්වන සෙංකඩගල ඇසළ මහ පෙරහැරටද බැංකුව අනුග්‍රාහකත්වය සපයයි. වසර 2,200ක් ඉක්මවූ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ අතිශය පූජනීය ස්ථානයක්වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ යාල ජාතික වනෝද්‍යානයෙහි පිහිටි සිතුල්පව්ව රජ මහ විහාරයට මහජන බැංකුවේ හවුල්කාරිත්වය ලැබුණේ පොසොන් උත්සවය වෙනුවෙන් බැංකුව විහාර පරිශ්‍රය සැරසිලි කිරීමත් සමඟිනි.

වසර දොළහක් මහජන බැංකුව අනුග්‍රාහකත්වය සපයා ඇති කොළඹ නගරයේ විශාලතම විචිත්‍රවත් උත්සව පෙරහැර වන වාර්ෂික නවම් පෙරහැර ද බැංකුව ඉතා උනන්දුවෙන් සම්බන්ධ වන තවත් සංස්කෘතික හා ආගමික උත්සවයකි. ශ්‍රී ලංකා ආගමික ඉතිහාසයේ පරිච්ඡේද ගණනක සටහන්ව ඇති තිස්සමහාරාම මහා විහාරයේ වාර්ෂික රුහුණු මහා පොසොන් පෙරහැරද බැංකුවේ අනුග්‍රාහකත්ව ලිතෙහි ස්ථිරව සටහන් වී පවතී.

ගංගාරාම විහාර පරිශ්‍රයට ආලෝකකරණය හා සැරසිලි එක්කර මෙම වැදගත් උත්සවය සනිටුහන් කරමින් ජනාධිපති ලේකම් කාර්යාලය සහ හුණුපිටිය ගංගාරාම විහාරය විසින් සංවිධානය කෙරෙන බුද්ධ රශ්මි වෙසක් මංගල්‍යයට බැංකුවේ සහාය ලැබීමත් සමඟ බෞද්ධ දින දර්ශනයෙහි වඩාත්ම වැදගත් ආගමික උත්සවයවන වෙසක් උත්සවයට උත්තේජනයක් ලැබිණි.

සහශ්‍ර දෙකක් ඉක්මවන ඉතිහාසයකට හිමිකම් කියන, රුහුණු රාජධානියට විහාරමහාදේවී කුමරිය (දුටුගැමුණු රජතුමාගේ මව) ගොඩබට ස්ථානයයැයි විශ්වාස කෙරෙන පොතුවිල්හි පිහිටි පෞරාණික පූජනීය ස්ථානයක් හා පුරාවිද්‍යා බිමක්වන මුහුදු මහා විහාරය තිස් වසරක යුද්ධයේ බලපෑමට ලක්ව තිබූ අතර එය ප්‍රතිසංස්කරණය සඳහා බැංකුව වෙතින් අරමුදල් සම්පාදනය කෙරිණි.

**තිරසාර සවිබල ගැන්වීම**

කාන්තා ව්‍යවසායකයින්ට දිරියක් සපයමින් හා කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි බැංකුවේ කැපවීමට උදාහරණයක් සපයමින් කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද වාර්ෂික සමුළුවට බැංකුව අනුග්‍රාහකත්වය සැපයීමෙන් එයට අතිරේක දිරිගැන්වීමක් හා අගය එක් කිරීමක් ලැබිණි.

තිරසාර ව්‍යවසායකත්වය, බැංකුවේ ආයතනික සමාජ වගකීම් සංකල්පය තුළ ශක්තිමත් වේදිකාවක්ව පවතින හෙයින් අධ්‍යාපනය කෙරෙහි අවධානය කේන්ද්‍රගතවන අතර, පීඨ හතකින්, පරිගණක විද්‍යා ආයතනයෙන්, අධ්‍යාපන ආයතන හයකින් හා ශ්‍රීපාලි විශ්ව විද්‍යාලයෙන් එක්වූ 8,000ක් උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන්, කථිකාචාර්යවරුන් හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් සහභාගිවූ කොළඹ විශ්ව විද්‍යාලයේ වර්ණ රාත්‍රියට බැංකුව අනුග්‍රාහකත්වය දැක්වීම මෙයට මනා උදාහරණයක් විය.

ජීවන කුසලතා හා සැබෑ ලෝකයේ ජීවත්වීමේ දැනුම හා අත්දැකීම ලබාදීම බාලදක්ෂ ව්‍යාපාරයෙහි කාර්යය වන අතර බැංකුව එයට හොඳින් අනුගතව සිටී. ලොව විශිෂ්ටතම බාලදක්ෂ කණ්ඩායම් අතරින් එකක් වන ධර්මරාජ විද්‍යාලයීය කණ්ඩායමේ 125 වැනි සංවත්සර සැමරුම වෙනුවෙන් වූ RISGO 2013 ජාත්‍යන්තර බාලදක්ෂ ජම්බෝරියට බැංකුව අනුග්‍රාහකත්වය ලබාදීමෙන් මෙය වඩාත් තහවුරු කෙරිණි.

**එක්සත්බව හා ජීවගුණය ගොඩනැගීම**

ශ්‍රී ලංකා මෝටර් රථ හා යතුරුපැදි ධාවන තරඟකරුවන්ගේ සංගමය හා එක්ව ශ්‍රී ලංකා යුධ හමුදා කාලතුවක්කු රෙජිමේන්තුව විසින් මින්නේරියේදී සංවිධානය කරන ලද උද්වේගකර මාර්ග ධාවන තරඟය 2013 ගනර් සුපර්ක්‍රොස්, සුවිශේෂී ලෙස ඉදිකරන ලද බොරළු ධාවන පථයේදී හයවැනි වරටත් පවත්වන ලද්දේ මහජන බැංකුවේ සහාය ඇතිවයි. බැංකුව මෙම වසර තුළදී වාහන හා පරිගණක මිලදී ගැනීම සඳහා ණය ඇතුළුව හමුදා පිරිස් සඳහා පුද්ගල ණය සැපයුවේය.

එක්සත්බව, අන්‍යෝන්‍ය බැඳීම හා කණ්ඩායම් ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් මෙම ක්‍රීඩා ක්‍රියාකාරකම් හා සම්බන්ධවීම තවදුරටත් ඉදිරියට ගෙනයමින් බැංකුව මෙම ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි වඩාත් ප්‍රසිද්ධ ඉසව්වක්වන ෆොක්ස් හිල් සුපර්ක්‍රොස් තරඟය 2013 වෙනුවෙන් අනුග්‍රාහකත්වය සැපයුවේය. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රමුඛ පුහුණු ආයතනය වන ශ්‍රී ලංකා යුධ හමුදා පුහුණු පාසල සහ ශ්‍රී ලංකා මෝටර් රථ හා යතුරුපැදි තරඟ ධාවනකරුවන්ගේ සංගමය විසින් සංවිධානය කර 21 වැනි වසරටත් පවත්වන ලද මෙම ප්‍රබෝධමත් කරවන සුලු තරඟයෙන් උපයාගන්නා අරමුදල් කලාපයේ සමාන අධ්‍යාපන ආයතන හා සම මට්මට, ආයතනය ගෙන ඒම පිණිස එහි පුහුණු හා සංවර්ධන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට යොදාගැනේ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හා ශ්‍රී ලංකා ඔටෝස්පෝර්ට්ස් රියැදුරු සංගමයේ ඒකාබද්ධ ප්‍රයත්නයක් වන සීගිරිය සුපර්ක්‍රොස් 2013 සහ ශ්‍රී ලංකා සන්නද්ධ බලකාය සහ ශ්‍රී ලංකා මෝටර් රථ හා යතුරුපැදි තරඟ ධාවනකරුවන්ගේ සංගමය විසින් සංවිධානය කෙරෙන ලද කැවල්රි සුපර්ක්‍රොස් 2013 යන දෙකටම මහජන බැංකුව අනුග්‍රාහකත්වය සැපයුවේය. මෙම තරඟ පිළිවෙලින් සඳහන් කරන ලද ආයතන වෙනුවෙන් අරමුදල් ඉපයීම සඳහාවූ අතර එම ආයතන යටිතල පහසුකම් සංවර්ධනය සහ හමුදා පිරිස්වල හා ඔවුන්ගේ පවුල්වල සුභසාධනය වෙනුවෙන් ක්‍රියා කරයි.

### තෘප්තිමත්භාවය ඇති කිරීම

පරිපූර්ණ පුරවැසියන් නිර්මාණය සඳහා විනෝදාස්වාදය සැපයීම තීරණාත්මක සාධකයක්ව පවතින අතර ඵලදායී හා සෞඛ්‍යසම්පන්න පුරවැසියන්වීම සඳහා ජනතාවට උත්තේජනය අවශ්‍ය බව හැමවිටම මහජන බැංකුවේ විශ්වාසයවී ඇත. මහජනතාවට ගුණාත්මක විනෝදාස්වාද සංකල්ප සැපයෙන බව තහවුරු කිරීමේදී ඔවුන් සපයන සේවාව හේතුවෙන් විනෝදාස්වාදය සපයන ශිල්පීන්ට නිසි පිළිගැනීම ලැබිය යුතු බවට විශ්වාසය ඇතිව බැංකුව ප්‍රමුඛ රූපවාහිනී සම්මාන උළෙලක් වන 2013 සුමති සම්මාන උළෙලට අනුග්‍රාහකත්වය සැපයුවේය.

ප්‍රීතිමත් හා තෘප්තිමත් පුරවැසියන් බිහිකිරීමට විනෝදාස්වාදය තීරණාත්මක සාධකයක්ය යන විශ්වාසය, ප්‍රවීණ සංගීතඥ හා ගායක විශාරද එඩ්වඩ් ජයකොඩි මහතාගේ 60 වැනි උපන්දිනය සමරමින් ඉදිරිපත් කරන ලද ඒක පුද්ගල ගී ප්‍රසංගයවූ මාරම්බරි වෙනුවෙන් අනුග්‍රාහකත්වය දැක්වීමට බැංකුව පෙළඹවූයේය. අර්ධ ශාස්ත්‍රීය, ශාස්ත්‍රීය, ජන, වේදිකා හා චිත්‍රපට ගී ගායනයෙහි පුහුණු ගායකයෙකු වන ඔහුගේ 35 වසරක සංගීත චාරිකාව ඔහුව එම ක්ෂේත්‍රය මූර්තිමත් කරන චරිතයක් බවට පත්කර ඇත.

ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස අරමුදල් රැස්කරනු වස් ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි 84 කණ්ඩායම මියැසි අබිමන් සංවිධානය කළ අවස්ථාවේදී මේ හා සමාන සංගීත සැඳෑවකට මහජන බැංකු අනුග්‍රාහකත්වය හිමි විය.

නිවාස, වෛද්‍ය ප්‍රතිකාර හා ශිෂ්‍යත්ව සඳහා අරමුදල් සැපයීම ඇතුළුව සුබසාධක ක්‍රියාකාරකම වෙනුවෙන් මුදල් රැස් කිරීමට අමතරව රණවිරුවන්ගේ දරුවන්ට අඛණ්ඩ අධ්‍යාපනය සහතික කිරීම පිණිස මුදල් ඉපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයද සංගීත ප්‍රසංගයක් සංවිධානය කළේය. මෙම අතිශය චමත්කාරජනක සංගීත ප්‍රසංගයවූ 'විරු දන ගී සර 5' පිට පිට පස්වෙනි වසරට පවත්වනු ලැබිණි.

### වෘත්තීය සංවර්ධනය

වෘත්තීය ආචාර ධර්ම හා කුසලතා සංවර්ධන බැංකුවේ පාර්ශ්වකරුවන්ගේ දියුණුවට අදාළ විෂය පථයෙහි අනිවාර්ය අවධානය පැහැරගන්නා කරුණක්වන අතර ශ්‍රී ලංකා කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් සංවිධානය කරන ලද පුවත්පත් කලාවේ විශිෂ්ටයන් වෙනුවෙන් සම්මාන උළෙලට අනුග්‍රාහකතක්වය සපයමින් බැංකුව ස්ථිර ආචාරධර්ම, අගනා ප්‍රතිපත්ති හා ඉහළම වගකීම් සහිත බව මත පදනම්වූ ඉහළ මට්ටමේ විමර්ශනාත්මක පුවත්පත් කලාව සඳහා සිය සහාය පළ කළේය.

මෙම වෘත්තිකයන් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරමින් 'පශ්චාත් ගැටුම් ශ්‍රී ලංකාව - අභියෝග සහ කලාපීය ස්ථාවරත්ව' යන තේමාව යටතේ සංවිධානය කරනු ලැබූ 2013 ආරක්ෂක සම්මන්ත්‍රණයට බැංකුව සිය නොමසුරු සහාය ලබා දුන්නේය. අත්දැකීම් හුවමාරු කරගැනීමට හා ශ්‍රී ලාංකික අත්දැකීමට විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් සහිතව ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් යළි ගොඩනැගීම, සමාජ ඒකාබද්ධතාව, ප්‍රතිසන්ධානය හා කලාපීය ස්ථාවරත්වය ඇතුළු පුළුල් පරාසයකවන මාතෘකා හා ගැටළු ගණනාවක් පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම ඉහළ මට්ටමේ තෙදින සම්මන්ත්‍රණය ලොව විවිධ රටවලින් ජ්‍යෙෂ්ඨ හමුදා පිරිස්, පරිපාලකයන්, බලධාරීන් හා බුද්ධිමතුන් ඒකරාශී කරයි.

# මූල්‍ය සමාලෝචනය

**2013 වර්ෂයේ බදු පූර්ව ලාභය හා පශ්චාත් බදු ලාභය, පිළිවෙළින් රුපියල් බිලියන 10.3ක් හා රුපියල් බිලියන 7.5ක් විය. පෙර වසරට වඩා 7%ක වර්ධනයක් පෙන්නුම් කරමින්, බැංකුවේ ශේෂ පත්‍රය මෙකී වසරේදී රුපියල් බිලියන 931ක් වාර්තා කළේය.**

## ආර්ථික සන්දර්භය

### ශ්‍රී ලංකා ආර්ථිකයේ යථා දර්ශය

තත්ත්වාගණනයන් පිළිබඳ සුප්‍රසිද්ධ ආයතන දෙකක් වන Fitch Ratings සහ Standard & Poor විසින් පිළිවෙළින් BB- සහ B+ යන තත්වාගණනයන් ශ්‍රී ලංකාවට ලබාදීමෙන්, රටේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් ඉහළ යමින් පවතින බව මනාව පැහැදිලි වෙයි. ගෝලීය සෞභාග්‍ය දර්ශකය (Global Prosperity Index) ඇතුළු තවත් දර්ශක කිහිපයක්ම මෙම ධනාත්මක ලක්ෂණම පිළිබිඹු කර ඇති අතර, ඒ අනුව, ශ්‍රී ලංකාව ලෝකයේ 60වන ස්ථානයටත්, දකුණු ආසියාවේ ප්‍රථම ස්ථානයටත් පත් කරනු ලැබ ඇත. Ease of Doing Business නම් වන දර්ශක ආයතනයද ශ්‍රී ලංකාව තව දුරටත් ඉහළ නංවමින්, එම තත්වාගණනයන් අනුව ලෝකයේ 85වන ස්ථානය ලබා දුන් අතර, ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයද 97 සිට 81 දක්වා උඩුකුරු තත්ත්වයකට පත්කර තිබිණි. The Global Competitiveness Index නම් ආයතනය විසින් දකුණු ආසියාවේ දෙවැනි ඉහළම 65වන ස්ථානය අප රටට ලබා දීමෙන් ඉක්බිතිව, ලෝකයේ මානව සංවර්ධන දර්ශකයේ 92වන ස්ථානය මානව සංවර්ධන ක්ෂේත්‍රය තුළ ලබා ගැනීමටද අපට හැකිවිය.

ගතවූ වසර කිහිපය තුළ සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පියවරවල් සමග මූල්‍ය උපාය මාර්ගයන් ඉතා බුද්ධිමත්ව ක්‍රියාත්මකවීම නිසා, බාහිර අවිනිශ්චිතතා සහ අභ්‍යන්තර අභියෝගද පාලනය කරගනු ලැබීය. මෙම උපාය මාර්ගයන් ස්ථිර වශයෙන් ම ධනාත්මකවූයේ, 2012 වර්ෂයේ අයවැය හිඟයවූ දළ දේශීය නිෂ්පාදනයෙන් 6.4% ප්‍රතිශතය, සමාලෝචනයට භාජනය වන වසරේ දී 5.8% දක්වා අඩුකර ගැනීමට හැකිවීමත්, එම අනුපාතය 79.1% සිට 78% දක්වා පහළ දැමීමට හැකි වූ නිසාත්ය. ගෝලීය තත්ත්වයන් හා දේශීය ප්‍රවණතාවන් සමීප ව අධීක්ෂණය කරනු ලැබූ හෙයින්, ඇමරිකානු ඩොලර් බිලියන 7.1ක් වටිනා මාස 4.5ක කාලයකට ප්‍රමාණවත් ආනයනයන් සිදුකිරීමට හැකිවන පරිදි විදේශ සංචිතයන් ප්‍රශස්ත මට්ටමක තබා ගැනීම සහතික කළහැකි වූයේය.

බාහිර උච්චාවචනයන්ට යටත්වීමට ශ්‍රී ලංකා රුපියල ප්‍රතික්ෂේප කළ අතර, වෙළෙඳ හා වාණිජමය ක්‍රියාවලින් වර්ධනය වනසේ අදාළ වසර පුරාම සැලකිය යුතු ස්ථාවරයක් එමගින් පවත්වා ගනු ලැබීය. සැප්තැම්බර් මුල් කාලයේ සිට ඇමරිකානු ඩොලරයට එරෙහි ව ශ්‍රී ලංකා රුපියලේ අගය වැඩි වූ අතර, 2013 අවසානයේදී එය ඇමරිකානු ඩොලරයට එරෙහිව 2.7% කින්ද, ස්ටර්ලින් පවුමට එරෙහි ව 4.7% කින්ද, යුරෝවට එරෙහිව 6.8% කින්ද අගය ක්ෂය වුව ද, ඉන්දියානු රුපියලට එරෙහිව 10.2% කින්ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව 13.3% කින් ද, ජපාන යෙන්වලට එරෙහි ව 18.8% කින්ද අගය වැඩි වූයේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකා රුපියලෙහි විනිමය අනුපාතිකය 'පාවෙන' ඒකකයක් ලෙස ප්‍රතිවාර්ගීකරණය කරන ලදී. සමස්තයක් වශයෙන් ගත් කල්හි, මෑත වර්ෂයන් හිදී ගෝලීය ආර්ථිකය අත්දුටු බිඳවැටීම්වල සෘණාත්මක බලපෑම් හමුවේ සාර්ථකව මුහුණ දීමට ශ්‍රී ලංකාවට තිබූ හැකියාව මොනවට ප්‍රකාශවූ බව ඉහත කී දර්ශකයන්ගෙන් පැහැදිලි විය. ඒ අනුව, රට තුළ යෝජිත ආර්ථික වර්ධන ඉලක්කයන් නොසැලෙන සේ ශ්‍රී ලංකාවට සිය වර්ධන රටාව අඛණ්ඩ ව පවත්වා ගත හැකි විය.

දේශීය යථා දර්ශය අනුව, පෞද්ගලික අංශයේ ණය ධනාත්මක ස්වරූපයක් පෙන්නුම් කළ අතර, රාජ්‍යායතන ණය මධ්‍යස්ථ මට්ටමෙහි පැවතිණි. ප්‍රතිපත්ති අනුපාතිකයන් අඩුවීමේ හා වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් පහළ වැටීමේ ප්‍රවණතාව යටතේ වුවද, දැඩි ප්‍රාග්ධනීකරණ හා ද්‍රවශීලතා තත්ත්වයන් නිසා බැංකු අංශයෙහි ස්ථාවරත්වය පවත්වා ගන්නා ලදී. තැන්පතුවල වෙළෙඳපොළ පොළී අනුපාතිකයන්හි ක්‍රමානුකූල යටිකුරු ගැලපීම් සිදුකිරීම පහසුවනසේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති හඳුන්වාදෙනු ලැබීය. මූලික ණය අනුපාතිකයන් මෙම ප්‍රවණතාවටද ඉක්මන් ප්‍රතිචාර දැක්විය. වැඩි වී පැවති ද්‍රවශීලතා මට්ටම් හා වර්ධනයවූ විදේශීය ආයෝජන නැඹුරුව ද නිසා, වර්ෂයේ මුල් භාගය තුළ දක්නට ලැබුණු දැඩිභාවය වාණිජ බැංකු පිරිනැමූ දිගු කාලීන ණය අනුපාතිකයන් හේතුවෙන් අඩුවිය.

### බැංකු ක්ෂේත්‍රය අනුකූලතාව පෙන්වයි

බැංකුකරණය හා අදාළ සියලුම අංශයන්හි මහා පරිමාණ ව්‍යාප්තිකරණයන් සිදුවෙද්දී, පාලනයේද, අවදානම්වල සහ ආචාරධර්මයන්හිද විශිෂ්ට පරිචයන් එහි ප්‍රධාන මූලධර්මයන්හි අන්තර්ගත කිරීම ගැන දිගින් දිගටම හඬනැගීම නිසා, සමස්ත බැංකු ක්ෂේත්‍රය තුළම නොවැළැක්විය හැකි ආකාරයෙන් ශුභවාදී ආකල්පයන් පැතිර ගියේය. ශක්තිමත් අධීක්ෂණ හා නියාමන කාර්යරාමුවක් මගින් මනා උපයෝගිත්වයක් ලැබූ මෙම ශක්තිය හා ප්‍රකෘතිභාවය විසින් සෑම අංශයක් තුළ ම පෙර නොවූවිරූ ව්‍යාප්තිකරණයක් ඇති කරන ලද්දේය. සමස්ත බැංකු පද්ධතියේ ශාඛා ජාලය දැනට 3,500ක් පමණද, වෙනත් ප්‍රවේශ ලක්ෂ්‍යයන් 3,100ක් පමණද, ස්වයංක්‍රීය ටෙලි බැංකුකරණ (ATM) ජාලය 2,500ක් දක්වාද ඒ අනුව ව්‍යාප්තව ඇත. ජනතාව අතරට විනිවිද යාම බස්නාහිර පළාතෙන් ක්‍රමානුකූලව ඈත්වූ අතර, බැංකු ශාඛා ඝනත්වය ජනගහනය 100,000කට එකක් වශයෙන් පැවතියද, අඩුම ඝනත්වයක් තිබූ නැගෙනහිර පළාතේ සිව් වසරක සුළු කාලයක් තුළ 21.5ක ඉහළ ම මට්ටම දක්වා එය ව්‍යාප්ත විය. ඉහළ ම මට්ටම පැවති බස්නාහිර පළාත පරාජයට පත් කිරීම, හා නැගෙනහිර සහ උතුරු මැද පළාත් ඝනත්වය අනුව තෙවන හා සිව් වන ස්ථානයන් ට පත් කරනු ලැබීම නිසා, රජයේ ප්‍රතිපත්තිය වන මූල්‍යමය අන්තර්කරණය දුර ගමනක් ගොස් ඇති බව පැහැදිලිය.

2013 අවසාන වනවිට, බැංකු කර්මාන්තයේ ප්‍රාග්ධන වර්ධනය 17%කින් පමණ පහළ බැස්සද, ප්‍රාග්ධන කළඹ 20%ක් ඉක්මවන වර්ධනයක් ලබා උඩුකුරු සංචලනයකට පාත්‍ර වූයේය. කෙසේ වුවද, බැංකුකරණ අංශයේ අරමුදල් ව්‍යුහය තුළ ප්‍රත්‍යක්ෂ වෙනසක් සිදුවූ අතර, එමගින් දේශීය ණය, සාමාන්‍ය කොටස්

වෙළෙඳපොළ සහ විදේශීය ණය ගැනීම් ඔස්සේ අරමුදල සපයා ගැනීම ආරම්භ විය. බැංකු අංශයේ ශේෂ පත්‍රයේ ශක්තියමත විදේශීය ණය ගැනීම් මගින් ඇමරිකානු ඩොලර් මිලියන 1,548ක් සපයා ගනුලැබූ අතර, බැංකු විසින් ලබා ගන්නා විදේශීය ණය ගැනීම් පිළිබඳ ප්‍රතිපත්තිය ලිහිල්කරණය වීම නිසා, එය වඩාත් ශක්තිමත් වූවා පමණත් නොව, 2015 දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකුවකට  ඇමරිකානු ඩොලර් මිලියන 50තෙක් ලබා ගැනීමටද අවස්ථාව ලැබිණි. ඒ අනුව, විදේශීය මුදල් ණය ගැනීම් උඩුකුරුව පැතිර ගියේ  ණය ගැනීම්වල සම්පූර්ණ වර්ධන ප්‍රතිශතය 35%ක් බව පෙන්වමිනි. මේ අතරතුර, 19%ක පමණ වර්ධනයක් ප්‍රදර්ශනය කරමින් තැන්පතුවලින් වැඩි කොටසක් ශ්‍රී ලංකා රුපියල් තැන්පතුවලට හිමි විය.

මූල්‍ය සේවා කර්මාන්තය තුළ ක්‍රියාත්මකවන නියාමන හා අධීක්ෂණ පරිසරය තවදුරටත් වැඩි කිරීම පිණිස දැඩි උත්සාහයක් පැවතිණි. අන්තර්ගත වූ ප්‍රධාන ප්‍රතිපත්ති නම්, අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ අවදානම් කළමනාකරණ කාර්යරාමු ශක්තිමත් කිරීම, ව්‍යාපාර වස්තු වෙළෙඳපොළ කෙරෙහි අංශයේ විවරත්වය පිළිබඳ රෙගුලාසි අනුකූලකරණය සහ නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතිය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පිළිගැනිම පහසු කිරීමයි. වැඩි කරන ලද අනාවරණ අවශ්‍යතා සම්බන්ධයෙන්ද ඉල්ලීමක් තිබිණි. ශ්‍රී ලංකාව තුළ පවත්නා අඩු පොළී ප්‍රවණතාව හා වෙනත් උද්ගතවන ආර්ථිකයන්ද අනුව, ණය හා අත්තිකාරම් මත පොළී අනුපාතිකය අඩුකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව උනන්දු වූයේය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රවර්ධනය කරන ලද නව දැක්ම පිළිබඳවද බොහෝ සෙයින් සාකච්ඡා ඇති විය. 2014 සඳහාවූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගමන් මග විස්තර කෙරෙන එය, මූලික වශයෙන්ම 2016 සඳහා යෝජිත ඉලක්කයන් සපුරා ගැනීමට සූදානම්වීමක් වන අතර, ධනාත්මක ආර්ථික දර්ශනයක් කරා යොමු කිරීමට හා මූල්‍ය පද්ධතියෙහි ස්ථාවරත්වය තහවුරු කිරීමටද අදහස් වූවකි. අපේක්ෂිත සැලසුම්වල අන්තර්ගත වන එක් කරුණක් නම්, රුපියල් ට්‍රිලියනයක හෝ ඊට වැඩි ප්‍රමාණයක වත්කම් සහිතව කලාපය තුළ ශක්තිමත් නියෝජනත්වයක් පවත්වා ගැනිම සඳහා යටත් පිරිසෙයින් ශ්‍රී ලාංකීය බැංකු පහක්වත් දිරිගැන්වීමයි. සංයුක්තවීම, ඒකාබද්ධකරණය සහ පවරාගැනීම් කෙරෙහිද පෙළඹවීම් පවත්නා අතර, බැංකුකරණ ක්‍රියාකාරකම් වර්ධනයට ප්‍රමාණවත් ප්‍රගාමකයක් වශයෙන් මහා පරිමාණ සංවර්ධන බැංකුවක් දියත් කිරීම කෙරෙහිද අවධානය යොමු ව තිබේ.  ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශීය බැංකු, දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩි වැඩියෙන් නිරතවීම ප්‍රදර්ශනයවනු දැකීමද ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවකි.

ප්‍රයෝජ්‍ය හා චංචලත්වය හමුවේ ගැලපීමට හැකි ප්‍රතිපත්ති හඳුන්වාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් කරන අතර, සැලකියයුතු මට්ටමින් අඩු පොළී උපාන්තයන් දිරිගැන්වීම උදෙසා, වැඩි දියුණු වූ කාර්යක්ෂමතාව මෙන්ම, විචක්ෂණශීලී වත්කම් හා වගකීම් කළමනාකරණයද දියත් කෙරෙනු ඇත. ආයෝජන භව්‍යතාව පරිත්‍යාග කිරීමෙන් තොර ව, අනපේක්ෂිත ව්‍යාපාර චක්‍රයන් සහ ගෝලීය ආර්ථිකයේ පිරිහීම වෙනුවෙන් මූල්‍ය සේවා කර්මාන්තය සූදානම් කිරීම සඳහා, ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් හා වෙනත් හදිසි අවශ්‍යතාද අන්තර්ගත වන්නේය.

බැංකු කර්මාන්තයේ ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමෙහිලා සැලකියයුතු බලපෑමක් දක්නට ලැබේ. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් බිලියන 10ක් වන අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා එය රුපියල් බිලියන 5කි. දැනට පවත්නා බැංකු වලට 2016 ජනවාරි යේ සිටද, නව බැංකු වලට 2015 ජනවාරි යේ සිටද මෙය අදාළ වෙයි. 2014 මාර්තු වනවිට, බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා කාර්යරාමු අවශ්‍යතා යටතේ ප්‍රගමන ප්‍රවේශයේ සංක්‍රමණය අවසාන කෙරෙනු ඇත. 2014 තුන්වන කාර්තුවේ සිට  බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතින් ක්‍රියාත්මක වේ.

නියාමන හා අධීක්ෂණ කාර්යරාමුවට සමාන්තරව, වෙනස්වන පරිසරයේ අවශ්‍යතාවන්ට අදාළ වන්නාවූ මූල ධර්ම හා සෙසු කරුණු කාරණා වැඩි දියුණු කර ගනිමින්, කර්මාන්තයේ අවදානම් කළමනාකරණ කාර්යරාමුවද කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය. බලපත්‍රලාභී වාණිජ බැංකුවල නිශ්චල දේපල ඇගයීම පිණිස නියාමන කාර්ය රාමුවක් 2014දී හඳුන්වා දෙන ලද අතර, වත්කම් වෙළෙඳපොළ වලට හා වෙනත් භව්‍ය ආර්ථික අනපේක්ෂාවන්ට මෙන්ම කම්පනයන්ටද බැංකුකරණ පද්ධතියේ පවත්නා විවරත්වය නියාමනය සඳහා ඇති සෙසු අවශ්‍යතාවන්ද ඉටු කෙරේ. වෙනත් මූලාරම්භනයන් අතර, ආතති පිරික්සුම් කාර්යරාමු මාර්ගෝපදේශ ස්ථාපනයද, බාසල් III ද්‍රවශීල ඇවුරුම් අනුපාතය හඳුන්වාදීමට සාධකවන නව ද්‍රවශීල අවදානම් කළමනාකරණ කාර්යරාමු ක්‍රියාත්මක කිරීමද වෙයි. ප්‍රධාන බැංකුකරණ පද්ධතියට සහ වෙනත් තොරතුරු තාක්ෂණය පාදක වූ අංශයන්ට අදාළ අවම ප්‍රමිතීන් ස්ථාපනය කිරීමද මීළඟ වසරේදී සිදුකෙරේ. නව ගණකාධිකරණ ප්‍රමිතීන්ට අදාළ වන්නා වූ, පවතින නියාමන කාර්යරාමුවට යෝග්‍ය වෙනස්කම් සංස්ථාපනය කිරීම ද බැංකු මගින් සිදුකළයුතු වන්නේය. නව අපගත ස්ථානීය අධීක්ෂණ වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීම සහ පවත්නා විධානයන්ට හා රෙගුලාසිවලට සංශෝධන යෙදිමද මෙයට ඇතුළත්වේ. බැංකුකරණ කණ්ඩායම්වල ඒකාබද්ධ අධික්ෂණය කෙරහි අවධානය යොමු කරමින්, පූර්ණ අධීක්ෂණ කාර්යරාමුවක් සකස් කිරිමද සිදුකරනු ලැබේ.

# බැංකුවේ කාර්ය සාධනය

2013න් අවසාන වූ මූල්‍ය වර්ෂය සඳහා, රුපියල් බිලියන 10.3ක බදු පෙර ලාභයක් සහ රුපියල් බිලියන 7.5ක බදු පසු ලාභයක් බැංකුව විසින් වාර්තා කරනු ලැබ තිබේ. 2013 කාලය තුළ පහළ වැටෙමින් තිබූ පොලී අනුපාතිකය සමග බද්ධ වෙමින් රන් මත දෙනු ලැබූ අත්තිකාරම්වල හානිකරභාවය ප්‍රධාන හේතුව වීම නිසා, (2012 රුපියල් බිලියන 15.2ක බදු පෙර ලාභය සහ රුපියල් බිලියන 10.9ක බදු පසු ලාභය අනුව) පෙර වසරට වඩා සමාලෝචනයට භාජනය වන වසරේ ලාභ මට්ටම අඩු විය. මෙම වසරේ සම්පූර්ණ හානිකරයේ වටිනාකම වන රුපියල් බිලියන 13.7, රුපියල් බිලියන 9.8කින් පෙර වසරේදීට වඩා ඉහළ ගොස් ඇත. බැංකුවේ ශේෂ පත්‍රය රුපියල් බිලියන 931 දක්වා වර්ධනයවීම, පෙර වසරට වඩා 7%ක වැඩි දියුණුවීමකි. ඉහළ මට්ටමේ ද්‍රවශීල අනුපාතයක් මෙන් ම, 2013 ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ දී නියෝජනයවන තැන්පතු අනුපාතයට සංසන්දනාත්මකව පහළ මට්ටමේ අත්තිකාරම්ද බැංකුව විසින් පවත්වා ගනුලැබ තිබේ.

සමූහයේ බදු පෙර ලාභය රුපියල් බිලියන 13.4ක් වූ අතර, බදු පසු ලාභය රුපියල් බිලියන 9.2කි. පෙර වසරේදී, බදු පෙර ලාභය රුපියල් බිලියන 17.7ක් හා බදු පසු ලාභය රුපියල් බිලියන 11.9ක් විය.

### බදු පෙර හා බදු පසු ලාභය

| | බදු පෙර ලාභය | බදු පසු ලාභය |
|---|---|---|
| 2013 : | 10,304 | 7,488 |
| 2012 : | 15,249 | 10,894 |
| 2011 : | 15,600 | 10,446 |
| 2010 : | 8,771 | 5,206 |
| 2009 : | 6,076 | 3,320 |




## ශුද්ධ පොලී ආදායම

සම්පූර්ණ වත්කම් හා තැන්පතුවල වර්ධනයට අනුකූලව, ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 33.9 සිට රුපියල් බිලියන 36.6 දක්වා වර්ධනය වෙමින් 8%ක වැඩිවීමක් පෙන්නුම් කළේය. පොලී ආදායම 30%කින් හා පොලී වියදම 44%කින් වර්ධනයවීමේ ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස මෙය හැඳින්විය හැකිය. පොලී වියදම ඉහළ ප්‍රතිශතයකින් වර්ධනයවීමට ප්‍රධාන හේතු සාධකයන් වූයේ, 11% කින් තැන්පතු පදනමේ වර්ධනය හා 2012දී පැවති 7.3% සිට 9.1% ක් දක්වා, මෙම වසරේ තැන්පතු මත අරමුදල්හි සාමාන්‍ය පිරිවැය වැඩිවීමයි.

### ශුද්ධ පොලී ආදායම

| | |
|---|---|
| 2013 : | 36,649 |
| 2012 : | 33,918 |
| 2011 : | 30,318 |
| 2010 : | 25,898 |
| 2009 : | 23,927 |




## ශුද්ධ මෙහෙයුම් ආදායම

ඉහළ පැහැදිලි කරන ලද පරිදි, ශුද්ධ පොලී ආදායමෙහි වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන්, සම්පූර්ණ මෙහෙයුම් ආදායම 7%කින් වැඩි වුවද, එසේම, වෙළෙඳ කටයුතු වල ශුද්ධ ලාභයේ වර්ධනය 36%කින් වැඩි වුව ද, ශුද්ධ මෙහෙයවුම් ආදායම 2012 පැවති රුපියල් බිලියන 39.4 සිට මෙම වසරේ රුපියල් බිලියන 32.8 දක්වා අඩු වෙමින්, රුපියල් බිලියන 6.6ක නොහොත් 16.8%ක අඩුවීමක් පෙන්නුම් කළේ, කලින්ද සඳහන් වූ ලෙස, ණය හා අදාළ ව ඉහළ මට්ටමේ හානිකරණය හා අදාළ අයවීමක බලපෑම පිළිබිඹු කරමිනි.

### සම්පූර්ණ මෙහෙයුම් ආදායම සහ ශුද්ධ මෙහෙයුම් ආදායම

| | සම්පූර්ණ මෙහෙයුම් ආදායම | ශුද්ධ මෙහෙයුම් ආදායම |
|---|---|---|
| 2013 : | 46,530 | 32,814 |
| 2012 : | 43,310 | 39,435 |
| 2011 : | 36,431 | 36,021 |
| 2010 : | 31,897 | 30,883 |
| 2009 : | 30,635 | 28,543 |




## මෙහෙයුම් වියදම්

2012දී පැවති රුපියල් බිලියන 21.7 සිට මෙම වසරේ රුපියල් බිලියන 20.8 දක්වා, එනම් 4.2%කින්, මෙහෙයුම් වියදම අඩුවිය. මෙයට හේතු වූයේ, අලෙවි වියදම් වැඩිවීම හා දේපළ, පිරියත හා උපකරණ, කාර්යාල පරිපාලනය, ආයතනික වියදම් ආදිය ක්ෂයවීම මගින් කොටසක් හිලව් කරනුලැබූ අතර සේවක මණ්ඩල වියදම්වල සුළු අඩුවීමක් සිදුවීම යි.

**සම්පූර්ණ මෙහෙයුම් වියදම් (වැට් බදු රහිත)**




**තැන්පතු**




## ණය හානිය හා වෙනත් අලාභයන්

හානි හා වෙනත් අලාභ වෙනුවෙන් 2012දී වෙන්කරන ලද රුපියල් බිලියන 3.9 හා සසඳන කල්හි, 2013 වෙනුවෙන් රුපියල් බිලියන 13.7ක් බැංකුව විසින් වෙන්කරනු ලැබීය. 2013දී ජාත්‍යන්තර රන් වටිනාකමෙහි සිදුවූ තියුණු අඩුවීම, උකස්කර අත්තිකාරම් විවරතාවන් පැවති බැංකු කෙරෙහි සෘණාත්මක බලපෑම් එල්ල කළේය. 2013දී දෙනු ලැබූ උකස් අත්තිකාරම් හා අදාළවූ හානිකරයන් මත වැයවීම්, එහෙයින් සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. උකස් අත්තිකාරම් කෙරෙහි පැවති විවරතාවන්හි අගය 2012 අවසානයේ තිබූ රුපියල් බිලියන 250.8ක වටිනාකම, 2013 අගවන විට රුපියල් බිලියන 197.1 දක්වා පහළ දමා ගැනීමට බැංකුව සමත් විය. ඒ අනුව, සම්පූර්ණ විවරත්වතා ප්‍රතිශතය 2012 පැවති 38% සිට 29% දක්වා 2013 අගදී අඩු වූයේය.

## බදු

මෙහෙයුම් ලාභයෙහි අඩුවීම පිළිබිඹු කරමින්, මූල්‍ය වැට් බදු හා අදාළ වූ අයකිරීම් 31%කින් අඩුවූ අතර, එය 2012දී රුපියල් බිලියන 2.5ක්ද 2013දී රුපියල් බිලියන 1.7ක්ද වූයේය.

## තැන්පතු

බැංකුවේ තැන්පතු පදනම 2013 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 762ක් වූ අතර, එය 2013 වසරේ රුපියල් බිලියන 684 හා සසඳන කල්හි 11.4%ක වර්ධනයකි. මෙම වර්ධනයට ප්‍රධාන දායකත්වය ලබාදුන් ස්ථාවර තැන්පතුවල වර්ධනය, ඉතුරුම් තැන්පතුවල රුපියල් බිලියන 19.7ක වර්ධනය සමග සසඳන විට රුපියල් බිලියන 84.7කි. සියලුම තැන්පතුවල ප්‍රතිශතයක් වශයෙන් ජංගම ගිණුම් හා ඉතුරුම් ගිණුම් 2012 වසරේ 40% සිට අදාළ වසරේ 38% දක්වා ආන්තික ලෙස අඩුවීමක් පෙන්නුම් කළේය.

## ණය හා ලැබිය යුතු මුදල්

දළ ණය හා ලැබිය යුතු මුදල්, 2012 දෙසැම්බර් 31 දිනට පැවති රුපියල් බිලියන 660.6 සිට 2013 දෙසැම්බර් 31 දිනට වාර්තාවූ 681.5 දක්වා 3.2%කින් වර්ධනය වූයේය.

උකස්කරණය රුපියල් බිලියන 53.6ක අඩුවීමක් පෙන්වනුයේ, වෙනත් අංශවලට ලබාදුන් ණය රුපියල් බිලියන 74.4ක වැඩිවීමක් වාර්තා කරද්දීය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම දායකව ඇත්තේ, රුපියල් බිලියන 60ක වැඩිවීමක් පෙන්වූ මධ්‍යකාලීන ණය, රුපියල් බිලියන 30ක වැඩිවීමක් පෙන් වූ දිගුකාලීන ණය සහ රුපියල් බිලියන 9ක වැඩිවීමක් පෙන් වූ වෙළෙඳ මූල්‍ය ණයයි.

**සම්පූර්ණ ණය හා ලැබිය යුතු මුදල්**



## ප්‍රාග්ධනය හා සංචිත

වසර 2013 අවසාන වනවිට, රඳවාගත් ඉපැයුම් සමග බද්ධ වූ ප්‍රාග්ධනය හා සංචිතයන් හි වටිනාකම රුපියල් බිලියන 36.5ක් වූ අතර, එය 2012 වසරේදී රුපියල් බිලියන 29.2කි. එහි ප්‍රධාන දායකයින්වූයේ රඳවාගත් ඉපැයුම් හා වසර තුළ ඉඩම් හෝ ගොඩනැගිලි පිළි ඇගයීම් ඔස්සේ ළඟා වූ ප්‍රත්‍යාගණන සංචිතයන්ය.

**ප්‍රාග්ධනය හා සංචිත**

| | | |
|---|---|---|
| 2013 | : | 36,537 |
| 2012 | : | 29,205 |
| 2011 | : | 23,089 |
| 2010 | : | 20,838 |
| 2009 | : | 17,800 |




## ප්‍රධාන කාර්යසාධන දර්ශක

2013 වසරේ දී, බැංකුව විසින් සිය ශේෂ පත්‍රයේ ස්ථාවරය ශක්තිමත් කරනු ලැබ ඇත. 2012 වසරේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (අදියර 1 - 9.8% සහ අදියර 2 - 14.0%) සමග සසඳන විට, 2013දී එය අදියර 1 - 10.4%ක් සහ අදියර 2 - 15.0%ක් වූයේය. බැංකුවේ ද්‍රවශීලතාව 2013දී වැඩි දියුණු වෙමින්, එම වසර තුළදී 25.2%ක සාමාන්‍ය ද්‍රවශීලතා අනුපාතිකයක් පවත්වා ගන්නා ලදී. 2013 අවසානය වනවිට තැන්පතු අනුපාතයට අත්තිකාරම් 89.4%ක් වූ අතර, එය 2012 අවසානයේදී 96.6ක් විය. පිරිවැය ආදායම් අනුපාතය 2013දී මධ්‍යස්ථ තත්වයකට පත්වෙමින් 48.4% කරා ළඟා වූයේය. උකස්කරණ අත්තිකාරම්වල බහුල ලෙස සිදුවූ සංචලනය නිසා, 2013දී අක්‍රිය අත්තිකාරම් අනුපාතය වැඩි වුවද, මෙම සංචලනයන්ට හිලව්කිරීම සඳහා උකස්කරණ අත්තිකාරම්වල වැඩිවූ හානිකරයන් හා අදාළ අයකිරීම් භාවිත කරනු ලැබීය.

ප්‍රධාන වශයෙන්ම, උකස්කරණය හා අදාළ ඉහළ මට්ටමේ හානිකරණ අය කිරීම් නිසා, 2012 හා සසඳනවිට, 2013දී (බදු පෙර) වත්කම් මත ආදායම 1.1%කින් අඩු වී තිබේ.

*සටහන: 2012 හා 2013 වර්ෂයන් සඳහා ඉහතින් වාර්තා කරන ලද ප්‍රතිඵල, 2012 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වූ, නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් (SLFRS and LKAS) පදනම් කර ගනිමින් සකස් කරන ලද, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයෙන් උපුටා ගන්නා ලදී. 2009-2010 සඳහා වාර්තා කරන ලද ප්‍රතිඵල උපුටා ගන්නා ලද්දේ, 2011 දෙසැම්බර් 31 දින දක්වා බල පැවැත්වූ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් (SLAS) පදනම් කර ගනිමින් සකස් කරන ලද බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයෙනි.*

## පරිපාලිතයන් හා ආශ්‍රිතයන්ගේ කාර්යසාධනය

### 1. පීපල්ස් ට්‍රැවල්ස්

තවත් අභියෝගාත්මක වසරක අත්දැකීම්වලින් පසු, අපගේ අපේක්ෂාවන්ට අනුකූලව ප්‍රතිඵල උදාකරගන්නට අපට හැකි විය. ගත වූ වසර අභියෝගාත්මක වුවද, අපගේ කාර්ය මණ්ඩලයේ නොසැලෙන කැපවීමත්, ලෝකයේ දේශපාලන හා ආර්ථික පරිසර වශයෙන් ජාත්‍යන්තරව පවත්නා අස්ථාවර තත්වය යටතේ වුව ද, ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය දියුණු වී ඇති නිසා සංචාරක කර්මාන්තයේ දිගු කාලීන අනාගතය සුභවාදීවීමත් කරනකොටගෙන, අනාගත වර්ධනය සඳහා පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රශස්ත මට්ටමක සූදානම් ව සිටී.

2012/2013 මූල්‍ය සමාලෝචනය අනුව, සම්පූර්ණ වසර සඳහා කාර්ය සාධනය තුළින් ලැබූ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 9.2කි. (2011/2012දී එය රුපියල් මිලියන 8.6ක් විය.) බදු පෙර වැඩිවීම 7%ක් වූයේය. කෙසේ වුවද, බදු පසු ලාභය 6%ක අඩුවීමක් පෙන්වයි. ගුවන් ගමන් බලපත්‍ර අලෙවි ආදායම 37%කින් ඉහළ ගොස් තිබේ.

**මෙහෙයුම් සමාලෝචනය**

සමාගමේ පරිමාණය හා විවිධත්වය එහි පැවැත්මට ප්‍රතිලාභයකි. පීපල්ස් ට්‍රැවල්ස් සිල්ලර, ආයතනික හා විවේක සංචාර ව්‍යාපාර ද මහා පරිමාණයෙන් එකතුවීම නිසා සමාගම එක ම සංචාරක අංශයක් මත යැපීමක් නොමැත.

2012/2013 කාලයේ දී සියලු අංශයන් ම වර්ධනය වුව ද, ආයතනික හා විනෝද (CORPRATE & LIESURE) අංශයන්හි වර්ධනය දැඩිවීමෙන්, වෙළෙඳපොළ තුළ වගකීමෙන් හා විශ්වාසවන්තභාවයෙන් යුතු සංචාරක කළමනාකරුවන් ලෙස දිනා තිබූ කීර්ති නාමය තවදුරටත් තහවුරු කරගැනීමට සමාග මට හැකිවිය. අනාගත වෙළෙඳ තත්ත්වයන් පූර්ව කථනය හෝ පාලනය කිරීමට සමාගමට නො හැකි වුවද, සංචාරක ව්‍යාපාරය තුළ වර්ධනීය අවස්ථා අපට දැකිය හැකිය. එම අවස්ථා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට හා ව්‍යාපාරය තුළ නවීකරණයන් සිදුකිරීමට සැලසුම් දැනටමත් සූදානම් වෙමින් පවතී.

මෙම වසරේදී සියලු සංචාරක වෙළෙඳපොළවල අඛණ්ඩ වර්ධනයක් පීපල්ස් ට්‍රැවල්ස් අපේක්ෂා කරයි. ගුවන් ගමන් සඳහාපිටත්ව යන මගීන්ගේ සංඛ්‍යාවන් දැඩිලෙස වර්ධනය කරගනු වස්, යුරෝපය, එංගලන්තය හා ජපානය වැනි නව ගමනාන්තයන් කෙරෙහි අපගේ අවධානය යොමු කරනු ලැබේ.

ප්‍රධාන සංචාරක සමාගම බවට පත්වීමේ ඉලක්කය සපුරාගැනීම සඳහා, නැවත නැවත අපගේ සේවාදායකයින්ගේ විශ්වාසය දිනාගැනීමට මෙන්ම, නව අනුග්‍රාහකයින් ආකර්ෂණය කරගැනිම පිණිස අසම සම සේවාවක් ලබාදීම අපගේ උත්සාහයයි. නිරන්තර පසු විපරම්ද සහිත සුපිරි සේවාවක් ගනුදෙනුකරුවන්ට පිරිනැමීමට එමගින් අපට හැකිවනු ඇත. සම්ප්‍රදායක මෙන්ම නවීන සන්නිවේදන ක්‍රමවේද ඔස්සේ අනුග්‍රාහකයින් සමග සබඳතා පවත්වනු ලබන අතර, සංස්ථායික සේවාදායකයින් සමග මාසික මට්ටමින් සම්පතා පවත්වාගැනීම අපේ අභිලාෂය වන්නේය. සංචාරකයින්ගේ සිතැගි අනුව ඒ ඒ කාලවලට ගැලපෙන පරිදි චාරිකා සංවිධානයද, විද්‍යුත් අලෙවි ක්‍රම හා ජනමාධ්‍ය ප්‍රචාර විධි භාවිතා කිරීමද තව දුරටත් සාර්ථකව ක්‍රියාත්මක වනු ඇත.

### අ. දඹදිව චාරිකා

ගතවූ වසරවල අපගේ ප්‍රධාන ආදායම් මාර්ගයක්වූයේ දඹදිව වන්දනා ගමන් සංවිධානය කිරීමයි. එහෙත් ගෙවීගිය දෙවසර තුළ ඉන්දියාවේ පැවති අහිතකර දේශපාලන වටාපිටාව අනුව, දඹදිව චාරිකා මගින් අප ලැබූ ආදායම ක්‍රමානුකූලව අඩුවන්නට පටන් ගත්තේය.

කෙසේවුවද, සුබෝපභෝගී දඹදිව චාරිකා මෙහෙයවීමේ වෙළෙඳ පොළ නායකත්වය තවමත් අපගෙන් ගිලිහී ගොස් නොමැති අතර, 2012/13 කාලය තුළ වන්දනාකරුවන් 302 සඳහා දඹදිව චාරිකා 13ක් (පෙර වසරේ එය වන්දනාකරුවන් 514 දෙනෙකු සඳහා චාරිකා 18ක් විය.) මගින් රුපියල් මිලියන 3.3ක බදු පූර්ව ලාභයක් අපට ලැබිණි.

### ආ. විවේක සංචාර

පීපල්ස් ට්‍රැවල්ස්හි විවේක සංචාර අංශයෙහි පරිමාව පෙර වසරේ ප්‍රමාණයට වඩා වැඩි වුව ද, ලැබූ ලාභ ප්‍රමාණය තරමක් අඩු වූයේ ඇමරිකානු ඩොලරය ක්ෂණික අගය වැඩිවීමකට භාජනයවූ නිසාය.

සමස්ත ඉපැයීම් සම්බන්ධයෙන්ද, ඇමරිකානු ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ අගය අඩුවීම හේතුකොටගෙන, විනෝද හා වන්දනා ගමන් ආශ්‍රිත ලාභදායිත්වයට බොහෝ අහිතකර බලපෑම් එල්ල වූයේය.

විවේක සංචාර මාර්ගයෙන් රුපියල් මිලියන 4ක බදු පෙර ලාභයක් ලබාගන්නට පීපල්ස් ට්‍රැවල්ස් සමත් වුවද, එය 2011/12 වසරේ ලාභයට වඩා 6%ක් අඩු විය. සමාලෝචනයට භාජනය වන වසර තුළ විනෝද සංචාරකයින් 613 දෙනෙකු සඳහා කණ්ඩායම් 6ක් චීනයටද, 5ක් සිංගප්පූරුව/මලයාසියාවටද, 6ක් බැංකොක් නුවරටද, 2ක් වියට්නාමයටද, එක කණ්ඩායමක් මියන්මාරයටද යැවීමට ගුවන් ගමන් සංවිධානය කරන ලදී.

ප්‍රවර්තන වසර තුළ යුරෝපය, අපගේ එක් නව ගමනාන්තයන් ලෙස එකතුකර ගැනිණි. එවැනි තවත් නව ගමනාන්තයන් ද, සුවිශේෂ හා විවිධත්වයෙන් යුත් නව නිපැයුම්ද, නව වෙළෙඳපොළවල්ද අපගේ වර්ධනය සඳහා සම්පකර ගැනීම අපගේ අභිලාෂයයි. එංගලන්තය, ජපානය හා නවසීලන්තය ශ්‍රී ලාංකිකයින් අතර වඩා ජනප්‍රිය ගමනාන්තයන් වන හෙයින්, ඒ අංශයෙහි පවත්නා වර්ධන භව්‍යතාව පදනම්කරගනිමින්, අනාගතයේ දී නියමු චාරිකා එම දේශයන් කරා යොමු කිරීමට අදහස් කෙරේ.

### ඇ. ගුවන් ගමන් බලපත් අලෙවිය

පීපල්ස් ට්‍රැවල්ස් 2012/13 වසරේ දී මෙම ක්ෂේත්‍රය තුළ සෑහෙන සාර්ථකත්වයක් ලැබූ අතර, ගුවන් ගමන් බලපත් අලෙවියෙන් ලැබූ රුපියල් මිලියන 19.6ක බදු පෙර ලාභය මගින්, විවේක සංචාර හා දඹදිව චාරිකා මුහුණදුන් හිඟපාඩු පියවා ගන්නට හැකි විය. ඒ අනුව පෙර වසරේ දීට වඩා මෙම වසරේදී 37%ක බදු පෙර ලාභයේ වැඩිවීමක් වාර්තා වූයේය.

අපගේ ධාරිතාවන් කාර්යශීලීව කළමනාකරණය කරගැනීමෙන් සහ සාර්ථක ලෙස හා දාර්ශනිකව දුෂ්කරතා මැඩලමින් ඉලක්කයන් කරා යොමුවීමෙන්, මෙම වසරේදී එකී ජයග්‍රහන උදාකර ගතහැකි වූ බව කිව හැකිය.

## 2. පීපල්ස් ලීසිං සමූහය

මහජන බැංකුවේ පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම දැනට ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුනොවන මූල්‍ය ආයතනය වන්නේය.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ පසුබිම

- පෞද්ගලික සීමිත වගකීම් සමාගමක් හා මහජන බැංකුවට පූර්ණ අයිතිය ඇති පරිපාලිත සමාගමක් ලෙස 1995 අගෝස්තු 22වන දින ස්ථාපනය කරන ලදී.
- නව සංයුක්ත අනන්‍යතාවක් ඔස්සේ, වර්ෂ 2000දී, එය පොදු සීමිත වගකීම් සමාගමක් බවට පරිවර්තනය කරනු ලැබිණි.
- වර්ෂ 2003දී, සමාගම ප්‍රථම වතාවට කල් බදු කර්මාන්තයේ වෙළෙඳපොළ ප්‍රමුඛයා බවට පත්විය.
- වර්ෂ 2011දී, ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම සාර්ථක මූලික කොටස් නිකුතුව මගින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් 1,560,000,160ක ලැයිස්තුගතකිරීම හේතුවෙන්, පීපල්ස් ලීසිං කම්පනි ලිමිටඩ් යන සමාගමේ නම, පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී යනුවෙන් වෙනස් කරන ලදී.

- වර්ෂ 2012දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙතින් මූල්‍ය ව්‍යාපාර බලපත්‍රය ලැබීමෙන් පසු, සමාගමේ තරාතිරම කල්බදු ආයතනයක සිට මූල්‍ය ආයතනයක් ලෙසට වෙනස් විය. මෙම වෙනස්වීමට අනුකූලව, සමාගමේ සංයුක්ත අනන්‍යතාවද පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සීහි සිට පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ලෙස නැවතත් වෙනස්විය.
- 2013 අප්‍රේල් 02 දින සමාගම එහි පරිපාලිත මෙන්ම, කොටස් වෙළෙඳපොළේ නම්කරන ලද සමාගමක් වන පීපල්ස් ෆයිනෑන්ස් පීඑල්සී සමග බද්ධ විය.
- බද්ධවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම විසින් පීපල්ස් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ සුළු කොටස්කරුවන්ට කොටස් 19,862,322ක් නිකුත් කරන ලදී. ඒ සමගම සම්පූර්ණ කොටස් ප්‍රමාණය 1,579,862,482 දක්වා වැඩි වූයේය.

රුපියල් මිලියන 10ක ප්‍රාග්ධනයක් හා සේවකයන් තිදෙනෙකු පමණක් සමග වාණිජ මෙහෙයුම් ආරම්භ කළ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, රුපියල් බිලියන 100ක ප්‍රාග්ධන පදනමක් සහිතව හා රට තුළ ඉහළම තක්සේරුවක් සහිත මූල්‍ය සමාගම වශයෙන්, අද ශ්‍රී ලංකාවේ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ආධිපත්‍යය පවත්වයි. කල් බදු ක්ෂේත්‍රයෙහි වෙළෙඳපොළ නායකයාසේ අඛණ්ඩව ක්‍රියාත්මකවෙමින්, ශාඛා 84ක් හා කවුළු කාර්යාල 109ක් සමාගම විසින් රට පුරා දැනට පවත්වා ගනුලබයි. සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් නම් මූල්‍ය කල්බදු, කුලී පිට ගැනුම් සහ වාරික ණය සැපයීම වන අතර, මූල්‍ය ව්‍යාපාර බලපත්‍රය ලැබීමෙන් පසු, සමාගම පොදු තැන්පතු හා ඉස්ලාමීය මුදල් සජීවීකරණ කටයුතුවලද නිරතවෙයි. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිසමෙන් ලද බලපත්‍රය යටතේ ආන්තික සපයන්නෙකු වශයෙන් ද සමාගම ක්‍රියා කරයි.

කෙටි කාලයක් තුළදී, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, රක්ෂණ, ක්ෂුද්‍ර මූල්‍ය, දේපල සංවර්ධනය සහ වාහන පද්ධති කළමනාකරණ සේවා යන ක්ෂේත්‍ර හරහා මෙහෙයුම් විවිධාංගීකරණය කරමින්, පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ට් ඩිවලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් හා පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් ලිමිටඩ් යන පරිපාලිත සමාගම් පහ ස්ථාපනය කළේය.

2012/13 අය වැය මගින් නිර්මාණය කරන ලද අවස්ථා උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින්, සමාගම ස්වකීය ප්‍රථම ලැයිස්තුගත ණයකරය වන ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, AA(-) තත්ත්වාගණනය සහිත, එකක් රුපියල් 100ක අගයෙන් යුත්, සිව් අවුරුදු හා පස් අවුරුදු ණයකරයන් 30,000,000ක් නිකුත් කළ අතර, ඊට ලැබුණු අධිදායකත්වය හේතුවෙන්, වැඩිපුර ණයකර 30,000,000ක් ද නිකුත් කරනු ලැබීම නිසා, සම්පූර්ණ ණයකර ප්‍රමාණය 60,000,000ක උපරිමය කරා ළඟා විය.

ඊට අමතර වශයෙන්, එමිරේට්ස් NBD බැංකුව විසින් මැද පෙරදිග හා සමග සංවිධානය කර අර්ධ මූල්‍යකරණයද සිදුකරනලද, ඉතා ආකර්ෂණීය කොන්දේසිවලින් සමන්විත, අමෙරිකානු ඩොලර් මිලියන 50ක සම-අරමුණු පාදක ණය මුදලක් සමාගම විසින් අත්කර ගන්නා ලදී. වසර දෙකහමාරක මෙම සම-අරමුණු පාදක ණය මුදලට, කටාර්හි කොමර්ෂල් බැංකුවද දායක විය. මෙය සමාගමේ දෙවන පහසුකම වන අතර, 2013 අප්‍රේල් අගදී අත්කර ගන්නා ලද ප්‍රථම පහසුකම, සමාගමේ පැතිකඩ ඉහළ නංවා ලීමේ සාධකයක් වූවා මෙන්ම, එහි ජාත්‍යන්තර පෞරුෂත්වය විදහා දක්වන්නක්ද වූයේය. එපමණක් නොව, සමාගමේ සේවා ක්ෂිතිජයන් ව්‍යාප්තිකරණය සිදුකිරීමේදී, නව යුගයක් කරා පියනැගීමට සමාගමට නව උද්‍යෝගයක් උදාකිරීමට එය අනුබලයක්ද වන්නේය.

### අ. මූල්‍ය කාර්යසාධනය

විවිධාංගීකරණය වූ පීපල්ස් ලීසිං සමූහ ව්‍යාපාරය, 2012 වර්ෂයේ පැවති රුපියල් මිලියන 16,580.53ට වඩා, 17%ක වර්ධනයක් පෙන්නුම් කරමින්, 2013 ලිත් වර්ෂයේදී රුපියල් මිලියන 19,489.17ක පොළී ආදායමක් වාර්තා කළේය. සමූහ ව්‍යාපාරයේ මෙහෙයුම් ආදායම, පෙර වර්ෂයේ පැවති රුපියල් මිලියන 9,867.96 හා සසඳනවිට, 2013 වර්ෂයේදී රුපියල් මිලියන 11,049.62 දක්වා ඉහළ යාම නිසා 12%ක වර්ධනයක් වාර්තා විය. ඒ අනුව, සමූහ ව්‍යාපාරයේ පෙර වසරේ බදු පසු ලාභය වන රුපියල් මිලියන 3,011.58 හා සාපේක්ෂ ව, 2013දී දැඩි කැපවීම තුළින් ලද එම ලාභය රුපියල් මිලියන 3,305.38ක් විය.

සියයට 18ක වර්ධනයක් ප්‍රදර්ශනය කරමින්, සමූහයේ සම්පූර්ණ වත්කම් ප්‍රමාණය 2012 පැවති රුපියල් මිලියන 96,191.56 වෙනුවට, 2013දී රුපියල් මිලියන 114,110.13 දක්වා ඉහළ නැංගේය. මනා මූල්‍ය ස්ථාවරයක් පෙන්නුම් කරමින්, සමාගමේ සම්පූර්ණ වත්කම් ප්‍රමාණය 2013 දී රුපියල් මිලියන 109.582.07ක් වූ අතර, එහි 85%ක වටිනාකම දැරූ ණය හා ලැබිය යුතු මුදල්වල අගය 2013 දෙසැම්බර් 31දිනට රුපියල් මිලියන 92,582.71ක් වූයේය.

ස්වකීය පරිපාලිතයක් වන, පීපල්ස් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම සමග බද්ධවීමේ වාසිදායක අවස්ථාව මැනවින් ප්‍රයෝජනයට ගත් හෙයින්, 2013 දෙසැම්බර් 31වන දිනට ගෙවුණු දොළොස් මස තුළ, සමාගමේ සම්පූර්ණ වියපැහැදම් ගෙවීම රුපියල් මිලියන 47,395.66කින් ඉහළ ගියේය. තවද, 2013 දෙසැම්බර් 31දින වනවිට, සමාගමේ අක්‍රීය අනුපාතය 2.19%ක් වූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරනලද 2014 ගමන් මගෙහි දැක්වෙන 6%ක අනුපාතයට වඩා බෙහෙවින් ම අඩු මට්ටමකට අයත් විය.

කොටස්කරුවන්ට වාසිදායක අගයක් නිර්මාණය වනසේ, 2012/2013 මුදල් වර්ෂය වෙනුවෙන් සමාගම විසින් කොටසකට රුපියල් 0.50ක් බැගින් වන අවසාන ලාභාංශයක් ගෙවන ලද අතර, එහි සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 789.93කි.

කොටස්කරුවන්ගේ වත්කම් තව දුරටත් වර්ධනය කරමින් 2013/14 මුදල් වර්ෂය වෙනුවෙන් කොටසක් සඳහා රුපියල් 0.75ක අගය සහිත හා සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 789.93ක් වන අන්තර් ලාභාංශයක් 2013 දෙසැම්බරයේදී ප්‍රකාශයට පත්කරනලදී. ලිත් වර්ෂය සඳහා ගෙවනු ලබන සියලු ලාභාංශයන්හි සම්පූර්ණ අගය වන රුපියල් මිලියන 1,974.84න් රුපියල් මිලියන 1,480.33ක් මව් ආයතනය වන මහජන බැංකුවට ලැබීමට නියමිත ය.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, ආරම්භ වූ දිනපටන්ම, එහි මව් ආයතනයට ආඩම්බර විය හැකි විශිෂ්ට ආයෝජනයක්සේ ක්‍රියාත්මක වූයේය. මහජන බැංකුව මෙම සමාගම තුළ සිදුකළ රුපියල් මිලියන 690.96ක් වටිනා ආරම්භක ආයෝජන පිරිවැයට එරෙහි ව, 2013 දෙසැම්බර් 31දින වනවිට, රුපියල් මිලියන 1,184.90ක් වටිනා කොටස් පවත්වා ගැනීම නිසා හිමිකම් දරන රුපියල් මිලියන 15,877.62ක ආයෝජන අගය, රුපියල් මිලියන 15,186.66ක වර්ධනයක් පෙන්නුම් කරයි.

### ආ. පරිපාලිත සමාගම් සමාලෝචනය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, ස්වකීය ස්ථාපිත උප පාලිත සමාගම් පහ ද සමග, දැනට ක්‍රියාත්මක කරන සහක්‍රියා කාර්ය භාරය අඛණ්ඩ ව සිදුවන අතර, එය මෙහෙයවනු ලබන සෑම ක්ෂේත්‍රයකම ලාභ උපයමින්, දේශයේ මූල්‍ය අංශයෙහි සැලකිය යුතු බලවේගයක් බවට වර්ධනය වෙමින් ඇත.

### i. පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ පූර්ණ අයිතිය සහිත පරිපාලිතයක් වශයෙන්, සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සමාගම, 2009දී ස්ථාපිත කරන ලදුව, වාණිජ ව්‍යාපාර කටයුතු 2010දී ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ රක්ෂණ සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා ලේඛන අනුව, 2013 අවසානය වනවිට දළ ලිඛිත කොටස් ගෙවීම් කොන්දේසි යටතේ, මෙරට සාමාන්‍ය රක්ෂණ අංශය තුළ, මෙම සමාගම පස්වන ස්ථානයෙහි පසුවෙයි. 2013 වර්ෂයේදී, ස්වකීය කොටස් ගෙවීම්වල 10%ක විශාල ප්‍රගතියක් ලබා, සමාගම පෙර වසරේ ලාභය වන රුපියල් මිලියන 235 සමග සසඳන කල්හි, මෙම වසරේ දී රුපියල් මිලියන 371ක බදු පසු ලාභයක් අත්කර ගත්තේය. දැනට පීපල්ස් ඉන්ෂුවරන්ස් ව්‍යාපාරයේ වැඩි කොටසක් සමූහය හා අදාළ වුව ද, වසර මුළ දී මහජන බැංකුව සමග බැංකාඇෂුවරන්ස් ගිවිසුමකට සමාගම එළඹියේය.

ඇමරිකාවේ, ෆ්ලොරිඩා හි පවත්වන ලද LACP Vision Awards 2012 නම් වූ වාර්ෂික වාර්තා තරගයේ දී, මෙම සමාගමේ ප්‍රථම වාර්ෂික වාර්තාවට 'කර්මාන්ත ස්වර්ණ තිළිණය' සහ 'උසස් ජාතික සම්මානය' පිරිනමනු ලැබිණි. තවද, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සංවිධානය කරන ලද, 2013 වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී, 'රක්ෂණ ආංශික අනුකූලතා සම්මානය' ද සමාගමට හිමිවිය.

### ii. පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් ලිමිටඩ්

පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් ලිමිටඩ් සමාගම පිහිටුවන ලද්දේ, ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී ජන කණ්ඩායම්වලට පීපල්ස් ලීසිං මූල්‍ය සේවාවන් ලබාදීමේ ප්‍රාථමික අරමුණ පෙරදැරි කරගෙනය. 'අද පවත්නා බීජය හෙට වැඩුණු ගසක් වන්නේය' යන පොදුජන වහර මත විශ්වාසය තැබූ සමාගම, අද සුළු ආදායම් ලබන්නා පසු දිනෙක ඉසුරුමත් අනුග්‍රාහකයෙකු වනු ඇතැයි සලකයි.

2013 වසර තුළදී, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ ශාඛාවන් සමග මෙම සමාගමේ ඒකක 7ක් සංයුක්ත කිරීමෙන් ග්‍රාමීය ක්ෂේත්‍රයට සිය සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කරනුලැබ ඇති අතර, ප්‍රධාන කාර්යාලය නුගේගොඩට රැගෙන යන ලද්දේ, එම ප්‍රදේශයෙහි වෙසෙන සේවාදායකයින් රාශිය සඳහා මැනවින් හා වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ පහසුව සඳහා ය.

නව සේවා ඒකකයන් ආරම්භ කිරීමත් සමගම, සමාගම දැනට PLC ශාඛා 33 ක් ඔස්සේ මෙහෙයුම් සිදුකරමින්, 2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 30ක ලාභයක් උපයා තිබේ.

### iii. පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්

පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් සමාගම, මහජන බැංකුවේ හා PLC සමූහයේ දේපල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියැලෙයි. අදාළ වසර තුළදී, මෙම සමාගම මහජන බැංකුවේ ආණමඩුව සහ විල්ගමුව ශාඛා ඉදිකිරීම් සාර්ථක ලෙස නිමාකර බැංකුවට භාර දුන්නේය. ඊට අමතරව, පිළියන්දල හා ත්‍රිකුණාමලයේ ශාඛා ඉදිකිරීම් දැනටමත් නිමාකර ඇති අතර, බැංකුවට භාරදීමට නියමිතය.

තවද, වව්නියා ව්‍යාපෘතියේ 2වන අදියර සහ ත්‍රිකුණාමලයේ මහජන බැංකු කලාපීය කාර්යාල ව්‍යාපෘතීන් හි ඉදිකිරීම් දැනට සිදුවෙමින් පවතින අතර, මතුගම, නාඋල, සහ බේරුවල ව්‍යාපෘති හා අදාළ ටෙන්ඩර් ඇගයීම් ද දැනට සිදුකෙරේ.

ලිත් වර්ෂ 2013 සඳහා රුපියල් මිලියන 48ක බදු පසු ලාභයක් සමාගම විසින් වාර්තා කරනු ලැබ ඇත.

### iv. පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්

මෙම සමාගම කල් බදු මෙහෙයුම්, වාහන කුලී පහසුකම්, වාහන සේවා හා තක්සේරු කිරීම් ආදිය හා අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීමේ නිරත වෙයි.

සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ, වාහන ප්‍රවාහක රථ මගින් හා ඇදගෙන යාමේ ට්‍රක් රථ මගින් වාහන ප්‍රවාහනය කිරීමේ නව පහසුකම් හා සේවාවන් සමාගම විසින් පිරිනමනු ලැබීය. එමෙන්ම, විනෝද චාරිකා හා පහසු වාහන

ධාවනයන් සඳහා සේවා පැකේජයන් සැලසුම් කර, එම එක් එක් පැකේජය හා අදාළ සේවාවන් කාර්යක්ෂම කිරීමටද සමාගම පියවර ගත්තේය. ඊට අමතරව, සමාගමේ ඇගයීමේ දෙපාර්තමේන්තුව ව්‍යාප්තිකරණයද, රක්ෂණ තක්සේරු සේවාවක් හඳුන්වාදීමද අදාළ වසරේදී සිදුවිය.

### v. පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්

පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගම, 2010 අගෝස්තු 12වන දින ස්ථාපනය කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘතියක කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමේ මූලික පරමාර්ථය ඇතිව ය. හැව්ලොක් ටවුන් හි මහල් 12ක නව කාර්යාල සංකීර්ණය සඳහා මුල් ගල තැබීමේ උත්සවය 2013 සැප්තැම්බර් මාසයේ සිදු කරන ලද අතර, 2015 මැයි මාසයේ දී ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

### ඇ. ත්‍යාග සහ සම්මාන

සමාගමට පිරිනැමුණු සම්මාන, ප්‍රශංසා සහ පුරෝගාමීත්ව කීර්තිය සැබවින් ම අතිශයින් ප්‍රසාදජනක ය. 2013 මාර්තු මාසයේ පැවති SLIM Nielsen People's Awards උළෙලේ දී, මූල්‍ය සේවා සම්පාදන වර්ගයේ සම ජයග්‍රාහකයා ලෙස පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම තෝරා ගනු ලැබූ අතර, 2011 දී පවත්වන ලද SAFA විශිෂ්ට වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී, මූල්‍ය සේවා අංශයේ 'සම්මාන සහතිකය' පිරිනමනු ලැබුවේද සමාගමේ 2010/11 වාර්ෂික වාර්තාවට ය.

මූල්‍ය කාර්ය සාධනය පාදක කර ගනිමින් Business Today නම් සඟරාව විසින් '2012/13 - ශ්‍රී ලංකාවේ ඉහළ ම වර්ගයේ ලැයිස්තුගත සමාගම් 25' යටතේ තෝරාගන්නා ලද ලැයිස්තුවේ 18වන ස්ථානය හිමි වූයේ, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමටය. මෙය සමාගම ලත් විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සැලකෙනුයේ, මෙම සම්මානයන් සඳහා ඉදිරිපත්වීමට ලත් ප්‍රථම අවස්ථාවේ දී ම එය දිනාගැනීමට හැකිවීම නිසා ය.

ශ්‍රී ලංකාවේ ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද '2013 ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන' උළෙලෙහි දී බැංකු නොවන සහ මූල්‍ය ආංශික 'ස්වර්ණ' සම්මානය පිට පිට ම දෙවතාවක් දිනා ගැනීමටද පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම සමත් වූයේය. ඒ සඳහා සිදුවූ තක්සේරුව, සමාගමේ ව්‍යාපාරික හා මූල්‍ය සාර්ථකත්වයන්ට පමණක් සීමා වූයේ නැත. නායකත්ව විශිෂ්ටතාව, ආයතනික පාලනය, ධාරිතා වර්ධනය, කාර්ය සාධන කළමනාකරණය, දේශීය හා විදේශීය වෙළෙඳපොළ ප්‍රවේශය, ආයතනික හා සමාජ වගකීම් ධාරාව සහ පාරිසරික තිරසාරත්වයද එහිදී අවධානය යොමු කෙරුණු මූල ධර්මයන්ය.

සම්මාන ජයග්‍රහණයන් ගැන තවදුරටත් වාර්තා කිරීමේදී, 2012/2013 කාලය හා අදාල වාර්ෂික වාර්තාව මෙන්ම, සමාගමේ තිරසාරභාවය පිළිබඳ වාර්තාවද වෙනුවෙන් සමාගම පහත දැක්වෙන සම්මාන දිනා ගත්තේ ඇමරිකානු සන්නිවේදන වෘත්තිකයන්ගේ ලීගය (LACP) විසින් සංවිධානය කරන ලද ගෝලීය සන්නිවේදන තරගාවලියේ '2013 Spotlight Awards'. උළෙලේදීය.

- මුද්‍රිත වාර්ෂික වාර්තා - තරගකාර අංශය - ආසියා ශාන්තිකර ස්වර්ණ සම්මානය
- අතිශයින්ම නිර්මාණශීලී වාර්ෂික වාර්තාව - (ලෝකව්‍යාප්ත විශේෂ ජයග්‍රාහී සම්මානය) - රජත සම්මානය
- තිරසාරත්ව වාර්තාව (මුද්‍රිත සෙසු වර්ග) - ලෝකඩ සම්මානය
- සමාගමේ වාර්ෂික වාර්තාව - තරගයට ඉදිරිපත්වූ සෙසු ශ්‍රී ලාංකික තරගකරුවන් අතර, තරගකාරීත්වය අනුව උච්චම ස්ථානය සහ ලෝකයේ ඉහළම සන්නිවේදන මෙවලම් 100 අතරින් 36වන ස්ථානය සමාගමට හිමි විය.

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය සංවිධානය කළ වාර්ෂික වාර්තා සම්මාන උළෙලයන්හි දී, කල්බදු අංශය සඳහා වූ කීර්තිධර ස්වර්ණ සම්මානය අඛණ්ඩ ව පස්වසරක්ම දිනා ගැනීමෙන් ඉක්බිතිව, 2013 වාර්ෂික වාර්තා සම්මාන උළෙලේ උද්වේගශීලී තරගකාරීත්වයක් පැවති මූල්‍ය අංශයට ප්‍රථම වතාවට ඉදිරිපත් වෙමින්, 'අපගේ විවිධත්වය අන්තර්ග්‍රහනය කරමින්' යන්න තේමාකරගත් සමාගමේ වාර්ෂික වාර්තාව විසින් අගනා 'ස්වර්ණ සම්මානය' දිනාගනු ලැබුවා පමණක් නොව, නැවත වරක් සමාගම තුළම රඳවාගන්නට ද සමාගම සමත් විය. මෙම ජයග්‍රහණයෙන් පිළිබිඹුවන සාධක රැස අතර, මූල්‍ය ප්‍රකාශන, ව්‍යාපාර කාර්යසාධනය, ආයතනික පාලනය, සහ ආයතනික හා සමාජ වගකීම් ධාරාව ආදිය සම්බන්ධයෙන් සමාගම පවත්වා ගන්නා මෙන්ම, අන්ගමනය කරන්නාවූ ද විනිවිදභාවය, කාලානුරූපීබව, පැහැදිලිතාව, අනුකූලත්වය, සහ වෘත්තීයමය ස්වභාවද අන්තර්ගත වෙයි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, මෙරට මූල්‍ය සමාගම්වල අභිමානය ඉහළට නංවාලූයේ ජාත්‍යන්තර තත්ත්වාගණනයන් දෙකක්ම එක්වර දිනාගැනීමේ ප්‍රථමයා වෙමිනි. 'Standard & Poor' ආයතනයේ ස්වෛරී 'B +/B' දිගුකාලීන හා කෙටිකාලීන හිකුතු සම්මාන තත්වාගණනය මෙන්ම, 'Fitch Ratings International' ආයතනයේ ස්වෛරී තරාතිරමට අංශයක් අඩුවූ, දිගු කාලීන විදේශීය හා දේශීය ව්‍යවහාර මුදල් පිළිබඳ 'B+' (IDRs) තත්වාගණනයද සමාගමට හිමි කරවන ලද්දේය. 2013 වසරේ දී 'Fitch Ratings Lanka' ආයතනය විසින්, සමාගමේ ජාතික දිගු කාලීන 'AA-(lka)' තත්වාගණනය නැවත වරක් තහවුරු කරනු ලැබීය.

## 3. පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී

පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම වනාහී මහජන බැංකුවේ ආශ්‍රිත සමාගමකි. මහජන බැංකුව, එහි පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම සමග සාමූහිකව, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී හි කොටස් 39.2%ක හිමිකම දරන අතර. පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, 2012 අප්‍රේල් මස ශ්‍රී ලංකා මහ බැංකුවෙන් මූල්‍ය සමාගම් බලපත්‍රය ලබාගත්තේය. මෙම සමාගම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් ආන්තික වෙළඳ බලපත්‍රයද ලබාගත්තේ ඊට අමතරවය. දැනට සමාගම Fitch Ratings ආයතනයේ BB+ (stable) තත්ත්වාගණනය දරන අතර, කල් බදු, කුලීපිටගැනුම්, සංයුක්ත ණය, නිශ්චල දේපල, ආන්තික ණය දීම් හා රන් ණය ඇතුළු මූල්‍ය සේවාවන් රැසක්ම එහි සංයුක්ත කාර්යාලය හා ශාඛා එකොළහකින් සැදුම්ලත් ජාලය හරහා ඉටු කරයි.

මූල්‍ය සමාගමක් ලෙස බලපත්‍රය ලබාගැනීමෙන් පසු, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, ස්වකීය මෙහෙයුම් සඳහා අරමුදල් සජීවීකරණය පිණිස, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් ගිණුම් හඳුන්වා දුන්නේය. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ද ලබාගත් අනතුරුව, මෙම සමාගම විදේශගත හා විදේශීය ආයෝජකයන් ආකර්ශණය කරගැනීම සඳහා, විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA) හඳුන්වා දුන්නේය. සිය සමාග මේ භව්‍යතාව ප්‍රශස්තිකරණය සඳහා සහ අපේක්ෂිත පුළුල් වූ ව්‍යාපාර පරිමාණයන් සාක්ෂාත් කරගැනීම අරභයා, පළපුරුදු වෘත්තිකයන්ගේ නායකත්වය ඔස්සේ නව ව්‍යාපාරික මාර්ගයන් සහිත විචක්ෂණ කළමනාකාරිත්වයක් පවත්වා ගැනීමද පිණිස නව ආයතනික ව්‍යුහයක් ද ස්ථාපනය කරනු ලැබීය.

පීපල්ස් මර්චන්ට් සමූහ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනයෙහි, 2013 මාර්තු 31න් අවසාන වූ 12 මසක කාලය තුළ රුපියල් මිලියන 91ක පාඩුවක් සිදු වී ඇති අතර, පෙර වසරේ ඊට සමාන කාල පරිච්ජේදය තුළ ලබා ඇති ලාභය රුපියල් මිලියන 64.5කි. සමාගම හා අදාළ ආදායම් ප්‍රකාශනය අනුව, එකී කාලය තුළ සිදුව ඇති බදු පසු පාඩුව රුපියල් මිලියන 90.8ක් වන අතර, පෙර වසරේ එම කාලය සඳහාම ලබා ඇති බදු පසු ලාභය රුපියල් මිලියන 92.7ක් වේ. මෙම ප්‍රතිඵලයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ මූල්‍ය වත්කම් මත ශුද්ධ හානිකරණ අයකිරීම් ඉහළ යාම හා සම්පූර්ණ මෙහෙයුම් වියදම් ද වැඩිවීමයි. පොදුකාර්ය වියදම් ඉහළයාමට හේතුව නම්, මූල්‍ය සමාගම් බලපත්‍රය ලබා ගැනීම හා සමගම, ඊට ගැලපෙන ආකාරයට ශාඛා ජාලයන් අතර යටිතල පහසුකම් වර්ධනයන් නංවාලීමට සිදුවීමයි.

සමූහයේ පොළී ආදායම 2013 වසරේදී රුපියල් මිලියන 640ක් ද, 2012දී රුපියල් මිලියන 500ක් ද වූ අතර, මෙම වසර සඳහා එය 28%ක වැඩිවීමකි. එම වර්ධනය සඳහා දායකත්වය ලැබී ඇත්තේ මූල්‍ය කල්බදු වශයෙන් ආදායම රුපියල් මිලියන 234ක් ද, කුලී පිට මිලට ගැනුම් ආදායම රුපියල් මිලියන 214ක් ද, ණය රුපියල් මිලියන 107ක් ද අය වූ නිසාය. සෙසු ආදායම්ද 2012 වසරේ රුපියල් මිලියන 160 සිට 2013 වසරේ රුපියල් මිලියන 60 දක්වා අඩු වී තිබේ. පෙර වසරේ වෙනත් ආදායම් ඉහළ ගොස් ඇත්තේ, පරිපාලිත සමාගමක් රුපියල් මිලියන 137.4කට බැහැර කරනු ලැබීමෙන් උපයා ගන්නා ලද ලාභය නිසාය. එම හේතුව ම නිසා ශුද්ධ ආදායමද පෙර වසරේ රුපියල් මිලියන 301 සිට මෙම වසරේ රුපියල් මිලියන 207 දක්වා අඩු වූයේය. අදාළ කාලය තුළ පැවති වැඩි වූ පොළී අනුපාතිකය හේතුකොට, පැරණි පහසුකම් මත තිබූ ආන්තයන් අඩුවූයේ, අරමුදල්කරණය උදෙසා කෙටිකාලීන ණය ගැනුම් මත විශ්වාසය තැබූ හෙයිනි. 2013 වසරතුළ, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් සමාගම දිගුකාලීනව නොගෙවූ අක්‍රීය ණය සඳහා අතිරේක ප්‍රතිපාදන සැපයූ අතර, එම හේතුවෙන් වසර සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයන්හි වටිනාකම රුපියල් මිලියන 270ක් ද, 2012 පෙර වසර සඳහා රුපියල් මිලියන 215 ක් ද විය. මේ අනුව, පෙර වසරේ රුපියල් මිලියන 92.7ක ලාභයට එරෙහිව, සමාගමට මෙම වසරේ පාඩුව රුපියල් මිලියන 91ක් විය.

සමූහ ව්‍යාපාරයේ වත්කම් 2012දී රුපියල් බිලියන 2.9ක් වූ අතර, එය 2013දී රුපියල් බිලියන 4.6ක් බවට පත් වෙමින් 57% ක වර්ධනයක් පෙන්නුම් කළේය. මූල්‍ය කල් බදු, කුලී පිට ගැනුම්, ආන්තික වෙළෙඳාම සහ උකස්කර අත්තිකාරම් වසර තුළ දී වැඩි විය. මූල්‍ය සමාගම් තරාතිරම අත්කර ගත් පසු, පෙර වසරේ රුපියල් බිලියන 1.4 සිට, 2013 වසරේ රුපියල් බිලියන 2.6 දක්වා, සමාගමේ තැන්පතු පදනම වර්ධනය වූයේය.

# අපගේ ගනුදෙනුකාරභවතුන්ට සේවා සැපයීම හා ඔවුනට සෞභාග්‍යය ළඟාකරදීම

අපගේ නිපැයුම් හා සේවා කළඹ අපගේ ගනුදෙනුකාරභවතුන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් ඉටු කිරීමට හා ඒවා ඉක්මවා යෑමට සැලසුම් කරනු ලැබේ. එයින් ඔබ්බට, එක් එක් පුද්ගලයන්ට සුවිශේෂී අවශ්‍යතාවයන්ට ගැලපෙන විසඳුම් බැංකුව සපයන අතර ඇතැම් ගනුදෙනුකාරභවතුන් කාණ්ඩ වෙනුවෙන් බොහෝවිට උපදේශකයෙකු හා මගපෙන්වන්නෙකු වශයෙන් ක්‍රියා කරයි.




Loan facilities made available at attractive interest rates with minimum collaterals
High Saving

# තිරසාරභාවය පිළිබඳ අතිරේකය

සැබැවින්ම මහජනයාගේ බැංකුවක් ලෙස අඛණ්ඩව
ක්‍රියා කිරීමට අපට හැකිවනු පිණිස, විභව්‍ය අවදානම්
හා උද්ගතවන රටාවන් තක්සේරු කරත්ම,
ව්‍යාපාරයක් වශයෙන් ආර්ථිකය, සමාජය සහ පරිසරය
කෙරෙහි ඇතිවන බලපෑම් පිළිබඳවද අවබෝධයෙන්
සිටිය යුතු වෙයි.

## පරපුරෙන් පරපුරට ප්‍රතිලාභ සැමටම

### පෙරවදන

දශක පහකටත් පෙර අපගේ චාරිකාව අප ආරම්භ කරද්දී, එය බැංකුවක් පමණක් නොවීමේ සංකල්පය අප රටේ ජනතාව අතර වපුරවා, ඔවුන්ගේ ජීවිතයේ සැබෑ හවුල්කරුවකුවීමේ කැපී පෙනෙන ගතිකත්වය පිළිබිඹු කෙරෙන ගමනක් වූයේය. මෙම සංකල්පය යථාර්ථයක් කරලීමේ ප්‍රාථමික පියවරවූයේ එය 'මහජන බැංකුව' වශයෙන් නම් කිරීමයි. ඉක්බිතිව, අපගේ පාර්ශ්වකරුවන් සමග හවුල්කරයන් ගොඩ නගා ගනිමින් අප ඉදිරියට ගමන් කළ අතර, එය සෑම සියලු දෙනාටම දැනෙන මෙන්ම නොදැනෙන ප්‍රතිලාභයන් උදා කරන ප්‍රබල හා ස්ථායී සබඳතාවක් බවට අද මහත්සේ වර්ධනයවී තිබේ.

අපගේ පාර්ශ්වකරුවන් අපට හමුවනවිට, අප කිසියම් තෘප්තියක් දකින අතර, අපේක්ෂා සමූහයක්ද ඒ හා සමගම අපට පෙනී යයි. බැංකුවේ අඛණ්ඩ ව සිදු කෙරෙන නවීකරණයන් සහ උද්ගතවන සංකල්පයන්ට වඩා අප පියවරක් ඉදිරියෙන් සිටීමෙන්, අපගේ පාර්ශ්වකරුවන්ට ප්‍රශස්ත සේවාවන් පිළිබඳ ලැබිය හැකි තහවුරුවන් එම අපේක්ෂාවන්ට හේතුන්වේ. එය අපට එකිනෙකා මුණ ගැසීමේ පොදු නවාතැනක්වී, එම අපේක්ෂා බොහෝවිට උතුරා ගලා යනවිට, කර්මාන්තයේත් විවිධාංගයන්ට යොමු වෙමින් ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කිරීමට අපි සූදානම්ව සිටිමු. මහජන බැංකුවක් වීමම මහජනයාගේ හද ගැස්ම හඳුනා ගැනීමට අපට සහාය වන අතර, අපගේ නිගමනයන් ඔවුන්ට ධනාත්මක බලපෑම් ඇතිකිරීමට මෙන්ම, අප සමග කටයුතු කරන අයට හා අනාගත පරම්පරාවලට ද අප හා එක්ව වර්ධනයවීමටද හැකිවන්නේ අපද ඔවුන්ගෙන්ම කෙනෙකු නිසා ය.

මෙකී සමානතාව තුළට ජාතිය පිළිබඳ අපි අපගේ දැක්ම ඇතුළත් කරමු. ජාතිය යනු අපගේ ජනතාව හෙයිනි. මෙම කලාපයෙහි සැබෑ අභිමානය විය හැකි පරිදි උද්ගතවෙමින් පවත්නා ආර්ථිකය ගොඩනැගීමේ පූර්ණ ශක්තිය මෙහෙයවන ප්‍රබල බලවේගය ඔවුන්ය. අප රටෙහි තීරණාත්මක ඉලක්කයන් සපුරා ගැනීමට සමාජ පරිසරය බලගැන්වීම පිණිස, බැංකු කර්මාන්තයේ සුවිශේෂ ස්ථම්භයක් බඳු නායකයෙකු වශයෙන්, මහජන බැංකුව නිරන්තරයෙන්ම සිය අවධානය යොමු කරයි. මෙම බලගැන්වීම උදෙසා, අන්තර්කරණ වර්ධනය අති මහත් සාධකයක් වන අතර, මහජන බැංකුවේ ගමන් මගෙහි සදාතනික ලක්ෂණයවූයේ මෙම අන්තර්කරණ වර්ධනය දිරිමත් කිරීම යි. ඒ හා අදාළ සංකල්පයන් යටි උඩු ප්‍රවේශයන් තුළින් සැලසුම් කරන ලද්දේ, සෑම දෙනාටම ප්‍රතිලාභ උදාකරගත හැකි ප්‍රජාවන්, ආර්ථිකයන් හා සමස්ත ජාතියමද ගොඩ නැගීමට දායකවීම සඳහා අවශ්‍ය පරිසරය ජනතාව වෙනුවෙන් නිර්මාණය කිරීමටය.

ක්ෂුද්‍ර හා මධ්‍ය ව්‍යවසායකත්වය ආර්ථිකය ඉදිරියට ගෙන යාමේ ප්‍රාථමික වර්ධන සාධකය බවට පත්කර, පුද්ගලයින් උගත්කමින් හා වෘත්තියත්වයෙන් බලගැන්වීමද, හැකියා හා කුසලතාවලින් සන්නද්ධ කිරීම ද, යටිතල සංවර්ධනයට දායකවීමද තිරසාර සංවර්ධන සංකල්පයෙහි මූලික සබඳතා හා අන්තර්කරණ සාධකය බවට පත් කෙරෙන කල්හි, අපගේ දර්ශනය සහතික වශයෙන්ම නිවැරදි සම්බන්ධයන් සකසා ඇත. එවිට, අපි ප්‍රතිඵල දකිමු, අවස්ථාවන් දකිමු, ඒ හා සමගම බලගැන්වීමද දකිමු. එසේනම්, පරපුරෙන් පරපුරට මෙම දේශයෙහි ජනතාවට ප්‍රතිලාභ ලබාදුන් හා ලබාදෙන ප්‍රශස්ත සූත්‍ර සංග්‍රහය මෙය නොවන්නේද? - අපේ විශ්වාසය එය බවයි.

## අප කවුරුන්ද ?

අපගේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සහිත ජනතාවගේ බැංකුව වීමයි; අගය නිර්මාණය කරන, තරගකාරී හා ආත්ම විශ්වාසය සහිත ජනතාවක් බවට පත්වීමට ඔවුන් සවිබල ගැන්වීමයි. මෙම දැක්මට දැඩි කැපවීමෙන් යුතුව සිටිමින්, අපගේ සමස්ත පැවැත්මට හුදු පදනම බවට පත්වනසේ, සෑම දෙනාටම ප්‍රතිලාභ උදාකළ හැකි න්‍යායක්, අප විසින් වර්ධනය කරනු ලැබ තිබේ.

1988 අංක 30 දරන බැංකුකරණ පනත යටතේ ආරම්භ කරන ලදුව, 1961 අංක 29 දරණ මහජන බැංකු පනතින් වාණිජ බැංකුවක් ලෙස සංස්ථාපිත, මහජන බැංකුව යනු බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. දැනට, බැංකුවේ හිමිකාරිත්වයෙන් 92%ක් ශ්‍රී ලංකා රජය දරන අතර, ඉතිරි 8%ක හිමිකාරිත්වය සමුපකාර සමිති විසින් උසුලනු ලබයි.

අපගේ නමින් කියැවෙන පරිදි, අප ගන්නා සෑම පියවරක්ම, අප එළැඹෙන සෑම තීරණයක්ම, අප නිර්මාණය කරන සෑම බලපෑමක්ම කේන්ද්‍රීය වන්නේ මහජනතාව වෙනුවෙනි. එහෙයින්, භූගෝලීය වශයෙන් අප ප්‍රවේශවීමට හැකිවීම අතිශයින්ම වැදගත් වන්නේය. මෙම ප්‍රවේශය දැන් දිවයිනපුරා ව්‍යාප්තය, ඇතැම් විට, දිවයිනෙන් බැහැරව සේවය කරන ශ්‍රී ලාංකික මහජනයාගේ ජීවිතවලට අනුබලයක් වනු පිණිස, ජාත්‍යන්තර සබඳතා ඔස්සේ, අප රටේ සීමාවන්ගෙන් ඔබ්බටද මෙම ප්‍රවේශය ව්‍යාප්තව ඇත. විවිධ වයස් කාණ්ඩද, විවිධ වෙළෙඳ පොළවල්ද, විවිධ කර්මාන්තද ආදී වශයෙන් පුළුල් මහජන පරාසයක් අපගේ සමීපතාව හා ප්‍රවේශය මගින් ආවරණයවන අතර, ඒ එක් එක් කණ්ඩායම අපගේ කාර්යයන් තුළින් මනා ප්‍රතිලාභ ලබා ඇත. පහත දැක්වෙන

අංශයන් ඇතුළු තවත් බොහෝ ක්ෂේත්‍රයන් සමග අප විසින් ශක්ති සම්පන්න සබැඳියාවන් නිර්මාණය කරනු ලැබ තිබේ.

- කෘෂිකර්මය හා ධීවර
- නිෂ්පාදනය
- සංචාරක
- ප්‍රවාහනය
- ඉදිකිරීම්
- වෙළෙඳ
- මූල්‍ය හා ව්‍යාපාර සේවා
- යටිතල පහසුකම්
- වෙනත් සේවා
- ණය කාඩ්පත්
- උකස්

මෙම සෑම සේවාවක්ම අපගේ ප්‍රධාන අංශවල කොටස්ය, එනම් - සිල්ලර බැංකුකරණ, කාඩ්පත් ව්‍යාපාර, ආයතනික බැංකුකරණ, භාණ්ඩාගාර කළමනාකරණ, විදේශ ගනුදෙනුකාර භවතුන් සඳහා සේවා, මූල්‍ය ආයතන (අනුරූප බැංකුකරණ) මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකුකරණය හා සමුපකාර සහ සංවර්ධන මූල්‍ය බැංකුකරණය යන කොටස් අයත් සංවර්ධන බැංකුකරණය හා දේශීය ණය යන ප්‍රධාන අංශවල කොටස්ය.

අපගේ ප්‍රාථමික බැංකුකරණ සේවාවන් හැරුණු කොට, සැබැවින් ම මහජන බැංකුවක්වීමේ අපගේ දැක්ම විසින් සාමාන්‍ය බැංකුකරණ ක්‍රියාවලියෙන් ඔබ්බට අප රැගෙන ගොස්, විවිධ ව්‍යාපාරවලට වටිනාකම් ලබා දියහැකි ශක්තිමත් හවුල්කරනයන්ගෙන් සමන්විත ක්ෂේත්‍රයන්හි අප නිරතකර ඇත.

### පරිපාලිත සමාගම්

- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම
- සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික)

### ආශ්‍රිත සමාගම්

- පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම

### උප පරිපාලිත සමාගම්

- සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්
- සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට්
- සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස්
- සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස්
- සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස්

### මහජන බැංකුවේ තිරසාර බවට පාදකවන මූලධර්ම

බැංකුව පුරා දිව යන අපගේ සමස්ත දර්ශනය නම්, පරම්පරාවෙන් පරම්පරාවට සෑම කෙනෙකුටම ප්‍රතිලාභ ලබාදීම වන අතර, සෑම විටකම, සෑම අවස්ථාවකම අපගේ උපරිම ශක්තිය තුළින් එම ප්‍රතිපත්තිය මහජන බැංකුවේ අසිරිමත් සංකේතය ලෙස තහවුරු කරනු ලබයි. මෙයින් සංකල්පනය වන තවත් සාධකයක් නම්, අපගේ විවිධ පාර්ශ්වයන් සඳහා පිරිනැමීමට අප අපේක්ෂා කරන ප්‍රතිලාභ නිර්මාණය කිරීමේදී හා ඔවුන්ට ඉදිරිපත් කිරීමේදී, ඒවාට අදාළ මූලධර්මයන් බැංකුවේ තිරසාරභාවයට පූර්ණ ලෙස අනුගත වනසේ එය සිදුවිය යුතු බවයි. එම මූලධර්මයන් විසින් ද්වනිත කරනු ලබන දර්ශනය ඔස්සේ ඉදිරියට යාමේදී, සැබැවින්ම මහජන බැංකුවක් ලෙස කටයුතු කිරීමේදී, ඊට අදාළ විය හැකි අවදානම් හා අවධානයන් පිළිබඳ ව මෙන්ම, ව්‍යාපාරයක් වශයෙන් ආර්ථිකය, සමාජය සහ පරිසරය යන ත්‍රිවිධාංගයන් කෙරෙහි අපගෙන් සිදුවන්නාවූ බලපෑම් ගැන ද අප සැලකිලිමත් විය යුතුය.

- අපගේ රට ශක්තිමත් කිරීමේ හා අනුග්‍රාහකයින් තෘප්තිමත් කිරීමේ, දෙආකාරයීය ප්‍රතිලාභ සමන්විත, මනා ප්‍රමිතියකින් යුත් අපගේ නිපැයුම් පිළිබඳව අප විසින් සහතික කරනු ලැබේ.
- අපගේ මහජනයාගේ වර්ධනය සහතික කරනුවස්, දැනුම හා බලගැන්වීම පාදකවන සංස්කෘතියක්, අප විසින් පෝෂණය කරනු ලැබීම ගැන ඔවුන් දැනුවත්වනු ඇත.
- අප විසින් විශිෂ්ට පරිචයන් උපයෝගී කර ගනු ලබන බවට හා පිළි ලකුණු නිර්මාණය කරනු ලබන බවට ඇති විශ්වාසය අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් තුළ පවතිනු ඇත.
- අප විසින් නොදැනුවත්වම සිදුකරනු ලැබිය හැකි කවර හෝ පාරිසරික උපද්‍රව සාධකයක් අවම කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, උපරිම ආකාරයෙන් ඉටු කරමින්, අප විසින් අපගේ පරිසරය ආරක්ෂා කෙරේ.
- අපගේ දේශය වන ශ්‍රී ලංකාව, බිම් මට්ටමේ සිට වර්ධනය කිරීමට අප දරන ප්‍රයත්න තුළින්, අපගේ ප්‍රජාවන්ද සවිබල ගැන්වෙන්නේය.

## මෙම වාර්තාව පිළිබඳව

මෙය තිරසාරභාවය පිළිබඳව ඉදිරිපත් කෙරෙන අපගේ දෙවන වාර්තාවයි. ගෝලීය වාර්තාකරණ ආරම්භනයේ (Global Reporting Initiative (GRI) එන මාර්ගෝපදේශවලට අනුකූල ත්‍රිවිධ යටි රේඛා සංකල්පය, අපගේ උපරිම හැකියාවන් අනුව අනුගමනය කරමින්, මෙය සකස්කර තිබේ. එසේ කිරීමේදී, ප්‍රවර්තන ආයතනික පාලන සම්මතයන් හා තිරසාරභාවය සඳහා පවත්නා ඉල්ලුම කෙරෙහි, අපගේ අවධානය යොමු වෙයි. සෑම සියලු දෙනාටම ප්‍රතිලාභ ලබාදීමේ සංකල්පය මත පිහිටා, මෙරට විශිෂ්ටතම බැංකුව බවට පත්වීමේ අපගේ ප්‍රයත්නයේදී, මෙම තොරතුරු ප්‍රකාශයට පත් කිරීමෙන් අප ඉලක්ක කරගනුයේ, අප ලැබූ ජයග්‍රහණ මතුකර දැක්වීම හා පවත්නා ඌනතා හඳුනාගැනීමයි.

මෙම වාර්තාව මගින්, 2013 ජනවාරි 1 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය ආවරණය කෙරෙන අතර, හැකි සෑම ස්ථානයකදීම, අප හිමිකම්පාන කරුණු කාරණා තහවුරුවන ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාධකයන් ඉදිරිපත් කරනු ලබයි. වාර්ෂිකව මෙම තොරතුරු ප්‍රකාශයට පත්කිරීම අපගේ අරමුණවන අතර, ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය තොරතුරු දක්වා ඇත.

## වාර්තාකරණ ප්‍රමිතීන්

නියාමන හා ප්‍රමිති ආයතනයන් විසින් අපේක්ෂිත ප්‍රමිතිවලට මෙන්ම, ගෝලීය වාර්තාකරණ මූලාරම්භන මාර්ගෝපදේශයන්ද ඇතුළුව, ආයතනික ක්ෂේත්‍රය තුළ දැනට පවත්නා ප්‍රමිතීන්ටද අනුගතව මෙම වාර්තාව සකස් කිරීමට සෑම උත්සාහයක්ම ගනු ලැබිනි. වඩාත් විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් අපගේ පාර්ශ්වකරුවන්ට පෙන්වීමද, අපගේ කාර්යයන්ට හා බලපෑම්වලට අප විසින්ම වගකීම දැරීමද මෙම වාර්තාව මගින් සිදු කෙරේ. මෙම වාර්තාව තුළ, ගෝලීය වාර්තාකරණ මූලාරම්භනයේ ප්‍රමිතීන්හි 'සී' මට්ටම උදාකර ගැනීමට අප අපේක්ෂා කළ අතර, වාර්තාවේ මෙම කොටසේ 103 සිට 105 දක්වා පිටුවල දැක්වෙන කොටු සැලැස්මෙහි අපගේ අනුක්‍රමණයන් සටහන්කර ඇත.

අප මහජන බැංකුවේ පහත සඳහන් මෙහෙයුම් මෙම වාර්තාවේ විෂයපථයෙන් බැහැර කරනු ලැබ ඇත. ඊට හේතුව නම්, ශ්‍රී ලංකාවේ බැංකුකරණ මෙහෙයුම් එම මුදල් ප්‍රවාහයන් මත නොයැපෙන නිසාත්, බැංකුවේ පරිපාලිත සමාගම්වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හා සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් යන සමාගම්වල මෙහෙයුම් පිළිබඳ පාලනයක් බැංකුවට නොමැතිවීමත් නිසාත් මෙම ඇගයීමට ඒවා නොවැදගත්වීමයි.

බැංකුවේ ආශ්‍රිතයකු වන පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ මෙහෙයුම් කෙරෙහිද පාලනයක් බැංකුවට නොමැතිවීම නිසා මෙම වාර්තාවේ සීමාවන්ගෙන් එයද බැහැර කරනු ලැබ ඇත. කෙසේ වුවද, මෙසේ බැහැර කරන ලද ආයතනවල මෙහෙයුම් අදාළ වන්නේ නම්, වාර්තාවේ සීමාවන් තුළ ඒවා අන්තර්ගත කිරීමට අප විසින් පියවර ගනු ලබන අතර, අවශ්‍යවූ කල්හි, අනාගත තිරසාරත්ව වාර්තාවන්හි වුවද ඇතුළත් කළ හැකි වේ.

අපගේ පාර්ශ්වයන් සමග සිදුකරන ක්‍රියාකාරකම්, 'පාර්ශ්ව ක්‍රියාකාරකම්' නමැති කොටස යටතේ 89වන පිටුවෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

## ප්‍රතිපෝෂණය

පසුගිය වසරේ අප දැනුම් දුන් පරිදි, ස්වකීය ප්‍රතිපෝෂණයන් සමග අප අමතන ලෙස පාර්ශ්වකාර භවතුන්ට අපි ආරාධනා කළෙමු. ඒ අනුව ප්‍රතිපෝෂණයන් ධනාත්මකවූ අතර, එය නිරන්තරයෙන්ම තව දුරටත් වැඩි දියුණු කර ගත හැකිය. මෙවර මෙම වාර්තාව සම්බන්ධයෙන්ද ප්‍රතිපෝෂණ ලබා දෙන ලෙස නැවතත් අපි අපේ ගනුදෙනුකාරභවතුන්ට ආරාධනාකර සිටිමු. එමගින්, අපගේ වාර්තාකරණ ප්‍රමිතිය වැඩිදියුණු කරගැනීමට අවස්ථාව ලැබෙනවා පමණක් නොව, අප බැංකුවේ පාර්ශ්වකාරභවතුන්ගේ අවශ්‍යතා, අපේක්ෂා ආදිය පිළිබඳව, අපට දැනගැනීමටද හැකි වන්නේය. ප්‍රතිපෝෂණය තුළින් සිදුවන තවත් සුවිශේෂ කාර්යයක් නම්, අපගේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන සම්බන්ධයෙන් අප විසින්ම විශ්ලේෂණයක් සිදුකර ගනු ලැබීමටද ඉඩ සැලසීමයි. ගනුදෙනුකාර භවතුන්ගෙන් අප වෙත ලැබෙන බාහිර ප්‍රතිපෝෂණයන්, අපගේ අඛණ්ඩ වර්ධන උපාය මාර්ගයන් සඳහා ප්‍රධාන සන්නිවේදන සංරචකයක් වන්නේය. ප්‍රතිපෝෂණීය අදහස් හා යෝජනා නිර්මාණාත්මක ලෙස භාවිත කරනු ලබමින්, හැකි අවස්ථාවලදී සුදුසු පරිදි යොදා ගැනීමද සිදු කෙරේ.

මෙම වාර්තාව පිළිබඳ පැහැදිලි කරගැනීම් හෝ විමසීම් පහත සඳහන් ලිපිනයට යොමු කළ හැකිය:

කළමනාකරණ තොරතුරු දෙපාර්තමේන්තුව
මහජන බැංකුව
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02,
ශ්‍රී ලංකාව

## සමාජ අන්තර්කරණයට මග පාදන ආර්ථික සවිබලගැන්වීම

තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය අපගේ බැංකුවේ සමස්ත පදනමේම පැල පදියම්වී තිබේ. ආරම්භයේ පටන්ම, අපගේ පාර්ශ්වකරුවන් සමග හවුල් වෙමින්, ජීවිත කාලයක් පුරා පවතින සබඳතා අප ගොඩනගාගෙන ඇත. සමස්ත බැංකුවම - සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට එක් එක් කාර්ය මණ්ඩල නිලධාරියා දක්වා - පොළඹවනු ලබනුයේ එකම එක පාඨයකිනි. එනම්, අපගේ ලාංකික සියලු පුරවැසියන්හට විශ්වාසයෙන් හා උද්‍යෝගී ක්‍රියාකාරිත්වයකින් යුතුව අනාගතයට මුහුණදීම සඳහා ශක්තිමත් ආධාරකයක් වීම යි. මෙය එතරම් පහසු නොවූවත්, වඩා යහපත් අනාගතයක් සඳහා අප දැන්මම ක්‍රියාශීලී වියයුතු කාර්යයකි.

ජාතියේ රාජ්‍ය බැංකුව වශයෙන්, නියමිත ජාතික ඉලක්කයන් සපුරා ගැනිම, ශ්‍රී ලංකාවට හැකි කරවීමේ වගකීම් කාරයභාරය අපට හිමිවී ඇත. සියලුම ආකාරයේ සමාජ ආර්ථික ජනවිකාසයන්, භූවිෂමතාවන්, ප්‍රජාවන්, ජන වර්ගීකරණයන්, සංස්කෘතීන්, ආගම් සහ ජන කණ්ඩායම් ආර්ථික හා සමාජ යහ පැවැත්මේ ප්‍රධාන ප්‍රවාහයට රැගෙනයාම මෙයට ඇතුළත්ය.

මේ අනුව, මහජනතාව සවිබල ගැන්වෙන, ව්‍යවසායකත්වය දිරිමත්වන, නවීකරණය පෝෂණය කෙරෙන හා සංවර්ධනයට නායකත්වය දෙන ග්‍රාමීය ආර්ථිකයන් ශක්තිමත් කිරීම අප සතු වගකීමකි. මහා පුළුල් පරිමාණයකින් විසිරී පැතිරී පවත්නා අපගේ නිපැයුම් හා සේවා කළඹ තුළින්, බිළිඳුවියේ සිට ජීවිතයේ සැඳෑ අවදිය තෙක්, පුද්ගලයින්ගේ ජීවන ගමනේදී අප හවුල්කරුවන්වී ඇත. ඒ අනුව, ගොවි පරපුරේ සිට ගුරු පරපුර ඇතුළු විවිධ ජීවන වෘත්තීන්ට හුරු පුරුදුව සිටින නා නා ප්‍රකාර තරාතිරම්වල ශ්‍රී ලාංකිකයින්ට, අපගේ සහාය ලැබී ඇති අතර, ආර්ථිකමය ස්වාධීනත්වය සඳහා කාන්තාවන්ගේ සම්පත් ධාරිත්වය පවා අප විසින් වර්ධනය කරනු ලැබිය. විදේශ සේවාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයින් විසින් මහන්සියෙන් උපයා ගන්නා ධනය වර්ධනය කර ගනු සඳහාද, අපගේ මගපෙන්වීම් සිදුකරන ලද්දේය. සමස්තයක් වශයෙන් සලකා බලන කල්හි, ආසියාවේ ආශ්චර්යය බවට අප ශ්‍රී ලාංකික ජාතිය පත්කිරීම උදෙසා පෙරට යන ගමනේදී, අපරිමිත ආධාරකයක් වන පරිදි, මහජනතාවගේ දෑත් සවිමත් කෙරෙන අන්තර්කරණ පරිසරයක් අප විසින් නිර්මාණය කරනු ලැබ ඇත.

ඒ හා සමගම, අපගේ තිරසාරත්ව ආරම්භනයන් වාර්තා කිරීමේ වැදගත්කම අපි අවබෝධ කරගෙන සිටිමු. අපගේ පාර්ශ්වකරුවන් සමග සංවාදයෙහි නිරතව සිටියදී දැඩි බලපෑමක් නිර්මාණය කිරීමට එය සහායවන අතර, ඵලදායක උපාය මාර්ග සැලසුම් කිරීමට පවා එය පිටිවහලක් වන්නේය. වාර්තාකරණය මගින් පරතරයන් හඳුනාගෙන ඒවා ඉවත්කිරීමටත්, විනිවිදභාවය වැඩිකර ගැනීමටත්, අපගේ වගකිවයුතුභාවය වර්ධනයකර ගැනීමටත් එයින් අපට හැකි වෙයි. ගෝලීය වාර්තාකරණ ආරම්භන මාර්ගෝපදේශයන්ට හා වෙනත් නියාමන ප්‍රතිපත්තීන්ට අනුකූල වෙමින්, තිරසාර වාර්තාකරණ ක්‍රියාවලියකට අනුගත වීමට අපව පොළඹවන ලද්දේ මෙකී කරුණු කාරණා විසිනි. බැංකුවේ පාර්ශ්වකරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා, අපගේ තිරසාරත්ව ආරම්භනයන්හි ඵලදායකත්වය පිළිබඳව, සාකල්‍යවාදී චිත්‍රයක් දර්ශනය කිරීමට අපට සහාය වන්නේ එම වාර්තාකරණයයි.

ඒ නිසා, අපගේ තිරසාරාත්මක සංවර්ධන උපාය මාර්ග තුළින් අවධානය යොමු කෙරෙනුයේ ඓතිහාසික හා සංස්කෘතික උරුමය සංරක්ෂණය. අධ්‍යාපනය, සෞඛ්‍ය සත්කාරය, ව්‍යවසායකත්ව සවිබල ගැන්වීම සහ ග්‍රාමීය සංවර්ධනය ආදිය වෙතය. අපගේ මහජනතාව සවිබල ගැන්වීමෙහිලා, අපගේ දේශය වෙනුවෙන්, මේ සියල්ල විසින් ඒකරාශීවූ අවධානයක් යොමු කරනු ඇති බව අපගේ ඒකායන විශ්වාසයයි. අපගේ ඉතිහාසයෙහි ගැබ්වී තිබෙන්නාවූ අප්‍රමාණ සිද්ධි ධාරාවන්ගෙන්, අපගේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගයන්හි සාර්ථකත්වය නැවත නැවතත් සනාථවී තිබේ.

අපි, අපගේ මහජනතාව තුළ දැඩිසේ මුල් බැසගෙන ඇත්තෙමු. අප නිරන්තරයෙන්ම විශ්වාස කළ කරුණක් නම්, අවශ්‍ය මෙවලම්, දැනුම සහ කුසලතාවලින් අපගේ මහජනතාව සවිමත් කිරීමෙන්, අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීමට හැකිවන බවය. අපට තිරසාර සංවර්ධනය යනු මහජනතාව සමග එක්ව, ඔවුන් සවිමත් කරමින් යන චාරිකාවකි.



එන්. වසන්ත කුමාර්
සාමාන්‍යාධිකාරි

2014 මාර්තු 26

# අපගේ සේවකයන් පෝෂණයකිරීම හා ඔවුනට සෞභාග්‍යය උදාකරදීම

සියලු පාර්ශ්වකරුවන්ගේ පොදු යහපත හා ආයතනික ඉලක්ක සාක්ෂාත්කර ගැනීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මකවීම හා සමග සේවක අභිලාෂයන් ඉටුකිරීම හා ඔවුනට දියුණුව අත්කරදීම සිදුවන බවට බැංකුව වග බලා ගනී.




DREAMS

# අපගේ පාර්ශ්වකරුවන්ට දිගුකාලීන සේවා සම්පාදනය කෙරෙහි අපි නිරන්තරයෙන්ම විශ්වාසය තබා ගතිමු.

## අපගේ තිරසාරත්වය පිළිබඳ දර්ශනය හා උපායමාර්ගය

තිරසාරත්ව වාර්තාකරණය පිළිබඳ සමාරම්භක ක්‍රියා පිළිවෙත පසුගිය වසරේ අරඹන ලදුව, අපගේ තිරසාරත්ව දර්ශනය හා උපායමාර්ගය, බැංකුවේ දැක්ම හා මෙහෙවර සමග පෙළගැස්වීම, අඛණ්ඩ ව පවත්වාගෙන යාමට, අප විසින් උපායමාර්ගික තීරණයක් ගනු ලැබ ඇත. ඊට හේතුව නම්, බැංකුවේ දැක්ම හා මෙහෙවර නිරන්තරයෙන්ම තිරසාර සංවර්ධනීය ප්‍රතිපත්ති මුල්තැනලා සැලකීමත්, එහෙයින්ම මෙම අවධානය අපට එය පහසු හා අර්ථවත් කරවීමත්ය.

අපගේ  පාර්ශ්වකරුවන්ට දිගුකාලීන සේවා සම්පාදනය කෙරෙහි අපි නිරන්තරයෙන්ම විශ්වාසය තබා ගතිමු. අප පවත්වාගෙන යන හවුල්කරුවන්ගෙන් අපගේ පාර්ශ්වකරුවන් - වෙසෙසින්ම, ශ්‍රී ලංකා රජය සහ සමුපකාර සමිති - දිගින් දිගටම ප්‍රතිලාභ ලබමින් සිටිති. අපගේ නිපැයුම්. සේවාවන් සහ දර්ශනය, රජයේ දැක්මට පෙළගැසී තිබීමම ඊට ප්‍රබල සාධකයකි. කෙසේ වුවද, රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහනට මෙන්ම, සුළු හා මධ්‍ය ව්‍යවසායකත්ව අංශයට සහ ප්‍රධාන කර්මාන්ත ක්‍රියාකාරකයින් ඇතුළු වෙනත් ආරම්භනයන්ටද අපි වැදගත් දායකයින් හා හවුල්කරුවන් වෙමු. අපගේ අනුග්‍රාහකයින්, වටිනා ව්‍යාපාර හවුල්කරුවන් සහ අප අවට ජීවත්වන ප්‍රජාවන්, අපගේ ධනාත්මක මැදිහත්වීම ඔස්සේ, මෙම ජාතික වර්ධනයට දායකත්වය සපයන උද්‍යෝගිමත් ක්‍රියාකාරකයින් බවට පත්වීම අප විසින් තහවුරු කරනු ලැබ ඇත.

එහෙයින්, අපගේ තිරසාරත්ව දර්ශනය වනාහී සෑම සියලු දෙනාටම ප්‍රතිලාභ ලබාදෙන අන්තර්කරණ වර්ධනය පිළිබඳවයි. අපගේ කාර්යභාරය වනුයේ, අවශ්‍යතා සහිත අංශයන් හඳුනාගැනීම, අපගේ පාර්ශ්වකරුවන් එම අවශ්‍යතා සහිත අංශයන්ට ගැලපීම සහ එම අවශ්‍යතා සහිත අංශයන් පාදක කරගනිමින් පෙරට යාම හා හවුල්කරුවන් ශක්තිමත්කර ගැනීම මගින්, පරම්පරාවෙන් පරම්පරාවට තිරසාර ලෙස පවත්වා ගත හැකි අන්තර්කරණ වර්ධනයක කාර්ය සාධනයක් නිර්මාණය කරනු ලැබීම තහවුරු කිරීමයි. සරල ලෙස එය සකස්වීමත් හා සමගම, අපගේ දර්ශනය වනුයේ, පාර්ශ්වකරුවන්ට සහ අපටද අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායී සූත්‍රයක් නිර්මාණය කිරීමයි. මෙහි අදහස නම්, අප සඳහාම අප සකස්කර ගන්නා ඉලක්කයන් අන්‍යෝන්‍ය වශයෙන් අන්තර්කරණීය වීමත්, අප ව්‍යාපාර සිදුකරන ආකාරයට විනිවිද භාවය හා වගකිවයුතු භාවය ඇතිකරන්නාවූ අගයන් හා පරිචයන් සමග වෙන් නොවෙන අයුරින් අන්තර් සබඳතා තුළ තරයේ බැඳී සිටීමත්ය.

වාර්තාකරණ ක්‍රියාවලිය අපගේ දර්ශනයට බද්ධකර ගන්නා අවදියකට අප එළඹ ඇත. විනිවිද භාවය හා වගකිවයුතු භාවය නිසා අපගේ ප්‍රගතිය (හෝ බිඳ වැටීම) අප වාර්තා කරන අතර, අවසානයේ එහි සාවද්‍ය හෝ නිරවද්‍ය  භාවයද සලකුණු කරමින් වැදගත් ක්‍රියාකාරකම් හා අදාළ වද්දී, අපට පැහැදිලි පූර්වතා

පවත්නා බව තහවුරු කෙරේ. මෙය පරිසරයටද පෙළගස්වා තිබේ, ඊට හේතුව, මෙම ග්‍රහ ලෝකයෙහි සම්පත්වල භෞතික සීමාවන් පවත්නා බව අප හඳුනා ගත් නිසාය. අප බැංකුව, මූල්‍ය සේවා සම්පාදන ඒකකයක් වුවද, පරිසරයේ ආරක්ෂාව වෙනුවෙන් අපි කැපවීමෙන් යුතුව සිටිමු. ආර්ථික, සාමාජික හා පාරිසරික ආදී වශයෙන් සාකල්‍යාවාදී සාංකල්පිකව ගත් කල්හි, අපගේ එක් එක් කාර්යයක් එකිනෙකට අන්තර් සබඳතාවකින් යුක්තව බැඳී පවත්නා බව අප දන්නා අතර, තිරසාරත්වය පිළිබඳ අපගේ දර්ශනයද එසේම වන්නේය.

## පාලනය සහ අවදානම් කළමනාකරණය

පාලනය සහ අවදානම් කළමනාකරණ පරිචයන්, උපාය මාර්ග හා ප්‍රතිපත්ති යන කරුණු පිළිබඳව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 117 සිට 126 දක්වාත්, 127 සිට 150 දක්වාත් සවිස්තරාත්මකව දක්වා තිබේ. බැංකුවේ සභාපතිතුමාට විධායක භූමිකාවක් නොමැති බැව් මෙහිලා සඳහන් කිරීම කාලෝචිතය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 21 සිට 26 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ පැතිකඩ යටතේ දක්වා ඇත.

### අවදානම් ලිහිල්කරණය

අවුරුදුපතා, බැංකුව පරිපූර්ණ අවදානම් කළමනාකරණ කාර්ය රාමුවක් පවත්වා ගනිමින්, ඒ පිළිබඳ සැලකිල්ලෙන් පසුවන අතර, කවර හෝ බැංකු ව්‍යාපාර ඒකකයක, කවර හෝ අවස්ථාවක වංචාවක් සිදුවීමට ඇති ඉඩකඩ පිළිබඳව නිරන්තර අවධානයෙන් පසුවෙයි. අදාළ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවලට අනුබද්ධිත බැංකුවේ ගෘහස්ථ විගණන නිලධාරීන්, සෑම ශාඛාවකටම අනුයුක්ත කර ඇති අතර. එවන් සිද්ධි හෝ අකටයුතු වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පරීක්ෂාවන් හා පාලනයන්ද ස්ථානගතකර ඇත. ඔවුන්ගේ භූමිකාව වනුයේ, ව්‍යාපාර ඒකකයන් විසින් එම පරීක්ෂාවන් හා පාලනයන් නිසි ලෙස ක්‍රියාත්මක කරනු ලබන්නේදැයි යන්න අධීක්ෂණය කිරීමත්, අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමත්ය.

ව්‍යාපාර ඒකකයන්හි අවම ලෙස දෛනික විගණන ශ්‍රිතයන් සිදුකරනු ලැබීම මගින්ද, එබඳු අවදානම හා බැඳුණු දූෂණ සිදුවීමේ හැකියාව අවම කරනු ලැබේ.

### අනුකූලතාවෙන් ඔබ්බට යාම

අප රාජ්‍ය බැංකුවක් වශයෙන්, අපගේ සියලු මෙහෙයුම්වලදී අනුකූලතාව ඉතා වැදගත් පිළිවෙතක් බව තහවුරු කිරීමේ වගකීම අප සතුව ඇති අතර, අල්ලස් හා දූෂණ සහ මුදල් විශුද්ධිකරණය නොඉවසීම එයින් අදහස් වෙයි. බැංකුව ඇතුළත පවත්නා අධීක්ෂණ හා පාලන ක්ෂේත්‍රයන් මගින් වංචා හා අනවශ්‍ය අවදානම් අවම කිරීම සිදුකෙරේ.

කෙසේ වුවද, දැඩි අධීක්ෂණ හා පාලන ක්‍රියාවලියන් පැවතියද, කවර හෝ අවස්ථාවක, කවර හෝ ව්‍යාපාර ඒකකයක වංචාවක් සිදුවීමට හැමවිටම ඉඩකඩ ඇත. එවැනි අකටයුතු වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පිරික්සුම් හා පාලනයන් යෙදිය යුතු බව මෙයින් කියැවේ. කලින්ද සඳහන් කළ පරිදි, සෑම ශාඛාවකටම අනුයුක්තකර ඇති, අදාළ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවලට අනුබද්ධිත බැංකුවේ ගෘහස්ථ විගණන නිලධාරීන්, ව්‍යාපාර ඒකකයන් විසින් එම පරීක්ෂාවන් හා පාලනයන් නිසි ලෙස ක්‍රියාත්මක කරනු ලබන්නේදැයි විමර්ෂනය කරන අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී නිසි ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

දූෂණ පිළිබඳ සියලු සිදුවීම්, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මෙන්ම පරීක්ෂණ හා විමර්ශන දෙපාර්තමේන්තුව මගින්ද විමර්ශනය කෙරේ. අදාළ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල හෝ ප්‍රධාන කාර්යාල දෙපාර්තමේන්තු විසින් මූලික පරීක්ෂණ සිදුකළ පසු, බැංකුවේ චර්යාධර්ම සංග්‍රහයෙහි විධිවිධාන යටතේ විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ. සිද්ධියේ ස්වභාවය හා බරපතලකම අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටද (CID) පැමිණිලි යොමු කරනු ලබන අතර, එම දෙපාර්තමේන්තුවේ සොයා ගැනීම් අනුව, චූදිතයා අධිකරණය හමුවට ගෙන එනු ලැබේ.

අනුකූලතාවෙහි ඉතා ඉහළ ප්‍රමිතීන් අනුගමනය කිරීමට අප උත්සාහ කරන අතර, පවත්නා නීති හා රෙගුලාසි අනුව, 2013 වසර තුළ ඒවා අනුගමනය නොකිරීම නිසා, කිසිදු දඩ මුදලක් අය කිරීම හෝ සම්බාධකයක් පැනවීමක් සිදු නොවීම එහි ප්‍රතිඵලයක් ලෙස දැකිය හැකිය. එසේම, වෙළෙඳ ප්‍රචාරනය, ප්‍රවර්ධනය හා අනුග්‍රාහකත්වය ඇතුළු අලෙවි සන්නිවේදන කටයුතු සම්බන්ධයෙන්ද රෙගුලාසි හා ස්වේච්ඡා ආචාරධර්ම සංග්‍රහයන්ට අනුකූල නොවීමේ සිද්ධීන් වුවද කිසිවක් සිදුවූයේ නැත.

### අනුකූලතා අවශ්‍යතා අනුව කණ්ඩායම පෙළගැස්වීම

කණ්ඩායම අතර අධීක්ෂණ හා පාලන ක්‍රියා පිළිවෙත් යාවත්කාලීන කිරීම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් අඛණ්ඩව සිදු වෙයි. අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණු වැඩසටහන් 21ක් මගින් සියලු කණ්ඩායම් සාමාජිකයෝ පුහුණුව ලැබූහ. ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවල නිලධාරීන් ඇතුළු අදාළ සෙසු නිලධාරීන් උදෙසා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පැවැත්වූ පුහුණු වැඩසටහන්වලට 430 දෙනෙක් 2013 වසරේදී සහභාගි වූහ.

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳ දැනුම ලබා දීමේ පුහුණු සැසි ශාඛා ජාලයන් සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව නිතිපතා පවත්වයි. 2011 අංක 40 දරන පනතින් සංශෝධිත 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාද මූල්‍යකරණය මැඩලීමේ ප්‍රඥප්තිය පිළිබඳ පනත යන පනත්වල අඩංගු නියමයන් එම පුහුණුවීම්වලට අදාළ වෙයි.

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳව පුහුණු සැසි 17ක්, 2013 වසර තුළදී, සේවකයන් 1,673 දෙනෙකු වෙනුවෙන් අනුකූලතා අංශය විසින් පවත්වන ලදී.

## ආර්ථික කාර්ය සාධනය

ශ්‍රී ලංකා රජය අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවා වන හෙයින්, ලාභාංශ හා බදු වශයෙන් මහා භාණ්ඩාගාරයට අප සිදු කරන සෘජු දායකත්වය මෙරට සංවර්ධනය සඳහා කිසිදු සැකයකින් තොරව භාවිත කරනු ලැබේ. අපගේ ත්‍රිවිධ යටි රේඛා සංකල්පය කෙරෙහි බැඳුණු වගකීම පිළිබඳ පූර්ණ අවධානය නිරන්තරයෙන්ම ඇතිව, අපගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් හා ලාභදායකත්වය වර්ධනයකර ගනිමින්, බැංකුවේ ස්ථාවරත්වය තහවුරු කෙරෙන ආරම්භනයන් ස්ථාපනයට හා ක්‍රියාත්මක කිරීමට, එම දායකත්වය අප උනන්දු කරන අතර, ජාතික සංවර්ධනයේ ප්‍රමුඛයෙකුවීම ගැන අපි මහත්සේ ආඩම්බර වෙමු.

අපගේ ආර්ථික කාර්ය සාධනය ජාතියේ ප්‍රගතිය සමග ඉතා සමීප ලෙස බද්ධවී ඇති හෙයින්, බැංකුව සඳහා ශක්තිමත් හා ස්ථාවර පදනමක් නිර්මාණය කිරීම ඔස්සේ, ප්‍රජාවන් හා පරිසරය ඉහළ නැංවීම සඳහා ඵලදායක ලෙස දායකත්වය ලබාදීම පිණිස එකී මූලධර්මයන් භාවිත කළ හැකි වන්නේය. අප රාජ්‍ය බැංකුවක් නිසා සහ ජාතික සංවර්ධනය සමග අපගේ පවත්නා නිත්‍ය සබඳතා නිසා, අපගේ සේවාදායකයින්, සේවා සම්පාදක කණ්ඩායම සහ වටිනා ව්‍යාපාර හවුල්කරුවන්ද අප සමග ගොඩ නගා ඇති සමීපතාව ගැන උදම් වනුයේ, අප තුළින් ඔවුන්ද ප්‍රගතිශීලී ජාතික සංවර්ධනයෙහි කොටස් කරුවන් බවට පත්ව ඇති හෙයින්වීමද සැලකියයුතු කරුණකි.

2013 වර්ෂයේදී, මහජන බැංකුව රු. බිලියන 120.4ක ආදායමක් සහ රු. බිලියන 10.3ක බදු පෙර ලාභයක් ලැබූ අතර, බදු, ලාභාංෂ හා ගෙවීම් වශයෙන් මහ භාණ්ඩාගාරයට රු. බිලියන 10ක් පිරිනමා ඇත.

## අපගේ නිපැයුම්

'පරම්පරාවන් ඔස්සේ  සැමටම ප්‍රතිලාභ' යන දර්ශනය අනුව, අපගේ නිපැයුම් හා සේවා කළඹ නිර්මාණයවී තිබේ. මෙම කළඹෙහි පදනම සකස්වී ඇත්තේ, මහජනතාව ආර්ථික වශයෙන් තිරසාර බවට පත් කරමින්, ඔවුන්ගේ අභිලාෂයන් හා ප්‍රාර්ථනාවන් සාක්ෂාත් කරගනු පිණිස ඔවුන් සවිබල ගන්වනු සඳහා ය. මෙය, කෙසේ වුවද. සිදුවිය හැකි වන්නේ පුද්ගල හා ප්‍රජා වර්ධනය ජාතික ප්‍රගතියට බැඳී පවතින්නේ නම් පමණකි. අපගේ බැංකුවේ නිපැයුම් හා සේවාවන් තරගකාරිත්වයේ පෙරමුණ ගන්නේ මෙම සාධකයෙන් වනුයේ, මහජනතාවගේ හද ගැස්ම පිළිබඳ විනිශ්චය කිරීමට අපට නිරන්තරයෙන්ම හැකිවීම නිසා සහ එය ජාතියේ ඉදිරිගමනට ගලපන්නටද අපට හැකිවූ නිසාය.

බැංකුව සේවකයින් 10,863 දෙනෙකුගෙන් සමන්විත ශාඛාවන් 735ක් මෙහෙයවයි. මීට අමතරව, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) 460 ක්ද රට පුරා ක්‍රියාත්මක වෙයි. මෙම ලක්ෂ්‍යයන් මගින් සේවාදායකයින් මිලියන 15කට අපගෙ සේවය සැලසේ.

තවත් එවැනි ටෙලර් යන්ත්‍ර 40ක් හා ශාඛා 7ක් තෝරාගත් සේවාවන් සම්පාදනය සඳහා සහත සඳහන් ස්ථානයන්හිදී මෙම වසරේ විවෘත කරන ලදී.

- මධ්‍යම පළාත් සභාව
- විගමන සම්පත් මධස්ථානය
- පුදුකුඩිඉරිප්පු
- කැනොවින් ආකේඩ් A
- කැනොවින් ආකේඩ් B
- කයිතඩි
- සෙත්සිරිපාය

## නිපැයුම් වගකීම

ගතවූ අවුරුදුවල අප විසින් දිනාගන්නා ලද සම්මාන අනුව - විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් ඔවුන්ගේ රුචිකත්වය පරිදි අපට පිරිනමන ලද සම්මාන අනුව - ශ්‍රී ලංකාවේ මහජනතාවගේ පළමුවන තෝරාගැනීම මහජන බැංකුව කරලීමේ අපගේ ඉලක්කය සාක්ෂාත්වී ඇත. කෙසේ වුවද, මෙය අඛණ්ඩව උද්ගතවන තරාතිරමක් බව අප විසින් මනාව අවබෝධ කරගනු ලැබ තිබේ.  රාජ්‍ය බැංකුවක් වශයෙන්, ආයතනික මග පෙන්වන්නෙකු සහ මූල්‍ය සේවා අංශයෙහි කර්මාන්ත නායකයෙකුවීමේ වගකීම අපට භාරවී ඇති අතර, එමගින් ස්ථාවර ප්‍රජාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම, සියලුම ශ්‍රී ලාංකිකයින්ට උසස් ජීවන තත්ත්වයක් තහවුරු කිරීම සඳහාද අප බැංකුව සහායකයකු වනු ඇත.

අපගේ ජනප්‍රියතාව අපගේ දැක්ම සමග යුගලක් බවට පත්කරමින්, අප නිබඳව සිහි තබා ගත යුතු කරුණක් නම්, අපගේ නිපැයුම් හා සේවාවන් උපදවා, ස්ථාපනයකර, ව්‍යාප්ත කළ යුතු වන්නේ සදාචාරාත්මක වගකීම් පරිසරයක් තුළ බවයි. මෙයින් අදහස් වනුයේ,  නිපැයුම් හා සේවාවන් පිළිබඳ මෙම වගකීම් ධාරාව, අපගේ ආයතනයේ ශිරා නාලයන් තුළ ගලා යායුතු බව හා එය අපගේ අනුග්‍රාහකයින්ට හා පාර්ශ්වකරුවන්ට ව්‍යාප්ත වියයුතු බවයි. අපගේ කළඹ පිළිබඳ එම ප්‍රවාහයන්, විනිවිද හා විවෘත භාවයෙන් යුක්ත විය යුතු බවත්, ව්‍යාකූල නොවන බවත්, පාර්ශ්වකරුවන්ට අනර්ථකාරී හෝ කායික මානසික වශයෙන් හානිකර හෝ අවාසිදායක වන සැඟවුණු ලක්ෂණ කිසිවක් එහි නොතිබිය යුතු බවත් තහවුරුවීම වැදගත්ය. නිපැයුම් වගකීමට මනා සම්බන්ධතාවක් සහිත අපගේ සන්නිවේදන උපාය මාර්ගය මෙතැන්හිදී අදාළ වන්නේය.

## එහෙයින්, තිරසාරභාවය පිළිබඳ අපගේ දර්ශනය සෑම දෙනාටම ප්‍රතිලාභ ගෙනදෙන අන්තර්කරණ වර්ධනය හා අදාළ වන්නේය.

### උපාය මාර්ගික සන්නිවේදන ප්‍රවේශය

ඉදිරි පස් වසර සඳහා උපාය මාර්ගික සන්නිවේදනය සහ දැක්ම පිළිබඳ ප්‍රතිපත්තියක් මෙම වසරේදී අලෙවි අංශය විසින් කෙටුම්පත් කරන ලදුව, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම ප්‍රතිපත්තියෙහි අන්තර්ගත න්‍යායයන් අනුව, ප්‍රචාරනය, ප්‍රවර්ධනය, සහ අනුග්‍රාහකත්වය ඇතුළු අලෙවි සන්නිවේදනය හා අදාළ වන ප්‍රමිතීන්ට මෙන්ම චර්යා ධර්මයන්ටද බැංකුව අනුගතව ඇත.

බැංකුව ඇතුළත, මාධ්‍ය හා ඊට අදාළ පාර්ශවකරුවන් සමග කටයුතු කිරීමේදී කාර්ය මණ්ඩලයට හා බාහිර නියෝජිතයින්ට මාර්ගෝපදේශ බැංකුව විසින් නිකුත්කර තිබේ. අපේක්ෂිත ප්‍රතිඵලයක් උදාකර ගැනීම පිණිස ක්‍රියාකාරකම්, ප්‍රතිබිම්බයන් හා වදන් මාලාවන් සංවිධානය කරගැනීම  සහ සමකාලිකකරණය උපාය මාර්ගික සන්නිවේදනය ලෙස අප අර්ථකරණය කරන අතර, එය උපාය මාර්ගික සන්නිවේදන අපේක්ෂාවන් හා බැඳුණු සංවර්ධත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. දැනුවත්භාවය, උනන්දුව හා විමර්ෂණය උත්පාදනය කෙරෙන ද්‍රව්‍ය හා තොරතුරු නිකුත් කිරීම හා අදාළවන ප්‍රතිපත්තිය, අපගේ ප්‍රවේශය මගින් පැහැදිලිව ප්‍රකාශ වෙයි.

### සන්නිවේදන පාලනය හා මිනුම්කරණය

බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන අනුග්‍රාහක ප්‍රඥප්තියට සහ චර්යා ධර්ම සංග්‍රහයට  අනුකූලව, අපගේ සන්නිවේදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අපි බැඳී සිටිමු. සත්‍යමය තොරතුරු, සාධාරණ බැංකුකරණ පරිචයන්හි කේන්ද්‍රීය ප්‍රමිතියක් ලෙස පවත්නා බැව් මෙය තහවුරු කරයි. එහෙයින්, සියලුම සන්නිවේදන ක්‍රියාවලීන්, තේමාවන්, ඉලක්කයන් හා නියුක්තිකරණ ක්‍රමවේදයන්, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති හා උපායමාර්ගික දැක්ම තුළින් අපි ලබා ගන්නෙමු. එය අපගේ සන්නිවේදන උපායමාර්ගයේ ඒකාකාරිත්වය හා පවත්වා ගැනීම පහසු කරයි.

මහජන බැංකුවේ සන්නාමය දැන් මෙරට ඉහළම ස්ථානයේ පවතින්නකි. සිදුකරන ලද ඇතැම් සමීක්ෂණයන්ට අනුව, එය එක්වරම කෙනෙකුගේ සිතට නැගෙන සන්නාමයකි. එහෙයින් සියලු ප්‍රචාරන ක්‍රමවේද සංස්ථාපිත සන්නාමයේ ඉලක්ක හා පූර්වතාවන් සමග බැඳී පවතී. ප්‍රවර්ධනය කෙරෙන නිපැයුම් හා සේවාවන්හි උපසන්නාමයන් අනුපූරණය කිරීම අරභයා, සියලුම සන්නිවේදනයන්හි ආවරණ තිරයක් ලෙස භාවිත කරමින් අපගේ සන්නාමය වර්ධනය කිරීම, සඳහා එය ප්‍රබල වේදිකාවක් අපට සපයයි. සන්නිවේදනයන්හි අපගේ ආයෝජනයන්ගේ අගය උපරිමකරණය සඳහා, තැන්පතු සජීවීකරණ ආරම්භනයන් මෙහෙයවනු ලබනුයේ පූර්ව නිගමනයක් හා පූර්ව අනුමැතියක් ලත් සන්නිවේදන අයවැයකිනි.

## විනිවිද පෙනෙන හා අන්තර්ක්‍රියාකාරිත්ව සන්නිවේදන

වඩාත් විනිවිද පෙනෙන හා වගකිවයුතු සංවිධානයක් නිර්මාණය කිරීමේ අපගේ උපාය මාර්ගික අභිලාෂය හා අවශ්‍යතාව අනුව, බැංකුවේ මෙම ධනාත්මක ගති ලක්ෂණ පවත්වා ගැනීමේදී, සංවාදය හා ප්‍රතිපෝෂණය නොහොත් ප්‍රතිචාරය වැදගත් ආධාරකයන් වන බව අපගේ විශ්වාසයයි. බහුලක්ෂණයන් සහ අපක්ෂපාතිත්වය සංයුක්ත සංවාදයන් ප්‍රගුණ කරනු පිණිස, අප විසින් යොදාගෙන ඇති උපාය මාර්ගික සන්නිවේදන ක්‍රමවේදයන් මගින් අපේක්ෂා කෙරෙනුයේ, සමාජමය වශයෙන් යෝග්‍ය සබඳතා ගොඩනගා ගැනීමයි. සියලුම සන්නිවේදන උපකරණ, අදාළ හා නැවුම් බවකින් යුක්ත වන අතර, සීඝ්‍රලෙස වෙනස් වෙමින් පවත්නා පෘථුල තත්වයන් සහිත යුගයක් තුළ, සේවාදායකයින් හා සෙසු අනුග්‍රාහකයින් සම්බන්ධකර ගැනීම උදෙසා සැලසුම්කර ඇත.

### කොටස්හිමියන් සමග සන්නිවේදනය

ශ්‍රී ලංකා රජය බැංකුවේ ප්‍රධාන කොටස්හිමියා වන අතර, බැංකුව පාලනයවන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සමග අප විසින් නිරන්තර සංවාදයන් පවත්වනු ලැබේ. නිතිපතා පැවැත්වෙන රැස්වීම්වලට බැංකුවේ ප්‍රාදේශීය කළමනාකාරිත්වයෙහි සාමාජිකයෝ හා සමුපකාර සමිති නියෝජිතයෝ සහභාගි වෙති. තවද, කොටස්හිමියන්ගේ අදහස් උදහස් ලබාගැනීමට හා ඔවුන්ට අදාළ ගැටළු විසඳීම සඳහා මහ සභාවේ රැස්වීම්ද අදාළ පරිදි පැවැත්වෙයි.

### සේවක පිරිස් සමග සන්නිවේදනය

බැංකුවේ ජීවනාලිය වන අපගේ කණ්ඩායම් සාමාජිකයින් සමග සන්නිවේදනයෙහි නිරත වීමේදී, 'බිම් මට්ටමේ සිට ඉහළ මට්ටමට' යන ප්‍රවේශය අප විසින් අනුගමනය කරන ලදී. අපගේ සියලු මෙහෙයුම්වල ප්‍රධාන සංරචකයක්වන, ඔවුන් සමග අඛණ්ඩ සංවාදයන් පවත්වා ගැනීමට අප ඉතා උද්‍යෝගිමත්වන අතර, බැංකුවේ සමස්ත උපාය මාර්ගික ක්ෂේත්‍රයන්හි උද්ගතවන කරුණු කාරණාද, සංස්ථාපිත සැලැස්මද, වාර්ෂික අයවැයද ඇතුළුව බැංකුවේ සිදු කෙරෙන මෙහෙයුම් පිළිබඳ හඳගැස්ම දැන හඳුනා ගැනීම සඳහා, සංස්ථාපිත කළමනාකරණ කණ්ඩායමේ සෑම සාමාජිකයෙකු සමගම, නොකඩවා විවෘත සංවාද පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය උනන්දුවීම ද අතිශයින් වැදගත් සාධකයකි.

ආයතනික කළමනාකාරිත්වය නිතිපතා විධායක කළමනාකාරිත්වයෙහි සාමාජිකයන්, ප්‍රාදේශීය කළමනාකරුවන් හා ශාඛා කළමනාකරුවන් සමග පවත්වන රැස්වීම්වලදී ඉලක්ක සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා ගෙවීගිය කාර්තුවේ කාර්ය සාධනය ඇගැයීම සිදු කෙරේ. මෙම ඇගයීම් සිදු කෙරෙනුයේ, වරින්වර පැවැත්වෙන කළමනාකරුවන්ගේ සම්මේලනයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ද සමගය. කළමනාකරුවන්ගේ සම්මේලනය බැංකුවට අතිශයින් වැදගත් වනුයේ, එහිදී සහභාගිවන්නන් උනන්දුවන කරුණු ඉස්මතුකර සාකච්ඡා කළ හැකි නිසාත්, පැහැදිලි කිරීම් ලබාගත හැකි නිසාත්ය. බැංකුව එහි වෘත්තීය සමිති සමගද කටයුතු කරමින් යහපාලනය හා අදාළ කරුණු පිළිබඳව ඔවුන් සමග සාකච්ඡා කරයි.

## සන්නාම අගය/ස්ථානගත කිරීම

මහජනතාවගේ ප්‍රථම තේරීම-වීමේ අපගේ අරමුණ: අපගේ ස්ථාන ගතකිරීමේ ඉලක්කය 'මතකයේ ඉහළින්ම ඇති සන්නාමය' බවට අප පත්වීමයි. මෙම ක්ෂේත්‍රයේ නොකඩවාම අප එය දිනාගෙන ඇත. කෙසේ වුවද, මෙම දැවැන්ත තරාතිරම නිතර අභියෝගවලට පාත්‍රවේ. ඒ ගැන අවබෝධයෙන් යුතුව ඉහළින්ම රැඳී සිටින්නට අප වෙහෙසිය යුතුය. නිර්මාණාත්මක හා නැවුම් ප්‍රවේශයන් භාවිත කිරීමද, අපගේ මූලික අගයන් වන ශක්තිය, ස්ථාවරත්වය, විශ්වාසය හා ප්‍රවේශයන් සමග සන්නිවේදන තේමාවන් බද්ධ කරගැනීමද තහවුරු කිරීමට පියවර ගනිමින්, මෙය ඉටු කරගැනීම අප දැනටමත් අරඹා ඇත.

## පාර්ශ්වකාර ප්‍රවේශය

අපගේ පාර්ශ්වකරුවන් අප සමගම සිටින්නන්ය. එය දශක පහකටත් පෙර සිට පෝෂණයවූ සබඳතාවක් වන අතර, පරපුරෙන් පරපුරට එය ශක්තිමත් කරගැනීම අපගේ අභිලාෂයයි. පරිසරය වනාහී අන්තරකරණ, නොහොත්, සියල්ලන් ඇතුළත් කරගන්නා, ස්ථාවරයකි. එනම්, සංස්කෘතික, වාර්ගික හෝ ආගමික ආදී කවර හෝ පදනමකින් වෙනස් කොට සැලකීමක් සිදු නොවේ. එකම ධජය යටතේ මහජනතාව ඒකරාශි කිරීමේ ජාතික දැක්ම අනුව, අපගේද අරමුණ වනුයේ, සමාජයේ සියලු කොටස් සමග එක්ව, ශ්‍රී ලාංකික සංස්කෘතියේ විවිධත්වය පවත්වාගැනීමයි. තවද, සිවිල් සමාජය, ප්‍රජා නායකයන්, රජයේ හා ප්‍රාදේශීය ජනනායක තීරණ ගන්නන් වැනි අය දියුණුවේදී අපගේ හවුල්කරුවන් කරගැනීමයි. බාධක හා අභියෝගවලට මුහුණදීම පිණිස අප කාර්යක්ෂම හා ප්‍රවාහගත කරනලද ක්‍රියාවලින් ආදේශ කරගෙන ඇති අතර, අන්‍යෝන්‍ය ප්‍රගතිය සඳහා අපගේ පාර්ශ්වකරුවන් සමග ඒකාබද්ධව කටයුතු කිරීමට එමගින් අපට අවස්ථාව සැලසේ.

පහත දක්වා ඇති වගුවෙහි පසුගිය වර්ෂයේ අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සිදු කරන ලද නියුක්තිකරණ ක්‍රියාවලීන් දක්වා ඇත.

| පාර්ශ්වකාර වර්ගය | නියුක්තිකරණ ක්‍රමය |
|---|---|
| රජය | • පොදු වේදිකා හා සම්මේලන |
| | • රැස්වීම් |
| | • පුවත්පත් නිවේදන |
| | • වාර්ෂික වාර්තා |
| | • අන්තර්වාර මූල්‍ය වාර්තා |
| | • පුවත්පත් සාකච්ඡා හා මාධ්‍ය නිවේදන |
| | • ආයතනික වෙබ් අඩවිය |
| නියාමකයන් | • අදාළ පරිශ්‍රයන්ට පැමිණීම |
| | • සාකච්ඡා හා රැස්වීම් |
| (ශ්‍රී ලං. ම. බැ, මු. අ., ශ්‍රී ලං. ව. ග. ආ. යනාදිය) | • වාරික සමාලෝචන සැසි |
| | • අනුකූලතා අංශය ශ්‍රී ලං. ම. බැ. සමග සම්බන්ධීකරණය |
| | • අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන |
| සේවකයන් හා වෘත්තීය සමිති | • කාර්ය මණ්ඩල රැස්වීම් |
| | • නිශ්චිත ප්‍රතිලාභ සැලසුම |
| | • අන්‍යෝන්‍ය වශයෙන් එකඟවූ කාර්යසාධනය |
| | • අභ්‍යන්තර චක්‍රලේඛන |
| | • වෘත්තීය සමිති සමග මුහුණට මුහුණලා රැස්වීම් |
| | • සේවක සමීක්ෂණ |
| | • කාර්යසාධන සමාලෝචන පද්ධතීන් |
| | • සේවකයින් පුහුණු කිරීමේ වැඩමුළු හා සැසි |
| | • විද්‍යුත් තැපැල් ප්‍රකාශන |
| | • ප්‍රශ්න විචාරාත්මක තරඟ, කාර්ය මණ්ඩලයේ ළමුන් වෙනුවෙන් පැවැත්වෙන සාදයන්, ආගමික ක්‍රියාකාරකම් යනාදී විශේෂ අවස්ථා |
| ගනුදෙනුකාර භවතුන් | • ශාඛා හා සේවා මධ්‍යස්ථාන |
| | • වාර්ෂික වාර්තා |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • ලිඛිත සන්නිවේදනය හා ප්‍රතිචාර |
| | • ඇමතුම් මධ්‍යස්ථානය |
| | • පුවත්පත් නිවේදන |
| | • අනුග්‍රාහක භවතුන්ගේ රැස්වීම් |
| | • අනුග්‍රාහක භවතුන්ගේ තෘප්තිමත් භාවය පිළිබඳ සමීක්ෂණ |
| ප්‍රජාව | • ආයතනික සමාජ වගකීම් සඳහා ආරම්භනයන් |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • අනුග්‍රාහකත්වය |
| | • ශිෂ්‍යත්ව |

| පාර්ශ්වකාර වර්ගය | නියුක්තිකරණ ක්‍රමය |
|---|---|
| | • පොදු අවස්ථා |
| | • සම්මේලන |
| | • ශාඛා |
| | • මාධ්‍ය |
| | • ඇමතුම් මධ්‍යස්ථානය |
| මාධ්‍ය | • පුවත්පත් නිවේදන |
| | • වාර්ෂික වාර්තා |
| | • පුවත්පත් සාකච්ඡා |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන |
| සැපයුම්කරුවන් | • අදාළ පරිශ්‍රවල පැවැත්වූ රැස්වීම් |
| | • මුද්‍රිත මාධ්‍යවල පොදු දැන්වීම් |

## ශ්‍රී ලංකා රජයෙන් ලත් විශේෂ මූල්‍ය සහාය

මහජන බැංකුවේ හිමිකම්වලින් 92.27%ක් දැනට දරන්නාවූ ශ්‍රී ලංකා රජයට, බැංකුවේ ප්‍රගතිය හා සංවර්ධනය උදෙසා ආයෝජනයන් සිදු කිරීමේ උරුමය පාදකවූ අයිතියක් තිබේ. බැංකුවේ විවිධ මෙහෙයුම් මූල ව්‍යාපෘති සඳහා රාජ්‍ය ප්‍රභවයන්ගෙන් ලැබෙන සැලකිය යුතු මට්ටමේ මූල්‍ය ශක්තිමත් කිරීම් එයට ඇතුළත්ය. තිරසාරත්ව වාර්තාකරණය පිළිබඳ විනිවිදභාවය හා බැඳුණු ප්‍රතිපත්ති වලට අනුකූලව, සමාලෝචනයට අදාළ කාල පරිච්ඡේදය තුළ රජයෙන් බැංකුව ලැබූ ණය හා මුදල් ප්‍රමාණයන් පහත දැක්වෙයි:

## පොලී සහනාධාර යෝජනා ක්‍රම

| යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | හිමිකම් ලබන අංශය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය | 2013 දෙසැම්බර් දිනට හිඟ ණය මුදලෙහි සමුච්චිතය රු. මිලියන |
|---|---|---|---|---|
| රජයේ සේවකයන් සඳහා විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමය | • රු. 500,000/- - දක්වා 8.0%<br>• රු. 500,001/- - රු. මිලියන 1.0 - දක්වා 4.0%<br>• රු. මිලියන 1.0 වැඩි - 3.0%<br>ශ්‍රී ලංකා රජයෙන් පොළී සහනාධාරය | වසර 5 ක සේවා කාලයක් ඇති, හා විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති, සේවයේ ස්ථිර කරන ලද රජයේ සේවකයන් | 36,206 | 23,542.74 |
| වි.වි.ප්‍ර.කො. යටතේ ඇති විශ්වවිද්‍යාලවල සේවකයන් වෙනුවෙන් නිවාස ණය යෝජනා ක්‍රමය | • රු. මිලියන 1.0 දක්වා - 5.5%<br>• රු. මිලි 1.0 - රු. මිලියන 2.0 - දක්වා 5.0%<br>ශ්‍රී ලංකා රජයෙන් පොළී සහනාධාරය | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ලියාපදිංචි කරන ලද විශ්වවිද්‍යාලයක වසර පහක සේවා කාලය ඇති සේවයේ ස්ථිර කරන ලද සේවකයන් | 408 | 472.19 |
| මාධ්‍යවේදීන්ට යතුරුපැදි, පරිගණක, කැමරා හා මාධ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා සහන පදනමින් ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා රජයෙන් පොළී සහනාධාරය 11% | ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යංශයෙන් නිර්දේශ කරන ලද මාධ්‍යවේදීන් | 130 | 5.02 |
| ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්ට, ශිල්පීන්ට සහ කර්තෘවරුන්ට මෝටර් රථ මිලදී ගැනීම සඳහා ණය යෝජනා ක්‍රමය | • රු. මිලියන 0.5 අඩු - 10.0%<br>• රු. මිලියන 0.5 - රු. මිලියන 1.0 - 12.0%<br>• රු. මිලියන 1.0 - රු. මිලියන 1.2 - 14.0%<br>සම්පූර්ණ පොලිය ශ්‍රී ලංකා රජයෙන් සහනාධාරයක්සේ (100% පොළී සහනාධාරය) | ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යංශයෙන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයෙන් නිර්දේශ කරන ලද පුද්ගලයින් | 169 | 180.29 |

## කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන යෝජනා ක්‍රමය

| මාතෘකාව | යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | හිමිකම් ලබන අංශය | | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය | 2013 දෙසැම්බර් දිනට හිඟ ණය මුදලෙහි සමුච්චිතය රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| පොළී සහනාධාර යෝජනා ක්‍රමය | වාණිජ මට්ටමින් කිරි හරක් ගොවිපල සංවර්ධන ණය යෝජනා ක්‍රමය | නියෝජිත - කලාපීය සංවර්. දෙපා. - ශ්‍රී.ලං.ම.බැ.<br>උපරිම ණය ප්‍රමාණය රු. මිලියන - 25<br>ණය ගැනීමේ පොළී අනුපාතිකය - 6%<br>ණය දීමේ පොළී අනුපාතිකය - 8%<br>උපරිම කාලය - අවුරුදු 5<br>උපරිම සහන කාලය මාස - 6 | කිරි හරක් මිලදී ගැනීම<br>ගව මඩු සකස් කිරීම<br>තණ බිම් වගා කිරීම<br>නව ගොවිපල සංවිධානය කිරීම<br>ගොවිපල සංවර්ධනය කිරීම<br>ජීව වායු නිපදවීමට කටයුතු කිරීම | දැනට පවත්නා ගොවිපල ව්‍යාප්ත කිරීම, කිරි හා ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම, ආරම්භ කිරීම, උපකරණ මිල දී ගැනීම, ප්‍රවාහනය සහ කිරි ගබඩා කිරීම | 9 | 44.92 |

| මාතෘකාව | යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | හිමිකම් ලබන අංශය | | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය | 2013 දෙසැම්බර් දිනට හිඟ ණය මුදලෙහි සමුච්චිතය රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිමූල්‍ය යෝජනා | කුඩා හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය | නියෝජිත - ලෝක බැංකුව<br>උපරිම ණය ප්‍රමාණය - රු. මිලියන 60<br>ණය ගැනීමේ පොලී අනුපාතිකය - මාස 6ක AWDR<br>ණය දීමේ උපරිම කාලය මාස 6ක AWDR + 2%<br>උපරිම කාලය - අවුරුදු 10<br>උපරිම සහන කාලය - අවුරුදු 2 | කෘෂිකර්ම ව්‍යාපෘති<br>සංචාරක කර්මාන්තය<br>ඉදි කිරීම්<br>කිරි ගොවිපළ හා අදාළ නිශ්පාදන<br>අධ්‍යාපනය<br>ධීවර කර්මාන්තය<br>නිමි ඇඳුම් කර්මාන්තය | සෞඛ්‍ය සේවා කර්මාන්ත<br>සත්ව පාලනය<br>විසිතුරු මසුන් වගාව<br>මුද්‍රණ කර්මාන්තය | 70 | 256.87 |
| ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය | SMILE III - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය | නියෝජිත - කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශය<br>උපරිම ණය ප්‍රමාණය -<br>(i) සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - රු. මිලියන 5.0<br>(ii) තාක්ෂණ පැවරුම් සහාය යෝජනා ක්‍රමය - රු. මිලියන 2.5<br>උපරිම ණය ප්‍රමාණය -<br>(i) සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - රු. මිලියන 5.0<br>(ii) තාක්ෂණ පැවරුම් සහාය යෝජනා ක්‍රමය - රු. මිලියන 2.5<br>ණය ගැනීමේ පොළී අනුපාතිකය -<br>(i) සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - 4.5%<br>(ii) තාක්ෂණ පැවරුම් සහාය යෝජනා ක්‍රමය - 3%<br>ණය දීමේ පොළී අනුපාතිකය -<br>(i) සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - 9%<br>(ii) තාක්ෂණ පැවරුම් සහාය යෝජනා ක්‍රමය - 5%<br>උපරිම කාලය -<br>(i) සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - අවුරුදු 3 - 10<br>(ii) තාක්ෂණ පැවරුම් සහාය යෝජනා ක්‍රමය - අවුරුදු 7<br>උපරිම සහන කාලය -<br>(i) සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - අවුරුදු 2<br>(ii) තාක්ෂණ පැවරුම් සහාය යෝජනා ක්‍රමය අවුරුදු 2 | තේ<br>කොහු<br>රබර්<br>පාවහන්<br>ප්ලාස්ටික්<br>රෙදි සහ ඇඳුම්<br>ආහාර නිෂ්පාදනය<br>ඖසු පැල ඖෂධ නිෂ්පාදනය<br>තොරතුරු තාක්ෂණය<br>මැණික් හා ස්වර්ණාභරණ<br>අත්යන්ත්‍ර හා අත්කම් නිෂ්පාදන<br>සම්භාණ්ඩ<br>ඇසුරුම්කරණය | පිඟන් භාණ්ඩ<br>කුළු බඩු<br>(අගය එකතුව)<br>දැව භාණ්ඩ | 12 | 30.58 |

| මාතෘකාව | යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | හිමිකම් ලබන අංශය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය | 2013 දෙසැම්බර් දිනට හිඟ ණය මුදලෙහි සමුච්චිතය රු. මිලියන |
|---|---|---|---|---|---|
| රජයේ බදු සහන | පීපල්ස් ඉන්වෙස්ට්මන්ට් පවර් ණය යෝජනා ක්‍රමය (PIP) | නියෝජිත -<br>උපරිම ණය ප්‍රමාණය - රු. මිලියන 50 | පලතුරු, එළවළු, කොකෝවා සහ කුළු බඩු සහ සත්ව පාලනය සහ ධීවර කර්මාන්තය<br>කම්හල්<br>මෝල නවීකරණය, ආයතනය පුළුල් කිරීම ඇතුළු වැවිලි බෝග, කෘෂි බෝග වගා කිරීම | 218 | 950.2 |
| | | ණය ගැනීමේ පොළී අනුපාතිකය - | තාක්ෂණය හා අදාළ ක්‍රියාකාරකම් බාහිර මූලාශ්‍ර වෙත පැවරීම | | |
| | | ණය දීමේ පොළී අනුපාතිකය - 5 භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය + 2% | අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව සහ තෘතීය අධ්‍යාපන ව්‍යවසාය, | | |
| | | උපරිම කාලය - අවුරුදු 10 | හෝටල් ඉදිකිරීම හා/හෝ ඊට අදාළ වෙනත් ව්‍යාපාර | | |
| | | උපරිම සහන කාලය - අවුරුදු 2 | ඉහත සඳහන් කරුණු සඳහා දෙන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීම | | |
| | | | කාන්තා ව්‍යවසායිකාවන් (ව්‍යාපාර ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ණය ලබාදීම උපරිම රු. මිලියන 10) | | |
| | | | සූර්ය තාප බල ශක්තිය ඇතුළු තිරසාර බල ශක්ති ප්‍රභවයන් මත ආයෝජනය | | |
| | | | වෙනත් කෘෂිකර්ම හා කුඩා හා මධ්‍ය පරිමාණ හා අදාළ ව්‍යාපෘති | | |

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ඒකකය සහ සංවර්ධන හා ක්ෂුද්‍රමූල්‍ය දෙපාර්තමේන්තුව යනු අපගේ ප්‍රජාවන් ඉහළට නංවා ලීමේ අපගේ දර්ශනයට අනුකලනයවූ සංරචකයක් වන මහජන බැංකුවේ ප්‍රධාන අංශ දෙකකි. ආර්ථික සවිබල ගැන්වීම මගින් සමාජ අන්තර්කරණය සිදුවෙතැයි යන අපගේ ප්‍රබල විශ්වාසයත් සමග, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයන්හි අප විසින් ක්‍රියාත්මක කරන ලද බිම් මට්ටමේ සිට ඉහළට යොමුවූ ප්‍රවේශය තුළ, ග්‍රාමීය ආර්ථිකයන් රැසකින්ම සැලකියයුතු සාර්ථකත්වයන් පිළිබඳ සිද්ධීන් වාර්තා වී ඇති අතර, ඒවා විසින් දිගු කාලීනව ජාතික සංවර්ධනයට පූර්ණ වශයෙන් විනිවිද යන දායකත්වයක් ලබාදී තිබේ.

උසස් ජීවන තත්ත්වයක් සඳහා සහ ජන ජීවනෝපායයන්හි වර්ධනය පිණිස අපගේ ප්‍රයත්නයන්ගෙන් සහ මහජන බැංකුවෙන් ලබාදෙන ලද ණය පහසුකම්වලින් ප්‍රතිලාභ ලැබූ අංශයන් පිළිබඳව පහත දැක්වෙන වගු වලින් පැහැදිලි වෙයි.

## සංවර්ධනය සහ ක්ෂුද්‍රමූල්‍ය

| යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | වාණිජ අනුපාතිකය | හිමිකම් ලබන අංශය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කරඇති ණය ප්‍රමාණය | 2013 දෙසැම්බර් දිනට හිඟ ණය මුදලෙහි සමුච්චිතය රු. මිලියන |
|---|---|---|---|---|---|
| **1. පොළී සහනාධාරය** | | | | | |
| (REPPIA) පුනරුත්ථාපන වැඩ සටහන සාර්ථකව නිමාකළ සමාජ අනුකලනයවූ පුහුණුකරුවන්ට ජීවන තත්ත්වය නගා සිටුවා ගැනීම පිණිස සහායවන ණය යෝජනා ක්‍රමය | පුද්ගලයින්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය | 8% | පුනරුත්ථාපන වැඩ සටහන සාර්ථකව නිමාකළ සමාජ අනුකලනයවූ පුහුණුකරුවන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම | 579 | 76.18 |
| මහවැලි අරුණ | මහවැලි අධිකාරිය | 9% | කෘෂි පාදක කර්මාන්ත, කෘෂි සේවා - කිසියම් හෝ ආදායම් ජනිත කරවන ක්‍රියාකාරකම් | 450 | 65.79 |
| NCRCS - වගා කටයුතු 2013/14 මහ | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 7,977 | 7,942.00 |
| NCRCS - වගා කටයුතු - 2013 යල | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 5,487 | 227.64 |
| NCRCS - වගා කටයුතු - 2012/13 මහ | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 11,108 | 223.27 |
| NCRCS - වගා කටයුතු - 2012 යල | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 7,254 | 106.41 |
| NCRCS - වගා කටයුතු - 2011/12 මහ | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 15,125 | 124.15 |
| NCRCS - වගා කටයුතු - 2011 යල | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 7,015 | 22.82 |
| උප එකතුව | | | | 54,995 | 8,788.26 |
| **2. ප්‍රතිමූල්‍යකරණය** | | | | | |
| උතුර පිබිදීම - චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 90% | කෘෂිකාර්මික හා ආර්ථික ක්‍රියාකාරකම් | 2,086 | 280.28 |
| නැගෙනහිර පිබිදීම - චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකාර්මික හා ආර්ථික ක්‍රියාකාරකම් | 1,753 | 169.71 |
| වියළි කලාපීය ජීවනෝපාය ආධාරක සහ හවුල්කර වැඩ සටහන ණය යෝජනා ක්‍රමය (භාග්‍යා ණය යෝජනා ක්‍රමය) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකාර්මික හා ආර්ථික ක්‍රියාකාරකම් | 1,062 | 12.96 |
| දිළිඳුකම පිටු දැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල (PAMP II RF) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 1,088 | 77.08 |
| දිළිඳුකම පිටු දැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල (PAMP - RF) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 662 | 19.28 |
| දිළිඳුකම පිටු දැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල (PAMP II - RF) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 1,088 | 91.06 |
| සෞභාග්‍ය (දේපල) ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | ක්ෂුද්‍ර සහ කුඩා මධ්‍යම ව්‍යවසායයන් | 3,225 | 663.94 |
| දසුන ණය යෝජනා ක්‍රමය | නැෂනල් ඩිවෙලොප්මන්ට් බැංකුව | 100% | කෘෂිකර්මය සහ ක්ෂුද්‍රමූල්‍ය ක්‍රියාකාරකම් | 82 | 5.58 |
| ස්වයං රැකියා සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සුදුසුකම් ලැබ පුහුණුවූ තරුණ පිරිසට ව්‍යවසායකත්ව ව්‍යාපෘතීන් ආරම්භ කිරීම | 299 | 25.14 |
| පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩ සටහන (PTCRRMP) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | සුනාමියෙන් බරපතල ලෙස විපතට පත්වූ ප්‍රජාවන්ට ආදායම්ලාභී ක්‍රියාකාරකම් | 825 | 29.25 |
| SPEnDP ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්මය සහ ක්ෂුද්‍රමූල්‍ය ක්‍රියාකාරකම් | 238 | 22.03 |
| කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය | පොල් වගා දෙපාර්තමේන්තුව | 100% | පොල් වගාව හා සංවර්ධනය | 1,156 | 45.49 |

| යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | වාණිජ අනුපාතිකය | හිමිකම් ලබන අංශය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කරඇති ණය ප්‍රමාණය | 2013 දෙසැම්බර් දිනට හිඟ ණය මුදලෙහි සමුච්චිතය රු. මිලියන |
|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 87% | තේ වගාව | 178 | 22.18 |
| වනිතා නවෝදය | යුනිෆෙම් (UNIFEM) | 100% | ඕනෑම අංශයක් සඳහා | 125 | 0.06 |
| කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය | පොල් වගා දෙපාර්තමේන්තුව | 100% | පොල් වගාව හා සංවර්ධනය | 125 | 85.12 |
| උප එකතුව | | | | 13,992 | 1,549.70 |
| | | | | | |
| **3. වෙනත්** | නැත | | | | |
| සම්පූර්ණ එකතුව | | | | 68,987 | 10,338.00 |

## සමාජ බලපෑම

අපගේ පැවැත්මේදී උත්ප්‍රේරකය වන්නේ මහජනතාවයි. අප භ්‍රමනය වන අක්ෂය වන්නේද, අපගේ ව්‍යවසායයන් හි හදවත වන්නේද ඔවුන්ය. ඒ නිසා මහජන බැංකුව වන අපට ඇති සෑම දේම මහජනයාය. අපගේ පැවැත්මේ හේතුව ද ඔවුන්මය. සමාජ තිරසාරභාවය පිළිබඳ පර්යාලෝකය අනුව, අපගේ කාර්යයන් හා මහජනයා කෙරෙහි සිදුවන ඒවායේ බලපෑම්, ධනාත්මක විය යුතු බවට අප තුළ පවත්නා හැඟීම, එහෙයින්, අමුතු දෙයක් නොවන්නේය. ඒ අනුව, අපගේ සමාජමය මැදිහත්වීම, මානව හිතවාදය පමණක්ම නිසා සිදු කෙරෙන්නක් නොව, එකී මහජනතාවගේ හැකියා ධාරිතාවන් වර්ධනයට හා අනාගතය දෙස විශ්වාසයෙන් යුතුව බැලීමට ඔවුන් සවිබල ගැන්වීම මත සිදු කරනු ලබන්නක් වෙයි.

මහජන බැංකුවේ සමාජ සංවර්ධන සූත්‍රයෙහි, අපගේ කණ්ඩායම අතිශය වැදගත් සාධකයක් වන්නේ, ඔවුන් සවිබල ගැන්වීම තුළින්, ප්‍රජාවන් සමග ධනාත්මක ලෙස අන්තර් සබඳතා පැවැත්වීමට හා, වඩාත් පුළුල් පරිමාණයකින් ගත් කල්හි, ඔවුන් ගේ ආර්ථිකයන් ගොඩනැංවීමට හේතුවන බව අපගේ විශ්වාසය නිසාය. අපගේ පාර්ශ්වයන්ට පාදක වන, හා එම සමාජමය පරිමාණයන් තුළට සමාජ සවිඥානය අනුකලනය කෙරෙන ආරම්භනයන් හා ව්‍යාපෘතීන් දිරිගැන්වීමේ ක්‍රියාවලියක්, අප විසින් ආරම්භ කරනු ලැබ ඇත. මෙයින් අදහස් වනුයේ, ප්‍රජා සවිබල ගැන්වීම සහ ජාතික සංවර්ධනය යන ද්විත්වය අරමුණුකර, අපගේ පාර්ශ්වකරුවන් සඳහා තිරසාර පදනමක් ගොඩනැගීමේ සමාජ වගකීම පිළිබඳ අපගේ කැපවීම, දෙආකාරයීය ක්‍රියාවලියක් බවයි.

### අපගේ දැක්ම ඉදිරියට රැගෙන යන කණ්ඩායම

අපගේ දැක්මට හා මෙහෙවරට මැනැවින් සමානුපාතීව, මුළු හදවතින්ම සහ කිසිදු සැකයකින් තොරව, තිරසාරභාවය පිළිබඳ පරිචයන් අපගේ කණ්ඩායම වැළඳගෙන සිටිති. මූල්‍ය කාර්ය සාධනයෙන් පමණක් නොව, අප අනුයුක්තව සිටින ප්‍රජාවන්ට, අපගේ සමාජ ව්‍යාපෘතීන් තුළින් ස්පෘශ්‍ය මෙන්ම අස්පෘශ්‍ය ප්‍රතිලාභද උදාවනු දැකීම තුළින්, අප ලබා ඇති සාර්ථකත්වයද, ඒ බව මනාව පිළිබිඹු කරයි. බඳවා ගැනීමේද, උසස්කිරීම් ලබා දීමේද, අනුප්‍රාප්තිකරණයේදීද හැකියා-කුසලතා පදනමින් මිස, අන් කිසිදු වෙනස්කම්පෑමේ ගතිකත්වයකින් තොරව, කටයුතු කිරීමේ විනිවිද පෙනෙන හා විවෘත පිළිවෙතක් ක්‍රියාත්මක කිරීමත් හා සමගම, අපගේ අවධානය දැන් යොමුව ඇත්තේ විශිෂ්ටම පුද්ගලයින් තෝරාගෙන, වර්ධනය කර, රඳවාගැනීම කෙරෙහිය. යමක යොදය වැනි හරයෙනුත් හරවත්ම පිරිසත් අපගේ ආලිංගයට කැඳවා ගැනීමේ ප්‍රතිපත්තිය අප අනුගමනය කරනුයේ, අපගේ සැලසුම්වලට හා දැක්මට ජවය හා උද්‍යෝගය එක්කළ හැකිවන්නේ එවැන්නන්ට පමණක් නිසාය. ගෝලීය විශිෂ්ට පරිචයන්ගෙන් හා ප්‍රමිතීන්ගෙන් සැදුම් ලත් වටාපිටාවක් තුළ කටයුතු කිරීම සඳහා පෙළඹවීම් සහිත, ඵලදායක මෙන්ම, කාර්යක්ෂම කාර්ය පරිසරයක සේවය කළ හැකි, සවිබලලාභී කණ්ඩායමක් පවත්වා ගැනීමට, එමගින් අප දිරිමත්ව ඇත.

### අපගේ මානව සම්පත් පිළිවෙත් සහ ප්‍රතිපත්ති

- අපි සමාන අවස්ථා සහිත සේවා දායකයෙකු වෙමු.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රතිපත්තිවලටද, ශ්‍රී ලංකාවේ කම්කරු රෙගුලාසිවලටද, වෙනත් අදාළ ආයතනවලට හා කම්කරු පරිචයන්ටද අපි අවනත වෙමු.
- වෙනස්කම් පෑමට හෝ ළමා ශ්‍රමිකත්වයට අපි දායක නොවන්නෙමු.
- කුසලතා තන්ත්‍රය සහ සමානත්වය අපි ප්‍රවර්ධනය කරමු.
- අල්ලස හා දූෂණය පිළිකුල් කරමින් අපි ඒවායින් වැළකෙන්නෙමු.
- අපගේ තෙවන පාර්ශ්වීය කොන්ත්‍රාත්කරුවන් අපගේ ආචාර විධිවලට අනුගත වියයුතු බවට හා කම්කරු රෙගුලාසි මෙන්ම, යහපත් සේවක පරිචයන් අනුගමනය කළ යුතු බවටද අපි බලකර සිටිමු.

## කම්කරු පරිචයන් සහ වැදගත් කාර්ය භාරයන්

මහජන බැංකුව තුළ 10,863ක් වන සේවා බල ඇනියක් සිටින අතර, එයින් 7,409ක් නිත්‍ය සේවකයෝද, ඉතිරි 3,454 දෙනා බාහිර ආයතනවලින් ලබාගත් සේවකයන් මෙන්ම විශ්ව විද්‍යාලවලට තේරී සිටින්නන් වෙති. පෙර වසරේදීට වඩා මෙම වසරේදී කණ්ඩායම් සාමාජිකයින් අඩුවන්නට හේතු වූයේ, බැංකුව අල්ප ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට නැඹුරුවීමයි. සේවකයින් අතර ව්‍යවස්ථාදායි විශ්‍රාම ගැනීම් සමගම, තාක්ෂණික අනුකලනයවීම්වලටද අමතරව, වඩා ආකර්ශණීය ඵලදායකත්ව හා කාර්යක්ෂම ක්‍රියාවලීන්ට යොමුවීම්ද හේතුවෙන් මහා පරිමාණයේ කාර්ය මණ්ඩලයක අවශ්‍යතාව ගිලිහී ගොස්, සාමාජිකයින් අඩු සංඛ්‍යාවක් ප්‍රමාණවත් විය.

කවර ආකාරයක හෝ වෙනස්කම්පෑම් සහිත කම්කරු පරිචයන් ප්‍රතික්ෂේප කිරීමේ කැපවීම නිසා, අපගේ මූලික වැටුප හා වේතනද, ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශ්වය අතර පවත්නා 1:1 අනුපාතයෙන්ම පවත්වා ගනු ලැබේ.

අපගේ එක් එක් සාමාජිකයා රට තුළ කවර ප්‍රදේශයකින් පැමිණියද, ඔහුට හා ඇයට එක හා සමාන අවස්ථා පිරිනැමීමට අප දරා ඇති කැපවීම පහත දැක්වෙන වගුවෙන් පැහැදිළි වේ:

### 2013 දෙසැම්බර් 31 දිනට සේවකයින්ගේ සම්පූර්ණ සංඛ්‍යාව

| | වර්තමාන සේවක පිරිස |
|---|---|
| 2013 දෙසැම්බර් 31 දිනට නිත්‍ය සේවකයින්ගේ සම්පූර්ණ සංඛ්‍යාව | 7,274 |
| **කොන්ත්‍රාත් පදනමේ සේවකයින්** | |
| **ආයතන සහ විධායක කළමනාකාරිත්වය** | |
| ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී | 1 |
| ආයතනික කළමනාකාරිත්වය | 4 |
| තොරතුරු තාක්ෂණ - වැඩ බලන ප්‍රධානි | 1 |
| | 6 |
| **සෙසු කොන්ත්‍රාත් පදනමේ සේවකයින්** | |
| වෙළෙඳපොළ බුද්ධි/කළමනාකරණ තොරතුරු පද්ධති සහකාර | 1 |
| සහකාර ඉංජිනේරු | 4 |
| අධිකරණ ලිපිකරු | 7 |
| මාධ්‍ය සහකාර | 1 |
| යතුරු ලේඛක | 50 |
| බහුකාර්ය සහකාර | 37 |
| විදුලි කාර්මික | 9 |
| ජල නල කාර්මික | 1 |
| රියැදුරන් | 10 |
| තාක්ෂණික සහකාර | 3 |
| **කොන්ත්‍රාත් පදනමේ සේවකයින් (ආයතනික, විධායක සහ වෙනත්)** | 129 |
| කළමනාකරණ අභ්‍යාසලාභීන් | 3 |
| බැංකු සහකාර පුහුණුවන්නන් (කොන්ත්‍රාත්) | 0 |
| ගනුදෙනුකාර සේවා සහායක (කොන්ත්‍රාත්) | 3 |
| කොන්ත්‍රාත් සේවක සම්පූර්ණ සංඛ්‍යාව | 135 |
| **2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ නිත්‍ය සේවක සම්පූර්ණ සංඛ්‍යාව (බාහිර ආයතනවලින් ලබාගත් සේවකයන් මෙන්ම විශ්ව විද්‍යාලයට තේරී සිටින අයද හැර)** | 7,409 |
| විශ්ව විද්‍යාලයට තේරී සිටින්නන් | 1,383 |
| බාහිර ආයතනවලින් ලබාගත් සේවකයන් | 2,071 |
| 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සම්පූර්ණ සේවක සංඛ්‍යාව | 10,863 |

**පිරිස් ශක්තිය, නිත්‍ය සේවකයින්ගේ ස්ත්‍රී පුරුෂ භාව විශ්ලේෂණය**

| 2013 දෙසැම්බර් 31 දිනට | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ආයතනික කළමනාකාරිත්වය (ස්ථිර හා කොන්ත්‍රාත්) | 13 | 5 | 18 |
| විධායක කළමනාකාරිත්වය (ස්ථිර හා කොන්ත්‍රාත්) | 14 | 10 | 24 |
| නිලධාරීන් (3-III - 1 ශ්‍රේණිය) | 1,593 | 1,854 | 3,447 |
| මාණ්ඩලික සහකාර ශ්‍රේණිය | 1,043 | 1,856 | 2,899 |
| වෙනත් කාණ්ඩ | 613 | 279 | 892 |
| කළමනාකරණ අභ්‍යාසලාභීන් | 1 | 2 | 3 |
| ගනුදෙනුකාර සේවා සහායක | – | 3 | 3 |
| සෙසු කොන්ත්‍රාත් පදනමේ සේවකයින් | 81 | 42 | 123 |
| **එකතුව** | 3,358 | 4,051 | 7,409 |

**පිරිස් ශක්තිය, නිත්‍ය සේවකයින්ගේ ස්ත්‍රී-පුරුෂ භාව විශ්ලේෂණය (3-I සහ ඉහළට)**

| 2013 දෙසැම්බර් 31 දිනට | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ආයතනික කළමනාකාරිත්වය (ස්ථිර හා කොන්ත්‍රාත්) | 13 | 5 | 18 |
| විධායක කළමනාකාරිත්වය (ස්ථිර හා කොන්ත්‍රාත්) | 14 | 10 | 24 |
| ප්‍රධාන කළමනාකරුවන් (1 ශ්‍රේණිය) | 39 | 21 | 60 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් (2 ශ්‍රේණිය) | 75 | 54 | 129 |
| කළමනාකරුවන් (3-I ශ්‍රේණිය) | 253 | 182 | 435 |
| **එකතුව** | 394 | 272 | 666 |

## බඳවාගැනීම්

බැංකුව තුළ අප දැඩි සේ විශ්වාස කරනුයේ විවිධත්වය තුළ ඒකීයත්වය රැඳා පවත්නා බවය. මෙය බැංකුවට බඳවාගැනීම් අවස්ථාවේදීම ආරම්භ වෙයි. අපගේ ප්‍රතිපත්ති හැකියා කුසලතා මත පදනමවී ඇති නිසාත්, අප ව්‍යාපාරයට විශිෂ්ටයින්ම තෝරා ගන්නා නිසාත්, බැංකුව තුළ පවත්නා කණ්ඩායම් සංස්කෘතිය උසස් ප්‍රතිඵල ලැබිය හැකි, ඉවසිලිවන්ත, එක්සත්වූ සහ ව්‍යවසායකත්වය සපිරි එකකි. බහුසංස්කෘතිකමය, බහුපරිමාණමය කණ්ඩායමක් සැලකිල්ලෙන් යුතුව තෝරාගනු ලබන අතර, සැලසුම් කළ මානව සම්පත් ප්‍රතිපත්ති පදනම්වූ එම තෝරා ගැනීම තුළින්, පුද්ගලයින්ගේ උපරිම හැකියාවන් ඔවුන්ගේ උපරිමයටත් ඔබ්බෙන් ප්‍රදර්ශනය කිරීමටත් අවස්ථාවන් උදාවේ. එහෙයින්, ස්වකීය පෞද්ගලික වෘත්තීයමය අපේක්ෂාවන් සපුරාගන්නා අතරම, අවස්ථාවන් සඳහා වෙහෙසෙන, අභියෝග මැඩලන්නට සූදානම්, දැක්මක් කරා ගමනේ යෙදෙන, අධ්‍යාත්මික වශයෙන් එක් සිත් සතන් වලින් හෙබි කණ්ඩායමක් පෙරමුණට ගෙනෙනු ලැබේ.

අපගේ තෝරාගැනීම් ක්‍රියාවලිය රජයේ මාර්ගෝපදේශවලට අනුකූලවන අතර, බෙහෙවින් විනිවිද පෙනෙන අයුරින් පුරප්පාඩු සඳහා පුවත්පත්හි දැන්වීම් පළ කරනු ලැබේ. සමස්ත තෝරාගැනීමම එවන් විනිවිදභාවයක් තුළ පවතී. උද්ගතවන ප්‍රවණතාවක්ට හා අවස්ථාවන්ට ගැලපෙන සේ, උපාය මාර්ගික සැලැස්ම සහ සෙසු ව්‍යාපාරික අවශ්‍යතාවන් පදනම් කරගනිමින් ආයතනයට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර කුසලතාවන් හඳුනාගැනීම පිණිස, බැංකුව විසින් අභ්‍යන්තර විශ්ලේෂණ පද්ධතියක් වර්ධනය කරනු ලැබ තිබේ. වාර්ෂික අයවැය පද්ධතිය ඊට ආධාරකයක්වන අතර, දැඩි තෝරාගැනීම් ක්‍රමය ඔස්සේ අයැදුම්කරුවන්ගේ විවිධත්වයන් හා බහුවිධ හැකියාවන් හඳුනාගත හැකි මෙන්ම අනාවරණය කරගත හැකි වන්නාවූද, තේරීම් මඩුල්ලක් විසින් මේ සියල්ල සිදු කෙරේ.

තෝරාගනු ලැබීමෙන් පසු, සියලුම නව බඳවාගනු ලබන්නන් හඳුන්වා දීමේ වැඩ සටහන්වලට සහභාගී කරවන අතර, එමගින් ඔවුනොවුන්ගේ ප්‍රවේශ මට්ටම අනුව, සේවා පරිසරයට සියුම් ලෙස ප්‍රවේශවීම තහවුරු කරනු ලැබේ.

උපාය මාර්ග සැලසුම අනුව උපාය මාර්ගික ව්‍යාප්තියක් අපේක්ෂා කෙරෙන හෙයින් මේ සඳහා ප්‍රමිතිගත මුල් පෙළේ කණ්ඩායම් සාමාජිකයින් යොදා ගැනීමේ අවශ්‍යතාව මත, නව ගනුදෙනුකාර සේවා සහායකයින් දහසක් බඳවා ගැනීමේ ක්‍රියාවලියක්ද ආරම්භවී ඇත. ඊට අමතරව, උතුරු හා නැගෙනහිර භූගෝලීය

ප්‍රදේශයන්හි ශාඛාවන්හි කළමනාකරණ හා සන්නිවේදන උපාය මාර්ග වැඩිදියුණු කරගැනීම උදෙසා දෙමළ භාෂා කුසලතා සහිත කළමනාකාර අභ්‍යාසලාභීන් තිස් දෙනෙකුද 2014 වසරේදී බඳවා ගැනීමට නියමිතය.

හැකියා කුසලතා පදනම සහ විනිවිද භාවයෙන් යුත් තෝරාගැනීම් ක්‍රමයම උපයෝගී කරගනිමින්, සේවක උසස් කිරීම් ක්‍රියාවලියද සිදුකෙරෙනුයේ විශිෂ්ඨතම පුද්ගලයින්ට වගකීම් භාරදීමේ අපේක්ෂාවෙනි. අදාළ වසරේදී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ රහස්‍ය ලේකම් යන තනතුරු සඳහාවූ පුරප්පාඩු සාර්ථක ලෙස සපුරා ගනු ලැබුවේ, දක්ෂතාවලට මුල්තැන දීමේදී හා විශිෂ්ටයින් අතරිනුත් විශිෂ්ටයින් තෝරාගැනීමේදී විනිවිදභාවය අකුරටම අනුගමනය කරනු ලබමිනි.

## ප්‍රතිලාභ හා පාරිතෝෂික දීමනා

අපගේ සියලු උපාය මාර්ගයන්හි වැදගත් ධර්මතාවක් නම්, මූල්‍ය හා මූල්‍ය නොවන සාධකයන්හි එකතුවක් සාධාරණ මෙන්ම ප්‍රමාණවත් වැටුප් තලයක් හා බද්ධවූ කල්හි, ඕනෑම සේවා පිරිස් බල ඇනියක් තෘප්තිමත් භාවයට පත්වන බව සිත්හි තබා ගැනීමය. මහජන බැංකුව රාජ්‍ය අංශයේ පැවරුම් නියෝගයන්ට අවනත හෙයින්, අපගේ කණ්ඩායමේ සාමාජිකයින්ට සැලකිය යුතු මට්ටමේ ප්‍රතිලාභ හා පාරිතෝෂිකයන් අයත්වන අතර, රාජ්‍ය සේවයේ අත්දැකිය හැකි පුහුණුව හා විශිෂ්ඨ පරිචයන් භුක්ති විඳීමේ අමතර වරප්‍රසාදයද ඔවුන්ට හිමිවේ.

අප බැංකුව අන් සියලු දෙනාටම ප්‍රයෝජනවත් වන්නාසේ, අපගේ කණ්ඩායමටද අප සමග කටයුතු කිරීම ප්‍රයෝජනවත් හා ප්‍රතිලාභදායක විය යුතුය. අප එම කණ්ඩායමට පිරිනමන ප්‍රතිලාභ අඛණ්ඩව සිදු කෙරෙන අතර, ඒවා අතරින් ප්‍රධාන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ:

- වාර්ෂික ප්‍රසාද දීමනා හා කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය
- ආයතනික කළමනාකාරිත්වය වෙනුවෙන් වාහන පහසුකම් හා විධායක කළමනාකාරිත්වය වෙනුවෙන් ප්‍රවාහන දීමනා
- කාර්ය මණ්ඩල නිල නිවාස හා නිවාඩු නිකේතන
- පෞද්ගලික අර්ථසාධක අරමුදල
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
- පරිපූර්ණ මරණ පාරිතෝෂික යෝජනා ක්‍රමය
- පුද්ගලික හදිසි අනතුරු රක්ෂණ ආවරණය
- පරිපූර්ණ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම (සහන පොළී අනුපාතික සහිතව)
- වෘත්තීය ආයතනවල සාමාජිකත්ව දායකත්ව/ ප්‍රසාද මුදල් ගෙවීම්

## විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම ගැනීමේදී, විශ්‍රාම වැටුප් ගෙවීමක් පිළිබඳව දෙනු ලබන තහවුරුව, රාජ්‍ය අංශයෙහි සේවය කිරීමේ එක් සුවිශේෂී වරප්‍රසාදයක් වෙයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය තුළ පුළුල් විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ දැනට සැලසුමක් නොමැති හෙයින්, කෙනෙකු විශ්‍රාම ගැනීමේදී රාජ්‍ය අංශය විසින් විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබීම අගනා ආශීර්වාදයක් ලෙස සැලකේ. මෙය සැලකිය යුතු වරප්‍රසාදයක් ලෙස ගැණෙනුයේ විශේෂයෙන්ම බැංකුවට බඳවාගැනීමේදී හා රඳවාගැනීමේදී, විශිෂ්ටයින්ට සේවය කරන වර්ෂවලට පසුවද ස්ථිර වැටුප් ප්‍රතිලාභ සහතික කරමින් බැංකුව ඔවුන් ආකර්ෂණය කරගැනීම අඛණ්ඩව සිදුකර ඇති හෙයිනි.

## නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම

### පූර්ව 1996 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

1996 ජනවාරි 1 වැනි දිනට පෙර බැංකුවේ සේවයට බැඳුණු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයෝ මෙම නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබති. මේ හා අදාළ දායක මුදල් වෙනම පාලනය වන අරමුදලකට යොමු කෙරේ. මෙම සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය ප්‍රතිලාභ ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කරමින් ව්‍යුත්පන්න කෙරේ. අදාළ මූල්‍ය වර්ෂයේ දී ආයුගණක ලාභ හෝ අලාභ ආදායම් හෝ වියදම් ලෙස පූර්ණ ලෙස හඳුනාගනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ ගෙවීමේ වර්තමාන වටිනාකමින්, මෙතෙක් හඳුනා නොගත් අතීත සේවා පිරිවැයෙන්, ගෙවීම් සෘජුවම පියවීමට භාවිත කළ යුතු සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මෙතෙක් හඳුනා නොගත් ආයු ගණක අලාභ අඩු කිරීමෙන් ලැබෙන අගයන්ගෙන්, නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ බැරකම් සකස් වන්නේය. මෙතෙක් හඳුනා නොගත් කවර හෝ ආයුගණක අලාභ හෝ අතීත සේවා පිරිවැය හා සැලසුමෙන්, ආපසු ගෙවීම් ආකාරයෙන් ලැබෙන යම් ආර්ථික ප්‍රතිලාභවල වර්තමාන අගය හෝ සැලසුමට අනාගත දායකවීම්වල අඩුවීම්වල වර්තමාන අගයේ මුළු එකතුවට, කවර හෝ වත්කමක අගය සීමාවේ.

ඇමෙරිකානු ආයුගණක හා උපදේශක ආයුගණක අධ්‍යයන ආයතනයේ සාමාජික පියල් එස් ගුණතිලක මහතා F.S.A. (එ.ජ.) විසින් 2013 ජනවාරි 1 වැනි දින අවසන් වරට ආයුගණක තක්සේරුව සිදු කරන ලදී.

මෙම තක්සේරුවේදී භාවිතා කරන ලද 2013 ජනවාරි 1 වැනි දිනට ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| පොලී/වට්ටම් අනුපාතය | වර්ෂයකට 11% |
| ජීවන වියදම් දීමනාවේ වැඩිවීම | වර්ෂයකට 5% |
| සියළු ශ්‍රේණි සඳහා මූලික වැටුප වැඩිවීම | වර්ෂයකට 7% |

පහත සඳහන් කොන්දේසි මත. විශ්‍රාම ලබන්නන්ට විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ:

කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ලබනුයේ, වසර 10ක සේවා කාලයකට පසු හා අවුරුදු 55ක් වන විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමේදී ය. විශ්‍රාම වැටුපේ ප්‍රමාණය, පහත දැක්වෙන පරිදි, සේවා කාලයේ විචල්‍යතාවන් මත රඳා පවතී:

| | සේවා කාලය | විශ්‍රාම වැටුප් ප්‍රමාණය |
|---|---|---|
| i. | වසර 10 - 20 | අවසන් වරට ලැබූ වැටුපෙන් 80% |
| ii. | වසර 21 - 29 | අවසන් වරට ලැබූ වැටුපෙන් 80% අමතරව වසර 20 ඉක්මවන සෑම වසරක් වෙනුවෙන්ම 1% එකතු කරනු ලැබේ. |
| iii. | වසර 30 හා ඊට වැඩි | අවසන් වරට ලැබූ වැටුපෙන් 90% |

මෙයට අමතරව එකවර ගෙවීමක් ලෙස පරිවර්තිත විශ්‍රාම වැටුප් ලෙස, අවසන්වරට ලැබූ මාසික දළ වැටුපෙන් 90% බැගින් 24 ගුණයක් නැවත අයකර නොගන්නා ගෙවීමක් ලෙස ලබාදෙනු ලබයි.

විශ්‍රාම වැටුප් අරමුදල් එදිනෙදා බැංකුකරණ සේවාවන්ගෙන් වෙන්කොට පවත්වා ගැනෙන අතර, ස්වාධීන බාහිර විගණකයන් විසින් සිදු කරන වාර්ෂික විගණනයකට යටත්වේ.

ප්‍රකාශන හා විගණන වාර්තා භාරකාර මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ. ප්‍රශස්ත මට්ටම් වලින් අරමුදල් සැපයීම සහතික කිරීමට බැංකුව බැඳී සිටින හෙයින්, බැංකුවේ අනාවරණයන් සමාලෝචනය කිරීම සඳහාද මෙම ලේඛන ඉදිරිපත් කෙරේ. ප්‍රතිලාභ ලබන්නාගේ අභාවය තෙක් මාසිකව විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

### පාරිතෝෂිකය

1996 ජනවාරි 1 වැනි දින, හෝ ඉන් පසුව, බැංකුවේ සේවයට බැඳුණු සේවකයෝ, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, පාරිතෝෂිකයන් ලැබීමට හිමිකම් ලබති. එහෙත්, පාරිතෝෂිකය ලැබීමට ඇති අයිතිය අත්හරිමින්, යෝජිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළුවීම වුවද තෝරාගැනීමට ඔවුන්ට අවස්ථාව තිබේ.

සේවය අවසන් කරනු ලැබූ සේවකයන්ගෙන්, වසර පහකට වැඩි කාලයක් සේවයකර ඇති අය, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ, සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසාන මාසයට අදාළ වන දළ වැටුපෙන් අඩක් ලෙස අඛණ්ඩ සේවා කාලයේ සෑම වර්ෂයක්ම වෙනුවෙන් සේවා අවසාන පාරිතෝෂිකයකට, හිමිකම් ලබති.

එබඳු පාරිතෝෂික ගෙවීම් වගකීම් වෙනුවෙන් බැංකුව මාසිකව මුදලක් වෙන් කරන අතර, 2007 දෙසැම්බර් 31 වැනි දින දක්වා බැංකුවේ ශේෂ පත්‍රවල එය පිළිබිඹුවේ. ඉන් අනතුරුව පාරිතෝෂික සූත්‍රය මත මුදල් වෙන් කිරීම සිදුකරන ලදී. ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්හි නියම කර ඇති පරිදි, ආයුගණක ඇගයීම පදනම් කර ගනිමින්, පාරිතෝෂික වගකීම් සඳහා බැංකුව ප්‍රතිපාදන වෙන්කර ඇත.

2008 දී බැංකුව පාරිතෝෂික වගකීම පිළිබඳව ආයුගණක තක්සේරුවක් ලබාගත් අතර එය පෙර පැවති පාරිතෝෂික සූත්‍රයට වඩා අඩු අගයක් දැක්වීය. බැංකුවේ අඩු සේවක පිරිවැටුම සැලකූ කල, අප වඩාත්ම විචක්ෂණ පාරිතෝෂික ක්‍රියා පටිපාටිය දිගටම පවත්වාගැනීමට ඉඩ ඇත.

මහජන බැංකුවේ පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ පාරිතෝෂික ගෙවයි. ඒ අනුව, මෙම සමාගම් අතරින් කවරක හෝ වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා වුවද ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙම වගකීම් සඳහා බාහිර අරමුදල් සැපයීමක් සිදු නොවේ.

### නිශ්චිත දායකත්ව සැලසුම්

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක්ද පරිපාලනය කරයි. මෙම සැලසුමට ලැබෙන දායකත්වය, සේවකයන් විසින් බැංකුවට ලබාදෙන සේවාවන්ට අනුව සිදු කෙරේ. මෙම දායක මුදල් 'පුද්ගල වියදම්' යටතේ වියදම් ලෙස වාර්තා කෙරේ. නොගෙවූ දායක මුදල් වගකීම් ලෙස සැලකෙන අතර, ඒවාද ගිණුම්ගත කෙරේ.

**පශ්චාත් 1996 - විශ්‍රාම වැටුප් සැලැස්ම**

1996 ජනවාරි 1 වැනි දිනෙන් පසු අපගේ සේවයට බැඳුණු ස්ථිර සේවකයෝ, මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් තුළින් ප්‍රතිලාභ ලැබීමට නියමිතව සිටිති. මෙම නව යෝජනා ක්‍රමයේ ආරම්භයක් ලෙස, බැංකුවේ පාරිතෝෂික අරමුදලින් රු. මිලියන 198ක්ද, තවත්, අතිරේක රු. මිලියන 854ක්ද බැංකුව අරමුදලට එක්කර ඇති අතර, 2013 දෙසැම්බර් 31 වැනි දිනට මෙම අරමුදලේ රු. මිලියන 1,356ක සම්පූර්ණ ප්‍රතිපාදනයක් පැවතිණි. මෙම මුදලට පොළී ගෙවීමක් වශයෙන්, 2013 වසර සඳහා රු. මිලියන 150ක ප්‍රතිපාදනයක් බැංකුව වෙන් කර ඇත. මෙම අරමුදල කෙරෙහි පවතින උනන්දුව වැඩිවන අතර, සේවකයින් 4,366 දෙනෙක් ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබා සිටිති.

**වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැලැස්ම (1996ට පෙර)**

මෙම අරමුදලේ සුවිශේෂතාව නම්, බැංකුවේ සාමාජික සේවකයින්ගේ දායකත්වයෙන් එය සකස්වීමයි. ජීවත්වන වැන්දඹු කාන්තාවන්/වැන්දඹු පුරුෂයින් සහ අනත් දරුවන් සඳහා විශ්‍රාමික ගෙවීම් මෙම අරමුදලෙන් ගෙවනු ලබයි.

සුදුසුකම්ලත් ආයුගණකවරයෙකුගේ උපදෙස් මත පදනම්ව බැංකුව අනාගත බැඳීම් වෙනුවෙන් වෙනම අරමුදලක් නඩත්තු කරයි.

පහත සඳහන් යෝජනා ක්‍රම වලට බැංකුව දායකවේ:

**සේවක අර්ථසාධක අරමුදල**

බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලට (අතිකාල දීමනා හැර) සේවකයාගේ මාසික දළ වැටුප අනුව, බැංකුව විසින් 12% ක්ද, සේවකයා විසින් 8% ක් ද වශයෙන් දායකත්වය සපයනු ලැබේ. මෙම අරමුදල සේවක අරමුදල් පනත යටතේ අනුමත අතර, එය අභ්‍යන්තර ලෙස පවත්වාගනු ලැබේ.

**සේවක භාරකාර අරමුදල**

සේවක භාරකාර අරමුදලට, අතිකාල දීමනා හැර, සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3%ක දායකත්වයක් බැංකුව විසින් සපයනු ලබයි. මෙය සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙනයනු ලබයි.

**පශ්චාත් සේවා නියුක්ති වෛද්‍ය ප්‍රතිලාභ**

මහා පරිමාණයේ වෛද්‍ය සේවා වියදම් දරා ගැනීමට නොහැකි සේවකයන් වෙනුවෙන් බැංකුව වෙනම වෛද්‍ය අරමුදලක් පවත්වා ගනී. බැංකුව විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රම පදනම්ව, හා අවශ්‍යතාව පැනනගින පරිදි, බැංකුව පශ්චාත් සේවා නියුක්ති වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම සිදු කරයි. අසාමාන්‍ය ලෙස විශාල වෛද්‍ය වියදම් වෙනුවෙන් වෙනම වෛද්‍ය අරමුදලක් අනාගතයේදී පවත්වා ගැනේ. මෙම අරමුදල් අවශ්‍ය අවස්ථාවල කළමනාකාරිත්වයෙහි අභිමතය පරිදි නිකුත් කරනු ලැබේ.

**සාමූහික ගිවිසුම්**

බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි හා වෘත්තීය සමිති ප්‍රධානීන් විසින් අත්සන් කරන ලද, එකඟතා පාදක අවධානයන් හා මෙහෙයවුම් ගුණාංග අන්තර්ගත අන්‍යෝන්‍ය අවබෝධය තහවුරු කෙරෙන ප්‍රබල වෘත්තීය සමිති ක්‍රියා පිළිවෙළක් බැංකුව අනුගමනය කරයි. සාමූහික සම්මුතීන්ට එළැඹීමේ ක්‍රියාවලින් සඳහා කණ්ඩායම් සාමාජිකයින් දිරිමත් කරනු ලබන අතර, එමගින්, බැංකුව හා සේවකයින් අතර පොදු ඉලක්ක හා අපේක්ෂා පිළිබඳ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභීය සබඳතා ගොඩනගා ගැනීමට බැංකුවට හැකි වෙයි. අපේක්ෂිත මෙහෙයවුම් වෙනස්වීම් හා අදාළව, සාමූහික ගිවිසුම යටතේ අවම දැනුම්දීමේ කාල පරිච්ඡේදයක් නියමව නැත. සියලුම වෙනස්කම් සහිත කළමනාකාර ක්‍රියාවලින් ක්‍රියාත්මක වනුයේ සේවක සමිති හා සාකච්ඡා කිරීමත් සමගම වීම, කාර්මික සහයෝගය පවත්වා ගැනීමට සහාය වනවා පමණක් නොව, බැංකුවේ විනිවිදභාවයටද දායකත්වය සපයයි.

**පුහුණු ව හා සංවර්ධනය**

අප තුළ උසස් පරමාර්ථ සහිත ඉලක්කයන් තිබුණද, ඒවා සපුරාගත නොහැකිය. කෙසේ වුවද, මෙම ඉලක්කයන් සපුරා ගැනීමේ වැදගත්ම සාධකය වනුයේ, නිරන්තරයෙන්ම විකසනය වන පරිසරයක් තුළ, අපගේ කණ්ඩායම නිවැරදි මෙවලම් වලින්ද, කුසලතා වලින් හා දැනුමෙන් ද බල ගැන්වීම යි. අපගේ මෙහෙයුම් සහිත පරිසරය, බැංකුවෙන් හා එහි සමීපම පරිසරයෙන් පමණක් සමන්විත නොවන බවත්, ඊට අමතරව ගෝලීය වටා පිටාවක්ද පවතින බවත් අපි දැන සිටිමු. එම ගෝලීය සන්දර්භයන්ට ගැලපෙන සේ හා එහි විශිෂ්ඨයන් බවට පත්වනසේ අපගේ කණ්ඩායම සූදානම් කළ යුතුවීම, එහෙයින්, ඉතා වැදගත්වන අතර, අපගේ පුහුණු හා සංවර්ධන න්‍යාය පත්‍රයේ මූලධර්මයන්ද එය ම වන්නේය.

මේ නිසා, බැංකුව සඳහා සක්‍රීය පුහුණු හා සංවර්ධන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරිමට අපගේ මානව සම්පත් අංශයට සිදුවූයේ, මනා කුසලතාවන්ගෙන් නිපුන, වෘත්තීයමය චර්යා ධර්මතා වලින් හෙබි කණ්ඩායමක් වර්ධනය කර ගැනීම ය. නිර්මාණශීලිත්වය, නිපැයුම් සංවර්ධනය හා පාරිභෝගික සේවා විශිෂ්ඨත්වය ඔස්සේ ඔවුන් අපගේ පාර්ශ්වකරුවන්ට නවමු වටිනාකමක් ළඟා කරදෙනු ඇත.

බැංකුවේ සාර්ථකත්වයට හා ස්වකීය ඉදිරි ගමනේදී ධනාත්මක පැවතුම් ප්‍රදර්ශනය කිරීමට, වර්ධනය හා ධෛර්යය සඳහා අනුබල දෙන අභියෝග පිරුණු පරිසරයක කැපී පෙනෙනසේ, පරිපූර්ණ පුහුණු හා සංවර්ධන ක්‍රියාවලියක් දැන් බැංකුව තුළ ක්‍රියාත්මක වන්නේය. අප අතර පවත්නා නිරන්තර සංවාදයන් තුළින් උකහා ගනු ලැබූ යෝජනා හා අදහස්-උදහස් වලින් පෝෂිත, පුළුල් පරිමාණයෙන් ගෝලීය වශයෙන් පරිශීලනය කරන්නාවූ ක්‍රමෝපායයන්, අපගේ වරලත් පුහුණු හා සංවර්ධන සිතියම පිළිබිඹු කරයි.

පුහුණුව හා සංවර්ධනය පාදක වූයේ අවශ්‍යතා මාලාවක් නිසාය. අපගේ අරමුණු වලට අප වඩාත් සමීප කරවන, අප කණ්ඩායමේ හැකියා තව දුරටත් වර්ධනය වනසේ එය සැලසුම්ව ඇත. රු. මිලියන 83ක් වසර ආරම්භයේදීම පුහුණුව හා සංවර්ධනය උදෙසා පූර්ණ වශයෙන්ම ආයෝජනය කරන ලද්දේ, අපගේ ව්‍යාප්තික සේවක කණ්ඩායමේ ආකල්පික හා චර්යාත්මක පරිවර්තනයක් සඳහා, මෘදු කුසලතා පුහුණුවට, එවන් ආයෝජනයක් අතිශයින්ම ඵලදායක වන හෙයිනි. මෘදු කුසලතා සංවර්ධනයේදී, ප්‍රමන්ත්‍රණය, සන්නිවේදනය, ඉදිරිපත් කිරීම, ධනාත්මක චින්තනය, අනුග්‍රාහක සත්කාරය, ව්‍යාපාරික චර්යා ධර්ම, නායකත්වය, කණ්ඩායම් ගොඩනැගීම, අභිප්‍රේරණය, අලෙවිය, සාරධර්ම, ආකල්පික වර්ධනය, කාල කළමනාකරණය, ආතති පාලනය, ගැටුම් නිරාකරණය ඇතුළු අනේකවිධ විෂය ධාරාවකට විවරත්වය ලබා ගැනීම අවශ්‍ය වන්නේය.

තාක්ෂණික අංශයන් හා කටයුතු කරන සාමාජිකයින්ගේ සමස්ත වගකීම් සම්භාරයම ආවරණය වනසේ, ණය පියවා ගැනීම, අනුකූලතාව, අවදානම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, විගණනය, ණය කළමනාකරණය, සංස්ථාපිත ණයදීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණයදීම, උකස්කර හා විනය කළමනාකරණය ආදිය හා අදාළව ක්‍රියාත්මක කරන ලද තාක්ෂණ කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන්ද සියුම් ලෙස මෙම අංශයේ අවධානයට ලක්විණි.

පුහුණු වැඩ සටහන් වලින් බොහොමයක්ම මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයයේ දී පවත්වන ලද අතර, අදාළ පරිදි පළාත් බදවද ඇතැම් වැඩ සටහන් පවත්වනු ලැබීය. සමහර කණ්ඩායම් සාමාජිකයන්ගේ විශේෂඥතාව අනුව, දැනුම හා කුසලතා මට්ටම තවදුරටත් වර්ධනය කරනු පිණිස, බාහිර හා විදේශීය පුහුණුවද ඔවුන්ට ලබා දෙන ලදී.

## අපගේ ප්‍රජාව සමග කටයුතු කිරීම

සැමටම ප්‍රතිලාභ යන තේමාව ඔස්සේ කටයුතු කිරීමේ අවශ්‍යතාව මත, අපගේ ඉදිරි ගමනේ පියවර අප තබනුයේ, ආර්ථික සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය සිදුවීම තහවුරු කරමිනි. අපගේ නිපැයුම් සියල්ලම නිර්මාණය වනුයේ, මෙම මූලධර්ම යුගල මගින් තිරසාර සංවර්ධනය උදා කරගනු පිණිසය. අප රටේ දැක්ම වන, අන්තර්කරණ සංවර්ධනයට අනුගත වෙමින් හා අපගේ සමාජ වගකීම් න්‍යාය පත්‍රය බෙහෙවින්ම පෘථුල සංවර්ධන චිත්‍රයට ආදේශ කරමින් සිතියම් කරනු ලැබුවේ, සමාජ සංවර්ධනයේ ප්‍රබල හා තිරසාර පදනම ඉදිකරමින් අපගේ ප්‍රජාව සමග ධනාත්මකව අනුයුක්තවනු පිණිසය.

අනුමතවූ ප්‍රජා ව්‍යාපෘති මුළින්ම දේශීය මට්ටමින් හඳුනාගනු ලබන අතර, අපගේ ප්‍රාථමික තිරසාර පසුබිම වන ශ්‍රී ලංකාවේ උරුමය සංරක්ෂණය, තිරසාර සවිබලගැන්වීම හා වෘත්තීයමය සංවර්ධනය යන තේමාවන්ට අනුකූලව ශාඛා විසින් ව්‍යාපෘති හඳුනාගනු ලැබ තෝරා ගැනේ.

ශාඛා කළමනාකරුගේ අනුමැතිය ලබාගත් පසු, ඊළඟ පියවර වනුයේ දේශීය ව්‍යාපෘතියක මාර්ගෝපදේශවලට එම ව්‍යාපෘතිය අනුකූලවන්නේදැයි තහවුරු කිරීමයි. එයිනික්බිති, ශාඛාව එය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. කෙසේ වුවද, ව්‍යාපෘතිය පරිමාණයෙන් විශාල වන්නේ නම්, එය අලෙවි කළමනාකරුට සහ අදාළ සරස්ශ්‍රිත කණ්ඩායමට යොමු කරනු ලබන අතර, එම කණ්ඩායම විසින්, ව්‍යාපෘතිය බැංකුවේ තිරසාරභාවය පිළිබඳ අරමුණ සාක්ෂාත් කරගැනීමේදී උද්ගතවන වැදගත්කම ගැන විමර්ශණය කරනු ලැබේ. අනුමත වූයේ නම්, ව්‍යාපෘති නිර්මාපිකයාට දන්වනු ලබන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන සමස්ත කාලය තුළම එය සමීපස්ථව නිරීක්ෂණය කරනු ලැබේ. ව්‍යාපෘතිය හමාරවූ පසු අවසාන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම වාර්තාව, ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳව විස්තර කරමින්, එහි බලපෑමත්, දුර්වලතා තිබුණේ නම් ඒ පිළිබඳවක් අදහස් දක්වනු ඇත. එමගින්. ව්‍යාපෘතිය අනාගත අත්දැකීම්වලට හැදෑරුම් මෙවලමක් වන්නේය.

### ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය සුරැකීම

සම්ප්‍රදායානුකූලව, ආසියාවේ විශාලතම සංස්කෘතික සංදර්ශනය ලෙස සැලකෙන, ශ්‍රී ලංකාවේ අති පූජනීය ශ්‍රී දළදා මාළිගාවේ වාර්ෂික ඇසළ මහ පෙරහැරට මුල් පෙළේ හවුල්කරුවෙකුවීම, මහජන බැංකුව අඛණ්ඩව සිදු කළේය. ප්‍රතාපවත් වස්ත්‍රාභරණයෙන් සැරසුණු අලි ඇතුන්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සිවු වාර්ගික නාට්‍ය ශෛලීන් නියෝජනය කරන නැටුම් ශිල්පීන් පිරිවරාගත්, ශ්‍රී දළදා මාළිගාව සතු මාහැඟි වස්තුව වන, බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේට පුද පූජා පවත්වමින්, කන්ද උඩරට අගනුවර වන මහනුවර නගරයේ, පැය තුනකටත් අධික කාලයක් විටි සංචාරය කරන මෙම සංදර්ශනය, ශ්‍රී ලංකාවේ සංස්කෘතික දින දර්ශනයේ අතිශයින්ම වැදගත් අංගයක් ලෙස අනුකලනය වෙයි. මහනුවර රාජධානි සමයේ සිට මේ දක්වා පැවත එන ඉපැරණි සම්ප්‍රදායන් හා උරුමයන් එමගින් සුරැකෙන අතර, බාල-මහළු ආදී වශයෙන් වෙනසක් නොමැතිව, මෙම පෙරහැර සංදර්ශනය අති විශාල ජනකායකට ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ඓතිහාසික උරුමය පිළිබඳ පාඩම් කියා දෙනුයේ, සියැසින් දැකබලා ගන්නා අයට පමණක් නොව, ජනමාධ්‍ය ඔස්සේ සිදුවන විකාශයන් තුළින් එය නරඹන දහස් සංඛ්‍යාත පිරිසකටත්ය.

සෙංකඩගල ඇසළ මහ පෙරහැරට මහජන බැංකුව සහයෝගය පිරිනැමීය. ශ්‍රී ලංකාව තුළ, මෙම පෙරහැර පැවැත්වුණේ, වසර 2,200කටත් අධික කාලයක් පැරණි විශිෂ්ඨ ඉතිහාසයකට නෑකම් කියන අති පූජනීය ආගමික සිද්ධස්ථානයකය.

බෞද්ධ දින දර්ශනයෙහි, අතිශය විශේෂවූ ආගමික සංසිද්ධියක් වන, මෙම වසරේ මැයි මාසයේ පැවති වෙසක් උත්සවය නිමිත්තෙන්, ජනාධිපති කාර්යාලය හා හුණුපිටිය ගංගාරාම මහ විහාරස්ථානය සංවිධානය කළ 'බුද්ධ රශ්මි' වෙසක් උළෙලට මහජන බැංකුවද හවුල් කරුවෙකු වූයේය. බෞද්ධ දර්ශනය, එහි හර පද්ධතීන් හා පැවිදි සංස්කෘතිය පිළිබඳව ජනතාව දැනුවත් කරන හා ඔවුන් පිනවන ආකාරයට නිර්මාණය කර තිබූ කෘතීන්ට විදුලි ආලෝකය හා සැරසිලි සම්පාදනය කරන ලද්දේ මහජන බැංකුව විසිනි.

ශ්‍රී ලංකාවට බෞද්ධ ධර්මය රැගෙන එනු ලැබූ දිනය වශයෙන් අනුස්මරණය කෙරෙන පොසොන් පොහෝ දිනය වෙනුවෙන්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතුල් පව්ව රජ මහා විහාරය සැරසිලි වලින් අලංකාර කරන ලද්දේ මහජන බැංකුවේ අනුග්‍රහයෙනි.

මුහුදු මහ විහාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මහජන බැංකුව දැක්වූ අනුග්‍රහය, මෙම වසරේ දියත් කරන ලද ඉතා වැදගත් සංස්කෘතික මෙහෙවරක ආරම්භනයක් ලෙස සැලකිය හැකිය. අවුරුදු දහස් ගණනකර පෙර, විහාර මහ දේවි ගොඩබට

තොටුපොළ වශයෙන් සැලකෙන මෙම ස්ථානය, පුරාණ පුද පූජා පරිශ්‍රයක් පමණක් නොව, වැදගත් පුරා විද්‍යා භූමියක්ද වුවද, විහාරය හා තදාසන්න පරිසරය තිස් අවුරුදු යුද්ධයෙන් විනාශව ගොස් තිබිණි. බැංකුවේ ආර්ථික සහයෝගිතාව නිසා, පැරණි ශ්‍රී විභූතිය නොබෝ දිනකින් යළි උදාකරගන්නට හැකිවන බව බොහෝ දෙනෙකුගේ විශ්වාසයයි.

ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය හා ගැමි සංගීතයේ පැවැත්මට හා අනාගත පරම්පරාවන් විසින් එහි ආභාෂය භුක්ති විඳිනු පිණිස අවශ්‍යවන දිරිය, බැංකුව මෙම වසරේදී ලබා දුන්නේ, 60වන ජන්ම දිනය සැමරූ, ප්‍රවීන සංගීතවේදී හා පුහුණු ගායන ශිල්පී විශාරද එඩ්වඩ් ජයකොඩි සූරීන්ගේ ඒක පුද්ගල ගායන වැඩ සටහනට ආධාර කරමිනි. මෙම වැඩ සටහන ඔස්සේ, 35 වසරක අර්ධ ශාස්ත්‍රීය, ශාස්ත්‍රීය, ජන ගී, වේදිකා නාට්‍ය සහ චිත්‍රපට ගී ගායනා තුළින් ශ්‍රාවක ප්‍රේක්ෂක සංගීත ලෝලීන්, සුන්දර අතීතයකට රැගෙන යාමට ඉඩ තිබුණු බව නොරහසකි.

මහජන බැංකුවේ කණ්ඩායම නිරන්තරයෙන්ම බහු සංස්කෘතික, බහු සාමයික එකක් වීම නිසා, සමගිය හා සහෝදරත්වය ඒ තුළින් පැතිරීම විශේෂතාවක් ලෙස දැකිය හැකි වූයේ, කණ්ඩායමේ සියලු දෙනා එක් එක් ආගමික හා සංස්කෘතික සංසිද්ධීය උත්සවශ්‍රීයෙන් සැමරූ හෙයිනි. උදාහරණයක් වශයෙන්, අස්වැන්න වෙනුවෙන් පැවැත්වූ තයි පොන්ගල් උත්සවයද, වෙසක් උත්සවය වෙනුවෙන් භක්ති ගී ගායනාද, නත්තල වෙනුවෙන් කැරොල් ගායනාද කණ්ඩායමේ සහභාගිත්වයෙන් පැවැත්විණි. ඊට අමතරව, තලවිල ශාන්ත ආනා දේවස්ථානයට පුද පූජා සඳහා යන බැතිමතුන් සඳහා විවේකාගාරයක් තැනීමටද බැංකුව ඉදිරිපත්විය.

## තිරසාර සවිබලගැන්වීම

අධ්‍යාපනය වනාහී ආර්ථික වර්ධනය හා සමාජ සංවර්ධනය යන ක්ෂේත්‍ර දෙකම ප්‍රවර්ධනය කරන සවිබල ගැන්වීමේ මෙවලමකි. වසර ගණනාවක් පුරා, උසස් මට්ටමේ විශිෂ්ටතාවන් දැක්වූ තරුණ ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව ලබාදීමෙන්, ඔවුන්ගේ අධ්‍යාපනයෙහි අඛණ්ඩතාව බැංකුව විසින් තහවුරු කරනු ලැබුවද, ඔවුන් සතු ගෘහස්ත පරිසරය සලකා බැලූ කල්හි, එය එක්තරා අභියෝගයක් විය. එය එසේ වුවද, සිසු උදාන යන නමින් අප විසින් සිසුන් සඳහා ම නිපැයුම් වර්ධනය කර, එමගින් ශිෂ්‍යත්ව පිරි නමා, ඔවුන්ගේ සිහින සැබෑ කිරීමට පියවර ගන්නා ලදී.

මෙම ඉතුරුම් නිපැයුම මගින් ඉතිරි කිරීමේ සංස්කෘතිය ප්‍රගුණ කරනු ලැබූ අතර, පාසැල් බැංකුකරණ ඒකකවල ඉලක්කය වූයේ සිසු අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාම දිරිගැන්වීමය.

YES ගිණුම හඳුන්වාදීමත් හා සමගම, උපාධි අපේක්ෂක හෝ වෙනත් වෘත්තීය උසස් අධ්‍යාපනයක් ලබාගැනීමට හෝ බලාපොරොත්තුවූ සිසුන් සඳහා උසස් අධ්‍යාපන ණය පහසුකම් අප විසින් පිරිනමනු ලැබිණි. මෙම සංකල්පය අපගේ වනිතා වාසනා යෝජනා ක්‍රමයේද අන්තර්ගතවූ අතර, එමගින් තරුණ ශිෂ්‍යාවන්ට, වෙනත් පහසුකම්ද සහිතව, උසස් අධ්‍යාපනයට බාධා නොවීමට අවස්ථා සලසා දෙන ලද්දේය.

කාන්තා සවිබල ගැන්වීම මහජන බැංකුව තුළ විශේෂවූ අවධානයකට පාත්‍රවූයේ, ඔවුන්ගේ හැකියා කුසලතා කෙරෙහි බැංකුව තබා ඇති අචල විශ්වාසය නිසාය. ඔවුන් කාර්ය පරිසරයේ ප්‍රබල බලවේගයක් වන අතර, ග්‍රාමීය ප්‍රජා ගොඩනැගීමේදී සැලකිය යුතු සාධකයකි. එක් එක් වසරක් තුළ, බැංකුව ජාත්‍යන්තර කාන්තා දිනයේ ක්‍රියාකාරකම් සමග අනුයුක්තවනුයේ, කාන්තා වර්ධනය සඳහා නියමිත බැංකු කළඹ තුළ, ඔවුන්ගේ ප්‍රගතිය වෙනුවෙන් නිපැයුම් වෙන් වෙන් වශයෙන් නිර්මාණය කර ඇති හෙයිනි. මෙම වසරේ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම වෙනුවෙන්, කාන්තාවන්ගේ සිහින සැබෑ කරලීම අරමුණුකර, වනිතා වාසනා පැතුම් ගස අප විසින් ඉදිරිපත් කරන ලදී. 2013 මාර්තු-මැයි ත්‍රෛමාසික කාලය, වනිතා වාසනා ත්‍රෛමාසික ඉතුරුම් කාලය ලෙස නම්කරනු ලැබීය. මෙම කාලය තුළ මුදල් තැන්පතු සිදු කළ කාන්තාවන් සඳහා විශේෂ ත්‍යාග දිනුම් ක්‍රම කිහිපයක් හඳුන්වා දෙනු ලැබිණි. මෙහි ප්‍රධාන උත්සවය, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/සාමානාධිකාරි තැනගේ ප්‍රධානත්වයෙන් මහජන බැංකුවේ මූලස්ථාන ශාඛාව මගින් පවත්වන ලදුව, වෛද්‍ය විශේෂඥයින් විසින් විශේෂ දේශනද පවත්වන ලදී, ඊට සමාන වැඩ සටහන් යාපනය, ගම්පහ සහ දිවයින පුරා මහජන බැංකු ශාඛාවල සංවිධායකත්වයෙන් පැවැත්විණි.

## වෘත්තීයමය සංවර්ධනය

ක්‍රීඩා වනාහී ජාතීන්ද, සංස්කෘතීන්ද, මහජනයාද ඒකරාශි කරන්නකි. එමගින් දිරිගැන්වෙන කණ්ඩායම්, ජීවේන්ද්‍රිය හා සහෝදරත්වය විසින් අවසානයේදී, ජාතික න්‍යාය පත්‍රයට සැලකියයුතු අන්දමින් දායකත්වය සපයනු ලබන අතරම, පොදු ඉලක්කයන් සපුරාගත හැකි එක්සත් ජාතියක් බිහි කිරීම සඳහාද නායකත්වය දෙනු ලබයි. තවද, විෂය බාහිර ක්‍රියාකාරකම්, පුද්ගලයින්ගේ වෘත්තීයමයභාවය වර්ධනය කරන බව අප විශ්වාස කරන අතර, වෘත්තීය සංවර්ධනයේ ගතිකයක් ලෙස ක්‍රීඩා සංවර්ධනය දිරිගැන්වීම පිණිස, විවිධ ආයතන හා සංවිධානවලට හවුල්වීමට අප යොමු කරනු ලබයි.

බැංකුව ස්වකීය කණ්ඩායම් අතර විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා, කොන්දේසි විරහිතව, දිරි දීම් සිදු කරයි. මෙම වසරේදී, ශ්‍රී ලංකා හමුදාවන්ගේ සුභ සාධන ආරම්භනයන්ට සහ විවිධ පුහුණුවීම්වලටත්, අරමුදල් අවශ්‍ය සංවර්ධන ආයතනවලටත් අගයක් දීමට ඔවුන් දරන උත්සාහයට සහාය දැක්වීම සඳහා, අප විසින් මෝටර් රථ ධාවන තරඟ කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය.

ඒ අනුව, මෙම වසරේදී ගනර් සුපර්ක්‍රොස් 2013, ද ෆොක්ස්හිල් සුපර්ක්‍රොස් 2013, ද සීගිරිය රැලි ක්‍රොස් 2013 සහ ද කැවල්රි සුපර්ක්‍රොස් 2013 සංවිධායකයින්ට බැංකුව හවුල් විය. ආරක්ෂක හමුදාවල සාමාජිකයින්ට, ස්වකීය පෞද්ගලික කුසලතා වර්ධනය කරගනු පිණිස, වාහන හා පරිඝණක ණය ඇතුළත් පෞද්ගලික ණය පහසුකම්, බැංකුව විසින් ඇතැම් ඉසව් වෙනුවෙන් සපයන ලදී.

මෙම වසරේ බැංකුව ආරක්ෂක වෘත්තිකයින්ට සහායවූ තවත් අවස්ථාවක් නම්, 'පශ්චාත් ගැටුම් ශ්‍රී ලංකා - අභියෝග හා කලාපීය ස්ථාවරත්වය' නම්වූ 2013 ආරක්ෂක සම්මන්ත්‍රණයට ස්වකීය නොසැලෙන සහයෝගය පිරිනැමූ අවස්ථාවයි. මෙහිදී, ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් ප්‍රතිසංස්කරණ, සමාජ ඒකාග්‍රතාව, ප්‍රතිසංධානය සහ කලාපීය ස්ථාවරත්වය ආදිය පිළිබඳව විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥයින් විසින් සාකච්ඡා පවත්වා, තොරතුරු සංසරණයකර, විශ්ලේෂයෙන් ඉක්බිතිව, ඔවුනොවුන් අතර බෙදා හදා ගන්නා ලදී.

මාධ්‍ය හා විනෝදජනක කටයුතු ඇතුළු විවිධ වෘත්තීන්හි වෘත්තීයභාවයට ආධාර කරමින්, රූපවාහිනී කර්මාන්තයේ විශිෂ්ඨයින්ට සම්මාන පිරිනැමීමේ වාර්ෂික සුමති සම්මාන 2013 උත්සවය සඳහා, බැංකුව මූල්‍ය සහාය පිරිනැමීය. ස්වකීය වෘත්තියේදී ඉහළ මට්ටමේ සාරධර්ම හා වෘත්තීයභාවය පිළිබිඹු කළ ලේඛකයින්ට ගරුත්වය දැක්වීම සඳහා, ශ්‍රී ලංකාවේ කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය ඒකාබද්ධව සංවිධානය කළ විශිෂ්ටත්වය සඳහා ලේඛක සම්මාන වැඩ පිළිවෙළටද බැංකුව සිය සහාය පිරිනැමුවේය.

විවිධ වෘත්තීන්ට පා තබන්නට සූදානම්ව සිටින තරුණ පිරිසක්, කොළඹ විශ්ව විද්‍යාලයයේ වර්ණ රාත්‍රියේ අභිනන්දනයට පාත්‍රකළ අවස්ථාවේදී, බැංකුව ඊට අනුග්‍රහය දැක්විය. විශ්ව විද්‍යාල අධ්‍යයන අංශ හතක, පරිඝණක අධ්‍යාපන ආයතනයෙහි සහ වෙනත් එවැනි ආයතන හයක, සහ ශ්‍රීපාලි සරසවි බිමෙහිද උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන්, දේශකයින්, පරිපාලන නිලධාරීන් 8,000ක් පමණ මෙම අවස්ථාවට සහභාගී වූහ. බැංකුවේ අනුග්‍රහය පිරිනමන ලද්දේ, දැන් මෙම තරුණ තරුණියන් පිරිස, තමන් වෘත්තීය ක්ෂේත්‍රයන්ට රැගෙන යන මෙවලම්වලින් සන්නද්ධවී සිටිනුයේ, තම තමන්ගේ ජීවිත අපේක්ෂාවන් සාක්ෂාත් කරගන්නා අතරම, ජාතික ඉලක්කයන්ද සපුරාලීමට ක්‍රියාශීලීව දායකත්වය සැපයීමේ අවස්ථාව ඔවුන්ට හිමි කරමිනි.

## අපගේ පාරිසරික කැපවීම

මහජන බැංකුව මූල්‍ය සේවා ආයතනයක් මිස නිෂ්පාදන ක්‍රියාවලියෙහි නියුක්තවන ආයතනයක් නොවන හෙයින්, අපගේ කාබන් පියසටහන අඩු කිරීම උදෙසා, අභ්‍යන්තරව ක්‍රියාත්මක කළ හැකි ක්‍රම වේදයන් දෙස අපි විමසිලිමත් වූයෙමු. අපගේ මූලික ප්‍රමුඛතාව, සමාජය සවිබල ගැන්වීම හා ආර්ථික ස්ථාවරත්වය නිසා, පාරිසරික ආරම්භනයන් කෙරෙහි අවධානය පූර්ණ ලෙස යොමුවී නොමැත.

කෙසේ වුවද, භාවිත නොකරන අවස්ථාවලදී, විදුලි ආලෝකය හා වෙනත් විද්‍යුත් උපකරණයන් නිවා දැමිය යුතු බවට ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සිටම පහළට දැනුම්දී තිබීම මගින් විදුලිය සංරක්ෂණය සඳහා දැඩි ප්‍රයත්නයක් දරනු ලැබීම, විශේෂයෙන්ම ආහාර ගන්නා කාමරවල හා නාන කාමරවල ජල කරාම මනාව වසා තැබීම හා ජලය කාන්දුවීම් පිළිබඳව නඩත්තු අංශයට ක්ෂණිකවම දන්වා සිටීම, අපතේ යාම වැළැක්වීම පිණිස කඩදාසි සංරක්ෂණය කිරීම හා හැකි සෑම අවස්ථාවකම කඩදාසි නැවත නැවත ප්‍රයෝජනයට ගැනීම හා එමගින් ගස් කැපීමේ අවශ්‍යතාව අඩුකිරීම සහ අභ්‍යන්තරව විද්‍යුත් සන්නිවේදන ක්‍රම භාවිත කිරීම ආදී පියවර අප විසින් ගනු ලැබ ඇත. වෙනත් පිරිවැය කළමනාකරණ ක්‍රම වේදයන්ද භාවිත කරනු ලබන අතර, උපරිම ප්‍රමාණයෙන් අපගේ තිරසාරභාවය ආරක්ෂා කරගනු පිණිස, පරිසරය ආරක්ෂා කිරීමේ හා සම්පත් සංරක්ෂනය කිරීමේ අවශ්‍යතාව හා අදාළ දැඩි වගකීම පිළිබඳව ශාඛාවන්ට පවා දැනුම්දී තිබේ.

පසුගිය වසරේ ආරම්භ කරන ලද පහත දැක්වෙන ආරම්භනයන්, වඩාත් අවධානයෙන් යුතුව දැනටත් ක්‍රියාත්මක වන අතර, අපගේ මතයට අනුව බල ශක්තිය සුරැකීම හා සංරක්ෂණය කිරීම ධනාත්මක වෙනසකට පාත්‍රව ඇත.

- පතරොම (කාට්රිජ) මිලදී ගැනීම අඩු කිරීම - මෙයට පෙර බැංකුව මෙබඳු අවශ්‍යතා සඳහා සැපයුම් අංශය හරහා ටෙන්ඩර් කැඳවීම සිදුකළ නමුත්, දැන් වැඩි පිරිවැයක් දරන්නට සිදුවුවද, දිගුකාලීන වශයෙන් පරිසරයට යහපත්වන හෙයින්, මුල්ම නිපැයුම් මිලදී ගැනීම
- විදුලි බල්බ නිවා දමන ලෙස ඉල්ලීම
- හැකි සෑම අවස්ථාවකම බලශක්ති ඉතිරි කරන සී එෆ් එල් බල්බ ආදේශ කිරීම
- විධිමත් කාර්යාල දිනයක අවසානයේ වායුසමන යන්ත්‍ර ක්‍රියා විරහිත කිරීම
- අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය සඳහා හැකිතාක් දුරට අභ්‍යන්තර ජාල හා විද්‍යුත් තැපැල භාවිතා කිරීම
- විශේෂයෙන්ම, අනුමත කිරීම්, මානව සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර සන්නිවේදනය හා සමාලෝචනය සඳහා කඩදාසි නාස්තිය හා භාවිතය අඩුකර තොරතුරු තාක්ෂණ පද්ධති හා ක්‍රියාවලි හඳුන්වා දීම

### පාරිසරික නීති/රෙගුලාසි වලට අනුකූලවීම

මහජන බැංකුවේ අපි පාරිසරික ප්‍රමිතීන් පවත්වාගැනීමට අඛණ්ඩවම උත්සාහ කරන අතර, නීති/රෙගුලාසි වලට අනුකූල නොවීම හෝ පරිසරය නොසලකා හැරීම හෝ පිළිබඳව එමෙන්ම නොසැලකිලිමත් පාරිසරික පරිචයන්හි නිරතවීම හෝ නිසා මුදල්මය දඩයක් ගෙවීමට අපට සිදුවූයේ නැත.

# ගෝලීය වාර්තාකරණ මූලාරම්භයන්හි සුචිය


| සුචි අංකය | විස්තරය | වාර්තාවේ කොටස | පිටුව |
|---|---|---|---|
| **1.** | **උපායමාර්ගය හා විශ්ලේෂණය** | | |
| 1.1 | ආයතනයේ ජ්‍යෙෂ්ඨතම තීරණ ගන්නාගේ ප්‍රකාශනය | තිරසාරත්ව අතිරේකය | 81 |
| **2.** | **ආයතනික පැතිකඩ** | | |
| 2.1 | ආයතනයේ නම | ආයතනික තොරතුරු | පිට කවරයේ පසුපිට ඇතුළු පැත්ත |
| 2.2 | මූලික සන්නාම, නිපැයුම් හා/හෝ සේවාවන් | ව්‍යාපාර සමාලෝචනය | 42 - 53 |
| 2.3 | ආයතනයේ මෙහෙයුම් ව්‍යුහය | ආයතනික පාලනය | 118 |
| 2.4 | ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ස්ථානය | ආයතනික තොරතුරු | පිට කවරයේ පසුපිට ඇතුළු පැත්ත |
| 2.5 | ආයතනය ක්‍රියාත්මකවන රටවල් සංඛ්‍යාව හා ප්‍රධාන මෙහෙයුම් ඇති රටවල හෝ වාර්තාවේ ආවරණය කෙරෙන තිරසාර බව හා සම්බන්ධ කරුණුවලට නිශ්චිතවම අදාළ වන රටවල නම් | කිසිවක් නැත | - |
| 2.6 | හිමිකාරිත්වයේ ස්වභාවය හා නෛතික ස්වරූපය | ආයතනික තොරතුරු | පිට කවරයේ පසුපිට ඇතුළු පැත්ත |
| 2.7 | සේවා සැපයෙන වෙළෙඳපොළවල් | තිරසාරත්ව අතිරේකය | 79 |
| 2.8 | වාර්තාකරණ ආයතනයේ පරිමාණය | මතුකර දැක්වීම් | 4 - 5 |
| 2.9 | ප්‍රමාණය, ව්‍යුහය හෝ හිමිකාරිත්වය සම්බන්ධයෙන් වාර්තාකරණ කාලය තුළ සිදුවූ වැදගත් වෙනස්කම් | කිසිවක් නැත | - |
| 2.10 | වාර්තාකරණ කාලය තුළ ලැබුණු සම්මාන | දශකය දෙස ක්ෂණික බැල්මක් | 283 |
| **3.** | **වාර්තාකරණ පරාමිතීන්** | | |
| 3.1 | වාර්තාකරණ කාලපරිච්ඡේදය | තිරසාරත්ව අතිරේකය | 79 - 80 |
| 3.2 | ආසන්නතම පෙර වාර්තාව නිකුත් කළ දිනය | තිරසාරත්ව අතිරේකය | 79 - 80 |
| 3.3 | වාර්තාකරණ චක්‍රය | තිරසාරත්ව අතිරේකය | 79 - 80 |
| 3.4 | වාර්තාව හෝ එහි අන්තර්ගතයට අදාළ ගැටළු සම්බන්ධයෙන් විමසීම් කළ යුතු ස්ථානය | තිරසාරත්ව අතිරේකය | 80 |
| 3.5 | වාර්තාවේ අන්තර්ගතය අර්ථ දැක්වීම | තිරසාරත්ව අතිරේකය | 80 |
| 3.6 | වාර්තාවේ සීමාවන් | තිරසාරත්ව අතිරේකය | 80 |
| 3.7 | වාර්තාවේ විෂයපථය හෝ බල ප්‍රදේශය සම්බන්ධ නිශ්චිත සීමාවන් | තිරසාරත්ව අතිරේකය | 80 |
| 3.8 | හවුල් ව්‍යාපාර, පරිපාලිත සමාගම්, කල්බදු දුන් පහසුකම්, බාහිර ආයතන වෙත පවරා ඇති මෙහෙයවුම් හා කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට හා/හෝ ආයතන අතර සංසන්දනය කිරීමේ හැකියාවට බලපාන වෙනත් ආයතන | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 192 |
| 3.10 | පෙර වාර්තාවල සපයා ඇති යම් තොරතුරක් නැවත ප්‍රකාශ කිරීමේ බලපෑම පිළිබඳ පැහැදිලි කිරීම | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 193 |
| 3.11 | වාර්තාවේ විෂය පථය, සීමාව හෝ යොදා ගනු ලැබූ මිනුම් ක්‍රම පිළිබඳව, පෙර වාර්තා කරනලද කාල පරිච්ඡේදයේ සිට සිදුව ඇති වැදගත් වෙනස්කම් | කිසිවක් නැත | - |
| 3.12 | GRI අන්තර්ගත සුචිය | තිරසාරත්ව අතිරේකය | 103 - 105 |

| සුචි අංකය | විස්තරය | වාර්තාවේ කොටස | පිටුව |
|---|---|---|---|
| **4.** | **පාලනය, කැපවීම් හා නියුක්තිකරණය** | | |
| 4.1 | ආයතනයේ පාලන ව්‍යුහය | ආයතනික පාලනය | 118 |
| 4.2 | ඉහළම පාලන අධිකාරියේ මුලසුන හොබවන්නා විධායක නිලධාරියෙකුද වන්නේද යන බව | ආයතනික පාලනය | 119 |
| 4.3 | ඉහළම පාලන අධිකාරියේ සිටින ස්වාධීන හා/හෝ විධායක නොවන සාමාජික සංඛ්‍යාව | ආයතනික පාලනය | 119 |
| 4.4 | ඉහළම පාලන අධිකාරිය වෙත නිර්දේශ හෝ විධාන ලබාදීම සඳහා කොටස්හිමියන් හා සේවකයන් වෙනුවෙන් ඇති යාන්ත්‍රණයන් | තිරසාරත්ව අතිරේකය | 88 |
| 4.14 | ආයතනය විසින් එහි නිරතකර සිටින පාර්ශ්වකාර කණ්ඩායම් ලැයිස්තුව | තිරසාරත්ව අතිරේකය | 89 |
| 4.15 | ආයතන කාර්යයන්හි නිරතකර ගැනීමෙහිලා පාර්ශ්වකරුවන් හඳුනාගැනීම හා තෝරාගැනීම සඳහා පදනම | තිරසාරත්ව අතිරේකය | 89 |

## ආර්ථික කාර්යසාධනය

| | | | |
|---|---|---|---|
| EC1 | ජනනය කර බෙදා හරිනු ලැබෙන සෘජු ආර්ථික අගය | ඇමුණුම් | 264 - 265 |
| EC3 | ආයතනයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම් ආවරණය | තිරසාරත්ව අතිරේකය | 97 - 99 |
| EC4 | රජය වෙතින් ලද වැදගත් මූල්‍ය සහාය | තිරසාරත්ව අතිරේකය | 89 - 94 |

## පාරිසරික කාර්යසාධනය

| | | | |
|---|---|---|---|
| EN2 | ප්‍රතිචක්‍රීකරණය කළ යෙදවුම් ද්‍රව්‍ය භාවිතා කිරීමේ ප්‍රතිශතය | තිරසාරත්ව අතිරේකය | 102 |
| EN28 | පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් ගෙවීමට සිදුවූ ප්‍රධාන දඩ මුදල්වල මුදල්මය අගය හා මුදල් නොවන සම්බාධක මුළු සංඛ්‍යාව | තිරසාරත්ව අතිරේකය | 102 |

## සමාජය

| | | | |
|---|---|---|---|
| SO1 | ක්‍රියාත්මක කරන ලද දේශීය ප්‍රජා අනුයුක්ත කිරීම්, බලපෑම් තක්සේරුව සහ සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිශතය | තිරසාරත්ව අතිරේකය | 100 - 101 |
| SO2 | දූෂණය හා සබැඳි අවදානම වෙනුවෙන් විශ්ලේෂණය කරන ලද ව්‍යාපාර ඒකක ප්‍රතිශතය හා මුළු සංඛ්‍යාව | තිරසාරත්ව අතිරේකය | 85 |
| SO3 | ආයතනයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පිළිබඳව පුහුණුව ලබාදුන් සේවක ප්‍රතිශතය | තිරසාරත්ව අතිරේකය | 85 - 86 |
| SO4 | දූෂණ සිද්ධීන්වලට සිදුවීම්වල ප්‍රතිචාර වශයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග | තිරසාරත්ව අතිරේකය | 85 |
| SO8 | නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් ගෙවීමට සිදු වූ ප්‍රධාන දඩ මුදල්වල මුදල්මය අගය හා මුදල්මය නොවන මුළු සම්බාධක සංඛ්‍යාව | තිරසාරත්ව අතිරේකය | 85 - 86 |

| සුචි අංකය | විස්තරය | වාර්තාවේ කොටස | පිටුව |
|---|---|---|---|

## ශ්‍රම පරිචයන් හා යෝග්‍ය රැකියා

| | | | |
|---|---|---|---|
| LA1 | රැකියා වර්ගය, රැකියා ගිවිසුම හා ප්‍රදේශය අනුව මුළු ශ්‍රම බලකාය ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන්කර දැක්වීම | තිරසාරත්ව අතිරේකය | 95 - 96 |
| LA2 | වයස් කණ්ඩායම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කලාපය අනුව නව සේවක කුලිය සහ සේවක පිරිවැටුම හා අදාළ සම්පූර්ණ සංඛ්‍යාව හා අනුපාතිකය වෙන්කර දැක්වීම | තිරසාරත්ව අතිරේකය | 96 |
| LA3 | වැදගත් මෙහෙයුම්වල පිහිටීම් අනුව, තාවකාලික හෝ අර්ධකාලීන සේවකයන්ට ලබා නොදෙන, නමුත් පූර්ණකාලීන සේවකයන්ට ලබාදෙන ප්‍රතිලාභ | තිරසාරත්ව අතිරේකය | 97 |
| LA10 | සේවක කාණ්ඩය අනුව සේවකයෙකුට වසරකට පුහුණුවීමේ සාමාන්‍ය පැය ගණන | තිරසාරත්ව අතිරේකය | 99 |
| LA11 | සේවකයින්ගේ අඛණ්ඩ සේවා නියුක්තිය හා වෘත්තිය අවසානය දක්වා කළමනාකරණය සඳහා සහායවීම පිණිස ආධාරකයක්වන කුසලතා කළමනාකරණ වැඩසටහන් | තිරසාරත්ව අතිරේකය | 99 |

## නිපැයුම් වගකීම

| | | | |
|---|---|---|---|
| PR6 | වෙළෙඳ ප්‍රචාරය, ප්‍රවර්ධනය හා අනුග්‍රාහකත්වය ඇතුළු අලෙවි සන්නිවේදනයන්ට සම්බන්ධ නීති, සම්මතයන් හා ස්වේච්ඡා සංග්‍රහයන්ට අනුකූලවීමේ වැඩසටහන් | තිරසාරත්ව අතිරේකය | 86 - 87 |
| PR7 | වෙළෙඳ ප්‍රචාරය, ප්‍රවර්ධනය හා අනුග්‍රාහකත්වය ඇතුළුව අලෙවි සන්නිවේදනයන් සම්බන්ධයෙන් රෙගුලාසි හා ස්වේච්ඡා සංග්‍රහයන්ට අනුකූල නොවීමේ සිදුවීම් ප්‍රතිඵල අනුව මුළු සංඛ්‍යාව | තිරසාරත්ව අතිරේකය | 86 - 87 |

| වාර්තා යෙදවුම් මට්ටම | | C ✔ | C+ | B | B+ | A | A+ |
|---|---|---|---|---|---|---|---|
| සම්මත හෙළිදරව් කිරීම | පැතිකඩ හෙළිදරවු කිරීම් — නිමැවුම් | 1.1<br>2.1-2.10<br>3.1-3.8, 3.10-3.12<br>4.1-4.4, 4.14-4.15<br>පිළිබඳ වාර්තා කරන්න | බාහිර වශයෙන් සහතික කරන ලද වාර්තාව | 1.2<br>3.9, 3.13<br>4.5-4.13, 4.16-4.17<br>C+ මට්ටමේ ලේඛන ගතකර ඇති සියලුම නිර්නායකයන් ගැන වාර්තා කරන්න | බාහිර වශයෙන් සහතික කරන ලද වාර්තාව | බී මට්ටමේ අවශ්‍යතාවයමවේ | බාහිර වශයෙන් සහතික කරන ලද වාර්තාව |
| | කළමනාකරණ ප්‍රවේශය හෙළිදරව් කිරීම — නිමැවුම් | අවශ්‍ය නොවේ | | එක් එක් දර්ශක කාණ්ඩය සඳහා කළමනාකරණ ප්‍රවේශය හෙළිදරව් කිරීම | | එක් එක් දරශක කාණ්ඩය සඳහා කළමනාකරණ ප්‍රවේශය හෙළිදරව් කෙරේ | |
| | කාර්යසාධන දර්ශක හා අංශ අතිරේක කාර්යසාධන දර්ශක — නිමැවුම් | සමාජ, ආර්ථික හා පාරිසරික යන දර්ශක අතරින් අවම වශයෙන් එකක් ඇතුළුව අවම වශයෙන් කවර හෝ කාර්යසාධන දර්ශක 10 පිළිබඳව පූර්ණ ලෙස වාර්තා කරන්න** | | ආර්ථික, පාරිසරික, මානව හිමිකම්, ශ්‍රම, සමාජයීය, නිපැයුම් වගකීම යන දර්ශකවලට අවම වශයෙන් එකක් ඇතුළත් වන පරිදි අවම වශයෙන් කවර හෝ කාර්යසාධක දර්ශක 20ක් පිළිබඳව පූර්ණ ලෙස වාර්තා කරන්න*** | | (අ) දර්ශකය පිළිබඳව වාර්තා කිරීම හෝ (ආ) වාර්තා නොකිරීමට හේතුව පැහැදිළි කිරීමෙන් සාපේක්ෂ වැදගත්කම් මූලධර්මය කෙරෙහි නිසි අවධානය දක්වමින් එක් එක් හර හා ආංශික අතිරේක දර්ශක පිළිබඳව ප්‍රතිචාර දක්වන්න. | |

# කොටස්හිමියන්ට හා ජාතියට සෞභාග්‍යය උදාකරදීම

අපගේ කොටස්හිමියාවන ශ්‍රී ලංකා රජයට උපරිම ප්‍රතිලාභ උත්පාදනයකිරීම සඳහා කැපවී ක්‍රියාකිරීමේදී ජාතික සංවර්ධනය වඩ වඩාත් අත්කර ගැනීමට සම්පත් සපයන්නෙකු ලෙස මහජන බැංකුව අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.




Bank

# 2013 සේයාරූ දසුන් පෙළක් ...

**මහජන බැංකුව විවිධ පාර්ශ්වීය ජන කණ්ඩායම්වල වර්ධනය හා සංවර්ධනය කෙරෙහි තිරසාර හා අනුපමේය කැපවීම විදහා දක්වමින්, 2013 වසරේ දී ඉටු කළ කාර්යයන් කිහිපයක් පිළිබිඹු කෙරෙන සේයාරූ දසුන් පෙළක් ...**



මහජන බැංකුවේ කයිතඩි බැංකු සේවා මධ්‍යස්ථානය ආරම්භ කළ දිනයේ, හා හා පුරා කියා මුලින්ම මුදල් තැන්පත් කළ ගනුදෙනුකරුට, බැංකුවේ සභාපති ගාමිණී සෙනරත් මහතා අතින් සිහිවටන තිළිනයක්



යාපනයේ කෙළින් වීදිය ශාඛාව සංවිධානය කළ 'වනිතා වාසනා පැතුම් වෘක්ෂය' පෙරහැර ගමනේ යෙදෙමින්



'ලෝක සකසුරුවම් දිනය' වෙනුවෙන් පැවති උළෙලේදී බැංකුව පාසැල් සිසුනට නව පන්නයේ ක්‍රීඩාවක් හඳුන්වා දුන් පසු



'සිසු උදාන' ඉතුරුම් ඒකක ඇරඹුම් ත්‍යාග ලබා ගන්නා සිසු දරුවෙක්



දොරින් දොර බැංකු සේවා වැඩ සටහන නිවාස/බද්ධ නිවාසවලට හඳුන්වා දෙන අතරතුර



කොළඹ 10, ප්‍රෙස්බිටීරියන් බාලිකා විද්‍යාලයෙහි 'සිසු උදාන' ඒකකය ආරම්භවූ අවස්ථාවේ, ඉතුරුම් පොත් ලබාගැනීමට තමන්ගේ වාරය එළඹෙනතුරු පෙළගැසී සිටි සිසු දැරියන් පිරිසක්



2013 පෙබරවාරි 4 දිනට යෙදුණු ජාතික දිනයේදී, ද සොයිසා මාතෘදාරක රෝහලේ පැවති 'නිදහසේ උපත' උත්සව අවස්ථාවේදී



බැංකුවේ මහනුවර කලාපීය ප්‍රධාන කාර්යාලය සංවිධානය කළ '2013 ජය ශ්‍රී සංදර්ශනය'



ගම්පහ කලාපීය ප්‍රධාන කාර්යාලය වෙසක් පුන් පොහෝදා සංවිධානය කළ වෙසක් දන්සැල



මාලිගාවත්ත කාල්ටන් පෙර පාසලේ 'ඉසුරු උදාන' ගිනුම් ආරම්භක උත්සවය පැවැත්වුනේ ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිණියගේ ප්‍රධානත්වයෙනි



මහජන බැංකු සභාපතිතුමා කහතේන බැංකු සේවා මධ්‍යස්ථානය උත්සවශ්‍රීයෙන් විවෘත කළ අවස්ථාව



'නිදහසේ උපත' උත්සවයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - අනුකූලතා අතින් 'ඉසුරු උදාන' සහතික පතක් ලබදිදී



'ජය ශ්‍රී' දිනුම් ඇදීම - පොලොන්නරුවේදී



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මධ්‍යස්ථානය වන්නිකරයේ ජනතාව සඳහා ආරම්භ කළ දිනයේ




බැංකුවේ වසර 52 සංවත්සරයේදී හින්දු, කතෝලික, ඉස්ලාම් ආගමික නායකයින්ගේ ආශීර්වාද ලැබිණි



පිරිත් සජ්ජායනය සඳහා බැංකුවේ සභාපතිතුමා භික්ෂූන් වහන්සේලාට ආරාධනා කරයි



හොරණ කතෝලික දේවස්ථානයේ ඉරුදින දහම් පාසැල් සිසුන් 250 දෙනෙකුට බැංකුවේ ක්‍රිස්තියානි සංසදය විසින් නිල පාසැල් ඇඳුම් ප්‍රදානය කරන ලද වගයි



2013 දෙසැම්බර් 1 දින බැංකුවේ හින්දු සංගමය විසින් කල්මුණේ සායිව මහා සබායිහි අනාථ දරුවන්ට පොත් පත්, නිල ඇඳුම් සඳහා රෙදි සහ පාසැල් පාවහන් පරිත්‍යාග කළ අවස්ථාව



අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රදේශයේ දිළිඳු පවුලකට බැංකුවේ බෞද්ධ සංගමය විසින් නිවසක් පරිත්‍යාග කරන ලදී



මහ කන්නයේ වී ගොවිතැනට සූදානම්වන ගොවියන්ට බෝග වගා ණය ලබා දීමේ වැඩ සටහනකදී කලාපීය කළමනාකරු ඩී. බී. කේ. රත්නායක මහතාත්, ශාඛා කළමනාකරු ජී. එච්. විජේසූරිය මහතාත් ගොවීන් දැනුවත් කරද්දී



'සිසු උදාන පොළ' පැවතිදා, සිය දරුවන් වෙනුවෙන් ඉතුරුම් ගිනුම් අරඹන්නට පුළ පුළා බලා සිටින දෙමාපියන්



මොනරාගල, යාලබෝව ප්‍රාථමික පාසලේ 'සිසු උදාන පොළ' දිනයේ ඊට සහභාගිවූ සිසු දරුවන්



ගොවි ජනතාවට සහන සැලසීමේ වැඩ පිළිවෙළ යටතේ බැංකු නිලධාරීහු ගොවීන් සමග සාකච්ඡා පවත්වති

# අනුකූලතා වාර්තාව

අනුකූලතාව මූලික වශයෙන් ම අරමුණු කරගනුයේ,
බැංකුවේ කීර්ති නාමය පවත්වා ගැනීමට හා
එය අඛණ්ඩ ව වැඩි දියුණු කර ගැනීම පිණිස ය.
අනුකූලතාව සඳහා අදාළ වන නීති පද්ධති අනුගමනය
කිරීම මගින් බැංකුවේ හා එහි සේවකයන්ගේ අභිමානය
සාක්ෂාත් කිරීම තහවුරු කෙරේ.

## හැඳින්වීම

ඕනෑ ම මූල්‍ය ආයතනයක් ස්වකීය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී උසස් ප්‍රමිතියකින් එය සිදුකළ යුතු අතර, සෑම අවස්ථාවකදී ම නීත්‍යානුකූලවීමට හා නීතියේ ගරුත්වය රැකීමට උත්සුක විය යුතුය. නීතිය උල්ලංඝණය නො කළ ද, ස්වකීය කොටස්කරුවන්, අනුග්‍රාහකයින්, සේවකයින්, සහ වෙළෙඳපොළ කෙරෙහි අනුකූලතාව හා අදාළ ක්‍රියාකාරකම්හි බලපෑම පිළිබඳ ව සැලකිල්ලට ගැනීමට අපොහොසත්වීම, අහිතකර ප්‍රචාරයන් පැතිරයාමට හා කීර්ති නාමය පළුදුවීමට හේතුවිය හැකිය.

අනුකූලතාව මූලික වශයෙන් ම අරමුණු කරගනුයේ, බැංකුවේ කීර්ති නාමය පවත්වා ගැනීමට හා එය අඛණ්ඩව වැඩි දියුණු කරගැනීම පිණිස ය. අනුකූලතාව සඳහා අදාළ වන නීති පද්ධති අනුගමනය කිරීම මගින් බැංකුවේ හා එහි සේවකයන්ගේ අභිමානය සාක්ෂාත් කිරීම තහවුරු කෙරෙන අතර, කාර්ය මණ්ඩල හා අනුග්‍රාහකයින් අතර අනුකූලතාව හා අදාළ නීති පද්ධතීන් හා ඒවාට අනුගතවීම පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් පැවතීම මෙන්ම, අනුකූලතා මාර්ගෝපදේශයන්ට සහ ප්‍රතිපත්තීන්ට පාදකවීම විමර්ශනය කරනු ලැබීම ද ඊට ඇතුළත් වේ.

## නෛතික ආකෘතිමය රාමුව

1961 මහජන බැංකු පනතේ (සංශෝධිත) අංක 29 අනුව පනවන ලද මූල්‍ය ආයතනයක් වන මහජන බැංකුව, මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම හා ත්‍රස්තවාද මූල්‍යකරණය පිළිබඳ ව පනවන ලද නීති පද්ධතීන්ට අනුකූලවීම හා සම්බන්ධයෙන්, බැංකු කර්මාන්තය තුළ පහත සඳහන් වර්ධනයන් කිහිපයක් ම සිදුවීම නිරීක්ෂණය කළේය.

- 2005 අංක 25 දරන ත්‍රස්තවාද මූල්‍යකරණය මර්දනය කිරීමේ සම්මුතිය හා අදාළ පනත
- 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා අදාළ පනත
- 2006 අංක 6 දරන මූල්‍යමය ගනුදෙනු වාර්තාකරණය හා අදාළ පනත

## මහජන බැංකුවේ අනුකූලතා ව්‍යුහය

කර්මාන්තය තුළ දැනට පවත්නා නීති හා රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාකිරීමේ දී, එසේ පවත්නා නීති හා රෙගුලාසිවලට අනුකූලව බැංකුව ක්‍රියාත්මකවීම තහවුරු කරනු පිණිස මහජන බැංකුව විසින් අනුකූලතා ශ්‍රිතයක් ස්ථාපනය කරනු ලැබීය.

**මහජන බැංකුවේ අනුකූලතා ව්‍යුහය**




පහත දැක්වෙන විෂය පථය හා අදාළ ව බැංකුව තුළ අනුකූලතා ශ්‍රිතය ක්‍රියාත්මක වෙයි.

- කර්මාන්තය හා අදාළ වන නීති හා රෙගුලාසිවලට අනුකූලව බැංකුවේ ව්‍යාපාර ක්‍රියාකාරකම් සිදුකරනු ලබන්නේද යන්න විමර්ශනය කිරීමට හා පරීක්ෂා කිරීමට නිදහස,
- මාණ්ඩලීය ඒකාබද්ධතා අවදානම් කළමනාකරණ කමිටුව වෙත හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට නිදහස,
- ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීමට හිතකර වන පරිදි මිස, රෙගුලාසිවල හරය උල්ලංඝනයවීම හෝ එහි නියාමකයා තුළ බැංකුව කෙරෙහි ප්‍රසාදය පළුදු වීම හෝ සිදු නොවන ආකාරයට හා නිර්මාණාත්මක ලෙස රෙගුලාසි අර්ථකථනය කිරීමට හැකියාව.

නීති හා රෙගුලාසි උල්ලංඝනය කිරීම තුළින්, සම්බාධක පනවනු ලැබීමට හා බැංකුවේ කීර්ති නාමයට හානි සිදු වීමට හේතු විය හැකි බැවින්, එවැනි තත්ත්වයන්ගෙන් බැංකුව ආරක්ෂාකර

ගැනීම, අනුකූලතා ශ්‍රිතය තහවුරු කරයි. තව ද, කර්මාන්තයට අදාළ නීති හා රෙගුලාසි පිළිබඳ දැනුවත්වීම හා ඒවාට අනුගතවීම මෙන්ම උසස් සදාචාරාත්මක පැවතුම් පවත්වා ගැනීම ද ඔස්සේ බැංකුවේ අනුග්‍රාහකයින් තුළ විශ්වාසය උත්පාදනය වන හෙයින්, හා ඉහත සඳහන් විෂය පථය තුළ ක්‍රියාත්මකවීම මගින්, බැංකු කර්මාන්තයේ මුල් පෙළේ ආයතනයක් වශයෙන් බැංකුවේ ව්‍යුහය හා ප්‍රසාදජනක නාමය වර්ධනය කර ගැනීම ද අරභයා අනුකූලතා ශ්‍රිතය මෙම වගකීම් ඉටු කරයි.

- බැංකු කර්මාන්තයට අදාළ නීතිරීති වලට අනුකූලව බැංකුවේ ව්‍යාපාර කටයුතු සිදු වන බව තහවුරු කිරීම
- සියලුම සේවකයින් ස්වකීය රාජකාරිය ඉටු කිරීමේදී පිළිගත් ආචාර ධර්ම ප්‍රමිතීන් අනුගමනය කරන බව තහවුරු කිරීම
- ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීමට හිතකර වන පරිදි මිස, රෙගුලාසිවල හරය උල්ලංඝනයවීම හෝ එහි නියාමකයා තුළ බැංකුව කෙරෙහි ප්‍රසාදය පළුදුවීම හෝ සිදු නොවන ආකාරයට හා නිර්මාණාත්මක ලෙස රෙගුලාසි අර්ථකථනය කිරීම
- බැංකු ව්‍යාපාරයන් හා අදාළ නීති/රෙගුලාසිවල යම් වෙනසක් ඇතිවූ කල්හි, කාර්ය මණ්ඩලය නිතිපතා ඒ පිළිබඳව යාවත්කාලීනකර, අනුකූලතා දැනුවත්භාවය හැමවිටම තහවුරු කිරීම සඳහා ශාඛා ජාලය පුරාම පුහුණුකිරීම් පැවැත්වීම
- බැංකුවේ සියලු මට්ටම්වල ඵලදායක ආයතනික පාලන සංස්කෘතියක් පවත්වා ගැනීම තහවුරු කිරීම
- මහජනතාවගේ විශ්වාසය හා ඔවුන් කෙරෙහි වගකීම රැකගනිමින්, ආරක්ෂාකාරී හා මනා පිළිවෙළකට ක්‍රියාත්මකවන බව තහවුරු කිරීම පිණිස බැංකුවේ ආයතනික ක්‍රියාකාරකම් හා චර්යාවන් පෙළගැස්වීම
- රට තුළ පවත්නා නීති හා රෙගුලාසිවලට අනුකූලව ශාඛා ජාලය ක්‍රියාත්මක වන බව සහතික කිරීම පිණිස ශාඛාවන් තක්සේරු කිරීම
- අදාළ දෙපාර්තමේන්තු විසින් අනුකූලතාවන්ට අනුගතවනු ලැබීම තහවුරු කිරීමේ වාරික ක්‍රියාවලින් සිදුකිරීම හා හඳුනාගනු ලබන යම් උල්ලංඝනය කිරීම් ඇත්තේ වී නම් ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරවීම
- ශ්‍රී ලංකා මහ බැංකු නියෝග අනුව අනුකූලතාව තහවුරු කිරීමේ වාර්තාවන් බැංකු අධීක්ෂණ අංශයට භාර දීම
- කාර්ය මණ්ඩලයෙන් ලැබෙන, අභ්‍යන්තර වශයෙන් සැක සහිත ගනුදෙනු පිළිබඳ වාර්තා අනුව, අසාමාන්‍ය/විශාල මෙන් ම අසාමාන්‍ය ගනුදෙනු රටාවන් සහිත හා පැහැදිලිව පෙනී යන කිසිදු ආර්ථික හෝ නීතිමය පදනමක් නොමැති ගනුදෙනු අධීක්ෂණය කිරීම, ඒවා ලබා ගැනීම හා විශ්ලේෂණය කර විමර්ශනය කිරීම
- සැක සහිත ගනුදෙනු වහාම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කිරීම
- කාලීන ව හා නිරවද්‍ය ව සියලු දත්තයන් ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කිරීම

අනුකූලතා ශ්‍රිතයේ මගපෙන්වීම අනුව, මහජන බැංකුව විසින් පහත සඳහන් සැකසුම් නිමාකර තිබේ.

- ආයතනික පාලනය පිළිබඳ ප්‍රශස්ත පරිච සංග්‍රහය
- මුදල් විශුද්ධිකරණ විරෝධී හා 'ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න' පිළිබඳ ප්‍රතිපත්ති
- ආචාරධර්ම සංග්‍රහය
- අනුකූලතා ප්‍රතිපත්ති
- අනුග්‍රාහක අධිකාර පත්‍රය
- මුදල් විශුද්ධිකරණ විරෝධතා, 'ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න', සහ වෙස්ටර්න් යුනියන් ගනුදෙනු හා අදාළ E-learning මොඩියුල

## 2013

2013 වසර තුළදී, සෙසු වගකීම් වලට අමතරව, අනුකූලතා දෙපාර්තමේන්තුව විසින්, පහත සඳහන් කරුණු කාරණා ඉටුකරනු ලැබ ඇත.

- අනුකූලතා ශ්‍රිතය හා අදාළ වන විෂයයන් පිළිබඳව, ශාඛා ජාලයට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 1,673 දෙනෙකු වෙනුවෙන් පුහුණුව ලබාදෙමින්, පුහුණු සැසිවාර 20ක් පැවැත්වීම,
- ශාඛා 46ක අනුකූලතා ප්‍රමිතීන් තක්සේරු කරන ලද අතර, සාවද්‍යතා නිවැරදි කරනු පිණිස උපදෙස් ලබාදීම, සහ
- මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත යටතේ ක්‍රියාත්මක වෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට, සැක සහිත ගනුදෙනු 37ක් වාර්තා කරනු ලැබීම.

දැනට රට තුළ බලපවත්නා අනුකූලතා අවශ්‍යතාවන්ට අනුගත වෙමින් මහජන බැංකුව කටයුතුකර ඇති අතර, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී මූල්‍යකරණය මර්දනය කිරීම සඳහා අවශ්‍ය උපරිම සහාය ලබාදෙනු වස්, පද්ධතීන් හා ක්‍රියා පිළිවෙත් සකස් කර තිබේ. මේ හා අදාළ වන සියලුම නියමයන් හා රෙගුලාසි අනුගමනය කරනු ලබන අතර, රාජ්‍ය බැංකුවක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධතීන්හි ස්ථාවරත්වය තහවුරු කරනු පිණිස නියාමන බලධාරීන්ට පූර්ණ සහාය ලබාදීමට පියවර ගනුලැබ ඇත.

# මහජනයාට හා මහපොළවට සෞභාග්‍යය උදා කර දීම

පුළුල් සමාජය තුළ අපගේ පිහිටීම හා පරිසරය මත අපගේ ක්‍රියාකාරකම් මගින් ඇති කෙරෙන බලපෑම පිළිබඳව අපි අතිශයින් ම සවිඥානකව සිටින්නෙමු. බැංකුවේ අන්තර්ගත චින්තනය වන්නේ සියලු ව්‍යාපාර හා ප්‍රයත්නයන් හරහා මහජනතාවගේ හා මහපොළොවේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමයි.




Financing Business Growth & Innovation
Community Development

# ආයතනික පාලනය

**අති විශාල ලාභ දායකත්වය හා මනා ව්‍යාපාර පරිචයන්: මෙම සංකල්ප ද්විත්වය සමෝධානික වශයෙන් එකිනෙකට සම්බන්ධවන අතර, එකිනෙකින් වෙන්කළ නො හැකිය. ආයතනයන්හි කොටස්කරුවන්, කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර පවත්නා සබඳතාව හා අදාළ කරුණු කාරණා, ලොව වටා පවත්නා මූල්‍ය පද්ධතීන්හි විවිධත්වයේ පතුළටම ගිලා බසී.**

මෑතක පැවති ගෝලීය මූල්‍ය අර්බුදයන් විසින් කාර්මිකමෙන් ම, නැගී එන හා වර්ධිත ආර්ථිකයන්ට ද එක හා සමාන ව බලපාන පරිදි, ආයතනික පාලන කරුණු කාරණාවන්හි අදාළත්වය පෙරමුණටම රැගෙන එනු ලැබ තිබේ.

යහපත් ආයතනික පාලනය වනාහී ආයතනයක මූල්‍ය හා පෞද්ගලික සාර්ථකත්වයේ සබඳතාවකි. අති විශාල ලාභ දායකත්වය හා මනා ව්‍යාපාර පරිචයන්: මෙම සංකල්ප ද්විත්වය සමෝධානික වශයෙන් එකිනෙකට සම්බන්ධවන අතර. එකිනෙකින් වෙන් කළ නො හැකිය. ආයතනයන්හි කොටස්කරුවන්, කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර පවත්නා සබඳතාව හා අදාළ කරුණු කාරණා, ලොව වටා පවත්නා මූල්‍ය පද්ධතීන්හි විවිධත්වයේ පතුළටම ගිලා බසී. මූල්‍ය පාදක මෙම ක්ෂේත්‍රයෙහි විෂය පථය, ප්‍රවනතාව හා වර්ධනය පිළිබඳ විමසා බැලීමෙන් හා පොදු ආයතනික අසාර්ථකත්වයන් හා ඒවාට ගැලපෙන විසඳුම් දෙස වඩාත් සමීපව සොයා බැලීමෙන්, ආයතනයන්හි අයිතිය, පාලනය හා නියාමනය ව්‍යුහගත කිරීම සඳහා සුදුසු විවිධ ප්‍රවේශයන් අවබෝධකරගැනීමට මෙන් ම ඇගයීමට ද අවශ්‍යවන විශ්ලේෂණ කුසලතා සහ කාර්මික දැනුමද සහභාගීවන්නන්ට හිමිවනු ඇත. ආයතනික පාලනය පිළිබඳ මෙම පාඨමාලාව මගින් ඉහත කී සංකල්පයේ මූලික ගති ලක්ෂණයන් සඳහා යහපත් පදනමක් නිර්මාණය කෙරේ.

**නිර්වචනය: සමාගමක් මෙහෙයවනු ලබන හා පාලනය කෙරෙන නියමයන්, පරිචයන් සහ ක්‍රියාවලීන් පද්ධතියයි.**

**ආයතනික පාලනය අවශ්‍යයෙන්ම අදාළ වනුයේ සමාගමක බහුවිධ පාර්ශ්වකරුවන්ගේ අයිතීන් තුලනය කිරීමට යි. ඔවුන් නම්, පාර්ශ්වකරුවන්, කළමනාකරුවන්, අනුග්‍රාහකයින්, සපයන්නන්, මූල්‍ය සම්පාදකයින්, රජය හා ප්‍රජාවයි. ආයතනික පාලනය විසින් සමාගමේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවශ්‍යවන ආකෘතික රාමුව පවා සම්පාදනය කෙරෙන හෙයින්, කාර්ය සාධන සැලසුම් සහ අභ්‍යන්තර පාලනයන්හි සිට කාර්ය ඵලය මැනීම සහ ආයතනික අනාවරණයන් දක්වා ඇති සෑම කළමනාකරණ ක්ෂේත්‍රයක්ම පොදු වශයෙන් ඊට අන්තර්ගත වෙයි.**

ආයතනික පාලන ප්‍රතිපත්තීන් -

- අයිතීන් හා කොටස්කරුවන්ට සමානලෙස සැලකීම
- සෙසු අයිතිකරුවන්ගේ කැමැත්ත
- අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව හා වගකීම්
- අභිමානය හා සදාචාරාත්මක චර්යාව
- අනාවරණය සහ පාරදෘශ්‍යභාවය

## ආයතනික පාලන ආකෘති රාමුව




බොහෝ සමාගම්වල උත්සාහය වනුයේ උසස් මට්ටමේ ආයතනික පාලනයක් පවත්වා ගැනීමයි. වර්තමානයේ, සමාගමක් ලාභදායීවීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, පාරිසරික දැනුවත්භාවය, සදාචාරාත්මක චර්යාව සහ මනා ආයතනික පාලන පරිචයන් ඔස්සේ යහපත් ආයතනික පුරවාසි ස්වභාවය ප්‍රදර්ශනය කිරීමද අවශ්‍ය වන්නේය. ඒ අනුව, රාජ්‍ය බැංකුවක් වශයෙන්, උසස් මට්ටමේ ආයතනික පාලනයක් පවත්වා ගැනීම තුළින් ස්වකීය සම-කණ්ඩායම්වලට වඩා තරඟකාරී වාසියක් තමන්ට ලබාගතහැකි බව මහජන බැංකුව විශ්වාස කරයි.

## ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද, ආයතනික පාලනය හා අදාළ විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට, බැංකුවේ අනුගතවීම

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| **(අ) පොදු** | | | |
| සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යනු එකම තැනැත්තකු වන්නේ නම්, සභාපති/ප්‍ර.වි.නි. ගේ සහ පත් කරන ලද ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ නම ද, එම තනතුරු ඒකාබද්ධ කිරීමට පාදක වූ සාධාරණ හේතු ද හෙළිදරව් කිරීම. | A.2.1 හා A.5.7 | සභාපති සහ ප්‍ර.වි.නි./ සාමාන්‍යාධිකාරී යන තනතුරු පුද්ගලයන් දෙදෙනෙකු විසින් උසුලනු ලැබේ. |
| අධ්‍යක්ෂ මණ්ඩල තුලනය | • ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හඳුනාගත යුතුය.<br>• පහත සඳහන් සාධක කවරක් පැවතියේවුවද, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු 'ස්වාධීන' ලෙස හඳුනාගනු ලැබේ නම්, එබඳු තීරණයක් ගැනීමට හේතු හෙළිදරව් කළ යුතුය.<br>• පහත සඳහන් කරුණුවලට අදාළ වන්නේ නම්, යම් අධ්‍යක්ෂකවරයෙක්/වරියක් 'ස්වාධීන' ලෙස සලකනු නොලැබේ:<br>- අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබීමට ආසන්නතම පූර්ව වර්ෂ දෙකක කාලසීමාව තුළ සමාගමේ, පරිපාලිතයේ හෝ මව් සමාගමේ හෝ සේවය කර තිබේ නම්,<br>- දැනට හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබීමට ආසන්නතම පූර්ව වර්ෂ දෙකක කාල සීමාව තුළ හෝ සෘජුව නැතහොත් වක්‍රව සමාගම සමග වැදගත් ව්‍යාපාරික සබඳතාවක් පවත්වා තිබේ නම්,<br>- සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරී හෝ ප්‍රධාන කළමනාකාර තනතුරක් හෝ දරන (හා/හෝ සමාන තනතුරක් දරන) පවුලේ සමීප සාමාජිකයෙකු සිටී නම්,<br>- සමාගමේ සැලකිය යුතු කොටස් ප්‍රමාණයක හිමිකාරිත්වය තිබේ නම් හෝ සමාගමේ සැලකිය යුතු කොටස් ප්‍රමාණයක් හිමි අන් අයෙකුගේ හෝ නිලධාරියෙකුගේ සෘජු ආශ්‍රිතයෙකු වන්නේ නම්,<br>- පළමු පත්වීමේ දින සිට වසර නවයකට වැඩි කාල පරිච්ඡේදයක් තුළ අඛණ්ඩව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර තිබේ නම්. | A.5.5 | 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේ බලය මුදල් අමාත්‍යවරයාට පැවරී ඇත. |

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | • පහත සඳහන් පරිදි වෙනත් සමාගමක් හෝ ව්‍යාපාරයක සේවය කරයි නම් -<br>- සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් අධ්‍යක්ෂවරුන් වශයෙන් සේවය කරන්නේ නම්, හෝ<br>- සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගේ බහුතරයකට සැලකිය යුතු කොටස්හිමිකමක් හෝ සැලකිය යුතු ව්‍යාපාරික සබඳතා හෝ සහිත වන්නේ නම්, හෝ<br>- සමාගමේ සැලකිය යුතු කොටස්හිමිකමක් හෝ සමාගම සමග ව්‍යාපාරික සබඳතාවක් ඇති වෙනත් සමාගමක හෝ ව්‍යාපාරයක සේවය කරයි නම්.<br>• වෙනත් සමාගමක අධ්‍යක්ෂවරයෙකු වන්නේ නම් -<br>- එම සමාගමේ සෙසු අධ්‍යක්ෂවරුන් බහුතරය සේවය කරන හෝ අධ්‍යක්ෂවරුන් වන්නේ නම්, හෝ<br>- සමාගමේ ව්‍යාපාරික සබඳතාවක් හෝ සැලකිය යුතු කොටස්හිමිකමක් ඇත්තේ නම්.<br>• වෙනත් සමාගමක හෝ ව්‍යාපාරයක ව්‍යාපාරික සබඳතා හෝ සැලකිය යුතු කොටස්හිමිකම තිබේ නම් -<br>- සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් බහුතරයක් සේවය කරන හෝ අධ්‍යක්ෂවරුන් වන හා/හෝ,<br>- සමාගම සමග ව්‍යාපාරික සබඳතාවක් හෝ එහි සැලකිය යුතු කොටස්හිමිකාරිත්වයක් සහිත. | | |
| නාම යෝජනා කමිටුව | නාම යෝජනා කමිටුවේ සභාපති හා සාමාජිකයින් හඳුනාගත යුතුය. | A.7.1 | අනුකූලතාව දක්වා ඇත. |
| නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම | නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමේදී මෙම තොරතුරු හෙළිදරව් කළ යුතුය:<br>• එබඳු එක් එක් අධ්‍යක්ෂවරයා පිළිබඳ කෙටි විස්තරයක්;<br>• අදාළ කාර්ය ක්ෂේත්‍රයන් පිළිබඳ ඔහුගේ විශේෂඥතාවයෙහි ස්වභාවය,<br>• එම අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ තනතුරු හෝ මාණ්ඩලික කමිටුවල සාමාජිකත්වය දරන සමාගම්වල නම්; හා<br>• එබඳු අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන ලෙස සැලකිය හැකිද යන්න. | A.7.3 | අනුකූලතාව දක්වා ඇත.<br>මහජන බැංකු පනතේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ. |
| මාණ්ඩලීය කාර්යසාධනය තක්සේරු කිරීම | කාර්යසාධනය ඇගයීම සිදු කරන ලද්දේ කෙසේද යන්න හෙළිදරව් කළ යුතුය. | A.9.3 | අධ්‍යක්ෂ මණ්ඩලය සමස්තයක් වශයෙන් කාර්යසාධනය සහ ඵලදායකත්වය තක්සේරු කිරීමට ඇගැයීම සිදු කරයි. |

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| මණ්ඩලය හා අදාළ අනාවරණයන් | එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර අනාවරණය කළ යුතුය:<br>• නම, සුදුසුකම් හා කෙටි විස්තරයක්<br>• අදාළ කාර්ය ක්ෂේත්‍රයන්හි ඔහුගේ/ඇයගේ විශේෂඥතාවයේ ස්වභාවය<br>• බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සමග ඇති සමීපස්ථම පවුල් සබඳතාව හා/හෝ සැලකිය යුතු ව්‍යාපාර සබඳතා<br>• අධ්‍යක්ෂවරයා විධායකද, විධායක නොවන නැතහොත් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුද යනබව<br>• අදාළ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සමාගම්වල නම්<br>• අදාළ අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන සෙසු සමාගම්වල නම්. (සමාගම අයිති සමූහ ව්‍යාපාරයේ අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂ ධුරය දරන්නේ නම්, එම සමාගම්වල නම් සඳහන් කිරීම අවශ්‍ය නැත. එම සමාගම්වල අධ්‍යක්ෂ ධුරය දරන බව පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය.)<br>• වර්ෂය තුළදී සහභාගි වූ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව/ප්‍රතිශතය;<br>• එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සමාගම්වල හොබවනු ලබන සම්පූර්ණ අධ්‍යක්ෂ තනතුරු සංඛ්‍යාව - ඒවා ලැයිස්තුගත සමාගම්ද නැතිද යන බව සහ එම තනතුරු හොබවනුයේ විධායක මට්ටමින්ද නැතහොත් විධායක නොවන මට්ටමින් ද යනබව සඳහන් කළ යුතුය.<br>• අධ්‍යක්ෂවරයා සභාපති හෝ සාමාජිකයෙකු ලෙස සේවය කරන මාණ්ඩලීය කමිටුවල නම්;<br>• වර්ෂය තුළදී සහභාගිවූ කමිටු රැස්වීම් සංඛ්‍යාව/ප්‍රතිශතය. | A.10.1 | අනුකූලතාව දක්වා ඇත. 2013 වාර්ෂික වාර්තාවේ මේ සම්බන්ධයෙන් පරිපූර්ණ තොරතුරු අඩංගු වේ. |
| පාරිශ්‍රමික අනාවරණය | • පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශනයක්<br>• සමස්තයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික විස්තරන<br>• පාරිශ්‍රමික කමිටුව සංයුක්තවන අධ්‍යක්ෂවරුන්ගේ නම් (නැතහොත් සමූහ සමාගමක නම්, මව් සමාගමේ කමිටු සාමාජිකයින්ගේ නම්)ත පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශනයක් අන්තර්ගත කරන්න, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකයේ මුළු සංඛ්‍යාව. | B.3 හා B.3.1 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අධ්‍යක්ෂවරුන්ට ගෙවිය යුතු දීමනා තීරණය කරයි. |
| ප්‍රධාන හා වැදගත් ගනුදෙනු | සමාගම විසින් සිදුකරනු ලබන සියලුම වැදගත් ගනුදෙනු හෙළිදරව් කළ යුතුය. තවද, සමාගම විසින් සබඳතා පවත්වනු ලබන පාර්ශ්වයක් සමග 'ප්‍රධාන පාර්ශ්ව සබඳතා ගනුදෙනුවක්' සිදුකිරීමට හෝ එවැන්නක් සඳහා අදහස් කිරීමට හෝ ප්‍රථම, එවැනි ගනුදෙනුවක අරමුණ සහ ඊට අදාළ සියලුම වැදගත් කරුණු අනාවරණය කළ යුතුය. | C.3 හා C.3.1 | අනුකූලතාව දක්වා ඇත. |

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| විගණන කමිටුව | • විගණන කමිටු සාමාජිකයින්ගේ නම් අනාවරණය කළ යුතුය.<br>• විගණන නිලධාරීන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීමේ පදනම. | D.3.4 | විගණන කමිටු සාමාජිකයින්ගේ නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ පිටු අංක 153 හි දක්වා ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විගණකාධිපතිවරයා බැංකුවේද විගණන නිලධාරියා ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කර තිබේ. විගණකාධිපතිවරයා විසින් බැංකුවේ බාහිර විගණනය සඳහා KPMG විගණන සමාගම පත් කරනු ලැබ ඇත. |
| ව්‍යාපාර චර්යා හා ආචාරධර්ම සංග්‍රහය | • අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායම සඳහා ව්‍යාපාර චර්යා හා ආචාර ධර්ම සංග්‍රහයක් බැංකුව සතුව තිබේ දැයි හෙළිදරව් කළ යුතුය.<br>• ඔවුන් එබඳු සංග්‍රහයක් අනුගමනය කරන බව සහතික කෙරෙන ප්‍රකාශනයක්ද අනාවරණය කළ යුතුය.<br>• මෙම සංග්‍රහයේ විධිවිධාන කිසිවක් කවර ආකාරයකින් හෝ උල්ලංඝනය කරනු ලබන බවක් සභාපතිවරයා නොදන්නා බවට සහතික කළ යුතුය. | D.4.1 හා D.4.2 | අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් වෙනුවෙන් ආචාරධර්ම සංග්‍රහයක්ද, සේවකයන් වෙනුවෙන් චර්යා ධර්ම සංග්‍රහයක්ද බැංකුව සතුව තිබේ. |
| අඛණ්ඩ පැවැත්ම | අවශ්‍ය පරිදි ආධාරක උපකල්පනයන් හා යෝග්‍යතා සහිතව බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව වාර්තා කළ යුතුය. | D.1.5 | බැංකුව අඛණ්ඩ පැවැත්මකින් යුක්ත ය. |
| කොටස්කරුවන් සමග සන්නිවේදනය | කොටස්කරුවන් සමග සන්නිවේදනයෙහි යෙදීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රමවේදය හෙළිදරව් කළ යුතුය.<br>ඉහතකී ප්‍රතිපත්තිය සහ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ආකාරය සමාගම විසින් හෙළිදරව් කළ යුතුය.<br>එබඳු සන්නිවේදනයකදී සම්බන්ධීකාරක පුද්ගලයා කවුරුන්දැයි සමාගම විසින් හෙළිදරව් කළ යුතුය.<br>කොටස්කරුවන්ගේ කරුණු කාරණා සහ අදහස් පිළිබඳව සියලු අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් තිබිය යුතු අතර, මෙම ක්‍රියාවලිය සමාගම විසින් හෙළිදරව් කළ යුතුය.<br>කොටස්කරුවන්ගේ කරුණු කාරණා ගැන සබඳතා පැවැත්විය යුතු පුද්ගලයා කව්රුන්දැයි සමාගම තීරණය කළ යුතුය.<br>කොටස්කරුවන්ගේ කරුණු කාරණා කෙරෙහි ප්‍රතිචාර දක්වන ක්‍රියාවලිය හෙළිදරව් කළ යුතුය. | C.2.2, C.2.3, C.2.4, C.2.5, C.2.6, C.2.7 | අනුකූලතාව දක්වා ඇත. අනුමත කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. |

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|

## ආ. පාරිශ්‍රමික කමිටු වාර්තාව

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන් | පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන්ගේ නම්, පාරිශ්‍රමික කමිටු වාර්තාවේ හෙළිදරව් කළ යුතුය. | B.1.3 | අනුකූලතාව දක්වා ඇත. පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන්ගේ නම්, මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ පිටු අංක 152 සිට 154 දක්වා අනාවරණය කර ඇත. |

## ඈ. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්තාව | අධ්‍යක්ෂවරුන් විසින් කරනලද පහත සඳහන් ප්‍රකාශ අඩංගු විය යුතුය:<br>● නීති හා රෙගුලාසි උල්ලංඝනය කෙරෙන කවර හෝ ආකාරයේ කාර්යයක් සමාගම විසින් සිදුකර නොමැත;<br>● සමාගම සම්බන්ධවන කොන්ත්‍රාත්තුවල සියලු වැදගත් කරුණු අධ්‍යක්ෂවරුන් ප්‍රකාශයට පත්කර ඇති අතර; ඔවුන්ට වැදගත්වන කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන්ද වැළකීසිට ඇත;<br>● කොටස්හිමියන්ට සාධාරණ ලෙස සැලකීම තහවුරු කිරීමට සමාගම සියලු ප්‍රයත්නයන් දරා ඇත;<br>● අවශ්‍ය පරිදි ආධාරක උපකල්පනයන් හා යෝග්‍යතාවන් සහිතව ව්‍යාපාරය අඛණ්ඩ පවත්වාගනු ලැබේ. සහ<br>● මූල්‍ය, මෙහෙයුම් හා අනුකූලතා පාලනය සහ අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි ඔවුන් විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයක් සිදුකරනලද අතර, ඒවායේ ඵලදායකත්වය හා සාර්ථක අනුගමනය සම්බන්ධයෙන් සාධාරණ සහතික වීම ලබාගෙන තිබේ. | D.1.2 | අනුකූලතාව දක්වා ඇත. |

## ඈ. මූල්‍ය ප්‍රකාශන

| | | | |
|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන | ● මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමේ ප්‍රකාශනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇතුළත් කරනු ලැබිය යුතුය.<br>● විගණන නිලධාරීන්ද ඔවුන්ගේ වාර්තාකරණ වගකීම සම්බන්ධ ප්‍රකාශනයක් ඇතුළත් කළ යුතුය. | D.1.3 | අනුකූලතාව දක්වා ඇත. |
| අදාළ පාර්ශ්ව ගනුදෙනු | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, සු.වි.කො. රෙගුලාසි සහ සෙසු අදාළ රෙගුලාසිද විසින් නියම කර ඇති පරිදි, සම්බන්ධිත පාර්ශ්වයන් හා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හෙළිදරව් කළ යුතුය. | D.1.7 | අඩ වශයෙන් අනුකූලතාව දක්වා ඇත.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හෙළිදරව් කර ඇත. |

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|

## ඉ. කළමනාකරණ වාර්තාව

| | | | |
|---|---|---|---|
| කළමනාකරණ වාර්තාව | කළමනාකරණ වාර්තාව, අවම වශයෙන් පහත සඳහන් කරුණු සාකච්ඡා කරමින් 'කළමනාකරණ සාකච්ඡාවක් සහ විශ්ලේෂණ වාර්තාවක්' අන්තර්ගත කළ යුතුය:<br>● කර්මාන්ත ව්‍යුහය හා වර්ධනයන්;<br>● අවස්ථා හා තර්ජන;<br>● අවදානම් හා සැලකියයුතු ප්‍රවනතාවන්;<br>● අභ්‍යන්තර පාලන පද්ධතිය හා ඒවායේ ප්‍රමාණවත් බව;<br>● බැංකුව විසින් සිදු කෙරෙන සමාජ හා පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්;<br>● මූල්‍ය කාර්යසාධනය;<br>● මානව සම්පත්/කාර්මික සබඳතා හා අදාළ වැදගත් වර්ධනයන්; හා<br>● අනාගත භව්‍යතාවන්. | D.1.4 | අනුකූලතාව දක්වා ඇත. |

## ඊ. ආයතනික පාලන වාර්තාව

| | | | |
|---|---|---|---|
| ආයතනික පාලන වාර්තාව | සංග්‍රහයේ ප්‍රතිපත්ති හා විධිවිධානවලට අනුකූලව බැංකුව ක්‍රියාකර ඇති ආකාරය හා පරිමාණයන් හෙළිදරව් කළ යුතුය. | D.5.1 | අනුකූලතාව දක්වා ඇත. |

## උ. විගණන කමිටු වාර්තාව

| | | | |
|---|---|---|---|
| විගණන කමිටු වාර්තාව | කමිටුව විසින් ඉටුකරනලද කාර්යයන් පැහැදිළි කළ යුතුය. | D.3.3 | අනුකූලතාව දක්වා ඇත. |

## ඌ. අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය | පහත සඳහන් කරුණු අවම වශයෙන් හෝ හෙළිදරව් කළ යුතුය.<br>(අ) අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලැස්ම හා ඵලදායකත්වය සමාලෝචනය කිරීම සඳහා යොදා ගෙන ඇති ක්‍රියාවලිය මණ්ඩලය විසින් සාරාංශගත කළ යුතුය.<br>(ආ) වාර්ෂික වාර්තාවේ අනාවරණයකර ඇති කිසියම් සුවිශේෂ ගැටළුවක වැදගත් අභ්‍යන්තර පාලන අංශයක් පිළිබඳව ක්‍රියාකිරීමට යොදා ගෙන ඇති ක්‍රියාවලියද හෙළිදරව් කළ යුතුය.<br>(ඇ) සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියට හා එහි සැලැස්ම හා ඵලදායකත්වය සමාලෝචනය කිරීමට මණ්ඩලය වගකියන බවට සහතිකයක් ලබා දියයුතුය. එවැනි පද්ධතියක් සැලසුම් කර ඇත්තේ, කළමනාකරණය සඳහා මිස, ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීමට අසමත්වීමේ අවදානම බැහැරලීමට නොවන බවත්, පාඩු ලැබීම පිළිබඳව සිදු කෙරෙන වැරදි ප්‍රකාශයන්ට එරෙහි පූර්ණ නොව, සාධාරණ සහතිකයක් වශයෙන් බවත් පැහැදිළි කළ යුතුය. | | අනුකූලතාව දක්වා ඇත.<br>පිටු අංක 156 සිට 157 දක්වා අභ්‍යන්තර පාලනය පිළිබඳ ව අධ්‍යක්ෂගේ ප්‍රකාශය බලන්න. |

| විෂය | ආයතනික පාලන ප්‍රතිපත්තිය | ශ්‍රී ලං.ව.ග.ආ. හා ශ්‍රී ලං.සු.වි.කො.ස. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | (ඇ) සමාගම මුහුණ පාන සුවිශේෂ අවදානම් හඳුනාගැනීමට, ඇගයීමට හා කළමනාකරණය කිරීමට දැනට බලපවත්වන ක්‍රියාවලියක් පවත්නා බවත්, සමාලෝචනයට භාජනයවන වසර තුළදී එය ක්‍රියාත්මකවූ බවත්, මණ්ඩලය විසින් එය නිතිපතා සමාලෝචනයට භාජනයකරනු ලබන බවත් අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කළ යුතුය.<br>(ඉ) සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලැස්ම හා ඵලදායකත්වය සමාලේචනය කිරීමට මණ්ඩලය අසමත්වූයේ නම්, මණ්ඩලය විසින් එය අනාවරණය කළ යුතුය.<br>(ඊ) මණ්ඩලයේ අනාවරණයන් අර්ථවත් උසස් මට්ටමේ තොරතුරු සම්පාදනය කරන බවත්, නොමග යැවෙන කරුණු ඉදිරිපත් නොකෙරෙන බවත් මණ්ඩලය විසික් තහවුරුකරනු ලැබිය යුතුය.<br>(උ) මෙම උපදෙස් යොදා ගැනීමේදී, සමූහයේ කොටස් වශයෙන්, වැදගත් පාලිත සමාගම්, බද්ධ ව්‍යාපාරයන් සහ ආශ්‍රිත ව්‍යාපාර අදාළකර නොගන්නේ නම්, ඒ බවද අනාවරණය කළ යුතුය.<br>(ඌ) මණ්ඩලය විසින් තහවුරුකරනු ලැබීම: මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම්කර ඇත්තේ, : මූල්‍ය වාර්තාකරණ වගකීම හා අදාළව සාධාරණ සහතිකයන් ලබාදීමට බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සැලසුම් කිරීම සිදුකර ඇත්තේ යොදාගත හැකි ගිණුම් ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව බවත් මණ්ඩලය විසින් සිය වාර්තාවෙන් තහවුරු කරනු ලැබීය යුතුය.<br>(එ) මූල්‍ය ප්‍රකාශන අත්සන්කළ අධ්‍යක්ෂවරුන් විසින් හා විගණන කමිටුවේ සභාපති විසින් අත්සන් කරනු ලැබිය යුතුය. | D.1.3 & D.2.3 | |

## එ. තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය

| | | | |
|---|---|---|---|
| තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය | පහත දැක්වෙන කරුණු හා අදාළව, තිරසාරමය ව්‍යාපාරයක් පවත්වා ගැනීමට යොදා ගැනෙන ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් අනාවරණය කළ යුතුය.<br>• තිරසාර ආර්ථික කාර්ය සාධනය<br>• පරිසරය<br>• ශ්‍රමික පරිචයන්<br>• සමාජය<br>• නිමැවුම් වගකීම<br>• පාර්ශ්වකරුවන් හඳුනාගැනීම, ඔවුන් සමග කටයුතු කිරීම සහ ඵලදායී සන්නිවේදනය<br>තිරසාර වාර්තාකරණය සහ අනාවරණයන් විධිමත් කළ යුත්තේ, සමාගමේ වාර්තාකරණ ක්‍රියාවලීන්හි කොටසක් වශයෙන් සහ එය නිතිපතා සිදුකළ යුතුය. | G.1 සිට G.1.7 | අනුකූලතාව දක්වා ඇත.<br>පිටු අංක 79 සිට 105 දක්වා ඇති තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය බලන්න. |

## මාණ්ඩලීය අනුකමිටු




## 2013 වර්ෂය තුළදී පවත්වනලද අධ්‍යක්ෂ මණ්ඩල හා අනුකමිටු රැස්වීම් සංඛ්‍යාව

| කමිටුවේ නම | රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | 14 |
| මාණ්ඩලීය විගණන කමිටු (මා.වි.ක.) | 6 |
| මාණ්ඩලික විධායක ණය කමිටු (මා.වි.ණ.ක.) | 23 |
| මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (මා.මා.ස.පා.ක.) | 11 |
| මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටු (මා.ස.අ.ක.ක.) | 3 |
| මාණ්ඩලීය නාමයෝජනා කමිටු (මා.නා.ක.) | 3 |
| මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටු (මා.ආ.බැ.ක.) | 2 |
| මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටු (මා.තො.තා.ක.) | – |

## 2013 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල හා අනුකමිටු රැස්වීම්වලට පැමිණීම

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල | මාවික | මාවිණක | මාමාසපාක. | මාසඅකක | මානාක. | මාආබැක. | මාතොතාක. |
|---|---|---|---|---|---|---|---|---|
| ගාමිණී සෙනරත් මහතා | 13/13 | සා/නො | සා/නො | 1/1 | සා/නො | 2/2 | සා/නො | – |
| ජෙහාන් පී. අමරතුංග මහතා | 12/13 | 6 | සා/නො | සා/නො | 2/3 | 2/2 | 2 | – |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | 12/13 | සා/නො | 22/23 | සා/නො | සා/නො | සා/නො | සා/නො | – |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | 12/13 | 4/6 | සා/නො | 8/10 | 1/1 | 1/1 | සා/නො | – |
| පවර දසනායක මහතා | 14/14 | සා/නො | 10/11 | 8/10 | සා/නො | සා/නො | සා/නො | – |
| ජී. කේ. ඩී. අමරවර්ධන මහතා | 11/12 | 4/4 | සා/නො | 10/10 | සා/නො | 2/2 | සා/නො | – |
| ආර්. එම්. පී. රත්නායක මහතා | 8/10 | 3/4 | සා/නො | සා/නො | 2/2 | 0/2 | 1/1 | – |
| පී. කුඩාබාලගේ මහතා | 9/10 | සා/නො | 15/15 | සා/නො | 2/2 | 1/1 | 1/1 | – |
| ඩබ්ලිව්. කරුණාජීව මහතා | 1/1 | සා/නො | 2/2 | – | සා/නො | සා/නො | සා/නො | – |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | 9/10 | සා/නො | 19/19 | 7/7 | 2/2 | 2/2 | සා/නො | – |
| අජිත් පණ්ඩිතරත්න මහතා | 5/5 | සා/නො | සා/නො | 1/1 | සා/නො | සා/නො | සා/නො | – |
| විසාඛා අමරසේකර මෙනවිය | 3/4 | 2/2 | සා/නො | සා/නො | 0/1 | 1/1 | 1/1 | – |
| ප්‍රියන්ත මායාදුන්න මහතා | 2/2 | සා/නො | සා/නො | සා/නො | සා/නො | සා/නො | සා/නො | – |

*සා/නො - මාණ්ඩලීය අනු කමිටුවේ සාමාජිකයෙකු නොවේ.*

# අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය වනාහී බැංකුවේ මූලිකම චර්යා රටාවකි. බැංකුවේ අවදානම පිළිබඳ පැතිකඩ කෙරෙහි බලපෑම් සිදුකරන සියලු ක්‍රියාකාරකම් ඊට අයත් වේ. සංවිධානය පුරා පවතින අවදානම පිළිබඳ අන්තර් සබඳතා කෙරෙහි අවධානය යොමු කෙරෙන සුදුසු ව්‍යුහයන් එහි ශ්‍රිතයන් මගින් තහවුරු කරනු ලබයි.

## 1. අවදානම පිළිබඳ නිර්වචනය

අවදානම යනු කිසියම් ක්‍රියාවක හෝ සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් අහිතකර බලපෑමක් අත්දැකීමට ඇති හැකියාවයි. එවැනි ප්‍රතිඵලයක් නිසා, ඉපැයීම්/ප්‍රාග්ධනය ඍජුවම හානියට පත්වීමට හෝ බැංකුවේ ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගැනීමට පවත්නා හැකියාව මත බාධක උද්ගතවීමට හෝ අවකාශ තිබේ. එවන් බාධාවන් නිසා බැංකුවේ සිදු කෙරෙන ව්‍යාපාර පවත්වා ගැනීමට බාධා ඇතිවීම හෝ ව්‍යාපාරය වර්ධනය කර ගැනීම සඳහා ඉස්මතුවන අවස්ථාවන්ගෙන් ප්‍රතිලාභ අයත්කර ගැනීම උගහට වන්නේය.

## 2. පසුබිම

දිවයින පුරා විසිරී පැතිරී සිටින, විවිධත්වයකින් සමන්විත අනුග්‍රාහකයින් සමුච්චයක් සඳහා, පූර්ණ සේවාවන් සම්භාරයක් පිරිනමන මහජන බැංකුව, ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුවලින් එකක් වශයෙන්, ණය සහ වෙළෙඳපොළේ සිට කීර්ති නාමය සහ මෙහෙයුම දක්වා අති මහත් වූ අවදානම් සමුදායකට විවෘතය. එහි වර්ධනය, ස්ථාවරත්වය සහ දිගු කාලීන පැවැත්ම තහවුරු කිරීම අරභයා, මනා අවදානම් කළමනාකරණ පරිචයන් හි අවශ්‍යතාව පිළිබඳ ව, මහජන බැංකුව පූර්ණ දැනුවත භාවයකින් පසුවෙයි.

එක් ගනුදෙනුවක අවදානම් කිහිපයක් ම අන්තර්ගත වියහැකි නිසා පමණක් නොව, එක් ආකාරයක අවදානමකින් වෙනත් අවදානම් රැසක් ම උද්ගත වියහැකි නිසා, වෙන් වෙන් වශයෙන් අවදානම් නිරීක්ෂණය හෝ තක්සේරු කිරීම සිදු නොකෙරේ. විවිධ අවදානම්වල සහසම්බන්ධතා තුළින් අවදානම් අඩු-වැඩි වීම් සිදුවිය හැකි හෙයින්, සියලුම ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල අවදානම් සහසම්බන්ධතා හඳුනාගැනීම හා ඒවාට අවධානය යොමු කිරීම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අනුව වඩාත් සුදුසුය.

අවදානම තක්සේරු කිරීමේදී සහ කළමනාකරණය කිරීමේදී, ආයතනය විවෘතව පවත්නා අවදානම් දෙස, කළමනාකරණය සර්ව ප්‍රකාර ලෙස සිය අවධානය යොමු කරයි. මේ සඳහා අවදානම් කළමනාකරණය කෙරෙහි සමෝධානික ප්‍රවේශයක් අවශ්‍ය වන්නේය. සංවිධානය පුරා පවත්නා අවදානම් අන්තර් සබඳතා අවබෝධ කර ගැනීමට උචිත ව්‍යුහයන් නිසි පරිදි ක්‍රියාත්මකවීම, අවදානම් කළමනාකරණ ශ්‍රිතය විසින් තහවුරු කරනු ලබයි.

අවදානම් කළමනාකරණය වනාහී බැංකුවේ මූලික ම චර්යා රටාවකි. බැංකුවේ අවදානම පිළිබඳ පැතිකඩ කෙරෙහි බලපෑම් සිදුකරන සියලු ක්‍රියාකාරකම් ඊට අයත් වේ. පහත සඳහන් තහවුරු කිරීම් සඳහා අවදානම් හඳුනා ගැනීම, මැන ගැනීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීමද අදාළ වන්නේය.

අ. අවදානමක් ගන්නා හෝ කළමනාකරණය කරන තැනැත්තා එය පැහැදිලිව අවබෝධ කර ගනී.

ආ. සංවිධානයේ අවදානම් විවරත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති සීමාවන් තුළ රඳා පවතී.

ඇ. අවදානම්ගැනීම පිළිබඳ නිගමනයන් නිශ්චිත මෙන්ම පැහැදිලිය.

ඈ. අවදානම්ගැනීම පිළිබඳ නිගමනයන් අධ්‍යක්ෂ මණ්ඩලය නියම කර ඇති ව්‍යාපාරික උපාය මාර්ගවලට හා අරමුණුවලට අනුකූල ය.

ඉ. අපේක්ෂිත ගෙවා නිදහස්වීම්, ගනු ලබන අවදානමට හිලව් වන්නේය.

ඊ. රට තුළ ක්‍රියාත්මක වන සියලුම අදාළ නීති හා රෙගුලාසිද නියමිත පාලන ප්‍රමිතීන්ද අප විසින් අනුගමනය කෙරේ.

උ. අපගේ සියලුම අනුග්‍රාහකයින්, සේවාදායකයින් සහ සෙසු පාර්ශ්වකරුවන් සමග අපගේ සබඳතාවන්හිදී, අප විසින් උසස් ම හා සමානුයෝගී ආචාර ධර්ම පිළිපදිනු ලැබේ.

ඌ. කාර්ය සාධනය සිදු කෙරෙනුයේ මූලික පාලන ප්‍රමිතීන්ට අනුකූලව ය. මෙම පාලන ප්‍රමිතීන් අනුව සැලසුම් කිරීම, අධීක්ෂණය, වෙන්කරනු ලැබීම, විධාන හා අනුමැතිය ලබාදීම, වාර්තාකරණය. සුරක්ෂිතභාවය, සැසඳීම සහ අගය කිරීමද සිදු කෙරේ.

එ. අවදානම් ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් වෙන්කරනු ලැබ ඇත.

බැංකුව විසින් හඳුනාගනු ලැබ ඇති ප්‍රධාන අවදානම් වර්ග කිහිපයක් මෙසේය:

i. ණය අවදානම
ii. වෙළෙඳපොළ අවදානම
iii. සාන්ද්‍රණ අවදානම
iv. ද්‍රවශීලතා අවදානම
v. මෙහෙයුම් අවදානම
vi . පොළී අනුපාතික අවදානම
vii. අනුකූලතා අවදානම
viii. පරිපාලන හා නීති අවදානම

බැංකුව මුහුණ දෙන අවදානම් වර්ග එකිනෙකට වෙනස් ප්‍රභේද දෙකකට වෙන් කළහැකිය. ඒවා නම්:

i. නිසි ව්‍යාපාර පරිචයන් මගින් බැහැර කළහැකි, පැවරියහැකි හෝ වැළැක්වියහැකි අවදානම්, සහ

ii. බැංකුව විසින් අවශෝෂණය කර ගත හැකි සහ සක්‍රිය ලෙස කළමනාකරණය කර ගත හැකි අවදානම්ය.

## 3. පහත සඳහන් පරිදි අප විසින් අවදානම බැහැරලීම, පැවරීම හෝ වැළැක්වීම සිදු කරනු ලැබේ:

i. අකාර්යක්ෂම හෝ සාවද්‍ය මූල්‍ය තීරණගැනීම වැළැක්වීම සඳහා ක්‍රියාවලීන්, ගිවිසුම් හා ක්‍රියාපිළිවෙත් ප්‍රමිතිකරණය කිරීම,

ii. අනවශ්‍ය අවදානම් සාන්ද්‍රණයන් අඩුකිරීම සඳහා, දැඩි විවිධාංගීකරණ ඉලක්ක සහිත කළඹ සකස් කිරීම,

iii. නිපැයුම් මිල නියමකිරීම හා සැලසුම.

ආවේණික අවදානම් කළමනාකරණය කිරීමේදී අප විසින් අපගේම සම්පත් හා විශේෂඥතාව භාවිතා කෙරේ. ස්ථාවරත්වය හා වර්ධනය සහතික කෙරෙන සංගත හා ප්‍රමාණවත් ප්‍රතිලාභ උපයා ගැනීමේ අපගේ ප්‍රයත්නයේදී, එවන් අවදානම් තත්ත්වයන් නිසි ලෙස කළමනාකරණය කිරීම වැදගත් කාර්යයක් බව අපගේ විශ්වාසයයි.

## 4. පහත සඳහන් අනුක්‍රමණ පියවර වලින්/ශිල්පීය ක්‍රමවලින් අපගේ අවදානම් කළමනාකරණ පද්ධතිය සමන්විත වේ:

### අ. පහත සඳහන් පැහැදිලි ප්‍රතිපත්ති නියමයන්ගෙන්:

i. වෙළෙඳපොළේ කිසියම් නිශ්චිත වර්ග හෝ ක්ෂේත්‍ර කෙරෙහි ඇති කැපවීම අනුව ප්‍රතිපත්ති හා උපායමාර්ග පැහැදිලි කරනු ලැබේ. අවදානම ගැනීම සීමා වනුයේ, පූර්ව පැහැදිලි කිරීම් සහිත අවසර ලත් වත්කම් පංති/හෝ ප්‍රතිපාර්ශ්වවලට පමණකි.

ii. අවදානම වර්ගීකරණය

iii. අවදානම් ප්‍රතිරක්ෂණ ප්‍රමිතීන් (අවදානම් නැඹුරුව නිර්වචනය කෙරෙන ආකාරයන් නම් - නොසලකා හැරීමේ පාඩුව, අනුග්‍රාහක පිළිගැනීමේ නිර්නායකය, සමාන අවදානම් ගතිලක්ෂණ සහිත වත්කම් හා වගකීම්වල සැලකියයුතු සාන්ද්‍රණ මට්ටම්, වත්කම් හා වගකීම්වල පිළිගත හැකි පරිණත නොගැලපීම් මට්ටම් ආදිය)

iv. සමාලෝචන ප්‍රමිතිය

### ආ. අවදානම් තත්ත්ව සීමා, අධිකාරිත්ව මට්ටම් හා නීති ස්ථාපනය කිරීම

යෝග්‍ය වත්කම් හා ප්‍රතිපාර්ශ්වීය විවරත්වයන් මත සීමා පැනවීම, කවර හෝ එක් පුද්ගලයෙකු විසින් උපකල්පිත අවදානම්ද මනා ලෙස නිර්ණය කරන ලද අධිකාරි මට්ටම් විසින් සීමා කරනු ලැබ ඇත. භාණ්ඩාගාර වෙළෙඳුන්ට මෙන්ම ණය නිලධාරීන්ටද මෙය අදාළ වන්නේය.

**වර්ෂය තුළ සිදු කරන ලද මූලාරම්භයන්**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, පහත සඳහන් මූලාරම්භයන් සිදු කරන ලදී.

i. බාසල් II ආකෘති රාමුවේ 2 ස්ථම්භය යටතේ අන්තර්ගත නොවූ වෙනත් වැදගත් අවදානම් වර්ගයන් මැනීමට හා ප්‍රමාණකරණය සඳහා ක්‍රමෝපායයන් බැංකුව විසින් වර්ධනය කරනලදී.

(උදාහරණ: බැංකුකරණ පොත්පත්හි පොළී අනුපාතික අවදානම, ද්‍රවශීලතා අවදානම, අනුකූලතා අවදානම, උපායමාර්ග හා ව්‍යාපාර අවදානම, කීර්තිප්‍රසාද අවදානම, සාන්ද්‍රණ අවදානම සහ ඉතිරි ශේෂ අවදානම)

ii. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා තක්සේරු ක්‍රියාවලිය ස්ථාපනය කරන ලද අතර, 2013 වසර සඳහා වූ වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කරනලදී.

iii. කිසියම් අසාර්ථකත්වයක් උද්ගතවූ කල්හි, බැංකුවේ ප්‍රාග්ධන සම්පත් කෙරෙහි ඇතිවියහැකි භව්‍ය අහිතකර බලපෑම් සැලකිල්ලට ගෙන, මහජන බැංකුවේ සියලුම පාලිත හා ආශ්‍රිත ආයතනවල අනපේක්ෂිත අවදානම් විවරත්වය පාලනය සහ කළමනාකරණය සඳහා, එම ආයතනවල අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය පිණිස, වාර්තාකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කරන ලදී.

## 5. අවදානම් කළමනාකරණ ආකෘති රාමුව

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් හා බැංකුවේ සමස්ත අවදානම් නැඹුරුව කළමනාකරණය සඳහා අවසාන වගකීම දරන අතර, සංවිධානය පුරා අවදානම් කළමනාකරණය පිණිස, බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ හා එහි අවදානම් කළමනාකරණ ආකෘති රාමුව සමාලෝචනයට මෙන්ම අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් ස්ථාපනයද සඳහා, යටත් පිරිසෙයින් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුද, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරිවරයාද, අවදානම් ප්‍රධානියා ද ඇතුළත් මාණ්ඩලීය අනුකමිටුවක් (මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව) වගකීම උසුලයි. මෙම ප්‍රයත්නයේදී, බැංකුව පුරා අවදානම් ආරම්භවීම හා කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරන අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මෙම කමිටුවට සහාය දක්වනු ඇත.

අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීමේ දීද, ආකෘතිරාමු සැලසුම් කිරීමේදීද, වරින් වර සමාලෝචන සිදුකිරීමේදීද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වගකියන්නේය. (එක් එක් අවදානම් වර්ගය යටතේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව උසුලන වගකීම් මෙම වාර්තාවේ අන් තැනක සඳහන්ව ඇත.)

ව්‍යාපාරික ශ්‍රිතයන්ගෙන් බැහැර ව පූර්ණ ස්වාධීන අංශයක්සේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙයි. ඒ අනුව, කාර්ය සාධන ස්වාධීනත්වය පවත්වා ගනු පිණිස, අවදානම් කළමනාකරණ ප්‍රධානියා මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුව ම වාර්තා කරන්නේය.

ව්‍යාපාරික ඒකකයන් අවදානමක අයිතිකරුවන් හා පළමු පෙළ ආරක්ෂකයින් බවට බැංකුව විසින් හඳුනාගනු ලබයි. දෛනික වශයෙන් ඔවුන්ගේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වලින් උද්ගත වන විවිධාකාරී අවදානම් හඳුනාගැනීම, කළමනාකරණය, සංසිඳවීම සහ වාර්තාකිරීම ඔවුන්ගෙන් අපේක්ෂා කෙරේ.

මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව, මාණ්ඩලීය විධායක ණය කමිටුව, මාණ්ඩලීය විගණන කමිටුව, මාණ්ඩලීය ආයෝජන කමිටුව, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවද ඇතුළත් අවදානම් කළමනාකරණය දෙවන පෙළ ආරක්ෂකයින් සේ ගැනේ.

මෙම කමිටු විසින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේද මග පෙන්වීම සහ සහායද ඇතිව, සමස්ත අවදානම් කළමනාකරණ ආකෘතිරාමුව සැලසුම් කර දියත්කරනු ලබන අතර, අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන්, ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත්ද වර්ධනයකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය නියම කරන පරිමාණයන් ඇතුළත, මෙම කමිටු විසින් විවිධ අවදානම් විවරත්වයන් අනුමත කරනුලැබ සමාලෝචනයටද භාජනය කරනු ලබමින්, රාශිගත අවදානම් වාර්තාකරණයද සිදුකරනු ලබයි. ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් නිතිපතා සමාලෝචනය කෙරෙන අතර, වෙළෙඳපොළ තත්ත්වයන්ටද, ඉදිරිපත් කෙරෙන නිමැවුම් හා සේවාවන්හි විපර්යාසයන්ටද අනුකූලව ඒවා යාවත්කාලීන කෙරේ.

තුන්වන හා අවසාන පෙළ ආරක්ෂකයින් වන අභ්‍යන්තර විගණනය, අවදානම් කළමනාකරණ ආකෘතිරාමුවෙහි ඵලදායකත්වය පිළිබඳ ස්වාධීන ලෙස පිරික්සුම හා සත්‍යාපනය සිදුකරන අතර, ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත්ද, එම ප්‍රතිපත්තිවලට අනුගතවීමද, කළමනාකරණ තහවුරු ක්‍රියාවලිය තක්සේරුකිරීමද ඊට ඇතුළත්වන කාර්යයන්ය. ස්වාධීනත්වය පවත්වාගැනීම අරභයා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මාණ්ඩලීය විගණන කමිටුවට සෘජුව ම වාර්තා කරයි.

## බැංකුවේ අවදානම් පාලන ව්‍යුහය




සමස්ත අවදානම් පැතිකඩ සමාලෝචන, අවදානම් කළමනාකරණ පරිචයන් හා ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචන හා වාර්තා

සමස්ත අවදානම් නැඹුරුව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි.

ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් සමග අනුකූලතාව අධීක්ෂණය, සමාලෝචනය සහ වාර්තාකරණය

අවදානම් පරිචයන් සහ ප්‍රතිපත්තිවල ඵලදායිත්වය පිළිබඳව මණ්ඩලයට තහවුරු ඉදිරිපත් කරයි.

ණය ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් අනුමත කරයි.

මහා පරිමාණ ණය විවරතාවන් අනුමත කරයි.

සමුච්ච ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණය, සහ වාර්තාකරණය

වෙළෙඳපොළ හා ද්‍රවශීලතා අවදානම් පිළිබඳ ව අධීක්ෂණය, සහ වාර්තාකරණය

අදාළ ප්‍රතිපත්ති සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරයි.

## 6. මහජන බැංකුවේ ආතති පිරික්සුම් ප්‍රතිපත්තිය

බැංකුකරණ ක්‍රියාවලියෙහිදී අවදානමට මුහුණපෑමට සිදුවීම සමෝධානික සිද්ධියක් බව අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෂ්ඨ කළමනාකරුවන් පිළිගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමිත අවදානම් සහන මට්ටම් ඇතුළත බැංකුවේ අවදානම් විවරත්වය පවත්වාගැනීම මණ්ඩලයේ වගකීම බවද දැනසිටී. ඒ අනුව, බැංකුවේ විවරත්වය සහිත බොහෝසෙයින් වැදගත් හා සුවිශේෂ අවදානම් සම්බන්ධයෙන් ආතති පිරික්සුම් ශිල්පීය ක්‍රම භාවිතකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

සමස්ත ආතති පිරික්සුම් වැඩ සටහන පිළිබඳ ව අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, ආතති පිරික්සුම්වල ප්‍රධාන සොයාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය දැනුවත් කෙරේ.

වැඩ සටහනේ ක්‍රියාත්මකකිරීම, කළමනාකරණය සහ අධීක්ෂණය පිළිබඳව මෙන්ම, දුරස්ථ, එහෙත් සැලකියයුතු ආතති සිද්ධී සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ප්‍රමාණවත් සැලසුම් ආයතනය සතුව පවත්නා බව තහවුරුකිරීමද වෙනුවෙන් ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය වගකියයි.

බැංකුවේ ප්‍රාග්ධන පදනම ආරක්ෂා කිරීමට සහ එහි දිගු කාලීන පැවැත්ම තහවුරු කිරීමට ඵලදායක ලෙස අවදානම් කළමනාකරණය කිරීම, කළමනාකරුවන්ගේ වගකීම වන්නේය. ආතති පිරික්සුම් අභ්‍යාසය තුළින් ලබාගන්නා තොරතුරු ඇසුරෙන්, විවිධ ආතති සිද්ධි යටතේ ප්‍රාග්ධන පදනමේ ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමට බැංකුවට හැකිවියයුතු අතර, අවශ්‍යතාවක් උද්ගත වුවහොත් විකල්ප සැලසුම් වර්ධනය කරගැනීම ද සිදුකළයුතු වන්නේය.

බාසල් II ආකෘති රාමුව යටතේ ආතති පිරික්සුම නියාමක අවශ්‍යතාවක් වන හෙයින්, ඒ සඳහා අවම අවශ්‍යතා නිර්ණය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපදෙස් සපයා ඇත.

ආතති පිරික්සුම වනාහී, මූල්‍ය විචල්‍යතාවන්හිදී සිදුවිය නොහැකි වුව ද, වැදගත් සිද්ධි හෝ ක්‍රියාවන් ලෙස සැලකියයුතුවන බැංකුවේ භව්‍ය අවදානම් සහිත භාවය ඇගයීම පිණිස භාවිත කරනුලබන අනුකාරක ශිල්පීය ක්‍රමයකි.

බැංකුවේ වත්කම් හා වගකීම් සමුච්චය හා අදාළ වන අවදානම් සාධක රාශියකම සිදුවන විපර්යාසමය බලපෑම් ප්‍රමාණකරණය සඳහා මාර්ගයක් ආතති පිරික්සුම විසින් සපයනු ලබයි.

### 6.1 ආතති පිරික්සුම සඳහා අදාළ ශිල්පීය ක්‍රම

බැංකු විසින් භාවිත කරනු ලබන ආතති පිරික්සුම්, පුළුල් වශයෙන් වර්ග දෙකකට බෙදේ. ඒවා නම් සංවේදික පිරික්සුම් සහ සිද්ධිගත පිරික්සුම්ය. මෙම දෙවාර්ගික පිරික්සුම් වෙන් වෙන් වශයෙන් හෝ එකිනෙකට බද්ධකර භාවිත කළ හැකිය.

- බැංකුවේ මූල්‍ය තත්ත්වයෙහි සිදුවන එක් විචල්‍යතාවක විපර්යාසමය බලපෑම් තක්සේරු කිරීම පිණිස සාමාන්‍ය වශයෙන් යොදා ගනු ලබනුයේ සංවේදික පිරික්සුම්ය. (උදාහරණ වශයෙන්, ඵලදා වක්‍රයෙහි ඉහළ ප්‍රමාණික සමාන්තර විස්ථාපනය, විදේශ විනිමය අනුපාතිකයෙහි සැලකියයුතු වෙනසක් සිදුවීම, හිමිකම් දර්ශකයෙහි විශාල පරිවර්තනයක් දක්නට ලැබීම ආදිය දැක්විය හැකිය.)
- සිද්ධිගත පිරික්සුම් වලට අන්තර්ගතවන අවස්ථා ලෙස ගැනෙනුයේ, අතීතයේ අත්දුටු (එනම්, ඓතිහාසික සිද්ධියක් - උදා: ස්වභාවික විපත්, කොටස් වෙළෙඳපොළ බිඳ වැටීම, රටක විදේශ විනිමය සංචිත අඩුවීම වැනි) ඒකීය සිද්ධියක් පදනම්වූ හෝ තවමත් සිදුනොවූ (එනම්, කල්පිත සිද්ධියක් - උදා:සමස්ත කලාපය/දේශය පුරා ම සන්නිවේදන පද්ධතිය බිඳ වැටීම, හදිසි හෝ දිගු කාලීන ප්‍රබල ආර්ථික අවදෝලනයක් වැනි) එහෙත් සිදුවනු ඇතැයි සැලකිය හැකි වෙළෙඳ පොළ සිද්ධියක් පදනම් වූ විචල්‍යතා (උදා: කොටස් මිල, තෙල් මිල, විදේශ විනිමය අනුපාතික, පොළී අනුපාතික, ද්‍රවශීලතාව ආදිය) කිහිපයක එක්වර සංචලන සිදුවීම සහ බැංකුවේ මූල්‍ය තත්ත්වය කෙරෙහි ඒවායේ බලපෑම තක්සේරු කිරීම ය.

අවදානම් සාධක සමූහයකක් තුළ, ද්විත්ව සංචලනයන්ම සහ එකී සංචලනයන් අතර පවත්නා සබඳතාවන්හි පරිවර්තනයන්ද ඇතුළත්වන පරිදි සිද්ධි සැලසුම් කළහැකිය.

### 6.2 ආතති පිරික්සුම් විෂය පථය

ආරම්භයක් වශයෙන්, ආතති පිරික්සුම් විෂයපථය, සරල සංවේදිත්ව විශ්ලේෂණයකට සීමා වෙයි. පොළී අනුපාතිකයන්, සුරැකුම බලෙන් විකිණිය හැකි වෙළෙඳපොල වටිනාකම, අක්‍රීය ණය, කොටස් මිල, විදේශ විනිමය අනුපාතිකය, තැන්පතු ආපසුගැනීම්, උකස් ණය ඇතුළත් විවිධ අවදානම් සාධක කිහිපයක්ම හඳුනාගෙන ඇති අතර, ඒවා ආතති පිරික්සුමට යොමු කළයුතුව ඇත. තව ද, බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය ද වෙනමම ආතති පිරික්සුමට භාජනය කළයුතු වෙයි. ආතති පිරික්සුම සඳහා විවිධ සිද්ධි නිර්මාණය කිරීමේ තීරණය අසීරු එකක් වුවද, කෙසේ හෝ ආරම්භයක් වශයෙන්, අවදානම් සාධකයන්හි ඓතිහාසික මෙන් ම කල්පිත චලනයන් ගැන සලකා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් අවදානම් උපාංගයන්ට ඇතැම් ප්‍රකම්ප මට්ටම් නියමකර තිබේ.

එකිනෙකට වෙනස් කල්පිත සිද්ධීන් තුනක් උපකල්පනය කරමින් ආතති පිරික්සුම සිදුකළ හැකිය:

- සුළු මට්ටමේ ප්‍රකම්පයන්: මෙයින් නියෝජනය වන්නේ අවදානම් සාධකයන්ට තිබෙන්නාවූ සුළු ප්‍රකම්පයන්ය. විවිධ අවදානම් සාධකයන්ගේ මට්ටම, කෙසේ වුවද, වෙනස්විය හැකිය.
- මධ්‍යම මට්ටමේ ප්‍රකම්පයන්: මධ්‍යම මට්ටමේ ප්‍රකම්පයන් මෙයින් අපේක්ෂා කෙරෙන අතර, එක් එක් අවදානම් සාධකය තුළ, වෙන් වශයෙන් මට්ටම නිර්වචනය කරඇත.
- ප්‍රධාන මට්ටමේ ප්‍රකම්පයන්: සියලුම අවදානම් සාධක කෙරෙහි මෙහිදී මහා පරිමාණ ප්‍රකම්පයන් බලපාන අතර, එක් එක් අවදානම් සාධකය හා අදාළව එය වෙන් වෙන්ව නිර්වචනය කෙරේ.

බාසල් II ආකෘති රාමුවේ 2 ස්ථම්භය යටතේ දැක්වෙන අවශ්‍යතා අනුව, ආතති පිරික්සුම් ආකෘති රාමුව සැලසුම්කර ක්‍රියාත්මක කිරීම, බැංකුවේ ප්‍රතිපත්තියවේ. එවිට එය බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා තක්සේරු ක්‍රියාවලීන්ට අත්‍යවශ්‍ය සාධකයක් වනු ඇත.

බැංකු ක්‍රියාත්මකවන පරිසරය හුදෙක්ම ගතික බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. ඒ සාර්ව ආර්ථික පරිසරය තුළද, බැංකු ලිය කියවිලි තුළ ද, වාණිජ උපාය මාර්ග හා නියාමන ප්‍රතිපත්තිවල ද පරිවර්තනයන් සිදුවෙමින් පවතින හෙයිනි. ඒ අනුව, බැංකුවේ ප්‍රතිපත්තිය වනුයේ, බැංකුවේ අවදානම් මිනුම් ක්‍රමවේදයන් හා ආතති පිරික්සුම් ශිල්ප ක්‍රම, එම පරිවර්තනයන් පිළිගැනීමට සූදානම් විය යුතු බවය.

බැංකුවේ ප්‍රවර්තන ආතති පිරික්සුම් වැඩ පිළිවෙළින් මෙම අංශයන් ආවරණය වේ:

අ. කොටස් අවදානම

ආ. විනිමය අනුපාතික අවදානම

ඇ. පොළී අනුපාතික අවදානම

ඈ. ද්‍රවශීලතා අවදානම

ඉ. ණය අවදානම

ඊ. උකස් අවදානම

## 6.3 වගකීම

ආතති පිරික්සුම් සිදුකිරීමේ ප්‍රාථමික වගකීම දරනුයේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවයි. සිදුකරනු ලබන ආතති පිරික්සුම් ගැනද, ඒවාට අදාළ උපකල්පනයන්ද, ප්‍රතිඵල හා ඵල විපාකයද එම දෙපාර්තමේන්තුව ලේඛනගත කරයි.

මෙම පිරික්සුම් පැවැත්වීම සඳහා අවශ්‍යවන සියලුම දත්ත සහ තොරතුරු සැපයීම මූල්‍ය දෙපාර්තමේන්තුවේ වගකීම වන්නේය.

## 6.4 උපකල්පනයන් හා සිද්ධීන්

එක් එක් ආතති පිරික්සුම් අභ්‍යාසය පිළිබඳ උපකල්පනයන් හා මූලිකාංගයන් නිසි ලෙස ලේඛනගත කරනු ලබන අතර, තෝරාගන්නා ලද සිද්ධි හා අදාළ හේතු සාධක සහ නිගමනයන්ද, සිද්ධීන්හි පරිමානයන් හා ස්වරූපයන් සහිත ආතති පිරික්සුම් ප්‍රතිඵලයන්හි සංවේදිතාවද ඊට ඇතුළත්වෙයි. ලේඛනගත කිරීම් මට්ටම, ආතති පිරික්සුමේ ස්වභාවය හා අරමුණ අනුව පදනම් විය යුතුය.

## 6.5 වාර්තාකරණය සහ නිසැදිය

ආතති පිරික්සුම් ත්‍රෛමාසිකව පවත්වනු ලබන අතර, අවම වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශිත කරුණු ඊට අඩංගුවේ. ඒවායේ සොයා ගැනීම් වත්කම් හා වගකීම් කමිටුවට සහ මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරනු ලැබේ.

## 6.6 ප්‍රාග්ධන මට්ටම්

ආර්ථිකයට ආතති සිද්ධීන් බලපෑම් සිදුකරන කල්හි, මනා ප්‍රාග්ධනිත තත්වයක් පවත්වා ගැනීම පිණිස කොපමණ අවශ්‍යවේද යන්න පිළිබඳව කල්වේලා ඇතිව ප්‍රාග්ධන තක්සේරුවක් සිදුකිරීම, ආතති පිරික්සුමක අරමුණයි. ආතති සිද්ධීන් යටතේ පාඩුවීම් වෙනුවෙන් හිලව් කිරීමට බැංකුවට සිදුවන්නේ නම්, එකී අරමුණ සිත්හි ධාරණයකර ගනිමින්, බැංකුවේ ප්‍රාග්ධන අනුපාතය මත ඇතිවන බලපෑම වාර්තාව මගින් විස්තර කළ යුතුය.

බැංකුව හා අදාළව, නියාමනික වශයෙන් නියමිත අනුපාතිකයකට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කෙරුණු වෙනත් අභ්‍යන්තර මිනුම් ලකුණකට හෝ අඩු බවක්, ආතති පිරික්සුමේ ප්‍රතිඵල වලින් දක්වනු ලබන්නේ නම්, නිශ්චිත කළමනාකරණ කාර්ය සාධක ආරම්භක ලක්ෂ්‍යයක් යොදා ගනු ලැබේ. එවැනි අවස්ථාවකදී, කළමනාකරුවන් විසින් තත්ත්ව විශ්ලේෂණයක් සහ අවදානම ලිහිල් කෙරෙන සැලැස්මක් සකස්කර, මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවේ අවධානය හා අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතුවේ.

# 7. ණය අවදානම

අපගේ සම්පත් පදනම මත ඉහළම බලපෑම් ඇති කරන අවදානම් වර්ගය ලෙස අප විසින් සලකනු ලබන්නේ ණය අවදානමයි. බැංකුවේ ණය ගන්නෙකු හෝ ප්‍රතිපාර්ශ්වයක් ගිවිසගත් ආකාරයට සිය වගකීම ඉටු කිරීමට අසමත්වීම තුළින් ණය අවදානම උද්ගතවන අතර, ඔවුන්ට දෙනු ලබන හා ඔවුන් වෙතින් ලැබිය යුතු ණය හා අත්තිකාරම් හා අදාළවද ණය අවදානම ඇති වේ. මූල්‍ය සහතික, ණයවර ලිපි, බැංකුවේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් නිකුත් කරන හා සිදු කරන ප්‍රතිග්‍රහණ සහ විවිධ රටවල දී විවරත්වයන් සඳහා සිදුකරන බැඳීම් ආදිය ඔස්සේද ණය අවදානම ඇති කෙරේ.

## 7.1 ණය අවදානම් කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණය හා අදාළ මූලික ප්‍රතිපත්තිවලට මෙම කරුණු අන්තර්ගත වෙයි:

- ව්‍යාපාරික අංශවලින් බැහැරව ණය අවදානම් කළමනාකරණ ශ්‍රිතය සඳහා ස්වාධීනත්වය.
- නිවැරදි අවදානම් නැඹුරුව නිගමනය සඳහා සහ ගනුදෙනු ප්‍රමාණවත් පරිදි මිළ කිරීම සඳහා පදනම සකස්වන එක් එක් ණය ලබන්නාගේ අභ්‍යන්තර තක්සේරු කිරීම.
- නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨත්වය පදනම්වූ කමිටුවලට පවරන ලද ණය අධිකාරිය පාදක ණය අනුමැතිය.

සේවාදායක අවදානම් පැතිකඩ පිළිබඳව සිදු කෙරෙන ආරම්භක තක්සේරුව තුළ, ණය අවදානම් කළමනාකරණයේ ප්‍රාථමික පොළඹවාලීම රඳා පවතී. එසේම, ණය අවදානම් කළමනාකරණයේදී බැංකුව විසින් අනුගමනය කරනු ලබන මූලික ප්‍රතිපත්තිය වනුයේ, ණය ආපසු ගෙවීම සඳහා ණය ලබා ගන්නා තුළ පවත්නා හැකියා ප්‍රවනතාව (ණය යෝග්‍යතාව) යි. ආපසු ගෙවීමට ඇති හැකියාවට අමතරව, ණය විවරත්වයන්හි ප්‍රමිතියට බලපාන තවත් සාධකයක් නම්, ඉදිරිපත් කරනු ලබන සුරැකුමේ ප්‍රමිතියයි. එහෙයින්, අභ්‍යන්තර ක්‍රියා පිළිවෙත්හි පැහැදිළිව නිර්වචනය කරඇති නියමයන් පදනම්කර ගනිමින්, පිළිගනු ලබන සමාන්තරයේ ප්‍රමිතිය හා අගය නිරවද්‍ය හා ගැඹුරු ලෙස තක්සේරු කෙරේ. ඉදිරිපත් කරනු ලබන සුරැකුමේ වැදගත්ම නිර්නායකය වනුයේ ද්‍රවශීලතාවයි.

විචක්ෂණශීලී සුරැකුම්කරණය සමග බද්ධවූ දැඩි ආරක්ෂණ ප්‍රමිතීන් අවශ්‍ය පරිදි යොදා ගනිමින්, ණය ආරක්ෂණයේ පළමු පෙළ නායකයින් වන බැංකුවේ ණය නිලධාරීන් විසින්, නිසි සේවාදායකයින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. ඉක්බිතිව, මෙම ණය ව්‍යාප්තිය කලින් කල සමාලෝචනයට භාජනය කෙරේ.

එක් එක් ව්‍යාපාරික පෙළ විසින් අවදානම් පිළිගැනෙන නිර්ණායකයන්, ක්‍රියා පිළිවෙත් හා ප්‍රතිපත්තීන් පැහැදිළිව නිර්වචනය කරඇති අතර, ඒවා සමානුයෝගීව අනුගමනය කරනු ලැබේ.

වෙනස්වන වෙළෙඳපොළ තත්වයන්හිදී බැංකුවේ ප්‍රාග්ධනය ඵලදායක ලෙස ආරක්ෂාවන පරිදි, විවිධාංගීකරණයවූ ණය සමුච්චයන් තහවුරු කිරීම තුළින්, අනවශ්‍ය පරිදි සාන්ද්‍රණයවීම වැළැක්වීමට බැංකුව කාර්යක්ෂමව අරමුණු කරගනී.

කවර හෝ ප්‍රතිපාර්ශ්වකරුවෙකුට ලබාදී ඇති කිසියම් ණය පහසුකමක් වෙනුවෙන් සිදුකළ යුතු (එහි භාවය, සමාන්තර ව්‍යුහය හෝ මූලික ගිවිසුම හා අදාළව වැනි) වැදගත් වෙනසක්වේ නම්, නිසි බලධාරී මට්ටමින් එම ණය අනුමැතිය ලබා ගත යුතු වෙයි. බැංකුව විසින් එම ණය අනුමත කිරීමේ බලය ජ්‍යෙෂ්ඨත්වය පදනම්කර ගනිමින් නිලධාරීන්ට පවරනු ලබන අතර, එය වරින් වර සමාලෝචනයට භාජනය කරනු ලැබේ.

එක් එක් ණය ලබා ගන්නාගේ සමස්ත ණය විවරතාව, ඒ හා අදාළ නියාමන අවශ්‍යතා ප්‍රකාර, සමස්ත ජාලය පුරාම ගණනය හා ඒකාබද්ධකරණය කෙරේ.

ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ මූලික හා ප්‍රධාන අංගයක් නම්, කිසියම් විවරතා මට්ටමකට ඉහළින්, එක් එක් ණය ලබා ගන්නාගේ සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් සකස් කිරීමය. ප්‍රඥාන්විත විවරතා සීමාවන් පවත්වා ගැනීමට මෙන්ම, මිල පරාමිතියන් නිගමනය කිරීමටද අවදානම් තක්සේරු කිරීම් සහාය වන්නේය.

ණය ලබා ගන්නෙකු තක්සේරු කිරීමේදී, බැංකුව විසින් එම පුද්ගලයාගේ ණය යෝග්‍යතාව ඇගයීම සඳහා, ගෘහස්ථ තක්සේරු ක්‍රම වේදයන්, ලකුණු පත් සහ බැංකුවේ 9 ශ්‍රේණි තක්සේරු පරිමාණයන් උපයෝගී කරගනු ලබයි. මහා පරිමාණ ආයතනික ණය ලබා ගන්නන්, මධ්‍ය ප්‍රමාණීය කුඩා සහ මධ්‍යම ව්‍යවසායක ණය ලබා ගන්නන් සහ මූල්‍ය ආයතන වෙනුවෙන්, බැංකුව විසින් වෙන වෙනම අවදානම් තක්සේරු ලකුණු පත් සකස්කර ඇත. මාණ්ඩලිය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව විසින් මෙම තක්සේරු ලකුණු පත්, කලින් කල සමාලෝචනයකට භාජනය කර වලංගු කරනු ලැබේ.

අලාභය පිළිබඳ අවදානම වැඩිවනු ඇතැයි පෙනීයන ණය විචරතා, කල් වේලා ඇතිව හඳුනාගත හැකි ක්‍රම වේදයක්ද බැංකුව ක්‍රියාත්මක කරයි. ගැටලු උද්ගත වීමට ඉඩ ඇති අවස්ථාවන් බැංකුව හඳුනාගත් විට, එම අදාළ විචරතාව නිරීක්ෂණ ලේඛනයක පවත්වා ගැනේ. මෙම පූර්ව අවවාද පද්ධතිය භාවිත කිරීමේ අරමුණ වනුයේ, එවැනි ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් කාල පරාසයක් සපයා ගැනීමට අවස්ථාව උදා කර ගැනීමයි.

ඉහත සාකච්ඡා කරන ලද ප්‍රතිපත්තීන්ට අමතරව, ණය අවදානම කළමනාකරණය කිරීමේදී සමානත්වය තහවුරුවීම පිණිස, පහත දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගෝපදේශද අනුගමනය කරනු ලැබේ.

i. ණය උත්පාදනය සහ පවත්වා ගැනීම් ක්‍රියා පිළිවෙත.

ii. කර්මාන්ත හා පෞද්ගලික ණය ලබා ගන්නන් සඳහා නියමිත ණය ලබාගැනීමේ උපරිම සීමාවන් වැනි, සමුච්ච කළමනාකරණ මාර්ගෝපදේශ.

iii. ප්‍රතිකාරක/පුනරුත්ථාපන කළමනාකරණ මාර්ගෝපදේශ.

iv. ණය සමාලෝචන ප්‍රතිපත්තිය.

v. කිසියම් ප්‍රමාණයක් ඉක්මවූ විචරතාවන් සම්බන්ධයෙන් ණය දීර්ඝ කිරීම සඳහා බලය ලබා දෙනුයේ, ණය පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුද ඇතුළුව යටත් පිරිසෙයින් ණය නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු විසිනි.

vi. අප විසින් ණය සමාලෝචන යාන්ත්‍රණයක් සකසා තිබේ. ඒ අනුව, අඩු අනුපාතයේ (මාස 6/වසර එකක) සමාලෝචන සඳහා එකිනෙකට වෙනස් කාල උපලේඛනයන් යොදා ගනු ලැබේ. ණය පිළිබඳ තීරණවල ගුණාත්මක බව අධීක්ෂණය කර සහතික කිරීම පිණිස හා නිසි වේලාවට ප්‍රතිකර්ම යෙදීමද සඳහා, ශාඛා/ප්‍රාදේශීය/කලාපීය බලධාරී මට්ටමේදී, කාර්තුමය ණය විය පැහැදම්වලින් යම් ප්‍රතිශතයක් අහඹු පදනමින් තෝරාගනු ලබන අතර, එය ප්‍රාදේශීය මෙන්ම ප්‍රධාන කාර්යාල මට්ටමින්ද පශ්චාත් ප්‍රදාන සමාලෝචනයන්ට භාජනය කරනු ලැබේ.

විශේෂයෙන්ම පහත සඳහන් කරුණු හා වෙනත් කරුණුද සම්බන්ධයෙන්, බැංකුවේ ප්‍රතිපත්තිය වනුයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට හා විධානයන්ට පූර්ණ වශයෙන් අනුකූලතාව දැක්වීමයි:

- ඕනෑකමින්ම පැහැර හරින ණය ආපසු ගෙවීම් හඳුනා ගැනීම හා වාර්ගීකරණය
- ඕනෑකමින් ම පැහැර හරින ණය වෙන්කර තැබීම.
- තනි පුද්ගලයකුට ලබාගත හැකි උපරිම ණය සඳහා දැඩි සීමා පැනවීම.

සිදුව ඇති අලාභයන්හි විෂය බද්ධ සාක්ෂ්‍ය පදනම්කර ගනිමින්, වත්කම්වලට සිදුව ඇති හානි සම්බන්ධයෙන් බැංකුව දැනටමත් LKAS 32 සහ LKAS 39 යොදා ගෙන තිබේ. ණය අලාභ සඳහා වෙන් කිරීම් සිදු කෙරෙනුයේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් අනුව ය.

**අක්‍රිය ණය සහ ආවරණ අනුපාතය (උකස් ණය හැර)**




## 7.2 ණය අවදානම් නැඹුරුව

පහත දැක්වෙන සහන සීමා මට්ටම්වල ආකාරයට ණය අවදානම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නැඹුරුව ප්‍රකාශයට පත්කර තිබේ:

| අවදානම් මිනුම | අඩු අවදානම | මධ්‍ය අවදානම | ඉහළ අවදානම | 31.12.13 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| වර්ග කළ ණය | <4.0% | 4 - 5 % | >5% | 4.52% |
| කල් ඉක්මුණු | <5% | 5 - 10% | >10% | 12.54% |
| වෙන් කළ ඇවුරුම | >90% | 75 - 90% | <75% | 88.1% |
| HHI - නාම සංකේන්ද්‍රණය | <0.15 | 0.15 - 0.25 | >0.25 | 0.08 |
| HHI - ආංශික සංකේන්ද්‍රණය | <0.15 | 0.15 - 0.25 | >0.25 | 0.12 |
| ආයතනික හරස් මායිම් විචරත්වය | <10% | 10 - 15% | >15% | 0.27% |

## 7.3 ආතති පිරික්සුම - ණය අවදානම

ණය අවදානම පිළිබඳ ආතති පිරික්සුම මගින් බැංකුවේ අක්‍රිය ණය මට්ටම වැඩිවීමෙන් සිදුවන බලපෑම තක්සේරු කෙරේ. බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණතාව මත අහිතකර ප්‍රවනතාවන්ගේ/ණය වත්කම් හානි විස්ථාපනයන්ගේ බලපෑම පිරික්සන ලද අතර, එහි ප්‍රතිඵල පහත දැක්වේ:

7.3.1 ණය ප්‍රකම්පය - අක්‍රිය ණය වැඩිවීම
7.3.2 ණය ප්‍රකම්පය - අක්‍රිය ණයවර්ගයන්හි විස්ථාපනය
7.3.3 ණය ප්‍රකම්පය - උකස් කළ සමාන්තරයන්හි FSV පහත වැටීම
7.3.4 ණය අවදානම - සක්‍රිය ණය අක්‍රිය ණය ලෙස පහත වැටීම
7.3.5 ණය අවදානම - මහා පරිමාණ ණය ලබන ඉහළම 10 දෙනා නිසා අක්‍රිය ණය වැඩිවීම

### උකස් කරන ලද සුරැකුම් වල විකුණුම් අගය අඩුවීම ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම

| | සංශෝධිත ණය අවදානම | |
|---|---|---|
| ප්‍රකම්පනයේ පරිමාණය | I ස්ථරය | I ස්ථරය+ II ස්ථරය |
| 5% | 10.29% | 14.89% |
| 10% | 10.20% | 14.79% |
| 20% | 10.11% | 14.70% |




I ස්ථරය    I ස්ථරය + II ස්ථරය

### අක්‍රිය ණය සඳහා ආතති පිරික්සුම

#### අක්‍රිය ණය වැඩිවීමෙන් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත ඇතිවන බලපෑම

| | සංශෝධිත ණය අවදානම | |
|---|---|---|
| ප්‍රකම්පනයේ පරිමාණය | I ස්ථරය | I ස්ථරය+ II ස්ථරය |
| 5% | 10.09% | 14.68% |
| 10% | 9.79% | 14.38% |
| 20% | 9.19% | 13.79% |




I ස්ථරය    I ස්ථරය + II ස්ථරය

#### අක්‍රිය ණය වර්ධනය (සක්‍රිය ණය, අක්‍රිය ණය බවට මාරු කිරීම හේතුවෙන්) ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම

| | සංශෝධිත ණය අවදානම | |
|---|---|---|
| ප්‍රකම්පනයේ පරිමාණය | I ස්ථරය | I ස්ථරය + II ස්ථරය |
| 1% | 9.87% | 14.46% |
| 2% | 9.35% | 13.95% |
| 3% | 8.84% | 13.43% |




I ස්ථරය    I ස්ථරය + II ස්ථරය

#### අක්‍රිය ණය කාණ්ඩ වල සෘණාත්මක විස්ථාපනයන් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතිකය මත බලපෑම

| | සංශෝධිත ණය අවදානම | |
|---|---|---|
| අක්‍රිය ණය තුළ සෘණාත්මක විස්ථාපනයන් | I ස්ථරය | I ස්ථරය + II ස්ථරය |
| 50% | 10.19% | 14.79% |
| 80% | 10.08% | 14.67% |
| 100% | 10.00% | 14.59% |




I ස්ථරය    I ස්ථරය + II ස්ථරය

#### මහාපරිමාණ ණය ගන්නන් 10 දෙනා අක්‍රිය ණය තත්ත්වයට පහත වැටීමෙන් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතයට වන බලපෑම

| | සංශෝධිත ණය අවදානම | |
|---|---|---|
| ප්‍රකම්පනයේ පරිමාණය | I ස්ථරය | I ස්ථරය+ II ස්ථරය |
| 5% | 10.18% | 14.77% |
| 7.5% | 10.07% | 14.67% |
| 10% | 9.97% | 14.56% |




I ස්ථරය    I ස්ථරය + II ස්ථරය

## 7.4 ණය කළඹ තුළ සාන්ද්‍රණ අවදානම

ණය කළඹ තුළ විවරතාවන් සාන්ද්‍රණයවීම ණය අවදානමෙහි වැදගත් අංගයකි. දෙයාකාර අසම්පූර්ණ විවිධාංගීකරණය නිසා එය උද්ගතවිය හැකිය. සාන්ද්‍රණයවීම නමැති පළමුවැන්න, කළඹක කුඩා බව නිසා හෝ නිශ්චිත එක් එක් ණය ගැතියාට විශාල ලෙස විවරත්වය සිදුවීම නිසා හෝ, පැහැදිලි අවදානමේ අසම්පූර්ණ විවිධාංගීකරණය හා අදාළ වෙයි. ආංශික සාන්ද්‍රණයවීම නමැති දෙවැන්න, අදාළ වනුයේ, ආංශික සාධකයන් ලෙස හැඳින්වෙන, අවදානමේ ක්‍රමානුකූල කොටස් පුරා දැකිය හැකි අසම්පූර්ණ විවිධාංගීකරණයයි.

මනාව විවිධාංගීකරණයවූ කළඹක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ගැන මහජන බැංකුව මැනැවින් දැන සිටින නමුත්, රාජ්‍ය අයිතිය සහිත ව්‍යවසායයන්ට විවරත්වය ලබා දෙන සාන්ද්‍රණ රාශියක්ම එයට උරුමව ඇත. රාජ්‍ය බැංකුවක් වීමේ ස්ථාවරය තුළින් උද්ගතවූ උකස් කිරීම හා නිවාස ක්ෂේත්‍රය රජයේ සමාජ ආර්ථික සංවර්ධන ආරම්භයන්ට බද්ධවූ අතර, උකස් ව්‍යාපාරයෙහි පුරෝගාමියා වශයෙන් ඓතිහාසික ස්ථාවරයක්ද බැංකුව ලැබීය. ගනුදෙනුකරුවන් අති විශාල සංඛ්‍යාවක් පුරා නිවාස හා උකස් විවරතාවන් පැතිරීම තුළින්, ණය සාන්ද්‍රණ අවදානම බොහෝ දුරට ලිහිල්කරණයවී තිබේ. එසේ වුවද, උකස් කළඹ රන් මිල වටිනාකමෙහි අස්ථිරතාවට පාදකවී ඇත. වෙනස් වෙමින් පවත්නා මෙහෙයුම් ප්‍රවනතාවන් නිසා, පාලන ක්‍රියා පිළිවෙත් ආදිය දිගින් දිගටම නිතිපතා විශෝධනය වෙමින් පවතී.

බැංකුව මෑතකදී කර්මාන්ත හා ණය ලබාගන්නන් සඳහා විවරතා සිමාවන් පිලිබඳ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. කර්මාන්ත විවරතා සහ පුද්ගලික/සමූහ විවරතා (නාමික සාන්ද්‍රණයන්) ආවරණය කරමින් විවරතා සීමාවන් පනවා ඇත. එවැනි විවරතා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර, වරින් වර මාණ්ඩලිය සමෝධානික ණය කළමනාකරණ කමිටුවට ඒ පිලිබඳ වාර්තා කෙරේ.

නියාමන උපරිමයට වඩා දැඩිවූ තනි ණය ලබාගන්නන්ගේ විවරතා සිමාවක් බැංකුව අනුගමනය කරයි. ගනුදෙනුකාර භවතුන්ගෙන් ඉහළම 10 දෙනාගේ හා ඉහළම 20 දෙනාගේ රාශිගත විවරතා මනිනු ලබනුයේ බැංකුවේ සමස්ත කළඹට අනුකූලවය.

2013.12.31 දිනට මහා පරිමාණ (රුපි. මිලියන 100ට වැඩි) සාන්ද්‍රණයන්:

| | කර්මාන්ත ක්ෂේත්‍රයීය සංඛ්‍යාව | පෞද්ගලික අනුග්‍රාහක සංඛ්‍යාව | ඍජු විවරතාව රු. මිලියන | වක්‍ර විවරතාව රු. මිලියන | එකතුව රු. මිලියන | ශේෂ පත්‍රයෙහි ප්‍රතිශතයක් වශයෙන් ඍජු විවරතාව |
|---|---|---|---|---|---|---|
| රජය සතු ව්‍යවසාය සහිතව | 29 | 183 | 260,477 | 142,988 | 403,465 | 44% |
| රජය සතු ව්‍යවසාය රහිතව | 28 | 156 | 35,409 | 19,831 | 55,240 | 6% |

විශාල විවරතාවන්හි කොටස් ප්‍රමාණයන්ට අනුකූලව 2013.12.31 දිනට ගනුදෙනුකාර භවතුන් ඉහළම 20 දෙනාගේ බැංකු ගිණුම්වල තත්ත්වය:

| විශාල විවරතාවන්හි කොටස් ප්‍රමාණය | ඉහළම 3 | ඉහළම 5 | ඉහළම 10 | ඉහළම 20 |
|---|---|---|---|---|
| නාමික සාන්ද්‍රණය (ශ්‍රී ලංකා රජය සහිත) | 66.0% | 77.1% | 83.9% | 88.7% |
| නාමික සාන්ද්‍රණය (ශ්‍රී ලංකා රජය රහිත) | 16.0% | 23.5% | 35.5% | 50.2% |
| **සමස්ත විවරතාවයෙහි කොටස් ප්‍රමාණය** | | | | |
| නාමික සාන්ද්‍රණය (ශ්‍රී ලංකා රජය සහිත) | 44.0% | 51.4% | 55.9% | 59.1% |
| නාමික සාන්ද්‍රණය (ශ්‍රී ලංකා රජය රහිත) | 1.5% | 2.1% | 3.2% | 4.6% |

තනි ණය ලබා ගැනීමේ සීමාවට අමතරව, සාන්ද්‍රණයන් අධීක්ෂණය හා පාලනය සඳහා බැංකුව හර්ෆින්ඩාල් - හර්ෂ්මන් (HHI) දර්ශකය භාවිත කරයි. (සෘජු සහ අසම්භාව්‍ය) රුපියල් මිලියන 100ට වැඩි (සීමාවෙහි වැඩි කොටස හෝ නොපියවූ) සියලු විවරතාවන් උදෙසා මෙම දර්ශකය ගණනය කරනු ලබන අතර, HHI ගණනය කෙරෙනුයේ තනිපුද්ගල හා කර්මාන්ත යන ද්විත්ව පදනම් වලිනි. දෙවැනි අංශය සම්බන්ධයෙන්, බැංකුව විසින් එහි ණය කළඹ පහසුවෙන් හඳුනාගත හැකි කර්මාන්ත අංශ 28කට බෙදී වෙන් කරනු ලබයි.

බැංකුව විසින් පහත දැක්වෙන සහන මට්ටම් සකස්කර ඇත්තේ සාන්ද්‍රණ අංශකය අනුව ය.

| මිනුම | අඩු සංකේන්ද්‍රණය | මධ්‍ය සංකේන්ද්‍රණය | ඉහළ සංකේන්ද්‍රණය |
|---|---|---|---|
| HHI | <0.15 | 0.15 - 0.25 | >0.25 |

2013 වසර පුරාම මහජන බැංකුවේ තත්වය මෙසේ විය:

| | 31.03.13 | 30.06.13 | 30.09.13 | 31.12.13 |
|---|---|---|---|---|
| තනි ගනුදෙනුකාර සාන්ද්‍රණය - රජය සතු ව්‍යවසාය රහිත | 0.05 | 0.02 | 0.02 | 0.02 |
| තනි ගනුදෙනුකාර සාන්ද්‍රණය - රජය සතු ව්‍යවසාය සහිත | 0.26 | 0.29 | 0.23 | 0.22 |
| කර්මාන්ත සාන්ද්‍රණය - රජය සතු ව්‍යවසාය රහිත | 0.11 | 0.12 | 0.11 | 0.11 |
| කර්මාන්ත සාන්ද්‍රණය - රජය සතු ව්‍යවසාය සහිත | 0.28 | 0.31 | 0.25 | 0.25 |

ශ්‍රී ලංකා රජයේ විවරතාවන් නොමැතිව, පහළ මට්ටමේ සංකේන්ද්‍රණය වීම්, ණය කළඹට ඇත්තේය.

### 7.5 ණය විශ්ලේෂණය සහ අත්තිකාරම් ණය කළඹ විශ්ලේෂණය

පහත සඳහන් කරුණු ආවරණය වනසේ, අවදානම් කළමනාකරණ අංශය විසින් ණය කළඹ විශ්ලේෂණය කරනු ලැබේ:

අ. නිපැයුම

ආ. අරමුණ/කර්මාන්ත අංශ

ඇ. ව්‍යාපාර වර්ග

ඈ. සමාන්තරය

ඉ. ණය ලබාගන්නාගේ ණය අවදානම් අනුපාතිකය

**නිමැවුම්:**

උකස් කිරීම්, නිවාස ණය, කාල ණය, පරිභ්‍රමන ණය (LC, STL, පිළිගනු ලැබීම්, TR, ඇපවීම), අයිරාව, සම්පූර්ණ ණය කළඹේ ප්‍රතිශතයක්සේ, එක් එක් තීරුවට එරෙහි වෙනත් ලේබලයක් ලෙස විවරතාව දැක්විය යුතුය.

**නිමැවුම් වශයෙන් ණය හා ලැබීම්**

| | 2013 | 2012 |
|---|---|---|
| විනිමය බිල්පත් | 14,519 | 24,476 |
| අයිරා | 67,487 | 84,887 |
| වෙළෙඳ මූල්‍ය | 103,232 | 94,008 |
| උකස් ණය | 197,129 | 250,772 |
| මාණ්ඩලික ණය | 10,363 | 9,909 |
| කාලීන ණය | 286,764 | 195,219 |
| වෙනත් | 1,973 | 1,353 |




2013 2012

**ණය ලබාගන්නාගේ අවදානම් අනුපාතිකය**

කාලානුරූපීව අහිතකර ප්‍රවනතාවන් හඳුනාගැනීම සඳහා පාඩු සිදුවීම් දැඩිසේ අධීක්ෂණය කරනු ලැබේ.

**ආයතනික ගනුදෙනුකාර හවතුන්ගේ අවදානම් පැතිකඩ**

| | 2013 (%) | 2012 (%) |
|---|---|---|
| AAA | 0 | 1 |
| AA | 3 | 3 |
| A | 11 | 14 |
| BBB | 20 | 21 |
| BB | 30 | 26 |
| B | 15 | 18 |
| CCC | 12 | 9 |
| CC | 3 | 3 |
| C | 6 | 5 |




## 8. වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය

වෙළෙඳපොළ අවදානම යනු විදේශ විනිමය අනුපාතික, පොළී අනුපාතික, සාමාන්‍ය කොටස් මිල හා වෙළඳ භාණ්ඩ මිල ආදියෙහි වෙනස්කම් සිදුකරන අවදානමයි. එමගින් බැංකුවෙහි ආදායමට සහ/හෝ බැංකුව පවත්වා ගන්නා කිසියම් මූල්‍ය ලියකියවිලිවලට හෝ අහිතකර බලපෑම් සිදුකරනු ලබයි. බැංකුවේ වෙළෙඳපොළ මෙන්ම බැංකුකරණ පොතද එවන් අවදානමට විවෘතව පවතී. වෙළෙඳපොළ අවදානම කළමනාකරණය කිරීම සඳහා නිශ්චිත ප්‍රතිපත්ති බැංකුවේ භාණ්ඩාගාර ප්‍රතිපත්ති අත්පොතෙහි අඩංගුවෙයි.

### 8.1 වෙළඳපොළ අවදානම සහ වත්කම් වගකීම් කළමනාකරණ කොටස්

අ. භාණ්ඩාගාර ඉදිරිපෙළ කාර්යාල ක්‍රියාකාරකම් සඳහා සීමාවන් පැනවීම හා උල්ලංඝණයන් සිදුවීම වාර්තාකරණය

ආ. වත්කම් වගකීම් කළමනාකරණය සඳහා සීමාවන් හා පිළිලකුණු පැනවීම

ඇ. ඇගයීම් අනුපාතිකයන් හා ක්‍රමවේදය ස්වාධීනව සත්‍යාපනය සිදු කිරීම

ඈ. වෙළෙඳපොළ අවදානම සහ ඒවා ගණනය සඳහා භාවිත වළංගුවන ආකෘතීන් ප්‍රමාණකරණය හා කළමනාකරණය සඳහා අවදානම් අගය, කාල සීමාව ආදිය හඳුන්වා දීම

**වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය සඳහා සංවිධානාත්මක ව්‍යුහය**




වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය සඳහා, පරිපූර්ණවූ ප්‍රතිපත්ති හා සීමාවන් මාලාවක් අනුගමනය කෙරේ. වත්කම් වගකීම් කමිටුවේ නිර්දේශ පරිදි, මණ්ඩලය විසින් විවිධ භාණ්ඩාගාර සහ ආයෝජනය හා අදාළ ක්‍රියාකාරකම් සඳහා සීමාවන් පනවනු ලබයි.

වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති වර්ධනය සම්බන්ධයෙන්, වත්කම් වගකීම් කමිටුව වගකීම දරයි. වත්කම් වගකීම් කමිටුව විසින් සියලුම වැදගත් වෙළෙඳපොළ අවදානම් ප්‍රභවයන් හඳුනාගෙන අවදානම් සීමාවන් නිර්ණය කරනු ලබයි.

මනා පරිචයන්ට අනුකූලවන අතරම, මෙම ප්‍රතිපත්තීන්/ක්‍රියා පිළිවෙත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ද අන්තර්ගතකර ගනී.

භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය විසින් විවිධ වෙළෙඳපොළ අවදානම් විවරත්වයන් සමීපස්ථව අධීක්ෂණය කරනු ලැබ, පාලන කාර්ය සාධනය පිණිස ප්‍රධාන අවදානම් නිලධාරියාට සහ වත්කම් වගකීම් කමිටුවට වාර්තා කෙරේ. කෙසේ වුවද, වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය (වාණිජ/ආයෝජන පොත) පිළිබඳ ඉදිරි පෙළ වගකීම උසුලනුයේ භාණ්ඩාගාර වෙළෙඳ අංශයයි.

පැහැදිලි හා මනාව නිර්වචනය කරන ලද වගකීම් සම්භාරයක් සමග භාණ්ඩාගාර ඉදිරි පෙළ කාර්යාලය, මධ්‍ය කාර්යාලය සහ පසු පෙළ කාර්යාලය එකිනෙකට වෙනස් වාර්තාකරණ මාර්ග තුනකට ක්‍රමවත්ව බෙදා වෙන්කර ඇත.

## 8.2 විදේශ විනිමය අවදානම් කළමනාකරණය

බැංකුව විවෘත ස්ථාවරයක පවතින කාල පරිච්ඡේදයක් තුළ, අහිතකර විනිමය අනුපාතික සංචලනයක් නිසා බැංකුව අලාභයක් අත්විඳීමේ අවදානමක් ඇතිවේ නම්, එම අවදානම විදේශ විනිමය අවදානමවේ.

හිමිවත් වෙළෙඳාමෙන් සහ ආනයන, අපනයන, ප්‍රේෂණ සහ වෙනත් ක්‍රියාකාරකම් හේතුවෙන් සේවාදායකයින් වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සිදු කිරීමෙන් යන දෙකෙන්ම විදේශ විනිමය විවරතාවන් උද්ගතවේ.

බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් දෛනික පදනමක් මත විදේශ විනිමය අවදානම කළමනාකරණය කරනු ලැබේ. විදේශ විනිමය අවදානම ප්‍රමාණකරණය සහ පාලනය සඳහා භාවිතවන ප්‍රාථමික යාන්ත්‍රණය නම් දෛනික අවදානම් අගය (DVaR) ක්‍රම වේදයයි. එක් ව්‍යාපාර දිනයක් තුළ ප්‍රවර්තන ස්ථාවරය අවලව පවතින්නේ නම්, එමගින් උද්ගතවිය හැකි භව්‍ය අලාභය 99% ක විශ්වාසවන්ත මට්ටමකින් යුක්තව DVaR ක්‍රම වේදය ඔස්සේ තක්සේරු කළ හැකිය.

විදේශ විනිමය අවදානම මැන ගැනීමට හා කළමනාකරණය සඳහා පහත දැක්වෙන මෙවලම් ද භාවිත කෙරේ:

i. මාසික-මිලියන පදනම අනුව මනිනු ලබන විදේශ ව්‍යවහාර මුදල් පාදක වත්කම් හා වගකීම් පිළිබඳ පරිණත අන්තර විශ්ලේෂණය

ii. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය මත විනිමය අනුපාතික සංචලනයන්හි බලපෑම මැනීමේ ආතති පිරික්සුම්

අවදානම ලිහිල්කරණයේ ප්‍රාථමික පියවරක් වශයෙන්, අවදානම විවෘත ස්ථාවරය මත පහත සඳහන් සීමාවන් පැනවේ:

i. ව්‍යවහාර මුදල් වෙළෙන්දාගේ පරිමා සීමාවන්

ii. සමස්ත අවකාශ සීමාවන්

iii. ව්‍යවහාර මුදල් සහ වෙළෙන්දාගේ අලාභය නතර කිරීමේ සීමාවන්

vi. මාසික-ඇමරිකානු ඩොලර් මිලියන පදනම අනුව මනිනු ලබන, ඉදිරි විදේශ ව්‍යවහාර මුදල් පරිණත අන්තර සීමාව

තථ්‍ය කාල පදනම මත නියමිත සීමාවන්ට එදිරිව මධ්‍ය කාර්යාලය මෙම විචරතාවන් අධීක්ෂණය කරයි.

ඇමරිකානු ඩොලර් 80,000ට අඩු උපරිම මට්ටමක් සමග, වසර පුරා, අභ්‍යන්තර සීමාවට ඉතා අඩුවෙන් දෛනික අවදානම් අගය (DVaR) පවත්වා ගන්නා ලදී.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය මත විනිමය අනුපාතික සංචලනයන්හි බලපෑම, ආතති පිරික්සුම් විසින් මනිනු ලබයි.

**විනිමය අනුපාතිකයේ අහිතකර සංචලනය මගින් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම**

| ප්‍රකම්පනයේ පරිමානය | සංශෝධිත ණය අවදානම I ස්ථරය | සංශෝධිත ණය අවදානම I ස්ථරය + II ස්ථරය |
|---|---|---|
| 5% | 10.37% | 14.96% |
| 10% | 10.35% | 14.95% |
| 15% | 10.34% | 14.93% |




15%ක පරිමාණයේ අහිතකර සංචලනයක් වුවද, බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව මත සිදු කරනුයේ, සැළකියයුතු බලපෑමක් නොවන බව මෙම ප්‍රස්තාරයෙන් පෙන්වයි.

විනිමය අවදානම මැනැවින් කළමනාකරණයකර ඇති බැවින්, විනිමය අනුපාතිකයෙහි කිසියම් අහිතකර සංචලනයක්වුවද, බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව මත ප්‍රබල බලපෑමක් සිදු නොකරන බවත් මෙම ප්‍රස්තාරය පෙන්වා දෙයි.

**2013 තුළ ශුද්ධ විවෘත පිහිටීම (NOP) සහ දෛනික අවදානම් අගය (DVaR)**




| දිනය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උපරිම NOP | 8,266,792 | 2,103,726 | 5,145,902 | 5,475,482 | 2,665,981 | 4,881,729 | 5,160,119 | 3,315,269 | 3,393,200 | 6,997,024 | 2,835,538 | 4,553,700 |
| අවම NOP | 9,768 | 2,491 | 10,667 | 1,447,844 | 6,587 | 124 | 163,347 | 316,382 | 10,953 | 6,655 | 11,959 | 2,575 |
| උපරිම VaR | 76,387 | 22,134 | 42,961 | 44,872 | 21,793 | 39,877 | 38,818 | 24,962 | 23,696 | 47,507 | 19,908 | 28,170 |

## 8.3 පොළී අනුපාතික අවදානම

පොළී අනුපාතික අවදානම වනාහි වෙළෙඳපොළ පොළී අනුපාතික මට්ටමෙහි වෙනස්කම් සිදුවීමට ඇති හැකියාවයි. බැංකුවේ ශුද්ධ පොළී ආදායම සහ රඳවාගෙන ඇති කිසියම් මූල්‍ය ලියකියවිලිවල අගය කෙරෙහි එය අහිතකර ලෙස බලපෑම් සිදු කරයි. මෙම අවදානම කළමනාකරණය කෙරෙනුයේ, පොළී අන්තරයන් සඳහා සීමාවන් නියමකර පවත්වා ගැනීමෙන් සහ විවිධ පොළී සංවේදී වත්කම් හා වගකීම්වල ප්‍රති-මිලකරණ පැතිකඩ සමග ගැලපීමෙනි. (ඉදිරි විනිමය ගිවිසුම්වල අවදානම ඇතුළුව) බැංකුකරණ හා වෙළෙඳ යන පොත් දෙකෙහිම පොළී අනුපාතික අවදානම සහතික කෙරෙන අතර, මේ සඳහා කාලසීමා අන්තර විශ්ලේෂණය සහ අවදානම් අගය යන දෙකම භාවිත කෙරේ.

ගිවිසුම්ගත සහ චර්යාමය යන දෙකම පදනම්කර ගනිමින් පොළී අන්තරයන් මනිනු ලැබේ. ඊට අමතරව, වෙළෙඳ පොතෙහි ස්ථාවර ආදායම් සුරැකුම්පත් පවත්වා ගැනීමේ පරිමා සීමාවන් සහ සමුච්චිත අලාභ නැවැත්වීමේ සීමාවන්ද පොළී අනුපාතික අවදානම කළමනාකරණය සඳහා භාවිත කෙරේ.

පොළී අනුපාතිකයන්හි යම් අහිතකර වෙනස්වීමක් සිදුවුවහොත් එමගින් බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය මත බලපෑමක් සිදුකළ හැකිය. වෙළඳ පොත හා බැංකුකරණ පොත යන දෙකෙහිම පොළී අනුපාතික අවදානම හිමිකර ගැනීමට හා ප්‍රමාණකරණය සඳහා බැංකුව සහතික වෙයි. පොළී අනුපාතික අවදානම සඳහා සමස්ත සීමාවක්ද ස්ථාපනය කරනු ලැබේ.

පොළී අනුපාතිකයන්හි අහිතකර වෙනස්වීම් මගින්, වෙළෙඳ කාර්යයන් සඳහා බැංකුව රඳවාගෙන ඇති ස්ථිර ආදායම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකම කෙරෙහි බලපෑම් සිදු විය හැකිය. අපගේ වෙළඳාම් කළඹ මත අලාභ නැවැත්වීමේ සීමාවක් අප විසින් මෑතකදී පනවනු ලැබ තිබේ. මෙම කළඹ දෛනික පදනමින් අලෙවිකරණය සඳහා නියමිත අතර, අලාභ නැවැත්වීමේ සීමාවන්ට අනුව අධීක්ෂණය කෙරේ.

වෙළෙඳ කළඹෙහි අවදානම් විවරතාව ප්‍රමාණකරණය සඳහා, 99% ක විශ්වාස මට්ටමක් සහිතව අප විසින් දෛනික අවදානම් අගය ආකෘතිය භාවිතා කරනු ලැබේ. මැද පෙළ කාර්යාලය අපගේ වෙළඳ කළඹ මත අවදානම් අගය (භව්‍ය අලාභය) දෛනික පදනමින් අධීක්ෂණය කරයි.

බැංකුකරණ පොතෙහි පොළී අනුපාතික අවදානමේ ප්‍රධාන මූලාශ්‍රය වනුයේ, ශේෂ පත්‍රයෙහි ප්‍රති-මිලකරණ පරිණත අන්තරයයි. වත්කම් හා වගකීම්වල ප්‍රති-මිලකරණ අන්තර ප්‍රකාශය (පරිණත අන්තර විශ්ලේෂණය) භාවිත කරමින් මෙය ප්‍රමාණකරණය කරනු ලැබේ.

ප්‍රති-මිලකරණ නොගැලපීමේ අවදානම විශ්ලේෂණය කිරීමේදී එක් ප්‍රධාන අභියෝගයක් පැනනැගීමට හේතුව නම්, නිවාස ණය, ස්ථාවර පොළී අනුපාත ණය, ඉතුරුම් හා ජංගම ගිණුම් වැනි ඇතැම් නිපැයුම්වල ආවේණික විකල්පයන් හා අදාළ උපකල්පනයන්හි ගුණාත්මක භාවයයි.

## 8.4 පොළී අනුපාතික අවදානම

බැංකුවේ ප්‍රාග්ධනය මත සිදුවන පොළී අනුපාතික පරිවර්තනයන්හි බලපෑම නිගමනය කිරීම සඳහා, (බැංකුකරණ හා වෙළෙඳ යන පොත් දෙකෙහිම) සමස්ත ශේෂ පත්‍රයටම කාල සීමා අන්තර විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී.

**1%ක පොළී අනුපාතිකය වැඩිවීම, ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම**

2013 සංශෝධිත ණය අවදානම

| | I ස්ථරය | I ස්ථරය + II ස්ථරය |
|---|---|---|
| 1වන කාර්තුව | 8.64% | 12.90% |
| 2වන කාර්තුව | 8.30% | 12.34% |
| 3වන කාර්තුව | 7.56% | 11.59% |
| 4වන කාර්තුව | 9.10% | 13.50% |




## 8.5 සාමාන්‍ය කොටස් අවදානම

පවත්වා ගනු ලබන කවර හෝ සාමාන්‍ය කොටස්වල සිදුවන මිල වෙනස්වීම් අනුව, සාමාන්‍ය කොටස් අවදානම උද්ගත වෙයි. මෙම අවදානම කළමනාකරණය කරනු ලබනුයේ, පරිමාවන්හි සීමාවන්වල හා අලාභ නැවැත්වීමේ සීමාවන්වල ඒකාබද්ධතාවයෙනි.

වෙළෙඳ අභිමතාර්ථයන් සඳහා, බැංකුව දිගටම මිල සඳහන් සාමාන්‍ය කොටස් කළඹක් පවත්වා ගනී.

පහත සඳහන් කරුණු නිශ්චය ලෙස දක්වමින්, දැඩි සීමාවන් තුළ, කළඹ නඩත්තු කිරීම හා වෙළෙඳ ක්‍රියාකාරම් අඛණ්ඩව සිදුකරන ලදී:

i. සමස්ත විවරත්ව සීමාවන්

ii. කළඹෙහි විවිධාංගීකරණ මට්ටම

iii. දැඩි ආයෝජන සුදුසුකම් නිර්ණායන

iv. තනි පුද්ගල විවරත්වය මත අලාභ සීමා තීරණය

දෛනික පදනමකින් කළඹ අලෙවි කිරීමට සටහන් කෙරෙන අතර, භාණ්ඩාගාර මැදපෙළ කාර්යාලය විසින් සීමාවන් අධීක්ෂණය කරනු ලැබේ.

### සාමාන්‍ය කොටස් මිල සංචලනයන් සඳහා ආතති පිරික්සුම

**සාමාන්‍ය කොටස් මිලෙහි අහිතකර චලනයන්, ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත සිදු කරන බලපෑම**

| ප්‍රකම්පනයේ පරිමානය | සංශෝධිත ණය අවදානම I ස්ථරය | I ස්ථරය + II ස්ථරය |
|---|---|---|
| 5% | 10.37% | 14.97% |
| 10% | 10.36% | 14.96% |
| 20% | 10.34% | 14.93% |




## 9. උකස් අවදානම කළමනාකරණය

උකස් ක්‍රියාවලියට ආවේනික අවදානම් කළමනාකරණය හා ලිහිල්කරණය සඳහා බැංකුව පහත දැක්වෙන ක්‍රියා මාර්ග භාවිත කරයි:

- අගයට ගැලපෙන ණය අනුපාතයන් විචක්ෂණ ලෙස පවත්වා ගැනීම - වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව විසින් තරගකාරී නිපැයුම් ගති ලක්ෂණයන් ද සමග, රන් වෙළෙඳපොළ මිල ගණන්, වරින්වර තක්සේරුකර විශ්ලේෂණය කරනු ලබන අතර, මෙම නිමැවුමේ අවදානම් ප්‍රදානයන් සබඳතාව උපරිමකරණය සඳහා, අගයට ගැලපෙන ණය සහ වෙනත් සුවිශේෂ ලක්ෂණයන් ඒ අනුව ගලපනු ලැබේ.
- උකස් කරනු ලබන රන් භාණ්ඩවල කැරට් සහ වෙනත් ප්‍රමිතීන් පරීක්ෂා කිරීම සඳහා ද්‍රවමාන හා රසායනික ක්‍රමවේද භාවිතය
- මූලික සේවාදායක උද්‍යෝගය
- අදාළ කාර්ය මණ්ඩල සඳහා නිතිපතා පුහුණුව
- ව්‍යාජ හා සොරකම් කරන ලද භාණ්ඩ ගැනීමෙන් සිදුවිය හැකි අලාභයන් ආවරණය කර ගැනීම සඳහා රක්ෂණ සහතික ලබා ගැනීම
- ඕනෑම කිසියම් දිනක උකස් කරන ලද භාණ්ඩවලින් 5%ක නියැදියක් දිනපතා පිරික්සා බැලීම ඇතුළු, නියමිත පර්යන්ත දිනය පසුවූ භාණ්ඩ නිතිපතා ස්වාධීනව වළංගු කිරීම
- නියමිත දිනවල ආපසු ලබා නොගන්නා ලද භාණ්ඩ නිතිපතා වෙන්දේසි කිරීම
- ඊට අමතරව, පූර්වාරක්ෂාව අරභයා බැංකුව විසින් පොදු සංචිතයක් පවත්වා ගැනීම

පෙර කවරදාවත් සිදුනොවූ පරිදි රන් මිල පහළ බැසීමෙන් සිදුවූ අහිතකර බලපෑම දරා සිටීමට, ඉහත විස්තර කරන ලද දැඩි කළමනාකරණ පරිචයන් නිසා බැංකුවට හැකිවිය.

## 10. ද්‍රවශීලතා අවදානම සහ කීර්තිය පිළිබඳ අවදානම

ද්‍රවශීලතා අවදානම යනු බැංකුවේ ගිවිසුම්ගත වගකීම් උද්ගතවන ආකාරයට ඉටු කිරීමට නොහැකිවීමේ අවදානම යි. නිසියාකාර පරිණතවීම්වලදී සහ එම අනුපාතිකයන් අනුවද වත්කම් අරමුදල්කරණය අපහසුවීම, හා සාධාරණ මිලකට සහ උචිත කාල වකවානුවක් තුළ වත්කම් ඈවරකිරීමට නොහැකිවීමද ඊට අයත්වෙයි.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ පරීක්ෂාව හා භාණ්ඩාගාර මැද පෙළ කාර්යාලයේ අධීක්ෂණය යටතේ මෙන්ම, අභ්‍යන්තර සහ නියාමන යන දෙකෙහිම මාර්ගෝපදේශද ඇතුළත, බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණය බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ වගකීම වන්නේය.

මූල්‍ය අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමේ ප්‍රාථමික භූමිකාව ඉටු කළ යුතු බැංකුවට, වැළැක්විය නොහැකි කරුණක් වන, කෙටි කාලීන වගකීම් වලින් දිගුකාලීන වත්කම් අරමුදල්කරණය නිසාද ප්‍රධාන වශයෙන්ම ද්‍රවශීලතා අවදානම පැන නගී. සාමාන්‍ය වෙළෙඳ පොළ අවස්ථාවක මෙය කළමනාකරණය කෙරෙනුයේ කෙටිකාලීන වගකීම් පැවරුමක් ලෙසය.

අභ්‍යන්තර හා බාහිර වශයෙන් කවර ආකාරයක දුෂ්කර අවස්ථාවන් පැවතියද, ස්වකීය වගකීම් අවම තත්ත්වයෙන් හෝ ඉටු කිරීමට බැංකුවට හැකියාව ලබාදීම, ද්‍රවශීලතා සැලසුම මගින් තහවුරු කළ යුතුය.

එක් බැංකුවක නිශ්චිත ද්‍රවශීලතා අර්බුදයක් නිසා, රටෙහි සමස්ත බැංකු ජාලය තුලම ඇතිවිය හැකි ක්‍රමානුකූල බලපෑම සැලකිල්ලට ගත්කල්හි, ඵලදායක ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය අතිශයින් ම වැදගත් ය.

### 10.1 ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කළහැකි ආකාරය

- (අවශේෂ, ගිවිසුම්ගත හෝ චර්යාත්මක පදනම මත) මුදල් ප්‍රවාහ පරිණතවීම්වල අන්තර කළමනාකරණය මගින්
- කවර හෝ හදිසි අවශ්‍යතාවන්හිදී භාවිත කළ හැකිවනසේ, පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි, උසස් ප්‍රමිතියේ ද්‍රවශීල වත්කම් සහිත කළඹක් පවත්වා ගැනීමෙන්. ඒ අනුව, ද්‍රවශීල වත්කම් සහිත කළඹක් පවත්වා ගැනීම හා මනා ලෙස සැලසුම් කරන ලද නිපැයුම් හඳුන්වාදීම සහ එවැනි සම්පත්වල ඵලදායක සබඳතා කළමනාකරණය මගින් ද බැංකුවට ආකර්ශණය විය හැකි විවිධාංගීකරණයවූ සිල්ලර තැන්පතු කළඹක් පවත්වා ගැනීම කෙරෙහි අපගේ ද්‍රවශීල කළමනාකරණ උපාය මාර්ගය අවධානය යොමු කරයි. පුළුල් ලෙස විසිරී පවත්නා අපගේ ශාඛා ජාලය මෙන්ම, ව්‍යාප්තව ඇති සිල්ලර සේවා දායක පදනමද අපගේ ද්‍රවශීල උපාය මාර්ගයෙහි වැදගත් අංගයෝ වෙති.

- අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළට පහසු ප්‍රවේශතාව පවත්වා ගැනීමෙන්
- කිසියම් නිශ්චිත අරමුදල් ප්‍රභවයක් කෙරෙහි, සිදුවිය නොහැකි වුවද, භව්‍යමය තර්ජනයක්වීමේ බැංකුවේ අවදානම තක්සේරු කිරීම සඳහා ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබඳ ආතති පිරික්සුම් සිදුකිරීමෙන්
- අවිනිශ්චිත අවස්ථා සැලසුම් කිරීමෙන් - විදේශීය හා දේශීය සම්භවයන් සහිත බාහිර සම්පත් උපයෝගීකර ගනිමින්, කැපවීමෙන් යුත් ණය මාර්ග රැසකටම අවතීර්ණ විය හැකි, පරිපූර්ණ හදිසි ආධාරක සැලැස්මක් බැංකුව විසින් වර්ධනය කරනුලැබ තිබේ.

ද්‍රවශීලතා අවදානම අධීක්ෂණය හා කළමනාකරණය සඳහා බැංකුව පහත දැක්වෙන මෙවලම් භාවිතා කරයි:

- වත්කම්-වගකීම්වල මුදල් ප්‍රවාහ පරිණත පරතර ප්‍රකාශන හා ඒවා නියමිත සීමාවන් අනුව අධීක්ෂණය කිරීම.
- ගනුදෙනුකරුවන්ගේ තැන්පතු අනුපාත ණය, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, භාවිත නොකරන ලද අන්තර් බැංකු ණය මාර්ග හා ගනුදෙනුකරුවන්ට ලබාදී ඇති, එහෙත් භාවිත නොකරන ලද සීමාවන් වැනි ද්‍රවශීලතා දර්ශක අධීක්ෂණය කිරීම.
- අක්‍රිය වත්කම්වල, ක්ෂණික මුදල් ධාරාවන්හි හෝ ඉහළ මට්ටමේ ද්‍රවශීලතා පිරිවැය අඩුවීමේ තක්සේරුවෙහි සැලකිය යුතු සහ හදිසි වැඩිවීම වැනි ආන්තික අවස්ථාවන් හා අදාළ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබඳ ආතති පරීක්ෂණ සිදු කිරීම.

| ද්‍රවශීලතා දර්ශනයන් | 2012 | 2013 |
|---|---|---|
| ණය/සේවාදායක තැන්පතු | 96.6 | 89.4 |
| භාවිත නොකරන ලද අන්තර් බැංකු ණය මාර්ග | 44 | 20 |
| මධ්‍ය-කාලීන අරමුදල්කරණය | 102 | 86 |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය | | |
| - DBU | 21.8 | 25.2 |
| - FCBU | 21.8 | 22.3 |

වසර තුළ ද්‍රවශීලතා තත්වය වැඩි දියුණු වී ඇති බව මෙම දර්ශකය පෙන්නුම් කරයි.

ද්‍රවශීලතාව හා ලාභ ලැබීම අතර පවත්නා නොවැළැක්විය හැකි හුවමාරුව බැංකුව පිළිගන්නා අතර, එය බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ තුළ සංස්ථාපනය කර තිබේ.

### ශේෂ පත්‍රයේ චර්යාත්මක ද්‍රවශීලතාව

| | 1 මාසය දක්වා | මාස 1 - 3 | මාස 3 - 12 | අවුරුදු 1 - 5 | අවුරුදු 5ට වැඩි |
|---|---|---|---|---|---|
| සම්පූර්ණ වත්කම් | 8% | 8% | 38% | 18% | 27% |
| සම්පූර්ණ වගකීම් | 9% | 18% | 29% | 17% | 27% |
| පරිණත නොගැළපීම | 0% | -10% | 9% | 1% | 0% |




සම්පූර්ණ වත්කම් | සම්පූර්ණ වගකීම් | පරිණත නොගැළපීම

### උණුසුම් මුදල් ආපසු ගැනීමේ බලපෑම

උණුසුම් මුදල් - ආපසු ගැනීමේ ඉහළම අවදානම සහිත අරමුදල්. ඉතුරුම්, ඉල්ලුම් තැන්පතු සහ ස්ථිර තැන්පතු ගිණුම් ශේෂයන් රුපියල් මිලියන 50කට වැඩිනම්, එය උණුසුම් මුදල් ලෙස සලකනු ලැබිය.

සිල්ලර අරමුදල් - ආපසු ගැනීමේ අඩු අවදානම සහිත අරමුදල්

1වන අවස්ථාව - උණුසුම් මුදල් 5% සහ සිල්ලර අරමුදල් 5% ආපසු ගැනීම

2වන අවස්ථාව - උණුසුම් මුදල් 10% සහ සිල්ලර අරමුදල් 5% ආපසු ගැනීම

3වන අවස්ථාව - උණුසුම් මුදල් 10% සහ සිල්ලර අරමුදල් 10% ආපසු ගැනීම

**'මාස 1 දක්වා' කාලපරාසය තුළ උණුසුම් මුදල්/සිල්ලර අරමුදල් ආපසු ගැනීමේ බලපෑම**

| | අනාතතිමය තත්ත්වය | 1වන අවස්ථාව | 2වන අවස්ථාව | 3වන අවස්ථාව |
|---|---|---|---|---|
| වත්කම් | 49% | 43% | 41% | 38% |
| වගකීම් | 51% | 57% | 59% | 62% |
| වගකීමේ % ලෙස අන්තරය | -2% | -25% | -30% | -39% |




## 10.2 කීර්තිනාමය පිළිබඳ අවදානම

තරගකාරී මිල ගණන්වලට අනුකූලව, දිගින් දිගටම අරමුදල් ආකර්ෂණය කරගැනීමට බැංකුවට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කරනුයේ, මහජනතාව හා මූල්‍ය වෙළෙඳපොළවල් තුළ බැංකුව හා අදාළ ව පවත්නා කීර්ති නාමය බව නොරහසකි. අපගේ කීර්තිනාමය කවර ලෙසකින් හෝ පළුදු වනුයේ නම්, සේවා දායක අවශ්‍යතා ඉටුකිරීම සඳහා අවශ්‍ය අරමුදල් පවත්වා ගැනීම සහ එමගින් සිදු කෙරන පිරිවැය කෙරෙහි ඍණාත්මක බලපෑම් ඇතිවන්නේය. එහෙයින්, කීර්තිනාමය පිළිබඳ අවදානමද ද්‍රවශීලතා අවදානමේ අන්තර්ගතයන් සංඛ්‍යාවට තවත් එකතු කිරීමක් ලෙස තක්සේරු කරනු ලැබ තිබේ.

දැඩි ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ උපාය මාර්ගයන් මගින් බැංකුවේ කීර්තිනාමය වර්ධනය කිරීමෙහිලා ස්ථාවරත්වයක් පිරිනැමෙන බව සැලකිල්ලට ගත යුතු කරුණකි. එමගින්, තරගකාරී මිල ගණන් යටතේ, සිල්ලර හා තොග වශයෙන් අරමුදල් ගොඩ නගා ගැනීම සඳහා බැංකුව සතු හැකියාව වර්ධනය වන්නේය.

# 11. මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම සියලුම ආකාරයේ ව්‍යාපාරවලට ආවේනික වන අතර, ප්‍රමාණවත්නොවූ හෝ අසාර්ථකවූ අභ්‍යන්තර ක්‍රියාවලීන්හි නැතහොත් පද්ධතීන්හි හෝ බාහිර සිද්ධිවල ප්‍රතිඵලයක් වශයෙන් පැනනගින, ඍජු හෝ වක්‍ර බලපෑමේ අවදානම ලෙස මෙය හැඳින්විය හැකිය.

මෙහෙයුම් අවදානම මගින් පහත දැක්වෙන අවදානම් හේතු ආවරණය වෙයි:

- අභ්‍යන්තර හා බාහිර වංචනික ක්‍රියා
- භෞතික සම්පත්වලට සිදුකරන හානි
- ව්‍යාපාර කඩාකප්පල්කිරීම් සහ කාර්යසේවා පද්ධති බිඳ වැටීම්
- විධානයන්, සේවා සම්පාදනය සහ ක්‍රියාවලීන් කළමනාකරණය
- සේවා දායකයින්, නිපැවුම් සහ ව්‍යාපාර පරිචයන්
- සේවා නියුක්ති පරිචයන්/වැඩ පොළෙහි සුරක්ෂිතභාවය

වංචාවන් (අභ්‍යන්තර හා බාහිර), වැරදි, තොරතුරු තාක්ෂණික පද්ධති බිඳ වැටීම්, ස්වභාවික විපත් සහ ත්‍රස්තවාදී ක්‍රියා යනු මෙහෙයුම් අවදානමේ පොදු ප්‍රභවයන් කිහිපයකි. සැබැවින්ම, මෙහෙයුම් අවදානම මුළුමණින් ම බැහැරලිය නොහැකිය. අභියෝගය නම්, කිසියම් මෙහෙයුම් පාඩුවක් සිදුවුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරන පරිදි, පිළිගතහැකි මට්ටමකට, එය කළමනාකරණය කිරීම සහ සීමාකර ගැනීමයි.

මෙහෙයුම් අවදානම පාලනය කිරීමේ ප්‍රාථමික වගකීම රැඳී ඇත්තේ, අවදානම් ආරම්භවන්නාවූ ශාඛාවන් හා ව්‍යාපාර ඒකකයන් සමග ය. මෙහෙයුම් අවදානම පාලනය කිරීම සඳහා වගකීම් ප්‍රමාණවත් පරිදි ඒකරාශිකර තිබීමත්, අවදානම් පූර්ණ වශයෙන් ආවරණයවී තිබීම හා වගකීම් පිලිබඳව පැහැදිළි භාවයක් පැවතීමත්, සියලුම ශ්‍රිතයන් විසින් සාමූහිකව තහවුරු කළ හැකිවීමේ ඔවුන්ගේ භූමිකාව හා වගකීමේ නිර්වචනය නම් මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමේ ආකෘති රාමුවේ පදනම යි.

මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමෙහි ලා සියලුම කාර්ය මණ්ඩලයන්හිද, ශාඛා හා ව්‍යාපාර සහ ශ්‍රිතයන්ගේ ඒකකවල ද භූමිකා හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැදිලිව නිර්වචනය කරනු ලැබ තිබේ. අවදානම් හඳුනාගැනීම හා තක්සේරුව, අවදානම් හසුකර ගැනීම හා වාර්තාකරණය, නිසි ලෙස වගකීම් ඒකරාශිකර ගැනීම, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම සහ පාලනයන් හා ක්‍රියා පිළිවෙත් පිළිබඳ දිගින් දිගටම සමාලෝචනය ද ඊට ඇතුළත්වෙයි.

කිසියම් හෝ මෙහෙයුම් පාඩු සහිත සිද්ධියක් සිදුවූයේ නම්, ව්‍යාපාර ඒකක හා ශාඛා විසින් වරින්වර එවැනි සිද්ධි අවදානම් කළමනාකරණ අංශයට වාර්තා කළ යුතු අතර, එම අංශය එවන් සිද්ධීන් පිළිබඳව දත්ත සමුදායක් පවත්වා ගනී. කිසියම් ප්‍රවනතාවක් තිබේ නම්, එය හඳුනා ගැනීම සඳහා සහ අනාගත මෙහෙයුම් අවදානම් අවමකර ගැනීම පිණිස එමගින් ක්‍රියා පිළිවෙත් හා පාලනයන් සමාලෝචනය කිරීමත් උදෙසා, අඛණ්ඩ පදනමින් එම සිද්ධීන් විශ්ලේෂණය කෙරේ.

බැංකුව විසින් මැනැවින් නිර්වචනය කරනු ලැබූ, මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇත. පහත සඳහන් කරුණු තහවුරු කිරීම එම ප්‍රතිපත්තියේ අරමුණ වෙයි:

i. සැලකිය යුතු මෙහෙයවුම් අලාභ වලින් බැංකුවේ ප්‍රාග්ධනය හා ඉපයීම් ආරක්ෂා කිරීම.

ii. බැංකුව පුරාම මෙහෙයුම් අවදානම කළමනාකරණය සඳහා මනාව නිර්වචනය කරනලද, පැහැදිලිව අවබෝධ කරගත හැකි හා ඒකාකාර ක්‍රියාවලිය.

iii. මෙහෙයුම් කරුණු කාරණා හේතුකොටගෙන බැංකුවේ සේවා සම්පාදන ප්‍රමිතීන් සහ කීර්තිනාමය පලුදු නොවීම

මෙහෙයුම් අවදානම් පාලන වැඩපිළිවෙළෙහි අභිමානය හා ප්‍රමාණතාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට තහවුරු කිරීම් ලබාදීම සඳහා, අභ්‍යන්තර විගණක ශ්‍රිතය විසින් ශාඛා ජාල පුරාම වරින්වර සමාලෝචන සිදුකරනු ලබයි.

## මෙහෙයුම් අවදානම කළමනාකරණය සඳහා සංවිධාන ව්‍යුහය




## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම, මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ අත්‍යවශ්‍ය කොටසක්වේ. මේ සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද පාදක කරගත් මෙවලම් ගණනාවක්ම භාවිත කරනු ලැබේ. මෙම ක්‍රමවේද මගින් රැස් කර ගනුලබන තොරතුරු, බැංකුව පුරාම පවත්නා අවදානම් ලිහිල් කර ගැනීමට සුදුසු කාර්ය සාධනය සඳහා භාවිත කරනු ලැබේ.

i. අලාභ අවස්ථා පිළිබඳ තොරතුරු: අතීතයේ සිදුවූ අලාභ හා හානි පිළිබඳව දත්ත සමුදායක් සකස් වෙමින් පවතී. ප්‍රවර්තන අභ්‍යන්තර පාලන තත්ත්වයන්හි පිරිහීමක් සිදුනොවුවහොත් සහ ව්‍යාපාරික හා මෙහෙයුම් පරිසරයෙහිද සැලකියයුතු වෙනසක් නොසිදුවන්නේ නම්, මෙම දත්ත සැලකිල්ලෙන් විශ්ලේෂණය කිරීමෙන්, අනාගතයේදී සිදුවියහැකි අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම සඳහා සහායයක් ලැබෙනු ඇත.

ii. ප්‍රධාන අවදානම් දර්ශකඃ අවදානම් දර්ශක යනු, යම් අවදානම් වර්ගයක් වෙනුවෙන්, කිසියම් ව්‍යාපාර ක්ෂේත්‍රයක පාලන පරිසරයේ ක්‍රියාකාරකම් හා තරාතිරම අධීක්ෂණය සඳහා භාවිතා කෙරෙන පුළුල් පියවර විශේෂයකි. අවදානම් දර්ශක නිරන්තර පදනමකින් අධීක්ෂණ කෙරේ. (උදාඃ දෛනිකව, සතිපතා, මාසිකව, කාර්තුවකට වරක් ආදී වශයෙනි,)

iii. පාලන තක්සේරුවඃ ඉහත සඳහන් පරිදි මෙහෙයුම් අවදානම් හඳුනාගත් පසු, සිදුවිය හැකි මෙහෙයුම් අවදානම් අලාභ සිද්ධියක සම්භාවිතාව සහ එවැනි සිද්ධියකින් බැංකුවට සිදුවිය හැකි උපරිම අලාභය, බැංකුව විසින් තක්සේරු කරනු ලබයි. ඉක්බිතිව, බැංකුවේ සමස්ත අවදානම් නැඹුරුව හා සමග එය තක්සේරු කෙරේ. මෙම ක්‍රියාවලිය අතරතුරදී, අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණාත්මතා බව, අවදානම් සාධකවල ස්වභාවය, ලේඛනගත කිරීමේ ප්‍රමාණාත්මතාව, පරිගණක පද්ධති හා වගකීම දරන පිරිස්ද ඇගයීමට ලක් කෙරෙන අතර, දුර්වල ක්ෂේත්‍රයන් ශක්තිමත් කිරීම සඳහා අවධානයට යොමු කරනු ලැබේ. පාලන තක්සේරු ක්‍රියාවලිය කාලානුරූපීව (වාර්ෂිකව) සිදුකෙරේ.

## අවදානම් ප්‍රතිකාරය

බැංකුවේ මෙහෙයුම් අවදානම් විවරත්වයන්ගෙන් බැංකුවට සිදුවන මූල්‍ය බලපෑම තීරණය කරන ලදුව, යම් අවදානම් සිදුවීමක ප්‍රබලතාව අඩුකිරීම සඳහා භාවිත කළහැකි විධික්‍රමයන් බැංකුව විසින් තීරණය කරනු ලැබේ.

ඒ හා සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග පහත සඳහන් වෙයිඃ

i. **රක්ෂණය**

අවදානමක් වශයෙන් සිදුවීමේ සම්භාවිතාව අඩු නමුත්, එයින් සිදුවිය හැකි මූල්‍යමය බලපෑම ඉහළ බවට හඳුනාගත් අවදානම් අවස්ථාවන්ගෙන් සිදුවිය හැකි අලාභ අවමකර ගැනීම සඳහා, බැංකුව විසින් එබඳු අවදානම්වලට එරෙහිව රක්ෂණය කරනු ලැබේ. බැංකුවේ වත්කම්වලට සිදුවන හානි, වංචාවන්, කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ නොසැලකිල්ල ආදියෙන් උද්ගතවන අවදානම් රක්ෂණය මගින් ආවරණය කෙරෙන කිහිපයකි.

ii. **ව්‍යාපාර අඛණ්ඩ සැලසුම**

බාධාවන් සිදුවීම සම්බන්ධයෙන්, බැංකුවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හෝ ශාඛා පරිශ්‍රයන්ට හෝ වේවා, මෙහෙයුම්වලට සිදුවන ප්‍රධාන බාධාවන්ගෙන් ඇතිවන අලාභ අවම කිරීම සඳහා, සෑම ශාඛාවකම/ව්‍යාපාර ඒකකයකම ව්‍යාපාර අඛණ්ඩ සැලසුමක් හා ආපදා ප්‍රතිප්‍රාප්තික සැලසුමක් තිබේ.

iii. **නව නිපැයුම් හා සේවාවන්**

නව නිපැයුම් හා සේවාවන් හඳුන්වා දීමට පෙර ඒවා සූක්ෂම ලෙස ලෙස පරීක්ෂාකර බලනු ලැබේ. නව නිපැයුම්වලට හා සේවාවන්ට ආවේණික සියලු ආකාරයේ අවදානම් පැහැදිලිව හඳුනාගෙන, ඒවායේ බලපෑම හැකිතාක් දුරට ලිහිල්කරණය එමගින් සහතික කෙරෙන අතර, ඉක්බිති ව ශේෂවන යම් අවදානමක්වේ නම්, එය බැංකුවේ අවදානම් සහන මට්ටම ඇතුළත සලකා බලනු ලබන්නක් වියයුතුය.

iv. **බාහිර පාර්ශ්ව දායකත්වය**

බැංකුවේ ක්‍රියාකාරකම් සඳහා බාහිර පාර්ශ්වයන්ගේ දායකත්වය ලබාගැනීමේදී උද්ගතවියහැකි අවදානම් තත්ත්වයන් පිළිබඳව දැනුවත්ව සිටින බැංකුව, එවැනි අවදානම් කළමනාකරණය සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයන් ස්ථාපනය කර ඇත.

**2013 වසර තුළ මෙහෙයුම් අලාභය**




මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් වශයෙන්, වර්ෂයේ මෙහෙයුම් අලාභය 0.6%කි. අභ්‍යන්තර සහන මට්ටමවන 1%ට වඩා මෙය අඩුය. (සැබෑ ප්‍රමාණය මෙහෙයුම් අවදානම් අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කරනු ලැබේ.)

## 12. පරිපාලන අවදානම සහ නීතිමය අවදානම

බැංකුවේ සේවක සේවිකාවන් විසින් අනුගමනය කළයුතු මූලික සදාචාරාත්මක ප්‍රතිපත්තීන්, එම නිලධාරීන්ගේ රෙගුලාසි හා නියමයන්හි කොටසක් වශයෙන් පවත්නා විනය සංග්‍රහයේ නිර්වචනයකර තිබේ. උදාහරණ වශයෙන්, සේවකයාගේ අභිමානය හා පක්ෂපාතිත්වය, පක්ෂපාතිත්වය පිළිබඳ පිළිගැටුම් විසඳීමේ මාර්ගෝපදේශ, අභ්‍යන්තර ව්‍යාපාරකරණ තහනම, මූල්‍ය උනන්දුමත් භාවයේ සීමාවන් සහ බැංකුවේ රහස්‍යභාවය හා අදාළ නියමයන් දැක්විය හැකිය.

තවද, බැංකුවේ සේවා කාර්යයන් සංවිධානය කිරීම විස්තර කෙරෙන හා සේවා නියුක්තිකයින්ගේ අයිතීන් හා යුතුකම් නිර්වචනය කෙරෙන අභ්‍යන්තර විධානයන්ද රැසක් ම ඇත. දෙපාර්තමේන්තු සඳහා සාමාන්‍ය විධානයන් මෙන්ම විශේෂ විධානයන්ද බැංකුව විසින් නිකුත් කරනු ලැබේ. සාමාන්‍ය විධානයන් අදාළවනුයේ බැංකුවේ සියලුම කාර්ය මණ්ඩලයන්ට හෝ දෙපාර්තමේන්තු දෙකකට වැඩි සංඛ්‍යාවකටය. දෙපාර්තමේන්තු සඳහා නියමිත විශේෂ විධානයන් එක් එක් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් සකස් කරනු ලබන අතර, අදාළ ව්‍යාපාර ප්‍රධානියා විසින් නිකුත් කරනු ලැබේ. මෙම විධානයන්ගෙන්, සංවිධානය, මෙහෙයුම්, මෙන්ම දෙපාර්තමේන්තුවල යුතුකම් හා වගකීම්ද

විස්තර කෙරේ. ඊට අමතරව, දෙපාර්තමේන්තුවක ඇතැම් ක්‍රියාපිළිවෙත් හා සේවා රටාවන් වැනිදේ ආවරණය කිරීම පිණිස, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අභ්‍යන්තර විධානයන් නිකුත් කිරීමද සිදු කෙරේ.

අභ්‍යන්තර විධානයන් පිළිබඳව සියලුම සේවක සේවිකාවන් දැන සිටීම හා ඔවුන් ඒවාට අනුගතවීම  තහවුරුකිරීම, කළමනාකරණයේ වගකීම වන්නේය.

මහජන බැංකුව විදේශීය ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, හා සේවා සම්පාදකයින් සමග නෛතික බැඳීම් සහිත ගනුදෙනු හා ගිවිසුම් විශාල ප්‍රමාණයක් ඔස්සේ කටයුතුකරන හෙයින්, බැංකුව විසින් නීතිමය අවදානම කළමනාකරණය හා පාලනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති, ක්‍රියාපිළිවෙත් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මකකර ඇත.

බැංකුව ක්‍රියාත්මක වන අධිකරණ බලය තුළ, බැංකුවේ නීතිමය අවදානම අදාළවන සාධක නම්, ප්‍රමාණවත් නොවන හෝ අකාර්යක්ෂම ලේඛනගත කිරීම, නීති පිළිබඳ හැකියාව, බලාත්මක කිරීමට හැකිකම සහ රටේ නීතිය ක්‍රියාත්මකවීම මෙන්ම, මතභේද විසඳීමේ යාන්ත්‍රණයන්ය. බැංකුවේ මෙහෙයුම් හෝ පරිපාලන ක්‍රියාකාරකම්වලට අදාළ වුවද, නැති වුවද, බැංකුවේ ක්‍රියා පිළිවෙත්, පූර්වාදර්ශ සාමාන්‍ය ලේඛනගත කිරීම් සහ සියලුම ගිවිසුම්ගත ලේඛන නෛතික ලෙස සමාලෝචනය කිරීමෙන් මෙම අවදානම් සැහැල්ලු කරගත හැකිවෙයි.

අපගේ අධිකරණ පද්ධතිය විසින් විද්‍යුත් ලේඛන නීතිමය වශයෙන් පිළිගනු ලැබූ පසු, බැංකුව සිය සේවාදායකයින් සමග විද්‍යුත් බැංකුකරණය සහ අන්තර්ජාල බැංකුකරණ පහසුකම් භාවිත කිරීම ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විද්‍යුත් භාවිත/සයිබර් අපරාධ බැංකු කර්මාන්තය තුළ සාමාන්‍ය සිද්ධියක් බවට පත්ව තිබේ. තෙවන පාර්ශ්වයන් සමග කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹීමෙන්ද, ගනුදෙනුකාර භවතුන්ගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමෙන්ද, දත්තයන් සංකේත බවට පරිවර්තනය කිරීමේ ප්‍රමිතිය වර්ධනය කිරීමෙන්ද මෙම අවදානම් සැහැල්ලුකර ගැනීමට බැංකුව විසින් ප්‍රවේසම්වීමේ හා ආරක්ෂාවීමේ පියවරගනු ලැබ තිබේ.

ණය ලබාදීමේ මෙහෙයුම්වලදී, කාලාන්තරයක් තිස්සේ වර්ධනය කරගනු ලැබූ සම්මත ලේඛනගතකිරීම් ක්‍රමය බැංකුව භාවිත කරයි. භාණ්ඩාගාරය හා අදාළ ලේඛනගතකිරීම්වලදී, වෙළෙඳපොළෙහි සාමාන්‍ය ලෙස පිළිගනු ලබන සම්මත ලේඛනගතකිරීම මත බැංකුව විශ්වාසය තබා ඇත. ණය ලබා ගැනීමේදී, බැංකුවේ ව්‍යවස්ථානුකූලව හා දීර්ඝ කාලයක් පුරා ලැබූ පරිචයන් අනුව, බැංකුව විසින්ම වර්ධනයකර ගන්නාලද සම්මත ලේඛන ගතකිරීමේ ක්‍රම භාවිත කෙරේ.  බැංකුවේ ගිවිසුම්ගත ලේඛනගතකිරීම්වලට නීති දෙපාර්තමේන්තුව වග කියයි - එනම්, බැංකුව කිසියම් හෝ ගිවිසුමකට එළඹෙන්නට පෙරාතුව, බැංකුවේ ප්‍රති-පාර්ශ්වයන්ගේ නීතිමය හැකියාව පිරික්සා බැලීම, සමාන්තර වගකීම් පිළිපැදීම තහවුරු කිරීම සහ රජයේ අදාළවන නීතිය හා මතභේද විසඳීමේ ක්‍රමවේද තෝරාගැනීම යනාදියයි. අවශ්‍යතාව උද්ගතවූ කල්හි, බැංකුව බාහිර උපදේශකයින්ගේ සහාය වුවද ලබා ගනී.

## 13. අනුකූලතා අවදානම් කළමනාකරණය

අනුකූලතා අවදානම නිර්වචනය කිරීමේදී එහි අර්ථය වනුයේ නෛතික හෝ නියාමන සම්බාධක, සැලකියයුතු මූල්‍ය අලාභයක් හෝ  බැංකුවේ ක්‍රියාකාරකම් ආදියට අදාළවන්නාවූ නීති, රෙගුලාසි සහ ස්වයං නියාමන සංවිධාන ප්‍රමිතීන්ට අනුකූල නියමයන් අනුගමනය කිරීමට අපොහොසත්වීම නිසා බැංකුවේ කීර්තිනාමයට සිදුවිය හැකි හානි ආදිය හා අදාළවන අවදානම යි.

මහජන බැංකුවේ ප්‍රතිපත්තිය වනුයේ, නීතියට හා ආචාර ධර්මවලට අනුකූලව නිරන්තරයෙන්ම මෙහෙයුම් සිදුකිරීමත්, බැංකුවේ ව්‍යාපාරවලට අදාළවන්නාවූ සියලුම නීති හා රෙගුලාසිවලට අනුකූලවීමත් ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් හා කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා විසින්ද අනුගමනය කළ යුතුවූ මාර්ගෝපදේශයක් ලෙස අනුකූලතා වැඩසටහන පිළිගැනීම ද බැංකුවේ ප්‍රතිපත්තියවෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය ඉහළම මට්ටමේ අභිමානයක් හා ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් පවත්වා ගනු ලැබීම මහජන බැංකුවේ අපේක්ෂාවයි. එවන් ප්‍රමිතීන්ට අනුකූල නොවන හෝ එසේ නොවන බවට පෙනීයන කවර හෝ ක්‍රියාදාමයක නිරතවීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය වැළකී සිටියයුතු වන්නේය.

මෙම ආචාර ධර්ම ප්‍රමිතීන් අනුගමනය කිරීමේදී, බැංකුවට අදාලවන සියලුම නීති හා රෙගුලාසිවලට දැඩිසේ අනුගතවීම අවශ්‍යවෙයි.

අදාළ නීති හෝ රෙගුලාසි කිසිසේත් උල්ලංඝණයවීම වැළැක්වීම සඳහා සහ සියලුම අදාළ නීති හා රෙගුලාසිවලට අඛණ්ඩ ව අනුකූලවීම සහතික කරනුවස්, ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහිත අනුකූලතා නිලධාරියෙකුගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මකවනු පිණිස, අධ්‍යක්ෂවරුන් විසින් අනුකූලතා වැඩසටහනක් ස්ථාපනය කර තිබේ.

විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය මූල්‍යකරණය වැළැක්වීමට හා නීති උල්ලංඝණයන් විමර්ශනය සඳහා සැලසුම් කරන ලද මෙම අනුකූලතා වැඩසටහන දැනට දිගටම ක්‍රියාත්මක වෙයි.

අනුකූලතා අවදානම කළමනාකරණය හා අදාළ නිශ්චිත ප්‍රතිපත්තීන්, බැංකුවේ AML සහ KYC යන ප්‍රතිපත්ති ලිපි ලේඛනවල අන්තර්ගත වෙයි.

## ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණයේදී මහජන බැංකුවේ ප්‍රාථමික අරමුණ වනුයේ -

- සාර්ථක ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව බැංකුව පවත්වා ගැනීම පිණිස බැංකුවේ හැකියාව සුරක්ෂිත කරලීම සහ එහි ව්‍යාප්තික සැලසුම් මූල්‍යකරණය උදෙසා ප්‍රමාණවත් ප්‍රාග් ධනයක් පවත්වා ගැනීම
- එහි අයිතිකරුවන්ට උපරිම මට්ටමින් ලාභ උපයාදීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම

මෙහි පහත දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති ආකාරයට බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය ගණනය කරනු ලබයි:

- ණය අවදානම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය භාවිත කෙරේ
- මෙහෙයවුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශය
- වෙළෙඳ පොළ අවදානම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය

## අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය

මෙම තක්සේරු ක්‍රියාවලියෙහි ප්‍රාථමික අරමුණ වනුයේ, බාසල් II ගිවිසුමේ II හා III යන ස්ථම්භයන්හි නියාමන නිරාවරණ අවශ්‍යතාවන්ට අනුකූලවීම සහ බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරයේ සහ දැනට පවත්නා මෙන්ම ප්‍රක්ෂේපිත මෙහෙයවුම් පරිසරයේද පදනම මත, බාහිර සහ අභ්‍යන්තර ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම යි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) වර්ධනය කිරීමේදී, බැංකුව පහත සඳහන් පියවර අනුගමනය කරයි:

**1. අවදානම හඳුනා ගැනීම**

1.1 1වන ස්ථම්භය යටතේ ආවරණයවන අවදානම් හසුකර ගැනීම (ණය අවදානම, වෙළෙඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම)

1.2 1වන ස්ථම්භය යටතේ ආවරණය නොවන, එහෙත්, බැංකුවේ විවරත්වය පවත්නා සෙසු සැලකිලිමත් අවදානම් සලකා බැලීම

(උදාහරණ: බැංකුකරණ පොතෙහි අඩංගු පොළී අනුපාතික අවදානම, ද්‍රවශීලතා අවදානම, අනුකූලතා අවදානම, උපාය මාර්ගික හා ව්‍යාපාරික අවදානම, කීර්තිය පිළිබඳ අවදානම, සාන්ද්‍රණ අවදානම සහ ඉතිරි ශේෂගත අවදානම)

1.3 නියාමන, ආර්ථික හා ව්‍යාපාර පරිසරයෙන් උද්ගතවන, බැංකුවට පරිබාහිරවූ අවදානම් සාධක සලකාබැලීම

**2. ප්‍රාග්ධන තක්සේරුව**

ශූන්‍ය ප්‍රාග්ධන ආරම්භක ලක්ෂ්‍යය වශයෙන් අභ්‍යන්තර ප්‍රාග්ධන අවශ්‍යතාව පිහිටුවා, සියලුම අවදානම්වලට (1වන ස්ථම්භය යටතේ හසුකර ගත් හා හසුකර නොගත් යන දෙකම) සහ බාහිර සාධකවලට ගැලපෙන සේ ප්‍රාග්ධනය මත වර්ධනය කිරීම

**3. ඉදිරි ප්‍රාග්ධන සැලසුම**

3.1 බැංකුවේ උපායමාර්ගික කාල දර්ශනපථයට ගැලපෙන සේ එහි ප්‍රාග්ධන අවශ්‍යතා වෙනස්වන්නේ කෙසේද, එම වෙනස්වීම්වලට බැංකුව ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න බැංකුව සලකා බලයි. ප්‍රාග්ධන සැලසුමේ අරමුණ වනුයේ, ආර්ථික පසුබැස්මකදී වුවද, වෙනස්වන ආර්ථික තත්ත්වයන් යටතේ බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහතික කිරීමට හැකියාව ලබා දීම යි.

3.2 ප්‍රාග්ධන සැලසුම් ක්‍රියාවලියේදී, පහත දැක්වෙන කරුණු සමාලෝචනයට භාජනය කරනු ලැබීය:

අ. ආයතනයේ ප්‍රවර්තන ප්‍රාග්ධන අවශ්‍යතාව

ආ. සැලසුම්ගත ප්‍රාග්ධන පරිභෝජනය

ඇ. ඉලක්කගත හා යෝග්‍ය ප්‍රාග්ධන මට්ටම (ආයතනයේ උපාය මාර්ග සහ අවදානම නැඹුරුව සලකා බලමින්)

ඈ. ප්‍රාග්ධන කළමනාකරණ ආකාරය: ප්‍රාග්ධන වර්ධනය සඳහා යොදාගතහැකි අභ්‍යන්තර හා බාහිර සම්පත් (ලාභ ඉපයීමේ හැකියාව)

ඉ. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තහවුරු කිරීමට යොදාගතහැකි සෙසු ක්‍රම (උදා: ලාභාංශ ගෙවීම් සහ ශේෂ පත්‍ර අයිතමයන් ආදිය සඳහා අයවැය)

ඊ. පවත්වාගතයුතු අවම ප්‍රාග්ධන මට්ටම සහ ආනුෂංගික ලාභාංශ ගෙවීම පිළිබඳව භාණ්ඩාගාරය සමග සාකච්ඡාවන්

උ. මහජන බැංකුවේ සමස්ත අභිමතය වනුයේ, නිරන්තරයෙන්ම යටත්පිරිසෙයින් පහත දැක්වෙන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයන්වත් පවත්වා ගැනීමය. විශේෂයෙන්ම බාසල් III මගින් අපේක්ෂිත නියාමන පරිසරයට අනුකූලව, මෙම අවම මට්ටම් සමාලෝචනයට භාජනය කරමින් සංශෝධනයට පාත්‍ර කරනු ලැබේ.

| | නියාමන | ICAAP |
|---|---|---|
| 1 ස්ථරය | 10.4% | 9.4% |
| සම්පූර්ණ ප්‍රාග්ධනය | 15.0% | 13.6% |

4. ICAAP අභ්‍යාසයේ ප්‍රතිඵලය ලේඛනගත කිරීම - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකර ඇති ආකාරයට, පළමුවන ICAAP ලේඛනය, 2013 වර්ෂයේදී එම බැංකුවට මහජන බැංකුව විසින් ඉදිරිපත් කරන ලදී.

## ICAAP අභ්‍යාසය අනුව ගණනය කරනලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පහත දැක්වේ:

| | අවදානම් වර්ගය | 2013 RWA | 2013 ප්‍රාග්ධන අයකිරීම (5%) | 2013 ප්‍රාග්ධන අයකිරීම (10%) | 2012 RWA | 2012 ප්‍රාග්ධන අයකිරීම (5%) | 2012 ප්‍රාග්ධන අයකිරීම (10%) |
|---|---|---|---|---|---|---|---|
| | ණය | 212,740 | 10,637 | 21,274 | 205,934 | 10,297 | 20,593 |
| 1වන ස්ථම්භය | වෙළෙඳපොළ | 6,223 | 311 | 622 | 5,301 | 265 | 530 |
| | මෙහෙයුම් | 62,787 | 3,139 | 6,278 | 55,928 | 2,796 | 5,593 |
| | සම්පූර්ණ 1වන ස්ථම්භ RWA | 281,750 | | | 267,163 | | |
| | සම්පූර්ණ 1වන ස්ථම්භ ප්‍රාග්ධන අවශ්‍යතාව | | 14,087 | 28,174 | | 13,358 | 26,716 |
| | අදාළ ප්‍රාග්ධන පදනම | | 29,261 | 42,204 | | 26,049 | 37,407 |
| | ප්‍රාග්ධන - හදිසි අවස්ථා පාදක | | 15,174 | 14,030 | | 12,691 | 10,691 |
| | නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව | | 10.4% | 15.0% | | 9.8% | 14.0% |
| 2වන ස්ථම්භය එකතුව | | | | | | | |
| | Liq. & Rep. අවදානම | 5,354 | 268 | 535 | 8,096 | 405 | 809 |
| | IR බැංකුකරණ පොත | 7,557 | 378 | 756 | 8,760 | 438 | 876 |
| | සංකේන්ද්‍රණ අවදානම | 1,104 | 55 | 110 | 3,505 | 175 | 350 |
| සෙසු අවදානම් | උකස්කරණය | 8,183 | 409 | 818 | 7,458 | 373 | 746 |
| | 2වන ස්ථම්භය එකතුව +II RWA | 303,948 | | | 294,982 | | |
| | සම්පූර්ණ ප්‍රාග්ධන අවශ්‍යතාව | | 15,197 | 30,393 | | 14,749 | 29,497 |
| | ප්‍රාග්ධන පදනම ගැලපුම | | 28,505 | 41,448 | | 25,304 | 36,662 |
| | ප්‍රාග්ධන - හදිසි අවස්ථා පාදක | | 13,308 | 9,392 | | 10,555 | 7,165 |
| | අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව | | 9.4% | 13.6% | | 8.6% | 12.4% |

2013 වර්ෂය අවසානයේදී, අභ්‍යන්තර තක්සේරුව පාදක ප්‍රවේශය විසින් 1වන අදියර ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් මිලියන 15,197 දක්වාද, සම්පූර්ණ ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් මිලියන 30,398 දක්වාද යොමු කරන ලදී. සුරැකුම් අගයෙහි බිඳවැටීමක ශක්‍යතාව ගණනය කරන ලදුව, රුපියල් මිලියන 28,505ක 1වන අදියර පාදක ප්‍රාග්ධනයක් ද, රුපියල් මිලියන 41.448ක ගලපන ලද සම්පූර්ණ ප්‍රාග්ධන පදනමක්ද බැංකුවට පැවතියේ, පිළිවෙළින් රුපියල් මිලියන 13,308ක හා රුපියල් මිලියන 9,392ක හදිසි අවස්ථා ප්‍රාග්ධන පදනමක්ද සපයමිනි. ඒ අනුව, බැංකුවේ වර්ධන අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍යවන ශක්තිය සඳහා බැංකුව ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධනීකරණයවී ඇති බව පෙනී යයි.

2013 වර්ෂය තුළදී, රුපියල් මිලියන 7,165 සිට රුපියල් මිලියන 9,392 දක්වා හදිසි අවස්ථා ප්‍රාග්ධනය වැඩිදියුණුවී තිබේ. අනාගතයේදී, ස්වකීය මෙහෙයුම් පරිමාණයන් හා විෂය පථයන් වැඩි කර ගැනීමට බැංකුවට හැකිවන බව, මෙම වර්ධන ගම්‍යතාව පෙන්නුම් කර ඇත.

# මූල්‍ය වාර්තා

## අන්තර්ගතය


අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව .................................................. 152
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ................ 155
අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ............... 156
ස්වාධීන තහවුරු කිරීමේ වාර්තාව ........................................... 158
තථ්‍ය සොයාගැනීම් හා ආයතනික පාලනය පිළිබඳ වාර්තාව ....... 160
මාණ්ඩලීය විගණන කමිටු වාර්තාව ..........................................180
විගණකාධිපතිගේ වාර්තාව .................................................... 183
ආදායම් ප්‍රකාශය ................................................................. 185
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය .................................................. 186
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ............................................ 187
මුදල් ප්‍රවාහ ප්‍රකාශය .......................................................... 188
ස්කන්ධ වෙනස්වීම ප්‍රකාශය .................................................. 189
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ................................................ 191

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

## අධ්‍යක්ෂවරු

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අමාත්‍යවරයා විසින් පත්කරන ලද අධ්‍යක්ෂවරුන් අට දෙනෙකුගෙන් සමන්විත වන අතර, එයින් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු 1961 අංක 29 දරන මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පතෙහි විධිවිධාන ප්‍රකාරව, සමුපකාර කටයුතුභාර අමාත්‍යවරයා විසින් නම් කිරීමෙන් පත්කරනු ලැබේ. මසකට යටත් පිරිසෙයින් එක්වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතු අතර, 2013 වසරේදී 14 වාරයක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලදී. මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය පස්දෙනෙකි. 2013 වසර තුළ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වෙන පරිදි විය.

| නම |
|---|
| ගාමිණී සෙනරත් මහතා - 2013 පෙබරවාරි මස පත්කරන ලදී. |
| ජෙහාන් පී. අමරතුංග මහතා |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය |
| ඩී.එම්. පවර දසනායක මහතා |
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා - 2013 මාර්තු මස පත්කරන ලදී |
| ආර්.එම්.පී. රත්නායක මහතා - 2013 අප්‍රේල් මස පත්කරන ලදී |
| පී.කුඩාබාලගේ මහතා - 2013 අප්‍රේල් මස පත්කරන ලදී |
| ඩබ්. කරුණාජීව මහතා - 2013 ජනවාරි මස 28 තෙක් |
| එම්.එම්. ප්‍රියන්ත කේ. මායාදුන්නේ මහතා - 2013 මාර්තු මස විශ්‍රාම ගන්නා ලදී |
| එම්.ටී.අයි. විශාඛා අමරසේකර මහත්මිය - 2013 අප්‍රේල් තෙක් |
| අජිත් පණ්ඩිතරත්න මහතා - 2013 මැයි මස විශ්‍රාම ගන්නා ලදී |
| ආචාර්ය ඩී.ජේ.ඩී. ජයකොඩි - 2013 සැප්තැම්බර් මස විශ්‍රාම ගන්නා ලදී |

### වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම

2013 වසරේදී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව - 14

| නම | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | සහභාගීවූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| ගාමිණී සෙනරත් මහතා | 13 | 13 |
| ජෙහාන් පී. අමරතුංග මහතා | 13 | 12 |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | 13 | 12 |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | 13 | 12 |
| ඩී.එම්. පවර දසනායක මහතා | 14 | 14 |
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා | 12 | 11 |
| ආර්.එම්.පී. රත්නායක මහතා | 10 | 8 |
| පී. කුඩාබාලගේ මහතා | 10 | 9 |
| ඩබ්. කරුණාජීව මහතා | 1 | 1 |
| ආචාර්ය ඩී.ජේ.ඩී. ජයකොඩි | 10 | 9 |
| අජිත් පණ්ඩිතරත්න මහතා | 5 | 5 |
| එම්.ටී.අයි. විශාඛා අමරසේකර මහත්මිය | 4 | 3 |
| ප්‍රියන්ත කේ. මායාදුන්නේ මහතා | 2 | 2 |

## පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්

බැංකුවේ පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් පහත දක්වා ඇත.

### (අ) සීමාසහිත පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පොදු සමාගම

බැංකුවේ කොටස්හිමිකාරීත්වය - 75%

මෙම සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ මූල්‍ය හා මෙහෙයුම් කල් බදු, කුලීපිට පදනම මත විකුණුම්, වත්කම් මූල්‍යනය හා ඉස්ලාමීය මූල්‍ය තැන්පතු හා ඉතුරුම් පිළිබඳ කටයුතු කිරීමයි.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝජනය පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| ගාමිණී සෙනරත් මහතා | - | සභාපති |
| පී. කුඩාබාලගේ මහතා | - | අධ්‍යක්ෂ |

### (ආ) සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

බැංකුවේ කොටස්හිමිකාරීත්වය - 99%

සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ ගුවන් ටිකට්පත් අලෙවිය සහ චාරිකා සංවිධානය කිරීමයි.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝජනය පහත පරිදි වේ**

| | | |
|---|---|---|
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | - | සභාපතිනිය |
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා | - | අධ්‍යක්ෂ |
| ඩී.එම්. පවර දසනායක මහතා | - | අධ්‍යක්ෂ |

### (ඇ) සීමාසහිත පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පොදු සමාගම

බැංකුවේ කොටස්හිමිකාරීත්වය - 26.1%

බැංකුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ කල් බදු මූල්‍යනය, වාණිජ මූල්‍යයනය, ආයතනික මූල්‍යයනය සහ ඒ හා අදාළ උපදේශන සේවා සැපයීම, ආයෝජන බැංකු කටයුතු හා නිශ්චල දේපල සංවර්ධන කටයුතුය.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝජනය පහත පරිදි වේ**

| | | |
|---|---|---|
| පී. කුඩාබාලගේ මහතා | - | සභාපති |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | අධ්‍යක්ෂ |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | - | අධ්‍යක්ෂ |

## ආයතනික යහපාලනය

බැංකුව විසින් ස්වේච්ඡාවෙන්ම යහපාලනය පිළිබඳ විධිවිධාන මාලාවක් සම්මත කරගනු ලැබූ අතර, ශක්තිමත් ආයතනික යහපාලනයක් තහවුරු කෙරෙන පද්ධතීන් සහ ක්‍රියාපිළිවෙත් ස්ථාපිත කර ඇත.

ආයතනික යහපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් 117 සිට 126 පිටුවල ඇතුළත් කර ඇත.

### අනුකූලතා වාර්තාකරණය

බැංකුව තුළ අනුකූලතා කාර්සාධන ඒකකයක් පිහිටුවා ඇත. ප්‍රධාන විධායක නිළධාරි සහ අනුකූලතා නිළධාරි විසින් සහතික කරන ලද අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අර්ධ මාසිකව ඉදිරිපත් කරනු ලැබේ. කාර්ය මණ්ඩලය සඳහා ආචාරධර්ම පද්ධතියක් නිර්මාණය කර ඇති අතර, එය සෑම කාර්ය මණ්ඩල සාමාජිකයකු වෙතම ලබාදී තිබේ.

අනුකූළතා වාර්තාකරණය පිළිබඳව සවිස්තර වාර්තාවක් 111 සහ 113 පිටුවල ඇතුළත් කර ඇත

2013 දෙසැම්බර් 31 වෙනි දිනට මාණ්ඩලීය අනු කමිටු පහත පරිදි විය.

### මාණ්ඩලීය විගණන කමිටුව (මා.වි.ක.)

| | | |
|---|---|---|
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | සභාපති - (මා.වි.ක.) |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | - | අධ්‍යක්ෂ |
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා | - | අධ්‍යක්ෂ |
| ආර්.එම්.පී. රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ, මෙහෙයුම් කාර්යයන්හිදී බැංකුව මුහුණ දෙන අවදානම් තත්ත්වයන් හඳුනාගෙන, එවැනි අවදානම් තත්ත්ව මඟින් ඇති විය හැකි බලපෑම් වළක්වාලීම හෝ අවම කරලීම සඳහා සහ යහපත් පරිචයන් සහ මනා තත්ත්ව ආරක්ෂණයන් සමස්ත බැංකු ජාලය තුළම සන්නිවේදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීමයි.

### මාණ්ඩලීය විධායක ණය කමිටුව (මා.වි.ණ.ක.)

| | | |
|---|---|---|
| පී. කුඩාබාලගේ මහතා | - | සභාපති - (මා.වි.ණ.ක.) |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | - | අධ්‍යක්ෂ |
| ඩී.එම්. පවර දසනායක මහතා | - | අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර් මහතා | - | ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි |
| ඒ.එස්. ඊබ්‍රහිම් මහතා | - | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) |
| රසිත ගුණවර්ධන මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ණය පාලන හා අවදානම්) |

මාණ්ඩලීය විධායක ණය කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ බැංකුවේ ණය ප්‍රතිපත්තිය සකස් කිරීම හා කාලීනව එය සමාලෝචනය කිරීමයි. විශේෂිත කණ්ඩායම් සඳහා නියමිත සීමාවන් ඉක්මවා ණය පහසුකම් සඳහා අවසරය ලබාදීමද මෙම කමිටුවේ කාර්යයකි.

### මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (මා.මා.ස.පා.ක.)

| | | |
|---|---|---|
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා | - | සභාපති - (මා.මා.ස.පා.ක.) |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | - | අධ්‍යක්ෂ |
| පවර දසනායක මහතා | - | අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර් මහතා | - | ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි |

මෙම කමිටුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්තීන් හා ක්‍රියාපටිපාටීන් සැකසීම, බැංකුවේ ව්‍යාපාරික අවශ්‍යතා අනුව සේවා යෙදවුම් මට්ටම් සමාලෝචනය හා සැකසීම, බඳවා ගැනීම් අනුමත කිරීම, සේවක සුභ සාධනය, සේවා දිගුකිරීම් ලබාදීම සහ ආයතනික හා විධායක කළමනාකරුවන් සඳහා සේවා ගිවිසුම් සැකසීමයි.

### මාණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව (මා.ස.අ.ක.ක.)

| | | |
|---|---|---|
| පී. කුඩාබාලගේ මහතා | - | සභාපති (මා.ස.අ.ක.ක.) |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | අධ්‍යක්ෂ |
| ආර්.එම්.පී. රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර් මහතා | - | ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි |
| ඒ.එස්. ඊබ්‍රහිම් මහතා | - | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) |

බැංකුවේ සමෝධානිත අවදානම් කළමනාකරණය සම්බන්ධව නිරන්තර සමාලෝචනය කරමින්, බැංකුවේ අවදානම් කළමනාකරණය හා බැඳුණු විවිධ ප්‍රයත්නයන් සඳහා අවශ්‍ය යෙදවුම්මය කරුණු නිර්දේශ කිරීමට මෙම අනුකමිටුව ස්ථාපිත කර ඇත.

වත්කම් හා වගකීම් කමිටු වාර්තා හා රැස්වීම්වලින්ද, ණය අවදානම හා අදාළ සාධක හා වාර්තා මඟින්ද, අවදානම් කළමනාකරණ මෙහෙයුම් කාර්ය රාමු ස්ථාපන ප්‍රයත්නයන් ඔස්සේද උද්ගතවන ක්‍රියාපිළිවෙත්හි හා සාධකයන්හි සාරාංශයන් විශේෂිත වශයෙන් විමසා බැලීම, සමෝධානිත අවදානම් කළමනාකරණ අනුකමිටුව විසින් සිදුකරනු ලැබේ.

බැංකුවේ සමෝධානිත අවදානම් කළමනාකරණය සම්බන්ධ සවිස්තර කරුණු මෙම වාර්තාවේ අංක 127 සිට 150 දක්වා පිටුවල දැක්වෙන මෙකී විෂයය හා සම්බන්ධ තවත් කොටසක අන්තර්ගත කර ඇත.

## මාණ්ඩලීය නාමයෝජනා කමිටුව (මා.නා.ක.)

| | | |
|---|---|---|
| ගාමිණී සෙනරත් මහතා | - | සභාපති - (මා.නා.ක.) |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | අධ්‍යක්ෂ |
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා | - | අධ්‍යක්ෂ |
| ආර්.එම්.පී. රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| පී. කුඩාබාලගේ මහතා | - | අධ්‍යක්ෂ |

මෙම කමිටුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරී තනතුරට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට පුද්ගලයන් තෝරාගැනීම/පත්කිරීම සඳහා සුදුසු ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරී තනතුර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ තනතුරු සඳහා පුද්ගලයන් පත්කිරීම හෝ උසස් කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් ප්‍රධාන කුසලතා නිර්ණය කිරීම සහ බැංකුවේ ප්‍රගතිය සඳහා කලින් කලට අවශ්‍ය කරනු ලබන අතිරේක/නව විශේෂඥයන්ගේ අවශ්‍යතාව පිළිබඳ සළකා බැලීම හා ඒ පිළිබඳ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමය.

## මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටුව (මා.ආ.බැ.ක.)

| | | |
|---|---|---|
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | සභාපති - (මා.ආ.බැ.ක.) |
| පී. කුඩාබාලගේ මහතා | - | අධ්‍යක්ෂ |
| ආර්.එම්.පී. රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර් මහතා | - | ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරී |
| ඒ.එස්. ඊබ්‍රහිම් මහතා | - | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) |

මාණ්ඩලිය ආයෝජන බැංකුකරණ කමිටුව ස්ථාපිත කිරීමේ අරමුණ වුයේ, ආයෝජන බැංකු ඒකකයට උපායමාර්ගික විධානයන් හා මාර්ගෝපදේශයන් සම්පාදනය කිරීම සහ බැංකුවේ ආයෝජන බැංකු ඒකකයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනයට භාජනය කිරීමයි.

මාණ්ඩලිය ආයෝජන බැංකුකරණ කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් බැංකුවේ ආයෝජන බැංකු ආකෘතිය නිරන්තර සමාලෝචනයට භාජනය කිරීමත්, කොටස් වෙළෙඳ සීමාවන් අනුමත කිරීමත්, නව ආයෝජන නිපැයුම් අනුමත කිරීමත්, ආයෝජන බැංකු ඒකකයේ මෙහෙයුම් සමාලෝචනයට භාජනය කිරීමත්, ව්‍යාපාර කොටස් තැරැව්කරුවන්ද, වෙළෙඳ ප්‍රතිපත්තීන් හා තොරතුරු තාක්‍ෂණ පද්ධතීන්ද භාවිතය සඳහා අනුමැතිය ලබාදීමත්ය.

## මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුව (මා.තො.තා.ක.)

| | | |
|---|---|---|
| ගාමිණී සෙනරත් මහතා | - | සභාපති - (මා.තො.තා.ක.) |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | අධ්‍යක්ෂ |
| පී.කේ.ඩී. අමරවර්ධන මහතා | - | අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර් මහතා | - | ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරී |

මණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, අභියෝග හා තරඟකාරීත්වය ජයගතහැකිවන පරිදි දුරදක්නා උපායමාර්ග සකස් කිරීමත්, තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ, බැංකුවේ තොරතුරු තාක්ෂණය සාර්ථකව ඉදිරියට රැගෙනයාම සඳහා ප්‍රතිපත්තිමය විධානයන් සම්පාදනය කිරීමත්ය.



රොහාන් පතිරගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

2014 පෙබරවාරි 11 දින

# මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

බැංකුව විසින් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත් ලෙස ගිණුම්පොත් පවත්වා ගෙන යාම, සහ අදාළ වර්ෂය තුළ බැංකුවේ ලාභ/අලාභ පිළිබඳව හා කටයුතුවල තත්ත්වය පිළිබඳව, සත්‍ය හා සාධාරණ අදහසක් නිරූපණය කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, තහවුරු කිරීම පිළිබඳ වගකීම, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, විගණන කමිටුව හරහා සහ නිතිපතා පවත්වනු ලබන ඔවුනගේ රැස්වීම්වල කටයුතු සමාලෝචනයන් තුළින්, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකාරිත්වයේ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබයි. මාණ්ඩලීය විගණන කමිටු වාර්තාව 180 සිට 182 දක්වා වූ පිටුවල ඇතුළත් කර ඇත.

බැංකුව තුළ අභ්‍යන්තර පාලනය හා අදාළවන ඵලදායී හා විස්තීර්ණ ක්‍රම හා පද්ධතීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත. අභ්‍යන්තර පරීක්ෂාව, අභ්‍යන්තර විගණනය, බැංකුවේ ව්‍යාපාරික කටයුතු විධිමත් ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සමස්ත මූල්‍ය පද්ධතීන් හා සෙසු පාලනයන්, වත්කම් ආරක්ෂණය සහ හැකිතාක් දුරට ප්‍රායෝගිකව වාර්තාවන්හි නිරවද්‍යභාවය හා විශ්වසනීයත්වය පවත්වා ගෙන යාම යනාදිය ඊට අන්තර්ගත වෙයි. පිටු අංක 185 සිට 262 දක්වා වාර්තාකර ඇති පරිදි, 2013 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් කරගනිමින්, ඒකාකාරී පදනමක් මත යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සලකනු ලැබේ.

මෙම වාර්තාව තුළ පිළියෙලකොට ඉදිරිපත් කර ඇති, 2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වසර සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1988 අංක 30 දරන බැංකු පනත හා ඊට අදාළ සංශෝධන සමග අනුකූල වේ. බාහිර විගණකගේ වාර්තාව අනුව, බැංකුවේ සහ එහි සමාගම් සමුහයෙහි කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශනයක් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය වේ.



රොහාන් පතිරගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

2014 පෙබරවාරි 18 දින

# අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

## වගකීම

2007 අංක 11 දරන බැංකු පනත් විධානයන්හි 3(8)(II) (ආ) වගන්තියට අනුකූලව, මහජන බැංකුවේ (බැංකුවේ) අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

බැංකුවේ අභ්‍යන්තර පාලනය සඳහා පවත්නා පද්ධතියෙහි ප්‍රමාණවත්භාවය හා ඵලදායකත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකීම භාරගනී. එවැනි පද්ධතියක් සැලසුම් කොට ඇත්තේ බැංකුවේ ප්‍රතිපත්තීන් හා ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමේ කාර්යයේදී, අසාර්ථකවීමේ අවදානම සම්පූර්ණයෙන් ඉවත්කිරීමට වඩා, පිළිගතහැකි අවදානම් පැතිකඩක් තුළ බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රයන් කළමනාකරණය කිරීමට හැකිවන ආකාරයටය. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධති මගින් සාධාරණ සහතිකවීමක් පමණක් සැපයෙන නමුත් කළමනාකරණ හා මූල්‍ය තොරතුරු සහ වාර්තා අවප්‍රකාශනයන් හෝ මූල්‍ය අලාභයන් හෝ වංචාවන්ට එරෙහිව පරිපූර්ණ සහතිකවීමක් සපයනු නොලැබේ.

බැංකුව මුහුණදෙන සුවිශේෂ අවදානම් හඳුනාගැනීමට, ඇගැයීමට හා කළමනාකරණයට අඛණ්ඩව පවත්නා ක්‍රියාවලියක් බැංකුව විසින් ස්ථාපිත කර ඇති අතර, ව්‍යාපාරික පරිසරයෙහි හෝ නියාමන මාර්ගෝපදේශයන්හි සිදුවන කාලීන වෙනස්කම්වලට අනුරූපව, අභ්‍යන්තර පාලන පද්ධතියෙහි වර්ධනයන් සිදුකිරීමද මෙම ක්‍රියාවලියට ඇතුළත් වෙයි. මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය නිතිපතා සමාලෝචනයට භාජනය කරනු ලැබේ. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය හා සම්බන්ධව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත්කර ඇති බැංකු අධ්‍යක්ෂවරුන්ගේ මාර්ගෝපදේශයන්ට අනුකූලව එය සිදුකෙරේ. එම මාර්ගෝපදේශයන්හි දක්වා ඇති අන්දමට අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේදී නියම කර ඇති ප්‍රතිපත්තීන් සහ මූලධර්ම අවධාරණය කොට, බැංකුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට භාජනය කර තිබේ.

මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වය පිළිබඳව සහ බාහිර අවශ්‍යතාවන් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමද සම්බන්ධයෙන් සාධාරණ සහතිකවීමක් ලබාදීමට දැනට පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය යහපත් හා ප්‍රමාණවත්බවද ගිණුම් හා අදාළ ප්‍රතිපත්තීන්ට හා නියාමන අවශ්‍යතාවන්ට ඒවා අනුකූලබවද අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි.

උද්ගතවන්නාවූ අවදානම් හඳුනාගැනීමෙන් හා තක්සේරුකිරීමෙන්ද, එම අවදානම් විසඳාගැනීමට හා පාලනය කිරීමට ගැළපෙන අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම තුළින්ද, අවදානම හා පාලනය පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් ක්‍රියාත්මක කිරීමේදී බැංකුවේ කළමනාකාරීත්වය මණ්ඩලයට සහායවෙයි.

### මූල්‍ය වාර්තාකරණය හා බැඳුණු අභ්‍යන්තර පාලන පද්ධතියෙහි නිර්මාණය හා ඵලදායකත්වය පිළිබඳව සමාලෝචනය සඳහා යොදාගත හැකි ක්‍රියාවලියේ මූලික ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය හා අදාළ වන අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණවත්බව හා සද්භාවය පිළිබඳ සමාලෝචනය කිරීමෙහිලා ස්ථාපනයකර ඇති ප්‍රධාන ක්‍රියාවලීන්ට, පහත සඳහන් කරුණු ඇතුළත්වෙයි.

- බැංකුව ඇතුළත ඵලදායී අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකමිටු පත් කරනු ලැබ ඇත. ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරීතැනගේ ප්‍රධානත්වයෙන් ආයතනික කළමනාකාරීත්වයක් පත්කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට අනෙක් ස්තරයන් වෙත බලතල පවරාදීමට හැකියාව ලැබී ඇත. උද්ගතවන්නාවූ අවදානම් හඳුනාගැනීමෙන් හා තක්සේරු කිරීමෙන්ද එම අවදානම් සමනය කිරීමට හා පාලනය කිරීමට යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම තුළින්ද අවදානම හා පාලනය පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් ක්‍රියාත්මක කිරීමේදී කළමනාකරණ අංශය මණ්ඩලයට සහායවෙයි.
- ණය, වෙළෙඳපොළ සහ මෙහෙයුම් අවදානම් ඇතුළු ප්‍රධාන අවදානම් හඳුනාගැනීමට, පාලනයට සහ වාර්තාකරණයට, අවශ්‍ය පද්ධති සහ ක්‍රියාපිළිවෙත් සකස් කර තිබේ. මෙම අවදානම්වලට නිරාවරණයවීම මාණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ. කමිටුව විසින් බැංකුව නිරාවරණය වියහැකි සියලුම අවදානම්වල ස්වභාවයන්, යෝග්‍ය අවදානම් දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු හරහා කලින් කලට තක්සේරු කරන අතර, නිශ්චිත අවදානම්වලට මුහුණදීම සඳහා මෙන්ම, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමා තුළ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා සියළුම කළමනාකරණ මට්ටම්වල කමිටු සතු ප්‍රමාණාත්මකභාවය සහ කාර්යක්ෂමතාවයද සමාලෝචනය කරනු ලැබේ. ආතති පරීක්ෂණය සහ අවදානම්වල ගතිලක්ෂණ සමාලෝචනයද මෙයට ඇතුළත් වේ. මාණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන විචක්ෂණ සීමාවන් ඉක්මවන ප්‍රමාණයේ අවදානම් ඇති අවස්ථාවලදී, නිශ්චිත අවදානම්වල ප්‍රතිවිපාක සමනය කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ.
- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමේදී, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන වැදගත් ගිණුම්වලට හා අනාවරණයන්ට සම්බන්ධ සියලු ක්‍රියාපිළිවෙත් හා පාලනයන්, බැංකුව විසින් සමාලෝචනය කරනු ලබයි. ඒ හා සමගම, දිගින් දිගටම සැලසුමේ හා ඵලදායකත්වයේ යෝග්‍යතාව සහතික කරනුවස්, අභ්‍යන්තර විගණන අංශය විසින් ඒවා අඛණ්ඩ පදනම මත නිරීක්ෂණයට හා විමර්ශනයට භාජනය කරනු ලැබිය. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම්, මණ්ඩලීය විගණන කමිටුවේ කාලීන රැස්වීම්වලදී සමාලෝචනය කරනු පිණිස එම කමිටුවට ඉදිරිපත් කෙරේ. මෙම

පද්ධති තක්සේරුවෙන් බැංකුවේ ක්‍රියාවලින් පමණක් ඇගයීමට භාජනයවූ අතර, එහි පරිපාලිතයින් හා ආශ්‍රිතයින් විසින් ක්‍රියාත්මක කරන ලද පද්ධතීන් ඊට අන්තර්ගත නොවිය.

- මාණ්ඩලීය විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සමස්ත ඵලදායකත්වය අධීක්ෂණය කරනු ලබන අතර, ඒ පිළිබඳව නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබ ඇත. කමිටුව මඟින් භාවිතා කරන ලද ප්‍රධාන ක්‍රියාදාමයන් අතර, නිරන්තර ව්‍යාපාර සහ මෙහෙයුම් අවදානම් තක්සේරු කිරීම, අභ්‍යන්තර විගණනය සහ අනුකූලතාවය ඇතුළු ප්‍රධාන අවදානම් කාර්යයන්හි ප්‍රධානීන්ගෙන් නිතිපතා වාර්තා ලබා ගැනීම, අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන වාර්තා, විචක්ෂණ විමර්ෂණ සහ නියාමන වාර්තා පිළිබඳ සමාලෝචන හා පසු විපරම් සිදුකිරීමද ඇතුළත්වේ. මාණ්ඩලීය විගණන කමිටුව විසින් බැංකුවට බලපාන ප්‍රධාන අවදානම් ස්වභාවයන්හී තත්ත්වයන් විමර්ෂනය කරනු ලබන අතර, ක්‍රියාත්මක කෙරෙන අවදානම් දුරුකරලීමේ ක්‍රියාමාර්ගවල යෝග්‍යතාවයද විමසා බැලීමක් කරනු ලැබේ.
- බැංකුවේ වාර්ෂික මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී එය පාලනය කෙරෙනුයේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති වාර්තාකරණ ආකෘතීන් හා වාර්තාකරණ අවශ්‍යතාවන් පිළිබඳ උපදෙස්ද පදනම් කර සකස් කරන ලද ලේඛනගත ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කරමිනි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අන්තර්ගතවූ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිතා කරමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ප්‍රවර්ථන වර්ෂය ඒවා අනුගමනය කරන දෙවන වර්ෂය වන අතර, එම ප්‍රමිතීන්හි අන්තර්ගත සියළුම හඳුනාගැනීම්, මිනුම්කරණ, වර්ගීකරණ සහ අනාවරණ අවශ්‍යතාවයන්ට එකඟවන ආකාරයට මූල්‍ය වාර්තාකරණය සිදුකර ඇත.
- අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය හා බැඳුණු සාක්ෂි රැස්කර ගැනීමේදී පරීක්ෂාවට භාජනය වූ තොරතුරු තාක්ෂණ සාමාන්‍යය පාලන ක්ෂේත්‍රය සඳහා වූ ලිපි ලේඛන පාලනයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතාවයන් හා බැඳුණු පරීක්ෂාව සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන වැඩිදියුණු කිරීම වැනි කරුණු පිළිබඳව බාහිර විගණනකවරුන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණයන් ඉදිරියේදී සැලකිල්ලට ගනු ලැබේ.

## තහවුරු කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලින් පදනම් කරගනිමින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවනසේ, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අභිමතාර්ථයන් සඳහා මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම යන කරුණු හා අදාළව සාධාරණ සහතිකයක් ලබාදිය හැකිවනසේ, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය පිළිබඳ අභ්‍යන්තර පාලනය සැලසුම්ගතව ඇතිබව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

## බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය

2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වූ බැංකුවේ වාර්ෂික වාර්තාව තුළ අන්තර්ගත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය, බාහිර විගණකවරු විසින් සමාලෝචනය කර ඇති අතර, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම හා ඵලදායීත්වය සමාලෝචනය කිරීමේදී ඒ සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් ඔවුන් ලත් අවබෝධය හා වැටහීමට අනුව, උක්ත ප්‍රකාශයට අනුකූල නොවන්නාවූ කිසිවක් පවතින බැව් විශ්වාස කිරීමට තරම් සාධක ඔවුන්ගේ අවධානයට යොමුවී නැතැයි ඔවුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

මණ්ඩලය වෙනුවෙන්,

ජෙහාන් පී. අමරතුංග
*විගණන කමිටු සභාපති*

ධර්මා එන්. ගම්මන්පිල
*අධ්‍යක්ෂ*

ජී.කේ.ඩී. අමරවර්ධන
*අධ්‍යක්ෂ*

ආර්.එම්.පී. රත්නායක
*අධ්‍යක්ෂ*

2014 මාර්තු 28 දින

# ස්වාධීන තහවුරු කිරීමේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } FB/G/PB/IC/2013 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதි / Date } 03 April 2014 |

## මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව වූ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති විගණකාධිපතිගේ සහතික කිරීමේ වාර්තාව

### හැඳින්වීම

2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රකාශිත, මහජන බැංකුවේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කරන ලද, එම බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය (ප්‍රකාශනය) පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් තහවුරුවක් ලබාදීම, මෙම වාර්තාව විසින් සිදුකෙරේ. මෙම වාර්තාව සැකසීමේදී, පොදුජන සේවයෙහි නියුක්ත වන්නාවූ වරලත් ගණකාධිකාරී ආයතනයක සහාය මා විසින් උපයෝගී කරගන්නා ලදී.

### කළමනාකාරිත්වයෙහි වගකීම

2007 අංක 11 දරන බැංකු පනතෙහි 3(8)(ii)(ආ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද 'අභ්‍යන්තර පාලන පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා මාර්ගෝපදේශ' වලට අනුකූලව මෙම ප්‍රකාශනය පිළියෙල කොට ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය වගකීම දරයි.

### මගේ වගකීම SLSAE 3050 සමඟ අනුකූලතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ ප්‍රකාශය පදනම් කරගනිමින් එම මණ්ඩලයට වාර්තාවක් නිකුත් කිරීම මගේ වගකීම වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද 'අභ්‍යන්තර පාලන පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා වන සහතික කිරීමේ වාර්තාවට' එනම්, SLSAE 3050 ට අනුකූලව මා විසින් මෙම කාර්යය ඉටු කරන ලදී.

### සිදුකරන ලද කාර්යයන් පිළිබඳ සම්පිණ්ඩනය

මාගේ කාර්යයන් ක්‍රියාවට නංවනලද්දේ, අධ්‍යක්ෂවරු හෝ ඔවුන් වෙනුවෙන් සකස් කොට ඉදිරිපත් කරන ලද ලිපි ලේඛනවලට අනුකූලව හා බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදය යෝග්‍ය පරිදි නිරූපණය කිරීම යන කරුණු දෙකම තහවුරු කෙරෙන පරිදි, මෙම වාර්තාව ඉදිරිපත් කර ඇත්ද යන්න ඇගයීමට භාජනය කිරීම සඳහායි.

මෙම අරමුණ ඉටුකර ගැනීමට පහත සඳහන් පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේදී යෝග්‍ය සාක්ෂි සපයා ගන්නා ලදී.

- අභ්‍යන්තර පාලන නිර්මාණය සහ එහි ඵලදායීත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද නිශ්චිත ක්‍රියාවලිය පිළිබඳව අවබෝධය අධ්‍යක්ෂවරුන්ගෙන් විමසීමෙන් ලබාගැනීම හා මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය සමඟ ඔවුනගේ අවබෝධය සංසන්දනය කිරීම.
- මෙම වාර්තාවේ කරුණු තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන පරීක්ෂා කිරීම.
- මා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී ලබාගන්නා ලද දැනුම සමඟ සම්බන්ධ කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාළ වන මණ්ඩලීය උප කමිටු රැස්වීම්වල වාර්තා සමාලෝචනය කිරීම.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

- අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලනය පිළිබඳව ප්‍රකාශනය ප්‍රවර්ථන වර්ෂය ආවරණය කරන්නේද සහ ඕනෑම ප්‍රමාණාත්මක කරුණක් හඳුනාගැනීමට ප්‍රමාණවත් ක්‍රියාපද්ධතියක් ස්ථාපිත වී ඇත්ද යන්න සලකා බැලීම.
- වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කරන අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය සලකා බැලීම හා අනුමත කරන ලද රැස්වීම සහිතව මාණ්ඩලීය විගණන කමිටු රැස්වීම් වලට සහභාගිවීම.
- වෙනත් ප්‍රමාණාත්මක වඩාත් යෝග්‍ය වූ විගණන සාක්ෂි සාධාරණ ලෙස පවතීයැයි සැළකිය නොහැකි අවස්ථාවන්හීදී අභ්‍යන්තර පාලන ප්‍රකාශය සඳහා ප්‍රමාණාත්මක ලෙස අදාළ වන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලිඛිත නියෝජනයන් ලබාගැනීම.

මූලික වශයෙන්ම බැංකුවේ නිළධාරීන්ගෙන් ලබාගත් තොරතුරුවලට මෙම පද්ධතිය සීමාවන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් ක්‍රියාවලිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන නියැදි ක්‍රමයට පරීක්ෂාවට භාජනය කරන ලදී.

ප්‍රකාශය විසින් සියලුම අවදානම් තත්ත්ව හා පාලන පද්ධති ආවරණය කරනු ලැබේද යන්න සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් තත්ත්වයන්හි සහ පාලන විධි පිළිවෙත්වල ඵලදායිතාව පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ SLSAE 3050 මා වෙතින් අපේක්ෂා නොකෙරේ. එසේම වාර්ෂික වාර්තාව මඟින් අනාවරණය කරන ලද කිසියම් සුවිශේෂී ගැටලුවල, අභ්‍යන්තර පාලන පද්ධතියට අදාළ වන ප්‍රමාණාත්මක ගැටළුවල බලපෑම් සම්බන්ධයෙන්, කටයුතු කිරීමට යොදා ගනු ඇතැයි විස්තර කරන ලද ක්‍රියාවලීන් මගින්, සත්‍ය වශයෙන්ම, අදාළ ගැටලුවලට විසඳුම් ලබා දෙන්නේද යන්න සලකා බැලීමද SLSAE 3050 මා වෙතින් අපේක්ෂා නොකෙරේ.

## නිගමනය

ක්‍රියාත්මක කරන ලද විධිපිළිවෙත් අනුව, බැංකුවේ අභ්‍යන්තර පාලන සැලසුම හා ඵලදායීත්වය සමාලෝචනය කිරීමේදී, බැංකු අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාපිළිවෙත සම්බන්ධයෙන් මා ලත් අවබෝධය අනුව, වාර්ෂික වාර්තාවේ අන්තර්ගත එම ප්‍රකාශයට අනුකූල නොවන්නාවූ කිසිවක් ඇති බව විශ්වාස කිරීමට මා හට හේතුවන කිසිදු සාධකයක් මාගේ අවධානයට යොමුවූයේ නැත.

**එච්.ඒ.එස්. සමරවීර**
විගණකාධිපති

# තථ්‍ය සොයාගැනීම් හා ආයතනික පාලනය පිළිබඳ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } FB/G/PB/CG/2013    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 03 April 2014

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, ආයතනික පාලන විධාන හා අදාළ අනුකූලත්ව අවශ්‍යතා සම්බන්ධයෙන් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනලද මහජන බැංකුවේ තථ්‍ය සොයා ගැනීම පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනලද ආයතනික පාලන විධාන හා අදාළ අනුකූලත්ව අවශ්‍යතා සපුරාලනු පිණිස, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස්කර ඉදිරිපත් කරනලද අභ්‍යන්තර පාලන වාර්තාව හා අදාළව මෙම වාර්තාවෙහි උපලේඛන අංක 1 යටතේ දක්වා ඇති ක්‍රියාපිළිවෙත් මා විසින් අනුගමනය කරනලදී. මෙම කාර්යය සිදුකරන ලද්දේ, එකඟතාවයටපත් ක්‍රියාකාරී පිළිවෙත් අනුව, සබැඳි සේවාවන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ 4400 (SLSRS 4400) තුළ අන්තර්ගත ප්‍රතිපත්තීන්ට අනුකූලවයි. ආයතනික යහපාලන විධාන අවශ්‍යතා සපුරාලීමේදී හුදෙක් ඔබට සහායවීම පිණිසම, එකී ක්‍රියාපිළිවෙත් ඉටුකරනු ලැබිය. මෙම ක්‍රියාවලිය ඉටුකිරීමේදී පොදු පරිචයෙහි නියුක්ත වන්නාවූ වරලත් ගණකාධිකාරී ආයතනයක සහාය මා විසින් උපයෝගී කරගන්නා ලදී.

මෙම වාර්තාවට අමුණා ඇති උපලේඛනය මගින් මගේ තීරණයන් වාර්තා කරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හෝ සමාලෝචන ක්‍රියාවලීන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතීන් හා අනුකූලවන්නාවූ පරිදි, විගණනයක් හෝ සමාලෝචනයක් යථෝක්ත ක්‍රියාපිළිවෙත් අනුව සිදුනොවූ හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනලද ආයතනික යහපාලන විධාන සමඟ අනුකූලවීම පිළිබඳ ආරක්ෂණයක් මා විසින් ප්‍රකාශ කරනු නොලැබේ.

මා විසින් අතිරේක ක්‍රියාපිළිවෙත් ඉටුකරනු ලැබුවේ නම් හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හෝ සමාලෝචන ක්‍රියාවලීන් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලවන්නාවූ පරිදි, විගණනයක් හෝ සමාලෝචනයක් යථෝක්ත ක්‍රියාපිළිවෙත් අනුව සිදුකරනු ලැබුවේ නම්, ඔබට වාර්තා කළයුතු වන්නාවූ වෙනත් කරුණු මගේ අවධානයට යොමුවන්නට ඉඩ තිබිණි.

මගේ වාර්තාව වනාහි හුදෙක්ම මෙම වාර්තාවේ පළමුවන ඡේදයෙහි දැක්වෙන අභිමතාර්ථය හා ඔබගේ දැනගැනීම පිණිස පමණක්ම වන අතර, අන් කවර හෝ අරමුණක් සඳහාවත් භාවිතා නොවිය යුතුවාක් සේම, වෙනත් පාර්ශවයන් අතර බෙදාහැරීමක් සඳහාද නොවන්නේය.

ඉහතින් නිශ්චිතව දක්වා ඇති අයිතමයන්ට පමණක් මෙම වාර්තාව අදාළ වන අතර, සමස්තයක් වශයෙන් සැළකෙන මහජන බැංකුවේ සෙසු මූල්‍ය ප්‍රකාශනයන් එමගින් ආවරණය නොවේ.

**එච්.ඒ.එස්. සමරවීර**
විගණකාධිපති

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

## තථ්‍ය සොයාගැනීම් පිළිබඳ වාර්තාවේ ඇමුණුම 1

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| **3 (1)** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම** | |
| 3 (1) (i) | බැංකුවේ සුරක්ෂිතභාවය හා අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීම. | |
| | (අ) බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>2011 - 2016 කාලච්ඡේදය සඳහා අනුමත උපායමාර්ගික සැලසුමක් බැංකුව සතුවේ. |
| | • බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම්, සමස්ත බැංකුව තුළම බැංකුව විසින් සන්නිවේදනය කර තිබේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>චක්‍රලේඛන හරහා උපායමාර්ගයන් අදාළ ශාඛා කළමනාකරුවන් වෙත සන්නිවේදන කර ඇත. |
| | (ආ) බැංකුවේ සමස්ත ව්‍යාපාරික අරමුණු සඳහා මාණ්ඩලික අනුමැතිය පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>2011 - 2016 කාලච්ඡේදය සඳහා අනුමත උපායමාර්ගික සැලසුමක් බැංකුව සතුවේ. |
| | • සමස්ත ව්‍යාපාරික අරමුණු තුළ, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපිළිවෙත් සහ යාන්ත්‍රණයන් අන්තර්ගතවීම හා එම කරුණු ලේඛනගත කිරීම පිළිබඳව පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මෙම කරුණු අනුමත උපායමාර්ගික සැලසුමේදී සැළකිල්ලට ගෙන ඇති අතර, මාණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව (ම.ස.අ.ක.ක.) සමාලෝචනයට භාජනය කර ඇත. |
| | • සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග තුළ, යටත් පිරිසෙයින් ඉදිරි තුන් වසර සඳහාවත් මැනිය හැකි ඉලක්කයන් පවත්නා බවට පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>2011 - 2016 කාලච්ඡේදය සඳහා උපායමාර්ගික සැලසුම තුළ මැනිය හැකි ඉලක්කයන් ඇතුළත් කර ඇති අතර, ඒවා කලින් කලට සමාලෝචනය කරනු ලැබේ. |
| | (ඇ) මණ්ඩලය විසින් හඳුනාගන්නා ලද හා අනුකූලතාව දක්වා ඇති අවදානම් කළමනාකරණය සඳහා යෝග්‍ය පද්ධතීන් නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව විසින් කලින්කලට අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. බැංකුව හා බැඳුනු සියළුම අවදානම් කළමනාකරණ පිළිවෙත් කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| | (ඈ) මණ්ඩලය විසින් සියලුම තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්හිමියන් සහ ණයගැතියන් සඳහා සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කරනු ලැබේ දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුවේ සන්නිවේදනය පිළිබඳ අනුමත උපාය මාර්ගික ප්‍රතිපත්තියක් පවතී. |
| | (ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත්භාවය හා ඍජුබව, බැංකුව විසින් සමාලෝචනයට භාජනය කරන ලද්දේ යැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය සහ සම්පූර්ණත්වය පිළිබඳව මණ්ඩලීය විගණන කමිටුව (ම.වි.ක.) සමාලෝචනය කර ඇත. ම.වි.ක. වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වරින්වර ඉදිරිපත් කෙරේ. |
| | (ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි නිර්වචනය කර ඇති ආකාරයට පහත සඳහන් ආකාරයේ කටයුතු වලට සම්බන්ධව බලපෑම් කළහැකි ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගැනීම හා නම් කිරීම කර ඇත්ද යන්න පරීක්‍ෂා කිරීම.<br>(i) සැළකිය යුතු ආකාරයට බලපෑම් කළහැකිවීමේ ප්‍රතිපත්තිය<br>(ii) ඍජු ක්‍රියාකාරකම් සහ<br>(iii) ව්‍යාපර කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය මෙහෙයවීම හා පාලනය කිරීම | අනුකූලතාව දක්වා ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (උ) බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම්හී කටයුතු මණ්ඩලීය ප්‍රතිපත්තිය හා අනුකූල වන්නේද යන්න තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝග්‍ය ක්‍රියාකාරකම් කර ඇත්ද යන්න පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අනුකමිටුව හරහා මණ්ඩලය විසින් එම කටයුතු පිළිබඳව යෝග්‍ය පරීක්ෂාවක් සිදුකර ඇත. 2013 වර්ෂය තුළදී පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සහ මණ්ඩලීය අනුකමිටු රැස්වීම් වාර ගණන පිළිබඳව තොරතුරු පහත දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් — 14<br>මාණ්ඩලීය විගණන කමිටු රැස්වීම් — 06<br>මාණ්ඩලීය විධායක ණය කමිටු රැස්වීම් — 23<br>මාණ්ඩලීය මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු රැස්වීම් — 11<br>මාණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් — 03<br>මාණ්ඩලීය නාමයෝජනා කමිටු රැස්වීම් — 03 |
| | (ඌ) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සඳහා, බැංකුව විසින් ඔවුන්ගේ අධිකාරය යෙදිය හැකි කරුණු සහ ප්‍රධාන වගකීම් නිගමනය කර තිබේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අනුකමිටු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වෙන් කර ඇත. යොමුකරවීමේ නිර්දේශයන් තුළින් අධිකාරිමය ක්ෂේත්‍රයන් සහ මූලික වගකීම් නිර්වචනය කර ඇත. |
| | (ඔ) පහත දෑ සහිතව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ ස්වකීය යහ පාලන පරිචයන්හී කාර්යසාධනීයභාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලච්ඡේද අනුව ඇගයීම් කර ඇත.<br>• අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් තෝරාගැනීම, නාම යෝජනා කිරීම සහ පත්කර ගැනීම.<br>• බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ<br>• දුර්වලතාවයන් හඳුනාගැනීම සහ අවශ්‍යතාවයන්ට අනුව වෙනස්කිරීම් ක්‍රියාත්මක කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මහජන බැංකු පනතේ වගන්ති අංක 8 ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරාගැනීම, නාම යෝජනා කිරීම සහ පත්කිරීම මුදල් ඇමතිවරයා විසින් කරනු ලැබේ. ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් මගින් සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගනු ලබන ප්‍රකාශනයන් හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනීයභාවය පිළිබඳව ඇගයීම් කරනු ලැබේ. කෙසේවෙතත්, වර්ෂය තුළදී එවැනි ප්‍රකාශනයන් සිදු කිරීමේදී ප්‍රමාණාත්මක තොරතුරක් අනාවරණය නොකිරීම හේතුවෙන් අධ්‍යක්ෂවරයෙකුගේ ඉල්ලා අස්වීමක් සිදුවී ඇත. |
| | (ඕ) ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් හා අදාළව අනුප්‍රාප්තික සැලැස්මක් මණ්ඩලය වෙත තිබේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>රැස්වීම් අංක 9/2012හි අධ්‍යක්ෂ මාණ්ඩලීය පත්‍රිකා අංක 279/2012 මගින් බැංකුව අනුප්‍රාප්තික සැලැස්මක් අනුමත කර ඇත. මෙම අනුප්‍රාප්තික සැලසුම ප්‍ර.වි.නි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, සහකාර සාමාන්‍යාධිකාරීන් සහ ප්‍රථම ශ්‍රේණියේ නිළධාරීන් සඳහා නිර්මාණය කර ඇත. ඔවුනගේ උත්තේජකභාවය තහවුරු කිරීමට බැංකුව සංවර්ධන සැලසුම් භාවිතා කරනු ලැබේ. |
| | (එ) ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපනය සහ ආයතනික අරමුණු කරා ලඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය පිණිස ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සමග, තීරණය කරගත් කාල සටහනක් අනුව, නිතිපතා රැස්වීම් පවත්වනු ලබන්නේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම ඊළඟ මුදල් වර්ෂය සඳහා මාණ්ඩලීය උපකමිටු රැස්වීම් පිළිබඳ කාලසටහනක් සකස් කරනු ලැබේ. ඔවුනගේ වගකීම් ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ආයතනික කළමනාකරණය නිරන්තරයෙන් ඒවාට සහභාගිවන වෙමින්, ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හී ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබේ. |
| | (ඒ) නියාමන පරිසරය අවබෝධ කරගැනීමට පියවර හා ක්‍රියාවලින් බැංකුව විසින් ගෙන ඇතිබව හා බැංකුව නියාමකයින් සමග ඵලදායී සබඳතාවක් පවත්වා ගන්නේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මාණ්ඩලීය විගණන කමිටුව මේ කරුණ සම්බන්ධයෙන් බැංකුවට සහායවෙයි. ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාවන් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කරනු ලැබේ. මේ හා සම්බන්ධව අනුකූලතා නිළධාරියෙකු මණ්ඩලය විසින් පත් කර ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ක) බාහිර විගණන නිළධාරීන්ගේ සේවය ලබාගැනීමේදී හා අධීක්‍ෂණයේදී බැංකුව සතු ක්‍රියාවලියක් පවත්නා බැව් පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි වගන්ති අංක 34 (1) ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් ඔහුගේ අධීක්‍ෂණය හා පාලනය යටතේ වෘත්තීය සුදුසුකම්ලත් විගණකයෙකු හෝ විගණකවරුන්ගේ සේවාවන් සඳහා පත්කිරීම් කෙරේ. |
| 3 (1) (ii) | මණ්ඩලය විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිළධාරීවරයා පත්කරනු ලැබ ඇත්තේ දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සභාපතිවරයා පත්කරනු ලැබ ඇත්තේ මුදල් ඇමතිවරයා විසිනි. නාම යෝජනා කමිටුව ඔස්සේ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරී පත්කරනු ලැබ ඇත. |
| | • සභාපතිවරයාගේ සහ ප්‍ර.වි.නි.ගේ කාර්යභාරයන් හා වගකීම මෙම විධානයන්හී අංක 3 (5) දරන වගන්තියට අනුකූල වන්නේ දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>කරුණාකර වගන්ති අංක 3 (5) යටතේ නිරීක්‍ෂණයකර ඇති ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරන්න. |
| 3 (1) (iii) | මණ්ඩලය නිතිපතා රැස්වීම් පැවැත්වූයේද, සාමාන්‍ය වශයෙන් මාසික විරාමයන් සහිතව වසරකට දොළොස් වාරයක්වත් මාණ්ඩලික රැස්වීම් පවත්වන ලද්දේ ද යන බව පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>2013 වර්ෂය තුළදී මණ්ඩලය 14 වාරයක් රැස්වී ඇත. |
| 3 (1) (iv) | ව්‍යාපාර ප්‍රවර්ධනය හා බැංකුවේ අවදානම් තත්ත්වයන් කළමනාකරණ කරනු පිණිස අදාළ වන්නාවූ කරුණු සහ යෝජනා මණ්ඩලීය රැස්වීම්වලදී අධ්‍යක්‍ෂවරුන්ට සාකච්ඡා කළ හැකි වනසේ රැස්වීම් න්‍යාය පත්‍රය තුළ ඇතුළත් කිරීමට ක්‍රියාපිළිවෙත් සකසා තිබේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (1) (v) | සෑම අධ්‍යක්‍ෂවරයෙකුටම මණ්ඩලීය රැස්වීම්වලට නිතිපතා සහභාගිවීමට හැකි වනසේ, රැස්වීම් පැවැත්වීම පිළිබඳව යටත් පිරිසෙයින් දින හතකවත් පූර්ව දැනුම්දීමක් සිදුකරන ලද්දේ දැයි පරීක්‍ෂා කිරීම සහ සෙසු සෑම මණ්ඩලීය රැස්වීමක් සඳහාම පූර්ව දැනුම් දීමක් සිදුකර ඇත්ද යන්න පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලයේ ලේකම්වරයා විසින් අත්සන්කරනු ලබන ලිපියක් මගින් මෙය සිදු කරනු ලැබේ. මෙම ලිපිය රැස්වීම පැවැත්වීමට සතියකට පෙර අතින් බාරදෙනු ලැබේ. |
| 3 (1) (vi) | ආසන්නතම දොළොස්මස තුළදී පැවති රැස්වීම් අතරින් යටත් පිරිසෙයින් රැස්වීම් තුනෙන් දෙකකටවත් නොපැමිණි හෝ අඛණ්ඩව තුන්වතාවක් රැස්වීම්වලට සහභාගිනොවූ අධ්‍යක්‍ෂවරුන් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබුවේදැයි පරීක්‍ෂා කිරීම. අධ්‍යක්‍ෂවරුන්ගේ රැස්වීම්වලට විකල්ප අධ්‍යක්‍ෂවරුන් හරහා සහභාගිත්වය ලබාදීම වුවද සහභාගි වීම වශයෙන් සැළකේ. | අනුකූලතාව දක්වා ඇත.<br>අවශ්‍ය පරිදි අධ්‍යක්‍ෂවරුන් මාණ්ඩලික රැස්වීම්වලට සහභාගිවී ඇත. අධ්‍යක්‍ෂ මණ්ඩලීය පැමිණීමේ ලේඛණ සහ ස්ව තක්සේරු සමාලෝචනයන් නිරීක්‍ෂණයට භාජනය කරන ලදී. අධ්‍යක්‍ෂවරුන් විසින් ඇතැම් අවස්ථාවන්වලදී ඔවුනගේ සහභාගීත්වය සිදුකළ නොහැකි අවස්ථාවන්වලදී ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කිරීම් කර ඇත. |
| 3 (1) (vii) | 1988 අංක 30 දරන බැංකු පනතේ 43වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව, මණ්ඩලයේ සහ කොටස්හිමියන්ගේ රැස්වීම්වලට අදාළ ලේකම් පදවියේ කටයුතුකිරීම සහ ව්‍යවස්ථාපිත හා අනිකුත් රෙගුලාසිවලින් නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් ඉටුකිරීම ප්‍රාථමික වගකීම වශයෙන් කළයුතු සමාගම් ලේකම්වරයෙකු, මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඇත්තේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුවේ ලේකම් ලෙස කටයුතු කරන්නේ වෘත්තියෙන් නීතිඥයෙකු වන රොහාන් පතිරගේ මහතාය. මණ්ඩලීය රැස්වීම් අංක 13/2010 සඳහා ඉදිරිපත් කරන ලද මණ්ඩලීය පත්‍රිකා අංක 406/2010 මේ සඳහා අදාළ වේ. |
| 3 (1) (viii) | සමාගම් ලේකම්වරයාගේ උපදෙස් හා සේවාවන් අධ්‍යක්‍ෂවරුන්ට ලබාගැනීමට පවතින ප්‍රවේශයන් පිළිබඳ ක්‍රියාවලිය පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සමාගම් ලේකම්වරයාගේ උපදෙස් හා සේවාවන් අධ්‍යක්‍ෂවරුන්ට අසීමිතව ලබාගැනීම සඳහා ප්‍රවේශයන් පවතියි. බැංකුවේ අනුමත යහ පාලන සංග්‍රහයෙහි මෙම අවශ්‍යතාවය දක්වා ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (1) (ix) | සමාගම් ලේකම්වරයා මාණ්ඩලීය රැස්වීම්වල වාර්තා පවත්වා ගන්නේද යන බව සහ අධ්‍යක්ෂවරුන්ට එම වාර්තා පරීක්ෂා කිරීමට ක්‍රියාපිළිවෙළක් තිබෙන්නේද යන බව පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>ඕනෑම අධ්‍යක්ෂවරුයෙකුට පරීක්ෂා කළ හැකි වන පරිදි රැස්වීම් වාර්තා පොත සමාගම් ලේකම්වරයා විසින් පවත්වාගනු ලැබේ. |
| 3 (1) (x) | පහත දෑ සම්බන්ධව අදාළව හෝ අන්තර්ගතවන අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීම් වාර්තා පරීක්ෂා කිරීම,<br>(අ) මණ්ඩලයේ සාකච්ඡාවලට භාජනය වන දත්ත හා තොරතුරුවල සාරාංශයක්<br>(ආ) මණ්ඩලය විසින් සළකා බලනු ලබන කරුණු<br>(ඇ) මණ්ඩලයේ වගකීම් සැළකිලිමත්ව හා විචක්ෂණශීලීව ඉටුකරනු ලැබේදැයි යන්න පැහැදිලි කෙරෙන, තථ්‍ය තොරතුරු විමර්ෂණ සාකච්ඡා සහ එකඟතා සහිත හෝ එසේ එකඟ නොවූ කරුණු<br>(ඈ) මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්තීන් සමඟ අනුකූලවන්නාවූ සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුගතවූ කරුණු<br>(ඉ) බැංකුව අනාවරණය වී ඇති අවදානම් පිළිබඳ අවබෝධයක් සහ ඒවාට පිළියම් වශයෙන් යෙදිය හැකි අවදානම් කළමනාකරණ පියවර සහ<br>(ඊ) තීරණයන් හා මණ්ඩලීය යෝජනාවන් | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (1) (xi) | යෝග්‍ය පරිදි අවස්ථානුකූලව, සාධාරණ ඉල්ලීමක් මත, ස්වාධීන වෘත්තීයමය උපදෙස්, බැංකුවේ වියදමින් අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැකි වනසේ, මණ්ඩලය විසින් එකගතාවට පත් ක්‍රියා පිළිවෙතක් පවත්නේද යන බව පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන වෘත්තියමය උපදෙස් ලබාගත හැකි වනසේ ක්‍රියා පිළිවෙතක් පවතී. |
| 3 (1) (xii) | අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳව ගැටුම් හෝ ඇල්ම පිළිබඳව ගැටුම් ලෙස පෙනී යන අවස්ථා වැළැක්වීම හා අදාළව නිගමන වලට එළැඹීමට, වාර්තාකිරීමට, නිරාකරණයට හා ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට ක්‍රියා පිළිවෙතක් පවතින්නේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මෙම කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය ශ්‍රී ලංකා මහා බැංකුවේ විධානයන් සහ මහජන බැංකුවේ ආයතන පාලනයෙහි අඩංගු යහපරිචයන් පිළිබඳ ආචාරධර්ම පද්ධතිය අනුගමනය කර ඇති අතර, අධ්‍යක්ෂවරුන්ගෙන් ප්‍රකාශයන්ද ලබාගෙන ඇත. |
| | • අධ්‍යක්ෂවරුයෙකුගේ/වරියකගේ හෝ එවැනි කෙනෙකුගේ ඥාතියෙකුගේ හෝ ව්‍යාපාරයක හෝ ප්‍රමාණවත් සම්බන්ධතාවක් පවත්නා කරුණක් හා අදාළ වන්නාවූ මණ්ඩලීය යෝජනාවකදී සිය ඡන්දය භාවිතා කිරීමෙන් වැළකීසිටීමට අධ්‍යක්ෂවරයෙකු/වරියක පියවර ගෙන තිබේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | • මණ්ඩලීය රැස්වීමක එවැනි අයිතමයක් න්‍යාය පත්‍රයට අඩංගුවූ අවස්ථාවකදී එවන් අධ්‍යක්ෂවරයෙකු/වරියක රැස්වීමෙහි ගණ පූර්ණය තීරණය කිරීමට ගන්නා ලද්දේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (1) (xiii) | බැංකුවේ ගමන් මග හා පාලනය ස්ථිර වශයෙන්ම එහි අධිකාරිය යටතේ පවත්නා බැව් හැඳින ගැනීම තීරණය කිරීම සඳහා, කරුණු අඩංගු නිශ්චිත ලෙස වෙන් කරන ලද විධිමත් සටහනක් බැංකුව සතුව පවතින්නේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලීය කටයුතු ඵලදායී ආකාරයට ඉටුකරලීම පහසුකරලීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (1) (xiv) | බැංකුවට සිය වගකීම ඉටුකිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇතැයි ද නැතහොත් එසේ පත්වන බව පෙනෙන්නට ඇතැයිද, එසේත් නැතහොත් වස්තුභංගත්වයට පත්වන්නට ඉඩ ඇතැයිද, එසේත් නැතහොත් ස්වකීය තැන්පත්කරුවන්ට හා ණයහිමියන්ට සිදුකළ යුතු ගෙවීම් අත්හිටුවීමට සිදුවනු ඇතැයිද යනාදී වශයෙන් හැඟෙන්නේ නම්, තමන් විසින් අන් කවර හෝ නිගමනයකට එළැඹෙන්නට පෙරාතුව, එම තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට නොපමාවම දැනුම් දී තිබේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (1) (xv) | මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි, බැංකුවට ප්‍රාග්ධනය සැපයීම මණ්ඩලය විසින් සිදුකර තිබේද යන්න පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුව ප්‍රමාණවත් ප්‍රාග්ධන අගයක් පවත්වාගෙන යන අතර, වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවශ්‍යතාවයන් මෙන්ම අභිකුත් විචක්ෂණ පදනම මත වූ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ඇත. |
| 3 (1) (xvi) | මෙම විධානයන්හී 03 විධානයට අනුකූලවෙමින්, මණ්ඩලය විසින් වාර්ෂික ආයතනික යහ පාලන වාර්තාවක්, බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත්තේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මෙම වාර්තාව අදාළ අවශ්‍යතාවය සපුරාලයි. |
| 3 (1) (xvii) | වාර්ෂිකව එක් එක් අධ්‍යක්ෂවරයා විසින් ස්වයං ඇගයීමක් සිදුකිරීමේ හා එවැනි ඇගයීම්වල වාර්තා පවත්වාගැනීමේ ක්‍රමවේදයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරන්නේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| **3 (2)** | **මණ්ඩලයේ සංයුතිය** | |
| 3 (2) (i) | අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 7 දෙනෙකුට නොඅඩු හා 13 දෙනෙකුට නොවැඩි වන පරිදි සංයුක්ත වන්නේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලය 8 දෙනෙකුගෙන් සමන්විත වන අතර, සමස්ත කාලය තුළම එම තත්ත්වය එලෙස පැවතිනි. |
| 3 (2) (ii) | (අ) ප්‍රධාන විධායක නිළධාරිවරයා හැර, සෙසු අධ්‍යක්ෂවරයෙකුගේ සම්පූර්ණ සේවා කාලය වසර 9 කට වැඩි නොවන බවට පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන් ස්වකීය අධ්‍යක්ෂ තනතුරේ සේවාකාලය වසර 9 ඉක්මවනු ලැබ නොමැතිබව නිරීක්ෂණය කරන ලදී. (සියළුම අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබ ඇත්තේ 2007න් පසුවය.) |
| | (ආ) යම් අධ්‍යක්ෂවරයෙකු වසර 9 කට වැඩ කාලයක් සේවය කර තිබේ නම්, සංක්‍රාමික ප්‍රතිපාදනයන් භාවිතා කර තිබේදැයි පරීක්ෂා කළ යුතුවෙයි. | අධ්‍යක්ෂවරුන් ස්වකීය අධ්‍යක්ෂ තනතුරේ සේවාකාලය වසර 9 ඉක්මවනු ලැබ නොමැතිබව නිරීක්ෂණය කරන ලදී. (සියළුම අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබ ඇත්තේ 2007න් පසුවය.) |
| 3 (2) (iii) | ප්‍රධාන විධායක නිළධාරිවරයා ඇතුළු විධායක නිළධාරීන්ගේ සංඛ්‍යාව, මණ්ඩලයේ සම්පූර්ණ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොඉක්මවන්නේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සියළු අධ්‍යක්ෂවරුන් විධායක නොවන හා ස්වාධීන වන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් ඔවුන් පත්කරනු ලැබඇත. |
| 3 (2) (iv) | මණ්ඩලය තුළ යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ සම්පූර්ණ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ යන දෙකෙන් වඩා වැඩි සංඛ්‍යාව සිටින්නේ දැයි පරීක්ෂා කිරීම. | සියළු අධ්‍යක්ෂවරුන් විධායක නොවන හා ස්වාධීන වන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් ඔවුන් පත්කරනු ලැබඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරියකු පහත සඳහන් කරුණු අනුව, ඔහු/ඇය ස්වාධීනලෙස සැළකිය හැකිදැයි පරීක්ෂා කිරීම.<br>(අ) සෘජු හෝ වක්‍රලෙස බැංකුවේ 1%ක ට වැඩි ප්‍රමාණයක කොටස්හිමියෙකු වීම.<br>(ආ) අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරියක වශයෙන් පත්වීම ලබන්නට පෙර දෙවසර තුළදී දැනට හෝ, මෑතකදී හෝ ඊටත් පෙර මෙහි විධාන අංක 3 (7) යටතේ සඳහන්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10%ක් ඉක්මවූ වටිනාකම සහිත ගණුදෙනුවක බැංකුව සමග නිරතව සිටීම. | |
| | (ඇ) අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්වීම ලබන්නට පෙර දෙවසර තුළදී, බැංකුවේ සේවයෙහි නිරතව සිටීම. | |
| | (ඈ) අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිළධාරි, ප්‍රධාන කළමනාකරණ තනතුරක සාමාජිකයෙකු, මෙම බැංකුවෙහි හෝ වෙනත් බැංකුවක කොටස්හිමියෙකු වශයෙන් සමීප ඥාතියෙකු වී තිබීම. (මෙහිදී සමීප ඥාතියෙකු යනු කලත්‍රයා හෝ මූල්‍ය යැපීමක් සහිත දරුවෙකි.) | |
| | (ඉ) බැංකුවේ කිසියම් නිශ්චිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කිරීම. | |
| | (ඊ) පහත සඳහන් ව්‍යාපාර ආයතනයක හෝ සමාගමක සේවකයෙක් හෝ අධ්‍යක්ෂකවරයෙක් හෝ ප්‍රමාණවත් කොටස්කරුවෙක් වීම.<br>i මෙම විධානයන්හී වගන්ති අංක 3 (7) යටතේ විස්තරකර ඇති පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10%ක් ඉක්මවන ප්‍රමාණයක ගනුදෙනුවක බැංකුව සමග නිරතවන හෝ,<br>ii බැංකුවේ සෙසු අධ්‍යක්ෂවරුන් සේවකයින් ලෙස හෝ අධ්‍යක්ෂවරුන් ලෙස හෝ කොටස්හිමියන් ලෙස හෝ කටයුතු කරන, හෝ<br>iii බැංකුවේ සෙසු අධ්‍යක්ෂවරුන්, මෙම විධානයන්හී විධාන අංක 3 (7) යටතේ විස්තර කර ඇති පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10%ක් ඉක්මවන ප්‍රමාණයක ගනුදෙනුවක නිරත වන | |
| 3 (2) (v) | ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත්කළවිට, ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ සුදුසුකම් එම විකල්ප අධ්‍යක්ෂවරයාටද තිබෙන්නේ දැයි පරීක්ෂා කිරීම. | සියළුම අධ්‍යක්ෂවරු මහජන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් ඇමතිවරයා විසින් පත්කර ඇත. ප්‍රවර්ථන වර්ෂය තුළදී විකල්ප අධ්‍යක්ෂවරු පත්කර නැත. |
| 3 (2) (vi) | ස්වාධීන අධ්‍යක්ෂවරයින් පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් බැංකුව තුළ තිබේදැයි පරීක්ෂා කිරීම. | සියළුම අධ්‍යක්ෂවරුන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් එම අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබ ඇත. |
| 3 (2) (vii) | මණ්ඩල රැස්වීමක නියමිත ගණපූරණය පත්ව සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් 50%ක් වුවද, එම 50%න් 50%ක් විධායක අධ්‍යක්ෂවරුන් නොවන පිරිසක් වුයේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩල රැස්වීමක නියමිත ගණපූරණය පස්දෙනෙකි. සියළුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (2) (viii) | සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන්, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ආදී වශයෙන් වර්ග කරනු ලැබ, මණ්ඩලයේ සංයුතිය වාර්ෂික ආයතනික යහ පාලන වාර්තා මගින් අනාවරණය කර ඇත්ද යන්න පරීක්ෂා කිරීම. | අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පිටු අංක 24 - 26 දක්වා ඇතුළත් කර ඇති අතර, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිටු අංක 152 - 154 ඇතුළත්කර ඇත. |
| 3 (2) (ix) | මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ පිළිවෙත පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8වන ඡේදය යටතේ අධ්‍යක්ෂවරයින් පත්කරනු ලබනුයේ මුදල් අමාත්‍යවරයා විසිනි. |
| 3 (2) (x) | තාවකාලික පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලබන අධ්‍යක්ෂවරයෙකුගේ එම පත්වීම, එකී පත්වීමෙන් පසු එළැඹෙන කොටස්හිමියන්ගේ ප්‍රථම මහ සභා රැස්වීමේදී අනුමත කරන ලද්දේ දැයි පරීක්ෂා කිරීම. | අදාළ නැත.<br>1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබයි. තාවකාලික තනතුරු පිරවීම සඳහා පත්කිරීමක් සිදුනොවේ. |
| 3 (2) (xi) | අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වුයේනම් හෝ ඉවත් කරනු ලැබුයේ නම්, එහිදී මණ්ඩලය,<br>(අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත්කරනු ලැබීම, සහ බැංකුව සමග එම අධ්‍යක්ෂවරයා ප්‍රතිවිරෝධතාවක් දැක්වුයේ නම් එය හා වෙනත් කරුණු ද ඇතුළුව එසේ ඉල්ලා අස්වීමට හෝ ඉවත්කරනු ලැබීමට හේතු මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කිරීම, සහ<br>(ආ) කොටස්හිමියන්ගේ අවධානයට යොමුකළ යුතු කරුණු කිසිවක් පවතීද නැත්ද යන බව තහවුරුකරමින් ප්‍රකාශයක් නිකුත්කිරීම. | අදාළ නැත.<br>මුදල් ඇමතිවරයාට ලිඛිතව දැනුම්දීමෙන් අධ්‍යක්ෂවරයෙකුට ඉල්ලා අස්විය හැකි අතර, මුදල් ඇමතිවරයාට අධ්‍යක්ෂවරයෙක් ඉවත් කිරීම කළ හැකිය. |
| 3 (2) (xii) | බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරන ලද්දේද, තෝරාගන්නා ලද්දේද, නැතහොත් එවැන්නක් සඳහා නාම යෝජනාකර තිබේදැයි යන්න හඳුනාගැනීම සඳහා විධිපිළිවෙලක් බැංකුව සතුව තිබේදැයි පරීක්ෂා කිරීම. | අධ්‍යක්ෂවරු මුදල් ඇමතිවරයා විසින් පත් කෙරේ. එලෙස පත් කිරීමට පෙර වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් වශයෙන් පත්ව ඇත්ද, පත්කර තිබේද හෝ නාමයෝජනා ඉදිරිපත් කිර තිබේද යන්න පිළිබඳව නිශ්චය කිරීමට බැංකුව ප්‍රකාශනයක් ලබාගනී. කෙසේවෙතත්, මෙම ක්‍රමවේදයෙහි විචක්ෂණභාවය වැඩිදියුණු කිරීමට එවැනි වාර්තා ලබාගැනීමේ ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට බැංකුව අදහස් කරයි. |
| **3 (3)** | **අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව හා සුදුසුකම් පිළිබඳව තක්සේරුකිරීමේ නිර්ණායකයන්** | |
| 3 (3) (i) | අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවය කරන අයගේ වයස අවුරුදු 70ට නොවැඩි බව පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත |
| | (අ) සංක්‍රාන්ති ප්‍රතිපාදනයන්ට අනුකූලව ක්‍රියාකර තිබේදැයි පරීක්ෂා කිරීම. | අදාළ නැත. |
| 3 (3) (ii) | බැංකුවේ පාලිත හෝ ආශ්‍රිත සමාගම් ඇතුළු සමාගම්, ව්‍යාපාර, ආයතන 20කට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් තනතුරු දරන්නේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>රැස්වීම් අංක 5/2013හි මාණ්ඩලික පත්‍රිකා අංක 151/2013 පරිදි අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද අනාවරණයන්ට අනුව බැංකුවේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් සමාගම්/ඒකක සහ ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂක ධුර දරනු නොලැබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| **3 (4)** | **මණ්ඩලය විසින් පවරන ලද කරනලද කළමනාකරණ ක්‍රියාකාරකම්** | |
| 3 (4) (i) | මණ්ඩලය විසින් අභිනියෝජන ක්‍රියාපිළිවෙල අනුමතකර තිබේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>එක් එක් උප කමිටුව සඳහා වු යොමු කිරීම් අනුදේශ පත්‍රිකා මත අභිනියෝජන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කෙරේ. |
| 3 (4) (ii) | මෙහි අංක 3 (1) (i) යටතේ දැක්වෙන කරුණු අභිනියෝජනය කෙරෙන අවස්ථාවලදී වුවද, බැංකුව වගකීම ගන්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>3 (1) (i) හි ඉදිරිපත් කර ඇති ප්‍රතිපල වෙත අවධානය යොමු කරන්න. |
| 3 (4) (iii) | ස්ථාපිත කර ඇති අභිනියෝජන ක්‍රියාදාමය මණ්ඩලය විසින් වරින් වර සමාලෝචනයට භාජනයකොට, බැංකුවේ අවශ්‍යතාවන් සපුරාලීම තහවුරු වන පරිදි එය ප්‍රමාණවත් ලෙස අදාළ වන්නේද යන්න පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>උප කමිටු රැස්වීම් හරහා කාලයෙන් කාලයට මණ්ඩලය විසින් අභිනියෝජන ක්‍රියාදාමය සමාලෝචනයට භාජනය කරන අතර, එමගින් එම ක්‍රියාදාමය බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන පරිදි පවතින බව තහවුරු කරගනු ලැබේ. |
| **3 (5)** | **සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිළධාරිවරයා** | |
| 3 (5) (i) | සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ භූමිකාවන් එකිනෙකට වෙනස්බවත් එකම කාර්යය ඔවුන් දෙදෙනාම සිදුනොකරන බවත් පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ භූමිකාවන් පැහැදිලිව එකිනෙකට වෙනස්වන අතර, එකම කාර්යය ඔවුන් දෙදෙනාම සිදුකරනු නොලැබේ. ඒ අනුව, තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී එක් තනි පුද්ගලයෙක් වෙත අසීමිත බලය පවරාදීම වලක්වා ඇත. |
| 3 (5) (ii) | සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු ලෙස කටයුතු කරන්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සභාපතිවරයා විධායක අධ්‍යක්‍ෂවරයෙකු නොවන අතර, මහජන බැංකු පනත යටතේ මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්‍ෂවරයෙකු ලෙස ඔහු පත්කරනු ලැබ ඇත. |
| | සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු නොවන්නේනම්, යෝග්‍ය පරිදි ලිඛිතව මණ්ඩලය විසින් එක් ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයෙකුසේ නියෝජනත්වය ලබාදී ඇත්තේදැයි පරීක්‍ෂා කිරීම. | සභාපතිවරයා විධායක අධ්‍යක්‍ෂවරයෙකු නොවන අතර, මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්‍ෂවරයෙකු ලෙස ඔහු පත්කරනු ලැබ ඇත. |
| | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයාගේ නියෝජනත්වය බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කර තිබේදැයි පරීක්‍ෂා කිරීම. | අදාළ නැත. |
| 3 (5) (iii) | සභාපතිවරයා සහ විධායක අධ්‍යක්‍ෂවරයාද, සෙසු අධ්‍යක්‍ෂවරුන්ද අතර (මූල්‍ය,ව්‍යාපාරික,පවුල් හෝ වෙනත් කවර හෝ ආකාරයේ) සබඳතාවන් තිබේනම්, එය හඳුනාගෙන, ඒ පිළිබඳව වාර්ෂික වාර්තාවේ කොටසක් වන ආයතනික යහ පාලන වාර්තාව මගින් අනාවරණය කිරීමට කිසියම් ක්‍රියාපිළිවෙතක් මණ්ඩලය සතුව තිබේදැයි පරීක්‍ෂා කිරීම. | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්‍ෂවරුන් පත්කරනු ලැබේ. බැංකුව අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් ස්වයං ඇගයීම් සහ ප්‍රකාශනයන් මගින් තොරතුරු ලබාගනී. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව අදහස් කරයි. |
| 3 (5) (iv) | පහත කරුණු සභාපතිවරයාගෙන් ඉටුවන්නේද යන්න, පිළිබඳව ස්වයං ඇගයීමක් සඳහා මණ්ඩලයට ක්‍රියාදාමයක් ඇත්ද යන්න පරීක්‍ෂා කිරීම:<br>(අ) මණ්ඩලයට නායකත්වය ලබාදීම.<br>(ආ) මණ්ඩලය ඵලදායකත්වයෙන් යුතුව කටයුතු කරමින් ස්වකීය වගකීම් ඉටුකරන බව තහවුරුකිරීම, සහ<br>(ඇ) ප්‍රධාන මෙන්ම යෝග්‍ය කරුණු - කාලීන වැදගත්කමින් යුක්තව මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබන බව තහවුරු කිරීම. | අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් අංක 05/2013 හා මණ්ඩලීය පත්‍රිකා අංක 08/2013 අනුව වාර්ෂික ස්වයං ඇගයීම් ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව අවශ්‍ය කටයුතු කරමින් සිටී. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (5) (v) | සභාපතිවරයා විසින් අනුමත කරන ලද විධිමත් න්‍යාය පත්‍රයක් සමාගම් ලේකම්වරයා විසින් සංසරණය කෙරේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (5) (vi) | මණ්ඩලීය රැස්වීම්වලදී උද්ගතවන කරුණු පිළිබඳව සභාපතිවරයා විසින් කාලීනව අධ්‍යක්‍ෂවරුන් නිසි පරිදි දැනුවත් කිරීම තහවුරු කරන්නේද යන්න පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (5) (vii) | මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් සියලු අධ්‍යක්‍ෂවරුන්ගේ පූර්ණ හා කාර්යශීලි දායකත්වයක් ලබාගැනීම දිරිගන්වනු පිණිස ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් පවත්නේද යනබව හා බැංකුවේ අභිවෘද්ධිය සඳහා සභාපතිවරයා සියලු කාර්යයන්ට නායකත්වය ලබාදෙන්නේ ද යන බව පරීක්‍ෂා කිරීම. | 2013 වර්ෂය තුළදී වාර්ෂික ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යක්‍ෂවරුන් විසින් කරනු ලබන විශේෂ දායකත්වය පිළිබඳව මෙහිදී වැඩි අවධාරණයක් යොමු කර ඇත. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කළයුතු බව බැංකුවේ අදහසයි. |
| 3 (5) (viii) | විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගේ දායකත්වය තක්සේරු කිරීම උදෙසා ස්වයං ඇගයීම් පිළිවෙලක් මණ්ඩලය තුළ පවත්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (5) (ix) | ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්ගේ සෘජු අධීක්‍ෂණය යටතේ සිදුවන ක්‍රියාකාරකම් හෝ වෙනත් කිසිදු විධායක ක්‍රියාකාරකමක සභාපතිවරයා නියුක්ත නොවන බව පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (5) (x) | කොටස්හිමියන් සමග ඵලදායක ලෙස සන්නිවේදනයෙහි නිරතවීමේ ක්‍රියාවලියක් පවත්නාබව හා ඔවුන්ගේ අදහස් මණ්ඩලයට සන්නිවේදනය වනබවත් පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (5) (xi) | බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු පිළිබඳ දෛනික කළමනාකරණයේදී, ප්‍රධාන විධායක නිළධාරියා, අග්‍ර විධායකයා ලෙස ක්‍රියාකරන්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මහජන බැංකුවේ ආයතනික යහ පාලන පරිචයන් පිළිබඳව පවත්නා ආචාරධර්ම පද්ධතියේ 3 වන වගන්තිය අනුව ප්‍රධාන විධායක නිළධාරියා බැංකුවේ දෛනික කාර්යයන් පිළිබඳ වගකිවයුතු ඉහළම විධායක තනතුර දරයි. |
| **3 (6)** | **මණ්ඩලය විසින් පත්කරනු ලබන කමිටු** | |
| 3 (6) (i) | මෙම විධානයන්හි, විධාන අංක 3 (6) (ii), 3 (6) (iii), 3 (6) (iv), 3 (6) (v) අනුව මණ්ඩලය විසින් යටත් පිරිසෙයින් කමිටු හතරක්වත් ස්ථාපිතකර ඇත්දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | එක් එක් මාණ්ඩලීය කමිටු වාර්තාව සෘජුවම මණ්ඩලය වෙත යොමු කරන්නේද යන්න පරීක්‍ෂා කිරීම.<br><br>එක් එක් කමිටුවක වගකීම්, කාර්යයභාරය හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තාවන් මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාව ඔස්සේ ඉදිරිපත් කරන්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 152 - 154 දක්වා ඉදිරිපත් කර ඇති මාණ්ඩලීය උප කමිටු වගකීම්, කාර්යයභාරය සහ ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාව බලන්න. |
| 3 (6) (ii) | විගණන කමිටුව | |
| | (අ) මෙම කමිටුවෙහි සභාපතිවරයා, ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු බවත්, සුදුසුකම් හා අදාළ ක්‍ෂේත්‍රයීය පළපුරුද්ද ඇති අයෙකු බවත් පරීක්‍ෂා කිරීම. | සභාපතිවරයා, ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකි. විගණන කමිටු සභාපතිවරයා එම තනතුර දැරීමට අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අයෙකි. |
| | (ආ) කමිටුවෙහි සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුවේ සියළුම අධ්‍යක්‍ෂවරුන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් වන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් එම අධ්‍යක්‍ෂවරුන් පත්කරනු ලැබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඇ) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුවේ දැයි පරීක්‍ෂා කිරීම:<br>i අදාළ තත්ත්වයන්ට අනුකූලවන පරිදි විගණන සේවාවන් සඳහා බාහිර විගණන නිළධාරියෙකු පත් කිරීම.<br>ii වරින් වර විගණන නිළධාරීන් සඳහා නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිළධාරියා පත්කර ඇත. එම ප්‍රතිපාදනයන් අනුව, විගණකාධිපතිවරයා විගණන නිළධාරියා වන අතර, ඔහුට වෙනත් ඕනෑම සුදුසුකම්ලත් විගණකයකු බාහිර විගණකසේ පත්කළ හැකිය. |
| | iii අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළවීම | අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ මූල්‍ය අංශ ප්‍රධානීන්ගේ උපදේශනය මත අදාළ ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳව මණ්ඩලය විසින් ඇගයීමට භාජනය කරනු ලැබේ. |
| | iv විගණන හවුල්කරු සේවයෙහි යොදාගැනීම පස් වසරක් නොඉක්මවීමත්, පෙර සේවාකාලය සම්පූර්ණවූ දින සිට තුන්වසරක් ඉක්මවීමට පෙරාතුව විගණන කටයුතු සඳහා යලි බඳවා නොගැනීමත් යන පදනම මත පිහිටා විගණන සේවා කාලය, විගණන ගාස්තු, විගණකගේ ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහකරනු ලැබීමක් පිළිබඳ කරුණුය. | අනුකූලතාව දක්වා ඇත.<br>1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිළධාරියා පත්කර ඇත. එම ප්‍රතිපාදනයන් අනුව, විගණකාධිපතිවරයා විගණන නිළධාරියා වන්නේය. විගණකාධිපතිවරයා බාහිර විගණක වන හෙයින් වෙනත් ඕනෑම සුදුසුකම්ලත් විගණකවරයෙක් බාහිර විගණකසේ පත්කළ හැකිය. වර්ෂ පහකට වරක් විගණක මාරු කිරීම බාහිර විගණක වශයෙන් සේවය කරන විගණකාධිපතිවරයාගේ වගකීමයි. |
| | (ඈ) ස්වකීය ස්වාධීනත්වය පිළිබඳව නියෝජනාත්මක කරුණු බාහිර විගණන නිළධාරීන්ගෙන් කමිටුව ලබාගත්තේද යන බවත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විගණන කටයුතු සිදුකරන ලද්දේද යන බවත් පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඉ) අදාළ රෙගුලාසි අනුව, බාහිර විගණක විගණන නොවන සේවාවන් සැපයීම සඳහා යොදවා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද්දේ දැයි පරීක්‍ෂා කිරීම. | බාහිර විගණක හා බැඳුනු මෙම කරුණු විගණන කමිටුවේ යොමු කිරීමේ නිර්දේශ තුළ ප්‍රධාන ක්‍රියාකාරකමක් සේ ඇතුළත් කර ඇත. |
| | (ඊ) විගණන කාර්යය ආරම්භවීමට පෙරාතුව, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව, බාහිර විගණක සමග විගණන කාර්යයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව විගණන කමිටුව සාකච්ඡා කළේද යන බව පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (උ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික වාර්තාව, ගිණුම් සහ තොරතුරු අනාවරණය සඳහා සකස්කරනු ලබන ත්‍රෛමාසික වාර්තා ආදියෙහි සම්පූර්ණත්වය අධීක්‍ෂණය සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනයට ක්‍රියාදාමයක් සහ පහත දැක්වෙන කරුණු ප්‍රධාන මූල්‍ය නිළධාරියාගෙන් ලබාගැනීමේ ක්‍රමවේදයක්ද කමිටුව තුළ පවත්නේදැයි පරීක්‍ෂා කිරීම.<br>i ප්‍රධාන විනිශ්චයාත්මක කරුණු;<br>ii ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සහ පරිචයන්හි සිදුවූ වෙනස්කම්;<br>iii අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයන්; සහ<br>iv අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ වෙනත් නෛතික අවශ්‍යතාවන් සමග අනුකූලවීම; සහ<br>v වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනය අනුව කළයුතු ප්‍රමාණාත්මක ගැලපීම් | අනුකූලතාව දක්වා ඇත.<br>විගණන කමිටුව බැංකුවේ මූල්‍ය තොරතුරු කාලච්ඡේද අනුව සමාලෝචනයට භාජනය කරනු ලැබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | (ඌ) | විධායක කළමනාකරණයේ සහභාගීත්වය නොමැතිව විගණනය හා බැඳුනු කිසියම් කරුණක් හා අදාළව, විගණන කමිටුව බාහිර විගණකයින් හමුවන ලද්දේ දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඔ) | බාහිර විගණකයින්ගේ කළමනාකරණය ලිපිය සහ ඊට කළමනාකරණය දැක්වූ ප්‍රතිචාරයන් කමිටුව විසින් සමාලෝචනයට භාජනය කරනු ලැබුවේ දැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>විගණන කමිටු අංක 42/2013 හිදී කළමනාකරණ ලිපියේ විගණන කමිටුව විසින් සමාලෝචනයට භාජනය කරන ලදී. |
| | (ඕ) | බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් පියවර කමිටුව විසින් ගනු ලැබේදැයි පරීක්‍ෂා කිරීම. | |
| | i | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, ක්‍රියාකාරකම් සහ සම්පත් ආදියෙහි ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම ස්වකීය කාර්යභාරයන් මනාව ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවට අවශ්‍ය අධිකාරි බලය තිබේදැයි සෑහීමට පත්වීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලීය රැස්වීම් අංක 01/2013 හි විගණන කමිටු පත්‍රිකා අංක යටතේ මහජන බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සැලසුම නිරීක්‍ෂණය කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, ක්‍රියාකාරකම් සහ සම්පත් ගැන අභ්‍යන්තර විගණන සැලසුමෙහි අන්තර්ගත වෙයි. |
| | ii | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අනුව ගත යුතු යෝග්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන ඇත්ද යන්න තහවුරු කිරීමට අවශ්‍ය අවස්ථාවන් හිදී අභ්‍යන්තර විගණන වැඩ සටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම. | |
| | iii | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය | අනුකූලතාව දක්වා ඇත.<br>උසස්වීම්/සේවය දීර්ඝ කිරීම්වලදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ කාර්යයසාධනය පිළිබඳ ඇගයීමක් කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව අදහස් කරයි. |
| | iv | අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සඳහා බාහිර සේවා සපයන්නන් පත්කිරීම හෝ සේවය නවතා දැමීම නිර්දේශ කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | v | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහ බාහිර සේවා සපයන්නන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත්වීම සහ එසේ ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට සහ බාහිර සේවා සපයන්නන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු දන්වා සිටීමට අවස්ථාවක් ලබාදීම පරීක්‍ෂා කිරීම. | 2013 වර්ෂය තුළ මණ්ඩලය විසින් එවැනි කිසිදු දන්වා සිටීමක් පිළිබඳ තත්ත්වයක් උද්ගතවී නැත. |
| | vi | අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම්, විගණනයෙන් පරිබාහිරව ස්වාධීනව සිදුවන්නේද යන්න පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලීය විගණන කමිටුවේ යොමු කිරීමේ නිර්දේශ අනුව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් ස්වාධීනව සිදු කෙරේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සෘජුවම විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. |
| | (එ) | අභ්‍යන්තර විමර්ශකයින්ගේ ප්‍රමාණාත්මක සොයාගැනීම් සහ ඒවාට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කෙරෙහි කමිටුව සළකා බලන ලද්දේද යන්න නිගමනය සඳහා සටහන් පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අභ්‍යන්තර විමර්ශකයින්ගේ ප්‍රමාණාත්මක සොයාගැනීම් මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කර ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
| --- | --- | --- |
| | (ඊ) විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් තොරව කමිටුව බාහිර විගණකයින් සමග යටත් පිරිසෙයින රැස්වීම් දෙකක්වත් පැවැත්වුයේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ක) පහත සඳහන් කරුණු සහතික කිරීම සඳහා කමිටුවේ යොමු කරවීමේ නිර්දේශයන් පරීක්ෂා කිරීම.<br>i එහි යොමුකරවීමේ නිර්දේශයන්හි ඕනෑම කරුණක් විමර්ශනය සඳහා නිශ්චිත ලෙස සඳහන් අධිකාරී බලය<br>ii ඒ සඳහා අවශ්‍යවන සම්පත්<br>iii තොරතුරු වලට පූර්ණ ප්‍රවේශය<br>iv අවශ්‍යවන්නේ නම්, බාහිර වෘත්තීයමය උපදෙස් ලබාගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පුද්ගලයින් සහභාගි කරගැනීමට බලය | අනුකූලතාව දක්වා ඇත.<br>විගණන කමිටුවේ යොමුකරවීමේ නිර්දේශයන් තුළ මෙම සියළුම කරුණු ඇතුළත්වේ. |
| | (ග) කමිටුව යටත් පිරිසෙයින් රැස්වීම් 4ක් වත් පවත්වා සටහන් තබාගත්තේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලීය විගණන කමිටු වාර්තා අනුව 2013 වර්ෂය තුළ මණ්ඩලීය විගණන කමිටුව 06 වතාවක් රැස්වීම් පවත්වා ඇත. |
| | (ච) පහත සඳහන් කරුණු මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කරන ලද්දේ දැයි පරීක්ෂා කිරීම.<br>i විගණන කමිටුවේ ක්‍රියාකාරකම්වල විස්තර<br>ii වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව<br>iii එම රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගිත්වය පිළිබඳ විස්තර | අනුකූලතාව දක්වා ඇත.<br>පිටු අංක 182 - 182 දක්වා ඉදිරිපත් කර ඇති මණ්ඩලීය විගණන කමිටු වාර්තාවට අවධානය යොමු කරන්න. |
| | (ජ) කමිටුවේ ලේකම්, සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රධානියා දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මාණ්ඩලීය විගණන කමිටු ලේකම් වන රොහාන් පතිරගේ මහතා සමාගම් ලේකම්වරයාද වෙයි. |
| | (ය) 'අනතුරු හැඟවීමේ' ප්‍රතිපත්තිය අනුව පහත සඳහන් කාර්යයන් ආවරණයවුයේදැයි පරීක්ෂා කිරීම.<br>i මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ වෙනත් කරුණු හා අදාළ අයෝග්‍යතාවයන් සහිත කටයුතු<br>ii (i) හා අදාළව එවැනි කරුණු සම්බන්ධයෙන් සාධාරණ හා ස්වාධීන පරීක්ෂණ පැවැත්වීමට යෝග්‍ය වැඩ පිළිවෙල ස්ථානගතව ඇති බවට කමිටුව විසින් සහතික කරලු ලැබීම සහ<br>iii යෝග්‍ය පසු විපරම් ක්‍රියාවලියක් | අනුකූලතාව දක්වා ඇත.<br>මාණ්ඩලීක පත්‍රිකා 138/2013 යටතේ මණ්ඩලය විසින් 'අනතුරු හැඟවීමේ' ප්‍රතිපත්තිය අනුමත කර ඇත. |
| 3 (6) (iii) | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට පහත සඳහන් නියමයන් අදාළවන්නේ දැයි පරීක්ෂා කිරීම. | |
| | (අ) අදාළ යොමුකිරීමේ නිර්දේශයන් හා සටහන් සමාලෝචනය කිරීම මඟින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වේතනයන් (වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍යමය ගෙවීම්) නිගමනය කිරීම සඳහා කමිටුව විසින් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලද්දේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව බැංකුවේ ප්‍රධාන විධායක නිළධාරීගේ සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍යමය ගෙවීම්) තීරණය කරනු ලැබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ආ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් හා සම්බන්ධ අපේක්ෂාවන් හා ඉලක්කයන් නිශ්චිතව තීරණය කර ඇත්දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඇ) ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්ගේ කාර්යයසාධනයන්, අපේක්ෂාවන් හා ඉලක්කයන් වරින්වර ඇගයීම්වලට භාජනය කිරීම හා ඒ අනුව ඔවුන්ගේ වේතන, ප්‍රතිලාභ හා කාර්යයසාධනය පදනම්කරගත් වෙනත් දිරිගැන්වීම් හා ගෙවීම් ප්‍රතිශෝධනය කිරීම පිළිබඳව කමිටුව සැළකිලිමත්වීම සම්බන්ධයෙන්ද පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>කාර්යයසාධන පාදකව ප්‍රතිලාභ සැලැස්මක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය බැංකුව විසින් දැනට කරනු ලැබේ. |
| | (ඈ) සටහන් සමාලෝචනයට භාජනය කරමින් ප්‍රධාන විධායක නිළධාරියා හා අදාළ කරුණු සාකච්ඡා වන අවස්ථාවලදී එම කමිටු රැස්වීම්වලට සහභාගි නොවීම පිළිබඳව යොමුකිරීමේ නිර්දේශයන්හී සඳහන් වන්නේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>යොමුකිරීමේ නිර්දේශ අනුව, ප්‍රධාන විධායක නිළධාරීවරයාගේ කරුණක් පිළිබඳව සාකච්ඡාවීමකදී හැර සියළුම කමිටු රැස්වීම් සඳහා ප්‍රධාන විධායක නිළධාරීවරයා සහභාගි විය යුතුය. |
| 3 (6) (iv) | නාම යෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නියමයන් අදාළ වන්නේද? | |
| | (අ) නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් තෝරාගැනීමට/පත්කර ගැනීමට කමිටුව විසින් ක්‍රියාපිළිවෙතක් අනුගමනය කරන්නේදැයි පරීක්ෂා කිරීම. | මණ්ඩලීය නාම යෝජනා කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්ගේ නම් යෝජනා කරනු ලබන අතර, මහජන බැංකු පනතෙහි ඇති ප්‍රතිපාදනයන් අනුව මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ. |
| | (ආ) ප්‍රවර්තන අධ්‍යක්ෂවරුන්ගේ නැවත පත්කරනු ලැබීම, කමිටුව විසින් සළකා බලා, නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) පරීක්ෂා කිරීම. | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ. |
| | (ඇ) තනතුරු අවශ්‍යතා විස්තර සමාලෝචනය අනුව, ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වශයෙන් තෝරාගැනීමේදී හෝ උසස්වීම් සිදුකිරීමේදී ඒ සඳහා සළකා බැලීමේ අවශ්‍යතා වශයෙන්, කමිටුව විසින් සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් හැකියාවන් වැනි සාධකයන් අඩංගු නිර්ණායකයන් යොදාගෙන තිබේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඈ) විධාන අංක 3(3)හි සහ ව්‍යවස්ථාවන්හී නිර්ණායකයන් ඔස්සේ දක්වා ඇති පරිදි, නිල තනතුරු දැරීම සඳහා තමන් ගැලපෙන හා සුදුසු පුද්ගලයින් බවට, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් විසින් අත්සන් සහිතව දෙන ලද ප්‍රකාශයන්, කමිටුව විසින් ලබාගන්නා ලද්දේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඉ) විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වෙනුවෙන් විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් පිළිබඳව කමිටුව සළකා බලන්නේ දැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මාණ්ඩලික පත්‍රිකා අංක 279/2012 යටතේ බැංකුව විසින් නිශ්චිත අනුප්‍රාප්තික සැලැස්මක් අනුමත කර ඇත. |
| | (ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් හා හැකිතරම් දුරට ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් කමිටුව සමන්විත වන්නේදැයි පරීක්ෂා කරන ලදී. ප්‍රධාන විධායක නිළධාරියාට ආරාධනයක් අනුව කමිටුව සහභාගිවිය හැකිය. | අනුකූලතාව දක්වා ඇත.<br>කමිටුවේ සියළුම සාමාජිකයින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, ඔවුන් පත්කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශයයි. |
| 3 (6) (v) | මණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුවට (ම.ස.අ.ක.ක.) පහත සඳහන් නියමයන් අදාළවන්නේ දැයි පරීක්ෂා කිරීම. | |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (අ) කමිටුව වෙත අනුයුක්ත කර ඇති අධිකාරය සහ වගකීම් පරාසය තුළ බැංකුවේ ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් ක්ෂේත්‍රයන් සුපරීක්ෂණය කරන ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ සාමාජිකයින් සහිත අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් කමිටුව සමන්විත වීම. | අනුකූලතාව දක්වා ඇත.<br>ම.ස.අ.ක.ක. විධායක නොවන අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගෙන් සමන්විතවේ. ප්‍ර.වි.නි. සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරුවන්ට ආරාධනය මත සහභාගි විය හැකිය.<br>අප විසින් ම.ස.අ.ක.ක. රැස්වීම් අංක 04/2013හි සටහන් අංක 01/2013 පරීක්ෂා කළ අතර, විවිධ අවදානම් සැලකිල්ලට ගෙන ඇති බව එය සාක්ෂි සපයයි. |
| | (ආ) යෝග්‍ය අවදානම් දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු මගින් මාසික පදනමක් මත, බැංකුවට ඉලක්කවන ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපායමාර්ගික ආදී සියලුම අවදානම් තක්සේරු කිරීම සඳහා ක්‍රියාපිළිවෙතක් කමිටුවට තිබේදැයි පරීක්ෂා කිරීම. පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් වනවිට බැංකු පදනමින් හා සමූහ පදනමින් අවදානම් කළමනාකරණ සිදු කෙරේ. | අනුකූලතාව දක්වා ඇත.<br>මණ්ඩලීය සමෝධානිත අවදානම් කමිටුව විසින් කාර්තුමය පදනමට සකස් කරනු ලබන "ආතති පරීක්ෂණ වාර්තා" තුළින් මණ්ඩලය විසින් අවදානම් අංශ පිළිබඳව ඇගයීම් කරනු ලැබේ. පහත මාණ්ඩලික පත්‍රිකා සහ මණ්ඩලීය සටහන් අනුව ආතති පරීක්ෂණ වාර්තා මණ්ඩලීය රැස්වීම් වෙත ඉදිරිපත් කර ඇත. ම.ස.අ.ක.ක. අංක 14/2013, ම.ස.අ.ක.ක. අංක 22/2013, ම.ස.අ.ක.ක. අංක 32/2013, ම.ස.අ.ක.ක. අංක 35/2013. |
| | (ඇ) ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව වැනි සියළුම කළමනාකරණ මට්ටමේ කමිටු සම්බන්ධයෙන් නිශ්චිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් මට්ටම් කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබුවේ ද හා වරින් වර යම් අවදානම් දර්ශකයන් වාර්තාකරනු ලැබුවේද යන බව පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>සියළුම කළමනාකරණ මට්ටම් සඳහා නිශ්චය කර ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් ම.ස.අ.ක.ක. විසින් සමාලෝචනයට භාජනය කෙරේ. මෙම සමාලෝචනය වාර්ෂිකව කරනු නමුත්, කිසියම් විශේෂිත තත්ත්වයන් උද්ගතවීම හේතුවෙන් ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී එම වාර්තා සමාලෝචනයට භාජනය කෙරේ. |
| | (ඈ) නිශ්චිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් මට්ටම් ඉක්මවා ඇති සියළුම අවදානම් දර්ශකයන් කමිටුව විසින් සමාලෝචනය කිරීම පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඉ) යටත් පිරිසෙයින් කාර්තු පදනමින් කමිටුව කී වාරයක් රැස්වී ඇත්තේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>කමිටුව වර්ෂය තුළදී කාර්තුමය පදනම යටතේ වාර හතරක් රැස්වී ඇත. |
| | (ඊ) නිශ්චිත අවදානම් හඳුනාගැනීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව, සමාලෝචන පවත්වා විධිමත් ලිඛිත විනයානුකූල ක්‍රියා පිළිවෙතක් කමිටුව විසින් අනුගමනය කරනු ලැබුවේ දැයි පරීක්ෂා කිරීම. | එවැනි ලේඛනගත නිශ්චිත විනයානුකූල ක්‍රියාපිළිවෙතක් නොපවතී. |
| | (උ) මණ්ඩලයේ අදහස්, අනුමැතිය සහ/හෝ නිශ්චිත විධානයන් අපේක්ෂා කරමින් එක් එක් රැස්වීම පවත්වා සතියක් ඇතුළත කමිටුව විසින් අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කරන ලද්දේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අවදානම් තක්සේරු වාර්තා ම.ස.අ.ක.ක. ට ඉදිරිපත් කෙරේ. කමිටු රැස්වීමෙන් අනතුරුව එළැඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මෙම වාර්තා ඉදිරිපත් කෙරේ. |
| | (ඌ) බැංකුවේ සියලුම මෙහෙයුම් ක්‍රියාකාරකම් හා අදාළව නීතිරීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්තීන් සමග පවත්නා අනුකූලතාව තක්සේරු කිරීම සඳහා කමිටුව විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇත්ද යන බවත්, එකී අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් අතරින් පූර්ණකාලීන අනුකූලතා නිළධාරියෙකු පත්කරන අතර, එම නිළධාරියා විසින් කමිටුවට වරින් වර වාර්තා කරනු ලබන්නේද යන බවත් පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මාණ්ඩලික පත්‍රිකා අංක 156/2012 යටතේ අනුකූලතා කාර්යයන් සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා නිළධාරියෙකු (ශ්‍රීමා අර්සකුලරත්න මහත්මිය) බැංකුව පත්කර ඇත. අනුකූලතා නිළධාරී විසින් සෑම දෙවර්ෂයකටම එක් වරක් අනුකූලතා වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා ප්‍රධාන කළමනාකරණ නිළධාරියෙක් ලෙස අර්ථකතනය කර නැත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| **3 (7)** | **සම්බන්ධිත පාර්ශව ගනුදෙනු** | |
| 3 (7) (i) | කිසියම් පුද්ගලයෙකු, විශේෂයෙන්ම මෙම විධානය හා අදාළව සම්බන්ධතා සහිත පාර්ශව වශයෙන් සැළකෙන, පහතින් වර්ගීකරණය කර ඇති පාර්ශවයන් සමග බැංකුව සිදු කරන ගනුදෙනුවකින් උද්ගතවිය හැකි බැඳියා පිළිගැටුම් වළක්වා ගැනීම පිණිස මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද හා ලේඛනගත කරන ලද ක්‍රියාවලියක් පවත්නේදැයි පරීක්ෂා කිරීම.<br>(අ) බැංකුවේ කවර හෝ පරිපාලිත සමාගමක්<br>(ආ) බැංකුවේ කවර හෝ ආශ්‍රිත සමාගමක්<br>(ඇ) බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකු<br>(ඈ) බැංකුවේ කවර හෝ ප්‍රධාන කළමනාකරණ නිළධාරියෙකු<br>(ඉ) බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන කළමනාකරණ නිළධාරියෙකුගේ සමීප ඥාතියෙකු<br>(ඊ) ප්‍රමාණාත්මක සබඳතාවක් සහිත බැංකුවේ කොටස්හිමියෙකු<br>(උ) බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුගේ හෝ කවර හෝ කොටස්හිමියෙකුගේ හෝ ප්‍රමාණාත්මක සබඳතාවක් සහිත ආයතනයක් | ඔවුන් දරන අධ්‍යක්ෂ ධුර/තනතුරු පිළිබඳ තොරතුරු ප්‍රකාශනයක් මගින් සමාගමේ සියළුම අධ්‍යක්ෂවරු පත්වීමේදී ලබාදිය යුතු අතර, ඉන් අනතුරුව එම ප්‍රකාශනය වාර්ෂිකව යාවත්කාලීන කළයුතුවේ. මෙම ප්‍රකාශනයෙහි තොරතුරු අදාළ ගනුදෙනු හඳුනාගැනීම සඳහා මූල්‍ය අංශයට ඉදිරිපත් කෙරේ. මෙම කරුණු පිළිබඳව වෙනසක් සිදුවන සෑම අවස්ථාවකදීම සමාගමේ මාණ්ඩලීය ලේකම්වරයා වෙත ඒ පිළිබඳව තව දුරටත් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවේ. මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයෙහි ඇති, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හා බැඳුනු නිර්දේශ බැංකුව අනුගමනය කරනු ලැබේ. මෙම පාලන ක්‍රියාදාමය තව දුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවරයන් දැනට බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් පවතී. |
| 3 (7) (ii) | මෙම විධානයෙන් ආවරණයවන්නාවූ සම්බන්ධතා සහිත පාර්ශවයන් සමග සිදුකෙරෙන ගනුදෙනු ලෙස හඳුනාගනු ලබන, පහත දැක්වෙන ආකාරයේ ගනුදෙනු, හඳුනාගැනීමට හා ඒ පිළිබඳව වාර්තා කිරීමට ක්‍රියාපිළිවෙතක් පවත්නේදැයි පරීක්ෂා කිරීම.<br>(අ) උපරිම මට්ටමේ පිළිසරණ පිළිබඳව මුදල් මණ්ඩලයේ විධානයන්හි අර්ථකථනය කර ඇති ආකාරයට, කවර හෝ ආකාරයක පිළිසරණක් ලබාදීම.<br>(ආ) තැන්පතු, ණයට ගැනීම් සහ ආයෝජන වශයෙන් කිසියම් වගකීම් බැංකුවෙහි නිර්මාණය කිරීම.<br>(ඇ) බැංකුවට සපයනු ලබන හෝ බැංකුවෙන් ලබා ගැනෙන මූල්‍ය හෝ මූල්‍ය නොවන ආකාරයේ කවර හෝ සේවාවන් සැපයීම.<br>(ඈ) සම්බන්ධතා සහිත පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි, ඵලදායී සම්පත් ලෙස උරුමකරගත හැකිවුත්, රහස්‍යවුත්, නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදීවුත් තොරතුරු භාවිතා කිරීමට භාජනය විය හැකි, වාර්තාකරණ මංපෙත් හා තොරතුරු ප්‍රවාහ මාර්ග, බැංකුව හා සබඳතා සහිත පාර්ශවයන් අතර නිර්මාණය හා පවත්වා ගැනීම. | අනුකූලතාව දක්වා ඇත.<br><br>පහසුකම් ලබාදීමේදී බැංකුව විසින් 'ණය සංග්‍රහයෙහි' ඇති විධිවිධාන අනුගමනය කරන අතර, ඇගයීම් ක්‍රියාවලිය අනුගමනය කරයි.<br><br>සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගන්නා සහ වාර්තාකරණ ක්‍රියාපිළිවෙතක් බැංකුව තුළ පවතී. කෙසේවෙතත්, මෙම පාලන ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර දැනට බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් පවතී. |
| 3 (7) (iii) | බැංකු සමග සමාන ව්‍යාපාර කටයුතුවල නිරතවන සෙසු පාරිභෝගිකයින්ට ලැබෙන පහසුකම්වලට වඩා වැඩි පහසුකම් සම්බන්ධතා සහිත පාර්ශවයන්ට භුක්තිවිඳීමට ඉඩ ලැබෙනසේ, ඉහත 3 (7) (i) හි දැක්වෙන විධානයන් හි විස්තර කර ඇති ආකාරයට එකී පාර්ශවයන් සමග ගනුදෙනුවල නිරතවීමේ දී බැංකුව විසින් ක්‍රියා නොකරනු ලබන බව තහවුරු කෙරෙන ක්‍රියාපිළිවෙතක් තිබේදැයි පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුව ණය සංග්‍රහය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් අනුගමනය කරයි. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (අ) සම්බන්ධතා සහිත පාර්ශවයන්ට, මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි විචක්ෂණ ප්‍රතිශතය ඉක්මවන 'මුළු ශුද්ධ පිළිසරණ' ප්‍රමාණයක් ලබාදීම. මේ සම්බන්ධයෙන් අනු විධානයන් පහත පළවේ:<br>i පිළිසරණ යනුවෙන් අදහස් කෙරෙනුයේ, පිළිසරණ උපරිම ප්‍රමාණය පිළිබඳ 2007 අංක 07 දරන බැංකු පනතේ විධානයන්හි අර්ථකථනය කර ඇති ආකාරයයි.<br>ii 'මුළු ශුද්ධ පිළිසරණ' ගණනය කෙරෙනුයේ, මුළු පිළිසරණ ප්‍රමාණයෙන් මුදල් සමායනය සහ බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ එම සබඳතා සහිත පාර්ශවයන් විසින් සිදු කරන ලද ආයෝජනයන් හා පස් වසරක හෝ ඊට වැඩි කාලයක කල්පිරීමක් සහිත ණය සාධනපත්‍රවල අගය අඩු කිරීමෙනි. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ආ) බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතිකයට වඩා අඩු පොළී අනුපාතිකයක් අයකිරීම හෝ සම්බන්ධතා රහිත වෙනත් පාර්ශවයන් සමග, සමාන ලෙස සැසඳිය හැකි ගනුදෙනුවක් සිදුකිරීමේදී බැංකුවේ තැන්පතු අනුපාතිකයට වැඩිපුර ගෙවීම. | අනුකූලතාව දක්වා ඇත. |
| | (ඇ) සම්බන්ධතා රහිත පාර්ශවයන් සමග සාමාන්‍ය පරිදි ව්‍යාපාර කටයුතු, සිදු කිරීමේදී භාවිතා වන නියමයන් ඉක්මවා යන වඩා වාසිදායක කොන්දේසි, වෙළෙඳ පාඩු සහ/හෝ ගාස්තු/කොමිස් ආවරණය වැනි වරණීය සැළකිලි පිරි නැමීම.<br><br>(ඈ) ඇගයීම් ක්‍රියාපිළිවෙතකින් තොරව, සම්බන්ධතා සහිත පාර්ශවයන්ට සේවාවන් සැපයීම හෝ එවැනි පාර්ශවයකින් සේවාවන් ලබා ගැනීම. | අනුකූලතාව දක්වා ඇත.<br><br>අනුකූලතාව දක්වා ඇත. |
| | (ඉ) නීත්‍යානුකූල වගකීම් හා ක්‍රියාකාරකම් ඉටු කිරීම හා බැඳනු අවශ්‍යතාවන්හිදී හැර, සම්බන්ධතා සහිත පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි, එලදායී සම්පත් ලෙස උරුමකරගත හැකිවුත්, රහස්‍යවුත්, නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදී වුත් තොරතුරු බෙදාහදා ගැනීමට ඉවහල්විය හැකි, වාර්තාකරණ මංපෙත් හා තොරතුරු ප්‍රවාහ මාර්ග, බැංකුව හා සම්බන්ධතා සහිත පාර්ශවයන් අතර නිර්මාණය හා පවත්වා ගැනීම. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (7) (iv) | බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන කළමනාකාර නිළධාරියෙකුට පිළිසරණ ලබාදීමේ විධිපිළිවෙළක් බැංකුව තුළ පවතින්නේද යන බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමකදී එම කරුණට අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකක ඡන්දය එසේ පිළිසරණ ලබාදීම අනුමත කිරීම සඳහා ලැබීමෙන් පසුව පමණක් ඒ සඳහා අවසරය ලැබීමට නියමිතවන්නේද යන බවත්, මෙම පිළිසරණ හා අදාළ එම ඇපයේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් වරින්වර නිකුත් කර ඇති නිගමනයන්ට අනුකූලව තීරණය කර ඇත්ද යන්න පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 (7) (v) | (අ) බැංකුව විසින් කිසියම් පුද්ගලයෙකුට හෝ එම පුද්ගලයාගේ සමීප ඥාතියෙකුට හෝ එම පුද්ගලයාට ප්‍රමාණාත්මක සම්බන්ධතා පවත්නා ආයතනයකට හෝ කිසියම් පිළිසරණක් ලබා දෙන ලද්දේද, එම පුද්ගලයා පසුව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරන ලද්දේද, එම පත්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඇපයක් ලබාගැනීමක් වශයෙන්, එසේ පත්කරනු ලැබීමේ දින සිට අවුරුද්දක් ඇතුළතදී මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලද්දේද යන කරුණු නිගමනය කිරීමේ වැඩ පිළිවෙලක් බැංකුව සතුව පවතින්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුව විසින් ණය සංග්‍රහයෙහි විධිවිධාන අනුගමනය කරනු ලැබේ. |
| | (ආ) ඉහත අකං 3 (7) (v) (අ) යටතේ දැක්වෙන විධානයන් අනුව, අදාළ කාලසීමාව තුළදී ඇපයක් සපයනු ලැබ නොමැත්තේ නම්, එම පිළිසරණ ලබාදෙන අවස්ථාවේ දී නියම කරන ලද කාල පරාසය තුළදී හෝ අදාළ අධ්‍යක්‍ෂවරයා පත්කරන ලද දින සිට මාස 18 ක කාලය පිරුණු දින හෝ යන දින වකවානු දෙකෙන් කලින් හමාරවන කාලපරාසය තුළදී, එකී පිළිසරණ සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල්, පොලියද සමග අයකර ගැනීමට බැංකුව විසින් පියවර ගනුලැබ ඇත්තේ දැයි පරීක්‍ෂා කිරීම. | අදාළ නැත. |
| | (ඇ) ඉහත දැක්වෙන අනු විධානයන් සමග අනුගතවීමට අපොහොසත් වන්නාවූ කිසියම් අධ්‍යක්‍ෂවරයෙකු වේනම්, එම අධ්‍යක්‍ෂවරයා සිය අධ්‍යක්‍ෂ තනතුර හැරගිය කෙනෙකු වශයෙන් සළකා, එම කරුණ ජනතාව හමුවේ ප්‍රකාශයට පත් කරන්නට ඉඩ සැළසෙන ක්‍රියාපිළිවෙතක් පවත්නේදැයි පරීක්‍ෂා කිරීම. | අදාළ නැත. |
| | (ඈ) පිළිසරණ ලබාදෙන අවස්ථාවේදී බැංකු සේවයේ නියුතු අධ්‍යක්‍ෂවරයෙකුට ඉහත 3 (7) (v) (ඇ) යටතේ දැක්වෙන අනු විධාන අදාළ නොවන අතර, පිළිසරණ එසේ ලබාදෙන ලද්දේ සියලු බැංකු සේවකයින්ට පොදු යෝජනාක්‍රමයක් අනුව බව සහතික කෙරෙන දැනට පවත්නා ක්‍රියාවලිය පරීක්‍ෂා කිරීම. | අදාළ නැත. |
| 3 (7) (vi) | කිසියම් බැංකු සේවකයෙකුට අදාළ වන යෝජනාක්‍රමයක් පදනම් කර ගනිමින් හෝ ඉහතින් සඳහන් 3 (7) (v) විධානයන් අනුව ලබාදෙන ලද පිළිසරණ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇපය අනුව සුරක්ෂිතභාවයේ පැවැත්ම හැරුණුකොට, කවර සේවකයෙකුට හෝ සේවකයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාගේ හෝ සමීප ඥාතියාගේ දැඩි සබඳතාවක් සහිත ව්‍යාපාරයකට අදාළවන්නාවූ ගාස්තුවක් සහ/හෝ කොමිස් මුදලක් අයකිරීම අතහැර දැමීමක් හා බැඳුනු පිළිසරණ හෝ වැඩි වාසි සහිත සැළකිල්ලක් බැංකුව විසින් පිරිනමනු ලබන අවස්ථාවන්හිදී ඒවා හඳුනාගැනීමේ විධිපිළිවෙළක් පවත්නේදැයි පරීක්‍ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුව ණය සංග්‍රහය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් අනුගමනය කරයි. |
| 3 (7) (vii) | ඉහත දැක්වෙන 3 (7) (v) සහ 3 (7) (vii) යටතේ ඇති විධානයන් අනුව ලබාදෙන පිළිසරණ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ලබාගැනීමටත්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව, එකී පිළිසරණෙන් කොටසක් හෝ ඒ සඳහා ලබාගන්නා පොළියක් හෝ ප්‍රේෂණය කළ නොහැකි අතර, එවැනි අනුමැතියෙන් තොර ප්‍රේෂණය ශුන්‍යභාවයෙන් යුක්ත හා අගයෙන් තොර එකක් බව තීරණය කිරීමටත් හැකිවන ක්‍රියාදාමයක් පවත්නා බැව් පරීක්‍ෂා කිරීම. | එවැනි සිදුවීම් කාලච්ඡේදය තුළදී සිදුව නැත. කෙසේවෙතත්, එවැනි ප්‍රතිපත්තියක් පිළිබඳව බැංකුවේ ණය සංග්‍රහය අවධාරනය යොමු කර නැත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| **3 (8)** | **අනාවරණයන්** | |
| 3 (8) (i) | පහත සඳහන් කරුණු මණ්ඩලය විසින් අනාවරණය කර ඇති බව පරීක්ෂා කිරීම:<br>(අ) අධීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් නියමකරනු ලැබ ඇති හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ආකෘතීන් අනුව වාර්ෂික විගණිත ප්‍රකාශන සකස්කර ප්‍රකාශයට පත් කරන ලද බව සහ එම ප්‍රකාශන සාරාංශ වශයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල පළ කරන ලද බව<br>(ආ) ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර, සාරාංශගතකර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල පළකර ඇත. | අනුකූලතාව දක්වා ඇත. |
| 3 (8) (ii) | මණ්ඩලය විසින් මෙම අවම අනාවරණයන් වාර්ෂික වාර්තාවෙහි සිදුකර ඇති බව පරීක්ෂා කිරීම. | |
| | (අ) නිශ්චිත අනාවරණයන් ඇතුළත්ව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර ඇති බවට ප්‍රකාශය. | අනුකූලතාව දක්වා ඇත.<br>අදාළ ගිණුම්කරණ ප්‍රමිත සහ න්‍යාමන රෙගුලාසිවලට දක්වන ලද අනුකූලතාවය පිළිබඳව අනාවරණයන් 'අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනයෙහි' ඇතුළත් කර ඇත. කරුණාකර පිටු අංක 155 බලන්න. |
| | (ආ) මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැළසුම්කර ඇති බව සහ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව බාහිර පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බව තහවුරු කෙරෙන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්තාව | අනුකූලතාව දක්වා ඇත.<br>අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයෙහි බැංකුවේ මූල්‍ය වාර්තාවල විශ්වසනීයභාවය පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදිය හැකි පරිදි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාවය සම්බන්ධව තහවුරුවක් ලබාදී ඇත. පිටු අංක 156 - 157 කෙරෙහි අවධානය යොමු කරන්න. |
| | (ඇ) මෙහි ඉහතින් 3 (8) (ii) (ආ) විධානයෙහි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ඵලදායකත්වය පිළිබඳව බාහිර විගණකගේ වාර්තාව මණ්ඩලය විසින් ලබාගන්නා ලද බව පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාවය පිළිබඳව තහවුරු කිරීමේ වාර්තාවක් බැංකුව විසින් බාහිර විගණකගෙන් ලබාගෙන ඇත. කරුණාකර පිටු අංක 158 - 159 කෙරෙහි අවධානය යොමු කරන්න. |
| | (ඈ) නම, සුදුසුකම්, වයස, නිර්මිත අවශ්‍යතා සපුරාලන යෝග්‍යතාව හා ගැලපීමද විස්තරවන පළපුරුද්ද, බැංකුව සමග පවත්නා ගනුදෙනු, බැංකුව විසින් ගෙවන ලද ගාස්තු/වේතනයද අන්තර්ගතව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර | අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පිටු අංක 24 - 26 දක්වා ඇතුළත් කර ඇති අතර, පිටු අංක 243 හි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 49 හි අධ්‍යක්ෂ ගාස්තු/පාරිශ්‍රමික පිළිබඳ විස්තර අනාවරණය කර ඇත. |
| | (ඉ) මෙහි 3 (7) (iii) විස්තරකර ඇති පරිදි, සබඳතා සහිත පාර්ශවයන්ට එක් එක් වර්ගීකරණය අනුව ලබාදී ඇති සම්පූර්ණ දළ පිළිසරණ ප්‍රමාණය, සබඳතා සහිත පාර්ශවයන්ට එක් එක් වර්ගීකරණය අනුව ලබාදී ඇති සම්පූර්ණ දළ පිළිසරණ ප්‍රමාණය බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් වශයෙන්ද අනාවරණය කළ යුතුවෙයි. | සම්බන්ධිත පාර්ශවයන් සඳහා ලබාදී ඇති පිළිසරණ ප්‍රමාණය පිටු අංක 243 - 247 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 49 හි දක්වා ඇත. බැංකුව විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අනාවරණය පිළිබඳව හා ඒවා හඳුනාගැනීම පිළිබඳව ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් කරමින් පවතී. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියාපිළිවෙත | අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඊ) ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්ට ගෙවන ලද වේතන, පිරිනමන ලද පිළිසරණ සහ බැංකුවේ තැන්පතු හෝ ආයෝජන ආදී වශයෙන් පුළුල් වර්ගීකරණයන් අනුව සකස් කරන ලදුව, බැංකුව විසින් එම නිළධාරීන්ට ගෙවන ලද වේතනයන්හි සමස්ත අගය සහ එම නිළධාරීන් සමග බැංකුව සිදුකළ ගණුදෙනුවල සමස්ත අගය | අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුව එහි ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම සමග කරන ලද ගනුදෙනුවල මුළු අගය පිටු අංක 243 හි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 49 හි ඇතුළත් කර ඇත. |
| | (උ) ආයතන යහ පාලන විධානයන් සමග අනුකූලවීම පිළිබඳව බාහිර විගණකගේ වාර්තාව මණ්ඩලය විසින් ලබාගන්නා ලද බවට පරීක්ෂා කිරීම. | අනුකූලතාව දක්වා ඇත.<br>මෙම විධානයන්හී අවශ්‍යතාවයන් සමග අනුකූලවීම පිළිබඳ බාහිර විගණක විසින් තථ්‍ය සොයා ගැනීම් පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| | (ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීතිරීති හා අභ්‍යන්තර පාලනයන් සහ කිසියම් හෝ වාස්තවික අනුකූල නොවීම් නිවැරදි කිරීම සඳහා ගන්නා ලද පියවර ද සමග අනුකූලවීම පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක් | අනුකූලතාව දක්වා ඇත.<br>කරුණාකර පිටු අංක 112 සිට 113 දක්වා බලන්න. |
| | (එ) බැංකුවේ අවදානම් කළමනාකරණ හා අදාළ ප්‍රමාද දෝෂයන් කෙරෙහි හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වාදෙන ලද විධානයන් සමග අනුකූල නොවීම කෙරෙහි නියාමන හා අධීක්ෂණ අවධානය පිළිබඳ ප්‍රකාශනයක්, එසේ වීනම්, මුදල් මණ්ඩලයේ විධානය අනුව එවැනි අවධාරනයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ගන්නා ලද පියවර ද සමග ජනතාවට එය අනාවරණය කිරීම. | මහජනතාව වෙත ආමන්ත්‍රණය කළ යුතු තරම් වන ප්‍රමාණාත්මක අවධාරනයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් වර්ෂය තුළදී බැංකුව වෙත නිකුත් කර නැත. |
| **3 (9)** | **සංක්‍රාන්තික හා වෙනත් සාමාන්‍ය ප්‍රතිපාදනයන්** | බැංකුව සංක්‍රාන්ති විධිවිධාන සමග අනුකූලතාවය දක්වා ඇත. |

# මාණ්ඩලීය විගණන කමිටු වාර්තා

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවයන් හා බැඳුනු වගකීම් ක්‍රියාත්මක කිරීමේදී, අවදානම් කළමනාකරණයේදී, අභ්‍යන්තර විගණනයේදී සහ අභ්‍යන්තර පාලන ඇගයීම් ක්‍රියාවලියේදී මණ්ඩලීය විගණන කමිටුව (ම.වි.ක) අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවනු ලැබේ. ම.වි.ක. බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ පවතින කාර්යක්ෂමතාවය පිළිබඳව සමාලෝචනය කරනු ලබන අතර, අභ්‍යන්තර විගණන වාර්තා සහ බැංකු කටයුතු පිළිබඳව බාහිර විගණක වාර්තා සමාලෝචන මෙන්ම ඒවායේ නිර්දේශයන් පිළිබඳව පසුවිපරම් කිරීමේ කාර්යයද කරනු ලැබේ.

ම.වි.ක.හි විෂය පථය සහ වගකීම් පිළිබඳ අධිකාරිය පවරාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලීය විගණන කමිටු ප්‍රඥප්තිය කාලීනව සමාලෝචනයකර අනුමත කරනු ලැබේ. තවද ම.වි.ක. විසින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි විෂය පථය සහ කාර්යභාරය තීරණය කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය නිර්දේශකොට මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

## කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, මණ්ඩලීය විගණන කමිටු ප්‍රඥප්තියට අනුකූලව කමිටු කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පත්කර ඇති ම.වි.ක. පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විතවේ:

ජෙහාන් පී. අමරතුංග මහතා (සභාපති)
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක

ඩී.එම්. ගම්මන්පිල මහත්මිය (සාමාජික)
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂිකා

ජී.කේ.ඩී. අමරවර්ධන මහතා (සාමාජික)
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක

ආර්.එම්.පී. රත්නායක මහතා (සාමාජික)
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක

ජෙහාන් පී.අමරතුංග මහතා ම.වි.ක. හි සභාපති වශයෙන් කටයුතු කරන අතර, ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක්වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු හා වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ අධිසාමාජිකයෙකු වන අතර, මූල්‍ය සහ කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වර්ෂ 25කට වඩා වැඩි කාලච්ඡේදයක් තුළ පුළුල් පළපුරුද්දක් ලබාගත් අයෙකි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙසද සේවය කරයි.

එතෙක් සාමාජිකයින් 03ක්ව පැවති ම.වි.ක. 2013 ජුනි මස 10 වන දින සිට සාමාජිකයින් 04 දෙනෙකුගෙන් සංයුක්තවනසේ ප්‍රතිනිර්මාණය කර ඇත. මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ලෙස නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂිකා විශාකා අමරසේකර මහත්මියට විකල්ප වශයෙන් ආර්.එම්.පී.රත්නායක මහතා පත්කර ඇත.

ම.වි.ක. හි ආරාධනයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතා) සහ බාහිර විගණක ම.වි.ක. රැස්වීම් සඳහා සහභාගිවේ. මණ්ඩලීය විගණන කමිටුවට තම කාර්යයභාරය ක්‍රියාත්මක කිරීමේදී යම් යම් ගැටළු හා නිරීක්ෂණයන් පිළිබඳව ව්‍යාපාර අංශයන්හි අදාළ නිළධාරීන්ට ඇතැම් රැස්වීම්වලට සහභාගී වන ලෙස ආරාධනා කරන අතර, එමගින් ප්‍රධාන ගැටළු සහ සංවර්ධනයන් පිළිබඳව ම.වි.ක. හි අවබෝධය වැඩි කරලීමටත් අපේක්ෂා කෙරේ.

## ව්‍යවස්ථාපිත අනුකූලතාව

2007 අංක 11 දරන බැංකු පනතේ නියමයන්ට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති, බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහාවූ අනුගම්‍ය ආයතනික යහපාලන සංග්‍රහය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඒකාබද්ධව නිකුත්කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව ආචාරධර්ම සංග්‍රහය මගින් විගණන කමිටුවේ විෂය පථය හා කාර්යභාරය නියාමනය කරයි.

## විගණන කමිටුවේ යුතුකම් සහ කාර්යයභාරය

මණ්ඩලීය විගණන කමිටුව පහත කාර්යයන් සම්බන්ධව වගකීම් දරනු ලැබේ:

- ප්‍රකාශනය සඳහා සකස් කෙරෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ ත්‍රෛමාසික වාර්තාවල සද්භාවය පාලනය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- ගිණුම් ප්‍රතිපත්ති හා පරිචයන්හි ගුණාත්මකබව හා පිළිගත හැකිබව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- ගිණුම්කරණය හා මූල්‍යකරණ වාර්තාකරණය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හා ව්‍යවස්ථාපිත අනුකූලතාව සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශය (ත්‍රෛමාසික අතුරු ප්‍රකාශ සහිතව) ප්‍රකාශනයට පෙර, ඒකාකාරීභාවයකින් යුක්තව ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන්, ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කිරීම හා ඉදිරිපත් කිරීම කර ඇත්දැයි පරීක්ෂා කිරීම.

- ආයතනික කළමනාකරණය සමග අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කරමින්, වැරදි, වංචා සහ ක්‍රියාපටිපාටිවලට අනනුකූලව කටයුතු කිරීම වැනිදෑ වැළැක්වීමට අවශ්‍ය පූර්වෝපාය ක්‍රියාමාර්ග ගැනීම.
- අභ්‍යන්තර විගණනයේ ස්වාධීනතාව ඇගයීම හා අභ්‍යන්තර විගණන ප්‍රධානී පත්කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන කාර්යයන් හා එහි කාර්යසාධනය අධීක්ෂණය කිරීම.
- බාහිර විගණනයේ ගාස්තු හා ඵලදායීතාවය මෙන්ම ඔවුන්ගේ ස්වාධීනත්වය සහිතවු බාහිර විගණක පත්කිරීම් පාරිශ්‍රමික ගෙවීම්, ඉල්ලා අස්වීම් හා ඉවත්වීම අධීක්ෂණය කිරීම.
- බාහිර ප්‍රයෝජනය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අදාළවන ගිණුම්කරණ ප්‍රමිතීන් හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව ඒවා සකස් කරන ලද බවට සාධාරණ සහතික කිරීමක් කළ හැකිවන පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධති හා අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීභාවය සමාලෝචනය කිරීම.
- එලෙස පත්කිරීම අවශ්‍ය වන්නේ යැයි පෙනී යන විට විශේෂිත කාර්යයන් සඳහා ස්වාධීන උපදේශකවරු අනුයුක්තකර ගැනීම.

2013 දෙසැම්බර් 31 දායින් අවසන් වර්ෂය තුළදී මණ්ඩලීය විගණන කමිටුවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ:

- **කාර්යයසාධනය**

ම.වි.ක. අවම වශයෙන් මූල්‍ය වර්ෂයක් තුළදී වාර 4ක් රැස්විය යුතු අතර, සමාලෝචිත වර්ෂය තුළදී කමිටුව රැස්වීම් හයක් (06) පවත්වා ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතා) සහ බාහිර විගණක මෙම රැස්වීම් සඳහා ආරාධනයෙන් සහභාගීවී ඇත.

- **මූල්‍ය වාර්තාකරණය**

මණ්ඩලය විසින් අනුගමනය කිරීමට තීරණය කරනලද ඒකාබද්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත එනම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) සමග අනුකූලතාවය සමාලෝචනය සහ නිර්දේශ කිරීම කරනලදී.

සකස් කොට ප්‍රකාශයට පත්කරන ලද වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණමය රෙගුලාසිමය අධිකාරීන් විසින් භාවිතා කළ යුතුයැයි නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලවන බවට තහවුරු කිරීම සඳහා මණ්ඩලයට සහායවන ලදී.

- **මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය**

බැංකුව ආයතනික යහපාලනය පිළිබඳව මහ බැංකුව විසින් 2007 අංක 11 දරන බැංකු පනතේ 3 (8) (ii) (ආ) වගන්තිවලට අනුව නිකුත් කරනු ලැබ ඇති නියෝගයන්ට අනුකූලව ක්‍රියාකළ යුතු අතර 2013 දෙසැම්බර් 31 දායින් අවසන්වු වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳව කාර්යයසාධනීයබව ඇගයීමට භාජනය කළ යුතුවේ.

2010 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධවවු මාර්ගෝපදේශනයේ නිර්ණායකයන් පදනම් කරගෙන 2013 දෙසැම්බර් 31 දායින් අවසන්වු කාලච්ඡේදය සඳහා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අභ්‍යන්තර පාලනයෙහි කාර්යයසාධනීයබව ඇගයීමට භාජනය කරනලදී.

- **වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව**

2007 අංක 11 දරන බැංකු පනතේ 3 (8) (ii) (උ) වගන්තියට අනුකූලව, බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති විධිවිධානයන් අනුකූලවන ආකාරයට, බැංකුවේ ආයතනික යහපාලන වාර්තාව ප්‍රසිද්ධකර ඇතිබව බාහිර විගණක වාර්තා කරඇත.

2013 වර්ෂය සඳහාවු ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාව 2013 වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් කරඇත.

## අභ්‍යන්තර විගණනය

මණ්ඩලීය විගණන කමිටුව බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යය ප්‍රමාණය හා ඵලාදායීතාවය පිළිබඳව අධීක්ෂණය සහ සමාලෝචනය කළ අතර, එහිදී විගණන කාර්යයන් පිළිබඳ වාර්තා හා විගණන සැලසුමට අනුව ලබාගෙන ඇති විශේෂ ප්‍රතිඵල සමාලෝචනය කිරීමත්, විගණකවරුන්ගේ ප්‍රමාණාත්මක සොයාගැනීම් මත පූර්වාරක්ෂක පියවර ගැනීම සඳහා ආයතනික කළමනාකාරීත්වය වෙත උපදෙස් ලබාදීමත්, විගණන දෙපාර්තමේන්තුවේ සම්පත් අවශ්‍යතා තක්සේරු කිරීමත් ඇතුළත් විය. ම.වි.ක. වර්ෂය පුරාම ප්‍රධාන අභ්‍යන්තර විගණක සමග අවශ්‍යතාවයන් මත අන්‍යෝන්‍ය ලෙස සහයෝගයෙන් කටයුතු කරනලදී.

සමාලෝචිත වර්ෂය තුළදී ම.වි.ක. අභ්‍යන්තර විගණන සැලසුම සමාලෝචනය කිරීම හා කාර්තුමය පදනම මත එහි ක්‍රමික ක්‍රියාත්මකවීම පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කරනලදී. ඒ ඒ අංශවල පැවති අවදානම් තත්ත්වය ප්‍රමාණය මත විගණනයන්හී අවශ්‍යතාවය තීරණයකොට වඩාත් වැඩි අවදානම් සහිත අංශ පිළිබඳව නිරන්තරයෙන් විගණන ක්‍රියාදාමයන් සිදුකිරීම මෙම කොටසට අයත්වේ.

ආයතනික කළමනාකරණය විසින් අභ්‍යන්තර විගණන නිර්දේශයන් ක්‍රියාත්මක කරන්නේද යන්න කමිටුව විසින් පරීක්ෂා කෙරේ. අභ්‍යන්තර විගණන වාර්තා බාහිර විගණකවරුන් වෙතද ලබාදේ.

ප්‍රමාණාත්මක සොයාගැනීම් හා සමගාමීව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ සේවකයින් තුළ ඇති යහපත් පාලනය පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍යවන පරිදි නිරන්තර පුහුණුවීම් හරහා තම දැනුම ලබාදීම හා බෙදාහැරීම කරනු ලැබේ.

මණ්ඩලීය විගණන කමිටුවේ නිර්දේශ අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනික කළමනාකරණය සඳහා නිරන්තරයෙන් ක්‍රියාත්මක වියයුතු වංචා වැළැක්වීමේ සහ පාලනය කිරීමේ ක්‍රියාවලියේදී වඩාත් ඵලදායීවූ යෙදවුම් ලබාදෙනු ලැබේ.

## බාහිර විගණකවරු

2013 දෙසැම්බර් 31 දායින් අවසන් මූල්‍ය වර්ෂය සඳහා බාහිර විගණකවරු නැවත පත්කිරීමේදී මණ්ඩලීය විගණන කමිටුව බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ විගණන ක්‍රියාවලියෙහි අරමුණ සහ ඵලදායීතාවය පිළිබඳව සමාලෝචනයකොට තම නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනලදී. ම.වි.ක. බාහිර විගණකවරු විගණන නොවන සේවා සඳහා යොදා ගැනීමේ විෂය පථය සහ ගාස්තු පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කරනලදී.

විගණන කමිටුව විසින් බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපියෙන් මතුකර ඇති කරුණු සහ ඒවා පිළිබඳව ගනුලබන පසු විපරම් ක්‍රියාකාරකම් සමාලෝචනය කරනලදී.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂාව මගින් ඉදිරිපත් කරනලද සොයාගැනීම් පිළිබඳ සමාලෝචනය කරනලද අතර, එම ව්‍යවස්ථාපිත පරීක්ෂාවේදී අධීක්ෂකයින්ගේ සැලකිල්ලට භාජනයවූ කරුණු යථාතත්ත්වයට පත්කිරීම සඳහා වූ සැලැස්මේ සඳහන් කරඇති කාලනියමයන්ට අනුකූලව කටයුතු කිරීමේ ප්‍රගතිය කාර්තුමය පදනමට සමාලෝචනය කරනලදී.

## අනතුරු සංඥාණනය

සංස්ථාපිත වංචා අවදානම් කළමනාකරණය හා බැඳුනු සම්බන්ධ උපායක්සේ මහජන බැංකුවේ අනතුරු සංඥාණන ප්‍රතිපත්තිය කටයුතු කිරීමට අරමුණු කරගනී. බැංකුව තුළ ඕනෑම කණ්ඩායම් සාමාජිකයෙක් හා සම්බන්ධව පවතින හෝ භව්‍ය 'වැරදි ක්‍රියාවක්' සම්බන්ධව තම අවදානය යොමු කිරීමට නිත්‍යානුකූල අයිතියක් ඇති අතර, එවැනි අවධාරණයන් ඒ සඳහා පත්කරනු ලබන ස්වාධීන අධිකාරියක් වෙත ස්වේච්ඡාවෙන් කරුණු ඉදිරිපත් කළ හැකිය. එවැනි ඉදිරිපත් කරන කරුණු පරීක්ෂණයකට භාජනය කරන අතර, එම කරුණු සහ ඉදිරිපත් කරන ලද පුද්ගලයා පිළිබඳව තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරගන්නා අතර, නිර්නාමික පැමිණිලි පවා සැලකිල්ලට භාජනය කරනු ලැබේ. සත්‍ය වශයෙන්ම මෙම පද්ධතිය මණ්ඩලයෙහි මණ්ඩලීය විගණන කමිටුව විසින් මෙහෙයවනු ලැබේ.

මණ්ඩලීය විගණන කමිටුව වෙනුවෙන්,



**ජෙහාන් පී. අමරතුංග**
සභාපති,
මණ්ඩලීය විගණන කමිටුව,
කොළඹ.

2014 ජනවාරි මස 23 දින

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } FB/G/PB/FA/2013

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 28 March 2014

## 2013 දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, 2013 දෙසැම්බර් 31 දිනට, මහජන බැංකුවේ (බැංකුව) සහ එහි පරිපාලතයන්ගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයන්, ආදායම් ප්‍රකාශනයන්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයන්, ස්කන්ධ වෙනස්වීම් දක්වන ප්‍රකාශනයන් හා එම වසර අවසානය දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත, බැංකුවේ සහ එහි පරිපාලතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය මගේ විධානය යටතේ සිදුකරන ලදී. මෙම විගණනය සිදුකිරීමේදී ප්‍රසිද්ධ වෘත්තීය වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශ විගණනය, එම පරිපාලිතයන් හා අදාළ සාමාජිකයන් විසින් පත්කරනලද ප්‍රසිද්ධ වෘත්තීය වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනනය කරනලදී.

### මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරීත්වයේ වගකීමවන අතර, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළහැකිවනු පිණිස අභ්‍යන්තර පාලනයන් සිදුකිරීම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකිව යුතුවේ.

### විගණකගේ වගකීම

මාගේ විගණන පරීක්ෂණ මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීමවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මා විසින් මෙම විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණව සහතික කළ හැකිවන පරිදි විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කළයුතු බවට ප්‍රමිතීන්ගෙන් කියැවේ. එකී මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට සහ අනාවරණයන් පිළිබඳ විගණන සාක්ෂි පරීක්ෂා කිරීම විගණනය සිදුකරන ක්‍රියාවලියට ඇතුළත්වේ. වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම තක්සේරු කිරීම ඇතුළු විගණකගේ විනිශ්චය මත, විගණනය සඳහා තෝරාගන්නා ක්‍රියාපිළිවෙත පදනම් වන්නේය. මෙම අවදානම් තක්සේරු කිරීමේදී, බැංකුවේ සුදානමට හා අවස්ථානුකූලව විගණන ක්‍රියාපිළිවෙත් සැලසුම් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කිරීමට අභ්‍යන්තර පාලනය අදාළවන බැව් විගණක අදහස් කරයි. එහෙත් එය බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායකත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා නොවේ. භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ කළමනාකාරීත්වය විසින් සකස් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම, මූල්‍ය ප්‍රකාශනයන්හි සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමත් විගණනයකට අන්තර්ගතවේ.

ඒ අනුව මාගේ විගණන මතය සඳහා පදනමක් සපයාගැනීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍යවන බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

Auditor General's Department

**මතය - බැංකුව**

මාගේ මතය අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක්, මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් කරනු ලබයි.

**මතය - සමූහය**

මගේ මතය අනුව, සීමිත මතය සඳහා පදනම සමූහය යටතේ ඉහත විස්තර කල බලපෑම හැරුනුවිට 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක්, මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් කෙරේ.

**අනෙකුත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

1988 අංක 30 දරන බැංකු පනත හා පසුකාලීන සංශෝධනයන් මගින් අවශ්‍ය කෙරෙන තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කර තිබුණි.

**නිදහස් කිරීම**

1971 අංක 38 දරන මුදල් පනතේ 5 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එවක මුදල් අමාත්‍යවරයා විසින් 1992 මැයි 14 දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝගයක් මගින්, බැංකුව එකී මුදල් පනතේ 11 වන කොටසේ විධිවිධානවලින් නිදහස් කර ඇත.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කෙරෙනු ඇත.

**එච්.ඒ.එස්. සමරවීර**
විගණකාධිපති

# ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන්වූ වසර සඳහා | | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| | සටහන | 2013 රු. '000 | 2012 රු. '000 | වෙනස % | 2013 රු. '000 | 2012 රු. '000 | වෙනස % |
| **දළ ආදායම** | 5 | 120,456,472 | 94,777,398 | 27.1 | 139,956,607 | 109,973,740 | 27.3 |
| පොළී ආදායම | | 110,440,562 | 85,241,301 | 29.6 | 129,204,762 | 100,844,385 | 28.1 |
| පොළී වියදම | | (73,791,102) | (51,323,506) | 43.8 | (84,244,882) | (60,211,289) | 39.9 |
| **ශුද්ධ පොළී ආදායම** | 6 | 36,649,460 | 33,917,795 | 8.1 | 44,959,880 | 40,633,096 | 10.6 |
| ගාස්තු හා කොමිස් ආදායම් | | 3,478,015 | 3,541,589 | (1.8) | 3,551,800 | 4,289,051 | (17.2) |
| ගාස්තු හා කොමිස් වියදම් | | (135,446) | (144,364) | (6.2) | (135,446) | (144,364) | (6.2) |
| ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 7 | 3,342,569 | 3,397,225 | (1.6) | 3,416,354 | 4,144,687 | (17.6) |
| වෙළෙඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය | 8 | 2,816,436 | 2,072,563 | 35.9 | 2,832,261 | 2,095,881 | 35.1 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 9 | 3,721,459 | 3,921,946 | (5.1) | 4,367,784 | 2,744,423 | 59.2 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | 46,529,925 | 43,309,529 | 7.4 | 55,576,279 | 49,618,087 | 12.0 |
| ණය හානිකරණය සහ වෙනත් අලාභයන් | 10 | (13,716,320) | (3,874,384) | 254.0 | (14,822,427) | (4,575,377) | 224.0 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම්** | | 32,813,605 | 39,435,145 | (16.8) | 40,753,852 | 45,042,710 | (9.5) |
| සේවක මණ්ඩල වියදම් | 11 | (11,958,251) | (13,818,647) | (13.5) | (13,371,475) | (14,932,771) | (10.5) |
| වෙනත් වියදම් | 12 | (8,844,614) | (7,902,154) | 11.9 | (11,877,082) | (9,626,218) | 23.4 |
| එකතුකළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභය | | 12,010,740 | 17,714,344 | (32.2) | 15,505,295 | 20,483,721 | (24.3) |
| මූල්‍ය සේවාවන් මත එකතුකළ අගය මත බද්ද | | (1,706,458) | (2,464,962) | (30.8) | (2,015,923) | (2,745,110) | (26.6) |
| එකතුකළ අගය මත බද්දට පසු මෙහෙයුම් ලාභය | | 10,304,282 | 15,249,382 | (32.4) | 13,489,372 | 17,738,611 | (24.0) |
| ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස | | – | – | | (76,978) | (67,207) | 14.5 |
| **බදුවලට පෙර ලාභය** | | 10,304,282 | 15,249,382 | (32.4) | 13,412,394 | 17,671,404 | (24.1) |
| බදු වියදම් | 13 | (2,816,395) | (4,355,390) | (35.3) | (4,248,210) | (5,774,716) | (26.4) |
| **වසර සඳහා ලාභය** | | 7,487,887 | 10,893,992 | (31.3) | 9,164,184 | 11,896,688 | (23.0) |
| **ලාභය බෙදීයන ආකාරය** | | | | | | | |
| බැංකුවේ ස්කන්ධ හිමියන් | | 7,487,887 | 10,893,992 | (31.3) | 8,364,339 | 11,230,194 | (25.5) |
| පාලනයට යටත් නොවන හිමිකම් | | – | – | | 799,845 | 666,494 | 20.0 |
| වසර සඳහා ලාභය | | 7,487,887 | 10,893,992 | (31.3) | 9,164,184 | 11,896,688 | (23.0) |
| **ලාභය මත කොටසක ඉපැයුම** | 14 | | | | | | |
| සාමාන්‍ය කොටසක් වෙනුවෙන් මූලික ඉපැයුම | 14.1 | 7,488 | 10,894 | (31.3) | 8,364 | 11,230 | (25.5) |
| සාමාන්‍ය කොටසක් වෙනුවෙන් තනුක ඉපැයුම | 14.2 | 52 | 76 | (31.3) | 58 | 78 | (25.5) |

පිටු අංක 191 සිට 262 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක්සේ සැළකේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| *දෙසැම්බර් 31න් අවසන්වූ වසර සඳහා* | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වසර සඳහා ලාභය** | 7,487,887 | 10,893,992 | 9,164,184 | 11,896,688 |
| **බදුවලින් පසු, වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණන ලාභ සහ අලාභ | (715,204) | (57,966) | (715,204) | (57,748) |
| විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් ප්‍රතිමිනුම් මත ලාභ සහ අලාභ | (133,988) | (18,489) | (132,690) | (38,609) |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය | 5,934,089 | – | 6,567,654 | – |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය - ආශ්‍රිතයන් | – | – | 182,475 | – |
| **අඩුකළා:** | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංරචක හා අදාළ බදු වියදම් / (ආදායම්) | (521,038) | – | (698,436) | – |
| **වර්ෂය සඳහා බදුවලින් පසු, වෙනත් විස්තීර්ණ ආදායම** | 4,563,859 | (76,455) | 5,203,799 | (96,357) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | 12,051,746 | 10,817,537 | 14,367,983 | 11,800,331 |
| **ලාභය බෙදී යන ආකාරය -** | | | | |
| බැංකුවේ ස්කන්ධ හිමියන් | 12,051,746 | 10,817,537 | 13,453,772 | 11,138,777 |
| පාලනයට යටත් නොවන හිමිකම් | – | – | 914,211 | 661,554 |
| | 12,051,746 | 10,817,537 | 14,367,983 | 11,800,331 |

පිටු අංක 191 සිට 262 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක්සේ සැළකේ.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31වැනි දිනට | | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2012 | වෙනස | 2013 | 2012 | වෙනස |
| | සටහන | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| **වත්කම්** | | | | | | | |
| මුදල් සහ මුදල් හා සමානද්‍රෑ | 16 | 18,772,595 | 24,401,979 | (23.1) | 20,801,230 | 26,102,723 | (20.3) |
| ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවත්නා ශේෂය | 17 | 40,370,892 | 43,412,048 | (7.0) | 40,370,892 | 43,412,048 | (7.0) |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 2,551,215 | 13,341,252 | (80.9) | 2,551,215 | 13,341,252 | (80.9) |
| ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර | 19 | 35,391 | 2,791 | 1,168.0 | 35,391 | 2,791 | 1,169.0 |
| වෙළඳාම සඳහා රඳවාගෙන ඇති වෙනත් මූල්‍ය වත්කම් | 20 | 63,748,857 | 18,772,710 | 239.6 | 64,057,091 | 19,002,137 | 237.1 |
| ණය සහ ලැබිය යුතු දෑ - බැංකු | 21 | 82,225,089 | 35,350,098 | 132.6 | 82,339,403 | 35,350,098 | 132.9 |
| ණය සහ ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් | 22 | 619,829,735 | 611,414,266 | 1.4 | 710,074,499 | 690,197,310 | 2.9 |
| මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින | 23 | 311,733 | 27,977,488 | (98.9) | 1,737,175 | 27,982,838 | (93.8) |
| මූල්‍ය ආයෝජන - කල්පිරෙනතෙක් දරා සිටින | 24 | 75,784,287 | 78,522,570 | (3.5) | 78,322,900 | 80,151,886 | (2.3) |
| පරිපාලිතයන්හි ආයෝජන | 25 | 1,245,908 | 1,253,434 | (0.6) | – | – | – |
| ආශ්‍රිතයින්හි ආයෝජන | 26 | 207,568 | 273,100 | (24.0) | 274,470 | 309,989 | (11.5) |
| කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 27 | 33,535 | 44,352 | (24.4) | 392,073 | 405,768 | (3.4) |
| දේපල, පිරියත හා උපකරණ | 28 | 14,705,721 | 8,234,565 | 78.6 | 18,183,658 | 10,923,098 | 66.5 |
| ආයෝජන දේපල | 29 | 189,776 | 398,508 | (52.4) | 189,776 | 398,508 | (52.4) |
| කල්බදු පෙරගෙවුම් | 30 | 295,732 | 291,866 | 1.3 | 295,732 | 291,866 | 1.3 |
| විලම්බිත බදු වත්කම් | 31 | 1,071,381 | 691,313 | 55.0 | 1,075,651 | 501,997 | 114.3 |
| වෙනත් වත්කම් | 32 | 9,205,859 | 8,913,989 | 3.3 | 10,771,638 | 12,485,771 | (13.7) |
| **මුළු වත්කම්** | | 930,585,274 | 873,296,329 | 6.6 | 1,031,472,794 | 960,860,080 | 7.3 |
| **වගකීම්** | | | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 33 | 81,794,017 | 94,124,713 | (13.1) | 101,987,002 | 133,987,864 | (23.9) |
| ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර | 34 | 215,844 | 1,710 | 12,522.5 | 215,844 | 1,710 | 12,522.5 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතුද්‍රෑ | 35 | 762,248,529 | 683,950,837 | 11.4 | 789,225,314 | 708,896,611 | 11.3 |
| වෙනත් ණය ගැනීම් | 36 | 20,353,986 | 41,024,958 | (50.4) | 38,878,017 | 40,740,098 | (4.6) |
| ප්‍රවර්තන බදු වගකීම් | | 393,380 | 1,860,689 | (78.9) | 877,476 | 1,933,576 | (54.6) |
| විලම්බිත බදු වගකීම් | 31 | 885,232 | 189,726 | 366.6 | 2,557,359 | 864,461 | 195.8 |
| වෙනත් වගකීම් | 37 | 13,124,900 | 12,938,908 | 1.4 | 19,501,922 | 18,686,592 | 4.4 |
| ණයකර | 38 | 15,032,542 | 10,000,000 | 50.3 | 23,141,451 | 10,000,000 | 131.4 |
| මුළු වගකීම් | | 894,048,430 | 844,091,541 | 5.9 | 976,384,385 | 915,110,912 | 6.7 |
| **හිමිකම්** | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරුණු ප්‍රාග්ධනය | 39 | 7,201,998 | 7,201,998 | – | 7,201,998 | 7,201,998 | – |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 40 | 2,811,685 | 2,437,291 | 15.4 | 2,811,685 | 2,437,291 | 15.4 |
| වෙනත් සංචිත | 41 | 24,409,753 | 15,883,878 | 53.7 | 25,959,057 | 16,671,804 | 55.7 |
| රඳවාගත් ඉපැයුම් | 42 | 2,113,408 | 3,681,621 | (42.6) | 14,168,284 | 14,858,239 | (4.6) |
| කොටස්කරුවන්ගේ මුළු හිමිකම | | 36,536,844 | 29,204,788 | 25.1 | 50,141,024 | 41,169,332 | 21.8 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 43 | – | – | – | 4,947,385 | 4,579,836 | 8.0 |
| මුළු හිමිකම් | | 36,536,844 | 29,204,788 | 25.1 | 55,088,409 | 45,749,168 | 20.4 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 930,585,274 | 873,296,329 | 6.6 | 1,031,472,794 | 960,860,080 | 7.3 |
| අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් | 44 | 197,118,649 | 207,021,384 | (4.8) | 197,376,033 | 208,570,108 | (5.4) |

පිටු අංක 191 සිට 262 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක්සේ සැළකේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරනු ලදුව, මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබා ඇත.

**ජී.ජී. මංගල**
ප්‍රධානී - මූල්‍ය

**එන්. වසන්ත කුමාර්**
ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි

**ගාමිණී එස්. සෙනරත්**
සභාපති

2014 මාර්තු 26, කොළඹ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන්වූ වසර සඳහා | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2013 | 2012 | 2013 | 2012 |
| | සටහන | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | | |
| බදු පෙරලාභය | | 10,304,282 | 15,249,382 | 13,412,394 | 17,671,404 |
| ගැලපීම් : | | | | | |
| බදු පෙර ලාභවල අඩංගු මුදල් නොවන අයිතමයන් | 45 | 14,561,131 | 3,431,840 | 15,927,755 | 4,515,991 |
| මෙහෙයුම් වත්කම්වල වෙනස්කම් | 46 | (72,878,904) | (173,144,405) | (84,217,843) | (188,289,730) |
| මෙහෙයුම් වගකීම්වල වෙනස්කම් | 47 | 44,113,293 | 204,656,120 | 46,097,018 | 217,986,741 |
| ආශ්‍රිතයින් හා බද්ධ ව්‍යාපාරවල ලාභ කොටස් | | – | – | (96,703) | 67,207 |
| ආශ්‍රිතයින් හා පරිපාලිතවලින් ලද ලාභාංශ | | (1,627,455) | (1,622,503) | (160,790) | (1,622,503) |
| ණයකර මත පොළී වියදම | | 1,695,043 | 1,337,500 | 1,695,043 | 1,337,500 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවූ දායක මුදල් | | 867,653 | 1,108,383 | 867,653 | 1,108,384 |
| බදු ගෙවීම් | | (4,489,304) | (5,608,101) | (4,883,503) | (6,919,856) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල්** | | (7,454,261) | 45,408,216 | (11,358,976) | 45,855,138 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහයන්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | | (1,168,692) | (1,327,807) | (1,654,618) | (2,190,339) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 30,288 | 23,879 | 118,591 | 383,938 |
| මූල්‍ය ආයෝජන මිලදී ගැනීම් | | – | (32,245,111) | – | (32,379,047) |
| පරිණතිය තෙක් රඳවාගෙන ඇති මූල්‍ය ආයෝජනවල වැඩිවීම/(අඩුවීම) | | 2,738,283 | – | 1,100,562 | – |
| අස්පෘශ්‍ය වත්කම් මිලට ගැනුම් - ශුද්ධ | | (27,792) | – | (43,644) | (18,557) |
| පරිපාලිතයින්ගේ සහ ආශ්‍රිතයින්ගේ ආයෝජන පවරා ගැනීමෙන්වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | – | – | 142,794 | – |
| පරිපාලිතයින් ඉවත්කිරීමෙන් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය | | 7,526 | 166,516 | – | – |
| ආශ්‍රිතයින් හා බද්ධ ව්‍යාපාර ඉවත්කිරීමෙන් ලත් ඉපැයුම් | | – | – | – | 50,000 |
| පරිපාලිත සහ ආශ්‍රිත ආයෝජනයන්ගෙන් ලත් ලාභාංශ | | 1,627,455 | 1,622,503 | 160,790 | 1,622,503 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් (යෙදවූ)/ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 3,207,068 | (31,760,020) | (175,525) | (32,531,502) |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහයන්** | | | | | |
| ණයකර නිකුතුවෙන් ලත් ශුද්ධ ඉපැයුම් | | 5,032,542 | – | 13,141,451 | – |
| ණයකර මත ගෙවනලද පොළිය | | (1,695,043) | (1,337,500) | (1,695,043) | (1,337,500) |
| පාලනයට යටත් නොවන කොටස්හිමියන්ට ගෙවනලද ලාභාංශ | | (219,690) | – | (713,400) | (34,027) |
| සෙසු ස්කන්ධ සාධනපත්‍ර හිමියන්ට ගෙවනලද ලාභාංශ | | (4,500,000) | (4,701,382) | (4,500,000) | (4,701,382) |
| කොටස් නිකුතු වියදම් | | – | – | – | (14,429) |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල්** | | (1,382,191) | (6,038,882) | 6,233,008 | (6,087,338) |
| **මුදල් සහ මුදල් හා සමානදෑ හී ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | (5,629,384) | 7,609,314 | (5,301,493) | 7,236,298 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමානදෑ | | 24,401,979 | 16,792,665 | 26,102,723 | 18,866,425 |
| මුදල් සහ මුදල් හා සමානදෑ හා අදාළ විනිමය වෙනස | | – | – | – | – |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමානදෑ | 16 | 18,772,595 | 24,401,979 | 20,801,230 | 26,102,723 |

පිටු අංක 191 සිට 262 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක්සේ සැළකේ.

# ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන්වූ වසර සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පැවරූ ප්‍රාග්ධනය | | සංචිත | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් | පැවරූ ප්‍රාග්ධනය | සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් සංචිත | ආයෝජන අරමුදල | විකිණීම සඳහා තබාගෙන ඇති ආයෝජන සංචිතය | රඳවාගත් ඉපැයුම් | |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **බැංකුව** | | | | | | | | | |
| 2011.01.01 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 49,998 | 5,630,460 | 2,198,971 | – | 413,124 | 3,914,771 | 19,409,322 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | – | 10,446,373 | 10,446,373 |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (96,671) | – | (96,671) |
| ශේෂ පත්‍ර බාහිර අයිතමයන්හි හානිකරණ අයකිරීම | – | – | – | – | – | – | – | – | – |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් - ශුද්ධ | – | – | – | – | – | – | – | (2,170,391) | (2,170,391) |
| කාලය තුළදී සංචිතයට මාරුකිරීම | – | – | 1,842,593 | – | 1,447,598 | 1,897,702 | – | (5,187,893) | – |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ | – | – | – | – | – | – | – | – | – |
| මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු විශේෂ ගෙවීම් | – | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) |
| 2011.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 1,892,591 | 5,630,460 | 3,646,569 | 1,897,702 | 316,453 | 2,502,860 | 23,088,633 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | – | 10,893,992 | 10,893,992 |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (18,489) | – | (18,489) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් - ශුද්ධ | – | – | – | – | – | – | – | (57,966) | (57,966) |
| කාලය තුළදී සංචිතයට මාරුකිරීම | – | – | 544,700 | (166,964) | 1,432,304 | 3,145,843 | – | (4,955,883) | – |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ | – | – | – | – | – | – | – | (201,382) | (201,382) |
| මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු විශේෂ ගෙවීම් | – | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) |
| 2012.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 2,437,291 | 5,463,496 | 5,078,873 | 5,043,545 | 297,964 | 3,681,421 | 29,204,788 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | – | 7,487,887 | 7,487,887 |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (133,988) | – | (133,988) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් - ශුද්ධ | – | – | – | – | – | – | – | (715,204) | (715,204) |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභ/(අලාභ) | – | – | – | 5,934,089 | – | – | – | – | 5,934,089 |
| කාලය තුළ සංචිතයට මාරුකිරීම | – | – | 374,394 | – | 1,875,000 | 1,371,812 | – | (3,621,206) | – |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ (සටහන් 41.6) | – | – | – | – | – | – | – | (219,690) | (219,690) |
| මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු විශේෂ ගෙවීම් (සටහන් 41.7) | – | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | – | – | – | (521,038) | – | – | – | – | (521,038) |
| 2013.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 2,811,685 | 10,876,547 | 6,953,873 | 6,415,357 | 163,976 | 2,113,408 | 36,536,844 |

| දෙසැම්බර් 31න් අවසන්වූ වසර සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පැවරුං ප්‍රාග්ධනය | | සංචිතයන් | | | | | | එකතුව | පාලනයට යටත් නොවන හිමිකම් | සංචිත එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් | පැවරුං ප්‍රාග්ධනය | සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනතත් සංචිත | ආයෝජන අරමුදල | විකිණීම සඳහා තබාගෙන ඇති ආයෝජන සංචිතය | රඳවාගත් ඉපැයුම් | | | |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **සමූහය** | | | | | | | | | | | |
| 2011.01.01 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 49,998 | 5,630,460 | 2,198,971 | – | 413,124 | 10,559,847 | 26,054,398 | 83,225 | 26,137,623 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | – | 12,117,411 | 12,117,411 | 406,127 | 12,523,538 |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (93,985) | – | (93,985) | 895 | (93,090) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් - ශුද්ධ | – | – | – | – | – | – | – | (2,169,579) | (2,169,579) | 271 | (2,169,308) |
| කාලය තුළ සංචිතයට මාරු කිරීම | – | – | 1,842,593 | – | 1,447,598 | 2,230,900 | – | (5,521,091) | – | – | – |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (3,580) | – | (3,580) | – | (3,580) |
| අපහරණයෙන් ලැබෙතැයි සැළකෙන ලාභය | – | – | – | – | – | – | – | 3,150,026 | 3,150,026 | – | 3,150,026 |
| කොටස් නිකුතු වියදම් | – | – | – | – | – | – | – | (211,190) | (211,190) | – | (211,190) |
| කීර්තිනාමය ගැලපීම | – | – | – | – | – | – | – | (2,969) | (2,969) | – | (2,969) |
| හිමිකම් වෙනස්වීම අපහරණය | – | – | – | – | – | – | – | (29,362) | (29,362) | – | (29,362) |
| වර්ෂය තුළ අත්පත් කරගැනීම් | – | – | – | – | – | – | – | – | – | 3,932,085 | 3,932,085 |
| මහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු විශේෂ ගෙවීම් | – | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) | – | (4,500,000) |
| 2011.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 1,892,591 | 5,630,460 | 3,646,569 | 2,230,900 | 315,559 | 13,393,093 | 34,311,170 | 4,422,603 | 38,733,773 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | – | 11,230,199 | 11,230,199 | 666,494 | 11,896,693 |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (38,663) | – | (38,663) | 54 | (38,609) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් - ශුද්ධ | – | – | – | – | – | – | – | (52,754) | (52,754) | (4,994) | (57,748) |
| කාලය තුළ සංචිතයට මාරු කිරීම | – | – | 544,700 | (166,964) | 1,432,304 | 3,621,639 | – | (5,431,679) | – | – | – |
| අපහරණයෙන් ලැබෙතැයි සැළකෙන ලාභයේ සංචලනය | – | – | – | – | – | – | – | 435,191 | 435,191 | (504,322) | (69,131) |
| කොටස් නිකුතු වියදම් | – | – | – | – | – | – | – | (14,429) | (14,429) | – | (14,429) |
| ශ්‍රී ලංකා රජයට ගෙවු ලාභාංශ (සටහන් 40.6) | – | – | – | – | – | – | – | (201,382) | (201,382) | – | (201,382) |
| මහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු විශේෂ ගෙවීම් | – | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) | – | (4,500,000) |
| 2012.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 2,437,291 | 5,463,496 | 5,078,873 | 5,852,539 | 276,896 | 14,858,239 | 41,169,332 | 4,579,836 | 45,749,168 |
| වර්ෂය සඳහා ලාභය /(අලාභය) | – | – | – | – | – | – | – | 8,364,339 | 8,364,339 | 799,845 | 9,164,184 |
| විකිණීම සඳහා පවතින ආයෝජනවල සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (133,015) | – | (133,015) | 325 | (132,690) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් - ශුද්ධ | – | – | – | – | – | – | – | (715,204) | (715,204) | – | (715,204) |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත ලාභ | – | – | – | 6,409,263 | – | – | – | – | 6,409,263 | 158,391 | 6,567,654 |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත ලාභ ආශ්‍රිතයන් | – | – | – | 182,475 | – | – | – | – | 182,475 | – | 182,475 |
| කාලය තුළ සංචිතයට මාරු කිරීම | – | – | 374,394 | – | 1,875,000 | 1,611,397 | (3,780) | (3,856,261) | 750 | 250 | 1,000 |
| ශ්‍රී ලංකා රජයට ගෙවු ලාභාංශ (සටහන් 41.6) | – | – | – | – | – | – | – | (219,690) | (219,690) | – | (219,690) |
| මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු විශේෂ ගෙවීම් (සටහන් 41.7) | – | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) | – | (4,500,000) |
| අපහරණයෙන් ලැබෙතැයි සැළකෙන ලාභයේ සංචලනය | – | – | – | – | – | – | – | 100,190 | 100,190 | (98,759) | 1,431 |
| කොටස් නිකුතු වියදම් | – | – | – | – | – | – | – | 208,554 | 208,554 | 69,518 | 278,072 |
| ඒකාබද්ධ ගැලපීම් | – | – | – | – | – | – | – | (71,883) | (71,883) | (23,961) | (95,844) |
| ලාභාංශ ගෙවීම් | – | – | – | – | – | – | – | – | – | (493,710) | (493,710) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු | – | – | – | (654,087) | – | – | – | – | (654,087) | (44,350) | (698,437) |
| 2013.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 2,811,685 | 11,401,147 | 6,953,873 | 7,463,936 | 140,101 | 14,168,284 | 50,141,024 | 4,947,385 | 55,088,409 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. වාර්තාකරණ ඒකකය

### 1.1 ආයතනික තොරතුරු

1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ, රජයට අයත් බැංකුවක් වශයෙන්, 1961 ජුලි මස 01 දින මහජන බැංකුව (බැංකුව) පිහිටුවා ඇති අතර, එහි මූලස්ථානය ශ්‍රී ලංකාවේ ස්ථාපිතව ඇත. 2013 දෙසැම්බර් 31වන දිනෙන් අවසන්වන වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ, බැංකුවේ මෙන්ම එහි පරිපාලිත සමාගම්වන, පීපල්සි ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හා පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම, සහ උපපරිපාලිත සමාගම්වන සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම, සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම, සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම සහ ආශ්‍රිත සමාගමවන පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ මූල්‍ය තොරතුරු අන්තර්ගතවේ. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2014 මාර්තු මස 26 දින අනුමැතිය දෙනු ලැබිය.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

**බැංකුව**

බැංකුවේ ව්‍යාපාරික කටයුතු අතරට තැන්පතු භාරගැනීම, ණය පහසුකම් ලබාදීම, පුද්ගලික බැංකු කටයුතු, සංවර්ධන බැංකු කටයුතු, උකස් ගැනීම, ජාත්‍යන්තර වෙළඳාම, රජයේ සුරැකුම්පත් හා අදාළ ගනුදෙනු, ණය කාඩ්පත් මෙහෙයුම්, විදේශ මුදල් ගනුදෙනු හා සම්බන්ධ බැංකු කටයුතු ආදිය ඇතුළත්වේ.

**පරිපාලිත සමාගම්**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමට අදාළ ප්‍රධානම ක්‍රියාකාරකම් වනුයේ කල්බදු මූල්‍යකරණය, කුළීපිට විකුණුම් පදනම මත වත්කම් මූල්‍යකරණය, ආන්තික වෙළෙඳාම, ණය සාධන පත්‍ර නිකුත් කිරීම සහ තැන්පතු භාරගැනීමයි. සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් සමාගමට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ සංචාර සංවිධානය සහ ගුවන් ටිකට්පත් නිකුත් කිරීමයි.

**උපපරිපාලිත සමාගම්**

බැංකුවේ උපපරිපාලිත සමාගම් පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්වල නිරතවෙයි:

| සමාගමේ නම | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|
| සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම | වාහන පද්ධතිය කළමනාකරණය, වාහන තක්සේරු කිරීම සහ සේවා ස්ථාන මෙහෙයවීම. |
| සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති පවත්වාගෙන යාම සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් |
| සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම |
| සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් සමාගම | අඩු ආදායම්ලාභීන් සහ ක්ෂුද්‍ර-ව්‍යාපාරිකයින් සඳහා බැංකු නොවන මූල්‍ය සේවා සැපයීම |
| සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම | සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම හා පවත්වාගෙන යාම |

**ආශ්‍රිතයන්**

පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ ප්‍රධාන කාර්යයන් නම් වෙළඳ, මූල්‍ය පහසුකම් සැපයීම, කල්බදු, කුළීපිට විකුණුම්, නිශ්චල දේපල වෙළෙඳාම්, කෙටිකාලීන ආයෝජන සහ ආයතනික මූල්‍ය සේවා සම්පාදනයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව, බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 මිනුම්කරණ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සහ, පහත දැක්වෙන කරුණු හැරෙන්නට, ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය පදනම් කරගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් අන්තර්ගතකරමින් බැංකුවේ සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත:

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයක් සහිත මූල්‍ය සාධන පත්‍ර සාධාරණ අගයට මිනුම්කරණය
- සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර

- විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයට මිනුම්කරණය
- සැලසුම් වත්කම්වල ශුද්ධ එකතුව, නිශ්චිත ප්‍රතිලාභ සඳහා වගකීම්වල ප්‍රවර්තන අගයෙන් අඩු කරනු ලැබීමෙන් නිශ්චිත ප්‍රතිලාභ සඳහා වගකීම ආයුගණක පදනම මත අගය කිරීම.

උද්ධමනීය සාධක වෙනුවෙන් ගැලපීම් සිදුකර නොමැත.

## 2.2 අනුකූලතා ප්‍රකාශය

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙලකොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලවයි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුව සහ සමූහය ස්වකීය මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ඉදිරිපත් කරනුයේ ද්‍රවශීලතාවය පදනම් කරගෙනය. වාර්තාකළ දිනයට පසු 12 මසක් ඇතුළත (ප්‍රවර්තන) සහ වාර්තාකළ දිනයට පසු 12 මසක් ගතවූ පසු (ප්‍රවර්තන නොවන) පියවීම් හෝ සමථයකට පත්කිරීම පිළිබඳව විග්‍රහයක් සටහන් අංක 51 යටතේ දක්වා ඇත.

## 2.4 ඒකාබද්ධකරණ පදනම

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනයන්ට අන්තර්ගතවනුයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා අදාළ වන්නාවූ බැංකුවේ සහ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන්ය. ඒකාබද්ධකරණය සඳහා බැංකුවේ පරිපාලිතයින්ගේ මූල්‍ය ප්‍රකාශනයන්ද පිළියෙල කරනු ලබනුයේ මහජන බැංකුව වාර්තාකරන වර්ෂයම පාදක කරගනිමින් හා එකම ආකාරයේ ප්‍රතිපත්තීන් අනුගමනය කරනු ලැබීමෙනි.

**2012 ජනවාරි 1 දින හෝ ඉන්පසු පවරා ගැනීම**

2012 ජනවාරි 1 දින හෝ ඉන්පසු පවරා ගැනීම සම්බන්ධයෙන්, පවරාගනු ලබන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම්වේනම් එම අගයද ඇතුළත්ව ගනුදෙනුවේ සාධාරණ අගයෙන්, පවරාගැනීමට යෝජිත වත්කම් හා වගකීම්වල ශුද්ධ නියමිත අගය (සාමාන්‍යයෙන් සාධාරණ අගය) අඩුකරනු ලැබීමෙන් සමූහය විසින් කීර්තිනාමය මනිනු ලැබේ.

**2012 ජනවාරි 1 දිනට පෙර පවරා ගැනීම**

SLFRS ක්‍රමයට පරිවර්තනයවීමත් සමගම, 2012 ජනවාරි 1 දින හෝ එම දිනට පසු සිදුවූ ව්‍යාපාර සංයෝජනයන් යළි ස්ථාපිත නොකරන්නට සමූහය විසින් තීරණය කරන ලදී. ඊට පෙර සිදුවූ පවරාගැනීම් සම්බන්ධයෙන්, සමූහයේ පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි නිර්දේශයන්ට අනුකූලව කීර්තිනාමය අගයකර ඇත.

## 2.5 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු, සමූහය විසින් පාලනය කරනු ලබන ආයතනයන්ය. පාලනය ආරම්භවන දින සිට පාලනය අවසානවන දිනය දක්වා පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර්ගතවේ. සමාන අවස්ථාවන්හිදී සිදුකෙරෙන සමාන ගනුදෙනු සම්බන්ධව හා සමාන සිද්ධීන් සම්බන්ධයෙන් පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පදනම්කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

මුදල් ලාභාංශ වශයෙන් හෝ ණය හෝ අත්තිකාරම් ආපසු ගෙවීමක් වශයෙන් හෝ මව් සමාගමට අරමුදල් පැවරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස සැළකිය හැකි සීමාවන් නොපවතී. බැංකුවේ සියළුම පරිපාලිත සමාගම් ශ්‍රී ලංකාවේ සංස්ථාපිතව ඇත.

## 2.6 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් සමූහය සතු බලපෑම් සැලකිය යුතු මට්ටමකට පවතින අතර, මූල්‍ය හා ප්‍රතිපත්ති මෙහෙයවීම මත සමූහයේ පාලනයක් නොමැත. වෙනත් ආයතනයක 20% - 50% අතර ඡන්ද බලයක් සමූහයට හිමිවූවිට එමගින් සැළකිය යුතු බලපෑමක් සිදුකළ හැකි ලෙස සැළකේ. ස්කන්ධ ක්‍රමය (ස්කන්ධ ගිණුම් සහිත ආයෝජිතයින්) භාවිතාකරමින් ආශ්‍රිත ආයතනවල ආයෝජන ගිණුම්ගතකෙරෙන අතර, ආරම්භයේදී ඒවා හඳුනාගනු ලබනුයේ මුල් පිරිවැය අනුවය. ගනුදෙනු සඳහා අදාළ පිරිවැයද, ආයෝජන පිරිවැය තුළ අන්තර්ගතවේ.

සමූහය විසින් ආශ්‍රිත සමාගම් මත සැළකිය යුතු බලපෑමක් ක්‍රියාත්මක කළ දින සිට එය නතරවූ දිනය දක්වා, සමූහයේ ප්‍රතිපත්ති සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුකූලවන ආකාරයට පෙළගැස්වීමට අවශ්‍ය ගැලපීම් සිදුකළ පසු, ලාභ හෝ අලාභ වශයෙන් බැංකුවේ කොටස හා වෙනත් විස්තීර්ණ ආදායම්වලින් අදාළ කොටස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයට අන්තර්ගත කෙරේ.

බැංකුවේ අලාභ කොටස, හිමිකම් ගිණුම් සහිත ආයෝජිතයින්ගේ ස්කන්ධයට වඩා අධිකවූ විට, කිසියම් දිගුකාලීන ආයෝජනයන්ද ඇතුළුව එම ස්කන්ධයේ ධාරණ අගය 'ශූන්‍ය' ලෙස වාර්තාවන අතර, එම ආයෝජිතයින් වෙනුවෙන් ගෙවීමක් සිදුකළ බවට හෝ ඒ සඳහා සමූහයේ වගකීමක් ඇති ප්‍රමාණයට හැරෙන්නට තවදුරටත් ඇතිවන අලාභ හඳුනාගැනීම නවත්වනු ලැබේ. පසුකාලීනව ආශ්‍රිතයින් ලාභ වාර්තා කළහොත්, බැංකුවේ ලාභ කොටස හඳුනා නොගත් අලාභ කොටසට සමාන වීමෙන් පසුව පමණක් එම ලාභවලින් තමන්ගේ කොටස හඳුනාගැනීමට බැංකුව ආරම්භ කරයි.

### 2.7 ව්‍යාපාර සංයෝජනයන්

ගිණුම්කරණයේදී අත්පත්කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජනයන් ගිණුම්ගත කරනු ලබයි. සාධාරණ අගයන්ට අත්පත්කර ගත්තාවූ ව්‍යාපාරයන්හී (පූර්වයේදී හඳුනා නොගත් අස්පෘශ්‍ය වත්කම්ද ඇතුළුව) හඳුනාගත හැකි වත්කම් හා (අනාගතයේ ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ඉවත් කළ හැකි අසම්භව්‍ය වගකීම් ඇතුළුව) වගකීම්ද මෙහිදී අදාළ කරගනී. හඳුනාගතහැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගයට වැඩිවූ අත්පත් කරගැනීමේ පිරිවැයෙහි අතිරික්තය කීර්තිනාමය ලෙස හැඳින්වෙයි. අත්පත්කරගත් හඳුනාගතහැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගයට වඩා අත්පත්කරගැනීමේ පිරිවැය අඩුවන්නේනම්, අත්පත්කරගැනීම හා අදාළ වෙනස, එය සිදුකළ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ සෘජුවම හඳුනාගැනේ.

### 2.8 පාලනයට යටත් නොවන හිමිකම් අත්පත්කර ගැනීම

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත්කර ගැනීම, ස්කන්ධ හිමියන්ගේ තත්ත්වය තුළ ඔවුන් සමඟ සිදුකරන ගනුදෙනු ලෙස ගිණුම්ගතකරනු ලැබේ. එමනිසා, එවැනි ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස කීර්තිනාමය හඳුනානොගනී.

### 2.9 ඒකාබද්ධකිරීමේදී ගනුදෙනු බැහැර කිරීම

ඒකාබද්ධකිරීමේදී, (විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ලාභ හෝ අලාභ හැර) සියළුම අන්තර් සමූහ ගනුදෙනු, ශේෂයන්, ආදායම් හා වියදම් බැහැරකරනු ලැබේ. සමූහය හා එහි ආශ්‍රිත සමාගම් අතර සිදුකෙරෙන ගනුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන්, ඇතිවන උපලබ්ධිනොවූ ලාභ හෝ අලාභ ආශ්‍රිත සමාගම් පිළිබඳව සමූහයේ පවතින ඇල්මෙහි ප්‍රමාණයට සමානුපාතික ලෙස ඉවත්කෙරේ.

උපලබ්ධිනොවූ ලාභ ඉවත්කිරීමේ ක්‍රමයටම උපලබ්ධිනොවූ අලාභද ඉවත් කරනු ලැබුවද, එය සිදුකරනු ලබන්නේ, හානිකරණය පිළිබඳ සාක්ෂි නොමැත්තේ නම් පමණි.

### 2.10 සැළකිය යුතු ලාභ හෝ අලාභ, ප්‍රතිපාදනයන් හෝ වැරදි නිවැරදි කිරීම්

පූර්ව අවධිවල සිදුවූ ව්‍යාපාරික සංයෝජනයන් හා අදාළව වර්ෂය තුළ හඳුනාගත් වැදගත් වාසි හෝ අවාසි, ප්‍රතිපාදනයන් හෝ වැරදි නිවැරදි කිරීම් නොතිබිණි.

## 3. සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තුගතකිරීම් සහ උපකල්පනයන්

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය යොදා ගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත් අගයන් නිශ්චයකරගැනීම පිණිස, කළමනාකාරීත්වය විසින් විනිශ්චයන්, ඇස්තමේන්තුගතකිරීම් සහ උපකල්පනයන් භාවිතයට ගෙන ඇත. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුගත කිරීම්වලින් වෙනස්වීමට ඉඩ තිබේ.

ඇස්තමේන්තුගතකිරීම් හා පාදක වූ උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. සංස්කරණය කරන ලද කාල පරිච්ඡේදය තුළ හා බලපෑම් සිදුවිය හැකි ඕනෑම කාල පරිච්ඡේදයක් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකෙරෙන සංස්කරණයන් හඳුනාගෙන ඇත.

බහුලව භාවිතාවන විනිශ්චයන් හා ඇස්තමේන්තුගතකිරීම් පහත දැක්වේ:

### 3.1 අඛණ්ඩ පැවැත්ම

බැංකුව, ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙනයාමට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරීත්වය ඇස්තමේන්තුකර ඇති අතර, කල්තියා අනාගතය දැකිය හැකි ව්‍යාපාරයක් ලෙස එය පවත්වාගැනීමට ප්‍රමාණවත් සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙසට දිගින් දිගටම පවත්වා ගන්නට ඇති හැකියාව පිළිබඳව සාධාරණ සැකයක් ජනිතවියහැකි කිසියම්වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව බැංකුවට දැනීමක් නොමැත. එසේ හෙයින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනමෙහි පිහිටා මූල්‍ය ප්‍රකාශන සිදුකරනු ලැබේ.

### 3.2 මූල්‍ය උපකරණවල සාධාරණ අගයන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තාවී ඇති මූල්‍ය වත්කම්වල හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපොළ වෙතින් නිගමනය කරගත නොහැකි තැන්හී, ගණිතමය ආකෘතීන් ඇතුළත් තක්සේරු ශිල්පීය විවිධාංගයන් භාවිතාකරමින් ඒ පිළිබඳව තීරණය කරනු ලබයි. හැකි අවස්ථාවලදී නිරීක්‍ෂණය කළ හැකි වෙළෙඳපොළ දත්තයන් ඇසුරින් මෙම ආකෘතියට අවශ්‍ය යෙදවුම් නිගමනය කරනු ලැබේ. කෙසේවුවද, එය කළ නොහැකිවූවිට සාධාරණ අගය නිගමනය කිරීමට විනිශ්චයන් සිදුකිරීම අවශ්‍ය වේ. මූල්‍ය උපකරණවල තක්සේරුව, සටහන් අංක 50හි වඩාත් විස්තරාත්මකව දක්වා ඇත.

### 3.3 ණය හා අත්තිකාරම් මත සිදුවන හානිකරණ අලාභයන්

බැංකුවේ ආදායම් ප්‍රකාශනවල හානිකරණ අලාභයන් වාර්තාකළ යුතුව ඇත්තේදැයි තක්සේරු කරගැනීම සඳහා, සෑම මූල්‍ය තත්ත්ව දිනයක්ම හා අදාළව ප්‍රකාශයට පත්කර ඇති ප්‍රමාණාත්මක අත්තිකාරම් හා ණය ප්‍රමාණයන් වෙන වෙනම ගෙන බැංකුව සමාලෝචනය කරයි. විශේෂයෙන්ම, හානිකරණ අලාභයන් තීරණය කරන අවස්ථාවන්හීදී ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට සහ අනාගත මූල්‍ය ප්‍රවාහයන්හී කාලගණනය සඳහා කළමනාකාරීත්වයේ විනිශ්චය අවශ්‍යවේ. එවැනි අවස්ථාවන්හීදී සාධක කිහිපයක්ම පිළිබඳ උපකල්පනයන් මත මෙම ඇස්තමේන්තු පදනම්වන අතර, සැබෑ ප්‍රතිඵල වෙනස්විය හැකිය.

වෙන් වෙන්ව සිදුකරන තක්සේරු පදනම්කර ගනිමින් හානිකරණය අවශ්‍ය නොවේනම්, සමාන අවදානම් ගතිලක්ෂණයන්ගෙන් සමන්විත වත්කම් සමූහ වශයෙන් ගෙන, එවැනි වෙන්වශයෙන් වැදගත්වන ණය සහ අත්තිකාරම්, සමූහයක් ලෙස ඇස්තමේන්තුගතකරනු ලැබේ. මෙය අවශ්‍යවනුයේ, විෂයානුබද්ධ සාක්ෂි සහිතවුවද එතෙක් එහි ප්‍රතිඵල පැහැදිලි නොමැති, අලාභදායක සිදුවීම් අත්විඳීම නිසා ප්‍රතිපාදනයන් සැළසිය යුතුදැයි නිගමනය කරගැනීම සඳහාය. සාමූහික තක්සේරුව විසින්, (ණය හිමිකරු වර්ගය, ණය හිඟ මට්ටම්, කර්මාන්ත ආදී) ණය කළඹ වෙතින් සහ අවදානම් හා ආර්ථික දත්ත ඒකරාශී කිරීමේ ප්‍රතිඵලය තුළින් ලබාගන්නා දත්ත කෙරෙහි සැළකිල්ල යොමුකරනු ලබයි. ණය හා අත්තිකාරම් මත සිදුවන හානිකරණ අලාභයන් පිළිබඳව සටහන් අංක 22හි විස්තර කර තිබේ.

හානිකරණය පිළිබඳ තක්සේරුකිරීමේදී සටහන් අංක 50හි අනාවරණයකර ඇති නිර්ණායකයන් බැංකුව භාවිතා කරයි.

### 3.4 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජනයන්හී හානිකරණය

විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් තවදුරටත් හානිකරණයක් ලෙස සැළකිය යුතු දැයි තක්සේරු කිරීම උදෙසා, සෑම වාර්තාකරණ දිනයකදීම බැංකුව විසින් සමාලෝචනය කරනු ලබයි. අත්තිකාරම් හා ණය වෙන් වෙන් වශයෙන් තක්සේරුකිරීම සඳහා යොදාගන්නා විනිශ්චයන් හා සමාන විනිශ්චයන් මේ සඳහාද භාවිතා කෙරේ.

විකිණීම සඳහා පවතින ස්කන්ධ ආයෝජනයන්හී සාධාරණ අගය පිරිවැයට වඩා සැළකිය යුතු හෝ දිගුකාලීන අඩුවීමක් දක්නට ලැබුණු කල්හි, එම ආයෝජන මත හානිකරණය හා අදාළ අයකිරීමක් බැංකුව විසින් වාර්තාකරනු ලැබේ. 'සැළකිය යුතු' හා 'දිගුකාලීන' යන්න නිගමනය කිරීම සඳහා විනිශ්චයක් අවශ්‍යවේ.

විකිණීම සඳහා පවතින ආයෝජන මත හානිකරණ අලාභය වඩාත් විස්තරාත්මකව සටහන් අංක 23හි දක්වා ඇත.

### 3.5 විලම්බිත බදු වත්කම්

අනාගතයේදී ලැබිය හැකි බදු ලාභවලට එරෙහිව ප්‍රයෝජනයට ගතහැකිවීමේ සම්භාවිතාවයක් සහිත බදු අලාභ ප්‍රමාණයට අනුරූප ප්‍රමාණයක් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. අනුමාන කෙරෙන කාලනියමය හා අනාගත බදු සැලසුම් උපායමාර්ග සමඟ අනාගත බදු අයකළ හැකි ලාභ මට්ටම්වල පදනම මත හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිගමනය කිරීම සඳහා විනිශ්චයන් අවශ්‍යවේ.

### 3.6 නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්

(1996ට පෙර සේවයේ සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් සැකසුනු) නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැළසුම ආයුගණක තක්සේරුවක් භාවිතාකරමින් නිගමනය කෙරේ. වට්ටම් අනුපාතිකයන්, වත්කම් ප්‍රතිලාභ මත අපේක්ෂිත අනුපාතිකයන්, අනාගත වැටුප් වැඩිකිරීම්, මරණ අනුපාතිකය සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකිරීම ආයුගණක තක්සේරුව හා අදාළවේ. මෙම සියළු උපකල්පනයන් එක් එක් වාර්තාකරණ දිනයකදී සමාලෝචනයට භාජනය කරනු ලැබේ. මෙම සැළසුම්වල දීර්ඝකාලීන ස්වභාවය හේතුවෙන්, එම ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වෙයි. භාවිතා කළ උපකල්පනයන් පිළිබඳව තොරතුරු මෙම වාර්තාවේ පිටු අංක 35.1හි ඇතුළත් කර ඇත.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශ

### 4.1 විදේශ විනිමය පරිවර්තනය

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ සියළුම පරිපාලිත සමාගම්වල භාවිතාවන මුදල් වර්ගයවන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කර තිබේ.

විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදු කෙරෙන ගනුදෙනු, එම ගනුදෙනු සිදු කෙරෙන දින හා බලපවත්වන තත්කාලීන අනුපාතිකය අනුව වාර්තා කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් දක්වා ඇති මූල්‍යමය වත්කම් හා වගකීම්ද වාර්තා කෙරෙන දිනයේ පැවති තත්කාලීන අනුපාතිකය අනුව නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙළෙඳ නොවන ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සියලු විනිමය වෙනස්කම් ආදායම් ප්‍රකාශනයෙහි 'වෙනත් මෙහෙයුම් ආදායම්' ලෙස වාර්තා කෙරේ.

විදේශ ව්‍යවහාර මුදල්හි ඓතිහාසික පිරිවැය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතමයන්, ඒවා හඳුනාගන්නා දිනයේ පවතින තත්කාලීන විනිමය අනුපාතිකයන් භාවිතාකරමින් පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්හි සාධාරණ අගය මත මිනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන්, එම සාධාරණ අගය නිගමනය කෙරෙන දින පවත්නා තත්කාලීන විනිමය අනුපාතිකයන් භාවිතාකරමින් පරිවර්තනය කරනු ලබයි.

### 4.2 මූල්‍ය උපකරණ, මුල්වරට හඳුනාගැනීම, වර්ගීකරණය සහ පසුකාලීන මැනීම

#### 4.2.1 හඳුනාගැනීමේ දිනය

නිරන්තරයෙන් වෙළෙඳාම් කරනු ලබන මූල්‍ය වත්කම්වල මිලදී ගැනීම්, නිරාකරණ දින ගිණුම්කරණය භාවිතාකරමින් හඳුනාගනු ලැබේ. නිරාකරණ දිනය යනු, කිසියම් වත්කමක් ආයතනයකට භාරදෙනු ලබන දිනයයි. නිරාකරණ දින ගිණුම්කරණය යනුවෙන් අදහස් කරන්නේ, ආයතනයක් විසින් භාරගන්නා දිනයේ වත්කමක් හඳුනාගැනීමයි. නිරාකරණ දින ගිණුම්කරණය භාවිතාකරනවිට, ගනුදෙනුවන දිනයේ හා නිරාකරණ දිනය අතර කාලය තුළ ලැබීමට නියමිත වත්කමේ සාධාරණ අගයෙහි කිසියම් වෙනසක් වේනම් ඒ සඳහා ආයතනය විසින් ගිණුම්ගත කිරීම කරනු ලැබේ.

මූල්‍ය වත්කම් හා වගකීම්, පිළිබඳව නිරන්තරයෙන් නොවන මිලදී ගැනීම් ගනුදෙනුවන දිනයේදී හඳුනාගනු ලැබේ. එනම්, උපකරණයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනයන්ට බැංකුව පාර්ශවයක් වන දිනයයි.

විධිමත් මිලදී ගැනීමක් යනු, ගිවිසුමක් යටතේ මූල්‍ය වත්කමක් මිලදී ගැනීමක්වන අතර, එම ගිවිසුමේ කොන්දේසි අනුව, අදාළ වෙළෙඳපොළ තුළ පවත්නා නියාමනයන් හෝ සම්ප්‍රදායට අනුකූලව ස්ථාපනයකර ඇති කාලපරාසය තුළ එම වත්කම භාරදීම අවශ්‍ය කෙරේ.

**4.2.2 මූල්‍ය උපකරණයන් මුල්වරට මැනීම**

මුල්වරට හඳුනාගැනීමකදී මූල්‍ය උපකරණ වර්ගීකරණ පදනම තීරණය වනුයේ ඒවායේ අරමුණු හා ගතිලක්ෂණද, ඒවා අත්පත්කරගැනීමට කළමනාකරණයේ ඇති අභිප්‍රායද යන කරුණු මතයි. ලාභාලාභ මගින් සාධාරණ අගය මත වාර්තාකර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් හැර, සාධාරණ අගයට අමතරව සැළකිය යුතු ගනුදෙනු පිරිවැයද සහිතව මුල්වරට සියලු මූල්‍ය උපකරණ මැනීම කරනු ලැබේ.

**4.2.3 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය හා පසුකාලීනව මැනීම**

**මූල්‍ය වත්කම්**

ආරම්භයේදී මූල්‍ය වත්කමක් පහත සඳහන් ප්‍රභේදයන්ගෙන් එකකට වර්ගීකරණය කෙරේ:

- ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මත වෙළෙඳාම සඳහා රඳවාගනු ලැබූ හෝ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත නම්කරනු ලැබූ
- විකිණීම සඳහා පවතින
- ණය හා ලැබිය යුතුදෑ
- පරිණතය තෙක් තබාගන්නා

මූල්‍ය වත්කම් හා අදාළව අනතුරුව සිදුකරනු ලබන පසුකාලීන මැනීම, ඒවායේ වර්ගීකරණය මත තීරණයවේ.

**මූල්‍ය වගකීම්**

සමූහය විසින් සියලුම මූල්‍ය වගකීම් ඒවා ජනනයවූ දිනයේදීම හඳුනාගනු ලබන අතර, ක්‍රමක්ෂිත පිරිවැය අනුව හෝ ලාභාලාභ මගින් සාධාරණ අගය අනුව එම මූල්‍ය වගකීම් වර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වගකීම් හා අදාළව පසුකාලීන මිනුම්කරණය සිදුකරනු ලබන්නේ ඒවායේ වර්ගීකරණ පදනම මතයි.

**4.2.4 වෙළෙඳාම සඳහා රඳවාගන්නා ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්**

වෙළෙඳාම සඳහා රඳවාගන්නා ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්, සාධාරණ අගය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කර ඇත. 'ශුද්ධ වෙළෙඳ ආදායම' තුළ සාධාරණ අගයේ වෙනස්කම් හඳුනාගනු ලැබේ. පොලිය සහ ලාභාංශ ආදායම හෝ වියදම ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව හෝ ගෙවීම් අයිතිය ස්ථාපනය කළ පසුව, 'ශුද්ධ වෙළෙඳ ආදායම'තුළ වාර්තා කෙරේ.

කෙටිකාලීනව වෙළෙඳාම් කිරීමේ ප්‍රධාන පරමාර්ථය ඇතිව අත්පත්කරගන්නා ලද ණය සුරැකුම්පත් හා ස්කන්ධයන්ද මෙම වර්ගීකරණයට අන්තර්ගතකර ඇත.

**4.2.5 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව වාර්තා කර ඇති ව්‍යුත්පන්නයන්**

ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්නයන් බැංකුව විසින් භාවිතා කරනු ලබයි. ව්‍යුත්පන්නයන් සාධාරණ අගය අනුව වාර්තාගතවන අතර, ඒවායේ සාධාරණ අගය ධනාත්මක වනවිට වත්කම් ලෙසටත්, සාධාරණ අගය ඍණාත්මකවනවිට වගකීම් ලෙසටත් වාර්තාකරනු ලැබේ. ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම් 'ශුද්ධ වෙළෙඳ ආදායම' තුළ අන්තර්ගත වෙයි.

**4.2.6 විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස හඳුනාගන්නා මූල්‍ය වත්කම් ව්‍යුත්පන්නයන් නොවන අතර, අන් වර්ගීකරණයකට ප්‍රභේදනය නොකරන ලද මූල්‍ය වත්කම් විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්කන්ධ සුරැකුම්පත්වල හා ඇතැම් ණය සුරැකුම්පත්වල සිදුකර ඇති සමූහයේ ආයෝජනයන් විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මුල්වරට හඳුනාගැනීමෙන් අනතුරුව, සාධාරණ අගයට මිනුම්කරණයකොට අදාළ වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබේ.

උපලබ්ධි නොවූ ලාභ හා අලාභ, වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. එවැනි ආයෝජනයක් අපහරණය කරන අවස්ථාවේදී, ස්කන්ධයන්හී පෙරහඳුනාගන්නා ලද සමුච්චිත වාසි හෝ අවාසි ආදායම් ප්‍රකාශනයේ 'වෙනත් මෙහෙයුම් ආදායම්' යටතේ හඳුනාගැනේ. තවද, විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන රඳවාගන්නා අතරතුර උපයාගන්නා ලාභාංශ, ආයෝජනය කරනු ලබන සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයේදී 'වෙනත් මෙහෙයුම් ආදායම්' ලෙස ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබයි. එවැනි ආයෝජනයන් හානිකරණයවීම තුළින් උද්ගතවන අවාසි, 'මූල්‍ය ආයෝජනයන්ගෙන් සිදුවන ශුද්ධ වාසි/(අවාසි)' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගන්නා අතර, 'මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය' තුළ එවැනි හානිකරණයන් අදාළ වත්කම්/වගකීම් ගිණුමෙන් ඉවත් කර නිරූපණය කරනු ලැබේ.

**4.2.7 පරිණතිය තෙක් තබාගන්නා මූල්‍ය ආයෝජන**

පරිණතිය තෙක් තබාගන්නා මූල්‍ය ආයෝජන යනු, ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් හා ස්ථිර පරිණතවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්වන අතර, එම වත්කම් පරිණතය තෙක් රඳවාගැනීමේ අභිමතය සහ හැකියාව බැංකුවට ඇත. එම ආයෝජන ප්‍රධාන වශයෙන්ම මහ භාණ්ඩාගාර බැඳුම්කරවේ. මුල්වරට මිනුම්කරණයෙන් පසු පරිණතිය තෙක් තබාගන්නා මූල්‍ය ආයෝජනයන්, සඵල පොළී අනුපාතික භාවිතයෙන් (EIR) හානිකරණය අඩුකිරීමෙන් ලැබෙන ශේෂය භාවිතාකරමින් ක්‍රමක්ෂිත

පදනම අනුව මිනුම්කරණය කෙරේ. සඵල පොළී අනුපාතිකයේ සංකලිත කොටස්වන, අත්පත්කරගැනීම් වට්ටම් හෝ අතිරික්තයන් සහ ප්‍රමාණාත්මක ගාස්තුද සැළකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ 'පොළී ආදායම' යටතේ ක්‍රමක්ෂිත වූ ප්‍රමාණය ඇතුළත් කර ඇත. එවැනි ආයෝජනවල හානිකරණයන්ගෙන් උද්ගතවන අවාසි 'මූල්‍ය ආයෝජනවලින් ලැබෙන ශුද්ධ වාසිය/(අවාසිය)' යටතේ ආදායම් ප්‍රකාශනයේ අන්තර්ගතවෙයි. පරිණතය තෙක් තබාගන්නා මූල්‍ය ආයෝජන පරිණතවීමට පෙරාතුව (ඇතැම් විශේෂ අවස්ථාවන්හීදී හැර) එයින් සැළකිය යුතු කොටසක් විකිණීමට හෝ ප්‍රතිවර්ගීකරණය කිරීමට බැංකුව අදහස් කරන්නේ නම්, සමස්ත පන්තියම දෝෂසහිතවන අතර, ඒ අනුව ඒවා විකිණීම සඳහා තබාගන්නා ලෙස ප්‍රතිවර්ගීකරණය කළයුතු වන්නේය. තවද, එවැන්නක් සිදුවූයේ නම්, කිසිදු මූල්‍ය වත්කමක් පරිණතය තෙක් තබාගන්නා ලෙස වර්ගකිරීම ඉක්බිතිව එළඹෙන දෙවර්ෂය පුරාම බැංකුවට තහනම්වනු ඇත.

### 4.2.8 ණය හා ලැබිය යුතුදෑ ලෙස වර්ග කරන ලද මූල්‍ය වත්කම්

පහත අයිතමයන් හැර, ක්‍රියාකාරී වෙළෙඳපොළක මිල නියම නොවූ, ස්ථාවර හෝ නිශ්චිතව නිගමනය කළ හැකි ගෙවීම් සහිත වන ව්‍යුත්පන්නයන් නොවන මූල්‍යමය වත්කම්, ණය හා ලැබිය යුතුදෑ ලෙස වර්ග කරන ලද මූල්‍ය වත්කම්වලට අන්තර්ගතවේ.

- වහාම හෝ සමීප කාලයකදී බැංකුව විසින් විකිණීමට අදහස් කරන ඒවා සහ මූලික හඳුනාගැනීම මත ලාභ හෝ අලාභය මගින් සාධාරණ අගය ලෙස නම් කරනලද ඒවා
- බැංකුව මූලික හඳුනාගැනීම මත විකිණීම සඳහා පවතින ලෙස නම් කරනලද ඒවා
- ණය පිරිහීමක් නිසා හැරෙන්නට බැංකුවට සැළකිය යුතු ප්‍රමාණයක් හෝ මුළුමනින්ම අයකර ගැනීමට නොහැකිවන මූලික ආයෝජනය

මූලික මිනුම්කරණයෙන් පසු බැංකුවලින් හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතුදෑ යටතේ පවත්නා ප්‍රමාණයන්, හානිකරණ දීමනා අඩුකරන ලද සඵල පොළී අනුපාතය (EIR) භාවිතා කරමින්, ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කර ගැනීම මත ඕනෑම වට්ටමක් හෝ අතිරික්තයක් සහ සඵල පොළී අනුපාතිකයේ සංකලිත කොටසක්වන ගාස්තු හා පිරිවැයද සැළකිල්ලට ගනු ලැබීමෙනි. ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම් යටතේ ක්‍රමක්ෂය ඇතුළත්වේ. හානිකරණයෙන් උද්ගතවන අලාභ, ආදායම් ප්‍රකාශයේ හානිකරණ පිරිවැය යටතේ ඉදිරිපත් කර ඇත.

### 4.2.9 මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය

ප්‍රතිවර්ගීකරණය සිදුවන දිනයේදී, ප්‍රතිවර්ගීකරණයන් සාධාරණ අගය මත වාර්තාගතකෙරෙන අතර, එය නව ක්‍රමක්ෂිත පිරිවැය බවට පත්වෙයි.

'විකිණීම සඳහා පවතින' ප්‍රවර්ගයේ ප්‍රතිවර්ගීකරණය කරනලද මූල්‍යමය වත්කමක් සඳහා, හිමිකම් තුළ හඳුනාගෙන ඇති, ඕනෑම පෙර ලද වාසිය හෝ අවාසිය එලදායී පොළී අනුපාතිකය භාවිතා කරමින්, ආයෝජනයේ ඉදිරියට පවත්නා කාලය මත ලාභය හෝ අලාභය හිලව් කෙරේ. නව ක්‍රමක්ෂිත කරනුලැබූ අගයත්, අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර ඇති ඕනෑම වෙනසක්ද සඵල පොළී අනුපාතය (EIR) යොදාගනිමින් වත්කමෙහි ඉතිරිව ඇති කාලය අනුව කපා හරිනු ලැබේ. වත්කම හානිකරණය වන බවට පසුකාලීනව නිගමනය කරනු ලබයිනම්, හිමිකම් තුළ වාර්තා වී ඇති ප්‍රමාණය ආදායම් ප්‍රකාශයට ප්‍රතිචක්‍රීය වෙයි.

ව්‍යුත්පන්න නොවන වෙළෙඳ වත්කමක් ණය හා ලැබිය යුතුදෑ යන නිර්වචනයට සමාන නම් සහ පැහැදිලි අනාගතයක් හෝ පරිණතභාවය දක්වා එම මූල්‍ය වත්කම රඳවාගැනීමට බැංකුවට අභිමතය හා හැකියාව තිබේනම්, වෙළෙඳාම සඳහා රඳවාගත් වර්ගයේ සිට 'ණය හා ලැබිය යුතු' වර්ගයට බැංකුව විසින් එම වෙළෙඳ වත්කම ප්‍රතිවර්ගීකරණය කරනු ඇත. මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කර ඇත්නම් සහ මුදල් ලැබීම් නැවත අයකර ගැනීමේ හැකියාව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව ඇස්තමේන්තුගත මුදල් ලැබීම් වැඩිකර ගනී නම්, ඇස්තමේන්තුව වෙනස්වූ දිනයේ සිට වැඩිවීමේ බලපෑම සඵල පොළී අනුපාතයට (EIR) ගැළපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ප්‍රතිවර්ගීකරණය කිරීම බැංකුවේ අභිමතය පරිදි තීරණයවන අතර, එය උපකරණයෙන් උපකරණයට යන පදනම මත නිගමනය වෙයි. මූලික හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ප්‍රවර්ගය ඔස්සේ බැංකුව ඕනෑම මූල්‍යමය උපකරණයක් සාධාරණ අගයට නැවත වර්ගීකරණය නොකරයි.

### 4.2.10 කාර්ය මණ්ඩල ණය සඳහා සංක්‍රමණික දින වෙනස

සියලු සේවක ණය ලබාදීම්, වෙළඳපොළ පොළී අනුපාතිකයට පහත අනුපාතිකයකින් ප්‍රදානය කෙරෙන අතර, ඒවා සාධාරණ අගය පදනම් කරගෙන හඳුනාගනු ලැබේ. සාධාරණ අගය හා මුදල් වියදම් කළ ප්‍රමාණය අතර වෙනස සංක්‍රමණික දින වෙනස ලෙස සළකනු ලබයි. එසේම සඵල පොළී අනුපාතය යොදාගෙන ණය මුදලේ ඉතිරි කාලය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සේවක වැය ලෙස ක්‍රමක්ෂය කෙරේ. මෙම ප්‍රමාණය පොළී ආදායමක් ලෙසද පෙන්වනු ලබන හෙයින් ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ ප්‍රතිඵලය ශූන්‍ය වේ.

### 4.2.11 වෙනත් මූල්‍ය වගකීම්

ලාභ අලාභ මගින් සාධාරණ අගය වශයෙන් නම් නොකළ, බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය උපකරණ වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ග කරනු ලබයි. එහිදී මුදල් වත්කම් අයිතිකරුට භාරදීමට හෝ මුදල්වල නිශ්චය කළ ප්‍රමාණය හුවමාරුවක් මගින් හැරුණු කොට බැඳීම් ඉෂ්ට කිරීමට හෝ තමන්ගේම ව්‍යාපාර වස්තුකොටස්වල නිශ්චිත සංඛ්‍යාවක් සඳහා වෙනත් මූල්‍යමය වත්කමක් හෝ භාරදීමට බැඳීමක් ඇතිව බැංකුව තුළ ගිවිසුම්ගත විධිවිධානයන්හි විෂයාර්ථ ප්‍රතිඵල ඇති කරයි.

වෙනත් මූල්‍ය වගකීම් ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ලද තැන්පත් බැංකුවෙන් ගෙවීමට ඇති ප්‍රමාණයන් බැංකුවලින් හා වෙනත් අයගෙන් ලබාගත් ණය හා ණයකරයන් ඇතුළත්වේ.

මූලික අගය කිරීමෙන් පසු වෙනත් මූල්‍ය වගකීම් සඵල පොළී අනුපාතිකය (EIR) යොදාගෙන පසුව සිදුවන ලෙසට ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබයි. සඵල පොළී අනුපාතිකයේ (EIR) සංකලිත කොටස්වන නිකුත් කිරීමේ වට්ටම් හෝ අතිරික්ත සහ පිරිවැය, ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කිරීමේදී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

## 4.3 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

### 4.3.1 මූල්‍ය වත්කම්

පහත සඳහන් තත්ත්වයන් යටතේ මූල්‍ය වත්කමක් (නැතහොත්, අදාළ වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම්වල එකතුවක කොටසක්) හඳුනාගැනීම ප්‍රතිවර්ත්‍ය කරනු ලැබේ:

- වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය අවසානවූවිට
- වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය බැංකුව අන් අයට පවරා තිබීම, නැතහොත් පැවරීමේ විධිවිධාන යටතේ, ලැබුණු මුදල් ප්‍රවාහයන් සැළකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයකට සම්පූර්ණයෙන්ම ගෙවීමට බැඳීමක් උපකල්පනය කර තිබීම. එසේත් නැතහොත්,
  - බැංකුව වත්කමෙහි සියලු අවදානම් හා ප්‍රතිලාභයන් නිත්‍ය ලෙස අන් අයට පවරා තිබීම.
  - බැංකුව වත්කමෙහි අවදානම් හා ප්‍රතිලාභයන්හි සැළකිය යුතු ප්‍රමාණයක් පවරා නැතිවිට හෝ තමන් වෙත රඳවාගෙන නොමැතිවිට වුවද, වත්කමෙහි පාලනය අන් අයට පවරා තිබීම.

### 4.3.2 මූල්‍ය වගකීම්

වගකීම යටතේ පවත්නා බැඳීම අත්හලවිට හෝ අවලංගු වූ විට හෝ අදාළ කාලය අවසානවුවිට මූල්‍ය වගකීම හඳුනාගනු නොලබයි.

එකම ණයගැනුම්කාර පුද්ගලයෙකු සතුව පවත්නා මූල්‍ය වගකීමක්, ප්‍රමාණවත්වු වෙනත් කොන්දේසි මත හෝ පවත්නා වගකීමක බොහෝ සෙයින් නවීකරණය කරනලද කොන්දේසි මත හෝ ආදේශ කරනු ලැබුකල්හී, එවැනි හුවමාරු කිරීමක් හෝ නවීකරණය කිරීමක් නිසා මුල් වගකීම හඳුනා නොගත් ලෙසටත්, නව වගකීමක් හඳුනාගත් ලෙසටත් සැළකේ. මුල් මූල්‍ය වගකීමෙහි ධාරණ අගය හා ගෙවීම් කළ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභාලාභය තුළ හඳුනා ගැනෙයි.

## 4.4 ප්‍රතිමිලදීගැනීම් හා ප්‍රතිවර්තිත ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම

විශේෂිත අනාගත දිනයකදී ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ, විකුණු සුරැකුම් හිමිකාරීත්වයක සියලු අවදානම් හා ප්‍රතිලාභයන් බැංකුව නිත්‍ය ලෙස රඳවා ගන්නාවිට, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් තුළින් හඳුනා නොගැනීම සිදු නොවේ. ලැබී ඇති හුවමාරුවන මුදල් ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් තුළ, වගකීමක් ලෙසින් එකරැස්වු පොලියද ඇතුළත් කරගනිමින් හා බැංකුවට ණයක් ලෙසින් ගණුදෙනුවේ ආර්ථික ප්‍රතිඵලය පිළිඹිබු කරමින්, එකී මුදල් ආපසු දීමට හුවමාරුවන වගකීමක් සමගවන වත්කමක් ලෙසින්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලබයි. විකුණුම් හා ප්‍රතිමිලදී ගැනීම් මිල අතර වෙනස පොළී වියදමක් ලෙස සැළකෙන අතර, එය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් ගිවිසුමෙහි ආයුකාලය සඳහා එකතු කෙරේ.

ප්‍රතිලෝම වශයෙන් නිශ්චිත අනාගත දිනකදී ගිවිසුම යටතේ නැවත විකිණීමට මිලදී ගත් සුරැකුම්පත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනු නොලැබේ. ණයට ගන්නා ලද සුරැකුම්පත් මත තබා ඇති මුදල් ඇප ඇතුළත් සහ බැංකුවට ණයක් ලෙස, ගනුදෙනුවේ ආර්ථික ප්‍රතිඵලය නිරූපණය කරනු ලබන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්වලට, උපචිත පොළීද ඇතුළුව ගෙවන ලද ප්‍රතිෂ්ඨාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කරනු ලැබේ. මිලදී ගැනුම් මිල සහ ප්‍රතිවිකුණුම් මිල අතර වෙනස ශුද්ධ පොළී ආදායම් ලෙස වාර්තා කරනු ලබන්නේ සඵලදායී පොළී අනුපාතිකය භාවිතා කරන ගිවිසුමේ ජීවකාලය තුළ උපචිත කිරීමෙනි.

## 4.5 සාධාරණ අගය නිගමනය කිරීම

වාර්තාකරණ දිනයේදී සක්‍රීය වෙළෙඳපොළෙහි වෙළඳාම් කරනු ලබන මූල්‍යමය උපකරණ සඳහා සාධාරණ අගය, ගනුදෙනුමය පිරිවැය සඳහා කිසිදු අඩු කිරීමක් නොමැතිව, වෙළෙඳපොළ අගය මත පදනම් වෙයි.

සක්‍රීය වෙළෙඳපොළෙහි වෙළඳාම් නොවන වෙනත් මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය, අනුයෝජන තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කිරීම මගින් නිගමනය කෙරේ. වට්ටම් මුදල් ප්‍රවාහ ක්‍රමය, වෙළෙඳපොළ නිරීක්ෂණය කළහැකි මිල ගණන් විද්‍යමානවන සමාන උපකරණ සමග සැසැඳීම් හා වෙනත් අදාළ තක්සේරු ක්‍රම ආදිය සාධාරණ අගය මැනීම සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රමවලට ඇතුළත්වේ.

වර්තමාන වෙළෙඳපොළ ගනුදෙනු හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ තොරතුරු නොමැති යම් යම් මූල්‍ය උපකරණ වාර්තාකර ඇත්තේ සාධාරණ අගය ශිල්ප ක්‍රමය භාවිතා කරමිනි. තක්සේරු ආකෘතියක් භාවිතා කරමින් නිශ්චය කරනලද ඒවායේ තක්සේරු අගය මිල ගණන් හෝ සත්‍ය වෙළෙඳපොළ ගනුදෙනු භාවිතා කරමින් බැංකුවේ හොඳම ඇස්තමේන්තු සහ වඩාත් යෝග්‍ය ආකෘතිමය උපකල්පනයන්ට එරෙහිව පරීක්ෂා කරනු ලැබේ.

මූල්‍යමය උපකරණවල සාධාරණ අගයන්ගේ විශ්ලේෂණයක් හා ඒවා අගය කළේ කෙසේදැයි පැහැදිලි කෙරෙන වැඩිදුර විස්තර අංක 50 සටහනෙහි දක්වා ඇත.

## 4.6 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍යමය වත්කම් සමූහයක් හානිකරණයවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂ්‍ය පවතින්නේදැයි බැංකුව සෑම වාර්තාකරණ දිනයකදී ඇගයීම් කරනු ලැබේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වේයැයි තීරණය කිරීමට වත්කම්වල මූලික හඳුනාගැනීමෙන් පසු පාඩුවිඳි අලාභ අවස්ථා සිදුවී ඇති සිදුවීම් එකක් හෝ ඊට වැඩි ගණනක ප්‍රතිඵලයක් සේ හානිකරණය පිළිබඳ විෂයානුබද්ධ සාක්ෂ්‍යක් සැපයෙන බව හා එසේම ඒ අලාභ සිදුවීම (හෝ සිදුවීම්) මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක් තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයන් කෙරෙහි තද බලපෑමක් තිබේනම්, එය විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි විටක හානිකරණයක් ඇතැයි නිගමනය කරනු ලැබේ.

හානිකරණ අලාභය ගණනය කිරීමේ සාක්ෂිවලට ඇතුළත් වන එනම්, ණයකරු හෝ ණයකරු සමූහය සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳිමින් සිටින්නේ යැයි පෙන්වීම, ඔවුන් බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට පිවිසෙනු ඇතැයි යන සම්භාවිතාවය පොළී හෝ මුල් මුදලේ ආපසු ගෙවීම් පැහැර හැරම හෝ අතපසු කිරීම යනාදී කරුණු ඇතුළත්වේ. එසේම එහි පැහැර හැරීම සමග සහ සම්බන්ධවන ආර්ථික තත්ත්වය හෝ හිඟ මුදල්වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ අනාගත මුදල් පාලනයන්හි මැනිය හැකි අඩුවීමක් ඇති බව නිරීක්ෂණය කළ දත්ත මගින් පෙන්වාදීම ආදියද එයට ඇතුළත්වේ.

### 4.6.1 ක්‍රමක්ෂිත පිරිවැයට තබාගන්නා මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයට තබාගන්නා මූල්‍ය වත්කම් (බැංකුවලින් සහ අනිකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය සහ අත්තිකාරම්) සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳව විෂයානුබද්ධ සාක්ෂි පවතින්නේදැයි පළමුව තනි තනිව තක්සේරුකරන අතර, තනි තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහිකව තක්සේරු කරනු ලැබේ. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් පිළිබඳව හානිකරණය සිදුවන බවට විෂයානුබද්ධ සාක්ෂි නැතැයි බැංකුව තීරණය කරනු ලබන්නේ නම්, සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක එය අන්තර්ගතකර සාමූහික ඇගයීමට භාජනය කරනු ලැබේ. හානිකරණය සම්බන්ධව තනි තනිව පරීක්ෂා කරනු ලැබූ වත්කම්වල යම් හානිකරණ අලාභයක් තිබේනම් හෝ එසේ සිදුවෙමින් තිබෙන බව හඳුනාගතහොත් ඒ වත්කම් හානිකරණය සම්බන්ධව සාමූහික තක්සේරුවට ඇතුළත් කරගනු නොලබයි.

හානිකරණ අලාභයක් සිදුවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි තිබේනම් වත්කමේ ධාරණ අගයත් තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයෙහි ප්‍රවර්තන වටිනාකමත් අතර වෙනස අලාභය ලෙස මිනුම්කරණය කරනු ලැබේ. (දැනට අත්විඳිනු නොලබන අනාගත අපේක්ෂිත ණය අලාභ බැහැර කොට) වත්කමෙහි ධාරණ අගය දීමනා ගිණුමක් භාවිතාකරමින් ඒ හරහා අඩුකරනු ලබන අතර, අලාභ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි. මූල්‍ය වත්කම්වලට හානිකරණ අරමුණු සඳහා අනාගත මුදල් ප්‍රවාහය වට්ටම් කිරීමට භාවිතා කළ පොළී අනුපාතය යොදා ගනිමින් බැංකුව විසින් ආදායම උපචිත කරනු ලබයි.

සියළු ඇප සුරක්ෂිතයන් උපලබ්ධි කරගෙන තිබෙනු හෝ බැංකුවට මාරුකරනු ලැබ ඇති අනාගත ප්‍රතිඅයවීම්වල යථාරූපී අපේක්ෂාවක් නොමැතිවිට ආශ්‍රිත දීමනා සමග ණය කපා හරිනු ලබන අතර, හානිකරණය හඳුනා ගැනීමට පසුව සිදුවන සිදුවීමක් නිසා තක්සේරු කළ හානිකරණයෙහි පාඩුව වසරකදී අඩුවන්නේ හෝ වැඩිවන්නේ නම් හෝ දීමනා ගිණුම ගැලපීම මගින් මුලින් හඳුනාගත් හානිකරණ පාඩුව වැඩි කරනු හෝ අඩු කරනු ලබයි. කපා හැරීමක් පසුව ආවරණය වන්නේ නම් එම අයවීම ආදායමක් ලෙස බැර කරනු ලබයි.

තක්සේරු කරන ලද අනාගත මුදල් ප්‍රවාහය හෝ ප්‍රවර්තන අගයන් මුල් වත්කමේ මුල් සඵල පොළී අනුපාතය මත වට්ටම් කරනු ලබයි. ණය මුදලට විචල්‍ය පොළී අනුපාතයක් තිබේනම්, ඕනෑම හානිකරණ අලාභයක් මැනීම සඳහා වට්ටම් අනුපාතය ප්‍රවර්තන ඵලදායී පොළී අනුපාතය වෙයි. සම පාර්ශවීය මූල්‍ය වත්කමක තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම ගණනය කිරීම පිළිඹිබු කරන්නේ අවුරා තැබීම විය හැකි වුවත් නැතත්, සම පාර්ශවීය වත්කම් ලබා ගැනීම හෝ විකිණීම සඳහා වැය අඩුකොට අහුරා තැබීමෙන් ප්‍රතිඵල ඇති කළ හැකි මුදල් ප්‍රවාහයන්ය.

හානිකරණයෙහි සාමූහික ගණනය කිරීමක අරමුණ සඳහා මූල්‍ය වත්කම් ණය අවදානම් ලක්ෂණවල පදනම මත මූල්‍ය වත්කම් කාණ්ඩගත කරනු ලබයි. එනම් වත්කම් ස්වභාවය, කර්මාන්ත අයිතියේ ස්වභාවය, කල්පසුවූ තත්ත්වයන් හා අනෙකුත් අදාළ සාධකයි.

හානිකරණය සඳහා සාමූහිකව ගණනය කළ මූල්‍ය වත්කම් සමූහයක් මත අනාගත මූල්‍ය ප්‍රවාහයන් තක්සේරු කරනු ලබන්නේ සමූහයේ තිබෙන ණය අවදානම් ගති ලක්ෂණවලට සමාන ගති ලක්ෂණ සමග වත්කම් වෙනුවෙන් අතීත අලාභ අත්දැකීම් පදනම මතයි. අතීත අලාභ අත්දැකීම් පදනමවී ඇති ප්‍රවර්ථන තත්ත්වයන්හි ප්‍රතිඵල පිළිඹිබු කිරීමට නිරීක්ෂණය කළ හැකි ප්‍රවර්තන දත්තවල පදනම මත ඓතිහාසික අලාභ අත්දැකීම සළකනු ලබන අතර, එසේම ප්‍රවර්තනයේ නොපවත්නා අතීත කාලපරිච්ඡේදයේ පැවති තත්ත්වයන්හි ප්‍රතිඵල ඉවත් කිරීමටද එසේ කරනු ලබයි.

අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කළ ක්‍රමවේදය හා උපකල්පනය නොකඩවා සමාලෝචනය කරන්නේ අලාභ ඇස්තමේන්තු හා සැබෑ අලාභ අත්දැකීම් අතර ඇති ඕනෑම වෙනසක් අඩුකිරීම සඳහායි.

#### 4.6.2 විකිණීම සඳහා තබාගන්නා මූල්‍ය වත්කම්

වාර්තාකරණ දිනට විකිණීම සඳහා තබාගන්නා මූල්‍ය වත්කම්වල හානිකරණයක් සිදුවීඇති බවට විෂයානුබද්ධ සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳ ඇගයීමක් බැංකුව විසින් කරනු ලැබේ.

'විකිණීම සඳහා තබාගන්නා ලෙස' වර්ගීකරණය කෙරෙන ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය ඒවායේ පිරිවැයට වඩා සැළකිය යුතු ප්‍රමාණයක් සහ කාලයක් තුළ පහළයමින් පවතින විට එවැන්නක් විෂයානුබද්ධ සාක්ෂියක්සේ සැළකේ. එවැනි හානිකරණය පිළිබඳව සාක්ෂියක් ඇති විටෙක ඒවායේ වර්තමාන සාධාරණ අගය සහ ඒවා අත්පත්කරගැනීමේ පිරිවැයෙන් මෙයට පෙර ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇති කිසියම් හානිකරණ අලාභයක් වේනම් එය අඩුකළ පසු ලැබෙන අගය ආයෝජනයෙන් ඉවත්කර ආදායම් ප්‍රකාශනයෙහි අලාභයක්සේ හඳුනාගනී. ස්කන්ධ ආයෝජනයක් සඳහාවූ හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශනයේ ප්‍රතිවර්ත්‍ය නොකරන අතර, හානිකරනයෙන් පසු සාධාරණ අගයෙහි ඇතිවන වැඩිවීම වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් කරනු ලැබේ.

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන මත හානිකරණ අලාභයන් පිළබඳ විස්තර සඳහා අංක 23 දරන සටහන බලන්න.

#### 4.6.3 ප්‍රතිකථිකාකරණයකළ ණය

හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප අත්පත් කරගැනීමට වඩා ණය ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තුවේ. මෙම ක්‍රියාවලියට දළ ගෙවීම් විධිවිධාන දීර්ඝ කිරීම හා නව අත්තිකාරම් කොන්දේසි ගිවිසුම ඇතුළත්වේ. කොන්දේසි පිළිබඳව නැවත එකඟත්වයකට එළඹීමෙන් පසු කොන්දේසි සංශෝධනයට පෙරාතුව පැවති මුල් සඵල පොළී අනුපාතිකය භාවිතාකර කිසියම් හානිකරණයක් වේනම් එය මිනුම්කරණය කෙරෙන අතර, තවදුරටත් එම ණය කල්පසුවූ ණයක් ලෙස සළකනු නොලැබේ. නැවත සළකා බැලූ ණය අනාගත ගෙවීම් ලැබෙතැයි විදහාපාන සියළු නිර්ණායකයන් සම්පූර්ණකර ඇත්ද යන්න පිළිබඳව කළමනාකරණය විසින් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. මෙම ණය මුල් සඵල පොළී අනුපාතිකය මත අඛණ්ඩව කේවල හා සාමූහික හානිකරණ ඇගයීමට යටත්වේ.

#### 4.6.4 ණය ඇප තක්සේරුව

හැකි සෑම අවස්ථාවකම මූල්‍ය වත්කම් මත අවදානම් අඩුකර ගැනීමට, බැංකුව ඇප භාවිතා කිරීමට බලාපොරොත්තුවේ. මුදල් සුරැකුම්පත්, ණයවර ලිපි, ඇප සහතික, දේපළ, ලැබිය යුතු ගිණුම්, තොග, වෙනත් මූල්‍ය නොවන වත්කම් සහ ණය වැඩි කිරීම වැනි විවිධ ආකෘතිවලින් ඇප ඉදිරිපත් කෙරේ.

#### 4.6.5 ප්‍රතිබුක්තියලැබූ ණය ඇප හෝ බැංකුවට දේපළ පවරා ඇතිවිට

ගෙවීම් පැහැර හැරී ගනුදෙනුකරුවන් වෙතින් ලද ඇප ආවරණය කිරීම මගින් අත්පත්කරගත් නිශ්චල දේපළ නැතහොත් ණය පියවීමට කොටසක් ලෙසින් බැංකුවට පවරා ඇති එවැනි දේපළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදී ඇති විධානයන් අනුව බැංකුවේ වත්කම්වල කොටසක් වශයෙන් හෝ ආයෝජන දේපළක් ලෙසින් ගිණුම්ගත කර නැත.

## 4.7 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව්කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරන්නේ, හඳුනාගත් වටිනාකම් හිලව් කිරීමට ප්‍රවර්තන ලෙස බලගැන්විය හැකි නීතිමය අයිතියක් ඇත්තේනම් පමණක් වනඅතර, ශුද්ධවූ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධිකර ගැනීමට හා සමගාමීව වගකීම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේය යන සාධක සියල්ලම සපුරාලන්නේ නම් පමණි. මෙය සාමාන්‍යයෙන් හිලව් කිරීමේදී අනුගමනය කරන සමස්ථ පදනමක් නොව එමනිසාම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනිකුත් සම්බන්ධිත වත්කම් හා බැරකම් දළ අගයට නිරූපණය කිරීමට අවස්ථාවක් ඇත.

## 4.8 කල්බදු

ගිවිසුමක් කල්බදු උපකරණයක් ලෙස හෝ එහි කල්බදු ඇතුළත්වී ඇති බව හෝ නිගමනය කිරීම ගිවිසුමේ අන්තර්ගතය මත රැඳී ඇති අතර, එම ගිවිසුම ඉෂ්ට සිද්ධකිරීම, නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතය මත යැපෙන්නේදැයි යන්න පිළිබඳව හා ගිවිසුම අනුව වත්කම භාවිතා කිරීමට අයිතියක් තිබේද යන්න පිළිබඳව තක්සේරුවක් අවශ්‍ය වෙයි.

#### 4.8.1 බැංකුව බදු ගැනුම්කරු ලෙස

**මෙහෙයුම් කල්බදු**

බැංකුවට කල්බදු අයිතමයේ හිමිකාරීත්වය හා බැඳුනු සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස නොපවරන බදු මෙහෙයුම් කල්බදු ලෙස සැළකේ. බදු කාලය තුළදී මෙහෙයුම් කල්බදු හා සම්බන්ධිත ගෙවීම් සරල මාර්ග ක්‍රමය පාදකව ආදායම් ප්‍රකාශනයෙහි වියදමක්සේ හඳුනාගනී. අසම්භව්‍ය බදු කුළී ඒවා දැරූ කාලච්ඡේදය තුළදීම වියදමක්සේ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

**මූල්‍ය කල්බදු**

කල්බදු අයිතමයේ හිමිකාරත්වය හා බැඳුනු සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන් පාහේ බැංකුවට හෝ සමූහයට මාරු කරන්නේ නම්, එවැනි අයිතමයක් මූල්‍ය කල්බද්දක් ලෙස සැළකෙන අතර, බදු දේපලේ සාධාරණ අගය හෝ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය යන අගයන්ගෙන් අඩු අගය කල්බද්ද

ආරම්භයේදීම ප්‍රාග්ධනනය කරනු ලැබේ. ඉතිරි වගකීම් ප්‍රමාණය මත ස්ථාවර පොළී අනුපාතිකයක් විභජනය කිරීමේ පරමාර්ථය සහිතව කල්බදු ගෙවීම මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීමෙහි අඩුවීමක් ලෙස බෙදාහැර හඳුනාගනු ලැබේ. කල්බදු වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලැබේ. සමූහය විසින් බදු කාලය අවසානයේදී වත්කමේ අයිතිය ලබාගන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් නොපවතින්නේ නම්, වත්කමෙහි බදු කාලය සහ වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලයක් තුළදී ක්ෂය කරනු ලැබේ.

#### 4.8.2 බැංකුව බදු දීමනාකාර ලෙස මූල්‍ය කල්බදු

නෛතික අයිතිය යන සාධකය හැර වත්කමේ අයිතිය හා බැඳුනු සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස ගනුදෙනුකරුවන්ට පවරා දෙන ලබන කල්බදු මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ලැබිය යුතු කල්බදු වාරික හානිකරණයන් සඳහා ප්‍රතිපාදනය කළ පසු ලැබෙන ශුද්ධ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි නිරූපණය කරනු ලැබේ.

### 4.9 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් හා කෙටිකාලීන අරමුදල්වලට අන්තර්ගත වන්නේ අතැති මුදල්, බැංකු සමග ඇති ශේෂ, බැංකු සමග ස්ථාපනයන්, ඒක්ෂණ මුදල්, කෙටි දැනුම් දීමෙන් ලැබෙන මුදල් ආදයයි. මෙම මුදල් හා කෙටිකාලීන අරමුදල් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයට අදාළ අංක 16 සටහනෙහි දැක්වේ.

### 4.10 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ, සමුච්චිත ක්ෂයවීම හා වටිනාකමෙහි හානිකරණයන් අඩුකොට දෛනිකව සේවා වියදම් බැහැර කරමින් ඒවායේ පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන අගයට වාර්තාකරණ කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසින් සළකන ලද හා අදාළ ලෙසින් අවප්‍රමාණය කළ හා ක්‍රමය වෙනස් කරමින් අපේක්ෂා කරන ඵලදායී ජීවකාලයෙහි වෙනස් කිරීම් සැළකීමට ගනිමින් ගිණුම්ගත කිරීම සිදු කරයි.

**පිරිවැය ආකෘතිය**

දේපල, පිරියත හා උපකරණ දෛනික සේවා පිරිවැය හැර අනෙක් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකළ පසු අගයට මෙම ක්‍රමයේදී වාර්තාකරණය කෙරේ. මෙම පිරිවැයට හඳුනාගැනීමේ නිර්ණායකයන් සම්පූර්ණ කෙරෙන්නේ නම්, ප්‍රතිෂ්ඨාපන පිරිවැයද ඒවා දරන අවස්ථාවේදී අන්තර්ගත කෙරේ.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

බැංකුව, සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි වල සමස්ත වර්ගයන් සඳහාම ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරයි. ප්‍රත්‍යාගණනය කළ දිනට ඒවායේ සාධාරණ අගය නිරූපණය කරන ප්‍රත්‍යාගණන අගයෙන් පසුකාලීන සමුච්චිත ක්ෂය හා හානිකරණ අලාභයකවේනම් සමුච්චිත හානිකරණ අලාභය අඩුකළ පසු අගයට නිරූපණය කෙරේ.

වත්කම්වල ධාරණ අගය ඒවායේ සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වීම වැලැක්වීම සඳහා සෑම වර්ෂ 7කට වරක් ප්‍රත්‍යාගණන ක්‍රියාදාමය ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රත්‍යාගණන අතිරික්තයකින් මීට පෙර වත්කම් ප්‍රත්‍යාගණනයකින්ලද ලාභ අලාභ ගිණුමෙහි අලාභයක්සේ හඳුනාගන්නා ලද සංඛ්‍යාවක් ප්‍රතිවර්තය කරන්නේ නම්, එම ප්‍රමාණය හැර ඉතිරි ප්‍රත්‍යාගණන අතිරික්තය එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හිමිකම් කොටසෙහි ඇතුළත් කරනු ඇත. පෙර වර්ෂයක නිශ්චිත එම වත්කමම ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලැබී ඇති අතිරික්තයකට හිලව් කිරීමක් නොවන්නේ නම් ප්‍රත්‍යාගණනයෙන් ලද ඌනතාවය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**පසුකාලීන පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල යම් අයිතමයක කොටසක් අලුත් කිරීමට යන වියදම අයිතමෙහි ධාරිත වටිනාකම තුළ හඳුනාගනු ලබයි. එය වියහැකි නම් එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලායනු ඇත. එසේම එහි අගය විශ්වාස ලෙස මැනිය හැකිය.

**ප්‍රතිසංස්කරණ පිරිවැය**

අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ නඩත්තුකිරීම හෝ පිළිසකර කිරීම, දේපල, පිරියත හා උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම මත දරන වියදම්, පාඩුවිදීම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කෙරේ.

**ප්‍රාග්ධන නොනිමි වැඩ**

මේවා ගොඩනැගිලි, ප්‍රධාන කම්හල් හා යන්ත්‍රෝපකරණ නිර්මාණය කිරීම හා පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනකරණ අපේක්ෂා යන අංශ තුළ සෘජු වියදම් වන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්ය. මේවා වැය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන්වේ.

**ක්ෂයවීම්**

ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළදී දේපල හා යන්ත්‍ර සූත්‍රවල අගය ඒවායේ අවශේෂ වටිනාකමට සමාන වන පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමට හැකිවන පරිදි ක්ෂය ගණනය කරනු ලැබේ. මූල්‍ය කල්බදු පදනම යටතේ ලබාගත් වත්කම් උපරිමය අවුරුදු 50කට

යටත්ව, ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ බදුකාලය යන කාලයන් දෙකෙන් අඩු කාලය තුළදී ක්ෂය කරනු ලැබේ. සින්නකර දේපළ සඳහා ක්ෂය කරනු ලැබේ. ඇස්තමේන්තුගත කරන ලද ඵලදායී ජීවකාලය පහත දැක්වේ:

| වත්කමේ වර්ගය | ක්ෂයවීමේ කාලය |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලය මත |
| බදුකර ගොඩනැගිලි | උපරිමය අවුරුදු 50කට යටත්ව බදු කාලය හෝ වත්කමේ ජීවිත කාලය යන දෙකෙන් අඩු අගය |
| ගෘහභාණ්ඩ, උපකරණ හා යන්ත්‍ර සූත්‍ර | වාර්ෂිකව 20% බැගින් |
| සින්නක්කර සහ බදුකර මෝටර් රථ | වාර්ෂිකව 25% බැගින් |
| පෙරගෙවූ කල්බදු | බදු කාලච්ඡේදය තුළ |

**අගයන් හඳුනා නොගැනීම**

විකිණීමෙන් සහ දේපළ හා උපකරණ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන අවස්ථාවක ඒවා හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවකදී සිදුවන ලාභ හෝ අලාභ (වත්කමේ වටිනාකම ලෙස ධාරණයවන ප්‍රමාණය සහ ඒවා විකිණීමෙන් ලත් ශුද්ධ ආදායම අතර ගණනය කරන ලද වෙනස) එකී වත්කම මුළුමනින්ම නොසලකා හරිනලද වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුළ ඇතුළත්කරනු ලැබේ.

## 4.11 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු, කුලී ආදායම් උපයාගැනීමට හෝ ප්‍රාග්ධන ඇගයීම හෝ ඒ දෙකම පරමාර්ථයෙන් රඳවාගනු ලබන්නාවූ නමුත්, සාමාන්‍ය ව්‍යාපාරකරණයේදී භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හා අලෙවිය හෝ පරිපාලන අරමුණු හෝ සඳහා විකිණීමට භාවිතා නොකෙරෙන දේපළය.

**හඳුනාගැනීමේ පදනම**

ආයෝජන දේපල හා බැඳුනු, අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමේ හව්‍යතාවයක් පවතින්නේ නම් හා ආයෝජන දේපලවල පිරිවැය විශ්වසනීය ලෙස මැනියහැකි වනවිට ඒවා ආයෝජන දේපල සේ හඳුනාගැනේ.

**මිණුම්කරණය**

ආයෝජන දේපලක් එහි පිරිවැය අනුව මූලික වශයෙන් මනිනු ලැබේ. මිලදී ගනුලැබූ ආයෝජන දේපලක පිරිවැය තුළ, එහි මිලදී ගන්නා මිල හා ඕනෑම සෘජු ආරෝපණය කළ හැකි වියදමක් අඩංගුවෙයි. ස්වයංනිර්මාණිත ආයෝජන දේපලක පිරිවැය නම්, එහි නිර්මාණයට හෝ එය සංවර්ධනයට ඒවා නිමකරන තෙක් දරන ලද පිරිවැය ඇතුළත්වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 40 (LKAS 40) හි 'ආයෝජන දේපල' යන ප්‍රමිතියට අනුකූලව සමූහය විසින් ආයෝජන දේපල සඳහා පිරිවැය ආකෘතිය යොදා ගනු ලබයි. ඒ අනුව ආයෝජන දේපල ලෙසට වර්ගකළ ඉඩම්, ඕනෑම සමුච්චිත හානිකරණ අලාභයක් අඩුකොට ලැබෙන අගය අනුව අගයකර ඇති අතර, ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කර ඇති ගොඩනැගිලි නිරූපණය කර ඇත්තේ ඒවායේ මිලෙන් සමුච්චිත ක්ෂයවීම් හා සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකරනු ලැබූ පසුවය.

## 4.12 අස්පෘශ්‍ය වත්කම්

**හඳුනාගැනීමේ පදනම**

බැංකුවේ වෙනත් අස්පෘශ්‍ය වත්කම් ලෙස පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් කෙරේ. අස්පෘශ්‍ය වටිනාකම් හඳුනාගනු ලබන්නේ විශ්වසනීය ලෙස එහි මිල මැනිය හැකිවිට හා එයට ආරෝපණය කළහැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලාඒමේ හව්‍යතාවයක් ඇත්නම් පමණි.

**මැනීම**

වෙන් වශයෙන් අත්පත්කරගත් අස්පෘශ්‍ය වත්කම්, මූලිකව හඳුනාගැනීම මුල් පිරිවැයට කරනු ලැබේ. ව්‍යාපාරික සංයෝජනයකදී, අත්පත්කරගත් අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය, එසේ අත්පත්කරගත් දින පවත්නා ඒවායේ සාධාරණ අගයයි. මූලික හඳුනාගැනීම්වලින් පසුව, කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් හා කිසියම් සමුච්චිත හානිකරණ අලාභයක් තිබේනම් ඒවා අඩුකොට ඉදිරියට ගෙනයනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ආයුකාලය සීමිත හෝ අසීමිත ලෙසට තක්සේරුකර ඇත. සීමිත ආයුකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්, ඵලදායී ආර්ථික ආයුකාලයක් මත ක්‍රමක්ෂයකර ඇත. අසීමිත ආයුකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්, ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය හා කාලය අවම වශයෙන් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලබයි. එම අපේක්ෂිත ආයුකාලයෙහි වෙනස්වීම නැතහොත් වත්කමෙහි අන්තර්ගතවූ අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව අදාළවන පරිදි ක්‍රමක්ෂය කිරීම, කාලයෙහි හා ක්‍රමයෙහි වෙනස්වීම මගින් හේතු දක්වනු ලබන අතර, ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුතුළ වෙනස්වීම් ලෙස සැළකිල්ලට ගනු ලැබේ. පරිමිත ආයුකාලය සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම එම වත්කම්වල ක්‍රියාකාරීත්වය සමග සමානුයෝගී ලෙසින් ආදායම් ප්‍රකාශනයෙහි වියදම් ප්‍රවර්ගයෙහි හඳුනාගනු ලබයි.

අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත කළ ඵලදායී ආයුකාලයන් මත, ඒවායේ අවශේෂ වටිනාකම්වලට අනුකූලව එම වත්කම්වල සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් පහත දැක්වෙනසේ ක්ෂයකිරීම් ගණනය කෙරේ:

| අස්පෘශ්‍ය වත්කම්වල වර්ගය | ඵලදායී ආයුකාලය | ක්ෂයකිරීමේ ක්‍රමය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය සම්බන්ධ ප්‍රාග්ධන අයිතම | වසර 05 | සරල රේඛීය ක්‍රමය |

### 4.13 මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

**හඳුනාගැනීමේ පදනම**

ඕනෑම වත්කමක් හානිකරණයවී ඇත්ද යන්න පිළිඹිබුවන සංඥාවක් තිබෙන්නේදැයි යනබව දැනගැනීමට, බැංකුව සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම් තක්සේරුවක් සිදුකරයි. එවැනි යම් හැඟවීමක් තිබෙන්නේයැයි පෙනීයන්නේනම්, නැතහොත්, වත්කම සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණය අවශ්‍යවන්නේනම්, බැංකුව වත්කමේ නැවත අයකරගතහැකි වටිනාකම තක්සේරුකරයි. වත්කමක නැවත අයකර ගතහැකි අගය යනු, වත්කමේ හෝ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන වියදම අඩුකළ පසු ලැබෙන අගය හෝ එහි ප්‍රයෝජ්‍ය අගය යන අගයන් දෙකෙන් වැඩි අගයයි. වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, එම වත්කම හානිකරණයවී ඇතිබව සළකන අතර, එහි අගය නැවත අයකරගත හැකි අගය තෙක් ලියා හැරේ. වත්කමක ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීමේදී එම වත්කම තුළින් ජනනය විය හැකි අනාගත මුදල් ප්‍රවාහයන් බදුපෙර වට්ටම් අනුපාතිකයක් භාවිතා කරමින් වට්ටම් කරන අතර, එමගින් එම වත්කම හා බැඳුනු නිශ්චිත අවදානම් සහ මුදලේ කාල අගය පිළිබඳව වර්තමාන වෙළෙඳපොළ තක්සේරුවට සමාන අගයක් නිරූපණය කිරීම තහවුරු කෙරේ. සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන වියදම අඩු කළ පසු අගයෙන් ගණනය කරන්නේ ඒ සඳහා යෝග්‍ය ඇගයීමේ ආකෘති භාවිතා කරමිනි. මෙම ගණනය කරනු ලැබීමේ තක්සේරු ගුණිතයන් පොදු වෙළෙඳ පාලිත සමාගම් සඳහා වූ මිල කළ කොටස් මිල ගණන් හෝ වෙනත් පවත්නා සාධාරණ මිල දර්ශකයන් මගින් සනාථ කරනු ලැබේ.

**මිණුම්කරණය**

පෙරදී හඳුනාගත් හානිකරණ අලාභය තවදුරටත් නොපවතින්නේද හෝ අඩුවී ඇත්ද යන්න පිළිබඳව කිසියම් සංඥාවක් සැපයෙන්නේද යන කරුණ සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම කීර්තිනාමය හැර අනෙක් වත්කම් පිළිබඳව ඇගයීමක් කොට පරීක්‍ෂා කරනු ලැබේ. එවැනි සංඥාවක් සපයන්නේනම් වත්කමේ හෝ මුදල් උත්පාදන ඒකකයේ නැවත අයකරගත හැකි අගය බැංකුව විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. පෙරදී හඳුනාගන්නා ලද හානිකරණ අලාභයන් ප්‍රතිවර්ත්‍ය කරනු ලබන්නේ, අවසාන වශයෙන් හානිකරණ අලාභයන් හඳුනාගත් අවස්ථාවේ සිට වත්කමේ නැවත අයකරගත හැකි අගය තීරණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන්ගේ වෙනසක් සිදුවී ඇත්නම් පමණි. මෙම ප්‍රතිවර්ත්‍ය කිරීම, වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි අගයට වඩා වැඩි නොවනසේ මෙන්ම පෙර වර්ෂවලදී හානිකරණ අලාභයන් හඳුනානොගන්නා ලද්දේ නම් වත්කමේ සමුච්චිත ක්‍ෂය අඩුකළ පසු ලැබෙන ශුද්ධ අගයට වඩා වත්කමේ අගය අඩු නොවන පරිදි වත්කමේ අගය නිරූපණය කරන ලෙස විය යුතුය. එවැනි ප්‍රතිවර්ත්‍ය කිරීම් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

කීර්තිනාමය අදාළ හානිකරණ අලාභයන් අනාගත කාල පරිච්ඡේදයේ දී ප්‍රතිවර්ත්‍ය නොකරනු ලැබේ.

කීර්තිනාමය පිළිබඳව හානිකර පරීක්‍ෂාව වාර්ෂික පදනමක් මත සිදුකරන නමුත් එහි ධාරණ අගය හානිකරණයවී ඇති බවට කිසියම් සිද්ධියක් වෙනස්වීමක් හෝ කරුණක් මගින් සංඥාණනය වන්නේ නම් එවැනි අවස්ථාවකදී කීර්තිනාමය නිරන්තර පදනම මත හානිකරණ පරීක්‍ෂාවට භාජනයවේ. හානිකරණ පරීක්‍ෂාව පරමාර්ථයෙන් ව්‍යාපාර සංයෝජනයකදී අත්පත්කරගන්නා කීර්තිනාමය යනු, අත්පත්කරගත් දිනයේදී බැංකුවේ මුදල් උත්පාදන ඒකක හෝ සමූහයේ මුදල් උත්පාදන ඒකකවලට විභජනය කරන ලද, සංයෝජනයේ ප්‍රතිඵල කරණකොටගෙන ජනනය වෙතැයි සළකන ආර්ථික ප්‍රතිලාභ අත්පත්කරගැනීමට භාජනයවන්නාගේ අනෙකුත් වත්කම්වලට හෝ බැරකම්වලට අනුපාතිකව ඇත්ද යන්න පිළිබඳව සැලකීමකින් තොරව කීර්තිනාම විභජනය කරනලද එක් එක් ඒකකයේ අවම මට්ටම නියෝජනය කිරීමට බැංකුව විසින් අභ්‍යන්තර කළමනාකරණ පරමාර්ථය සහිතව කීර්තිනාමය පාලනය කරනු ලබන අතර, එලෙස හඳුනාගන්නා ලද ඒකක SLFRS 8 හි අර්ථකතනය කරඇති 'මෙහෙයුම් ඛණ්ඩ' වලට වඩා විශාල ඒවා නොවේ.

කීර්තිනාමය මුදල් උත්පාදන ඒකකයක් (හෝ ඒකක සමූහයක්) ලෙස සැකසෙන අතර, එය ඒකකය තුළ මෙහෙයුම් කොටසක් බවට පත්වේ. මෙහෙයුම් කටයුතු සමඟ හවුල්වන කීර්තිනාමය මෙහෙයුම් ධාරිත ප්‍රමාණයතුළ අන්තර්ගතවෙයි. එය සිදුවන්නේ මෙහෙයුම් කළමනාකරණය මත ලාභය හෝ අලාභය නිගමනය කිරීමේදීය. මෙම අවස්ථාවේ කීර්තිනාමය ක්‍රියාත්මකවීම මගිනු ලබන්නේ ක්‍රියාවට නැගුණු මෙහෙයුමේ යෙදුණු මුදල් උත්පාදන ඒකකවල කොටසේ සාපේක්‍ෂ වටිනාකම මතයි.

පාලිත සමාගම් විකුණනවිට විකුණන මිලත් ශුද්ධ වත්කම් අතරත් වෙනස උපචිත පරිවර්තන වෙනස්කම් වැඩිකරන අතර, කීර්තිනාමය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගැනේ.

### 4.14 මූල්‍ය ඇප සහතික

**හඳුනාගැනීමේ පදනම**

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ දී ණයවර, ඇප සහතික සහ ප්‍රතිග්‍රහණය හා අදාළ ලිපිවලින් සමන්විත මූල්‍ය ඇප සහතික බැංකුව විසින් දෙනු ලබයි. මූල්‍ය ඇප සහතික ආරම්භයේදී ලද ආධික්‍යයන් ලෙස සාධාරණ අගය මත මූල්‍ය ප්‍රකාශනවල (අනෙකුත් වගකීම් ඇතුළත) හඳුනාගනු ලබයි. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, සෑම ඇප සහතිකයක්ම යටතේ බැංකුවේ වගකීමෙන්, ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්‍ෂය කිරීම අඩුකර, ආරම්භයේදී හඳුනාගත් අගය සහ ඇප සහතිකවල ප්‍රතිඵලයක් වශයෙන් පවත්නා මූල්‍ය වගකීම් නිසා, ගෙවීමට අවශ්‍ය වන වියදම්වල ප්‍රශස්ත ඇස්තමේන්තු අගයන් යන දෙකෙන් වඩා වැඩි වටිනාකම මත අගය කෙරේ.

**මිණුම්කරණය**

මූල්‍ය ඇප සහතික හා සම්බන්ධ වගකීම්වල වැඩිවීම, ණය අලාභ වියදම් යටතේ ආදායම් ප්‍රකාශනය තුළ වාර්තාකරනු ලැබේ. ලැබී ඇති ආධික්‍යයන්, ඇප සහතිකයේ ජීවකාලය මත සරල මාර්ග ක්‍රමයට ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනයතුළ හඳුනාගනු ලබයි.

## 4.15 විශ්‍රාම ප්‍රතිලාභ

### 4.15.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම

| මධ්‍යම | මහනුවර | 500,000 | 898,223 |
| | මාතලේ | – | – |
| | නුවර එළිය | 398,223 | – |
| නැගෙනහිර | අම්පාර | 1,800,000 | 2,150,000 |
| | මඩකලපුව | 350,000 | – |
| | ත්‍රිකුණාමලය | – | – |
| උතුරු මැද | අනුරාධපුරය | 850,000 | 850,000 |
| | පොළොන්නරුව | – | – |
| උතුර | යාපනය | – | – |
| | වන්නි | – | – |
| දකුණ | ගාල්ල | 17,850,000 | 97,805,000 |
| | හම්බන්තොට | 77,300,000 | – |
| | මාතර | 2,655,000 | – |
| ඌව | බදුල්ල | 11,700,000 | 11,700,000 |
| | මොණරාගල | – | – |
| වයඹ | කුරුණෑගල | 14,728,030 | 47,570,030 |
| | පුත්තලම | 32,842,000 | – |
| සබරගමුව | කෑගල්ල | 9,304,722 | 9,304,722 |
| බටහිර කලාප II | බස්නාහිර II | 42,142,001 | 43,342,001 |
| | කළුතර | 1,200,000 | – |
| | රත්නපුර | – | – |
| විශේෂ වත්කම් ඒකකය/ආයතනික බැංකු අංශය | | 7,311,656,790 | 7,311,656,790 |
| **එකතුව** | | | 8,454,929,151 |

### 44.4 වෙනත් ප්‍රාග්ධන බැඳීම්

පාරිභෝගිකයින්ට ණය ලබාදීම සඳහා වගකීම් දරන, සමූහයේ ශේෂ පත්‍රයෙන් බැහැර මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත ප්‍රමාණයන් පහත දක්වා ඇත:

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| අනුමත කරනලද හා ගිවිසුම්ගත වූ | 773,563 | 264,180 | 1,488,040 | 264,180 |
| අනුමත කරනලද එහෙත් ගිවිසුම්ගත නොවූ | 915,943 | 543,170 | 915,943 | 543,170 |
| | 1,689,506 | 807,350 | 2,403,983 | 807,350 |

## 45. බදු පෙර ලාභය තුළ අන්තර්ගත මුදල් නොවන අයිතමයන්

| | | | | |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | 763,487 | 510,590 | 999,043 | 783,718 |
| බදු දේපල ක්‍රමක්ෂය | 40,739 | 102,626 | 47,535 | 111,890 |
| කලින් ගෙවූ බදු කුළී ක්‍රමක්ෂය | 29,034 | 33,358 | 29,034 | 33,358 |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 38,609 | 56,455 | 57,339 | 73,596 |
| ආයෝජන දේපළ ක්ෂයවීම | 1,754 | 9,071 | 1,754 | 9,071 |
| ණය හා අත්තිකාරම්මත හානිකරණ අලාභ | 13,650,788 | 2,742,305 | 13,922,095 | 3,585,236 |
| වෙනත් හානිකරණයන් | 65,532 | – | 900,332 | – |
| ස්ථාවර තැන්පතු විකිණීමෙන්ලත් ලාභය | (28,812) | (22,565) | (29,377) | (80,878) |
| | 14,561,131 | 3,431,840 | 15,927,755 | 4,515,991 |

## 46. මෙහෙයුම් වත්කම්වල වෙනස්කම්

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල වෙනස්කම් | (32,600) | – | (32,596) | – |
| වෙළෙඳාම් සඳහා රඳවාගෙන ඇති ණය සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ශුද්ධ වැඩිවීම | (44,976,147) | 5,143,928 | (45,054,954) | 5,007,667 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්නා ශේෂයෙහි ශුද්ධ වැඩිවීම | 3,041,156 | (394,408) | 3,041,156 | (394,408) |
| බැංකුවල පවතින තැන්පතුවල ශුද්ධ වැඩිවීම | 10,790,037 | (3,748,532) | 10,790,037 | (3,748,532) |
| ණය සහ ලැබිය යුතුදෑ - බැංකු ශුද්ධ වැඩිවීම | (46,874,991) | (3,339,657) | (46,989,304) | (3,339,657) |
| ණය සහ ලැබිය යුතුදෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් ශුද්ධ වැඩිවීම | (12,484,249) | (143,465,972) | (33,159,748) | (158,834,289) |
| විකිණීම සඳහා පවත්නා මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 27,531,768 | (27,531,767) | 26,112,973 | (27,485,305) |
| වෙනත් වත්කම්වල වෙනස්කම් | (9,873,878) | 192,003 | 1,074,593 | 504,794 |
| | (72,878,904) | (173,144,405) | (84,217,843) | (188,289,730) |

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |

## 47. මෙහෙයුම් වගකීම්වල වෙනස්කම්

| | | | | |
|---|---|---|---|---|
| බැංකුවලට ගෙවියයුතු ප්‍රමාණයෙහි වෙනස්කම් | (12,330,696) | 50,522,643 | (32,000,862) | 52,603,790 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල වෙනස්කම් | 214,134 | – | 214,134 | – |
| බැංකුවල ගණුදෙනුකරුවන්ගේ තැන්පතුවල සහ නිකුත් කරනලද ණය සුරැකුම්වල වෙනස | 72,844,667 | 133,724,389 | 80,188,819 | 136,573,324 |
| වෙනත් ණයගැණුම්වල වෙනස | (20,670,972) | 20,237,823 | (1,862,081) | 20,759,777 |
| වෙනත් වගකීම්වල වෙනස | 4,056,160 | 171,265 | (442,992) | (8,049,845) |
| **එකතුව** | 44,113,293 | 204,656,120 | 46,097,018 | 217,986,736 |

## 48. ඛණ්ඩ වශයෙන් මූල්‍ය වාර්තාකරණය

| | බැංකුකරණය | | කල්බදු | | චාරිකා | | ඉවත්කිරීම | | සමූහය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පොලිය | 109,859,280 | 84,504,278 | 5,256,598 | 1,992,659 | – | – | (707,529) | (742,593) | 114,408,349 | 85,754,344 |
| විනිමය | 1,418,430 | 2,126,109 | – | – | – | – | – | – | 1,418,430 | 2,126,109 |
| කල්බදු | – | 12,332 | 14,088,830 | 14,587,867 | – | – | (21,893) | (52,921) | 14,066,937 | 14,547,278 |
| කොටස් වෙළෙඳාම/ලාභාංශ | 146,325 | 31,135 | 14,465 | 40,392 | – | – | – | – | 160,790 | 71,527 |
| කොමිස් හා ගාස්තු | 3,478,015 | 3,541,589 | 348,511 | 262,999 | 33,638 | 27,071 | (115,219) | (298,437) | 3,744,945 | 3,533,222 |
| වෙනත් | 3,431,415 | 1,984,223 | 1,852,606 | 859,628 | 54 | 3,458 | (450,540) | (1,622,505) | 4,833,534 | 1,224,804 |
| බාහිර ගනුදෙනුකරුවන්ගෙන් මුළු ආදායම | 118,333,466 | 92,199,666 | 21,561,009 | 17,743,545 | 33,691 | 30,529 | (1,295,181) | (2,716,456) | 138,632,986 | 107,257,284 |
| අන්තර්ඛණ්ඩ ආදායම | 2,123,008 | 2,577,734 | 648,903 | 138,722 | 4,400 | – | (1,481,130) | – | 1,295,181 | 2,716,456 |
| විභජනය නොකළ ආදායම් | – | – | – | – | – | – | 28,442 | – | 28,442 | – |
| මුළු ආදායම | 120,456,473 | 94,777,400 | 22,209,913 | 17,882,267 | 38,091 | 30,529 | (2,747,869) | (2,716,456) | 139,956,608 | 109,973,740 |
| ඛණ්ඩ ප්‍රතිඵල | 10,304,282 | 15,249,382 | 4,734,536 | 4,102,631 | 9,618 | 9,104 | – | – | 15,048,436 | 19,361,117 |
| විභජනය නොකළ ආදායම් | – | – | – | – | – | – | – | – | (1,559,064) | (1,622,503) |
| ආශ්‍රිතයින්ගේ ආදායම් | – | – | – | – | – | – | – | – | (76,978) | (67,207) |
| ආදායම් බදු වියදම් | (2,816,395) | (4,355,390) | (1,429,153) | (1,418,547) | (2,662) | (779) | – | – | (4,248,210) | (5,774,716) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | – | – | – | – | – | – | – | – | 9,164,184 | 11,896,690 |
| පාලනයට යටත් නොවන හිමිකම් | – | – | – | – | – | – | – | – | (799,845) | (666,494) |
| බැංකුවේ ස්කන්ධහිමියන්ට අයත් ලාභය | – | – | – | – | – | – | – | – | 8,364,339 | 11,230,196 |
| වර්ෂය සඳහා ලාභය | – | – | – | – | – | – | – | – | 9,164,184 | 11,896,688 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | – | – | – | – | – | – | – | – | 5,203,799 | (96,357) |
| බදුවලින් පසු මුළු විස්තීර්ණ ආදායම් | – | – | – | – | – | – | – | – | 14,367,983 | 11,800,330 |
| පාලනයට යටත් නොවන හිමිකම් | – | – | – | – | – | – | – | – | (914,211) | (661,554) |
| බැංකුවේ ස්කන්ධහිමියන්ට අයත් ලාභය | – | – | – | – | – | – | – | – | 13,453,772 | 11,138,776 |
| ඛණ්ඩ වත්කම් | 930,377,706 | 873,023,229 | 114,011,339 | 96,119,835 | 69,549 | 46,654 | (13,264,132) | (11,304,988) | 1,031,194,463 | 960,550,091 |
| ආශ්‍රිතයන්හි ආයෝජන | 207,568 | 273,100 | 98,787 | 205,160 | – | – | (31,886) | (51,064) | 274,469 | 309,989 |
| මුළු වත්කම් | 930,585,274 | 873,296,329 | 114,110,126 | 96,324,995 | 69,549 | 46,654 | (13,296,018) | (11,356,052) | 1,031,468,934 | 960,860,080 |
| ඛණ්ඩ වගකීම් | 894,048,430 | 844,091,541 | 94,322,248 | 79,151,549 | 28,072 | 11,007 | (12,018,224) | (10,779,525) | 976,384,385 | 915,110,912 |
| මුළු හිමිකම් හා වගකීම් | 930,585,274 | 873,296,329 | 114,110,126 | 96,324,995 | 69,549 | 46,654 | (13,296,018) | (11,356,052) | 1,031,472,794 | 960,860,080 |

## 49. සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳව අනාවරණය කිරීම

### 49.1 බැංකුවේ ප්‍රධාන කළමනාකරණ තනතුරු දරණ පාර්ශව සමඟ ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ තනතුරු දරණ පාර්ශව අර්ථකථනය කරනු ලැබ ඇත්තේ, බැංකුවේ ක්‍රියාකාරකම් සැළසුම්කිරීම, මෙහෙයවීම හා පාලනය සඳහා බලය හා වගකීම සහිත පුද්ගලයින් වශයෙනි. බැංකුවේ සභාපතිවරයා, විධායක හා විධායක නොවන අධ්‍යක්‍ෂවරු, ප්‍රධාන විධායක නිළධාරී/සාමාන්‍යාධිකාරී සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින් එකී ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන අයට අයත් වෙති.

| | 2013<br>රු. '000 | 2012<br>රු. '000 |
|---|---|---|
| **49.1.1 බැංකුවේ ප්‍රධාන කළමනාකරණ තනතුරු දරණ පාර්ශවයන්ට කළ ගෙවීම්** | | |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 16,270 | 17,470 |
| පශ්චාත් සේවා විශ්‍රාම | – | – |
| සේවා අවසාන කිරීමේ ප්‍රතිලාභ | – | – |
| කොටස් පාදක ගෙවීම් | – | – |

**49.1.2 ප්‍රධාන කළමනාකරණ තනතුරු දරණ පාර්ශව සමඟ ගනුදෙනු**

වර්ෂය තුළ බැංකුවේ ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන පාර්ශව සමඟ කරන ලද ගනුදෙනුවලට අදාළ, ගෙවා අවසාන නොමැති ශේෂයන් හා ඊට අනුරූප පොළී ආදායම් පහත වේ:

| | වර්ෂ අවසානයේ ශේෂය | | වර්ෂය තුළ ආදායම | |
|---|---|---|---|---|
| | 2013<br>රු. '000 | 2012<br>රු. '000 | 2013<br>රු. '000 | 2012<br>රු. '000 |
| නිවාස දේපළ උකස්කිරීම් | – | – | – | – |
| ක්‍රෙඩිට් කාඩ්පත් | 319 | 441 | 1 | 5 |
| ඇපකර | – | – | – | – |

## 49.2 පරිපාලිත සමාගම් සමඟ ගණුදෙනු

වර්ෂය තුලදී පරිපාලිත සමාගම් විසින් පියවියයුතු ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ණය පහසුකම් හා තැන්පතු ශේෂයන් මෙන්ම, අදාළ පොලියද පහත දැක්වෙන වගුවල දැක්වේ:

| | වර්ෂ අවසානයේ ශේෂය | | වර්ෂය තුළ ආදායම | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී** | | | | |
| ආයෝජන - සාමාන්‍ය කොටස් | 690,958 | 498,484 | 1,480,333 | 1,464,016 |
| - වරණීය කොටස් | 550,000 | 750,000 | 127,500 | 157,250 |
| ණය සහ අත්තිකාරම් | 1,914,380 | 6,230,062 | 581,282 | 670,542 |
| තැන්පතු | 6,271,733 | 136,429 | 104,234 | 44,350 |
| වෙනත් ලැබිය යුතුදෑ (ණය පොලිය, ගොඩනැගිලි බදුදීම් ආදිය) | 6,150 | 3,100 | – | – |
| වෙනත් ගෙවිය යුතුදෑ (නියෝජිත කොමිස්, කුළී රථ ධාවනය, බදු කුලිය ආදිය) | 149,144 | 252,055 | – | – |
| ගොඩනැගිලි කුළිය ලැබීම් | – | – | 20,475 | 18,600 |
| ගෙවනලද නියෝජිත කොමිස් | – | – | – | 744 |
| ගෙවනලද කල්බදු කුළී | – | – | 21,893 | 36,416 |
| **පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** | | | | |
| ආයෝජන - සාමාන්‍ය කොටස් | 4,950 | 4,950 | 1,238 | 1,238 |
| ණය සහ අත්තිකාරම් | – | – | – | – |
| ශේෂ පත්‍රයෙන් බැහැර පහසුකම් | 23,550 | 24,050 | 628 | 459 |
| තැන්පතු | 16,889 | 13,558 | 1,860 | 1,679 |

## 49.3 උප පරිපාලිත සමාගම් සමඟ ගනුදෙනු

වර්ෂය තුළදී උප පරිපාලිත සමාගම් විසින් පියවියයුතු ණය හා අත්තිකාරම් සහ වෙනත් ණය පහසුකම් හා තැන්පතු ශේෂයන් මෙන්ම, අදාළ පොළියද පහත වගුවල දැක්වේ:

| | වර්ෂ අවසානයේ ශේෂය | | වර්ෂය තුළ ආදායම්/වියදම් | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්** | | | | |
| තැන්පතු | 6,018 | 3,241 | – | 64 |
| ගෙවියයුතු කුළී | 10,511 | 11,528 | – | – |
| ගෙවනලද කුළී | – | – | 66,159 | 44,913 |
| **පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්** | | | | |
| තැන්පතු | 7,383 | 2,827 | – | 24 |
| වෙනත් ගෙවිය යුතුදෑ | 38,514 | 26,027 | – | – |
| ගෙවනලද වියදම් | – | – | 28,585 | 49,043 |
| **පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** | | | | |
| ණය සහ අත්තිකාරම් | 10,934 | – | – | – |
| තැන්පතු | 81,062 | – | 1,558 | – |
| රෙපෝ ආයෝජන | 208,100 | 262,207 | 15,277 | 31,093 |
| ලැබියයුතු හිමිකම් | 209,388 | – | – | – |
| වෙනත් ලැබියයුතු දෑ | 2,709 | 1,241 | – | – |
| ගෙවියයුතු රක්ෂණ වාරික | 190 | 571 | – | – |
| සේවා අයකිරීම් හා හිමිකම් ලැබීම් | – | – | 50,309 | 78,117 |
| ගෙවනලද රක්ෂණ වාරික | – | – | 265,175 | 247,143 |
| වෙනත් ආදායම් ලැබීම් | – | – | 5,964 | 6,077 |
| **පීපල්ස් ෆයිනෑන්ස් පීඑල්සී** | | | | |
| අයිරා | – | 169,664 | – | 1,988 |
| තැන්පතු | – | 58,560 | – | 1,855 |
| රෙපෝ ආයෝජන | – | 22,653 | – | 5,712 |
| **පීපල්ස් මයික්‍රෝෆයිනෑන්ස් ලිමිටඩ්** | | | | |
| තැන්පතු | – | 3,526 | – | 73 |
| **පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටි ලිමිටඩ්** | | | | |
| රෙපෝ ආයෝජන | 2,169 | 14,873 | 782 | 1,067 |

## 49.4 ආශ්‍රිත සාමගම් සමඟ ගනුදෙනු

වර්ෂය තුළදී ආශ්‍රිත සමාගම් විසින් පියවිය යුතු ණය හා අත්තිකාරම් සහ වෙනත් ණය පහසුකම් හා තැන්පතු ශේෂයන් මෙන්ම, අදාළ පොළියද පහත වගුවල දැක්වේ:

| | වර්ෂ අවසානයේ ශේෂය | | වර්ෂය තුළ ආදායම/වියදම | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී | | | | |
| ආයෝජන - සාමාන්‍ය කොටස් | 263,100 | 263,100 | – | – |
| - වරණීය කොටස් | 10,000 | 10,000 | – | – |
| ණය සහ අත්තිකාරම් | 56,550 | 314,579 | 23,016 | 39,987 |
| ශේෂ පත්‍රයෙන් බැහැර පහසුකම් | – | – | – | – |
| තැන්පතු | 397,538 | 131,918 | 3,328 | 14,761 |

## 49.5 ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය අයිතිය සහිත ව්‍යවසායකයන් සමඟ ගනුදෙනු

### 49.5.1 ශ්‍රී ලංකා රජයේ සහ රාජ්‍ය අයිතිය සහිත ව්‍යවසායකයන්ගේ ණය හා අත්තිකාරම්

| | 2013 | | | | 2012 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ශේෂය | | | | ශේෂය | | | |
| | අයිරාවන් | ණය හා අත්තිකාරම් | බිල්පත් | එකතුව | අයිරාවන් | ණය හා අත්තිකාරම් | බිල්පත් | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ශ්‍රී ලංකා රජය | 32,245,313 | 4,750,368 | 111,083 | 37,106,764 | 35,712,233 | 4,058,085 | 12,837 | 39,783,155 |
| පළාත් පාලන ආයතන | 32,703 | – | – | 32,703 | 15,384 | – | – | 15,384 |
| ප්‍රාදේශීය සභා | 166 | – | – | 166 | 166 | – | – | 166 |
| රාජ්‍ය සංස්ථා | 6,538,415 | 177,836,919 | – | 184,375,334 | 22,653,774 | 91,346,349 | 22,248,456 | 136,248,579 |
| **එකතුව** | 38,816,596 | 182,587,287 | 111,083 | 221,514,966 | 58,381,556 | 95,404,434 | 22,261,293 | 176,047,283 |

### 49.5.2 ශ්‍රී ලංකා රජයේ සහ රාජ්‍ය අයිතිය සහිත ව්‍යවසායකයන්ගේ තැන්පතු

| | 2013 | | | | 2012 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ශේෂය | | | | ශේෂය | | | |
| | ඉල්ලුම | ඉතුරුම් | කාලය | එකතුව | ඉල්ලුම | ඉතුරුම් | කාලය | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ශ්‍රී ලංකා රජය | 6,298,933 | 508,565 | 1,636,053 | 8,443,551 | 8,388,864 | 599,095 | 2,051,654 | 11,039,614 |
| පළාත් පාලන ආයතන | 1,167,764 | – | 462,808 | 1,630,572 | 1,214,892 | – | 501,378 | 1,716,270 |
| ප්‍රාදේශීය සභා | 1,281,878 | – | 1,130 | 1,283,008 | 891,389 | – | 1,504 | 892,893 |
| රාජ්‍ය සංස්ථා | 2,007,680 | 1,272,934 | 64,803,959 | 68,084,573 | 2,545,445 | 502,889 | 44,642,808 | 47,691,141 |
| **එකතුව** | 10,756,256 | 1,781,499 | 66,903,950 | 79,441,705 | 13,040,590 | 1,101,984 | 47,197,344 | 61,339,918 |

### 49.5.3 ශ්‍රී ලංකා රජයේ සහ රාජ්‍ය අයිතිය සහිත ව්‍යවසායකයන්ගේ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමයන්

| | 2013 | | | | 2012 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පිළිගැනීම | ලේඛනගත ණය | ඇපකර | එකතුව | පිළිගැනීම | ලේඛනගත ණය | ඇපකර | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ශ්‍රී ලංකා රජය | – | 2,761,792 | – | 2,761,792 | – | 3,113,279 | – | 3,113,279 |
| රාජ්‍ය සංස්ථා | 48,013,310 | 63,348,146 | 1,195,207 | 112,556,663 | 77,020,354 | 53,045,162 | 633,847 | 130,699,363 |
| **එකතුව** | 48,013,310 | 66,109,938 | 1,195,207 | 115,318,455 | 77,020,354 | 56,158,441 | 633,847 | 133,812,642 |

### 49.5.4 රාජ්‍ය විධානානුකූල ණය හා අත්තිකාරම්

| | වර්ෂ අවසානයේ ශේෂය | | වර්ෂය තුළ ආදායම් | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| ක්ෂුද්‍ර මූල්‍ය සහ සංවර්ධන ණය | 9,376,673 | 10,583,278 | 1,181,621 | 1,712,928 |
| රාජ්‍ය සේවකයින්ට පිරිනමනලද නිවාස ණය | 23,542,743 | 23,842,103 | 3,070,487 | 2,926,909 |
| **එකතුව** | 33,374,152 | 34,880,117 | 4,272,873 | 4,660,602 |

## 50. මූල්‍ය උපකරණවල සාධාරණ අගය

**සාධාරණ අගයමත වාර්තා කරනලද මූල්‍ය උපකරණ**

තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් භාවිතාකරමින් මූල්‍ය උපකරණ සාධාරණ අගය අනුව වාර්තා කිරීමේදී සාධාරණ අගය නිගමනය කරන ආකාරය පහත දක්වා ඇත. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ අගය කිරීමේදී වෙළෙඳපොළ කටයුතුවලට සහභාගිවන්නකු විසින් කරන උපකල්පනයන් පිළිබඳව බැංකුවේ තක්සේරු කිරීමද මෙහි අන්තර්ගතවෙයි.

**ව්‍යුත්පන්නයන්**

වෙළෙඳපොළ නිරීක්ෂණ සහිත යෙදවුම් සමග තක්සේරු ක්‍රමවේද භාවිතා කරමින් අගය කෙරෙන ව්‍යුත්පන්නයන් වන්නේ, මූලික වශයෙන්ම ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම් හා ඉදිරි විදේශ විනිමය ගිවිසුම්ය. ප්‍රධාන වශයෙන් භාවිතා කරනු ලබන තක්සේරු ක්‍රමවේදයන්ට වර්තමාන අගය පාදක ගණනය කිරීම් මත සිදුකෙරෙන ඉදිරි මිල නියමකිරීම් හා හුවමාරු ගිවිසුම් ආකෘතීන් ඇතුළත්වේ. ප්‍රතිපාර්ශවයන්ගේ ණය ගුණාත්වය, විදේශ විනිමය තත්කාලීන වෙළෙඳපොළ අනුපාතිකයන් හා ඉදිරි අනුපාතිකයන් ඇතුළු විවිධ යෙදවුම් මෙම ආකෘතීන් තුළ පවතී.

**විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජනයන් -**

තක්සේරු ක්‍රමවේද හෝ මිල කිරීම් ආකෘතීන් භාවිතා කරමින් තක්සේරු කරනු ලබන විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන් මූලික වශයෙන් මිල නියම නොකළ ස්කන්ධවලින් සමන්විතවෙයි. නිරීක්ෂණ දත්තයන් භාවිතා කරන ආකෘතීන් ප්‍රයෝජනයට ගනිමින් මෙම වත්කම් තක්සේරු කෙරේ. ආයෝජිතයාගේ අනාගත මූල්‍ය කාර්යසාධනය, අවදානම පිළිබඳ පැතිකඩ සහ ආර්ථික උපකල්පනයන් හා අදාළ කරුණු එම ආකෘතීන්හි නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලට අයත්වේ.

**වෙළඳාම් සඳහා තබාගන්නා වෙනත් මූල්‍ය වත්කම්**

හඳුනාගන්නා ලද එක් එක් වත්කමක් සඳහා සක්‍රිය වෙළෙඳපොළ තුළ පවතින නියම කළ (නොගලපන ලද) මිල භාවිතාකර වෙළඳාම් සඳහා තබාගන්නා වෙනත් මූල්‍ය වත්කම් තක්සේරු කරනු ලැබේ.

**සාධාරණ අගය නිර්ණය කිරීම හා සාධාරණ අගයේ ව්‍යුහය**

බැංකුව මූල්‍ය උපකරණවල සාධාරණ අගය තක්සේරු ක්‍රමවේද මගින් නිගමනය කිරීමට හා අනාවරණය කිරීමට බැංකුව පහත දැක්වෙන ධූරාවලියට අනුකූලව කටයුතු කරනු ලැබේ:

| | | |
|---|---|---|
| පළමු පෙළ | : | එක හා සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොළෙහි නියම කළ (නොගලපන ලද) මිල |
| දෙවන පෙළ | : | ඍජුව හෝ වක්‍රව, නිරීක්ෂණය කළහැකි වාර්තාකළ සාධාරණ අගයමත සැළකියයුතු බලපෑමක් සිදුකළහැකි සියලු යෙදවුම් සඳහා වෙනත් ක්‍රමවේදයන් |
| තෙවන පෙළ | : | නිරීක්ෂණය කළනොහැකි වෙළෙඳපොළ දත්තයන් පදනම්වන වාර්තා කළ සාධාරණ අගයමත සැළකියයුතු බලපෑමක් සිදුකළ හැකි යෙදවුම් භාවිතා කරන ක්‍රමවේදයන් |

සාධාරණ අගය පිළිබඳ ධූරාවලි මට්ටම් අනුව වාර්තා කරනලද මූල්‍ය උපකරණවල විග්‍රහයක් පහත දැක්වෙන වගුවෙන් දක්වා ඇත.

| 2013 දෙසැම්බර් 31 දිනට | පළමු පෙළ<br>රු. '000 | දෙවන පෙළ<br>රු. '000 | තෙවන පෙළ<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | | | |
| ඉදිරි විදේශ විනිමය ගිවිසුම් | – | 35,392 | – | 35,392 |
| වෙළඳාම සඳහා රඳවාගෙන ඇති වෙනත් මූල්‍ය වත්කම් | | | | |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර | – | 62,911,531 | – | 62,911,531 |
| මිල කළ ආයෝජන | 837,326 | – | – | 837,326 |
| විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන - | | | | |
| මිල නියම නොකළ ආයෝජන | – | – | 311,733 | 311,733 |
| | 837,326 | 62,946,923 | 311,733 | 64,095,982 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | | | |
| ඉදිරි විදේශ විනිමය ගිවිසුම් | – | 215,844 | – | 215,844 |

| 2012 දෙසැම්බර් 31 දිනට | පළමු පෙළ<br>රු. '000 | දෙවන පෙළ<br>රු. '000 | තෙවන පෙළ<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | | | |
| ඉදිරි විදේශ විනිමය ගිවිසුම් | – | 2,791 | – | 2,791 |
| වෙළඳාම සඳහා රඳවාගෙන ඇති වෙනත් මූල්‍ය වත්කම් | | | | |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර | – | 18,099,173 | – | 18,099,173 |
| මිල කළ ආයෝජන | 673,537 | – | – | 673,537 |
| විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන - | | | | |
| මිල නියම නොකළ ආයෝජන | – | – | 445,722 | 445,722 |
| | 673,537 | 18,101,964 | 445,722 | 19,221,223 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | | | |
| ඉදිරි විදේශ විනිමය ගිවිසුම් | – | 1,710 | – | 1,710 |

මූල්‍ය ප්‍රකාශනවල අගය ඉදිරිපත් කිරීමේදී සාධාරණ අගය භාවිතා නොකරනු ලබන මූල්‍ය උපකරණයන්, ඊට අදාළ පංතියට අනුව වර්ගීකරණය කරනලද සංසන්දනාත්මක විශ්ලේෂණයක් පහත දක්වා ඇත. මූල්‍ය නොවන වත්කම් හා මූල්‍ය නොවන වගකීම්වලට අදාළ සාධාරණ අගයන් මෙම වගුවෙහි අන්තර්ගත නොවේ.

| 2013 දෙසැම්බර් 31 දිනට | 2013 | 2012 | 2013 | 2012 |
|---|---|---|---|---|
| | ධාරණ අගය | සාධාරණ අගය | ධාරණ අගය | සාධාරණ අගය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 18,772,595 | 18,772,595 | 24,401,979 | 24,401,979 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවත්නා ශේෂයන් | 40,370,892 | 40,370,892 | 43,412,048 | 43,412,048 |
| බැංකුවල පවතින තැන්පතු | 2,551,215 | 2,551,215 | 13,341,252 | 13,341,252 |
| ණය හා ලැබිය යුතුදෑ | 82,225,089 | 82,225,089 | 35,350,098 | 35,350,098 |
| වෙනත් ගනුදෙනුකරුවන් සඳහා ණය හා ලැබිය යුතු දෑ | 619,829,735 | 620,069,711 | 611,414,268 | 610,729,551 |
| පරිණතිය තෙක් තබාගන්නා මූල්‍ය ආයෝජන | 75,784,287 | 75,709,750 | 78,522,570 | 76,615,352 |
| පරිපාලිතයන්හි ආයෝජන | 1,245,908 | 16,432,568 | 1,253,434 | 16,234,327 |
| ආශ්‍රිතයින්හි ආයෝජන | 207,568 | 207,568 | 273,100 | 274,600 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 81,794,017 | 81,794,017 | 94,124,713 | 94,124,713 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 762,248,529 | 762,614,291 | 683,950,837 | 684,106,858 |
| වෙනත් ණයගැනුම් | 20,353,986 | 20,353,986 | 41,024,958 | 41,024,958 |
| ණයකර | 15,032,542 | 15,032,542 | 10,000,000 | 9,907,647 |

## සාධාරණ අගය මත ගණුදෙනු නොවන මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය

මූල්‍ය ප්‍රකාශනයන්හී සාධාරණ අගය අනුව වාර්තාකර නොමැති මූල්‍ය උපකරණවල සාධාරණ අගය නිගමනය කිරීම සඳහා භාවිතා කෙරෙන ක්‍රමවේදයන් හා උපකල්පනයන් පහතින් විස්තර කර ඇත:

## සාධාරණ අගය ධාරණ අගයට ආසන්නතාවයක් දක්වන වත්කම්

කෙටිකාලීන කල්පිරීමක් සහිත (අවුරුද්දකට වඩා අඩු පළමු කල්පිරීමක් ඇති) මූල්‍ය වත්කම්වල හා මූල්‍ය වගකීම්වල ධාරණ අගය ඒවායේ සාධාරණ අගයට ආසන්නවන්නේයැයි උපකල්පනය කෙරේ. නිශ්චිත කල්පිරීමක් නොමැති ඉල්ලුම් තැන්පතු, ඉතුරුම් තැන්පතු හා ඉතුරුම් තැන්පතු සම්බන්ධයෙන්ද මෙම උපකල්පනයන් අදාළ කරනු ලැබේ.

## ස්ථාවර අනුපාතික සහිත මූල්‍ය උපකරණ

ස්ථාවර අනුපාතිකයන් සහිත ණය සහ ලැබිය යුතුදෑ වාර්තාකරණ කාලච්ඡේදය අවසානයේ පවතින වෙළෙඳපොළ අනුපාතිකයන් භාවිතා කරමින් සාධාරණ අගයට ඇගයීම් කරනු ලබන අතර, එකඟවූ අනුපාතිකය සහ වෙළෙඳපොළ පොළී අනුපාතිකය අතර ප්‍රමාණාත්මක වෙනස්කම් පවතින්නේනම් මෙම ණය ගිවිසුම් සම්බන්ධයෙන්වූ එකඟවූ අනුපාතිකයන් වෙනස්කිරීමට බැංකුවට අවස්ථාවක් ඇත. ඒ අනුව, ක්‍රමක්ෂිත පිරිවැයට වාර්තාකර ඇති ණය සහ ලැබියයුතුදෑ ඒවායේ සාධාරණ අගයන්ට සංසන්දනාත්මක වේ. අනෙකුත් විචල්‍ය අනුපාතික උපකරණ ණයවල ධාරණ අගය සාධාරණ අගයට සමාන ලෙස සළකනු ලැබේ. ගනුදෙනුකරුවන්ටදී ඇති ණය හා ලැබියයුතු මුළු කදම්භයෙන් ආසන්න වශයෙන් 56% තරම්වන ප්‍රමාණයක් වර්ෂයකට වඩා අඩු කාලයක් තුළදී පරිණතවන ගිවිසුම්ය.

ප්‍රතිලෝම වශයෙන්, පරිණතිය මුල්වරට අවුරුද්දකට වැඩිවූ හා කල්පිරීමේදී පොලිය ගෙවනු ලබන්නාවූ ස්ථිර තැන්පතු, වාර්තාකරණ කාලය අවසානයේදී ගනුදෙනුකරුවන්ට පිරිනමනු ලබන ප්‍රවර්තන වෙළෙඳපොළ අනුපාතිකයන් භාවිතා කරමින් වට්ටම් කිරීමෙන් ගණනය කර ඇත.

## 51. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 51.1 හැඳින්වීම

අවදානම් වලට නිරාවරණයවීම පාලනය කිරීම සඳහා මූල්‍ය උපකරණයන්හි ආර්ථික වටිනාකම භාවිතා කිරීම බැංකුවේ මූල්‍ය අවදානම් කලමනාකරණයෙහි පරිචයයි. ඒ හා සමානව ඒවායේ සම්පත් හඳුනාගැනීම මිනුම්කරණය සහ අවදානම්වලට ආමන්ත්‍රණය කරන පරිදි සැලසුම් කිරීම යනාදිය සාමාන්‍ය අවදානම් කළමනාකරණය, මූල්‍ය අවදානම් කළමනාකරණය මගින් සිදුකළ යුතුවේ.

බැංකුව හඳුනාගෙන ඇති ප්‍රධාන පෙළේ අවදානම් වර්ග කිහිපයක් මෙසේය.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළෙඳපොළ අවදානම
- මෙහෙයුම් අවදානම

### 51.2 අවදානම් කළමනාකරණ ව්‍යුහය

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ සමස්ථ අවදානම් අභිරුචිය සහ අවදානම් කළමනාකරණය පිළිබඳව අවසාන වශයෙන් වගකීමට යටත් වන අතර, අවම වශයෙන් අධ්‍යක්ෂවරු තිදෙනෙක්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ අවදානම් කළමනාකරණ ප්‍රධානීගෙන් සමන්විත වූ කමිටුවක් (මණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව) බැංකුවේ සමස්ථ අවදානම් පැතිකඩ සමාලෝචනය කරමින් අවශ්‍ය ප්‍රතිපත්ති සහ පද්ධති සංවිධානය පුරා පැතිර පවත්නා අවදානම් කළමනාකරණය පිළිබඳව වගකීම දරනු ලැබේ. මෙම ප්‍රතිඵල අත්කරගැනීමේ කාර්යයේදී බැංකුව පුරා ව්‍යාප්තව ඇති අවදානම් කළමනාකරණය සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහයෝගය ලබාගැනේ.

අවදානම් ප්‍රතිපත්ති සහ ආකෘතිමය රාමුව සැලසුම් කිරීම මෙන්ම ක්‍රියාත්මක කිරීමත් කාලච්ඡේදයානුකූලව සමාලෝචනය කිරීමත් පිළිබඳ වගකීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැවරේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපාරික කාර්යයන්ගෙන් මුළුමනින්ම ස්වාධීන ලෙස තම කාර්යයන් කරනු ලැබේ. ඒ අනුව ක්‍රියාකාරකම්හි ස්වාධීනත්වය පවත්වාගෙන යාම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රධානී සෘජුවම මණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරනු ලැබේ.

බැංකුව, බැංකුවේ ව්‍යාපාර ඒකක, අවදානම් දරන්නන් ලෙස හා ඒවාට මුහුණදීමෙන් ආරක්ෂා කළ යුතු ප්‍රථම මට්ටමේ ආරක්ෂණ ස්ථරය සේ හඳුනාගනී. දෛනික ව්‍යාපාර කටයුතු තුළින් ඇතිවිය හැකි විවිධ ස්වභාවයේ අවදානම් හඳුනාගැනීම, කළමනාකරණය, සමනය කිරීම සහ ඒ පිළිබඳව වාර්තාකිරීම ඔවුන් විසින් කළයුතුවේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සකස් වී ඇත්තේ, ආරක්ෂාව සඳහා දෙවන මට්ටමේ ස්ථරයන් ලෙස සැළකෙන ම.ස.අ.ක.ක. (මණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව), ම.වි.ණ.ක.(මණ්ඩලීය විධායක ණය කමිටුව), ම.වි.ක.(මණ්ඩලීය විගණක කමිටුව), ම.ආ.ක.(මණ්ඩලීය ආයෝජන කමිටුව),ව.බැ.ක.ක.(වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව), මෙ.අ.ක.ක.(මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව) යන ඒවායින් සමන්විතවේ.

උක්ත කමිටු අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිතව සමස්ථ අවදානම් කළමනාකරණ ආකෘතිය නිර්මාණය කිරීම සහ අවදානම් කළමනාකරණ ක්‍රමවේද, ප්‍රතිපත්ති සහ පද්ධතීන් සැලසුම්කිරීම හා නියුක්තකිරීම සිදුකරනු ලැබේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සුදුසු අවදානම් සීමා සහ පාලනයන් පිහිටුවීමට සහ අවදානම අධීක්ෂණය කිරීමට සහ සීමාවන්වලට අනුගතවීම අනුමතකිරීම සහ සමාලෝචනය කිරීමද මෙම කමිටුව විසින් සිදුකරනු ලැබේ. වෙළෙඳපොළ වෙනස්වීම් නිපැයුම් සහ සපයන සේවාවන්හි වෙනස්වීම්වලට අනුකූලවන ආකාරයට මෙම ප්‍රතිපත්තීන් සහ පද්ධතීන් නිරන්තර පදනම මත සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය හා බැඳුනු තෙවන සහ අවසාන ආරක්ෂණ ස්ථරය වන අභ්‍යන්තර විගණනය විසින් අවදානම් කළමනාකරණයේ ආකෘතිය, පිළිවෙත් සහ ප්‍රතිපත්තීන් සහ එම ප්‍රතිපත්තීන් පිළිබඳ අනුකූලතාවය පිළිබඳව ඵලදායීතාවය ස්වාධීනව පරීක්ෂාවට සහ සත්‍යාපනයට භාජනය කරනුලබන අතරම, සහතිකවීමේ ක්‍රියාවලියෙහි කළමනාකරණයද ඇගයීමට භාජනය කළයුතුවේ. ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සෘජුවම මාණ්ඩලීය විගණන කමිටුවට (ම.වි.ක.) වාර්තා කළ යුතුවේ.

### 51.3 ණය අවදානම

අප අදහස් කරන පරිදි බැංකුවේ සම්පත් පදනමට උපරිම ප්‍රතිවිපාක ඇතිවිය හැකි වඩාත් වැදගත් අවදානම් ක්ෂේත්‍රය ණය අවදානමයි. ණය ගැණුම්කරුවන්ගේ හෝ ප්‍රතිපාර්ශවකරුගේ ගිවිසුම්මය බැඳීම ඉටු කිරීමට අසමත් වීමෙන් බැංකුවට මූල්‍ය අලාභයක්වීමේ අවදානම ණය අවදානමයි. මූලික වශයෙන් ගැනුම්කරුවන් හෝ වෙනත් බැංකුවෙත දුන් ණය හා අත්තිකාරම් සහ ණය සුරැකුම්හි ආයෝජනයන් තුළින් මෙම අවදානම් පැන නගී. බැංකුවේ සේවාදායකයින් වෙනුවෙන් පිළිගෙන නිකුත් කරනු ලබන ණයවර ලිපි සඳහා ඇපවීම්, මූල්‍ය ඇප, විවිධ රටවල නිරාවරණයන් භාරගැනීම වැනිදෑ තුළින්ද ණය අවදානම් හටගනී.

**ණය අවදානම් පාලනය කිරීම**

ණය අවදානම් පාලනය කිරීම හා බැඳුනු මූලික මූලධර්මවලට අයත්වන්නේ -

- ණය අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් ව්‍යාපාරික අංශයන්ගෙන් ස්වාධීනවීම.

- නිවැරදි අවදානම් අභිරුචිය තීරණය කිරීමට හා ගනුදෙනු නිවැරදිව මිලකිරීම සඳහා පාදකවන එක් එක් ණය ගැණුම්කරු පිළිබඳව කරනු ලබන අභ්‍යන්තර අනුපාතය තීරණය කිරීමට පද්නම සකස් කිරීම.
- පුද්ගල හා ජ්‍යෙෂ්ඨත්ව පද්නමමත සකස් කෙරෙන කමිටුවලට අනුයුක්ත කරනලද ණය අධිකාරිමය සීමාවන්මත ණය අනුමත කිරීම.

ණය අවදානම් කළමනාකරණයේ මූලික මෙහෙයුම් සාධකය ගනුදෙනුකරුවන්ගේ අවදානම් පැතිකඩ පිළිබඳව කරනු ලබන මූලික ඇගයීමයි. බැංකුව විසින් මෙහිදී පාදක කරගනු ලබන මූලික මූලධර්මයවන්නේ, ණය ගැණුම්කරුගේ ණය ගෙවීමේ හැකියාව (පාරිභෝගික ණයදැරීමේ හැකියාව) පිළිබඳව කරනුලබන ණය අවදානම් කළමනාකරණ ඇගයීමයි. ණය ගෙවීමේ හැකියාවට අතිරේක වශයෙන්, ඇප වශයෙන් තබාගනු ලබනදෑහි ගුණත්වය ණයවල ගුණත්වය නිරාවරණය වීමට බලපෑම් ඇතිකරයි. එම නිසා, අභ්‍යන්තර පිළිවෙත්හි වඩාත් පැහැදිලිව නිර්වචනයකර ඇති රීති පාදකව ඇප වශයෙන් ලබාගන්නා සුරැකුම්වල ගුණත්වය ඇගයීම නිවැරදි ලෙස කළයුතුවේ. ඉදිරිපත් කර ඇති ඇප සුරැකුම්හි වඩාත් වැදගත් නිර්ණායකය වන්නේ, ද්‍රවශීලතාවයයි. මුළු ණය සහ ලැබියයුතුදෑ රුපියල් බිලියන 913ක ඇප සුරැකුම් වලින් ආවරණය වී ඇත.

අවශ්‍යයැයි පෙනීයන විචක්ෂණ ඇප සුරැකුම්කරණය සමඟ බැඳුනු වඩාත් තීව්‍ර ආරක්ෂක ප්‍රමිත අනුගමනය කිරීමෙන් බැංකුවේ ප්‍රථම මට්ටම් ආරක්ෂණ ස්ථරය ලෙස සැළකෙන ණය නිලධාරීන් විසින් බැංකුවට විචක්ෂණ ගනුදෙනුකරුවන් තෝරා ගැනීමේ කාර්යය කළයුතුවේ.

වඩාත් පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද, සෑම ව්‍යාපාර අංශයකම අවදානම් පිළිගැනීමේ නිර්ණායක, ක්‍රියාකාරකම් සහ ඒකාකාරීව භාවිතාකරන මූලධර්මයන් නියම කර ඇත.

විවිධාංගීකරණයවූ ණය කදම්භයක් තහවුරුකිරීම සඳහා බැංකුව අනිසි ලෙස ඒකාග්‍රතාවයක් වැළැක්වීම සඳහා මූලික වශයෙන්ම අරමුණු කරගන්නා අතරම විවිධ වෙළෙඳපොළ වාතාවරණයන් යටතේ බැංකුවේ ප්‍රාග්ධනය ඵලදායී ලෙස ආරක්ෂාකිරීම කරනු ලැබේ.

ඕනෑම ප්‍රතිපාර්ශවයක් සඳහා ණය දීර්ඝකිරීම් හෝ ණය පහසුකම් (කාලච්ඡේදය, ඇපසුරැකුම් ව්‍යුහය හෝ ප්‍රධාන ප්‍රඥප්ති) වෙනස්කිරීම අදාළ ණය සීමා අධිකාරියෙහි අනුමැතියට අනුව සිදුකරනු ලැබේ. පුද්ගලයින්ගේ ජ්‍යෙෂ්ඨත්ව මට්ටම් අනුව ණය අනුමත අධිකාරිය ඔවුන් වෙත පවරනු ලබන අතර, ඒවා කාලච්ඡේදයානුකූලව සමාලෝචනය කරනු ලැබේ.

න්‍යාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සමස්ථ ජාලය පුරාම පැතිර ඇති එක් එක් ණය ගැනුම්කරුගේ ණය නිරාවරණය මිනුම්කරණය හා සමනය කිරීම බැංකුව විසින් කරනු ලැබේ.

ණය අනුමත කරන ක්‍රියාවලියේදී, මූලික සහ වැදගත් සාධකයක් වන්නේ, නිශ්චිත නිරාවරණ මට්ටමකට වඩා එක් එක් ණය ගැණුම්කරු පිළිබඳව විස්තරාත්මක අවදානම් අනුපාතිකයන් තීරණය කිරීමයි.

ණය ගැණුම්කරුවෙකු හා සම්බන්ධ ණය අනුපාතිකය තීරණය කිරීමේදී බැංකුව අභ්‍යන්තර ලෙස සකස් කරනලද ක්‍රමවේද, ලකුණු ලබාදීම සහ ඔවුන්ගේ ණය දැරීමේ හැකියාව පිළිබඳව ඇගයීම් කිරීම සඳහා ශ්‍රේණි 9ක අනුපාතික පද්නමක් භාවිතා කරනු ලැබේ. විශාල ආයතනික ණය ගැණුම්කරුවන්, මධ්‍යම පරිමාණ/සුළු හා මධ්‍ය පරිමාණ ණය ගැණුම්කරුවන් සහ මූල්‍ය ආයතනවලට අදාළ අනුපාතිකය තීරණය කිරීම සඳහා බැංකුව වෙනමම ලකුණුදීමේ ක්‍රමයක් නිර්මාණය කර ඇත. මෙම අනුපාතික ලකුණුදීමේ ක්‍රමය ම.ස.අ.ක.ක. විසින් කාලච්ඡේදයානුකූලව සමාලෝචනයට සහ වලංගු කිරීමට භාජනය කරනු ලැබේ.

**අවදානම් පැතිකඩ අනුව ආයතනික ගණුදෙනුකරුවන්ගේ විග්‍රහය**

| | 2013 (%) | 2012 (%) |
|---|---|---|
| AAA | 0 | 1 |
| AA | 3 | 2 |
| A | 11 | 14 |
| BBB | 20 | 21 |
| BB | 30 | 26 |
| B | 15 | 18 |
| CCC | 12 | 9 |
| CC | 3 | 3 |
| C | 6 | 5 |




2013 2012

නිරන්තරයෙන් සිදුවන සක්‍රීය ණය අවදානම් තත්ත්වය පාලනය කිරීම සහ කළමනාකරණය බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්හි අන්තර්ගත කොටසකි. ව්‍යාපාර අංශ විසින් ණය පාලන දෙපාර්තමේන්තුව සමඟ ඉතා සමීපව සම්බන්ධ වෙමින් මූලික වශයෙන් පාලන ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ. ඔවුනගේ ණය ගනුදෙනුකරුවන් හා බැඳුනු ණය අවදානම් පාලනය කිරීම පිළිබඳව විශේෂඥතාවය සහ පළපුරුද්ද ව්‍යාපාර අංශයන්හි ණය නිළධාරීන් සතුව පවතී. ඔවුන් වෙත අනුයුක්ත කරඇති ණය කදම්භය නිරන්තරයෙන් පාලනය කිරීම එක් එක් ණය නිළධාරියාගේ වගකීමක් ලෙස සැළකේ.

අලාභ වැඩිවීම පිළිබඳව අවදානමක් ඇතිවිටක ඇති මූලික අවස්ථාවේදීම ණය නිරාවරණය හඳුනාගැනීම සඳහා බැංකුව විසින් පද්ධති ස්ථාපිත කරඇත. ණය නිරාවරණයන් ඇතිවිය හැකියැයි හැඟෙන ඇතැම් අවස්ථාවන්හිදී එවැනිදෑ පිළිබඳව ඉතා ළඟින් නිරීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් බැංකුව අනුගමනය කරයි. මෙලෙස ස්ථාපිත කර ඇති ඉතා ඉක්මනින් අනතුරු සංඥා සැපයීමේ ක්‍රියාවලියෙහි අරමුණ වන්නේ, තවමත් පියවර ගැනීමට ඉඩ ප්‍රස්ථා සහිත ගැටළු සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමයි.

ණය අවදානම් කළමනාකරණය කිරීමේදී ඉහතින් සාකච්ඡා කරන ලද මූලධර්මවලට අතිරේකව ඒකාග්‍රතාවය තහවුරු කිරීම සඳහා පහත ප්‍රතිපත්තිමය නිර්දේශයන් ස්ථාපිතව ඇත.

i. ණය ජනනය කිරීම සහ පවත්වාගෙනයාමේ ප්‍රතිපත්තිය
ii. කර්මාන්ත සහ එක් එක් තනි ණය ගැණුම්කරුවන් පිළිබඳව උපරිම ණය සීමාවන් තීරණය කිරීම වැනි කදම්භ කළමනාකරණ නිර්දේශ
iii. ප්‍රතිකර්ම/පුණරුත්ථාපන කළමනාකරණ නිර්දේශයන්
iv. ණය සමාලෝචන ප්‍රතිපත්තීන්
v. නිශ්චිත ප්‍රමාණය ඉක්මවූ නිරාවරණයන් පිළිබඳව ණය සීමා දීර්ඝ කිරීම අවම වශයෙන් ණය නිළධාරී සහිතව ණය පාලන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දෙදෙනෙකු විසින් අනුමත කිරීම.
vi. අප විසින් ණය සමාලෝචන යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත.

පහළ අනුපාතිකයන් සහිත ණය ගැණුම්කරුවන් සඳහා වෙනස්වූ කාල සැලැස්මක සමාලෝචන ක්‍රියාත්මක වේ. (මාස 06/වර්ෂ 01 සමාලෝචනයන්). ණය තීරණවල ගුණාත්වය තහවුරු කිරීමට හා ගනුලබන ප්‍රතිකර්ම ක්‍රියාකාරකම්වල කාලීනභාවය තහවුරු කිරීම සඳහා ශාඛා/ප්‍රාදේශීය/කලාපීය අධිකාරී මට්ටම් විසින් දීඇති ණයවල ප්‍රතිශතයක් නියැදි පදනම යටතේ කාර්තුමය පදනමට ප්‍රධාන කාර්යාලය විසින් පශ්චාත් ණය සම්පාදන සමාලෝචනයකට භාජනය කරනු ලැබේ.

විශේෂයෙන්ම පහත කරුණුවලට අනුකූලව මහ බැංකු විධිවිධාන හා නිර්දේශවලට පූර්ණ අනුකූලත්වය දැක්වීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ:

- අපචාරී ණය හඳුනාගැනීම සහ වර්ගීකරණය
- අපචාරී ණය සඳහා ප්‍රතිපාදනය
- තනි ණය ගැණුම් ප්‍රමාණය පිළිබඳ සීමාවන්

ඒ සඳහා අදාළ විෂය මූලික සාක්ෂි පාදකව හානිකරණ වත්කම් වලින් සිදුවූ අලාභ පිළිබඳව ගිණුම්කරණය කිරීමට බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 32 හා 39 (LKAS 32 සහ LKAS 39) භාවිතා කර ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව ණය අලාභ ප්‍රතිපාදනයන් ගිණුම්ගත කර ඇත.

**51.3.1 වෙනත් ගණුදෙනුකරුවන්ගේ ණය සහ ලැබිය යුතු දෑ**

වෙනත් ගණුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 39) හි නිර්දේශයන්ගෙන් අවශ්‍ය කෙරෙන පරිදි කේවල ප්‍රමාණාත්මක නිරාවරණයන් සහ සාමූහික නිරාවරණයන් ලෙස පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | 2013 | 2012 |
|---|---|---|
| | % | % |
| **කේවල ප්‍රමාණාත්මක හානිකරණ ණය** | | |
| ක්‍රමක්ෂිත පිරිවැය | 45,885,774 | 44,763,478 |
| හානිකරණය සඳහා වෙන්කිරීම් | (39,341,542) | (37,405,759) |
| **දෙසැම්බර් 31 දිනට ධාරණ අගය** | 6,544,232 | 7,357,719 |
| **සාමූහික ලෙස තක්සේරු කළ ණය** | | |
| ක්‍රමක්ෂය වටිනාකම | 635,581,090 | 615,860,621 |
| ක්‍රමක්ෂිත පිරිවැය | (22,295,587) | (11,804,073) |
| **දෙසැම්බර් 31 දිනට ධාරණ අගය** | 613,285,503 | 604,056,548 |

සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනකදීම බැංකුව විසින් එහි කේවල ප්‍රමාණාත්මක ණයවල හානිකරණයක්වී ඇත්නම්, එය ආදායම් ප්‍රකාශනය තුළ වාර්තාකර ඇත්ද යන්න පිළිබඳව සමාලෝචනය කරනු ලැබේ. විශේෂයෙන්ම හානිකරණ අලාභය නිශ්චය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහන්හි ප්‍රමාණය හා කාල නිර්ණය පිළිබඳව කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම ඇස්තමේන්තු සාධක විවිධ උපකල්පනයන් මත පදනම්වන අතර, ඒවා සත්‍ය ප්‍රතිඵල වලින් වෙනස්විය හැකිය.

කේවල පදනම මත හානිකරණය සඳහා වෙන්කිරීමක් අවශ්‍ය නොවන්නේ නම්, එක හා සමාන අවදානම් ගුණාත්මක ලක්ෂණ සහිත එවැනි සියළුම කේවල ණය හා ලැබිය යුතු දෑ සාමූහික පදනමක් මත සමාලෝචනයට භාජනය කරනු ලැබේ. විෂයානුබද්ධ සාක්ෂි සපයන්නේ නමුත් එහි ප්‍රතිඵලය පිළිබඳව තවමත් සාක්ෂි නොසැපයෙන ශේෂ සඳහා අලාභ වෙනුවෙන් වෙන්කිරීමක් කළ යුතු වන්නේද යන්න තීරණය කිරීම සඳහා මෙය අවශ්‍ය වේ. සාමූහික තක්සේරුකරණය සඳහා ණය කදම්භයේ දත්තයන් සැලකිල්ලට ගන්නා අතරම (ණය අයිතිකාරත්ව ස්වභාවය, හිඟ මට්ටම, කර්මාන්තය) අවදානම් සංකේන්ද්‍රගතවීමේ ප්‍රතිවිපාකය සහ ආර්ථික දත්ත පිළිබඳවද විනිශ්චයන් සැලකිල්ලට ගනී.

**ණය අවදානම් සාන්ද්‍රණය වීම**

දෙසැම්බර් 31වෙනි දිනට ණය සහ ලැබිය යුතු දෑ පිළිබඳව ණය අවදානම සාන්ද්‍රණය වීම පිළිබඳව විශ්ලේෂණය පහත වේ:

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | රු. '000 | % | රු. '000 | % |
| කෘෂිකර්මය සහ මසුන් ඇල්ලීම | 179,434,380 | 26.3 | 206,758,307 | 31.3 |
| නිෂ්පාදන | 13,166,471 | 1.9 | 19,954,340 | 3.0 |
| සංචාරක | 4,381,817 | 0.6 | 4,036,184 | 0.6 |
| ප්‍රවාහන | 1,036,626 | 0.2 | 957,592 | 0.1 |
| ඉදිකිරීම් | 128,747,395 | 18.9 | 112,624,992 | 17.0 |
| වෙළෙඳ | 52,731,604 | 7.7 | 40,931,668 | 6.2 |
| නව ආර්ථික | 8,269 | 0.0 | 5,665 | 0.0 |
| වෙනත් | 301,960,302 | 44.3 | 275,355,351 | 41.7 |
| **ශුද්ධ එකතුව** | 681,466,864 | 100.0 | 660,624,099 | 100.0 |

## 51.4 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු, බැංකුවට එහි ගිවිසුම්ගත බැඳීම් පියවීමට අවශ්‍යවිට ඒවා පියවීමට නොහැකිවීමයි. අදාළ පරිණතයන්හිදී මූල්‍ය වත්කම් සපයාදීමේ දුෂ්කරතාවයන් සහ නිශ්චිත කාලපරාසයක් තුළ වත්කම් උපලබ්ධියේදී සාධාරණ මිලක් සහ අනුපාතිකයක් ගෙවීමට ඇති නොහැකියාව මෙයට ඇතුළත්වේ.

වත්කම් හා බැරකම් කමිටුවේ අධීක්ෂණයට යටත්ව භාණ්ඩාගාර මැදපෙළ කාර්යාලය විසින් පාලනය කරන ආකාරයට බැංකුවේ ද්‍රවශීලතාවය අභ්‍යන්තර හා නියාමන නිර්දේශයන්ට අනුකූලව කළමනාකරණය කිරීමේ වගකීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට පවරාදී ඇති වගකීමකි.

බැංකුව මූල්‍ය අතරමැදියෙකුගේ මූලික කාර්යයභාරය ක්‍රියාත්මක කරන හෙයින් කෙටිකාලීන බැරකම්වලින් දීර්ඝකාලීන වත්කම් සඳහා මූල්‍යනයකිරීම හේතුවෙන් ද්‍රවශීලතා අවදානම ප්‍රධාන වශයෙන්ම ඇතිවීම වැළැක්විය නොහැකිය.

ද්‍රවශීලතා සැලසුම්කරණය තුළින්, අභ්‍යන්තර හා බාහිර වශයෙන් ජනනය වන ඉතාමත්ම දැඩි ආතති වාතාවරණයක් තුළදී පවා බැංකුවට එහි අරමුදල් බැඳියාවන් අවම වශයෙන් හෝ සපුරාලීම තහවුරු කෙරේ.

එක් බැංකුවක සම්ප්‍රදායික ද්‍රවශීලතා ගැටළුවක් තුළින් රටේ සමස්ථ බැංකු ජාලයටම ඇතිවිය හැකි ප්‍රතිවිපාකය සළකා බැලීමේදී වඩාත් කාර්යක්ෂම ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයක වැදගත්කම අතිශයින් නිරූපණය වේ.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය වනුයේ -

- මුදල් ප්‍රවාහ පරිණතියන් පිළිබඳව වෙනස කළමනාකරණය (අවශේෂ පදනම, ගිවිසුම්මය සහ චර්යා පදනම)
- ඕනෑම අසම්භාව්‍යකට මුහුණදිය හැකි පරිදි මුදල් බවට වඩාත් පහසුවෙන් පත්කර ගතහැකි ගුණත්වයෙන් උසස් ද්‍රවශීල වත්කම් කදම්භයක් පවත්වාගෙන යාම. ඒ අනුව අපගේ ද්‍රවශීලතා කළමනාකරණ උපායමාර්ග අරමුණුගතකර ඇත්තේ ද්‍රවශීලතා වත්කම් කදම්භයක් පවත්වාගෙන යාම සහ හොඳින් සැලකිල්ලට භාජනය කරනලද නිපැයුම් හඳුන්වාදීම සහ එවැනි සම්පත් පිළිබඳව කාර්යක්ෂම සම්බන්ධිතා කළමනාකරණය තුළින් සුළු පරිමාණ තැන්පතු ආකාර්ෂණය කිරීමෙන් විවිධාංගීකරණය වූ ද්‍රවශීලතා කදම්භයක් පවත්වාගෙන යාම. අපගේ මෙම ද්‍රවශීලතා උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී ඉතා විශාල ලෙස පැතුරුනු ශාඛා ජාලය සහ විස්තීර්ණ කුඩා ගනුදෙනුකරුවන්ගේ පදනම ඒ සඳහා වඩාත් වැදගත් සාධක විය.
- අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළ සඳහා ප්‍රවේශය සුදානම්ව තිබීම
- භව්‍ය එහෙත් ඉතාමත් කලාතුරකින් සිදුවියහැකි ගර්ජනාත්මක තත්ත්වයක් මත බැංකුවට මුහුණ පෑමට සිදුවන ද්‍රවශීලතාවය පිළිබඳව අනතුරුමය තත්ත්වයක් නිසා හෝ කිසියම් අරමුදල් ප්‍රභවයක් මත රඳා පැවැත්මේ ප්‍රමාණය මත ඇතිවිය හැකි ආතති පිළිබඳව පරීක්ෂා කිරීම.
- අසම්භාව්‍ය සැලසුම්කරණය - විදේශීය හා දේශීය සම්භවයන්ගෙන් යුක්තව බාහිර සම්පත්වලින් සැකසුණු හා වගකීම් සහිත ණය ක්ෂේත්‍ර සමුදායකින් වර්ධනයවූ පරිපූර්ණ අවිනිශ්චිත අරමුදල් සැලැස්මක් බැංකුව විසින් සැළසුම්කරනු ලැබ තිබේ.

ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය හා කළමනාකරණය සඳහා බැංකුව පහත සඳහන් උපක්‍රම භාවිතා කරයි:

- වත්කම්, වගකීම් පිළිබඳ මුදල් ප්‍රවාහ කල්පිරීම් හා බැඳුනු පරතරයන් සහ නියමිත සීමාවන් හා අදාළව ඒවා අධීක්ෂණය කිරීම.
- ණය හා ගනුදෙනුකරු තැන්පතු අනුපාතය, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, භාවිතා නොකරන ලද අන්තර් බැංකු ණය ඉල්ලුම් ඉඩකඩ, ගනුදෙනුකරුවන් සඳහා පවත්නා භාවිතා නොකරන ලද සීමාවන් වැනි ද්‍රවශීලතා දර්ශකයන් අධීක්ෂණය
- සැළකිය යුතු මට්ටමින් හා ක්ෂණිකව අක්‍රිය වත්කම්වල වැඩිවීමක් සිදුවීම, ක්ෂණික මුදල් ප්‍රවණතාව හෝ ඉහළ මට්ටමේ පිරිවැයක් කරා ද්‍රවශීලතාව යොමුකරන අඩුවෙමින් පවත්නා අනුපාතයන් වැනි ආන්තික දර්ශනයන් සහිත ආතති ද්‍රවශීලතා තත්ත්වයන් පිරික්සුම

| ද්‍රවශීලත්ව දර්ශකයන් | 2012 | 2013 |
|---|---|---|
| | % | % |
| ණය/ගණුදෙනුකරු තැන්පතු | 96.6 | 89.4 |
| භාවිතා නොකරන ලද අන්තර් බැංකු ණය මාර්ග | 44 | 20 |
| මධ්‍යකාලීන අරමුදල්කරණය | 102 | 86 |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය - දේ.බැ.අ. | 21.8 | 25.2 |
| - වි.ව්.බැ.අ. | 21.8 | 22.3 |

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය වර්ධනයවී ඇතිබව මෙය විදහා දක්වයි.

ද්‍රවශීලතාවය සහ ලාභදායීත්වය අතර ඇති නොවැලැක්විය හැකි තත්ත්වයන් බැංකුව විසින් හඳුනාගෙන ඇති අතර, ඒවා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ නිර්දේශයන් තුළ අන්තර්ගත කර ඇත.

**ඉතිරි ගිවිසුම්මය පරිණතිය මත මූල්‍ය වත්කම් හා වගකීම් විශ්ලේෂණය**

2013 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් සම්බන්ධ කල්පිරීම් පැතිකඩ

| | මාස 03 දක්වා | මාස 3-12 දක්වා | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5 ට වැඩි | එකතුව 2013 | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | **රු. '000** | රු. '000 |
| **වත්කම්** | | | | | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 18,772,595 | – | – | – | – | 18,772,595 | 24,401,979 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්නා ශේෂය | 14,339,316 | 14,227,837 | 3,919,656 | 3,760,235 | 4,123,848 | 40,370,892 | 43,412,048 |
| බැංකු සමඟ ස්ථාපනයන් | 2,551,215 | – | – | – | – | 2,551,215 | 13,341,252 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 35,391 | – | – | – | – | 35,391 | 2,791 |
| විකිණීම සඳහා තබාගෙන ඇති වෙනත් මූල්‍ය වත්කම් | 41,521,610 | 22,147,171 | 80,076 | – | – | 63,748,857 | 18,772,710 |
| බැංකුවලට දුන් ණය සහ ලැබිය යුතු ශේෂ | 30,100,949 | 24,153,320 | 8,922,790 | 11,358,880 | 7,689,150 | 82,225,089 | 35,350,098 |
| වෙනත් පාරිභෝගිකයින්ට දුන් ණය සහ ලැබිය යුතු ශේෂ | 186,513,677 | 163,020,187 | 86,158,072 | 74,744,904 | 109,392,896 | 619,829,736 | 611,414,267 |
| විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය ආයෝජන | – | 311,733 | – | – | – | 311,733 | 27,977,489 |
| පරිණතිය තෙක් තබාගන්නා මූල්‍ය ආයෝජන | 10,806,727 | 31,761,846 | 19,082,572 | 13,063,142 | 1,070,000 | 75,784,287 | 78,522,570 |
| පරිපාලිතයන්හි ආයෝජන | – | – | – | – | 1,245,908 | 1,245,908 | 1,253,434 |
| ආශ්‍රිතයින්හි ආයෝජන | – | – | – | – | 207,568 | 207,568 | 273,100 |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | – | – | – | – | 33,535 | 33,535 | 44,352 |
| දේපළ, පිරියත හා උපකරණ | – | – | – | – | 14,705,721 | 14,705,721 | 8,234,565 |
| ආයෝජන දේපළ | – | – | – | – | 189,776 | 189,776 | 398,508 |
| පෙරගෙවුම් කල්බදු | – | – | – | – | 295,732 | 295,732 | 291,866 |
| විලම්බිත බදු වත්කම් | – | – | – | – | 1,071,381 | 1,071,381 | 501,587 |
| වෙනත් වත්කම් | 7,511,398 | 259,123 | 484,855 | 513,223 | 437,259 | 9,205,858 | 8,913,987 |
| **2013 මුළු වත්කම්** | 312,152,879 | 255,881,216 | 118,648,021 | 103,440,384 | 140,462,774 | 930,585,274 | – |
| **2012 මුළු වත්කම්** | 284,700,055 | 286,159,067 | 102,198,603 | 72,001,463 | 128,047,415 | – | 873,106,604 |
| **වගකීම්** | | | | | | | |
| බැංකුවලට ගෙවියයුතු | 69,490,607 | 12,303,411 | – | – | – | 81,794,018 | 94,124,713 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 215,844 | – | – | – | – | 215,844 | 1,710 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 238,253,734 | 255,360,744 | 80,011,136 | 67,311,307 | 121,311,608 | 762,248,529 | 683,950,837 |
| වෙනත් ණය ගැනීම් | 17,292,351 | 3,061,635 | – | – | – | 20,353,987 | 41,024,958 |
| ප්‍රවර්තන බදු වගකීම් | 393,380 | – | – | – | – | 393,380 | 1,860,689 |
| විලම්බිත බදු වගකීම් | – | – | – | – | 885,231 | 885,231 | – |
| වෙනත් වගකීම් | 2,559,398 | 9,656,804 | 769,184 | 139,515 | – | 13,124,900 | 12,938,910 |
| ණයකර | 32,542 | – | – | 5,000,000 | 10,000,000 | 15,032,542 | 10,000,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | – | – | – | – | 7,201,998 | 7,201,998 | 7,201,998 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | – | – | – | – | 2,811,685 | 2,811,685 | 2,437,291 |
| රඳවාගත් ඉපැයුම් | – | – | – | – | 2,409,607 | 2,409,607 | 3,977,820 |
| ප්‍රත්‍යාගණන සංචිත | – | – | – | – | 10,876,547 | 10,876,547 | 5,463,496 |
| වෙනත් සංචිත | – | – | – | – | 13,237,006 | 13,237,006 | 10,124,182 |
| **2013 මුළු ස්කන්ධය සහ වගකීම්** | 328,237,856 | 280,382,594 | 80,780,320 | 72,450,822 | 168,733,682 | 930,585,274 | – |
| 2012 මුළු ස්කන්ධය සහ වගකීම් | 310,769,057 | 265,288,246 | 80,251,248 | 67,514,339 | 149,283,713 | – | 873,106,604 |

## 51.5 වෙළෙඳපොළ අවදානම

විදේශ විනිමය අනුපාතිකයේ, පොලී අනුපාතිකයේ, ස්කන්ධ මිලෙහි හා භාණ්ඩ මිලෙහි ඇතිවිය හැකි වෙනස්කම් තුළින් බැංකුව දරාගෙන සිටින කිසියම් මූල්‍ය උපකරණයක අගය හෝ ආදායම සම්බන්ධව ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක වෙළෙඳපොළ අවදානමයි. අපගේ වෙළෙඳ කටයුතු පිළිබඳව හා බැංකු කටයුතු පිළිබඳව එවැනි අවදානම් පවතී. බැංකුවේ භාණ්ඩාගාර ප්‍රතිපත්ති සංග්‍රහයෙහි වෙළෙඳපොළ අවදානම කළමනාකරණය සඳහා අනුගමනය කළ යුතු නිශ්චිත ප්‍රතිපත්ති අන්තර්ගත කර ඇත.

**1. වෙළෙඳපොළ අවදානම සහ වත්කම් බැරකම් කළමනාකරණයට පහත දෑ අයත්වේ:**

අ. භාණ්ඩාගාර ඉදිරිපෙළ කාර්යාලීය කටයුතු සඳහා සීමාවන් නියම කිරීම හා ඒවා බණ්ඩනයන් පිළිබඳව වාර්තාකරණය

ආ. වත්කම් හා බැරකම් කළමනාකරණය සඳහා සීමාවන් සහ වරණීය මිනුම් ලකුණු තීරණය කිරීම.

ඇ. ඇගයුම් අනුපාතිකයන් සහ ක්‍රමවේද පිළිබඳව ස්වාධීන සත්‍යාපනය

ඈ. වෙළෙඳපොළ අවදානම ප්‍රමාණනය කිරීම සහ පාලනය කිරීම සඳහා සහ එම ගණනය කිරීම සඳහා භාවිතා කරන ආකෘතිවල වලංගුතාවය තහවුරු කිරීමට අගය මත අවදානම හඳුන්වාදීම.

**වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය සඳහා වූ සංවිධානාත්මක සැලැස්ම**

වෙළෙඳපොළ අවදානම පාලනය කිරීම සඳහා විස්තීර්ණ ප්‍රතිපත්ති සමූහයක් සහ සීමාවන් බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. වත්කම් හා බැරකම් කමිටුවේ නිර්දේශයන් මත මණ්ඩලය විසින් විවිධ භාණ්ඩාගාර සහ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා සීමාවන් තීරණය කර ඇත.

වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සංවර්ධනය කිරීමේ වගකීම, වත්කම් හා බැරකම් කමිටුවේ වගකීමකි. වත්කම් හා බැරකම් කමිටුව විසින් සියළුම ප්‍රමාණාත්මක වෙළෙඳපොළ අවදානම් ප්‍රභවයන් හඳුනාගෙන ඇති අතර, අවදානම් සීමා තීරණය කර ඇත.

යහපාලන පරිචයන්ට අනුකූලවන අතරම, මෙම ප්‍රතිපත්ති/පද්ධති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් තුළ අන්තර්ගතවේ.

භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය විසින් විවිධ වෙළෙඳපොළ අවදානම් නිරාවරණයන් ඉතා සමීපව පාලනය කරන අතර, පාලන ක්‍රියාමාර්ග සඳහා ඒවා පිළිබඳව ප්‍රධාන අවදානම් නිළධාරීවරයාට සහ වත්කම් හා බැරකම් කමිටුවට වාර්තාකරණය කරනු ලැබේ.

භාණ්ඩාගාරයේ ඉදිරි කාර්යාලය, මධ්‍යම කාර්යාලය සහ පසුපස කාර්යාලය වෙන්කොට වාර්තාකරණ මාර්ග තුනකට පැහැදිලිව හඳුනාගෙන ඇති අතර, ඒවායේ වගකීම් පැහැදිලි ලෙස නිර්වචනය කර ඇත.

**විදේශ විනිමය අවදානම කළමනාකරණය**

විදේශ විනිමය අවදානම යනු, බැංකුව විවෘත ස්ථාවරයට මුහුණදී සිටින වකවානුවක අවාසිදායක විනිමය අනුපාතික සංචලනයන් නිසා, බැංකුවට අලාභ සිදුවීමට ඇති අවදානමයි.

විදේශ විනිමය අවදානමට නිරාවරණයවීම ස්වකීය වෙළෙඳාම් මත මෙන්ම ගනුදෙනුකරුවන් වෙනුවෙන් ඔවුන්ගේ ආයත හා නිර්යාත ගිනුම්, ප්‍රේෂණ සහ වෙනත් ක්‍රියාකාරකම් මත බාරගනු ලබන විදේශ විනිමයෙන් නියමිත වූ ගනුදෙනුවලින් පැන නගී.

බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව දෛනික පදනම මත විදේශ විනිමය අවදානම පාලනය කරනු ලැබේ. දෛනික අගය මතවූ අවදානම යන්න විදේශ විනිමය අවදානම පාලනය කිරීමේදී සහ ප්‍රමාණනය කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලික යාන්ත්‍රණයයි. දෛනික අගය මතවූ අවදානම 99%ක විශ්වසනීය මට්ටමක් යටතේ කරනු ලබන ඇස්තමේන්තුවක් වන අතර, එක් ව්‍යාපාර දිනයකදී වර්තමාන තත්ත්වය වෙනස් නොවී පවත්වාගතහොත් ඇතිවිය හැකි භව්‍ය අලාභය එයින් නිරූපණය කරයි.

අප විසින් විදේශ විනිමය අවදානම පාලනය සහ මැනීම සඳහා පහත උපක්‍රමද භාවිතා කරනු ලැබේ:

i. විදේශ මුදලින් ප්‍රකාශිත වත්කම් සහ බැරකම් මාසිකව මිලියන වලින් ගණනය කොට පරිණත පරතර විශ්ලේෂණයක් ලබාගැනීම.

ii. විනිමය අනුපාතිකයන්හි සංචලනය මත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයට ඇතිවන බලපෑම මැනීම සඳහා ආතති පරීක්ෂා ක්‍රියාත්මක කිරීම.

අවදානම සමනය කරගැනීමේ ප්‍රාථමික පියවරක් වශයෙන් අවදානමට විවෘත තත්ත්වයේදී පහත සඳහන් සීමාවන් පනවනු ලැබේ:

i. ව්‍යවහාර මුදල්/වෙළෙඳාම පිළිබඳ ධාරිතාමය සීමාවන්

ii. සමස්ත ඉඩ සීමාවන්

iii. ව්‍යවහාර මුදල්/වෙළෙන්දා හා අදාළව අලාභය නතර කිරීමේ සීමාවන්

iv. ඉදිරි විදේශ විනිමය පරිණත පරතර සීමාවන් මාසිකව එක්සත් ජනපද ඩොලර් මිලියන වලින් මිනුම්කරණය

තත්කාලීන පදනම මත මධ්‍යම කාර්යාලය විසින් මෙම නිරාවරණයන්ට එරෙහිව වූ සීමා තීරණය කරනු ලැබේ.

### 2013 තුළදී දෛනික විදේශ විනිමය ශුද්ධ විවෘත තත්ත්වය (NOP) සහ අගය මත වූ අවදානම (DVaR)




| දිනය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උපරිම ශු.වි.ත. | 8,266,792 | 2,103,726 | 5,145,902 | 5,475,482 | 2,665,981 | 4,881,729 | 5,160,119 | 3,315,269 | 3,393,200 | 6,997,024 | 2,835,538 | 4,553,700 |
| අවම ශු.වි.ත. | 9,768 | 2,491 | 10,667 | 1,447,844 | 6,587 | 124 | 163,347 | 316,382 | 10,953 | 6,655 | 11,959 | 2,575 |
| උපරිම අ.ම.අ. | 76,387 | 22,134 | 42,961 | 44,872 | 21,793 | 39,877 | 38,818 | 24,962 | 23,696 | 47,507 | 19,908 | 28,170 |

වර්ෂය පුරා දෛනික අවදානම් මත අගය (DVaR) අභ්‍යන්තර සීමාවට වඩා බොහෝ පහළ මට්ටමක පවත්වාගෙන ගොස් ඇති අතර, උපරිම මට්ටම එක්සත් ජනපද ඩොලර් 80,000ට වඩා අඩුවිය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතිකය මත විනිමය අනුපාතිකයන්හි සංචලනය ඇතිකරනලද බලපෑම මිනුම්කරණය සඳහාවූ ආතති පරීක්ෂාව

**විනිමය අනුපාතිකයන්හි සංචලනයන් මත ප්‍රා.ප්‍ර.අ. සඳහා වූ අහිතකර බලපෑම**

| කම්පනයේ තරම | සංශෝධිත ප්‍රා.ප්‍ර.අ. I ස්ථරය | සංශෝධිත ප්‍රා.ප්‍ර.අ. I ස්ථරය + II ස්ථරය |
|---|---|---|
| 5% | 10.37% | 14.96% |
| 10% | 10.35% | 14.95% |
| 15% | 10.34% | 14.93% |




මෙම සටහන නිරූපණය කරන පරිදි 15% ක තරම්වූ අහිතකර කම්පන තත්ත්වයකදී වුවද බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය පිළිබඳව ඇතිවන බලපෑම ඉතා සුළු ප්‍රමාණයකි.

මෙම සටහන විදහාපාන්නේ බැංකුව විසින් එහි විනිමය අවදානම් වඩාත් හොඳින් පාලනය කර ඇති බවත් ඕනෑම අවාසිදායක විනිමය අනුපාතික සංචලනයකදී වුවද බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයට විශාල බලපෑමක් සිදුනොවන බවයි.

**පොළී අනුපාත අවදානම**

පොළී අනුපාත අවදානම යනු, වෙළෙඳපොළේ පොළී අනුපාතිකය වෙනස්වීමේ හැකියාව මත ඇතිවන පොළී අවදානම මූල්‍ය වත්කම්වල අනාගත මුදල් ප්‍රවාහයන්ගේ හෝ ඒවායේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම කෙරෙහි බලපෑමයි. මෙම අවදානම පාලනය කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ගය වන්නේ, එහි තත්ත්වයන් අඛණ්ඩව දෛනික පදනමක් තුළ අධීක්ෂණය කිරීම හා එම තත්ත්වයන් සඳහා විචක්ෂණ මට්ටමක් පවත්වා ගැනීමට අවශ්‍ය උපක්‍රමික සීමාවන් ක්‍රියාත්මක වන බවට සහතික වීමත්ය. බැංකුකරණ හා වෙළෙඳ ශේෂ (ඉදිරි විනිමය ගිවිසුම් අවදානම් සහිතව) මත පොළී අනුපාතික අවදානම නිශ්චය කරන අතර, මෙම කාර්යය සඳහා කාල පරාස විශ්ලේෂණය සහ අගයමත අවදානම භාවිතයට ගනු ලැබේ.

වෙළෙඳ පොතෙහි ස්ථාවර ආදායම් දරන සුරැකුම්වල ඇති ශේෂයන්ගේ පොළී පරතරය ගිවිසුම්මය හා චර්යා පදනම යන ආකාර දෙකටම මිනුම්කරණය කෙරේ. දරාසිටීමේ පරිමාව සීමා කිරීම හැරෙන්නට සමුච්චිත අලාභ නැවතුම් සීමා පොළී අනුපාතික අවදානම් පාලනය සඳහා භාවිතා කරනු ලැබේ.

පොළී අනුපාතිකය පිළිබඳව සිදුවන්නාවූ අහිතකර ප්‍රතිවිපාකයන් බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකයන් සඳහා බලපෑම් ඇතිකළ හැකිය. බැංකුකරණ පොතෙහි/කදම්භයෙහි සහ වෙළෙඳ පොතෙහි/ කදම්භයෙහි ඇතිවන පොළි අනුපාතික අවදානම් ග්‍රහණය කර ගැනීම හා ප්‍රමාණනය කිරීම සාක්ෂාත් කරනු ලැබේ. සමස්ථ පොළී අවදානම් පිළිබඳ සීමාවන් ස්ථාපිත කර ඇත.

| | කුච්චුවෙලි | 593 |
| | සෙන්ට්‍රල් රෝඩ් SPC | 501 |
| වන්නි | කිලිනොච්චි නගරය | 732 |
| | මල්ලාවි සේවා මධ්‍යස්ථානය | 978 |
| | කනගරාජන්කුලම් | 731 |
| | ඔඩ්ඩුසුඩාන් | 599 |
| | පුදුකුඩිඉරුප්පු | 779 |
| | පලෙයි | 979 |
| | නානත්තන් | 967 |
| | සිලාවතුරෙයි | 742 |
| | පේසාලේ | 955 |
| | වවුනියා නගරය | 983 |
| | නැඳුන්කර්නි | 595 |

# ලොව පුරා හවුල්කරුවන්




(a) යුරෝපය

Banca Nationale del Lavoro SpA, (BNL) Rome
Bank of Ceylon, London
Bank of Cyprus Public Company Ltd., Nicosia
Barclays Bank PLC, London
BHF Bank Aktiengesellsschaft, Frankfurt am Main
BNP Paribas SA, Paris
Budapest Bank RT, Budapest
Commerzbank AG, Frankfurt am Main
Credit Suisse, Zurich
Czekoslovenka Obchodna Banca AS, Bratislava
Danske Bank A/S, Copenhagen
Deutsche Bank AG, Frankfurt am Main
Gorengska Banka DD, Ljubljana
HSBC Bank PLC, London
ING Bank NV, Amsterdam
ING Belgium SA/NV, Brussels
Intesa Sanpaolo SpA, Milano
Komercni Bank NA, Prague
MKB Bank ZET, Budapest
National Westminster Bank PLC, London
Natixis, Paris
Nordea Bank AB (Publ), Stockholm
Nordea Bank Norge ASA, Oslo
Raifaizen Bank, Vienna
SEB Bank, Tallinn
SEB Bank, Vilnius
Skandinaviska Enskilda Banken AB (Publ), Stockholm
Societe Generale, Paris
Sparkasse Kolnbonn, Cologne
Svenska Handelsbanken AB (Publ), Stockholm
The Royal Bank of Scotland NV, Amsterdam
The Royal Bank of Scotland, Athens
UBAE S.P.A, Rome
UBAF, Paris
UBS AG, Zurich
Ukrexim Bank, Kiev
Unicredit Bank Austria AG, Vienna
Unicredit Bank, Sofia
UniCredito Italiano SpA, Milan
Zagrebacka Banka DD, Zagreb

### (b) උතුරු ඇමෙරිකාව

Bank of Montreal, Montreal
Bank of Nova Scotia, Montreal
Canadian Imperial Bank of Commerce, Toronto
Citibank NA, New York
Deutsche Bank Trust Company Americas, New York
Habib American Bank, New York
HSBC Bank USA NA, New York
JP Morgan Chase Bank NA, New York
Mashreq Bank PSC, New York
Standard Chartered Bank, New York
The Royal Bank of Scotland NV, New York
Wells Fargo Bank NA, USA

### (c) දකුණු ඇමෙරිකාව

Banco de Chile, Santiago
Banco Santander Brazil SA, Sao Paulo
BBVA Banco Continental, Lima
Deutsche Bank, Sao Paulo

### (d) අප්‍රිකාව

ABSA Bank Ltd., Johannesburg
Bank Misr, Cairo
Barclays Bank of Kenya Ltd., Nairobi
Citi Bank, Abidjan
Mauritius Commercial Bank Ltd., Port Louis
National Bank of Egypt, Cairo
Nedbank Ltd., Johannesburg

### (e) ආසියාව

Axis Bank Ltd., Mumbai
Bank for Foreign Trade, Hanoi
Bank of Ceylon, Chennai
Bank of China, China
Bank of Communications Co. Ltd., Shanghai
Bank of Maldives, Malè
Bank of Tokyo Mitsubishi UFJ Ltd., Tokyo
China Construction Bank, Beijing
China Development Bank, Shanghai
CIMB Bank Ltd., Kuala Lumpur
DBS Bank Ltd., Singapore
Exim Bank of Korea, Seoul
Export Import Bank of China, Beijing
Hana Bank, Seoul
HSBC Bank, Hong Kong
ICICI Bank Ltd., Mumbai
Korea Exchange Bank, Seoul
Mashreq Bank PSC, Mumbai
MCB Bank Ltd., Karachi
Mizuho Corporate Bank Ltd., Tokyo
Myanmar Foreign Trade Bank, Yangon
Nepal Bank Ltd., Kathmandu
Oversea-Chinese Banking Corp. Ltd., Hong Kong
Oversea-Chinese Banking Corp. Ltd., Kuala Lumpur
Oversea-Chinese Banking Corp. Ltd., Singapore
Pubali Bank Ltd., Dhaka
Rupali Bank Ltd., Dhaka
Standard Chartered Bank, Khartoum
Standard Chartered Bank (Pakistan) Ltd., Karachi
Standard Chartered Bank, Dhaka
Standard Chartered Bank, Kathmandu
Standard Chartered Bank, Tokyo
State Bank of India, Chennai
Sumitomo Mitsui Banking Corporation, Tokyo
UBAF, Singapore
Woori Bank, Hanoi

### (f) (g) ඕෂනියා

ANZ National Bank Ltd., Wellington
Australia & New Zealand Banking Group Ltd., Melbourne
National Australia Bank Ltd., Melbourne
Westpac Bank PNG Ltd., Port Moresby
Westpac Banking Corporation, Suwa

### (h) මැද පෙරදිග

Ahli United Bank, Kuwait
Al Rajhi Banking & Investment Corporation, Riyadh
Bank Dhofar, Ruwi
Bank of Bahrain and Kuwait, Manama
Bank Muscat SAOG, Ruwi
Byblos Bank SAL, Beirut
Commercial Bank of Dubai PSC, Dubai
Commercial Bank of Qatar, Doha
Doha Bank, Doha
Emirates NBD Bank PJSC, UAE
Jordan Islamic Bank, Amman
Mashreq Bank PSC, Dubai
National Bank of Abu Dhabi, Abu Dhabi
National Bank of Oman SAOG, Muscat
UBAE S.P.A., Dubai
United Bank Ltd., UAE

# දශක පිළිබඳ කෙටි විවරණයක්

1961

1961 ජුලි 1 වැනි දින මහජන බැංකුව ආරම්භ කරන ලදී. පළමු ශාඛාව කොළඹ ඩියුක් වීදියේ විවෘත කෙරිණි. වර්ෂය තුළ කොළඹ විදේශීය ශාඛාවට අමතරව පොළොන්නරුව, හිඟුරක්ගොඩ, හම්බන්තොට, අනුරාධපුර, පුත්තලම, මාතලේ හා මහනුවර යන නගර වල තවත් ශාඛා අටක් විවෘත කරන ලදී. මුළු සේවක සංඛ්‍යාව 169 ක් විය.

1962

ප්‍රධාන කාර්යාලය කොළඹ 2 යුනියන් පෙදෙසේ රත්නම් ගොඩනැගිල්ලට ගෙන යන ලද අතර තවත් ශාඛා 17 ක් විවෘත කරන ලදී.

1963

බැංකුව සිය උකස් සේවාවන් ආරම්භ කළේය.

1964

සමූපකාර ග්‍රාමීය බැංකුකරණ යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී.

1965

බැංකුවේ අංශ කිහිපයක් කොළඹ 2 චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ රජයේ ලිපිකරු සේවා සංගමයේ ගොඩනැගිල්ලට නැවත ගෙන යන ලදී. මුළු ශාඛා සංඛ්‍යාව 48 දක්වා වර්ධනය වූ අතර හොරණ, කැකිරාව, පදවිය, මන්නාරම, ඇඹිලිපිටිය, කහටගස්දිගිලිය, රාගල හා තලවාකැලේ යන ස්ථානවල නව ශාඛා ද මේ අතරට අයත් විය.

1967

කුඩා ගොවිපල අංශයේ පුරෝගාමී ණය දෙන්නා බවට පත්වෙමින් බැංකුව නව කෘෂිකර්ම ණය යෝජනා ක්‍රමය ඇරඹුවේය.

1970

අවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය සම්පාදනය සඳහා 'අතමාරු' ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. විධිමත් ඉතිරි කරන්නන් ආකර්ෂණය කරගැනීම සඳහා ණය හා සම්බන්ධ ඉතිරි කිරීම් යෝජනා ක්‍රමයක් වන ආයෝජන ඉතිරි කිරීම් යෝජනා ක්‍රමය දියත් කෙරිණි.

1971

බැංකුවේ සියවැනි ශාඛාව මරදගහමුලදී විවෘත කරන ලදී.

1973

නිෂ්පාදන හා පරිභෝජන යන දෙවර්ගයේම ණය පහසුකම් සැපයීම පිණිස පරිපූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී. සිංහල හා දෙමළ අළුත් අවුරුදු චාරිත්‍ර තම අනන්‍යතාවට එක් කර ගනිමින් හා නැකැත් වේලාවට බැංකුව සමග ගනුදෙනු කිරීමට ගනුදෙනුකාරහවතුන් දිරිගැන්වීම පිණිස බැංකුව 'ගනුදෙනු' පිළිවෙත ආරම්භ කළේය.

1975

ආක්‍රමණශීලී බැංකු ව්‍යාප්ති වැඩසටහනක් අපගේ මුළු ශාඛා සංඛ්‍යාව 158 දක්වා ගෙන ආවේය.

1977

අපගේ දෙසියවැනි ශාඛාව කොල්ලුපිටියේ විවෘත විය. ප්‍රධාන කාර්යාලය කොළඹ කොටුවේ ගොඩනැගිල්ලකට නැවත ගෙන යන ලදී. මුළු සේවක සංඛ්‍යාව 5,000 ක් විය. ප්‍රථම ධීවර බැංකුව කොරලවැල්ලේදී විවෘත කරන ලදී.

1981

අපගේ ශාඛා ජාලය ශාඛා 290 දක්වා වර්ධනය විය. විස්තෘත බාලවයස්කාර ඉතුරුම් යෝජනාක්‍රමය දියත් කරන ලදී.

1982

බැංකුවේ තුන්සියවැනි ශාඛාව ඉංගිරියේ දී විවෘත විය. මුළු සේවක සංඛ්‍යාව 10,000 තෙක් ළඟා විය.

1984

බැංකුවේ පරිපාලිතයක් වන පීපල්ස් මර්චන්ට් බැංකුව ස්ථාපනය කරන ලදී. කොම්පඤ්ඤවීදියේ අපගේ ශාඛාව, ජාත්‍යන්තර අංශය හා කොටුව විදේශීය ශාඛාව සමග ඒකාබද්ධ කරන ලදී.

1986

පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අපගේ මධ්‍යම ප්‍රධාන කාර්යාලයේ දී හා තෝරාගත් නගර ශාඛාවල ඇරඹුණු අතර 'බිලක් ලයිට්' ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් මෙමගින් කාලය විශාල වශයෙන් ඉතිරි කිරීම සිදු විය.

1987

අපගේ මුලස්ථාන ශාඛාව බැංකුවේ පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය ශාඛාව බවට පත් විය. ග්‍රාමීය විදුලි සැපයුම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් විදුලිබල මණ්ඩලය සමග සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක කෙරිණි.

1989

සේවක අර්ථසාධක අරමුදලේ ශේෂය ඇප ලෙස තබා නිවාස ණය සැපයීම සඳහා කම්කරු අමාත්‍යාංශය අනුග්‍රාහකත්වය දක්වන ලද ණය යෝජනා ක්‍රමයකට බැංකුව සහභාගි විය. විදේශ රැකියා අපේක්ෂා කරන්නන් වෙනුවෙන් ණය සැපයීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ඒකාබද්ධව ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී. 1983 සිවිල් ගැටුමෙන් හානියට පත් වූවන්ට ණය සැපයීම සඳහා වූ REPIA විසින් දියත් කරන ලද ණය යෝජනා ක්‍රමයකට බැංකුව සහභාගි වූයේය. වර්ෂය තුළදී ජනසවිය ආශ්‍රිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ගනුදෙනු කළ හැකි ඉතුරුම් සහතික නිකුත් කිරීමද බැංකුව මෙම වර්ෂය තුළදී ආරම්භ කළේය.

1990

දායාද ඉතුරුම් තැන්පතු යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. වීසා ඉන්ටනැෂනල් සමග ඒකාබද්ධව පීපල්ස් වීසා කාඩ්පත හඳුන්වා දෙන ලද අතර ශාඛා 24 ක් පූර්ණ වශයෙන් පරිගණකගත කරන ලදී.

1991

ප්‍රථම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය අපගේ මුලස්ථාන ශාඛාවේ පිහිටුවන ලදී.

1992

රජයේ ඇඟලුම් කම්හල් 200 වැඩසටහනට බැංකුව සහාය විය. පීපල්ස් ස්වයංක්‍රීය බැංකුකරණ පද්ධතිය (PABS) නම් බැංකුව විසින්ම සකසන ලද බැංකුකරණ යෙදවුම ජීවී මෙහෙයුම් ආරම්භ කළේය.

1993

රට පුරා බැංකු ශාඛා 330 ක් ක්‍රියාත්මක වෙමින් තිබූ අතර ප්‍රධාන ශාඛා 35 ක් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය කර තිබිණි. කාන්තාවන් සඳහා ඉතුරුම් යෝජනා ක්‍රමයක් වන 'වනිතා වාසනා' හඳුන්වා දෙන ලදී.

1994

නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අටක් සවි කරන ලද අතර ස්වයංක්‍රීයකරණ වැඩසටහන යටතේ ශාඛා 160 ක් පරිගණකගත කරන ලදී.

1995

රජයේ ගුරුවරුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා නව තැන්පතු ඒකරාශී කිරීමේ හා ණය යෝජනා ක්‍රමයක් වූ 'ගුරු සෙත' අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව දියත් කරන ලදී.

1996

රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවක පිරිස් සඳහා ණය පැකේජයක් වන 'සුව සෙවන' දියත් කෙරිණි. පාසල් සිසුන් සඳහා නව තැන්පතු යෝජනා ක්‍රමයක් වූ 'සිසු උදාන' හඳුන්වා දෙන ලදී. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය හා වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය නම් ආසියානු සංවර්ධන අරමුදල් ලබන ණය යෝජනා ක්‍රම දෙකකට බැංකුව සහභාගි විය. සී/ස පීපල්ස් ලීසිං සමාගම හා සී/ස පීපල්ස් ට්‍රැවල්ස් සමාගම යන බැංකුව පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත සමාගම් මෙහෙයුම් ආරම්භ කළේය. විමධ්‍යගත පාලනය ශක්තිමත් කිරීම හා ගනුදෙනුකාර භවතුන්ට වඩා හොඳ සේවා සැපයීම උදෙසා කලාප කාර්යාල විවෘත කරන ලදී.

1997

ස්වයං රැකියා ව්‍යාපෘති වලට සහාය වීම පිණිස 'සුරතුර' ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී. ජාතික සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහායක ව්‍යාපෘති (SMEAP). යටතේ බැංකුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හා කර්මාන්ත වෙත සිය ණය පහසුකම් ව්‍යාප්ත කළේය.

## 1998

කාඩ්පත් හිමියන් 125,000 ට සේවා සපයමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 36 දක්වා වැඩි විය. ශාඛා 175 ක් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය තත්ත්වයට පත් කර තිබූ අතර උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 188 දක්වා වැඩි විය. විගමනික ශ්‍රමිකයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග හවුල්ව 'විදේශිකා' නමින් හැඳින්වෙන විශේෂ ණය හා ඉතුරුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

## 1999

තමා භාරයේ සිටින ළාබාලයන්ට ප්‍රතිලාභ සඳහා ඉතිරි කිරීමට දෙමවුපියන් හා භාරකරුවන් දිරිගන්වන තැන්පතු යෝජනා ක්‍රමයක් වන 'ඉසුරු උදාන' බැංකුව දියත් කළේය.

## 2000

ජන ජය ඉතුරුම් හා ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී. අළුතින් හඳුන්වා දෙන ලද 'ජය ශ්‍රී' දිනුම් ඇදීම තැන්පත්කරුවන්ට ආකර්ෂණීය ත්‍යාග පිරිනැමුවේය. රට පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 74 තෙක් ව්‍යාප්ත විය. PABS ශාඛා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සම්බන්ධ කිරීම සඳහා මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරුව හඳුන්වා දෙන ලදී.

## 2001

පෞද්ගලික බැංකු අංශයෙන් ඇතැම් අංශ ප්‍රධානීන් බඳවාගැනීම මගින් බැංකුවේ ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම ශක්තිමත් කරන ලදී. උපාය මාර්ගික සැලැස්මක් දියත් කිරීම හරහා බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමට මුලපුරන ලදී. මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 90 තෙක් වර්ධනය විය.

## 2002

PABS හි ස්වයංක්‍රීයකරණය කරන ලද ශාඛා සංඛ්‍යාව 218 තෙක් ඉහළ නැංග අතර ශාඛා 119 ක් මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මාරුවට සම්බන්ධ කෙරිණි. භාණ්ඩාගාර ස්වයංක්‍රියකරණ පැකේජය ක්‍රියාත්මක කරන ලදී.

## 2003

බැංකුවේ 11 වන ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරී අශෝක ද සිල්වා මහතා 2003 පෙබරවාරි 1 වැනි දින වැඩ භාරගත්තේය. යොවුන් විධායක ඉතිරිකරන්නන්ගේ (YES) ගිණුම දියත් කරන ලදී. ප්‍රධාන කාර්යාල ඇතුළු තෝරාගත් ශාඛා 60 ක මූලික වශයෙන් ක්‍රියාත්මක වූ අති නවීන බැංකුකරණ පැකේජයක් හා වෙළඳ සේවා විසඳුම් ස්ථාපනය කිරීම සඳහා බැංකුව මලයාසියාවේ සිල්වර් ලේක් සිස්ටම් SDV BUD සමග ගිවිසුමක් අත්සන් කළේය.

## 2004

ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර දියත් කරන ලද 2004 - 2008 සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මේ දෙවැනි අදියර ආසියානු සංවර්ධන බැංකුවේ යළි මුදල් ආයෝජන සහාය මත පදනම් විය. බැංකුව ප්‍රථම වතාවට BBB + පොදු තත්ත්වාගණනය ෆිච් රේටිංස් ලංකා වෙතින් ලබා ගත්තේය. හර බැංකුකරණ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

## 2005

බැංකුවේ 15 වැනි සභාපති වශයෙන් ආචාර්ය පී. ඒ. කිරිවන්දෙනිය මහතා 2005 දෙසැම්බර් මස මුලදී වැඩ භාරගත්තේය. ඉන් සුළු කාලයකට පසුව රජය, ආසියානු සංවර්ධන බැංකුවේ සහ මහජන බැංකුව අතර අත්සන් තබන ලද ගිවිසුමකට අනුකූලව ශ්‍රී ලංකා රජය විසින් බැංකුවේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ආයෝජන ප්‍රථම වාරිකය ලෙස රු. බිලියන 2 ක් ලැබිණි. හර බැංකුකරණ ව්‍යාපෘතිය ශාඛා ජාලය හරහා තවදුරටත් ව්‍යාප්ත කෙරිණි. 2004 දෙසැම්බර් මස සුනාමියේ බලපෑමට ලක්වූවන්ගේ ජීවිත, නිවෙස් හා ව්‍යාපාර ගොඩනැගීම සඳහා රජයෙන් ප්‍රදානය කරන ලද මූල්‍ය සහාය ගෙන ඒමේදී බැංකුව ප්‍රධාන අතරමැදියෙකු විය.

## 2006

සිය පෙර තත්ත්වාගණන මට්ටමේ සිට ප්‍රගතියක් දක්වමින්, බැංකුව සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් A තත්ත්වාගණනයක් ලබා ගත්තේය.

ශ්‍රී ලංකා අලෙවි ආයතනය විසින් සිදු කරන ලද සම්මාන ප්‍රදානයේදී බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ 2006 POP සම්මානයෙන් මහජන බැංකුව පිදුම් ලැබුවේය. ශ්‍රී ලංකා රජයෙන් ලද දෙවැනි ප්‍රාග්ධන වාරිකය වූ රු. බිලියනය ලැබිණි.

## 2007

බැංකුවේ 16 වැනි සභාපතිවරයා වූ ඩබ්ලිව්. කරුණාජීව මහතා 2007 මැයි මස දී වැඩ භාරගත්තේය. ෆිච් රේටිංස් වෙතින් ලද A තත්ත්වාගණන මට්ටම වර්ෂය තුළ පවත්වා ගන්නා ලදී. ශ්‍රී ලංකා රජය තෙවැනි ප්‍රාග්ධන වාරිකය වූ රු. බිලියන 1.5 බැංකුවට ලබා දුන්නේය. පිට පිට දෙවැනි වසරටත් වසරේ බැංකුකරණ හා මූල්‍ය සේවා සන්නාමය වෙනුවෙන් ජනතා සම්මානය මහජන බැංකුව විසින් දිනාගන්නා ලදී. 2007 වර්ෂයේදී බැංකුව මුළු තැන්පතු වල රු. බිලියන 300 සීමාව බැංකුව විසින් ඉක්මවන ලදී.

## 2008

බැංකුවේ 12 වන ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරී වශයෙන් එච්. වික්‍රමසිංහ මහතා වැඩ භාරගත්තේය.

ශ්‍රී ලංකා රජය හතරවැනි ප්‍රාග්ධන වාරිකය නිදහස් කළේය. වර්ෂයේ අවසානය වන විට බැංකුව 10.5% ප්‍රාග්ධන ප්‍රමාණවත් බව මට්ටමට ළඟා විය. තවද, රු. බිලියන 2.5 ක ක බැංකුවේ ප්‍රථම ණයකර නිකුතුව මෙම වර්ෂයේදී සිදු කරන ලදී.

විදේශයන්හි සිට මිනිත්තු ගණනකින් මුදල් ප්‍රේෂණය කිරීම සඳහා, නවතම තාක්ෂණයේ සහාය ඇති වෙබ් අඩවි පාදක ප්‍රේෂණ නිපැයුමක් වූ 'පීපල්ස් ඊ රෙමිටන්ස්' හඳුන්වා දීමත් සමග, බැංකුවේ ප්‍රේෂණ සේවාවෙහි කැපී පෙනෙන දියුණුවක් ඇති විය. නව විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු නිපැයුම් දෙකක්, එනම් ළමුන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු නිපැයුමක් වන 'දූ දරු එතෙර ඉසුර' හා 'විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම' [SFIDA]. දියත් කෙරිණි.

## 2009

බැංකුවේ 13 වැනි ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී පී. වී. පතිරණ මහතා 2009 ජනවාරි මසදී වැඩ භාරගත්තේය.

රු. බිලියන 2.5 ක් සඳහා සිය දෙවැනි ණයකර නිකුතුව බැංකුව මෙම වර්ෂයේ දී සිදු කළේය.

ශාඛා 214 ක් හා සේවා මධ්‍යස්ථාන 236 ක් අන්තර් ජාලය මගින් සම්බන්ධ කරනු ලැබිණි. බැංකුව දිවයින පුරා ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 300 ක් උපායමාර්ගික ලෙස ස්ථානගත කළේය.

මුළු තැන්පතු රු. බිලියන 400 ක් විය.

බදුවලට පෙර ඉහළම ලාභය වූ රු. මිලියන 6.1 සාක්ෂාත් කරගන්නා ලදී. බැංකුවේ ඉතිහාසයේ ප්‍රථම වතාවට 2008 වාර්ෂික වාර්තාව වෙනුවෙන් දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) සම්මානයක් ලැබිණි.

## 2010

2010 ඔක්තෝබර් මසදී එච්. එස්. ධර්මසිරි මහතා බැංකුවේ 14 වැනි ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස වැඩ භාර ගත්තේය.

ශාඛා ජාලය හා සේවා මධ්‍යස්ථාන 679 දක්වා පුළුල් විය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 330 දක්වා වර්ධනය විය.

2010 ජූලි මාසයේදී පීපල්ස් ඉන්ටනැෂනල් වීසා හර කාඩ්පත දියත් කරන ලදී.

බැංකුව, සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් AA- හා රැම් රේටිංස් වෙතින් AAA තත්ත්වාගණනයක් ලබා ගත්තේය.

2010 වර්ෂය තුළදී මුළු තැන්පතු අගය රු. බිලියන 462 ඉක්මවූයේය.

බදුවලට පෙර ඉහළම ලාභය වූ රු. මිලියන 8.7 අත් කරගන්නා ලදී.

නිව්යෝක් නගරයේ පැවති සම්මාන උළෙලේදී මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් ARC ස්වර්ණ සම්මාන දෙකක් පිරිනමන ලදී.

2009 වාර්ෂික වාර්තාව වෙනුවෙන් රාජ්‍ය අංශය කාණ්ඩයේ ප්‍රථම ස්ථානය සඳහා SAFA සම්මානය දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනය වෙතින් බැංකුවට ලැබිණි.

## 2011

බැංකුවේ 15 වැනි ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී වශයෙන් එන්. වසන්ත කුමාර් මහතා 2011 පෙබරවාරි මස 22 වැනි දින එම ධූරයට පත් විය.

2011 ජූලි 1 වැනි දින බැංකුව සිය ස්වර්ණ ජුබිලිය උත්සවාකාරයෙන් සැමරුවේය.

මුළු ශාඛා ජාලය 714 ක් වූ අතර දිවයිනේ සියලු පෙදෙස් ආවරණය කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටීම් 382 දක්වා
වර්ධනය විය.

AA (ස්ථාවර) උත්ශ්‍රේණිගත තත්ත්වාගණනයක් සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් බැංකුවට ලැබිණි.

බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා අත්තිකාරම් පිළිවෙළින් රු. බිලියන 663, රු. බිලියන 539 හා රු. බිලියන 478 ඉක්මවීය. බදුවලට පෙර ඉහළම ලාභය වූ රු. බිලියන 15.3 ක් හා බදුවලට පසු ලාභය රු. බිලියන 10.2 ක් අත් කරගන්නා ලදී.

බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනප්‍රිය බැංකුව ලෙස ස්ලිම් නීල්සන් ජනතා සම්මානය, වසරේ සේවා සන්නාමය - ස්ලිම් නීල්සන් ජනතා සම්මානය දිනාගත් මහජන බැංකුව සේවා කාණ්ඩයේ ලෝකඩ සමමානයද 2011 ස්ලිම් සන්නාම විශිෂ්ටත්ව සම්මාන උළෙලේදී දිනාගත්තේය.

## 2012

මුළු ශාඛා ජාලය 728 දක්වා ළඟා වූ අතර දිවයිනේ සියලු පෙදෙස් ආවරණය කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටීම් 420 තෙක් වර්ධනය විය. සී. ෆිච් රේටිංස් ලංකා වෙතින් AA + (ස්ථාවර) උත්ශ්‍රේණිගත තත්ත්වාගණනයක් බැංකුව ලබා ගත්තේය. බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා අත්තිකාරම් පිළිවෙලින් රු. බිලියන 873, රු. බිලියන 683 හා රු. බිලියන 660 ඉක්මවිය.

2012 ජාත්‍යන්තර වාර්ෂික වාර්තා සමාගම් (ARC) සම්මාන උළෙලේදී බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව සඳහා එක් සුපිරි සම්මානයක් (Grand Award) හා ස්වර්ණ සම්මාන තුනක් දිනා ගත්තේය.

## 2013

ගාමිණී එස්.සෙනරත් මහතා 2013 පෙබරවාරි මාසයේදී බැංකුවේ 17වන සභාපති වශයෙන් වැඩ භාරගත්තේය.

දිවයිනේ විවිධ ප්‍රදේශවල කුඩා සහ මධ්‍ය ප්‍රමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන 23ක් පිහිටුවන ලදී.

වර්ෂය තුළ, ගෝලීය වශයෙන් වීසා බලයලත් වෙළඳුන් මිලියන 30 වැඩි සංඛ්‍යාවක් වෙත ප්‍රවේශය ඇතිව කාඩ් මිලියන 1ක් වන වැදගත් සීමාව ඉක්මවා යනු ලැබිය.

සේ.අ.අ., සේ.හා.අ. සහ රේගු ගාස්තු ගෙවීම පිණිස, මාර්ගගත තත්කාල ගෙවීම් පහසුකම, ආයතනික ගනුදෙනුකරුවන්ට ලබා දෙන ලදී.

ජාතික පොදු ඒ.ටී.එම්. ස්විච් පද්ධතියට සම්බන්ධ කරනු ලැබූ පළමුවන බැංකුව බවට මහජන බැංකුව පත්විය. A.T.M. පිහිටි ස්ථාන 460 දක්වා වැඩිවූ අතර, ශාඛා ජාලය 735 දක්වා ව්‍යාප්ත විය.

බැංකුවේ හතරවන ණයකර නිකුත් කිරීමේදී, වර්ෂය තුළ රු. බිලියන 5 ක් වටිනා ණයකර නිකුත් කරන ලදී.

# කාර්යසාධන සමාලෝචනය 2004-2013

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | නව ශ්‍රී ලං.ගි.ප්‍ර. පදනම මත | | |
| *(ශ්‍රී ලංකා රු. මි.)* | | | | | | | | | | |
| **වත්කම්** | | | | | | | | | | |
| මුදල් සහ කෙටිකාලීන අරමුදල් | 55,386 | 65,592 | 47,191 | 57,090 | 39,663 | 83,973 | 87,062 | 52,510 | 67,814 | **59,143** |
| ආයෝජන | 31,978 | 50,583 | 62,682 | 61,095 | 80,109 | 84,807 | 82,688 | 129,977 | 175,491 | **226,075** |
| ණය හා අත්තිකාරම් (ශුද්ධ) | 122,477 | 142,497 | 207,138 | 238,293 | 248,626 | 283,760 | 357,336 | 461,656 | 611,414 | **619,830** |
| දේපල, පිරියත හා උපකරණ | 4,756 | 4,862 | 8,936 | 8,414 | 8,362 | 7,939 | 8,385 | 7,523 | 8,235 | **14,706** |
| වෙනත් වත්කම් | 9,451 | 11,727 | 12,608 | 15,691 | 20,787 | 15,766 | 12,144 | 10,412 | 10,343 | **10,832** |
| **මුළු වත්කම්** | 224,048 | 275,262 | 338,555 | 380,584 | 397,548 | 476,245 | 547,616 | 662,077 | 873,296 | **930,585** |
| **බැරකම්** | | | | | | | | | | |
| ගනුදෙනුකාර තැන්පතු | 185,643 | 225,600 | 269,947 | 300,956 | 324,489 | 396,158 | 462,140 | 550,226 | 683,951 | **762,249** |
| බැංකුවලින් සහ වෙනත් ණය ගැනීම් | 24,925 | 29,134 | 35,840 | 49,063 | 33,714 | 36,884 | 39,132 | 64,053 | 135,150 | **102,148** |
| වෙනත් බැරකම් | 13,514 | 16,512 | 22,496 | 17,670 | 20,965 | 20,404 | 20,505 | 14,709 | 14,991 | **14,619** |
| ණයකර | – | – | – | – | 2,500 | 5,000 | 5,000 | 10,000 | 10,000 | **15,033** |
| **මුළු බැරකම්** | 224,082 | 271,246 | 328,283 | 367,689 | 381,668 | 458,445 | 526,778 | 638,988 | 844,092 | **894,048** |
| ප්‍රාග්ධන සහ සංචිත | (34) | 4,017 | 10,271 | 12,895 | 15,880 | 17,800 | 20,838 | 23,089 | 29,205 | **36,537** |
| **සමස්ත කොටස් සහ බැරකම්** | 224,048 | 275,262 | 338,555 | 380,584 | 397,548 | 476,245 | 547,616 | 662,077 | 873,296 | **930,585** |
| බැඳීම් සහ අවිනිශ්චිත අවස්ථා | 30,060 | 45,177 | 39,450 | 74,222 | 138,989 | 100,867 | 131,751 | 190,732 | 207,021 | **197,119** |
| **මෙහෙයුම්** | | | | | | | | | | |
| දළ ආදායම | 22,601 | 27,202 | 35,131 | 47,984 | 58,948 | 69,050 | 62,532 | 68,298 | 94,777 | **120,456** |
| සමස්ත මෙහෙයුම් ආදායම | 13,705 | 14,784 | 19,509 | 21,442 | 24,456 | 30,635 | 31,897 | 36,431 | 43,310 | **46,530** |
| මුළු පොදු කාර්ය | 10,362 | 11,070 | 15,038 | 15,736 | 17,159 | 19,719 | 21,305 | 20,421 | 24,186 | **22,509** |
| බදුකරණයට පෙර ලාභය | 2,463 | 4,035 | 4,079 | 5,002 | 5,664 | 6,076 | 8,771 | 15,600 | 15,249 | **10,304** |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 377 | 1,263 | 922 | 2,628 | 2,959 | 2,755 | 3,565 | 5,154 | 4,355 | **2,816** |
| බදුකරණයට පසු ලාභය | 2,086 | 2,772 | 3,157 | 2,374 | 2,705 | 3,320 | 5,206 | 10,446 | 10,894 | **7,488** |
| **කාර්යසාධන දර්ශක** | | | | | | | | | | |
| සේවක සංඛ්‍යාව (ස්ථිර) | 9,592 | 9,531 | 9,645 | 8,416 | 8,587 | 8,863 | 8,399 | 8,249 | 7,823 | **7,409** |
| වත්කම් මත ප්‍රතිලාභ (%) (බදුවලට පෙර) | 1.2 | 1.6 | 1.3 | 1.4 | 1.5 | 1.4 | 1.7 | 2.6 | 2.0 | **1.1** |
| සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ (%) | (289.0) | 139.2 | 44.2 | 20.5 | 18.8 | 19.7 | 26.9 | 49.2 | 41.7 | **22.8** |
| පිරිවැය/ආදායම් අනුපාතය (%) | 73.1 | 72.7 | 73.8 | 68.7 | 65.4 | 60.6 | 60.2 | 56.1 | 55.8 | **48.4** |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (CAR) (%) | (2.3) | 1.9 | 5.6 | 6.9 | 10.5 | 13.4 | 12.8 | 14.8 | 14.0 | **15.0** |

| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | නව ශ්‍රී ලං.ගි.ප්‍ර. පදනම මත | | |
| *(ශ්‍රී ලංකා රු. මි.)* | | | | | | | | | | |
| **එක් සේවකයෙකුට** | | | | | | | | | | |
| තැන්පතු | 19,354 | 23,670 | 27,988 | 35,760 | 37,788 | 44,698 | 55,023 | 66,702 | 87,428 | **102,881** |
| අත්තිකාරම් | 12,769 | 14,951 | 21,476 | 28,314 | 28,954 | 32,016 | 42,545 | 55,965 | 78,156 | **83,659** |
| දළ ඉපැයුම් | 2,356 | 2,854 | 3,642 | 5,702 | 6,865 | 7,791 | 7,445 | 8,280 | 12,115 | **16,258** |
| බදුවලට පසු ලාභය | 217 | 291 | 327 | 282 | 315 | 375 | 620 | 1,266 | 1,393 | **1,011** |
| *(ශ්‍රී ලංකා රුපියල්)* | | | | | | | | | | |
| එක් කොටසකට | | | | | | | | | | |
| බදුකරණයට පසු ලාභය | 2,086 | 2,772 | 3,157 | 2,374 | 2,705 | 3,320 | 5,206 | 10,446 | 10,894 | **7,488** |
| මුළු වත්කම් | 224,048 | 275,262 | 338,555 | 380,584 | 397,547 | 476,245 | 547,616 | 662,077 | 873,296 | **930,585** |
| ශුද්ධ වටිනාකම | (34) | 4,017 | 10,271 | 12,895 | 15,880 | 17,800 | 20,838 | 23,089 | 29,205 | **36,537** |

| **කලින් ශ්‍රී ලං.ගි.ප්‍ර. පදනම් කරගත්** | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අක්‍රිය ණය අනුපාතය (දළ) (%) | 14.1 | 11.0 | 7.1 | 5.9 | 6.8 | 6.7 | 5.0 | 3.4 | 2.8 | **5.3** |
| අක්‍රිය ණය අනුපාතය (ශුද්ධ) (%) | 2.4 | 1.8 | 0.9 | 0.7 | 1.6 | 2.0 | 1.3 | 0.5 | 0.4 | **2.0** |
| අක්‍රිය ණය ආවරණ අනුපාතය (%) | 83.0 | 83.9 | 87.1 | 88.0 | 75.7 | 70.6 | 73.6 | 81.5 | 84.0 | **61.8** |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ෆිච් ශ්‍රේණිගත කිරීම | BBB+ | BBB+ | A- | A- | A- | A | AA- | AA | AA+ | **AA+** |
| RAM ශ්‍රේණිගත කිරීම | | | | | | | AAA | AAA | AAA | **AAA** |

# මූල්‍ය/බැංකුකරණ යෙදුම් පාරිභාෂික ශබ්ද මාලාව

### ගිණුම්කරණ ප්‍රතිපත්ති
ආයතනයක මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා වාර්තා කිරීමේදී එහි කළමනාකරුවන් විසින් තෝරාගෙන, නොවෙනස්ව අනුගමනය කළයුතු ප්‍රතිපත්ති, රීති හා පිළිවෙත්ය.

### උපචිත පදනම
ගනුදෙනු හා වෙනත් සිදුවීම් සිදුවූ කල්හි, මුදල් හෝ ඊට සමාන කමක් ලැබීමක් හෝ ගෙවීමක් ගැන නොසලකා, එම ගනුදෙනුවෙහි ප්‍රතිඵලය කෙරෙහි සැලකිල්ල දැක්වීමයි.

### ක්‍රමක්ෂය
අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ආයුකාලය මතට, ක්ෂයවියහැකි අගයක් ක්‍රමානුකූලව වෙන් කිරීමයි. ක්ෂය කිරීම හා හිලව් කිරීම යන දෙකෙහිම ඇත්තේ එකම තේරුමකි.

### ක්‍රමක්ෂය කරනලද පිරිවැය
ප්‍රධාන ආපසු ගෙවීම් අඩු කළ මුළු මුදල් ප්‍රමාණය හා කල්පිරීමේදී මුදල් ප්‍රමාණය අතර යම් වෙනසකට ඵලදායක පොළී ක්‍රමය භාවිතා කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කළ හෝ අඩු කළ හා අක්‍රියවීම හෝ ලබාගත නොහැකිවීම හේතුවෙන් යම් අඩු කිරීමක් (සෘජුව හෝ දීමනා ගිණුමක් භාවිතා කිරීමෙන්) වේ නම් එය අඩු කළ මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය බැරකමක් මුල් හඳුනාගැනීමේදී මනිනු ලබන ප්‍රමාණය.

### ආශ්‍රිත සමාගම්
ප්‍රධාන හෝ පාලක සමාගමක ආධාරක සමාගමක් නොවුවද, එහි කාර්යයන්ට සහභාගිවීමට අයිතියක් ඇතිවාක් මෙන්ම, එහි මෙහෙයවුම් හා මූල්‍ය ප්‍රතිපත්ති කෙරෙහි ප්‍රමාණවත් බලපෑමක් සිදුකළහැකි සමාගමකි.

### අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම්
අලෙවිය සඳහා ඇති යනුවෙන් නම් කර ඇති හෝ (අ) ණය හා ලැබිය යුතු (ආ) කල්පිරීම තෙක් රඳවාගන්නා ආයෝජන හෝ (ඇ) ලාභය හෝ අලාභ මගින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණයකර නැති මූල්‍ය වත්කම්.

### වට්ටම්කරණ ලද බිල්පත
පොරොන්දු සටහන් පතක හෝ විනිමය බිල්පතක, මුහුණත වටිනාකමට අඩුවෙන් එම බිල්පත හෝ සටහන්පත මිලදී ගන්නා අතර, එම මිල වෙනස, බිල්පතෙහි වලංගු කාලය මත පොළිය ලෙස සැලකේ. පරිණතවූ කල්හි, එම බිල්පතෙහි මුහුණත අගය, එහි හිමිකරුට සිය ගිණුමට හරකළ හැකි වෙයි.

### විනිමය බිල්පත
කෙනෙකු විසින් වෙනත් කෙනෙකුට කිසියම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස, අත්සන සහිතව මෙන්ම ලිඛිතව හා කොන්දේසි විරහිතව, තවත් කෙනෙකු ආමන්ත්‍රිත නියමයකි. විනිමය බිල්පත් හා අණකර යන වාග් මාලා බොහෝවිට එකිනෙක මාරුකරමින් භාවිත කෙරේ.

### ඉල්ලුම් තැන්පතු හෝ ඉල්ලුම් මුදල්
ඉල්ලා සිටිනවිට ආපසු ලබාදියයුතු, තාවකාලික වශයෙන් දෙනු ලැබූ, තැන්පතු හෝ අරමුදල්ය.

### ප්‍රාග්ධන ප්‍රමාණවත් බව
කිසියම් බැංකුවක පවත්නා අරමුදල් ප්‍රමාණය අනුව, තමන්ගේ තැන්පත්කරුවන්ගේ හා සෙසු ණය හිමියන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට ඇති හැකියාවයි. ජාත්‍යන්තර සමථකරණය සඳහා වන බැංකුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතා පරිදි දේශීය බැංකු විසින්, නියමිත අවම ප්‍රාග්ධනයක් පවත්වා ගතයුතුය.

### ණය අවදානම්
මූල්‍ය උපකරණයක එක් පාර්ශ්වයක් බැඳීම අනුව කටයුතු කිරීමට අපොහොසත් වීමෙන් අනෙක් පාර්ශ්වයට මූල්‍යමය අලාභයක් ඇති කිරීමේ අවදානම.

### ප්‍රාග්ධන 1 වන ස්ථරය
### (හර ප්‍රාග්ධනය)
ප්‍රාග්ධන අරමුදල්වල තෝරාගත් අයිතමයන්, හර ප්‍රාග්ධනයට අයත් වෙයි. ප්‍රධාන හර ප්‍රාග්ධන අයිතමයන් නම්, කොටස් ප්‍රාග්ධනය, කොටස් මුදල, ව්‍යවස්ථාපිත සංචිත අරමුදල, රඳවාගනු ලැබූ ලාභයන්, සාමාන්‍ය සංචිතයන්, ස්ථාවර හා දිගුකාලීන ආයෝජන විකුණා බදුගෙවූ පසු ඉතිරිවන අතිරික්තය/අලාභය ආදියයි.

### ප්‍රාග්ධන 2 වන ස්ථරය
### (අතිරේක ප්‍රාග්ධනය)
අතිරේක ප්‍රාග්ධනයට අයත්වනුයේ අනුමත කරන ලද ප්‍රතිඇගයීම් සංචිතයන්, සාමාන්‍ය ප්‍රතිපාදනයන්, දෙමුහුන් (ණය/හිමිකම්) ප්‍රාග්ධන අයිතමයන් සහ අනුමත කරනලද උපකාරක කාලණය ආදියයි.

### මුදල් සමානයන්
යම් නියමිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කරගත හැකි වන්නාවූද, අගය වෙනස්වීමේ අවදානමට ඉතා මඳ වශයෙන් භාජනය වියහැකිවූද, කෙටිකාලීන මෙන්ම, බෙහෙවින් ද්‍රවශීලී වූ ද ආයෝජනයන් ය.

### තැන්පතු සහතික
තැන්පතු අරමුදලක් සඳහා ගෙවියයුතු පොළී අනුපාතිකයන්ද, එම අරමුදල නැවත තැන්පත්කරුට ගෙවීමට නියමිත දිනයද සඳහන්ව, බැංකුවක් විසින් තැන්පත්කරුවකුට නිකුත් කරනු ලබන සහතිකයයි. මෙම සහතික බොහෝ විට ගනුදෙනු කළ හැකිය.

### වාණිජ පත්‍රය
බැංකුව මගින් සහ ණය වටිනාකම සහිත ආයතනික ණය ලබාගන්නන් විසින් නිකුත් කෙරෙන, සුරක්ෂිතභාවයෙන් තොර, කෙටිකාලීන පොරොන්දු සටහන් පතකි.

### බැඳීම්
සේවාලාභියෙකු වෙනුවෙන් අනුමත කරනලද නමුත්, ශේෂ පත්‍ර දිනයවන විට, ප්‍රයෝජනයට නොගන්නාලද ණය පහසුකම්ය.

### අසම්භව්‍යතාවන්
කිසියම් අවිනිශ්චිත අනාගත සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක්, සිදුවීම හෝ නොසිදුවීම තුළින් පමණක් තහවුරු කළහැකි, ලාභය හෝ පාඩුව අවසාන ප්‍රතිඵලය සේ ගැනෙන තත්ත්වයක් නැතහොත් අවස්ථාවකි.

### ආයතනික පාලනය
ආයතනික ඒකකයන් පාලනය කිරීමේ ක්‍රියාවලියයි. ආයතනයක කළමනාකරණය හා ගමන් මග මෙන්ම, එහි විධායක කාර්යයන් හා එහි හිමිකරුවන් සහ වෙනත් අය කෙරෙහි පවත්නා වගකීම අධීක්ෂණය කිරීමද සම්බන්ධයෙන් බලතල භාවිත කිරීමේ ක්‍රමවේදය මේ හා අදාළ වන්නේය.

### අනුරූප බැංකුව
වෙනත් බැංකුවක නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරන බැංකුවකි. සමරූපී බැංකුවක් පිහිටා තිබෙන ප්‍රදේශයේ, සෙසු බැංකු වෙනුවෙන් පුළුල් හා විවිධත්වයෙන් යුත් බැංකු සේවාවන් සාමාන්‍ය වශයෙන් සම්පාදනය කිරීමේ කාර්යයෙහි එය නිරත වන්නේය.

### පිරිවැය ආදායම අනුපාතය
ශුද්ධ ආදායමෙහි ප්‍රතිශතය ලෙස ගැනෙන මෙහෙයුම් වියදම්ය.

### ප්‍රතිපාර්ශ්වය
කිසියම් ගනුදෙනුවක් සිදුකරන හෝ පියවන (බැංකුවක්වුවද ඇතුළුව) දෙවන පාර්ශ්වයයි.

### දේශයික අවදානම
කිසියම් දේශයක්/රටක් තුළ, ණය ලබාගන්නන්ට ණය ලබාදීමේදී අදාළ වන ණය අවදානමයි. ඇතැම්විට, ස්වෛරීයත්ව අවදානම්ද මෙයට ඇතුළත්විය හැකිය.

### හරස් අනුපාතය
එකම ව්‍යවහාර මුදලක් හා අදාළව, එකිනෙකට වෙනස් මිල කැඳවීම් දෙකක් අතරින් ගණනය කරනු ලබන, විදේශ විනිමය අනුපාතිකයයි.

### ව්‍යවහාර මුදල් හුවමාරුව
කිසියම් ව්‍යවහාර මුදල් දෙවර්ගයක ප්‍රධාන ප්‍රමාණයන් ප්‍රවර්තනව මාරුකිරීමේදී, ඒ හා අදාළවන්නාවූ ගිවිසුමෙහි, නැවත පසුදිනෙක එම මාරුව හැරගැනීමටත්, එසේ මාරුව හැරගන්නා දිනය දක්වා නියමිත පොළිය ගෙවීමටත් සඳහන්කරනු ලැබීම මෙයින් අදහස් කෙරේ.

### විලම්බිත බදු
වෙනත් ඉදිරි වර්ෂයක ගෙවීමට සිදුවන බදු මුදල්, ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි වෙන්කර තැබීමය.

### ක්ෂය වීම
වත්කමක ක්ෂය වන ප්‍රමාණය එහි ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමානුකූල විභජනය.

### ව්‍යුත්පන්නය
නිශ්චිත භාණ්ඩයක්, බැඳුම්කරයක්, ස්කන්ධයක් හෝ ව්‍යවහාර මුදල් විශේෂයක් හා සමග දැඩි සබඳතාවක් සහිත මිලක් හා අදාළ මූල්‍ය උපකරණයකි.

**අතරමැදිහරණය**
මෙය බහුල ලෙස භාවිතවනුයේ, ණය ලබා ගන්නන් බැංකු ක්ෂේත්‍රයෙන් ණය ලබාගනු වෙනුවට, ප්‍රාග්ධන වෙළඳපොළෙන් සෘජුවම අරමුදල් සපයා ගැනීම විස්තර කිරීමටය. මෙය සාමාන්‍යයෙන් සිදු කරනු ලබනුයේ, ණය ලබාගැනීමට ඉතා ශක්තිමත් පසුබිමක් ඇත්තවුන් විසිනි.

**ලේඛනගත බිල්පත්**
බඩු පැටවුම්පත, ඉන්වොයිසිය සහ රක්ෂණ සහතිකයවැනි විවිධ ලේඛන සමග ඉදිරිපත් කෙරෙන විනිමය බිල්පතයි.

**ලේඛනගත ණය**
ගෙවීම් සිදුකිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන නියම කෙරෙන, ණයවර ලිපියයි.

**අණකරය**
විනිමය බිල්පත් සමග මෙය නිරන්තරයෙන් සඳහන්කරනු ලැබුවද, ඇතැම්විට හා වඩාත් නිශ්චිතව මෙය භාවිතවනුයේ, අන්තර් බැංකු බිල්පත් සම්බන්ධයෙනි.

**ඵලදායක පොළී ක්‍රමය**
මූල්‍ය වත්කමක හෝ මූල්‍ය බැරකමක ක්‍රමක්ෂය කරනලද පිරිවැය ගණනය කර අදාල කාලපරිච්ඡේදය පුරා පොළී ආදායම හෝ පොළී වියදම විභාජනය කිරීම

**සාමාන්‍ය කොටස් උපකරණය**
යම් ආයතනයක බැරකම් සියල්ල අඩු කිරීමෙන් පසුවද වත්කම්වල ශේෂ බැඳියාවක් දක්වන යම් ගිවිසුමක්

**සාධාරණ අගය**
දැනුමක් හා කැමැත්තක් ඇති, පාර්ශ්ව දෙකක් අතර අතේ දුරින් සිදුවන ගනුදෙනුවකදී වත්කමක් හුවමාරු කළහැකි හෝ බැරකමක් නිරවුල් කළ හැකි පාදක මුදල

**ස්ථාවර අය කිරීම්**
නිශ්චිත දේපලක් - සාමාන්‍ය වශයෙන් සින්නක්කර හෝ බදු දේපලක්, හෝ පිරියත හා යන්ත්‍රසූත්‍ර ආදිය හෝ සම්බන්ධ නිත්‍යානුකූල උකසක් වෙනුවෙන් කරනු ලබන අය කිරීමයි

**මූල්‍ය උපකරණය**
එක් ආයතනයක මූල්‍ය වත්කමක් හා තවත් ආයතනයක මූල්‍ය බැරකමක් හෝ සාමාන්‍ය කොටස් උපකරණයක් පැන නැගීමට හේතුවන යම් ගිවිසුමක්

**චංචල අය කිරීම්**
කෙනෙකුගේ යම් තොගයක්, හෝ ණයකරුවන් නැතහොත් මුදල්වැනි දේපලක් හෝ සම්බන්ධ අත්තිකාරමක සුරක්ෂිතභාවය වෙනුවෙන්, ණය දෙන සමාගමක් විසින් කරනුලබන අය කිරීම මෙයින් හැඳින්වෙන අතර, ඒ අනුව, එම සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් වශයෙන්, එම වත්කම් භාවිත කිරීමට හෝ සුදුසු පරිදි යොදා ගැනීමට හෝ අදාළ සමාගමට අවසරය ඇත.

**විදේශ විනිමය ආදායම**
ශේෂ පත්‍රයක විදේශ ව්‍යවහාර මුදලින් වාර්තාවී ඇති වත්කම් හා වගකීම්, එම ශේෂ පත්‍රයේ දැක්වෙන දිනයේ පැවති අනුපාතය අනුව, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේදී ලැබෙන ආර්ථික වාසිය මෙහිලා ගැනෙන අතර, මෙකී අනුපාතය ආරම්භයේදී හෝ පෙර ශේෂ පත්‍රයේ සඳහන් දිනයේදී හෝ පැවති අනුපාතයට වඩා වෙනස් වියහැකිය. විදේශ ව්‍යවහාර මුදල් විකිණීමෙන් ද විදේශ විනිමය ආදායම උපයාගැනීමට පිළිවන.

**ඉදිරි ගිවිසුම් (කොන්ත්‍රාත්තු)**
මෙම ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුකූලව, අදාළ පාර්ශ්වයන් විසින් නිශ්චිත ඉදිරි දිනකදී, කිසියම් හුවමාරුවක් සිදුකිරීම සඳහා බැඳී සිටීමේ පොරොන්දුවයි.

**ඉදිරි අනුපාතයන්**
තත්කාලීන දිනයෙන් ඔබ්බෙහි දිනයකද පරිණතවූ විට, ව්‍යවහාර මුදලෙහි මිල මෙයින් අදහස් කෙරේ. ඉදිරි අනුපාතයන්, තත්කාලීන දිනයෙහි අනුපාතයට සමාන හෝ අසමාන විය හැකිය. සමානවූ කල්හි, ඉදිරි අනුපාතය ඒකාන්තවන අතර, අසමාන වූ කල්හි, මුල් මුදලට වඩා මිල වැඩිවීම හෝ වට්ටමක්සේ මිල අඩුවීම සිදුවන්නේය.

**ඉදිරි අනුපාත ගිවිසුම්**
(ලන්ඩන්හි අන්තර් බැංකු පිරිනැමු අනුපාතිකයන්වැනි) කිසියම් පොළී අනුපාතික සුචියක් සහ එකඟවූ ස්ථාවර අනුපාතිකයක් අතර වෙනස පදනම් කරගනිමින්, නිශ්චිත ඉදිරි දිනයකදී ගෙවීම් හුවමාරු කරගැනීමේ ගිවිසුමයි.

**සමූහ ව්‍යාපාරය**
මව් ව්‍යාපාරය සහ සෙසු සියලු ආධාරක ආයතන සමූහ ව්‍යාපාරය ලෙස ගැනේ.

**මිල අවදානම් සුරක්ෂිතය**
(පොළී අනුපාතිකයන්, මිල, භාණ්ඩ ආදියෙහි) අවාසිදායක ලෙස අගය සංචලනයවීමේ ඉදිරි අවදානම්වලදී ආවරණයවනු පිණිස භාවිතයෙහි යෙදෙන ක්‍රමෝපායයකි.

**කල්පිරීම තෙක් දරනු ලැබෙන ආයෝජන**
වෙළඳාම සඳහා දරා සිටින හෝ අලෙවිය සඳහා තිබෙන ලෙස හැඳින්වීමට මූලික හඳුනාගැනීමේදී තෝරා ගැනෙන හෝ ණය හා ලැබියයුතු යන නිර්වචනයට ඇතුළත් වන මූල්‍ය වත්කම් හැරුණුකොට කල්පිරීමතෙක් බලා සිටීමට සාධනීය අභිප්‍රාය හා හැකියාව ආයතන සතු ස්ථිර හෝ තීරණය කළහැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම්.

**හානිකරණය**
උපකරණයක ධාරණ අගයට වඩා අයකර ගතහැකි මුදල අඩුවීම, හානිකරණය ලෙස ගැනේ.

**හානි ආවරණය**
කිසියම් ගිවිසුමක/කොන්ත්‍රාත්තුවක පාර්ශ්වකරුවකුට සිදුවිය හැකි අලාභයෙන් උද්ගතවන හානිය දරා ගැනීමට, ගිවිසුමේ පාර්ශ්වකරුවෙකු නොවන කෙනෙකුගේ එකඟතාවට අනුමැතිය ලැබීමයි. එසේ එකඟතාව පිරිනැමීමේදී, ගිවිසුමක ද්විතීයික වගකීම දරණ ඇපකරුවකු මෙන් නොව, එම පිරිනැමීම සිදුකරන තැනැත්තා ප්‍රාථමික වගකීමම දැරිය යුතු වෙයි.

**පොළී අනුපාතික අවදානම**
වෙළඳපොල පොළී අනුපාතික වෙනස්වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහ වල සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානම.

**ප්‍රධාන කළමනාකරණ පිරිස**
ආයතනයක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා පාලනය කිරීමේ බලතල මෙන්ම වගකීම දරන කණ්ඩායම මෙසේ හැඳින්වේ.

**ණයවර ලිපිය**
අදාළ නියමයන් හා කොන්දේසිවලින් සමන්විතව, බැංකුවක් විසින් තුන්වන තැනැත්තෙකුට කිසියම් මුදලක් ලබා දෙනලෙස ඉල්ලා සිටිමින්, වෙනත් බැංකුවකට නිකුත් කරන ලියවිල්ලයි.

**ද්‍රවශීලතා අවදානම**
මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් සැපයීම මගින් නිරවුල් කෙරෙන මූල්‍ය වගකීම් හා සබැඳි වගකීම් ඉටු කිරීමේදී ආයතනයක් අසීරුතාවට පත්වීමේ අවදානම

**වෙළඳපොළට ගැලපීම**
ප්‍රවර්තන වෙළෙඳපොළ හෝ සාධාරණ අගය අනුව, පිහිටීම ඉහළ හෝ පහළ යන පරිදි වරින්වර ප්‍රතිඇගයීමේ පිළිවෙතයි.

**වෙළෙඳපොළ අවදානම**
වෙළඳපොළ මිල ගණන්වල වෙනස්වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ අගය හෝ අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනයවීමේ අවදානම සුළු කොටස්හිමියන්ගේ අයිතිය මව් සමාගමකට, ස්වකීය ආධාරක ආයතන මගින් සෘජුව හෝ වක්‍රව අයිතියක් පෑමට අවසරයක් නොමැති හිමිකම් පොලියසේ සැලකෙන, ආධාරක ආයතනික ලාභ හෝ අලාභ සහ ශුද්ධ වත්කම්වල සමානුපාතය මෙයින් හැඳින්වෙයි.

**උකස් කිරීම**
ණයක් ලබාගැනීම පිණිස සුරැකුමක් ලෙස යොදාගනු ලබන නිශ්චල දේපලක් හා අදාළ අයිතිකාර බලයයි. ගනුදෙනු කළහැකි උපකරණය තුන්වැනි පාර්ශ්වයකට (ගනුදෙනුවක් තුළින්) ගැටලුවකින් තොරව විකිණිය හැකි සුරැකුම්පතක් හෝ වෙනත් මූල්‍ය උපකරණයකි. බැංකු නෝට්ටුවක්, නියමිත බැඳුම්කරයක්, විනිමය බිල්පතක් සහ චෙක්පතක් සාමාන්‍යයෙන් ගනුදෙනු කළහැකි උපකරණ ලෙස සැලකේ.

**ශුද්ධ පොළී ආන්තිකය**
මෙයින් අදහස්වනුයේ, සාමාන්‍ය පොළිය උපයන වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ගැනෙන පොළී ආදායමයි.

### අක්‍රිය ණය
නියමිත දිනයේදී මුල් මුදල හෝ පොළිය නොගෙවනු ලබන අවස්ථා සහිත ණය හෝ ණය හා අදාළ වෙනත් නියමිතයන් හෝ කොන්දේසි පිළිපැදීමට ණයගත් තැනැත්තා අසමත්වන්නාවූ අවස්ථා සහිත ණය මේ යටතට ගැනේ. අක්‍රිය ණය නිරන්තරයෙන්ම නිරුපචිත තත්ත්වයෙහිලා සලකනු ලබයි.

### 'නොස්ට්‍රෝ (NOSTRO) ගිණුම
මෙය සාමාන්‍යයෙන් භාවිත කරනුයේ, වෙනත් බැංකුවක් සමග පවත්වා ගන්නා විදේශ ව්‍යවහාර මුදල් සහිත ජංගම ගිණුමක් සඳහාය. එසේ වුවද, එම බැංකුව විදේශ සමරූපී බැංකුවක්වීම අවශ්‍යම නොවේ. අදාළ බැංකුවේ තැන්පතුව 'නොස්ට්‍රෝ' (NOSTRO) ගිණුම ලෙස හැඳින්වේ.

### වාස්තවික සාක්ෂි
විශ්ලේෂණය, මැනීම, නිරීක්ෂණය හා වෙනත් එබඳු පර්යේෂණ ක්‍රම මගින් ඔප්පු කළ හැකි කරුණු මත පදනම්වූ තොරතුරු.

### ශේෂ පත්‍ර බාහිර ගනුදෙනු
ශේෂ පත්‍රය අනුව, වත්කම් හෝ වගකීම් ලෙස හඳුනා නොගත්තද, අවිනිශ්චිතතා හා බැඳීම්වලට තුඩුදෙන ගනුදෙනු මේ යටතට එයි.

### පිහිටීම
නියමිත ව්‍යවහාර මුදලක් හෝ පොළී අනුපාතිකයක් හා අදාළව, ඒකරාශිගත කරන ලද පූර්ණ බැඳීම්, මෙනයින් හැඳින්වේ. පිහිටීමක් ඒකාන්ත හෝ සමසතරැස් (විවරත්වයකින් තොර), නැතහොත් දිගු (එනම්, ව්‍යවහාර මුදල් විකුණුවාට වඩා මිලදී ගන්නාලද, නොහොත් අධි මිලදී ගැනුම්) හෝ කෙටි (එනම්, ව්‍යවහාර මුදල් මිලදී ගත්තාට වඩා විකුණනලද නොහොත් අධි විකුණුම්) විය හැකිය.

### ප්‍රාථමික අනුපාතය
බැංකුවක් විසින් ස්වකීය අතිශය ප්‍රශස්ත මට්ටමේ ණය ලබාගන්නන් සඳහා භාවිත කරන පොළී අනුපාතය මෙයින් අදහස් වෙයි.

### පොරොන්දු පත්‍රය
කෙනෙකු (පළමුවැන්නා) පොරොන්දුකරුවකු වශයෙන්, තවත් කෙනෙකු (දෙවැන්නකු) ඉල්ලීමක් කළ විටක හෝ, නිශ්චිත නැතහොත් නියම කරනු ලබන ඉදිරි දිනයකදී, එම දෙවන තැනැත්තාට, එසේත් නැතහොත් දෙවන තැනැත්තා විසින් තම නියම කරනු ලබන තුන්වන තැනැත්තෙකුට, නිශ්චිත මුදල් ප්‍රමාණයක් ආපසු ගෙවන බවට, අත්සන් සහිතව දෙනුලබන, කොන්දේසි විරහිත, ලිඛිත පොරොන්දුවකි.

### සම්බන්ධිත පාර්ශ්වයන්
මූල්‍ය හෝ මෙහෙයුම් තීරණ ගැනීමේදී, එක් පාර්ශ්වයක් කෙරෙහි පාලනය කිරීමේ හෝ එම පාර්ශ්වය කෙරෙහි ප්‍රමාණවත් බලපෑමක් සිදු කිරීමේ හෝ හැකියාව සහිත තවත් පාර්ශ්වයක් ආදී වශයෙන් සැලකෙන පාර්ශ්වයන්ය.

### 'රෙපෝ' (Repo)
විකිණුම් හා ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම් සඳහා භාවිත කෙරෙන සංකේතාත්මක හැඳින්වීමයි.

### සංචිත වත්කම්
ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලව, මූල්‍ය ආයතනයක් විසින් යොදනු ලබන සංචිතවලින් කොටසක් වන එම ආයතනයේ වත්කම් මෙයින් කියැවේ.

### ප්‍රති විකුණුම් (Reverse Repo)
'රෙපෝ' යන්නෙහි විරුද්ධාර්ථයයි. එනම්, මිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් ගිවිසුමයි.

### චක්‍රීය ණය
ණය ලබාගන්නාගේ රුචිය අනුව, අඛණ්ඩව ණය ලබාගැනීමට හා ආපසු ගෙවීමට අවසරය ලැබෙන නියමයන් සහිත ණය ක්‍රමයකි. මුල් මුදල ආපසු ගෙවීම මගින්, ණය අරමුදල ප්‍රතිසංස්ථාපනය වේ.

### සුරක්ෂිතකරණය
වාහනයක් මිලදී ගැනීමේදී, එහි මූල්‍ය අවශ්‍යතා ණය නිකුතුවක් මගින් පියවා ගැනීම සඳහා, ආදායම් උත්පාදිත වත්කම් ගොන්නක් ඉදිරිපත් කිරීම මෙයින් කියැවේ.

### ඛණ්ඩනීය විශ්ලේෂණය
ආයතනයක් මෙහෙයුම් සිදුකරන විවිධ භූගෝලීය ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින්, ඛණ්ඩ වශයෙන්ගෙන, මූල්‍ය තොරතුරු විශ්ලේෂණය කරනු ලැබීමයි.

### ඛණ්ඩ වාර්තාකරණය
ඛණ්ඩ වාර්තාකරණයෙන් කියැවෙනුයේ, බැංකුකරණය, කල්බදු මෙහෙයුම්, කොටස් තැරැව්කරණය, සුරැකුම් වෙළඳාම, දේපල හා රක්ෂණයවැනි ව්‍යාපාර ඛණ්ඩයන්ගෙන් ආදායමට ලැබෙන දායකත්වය ප්‍රකාශ වීමයි.

### සමථකරණ දාතම
මුදලට සිදුකෙරෙන සැබෑ සුරැකුම් හුවමාරුවක් මගින්, සුරැකුම් ගනුදෙනුවක් සම්පූර්ණ කරනු ලැබීමේ දිනය මෙයින් හැඳින්වේ.

### ඌන ප්‍රවණතාව
වත්කම් (සහ/හෝ ඉදිරි මිලට ගැනුම් ගිවිසුම්) වලට වඩා වගකීම් (සහ/හෝ ඉදිරි විකුණුම් ගිවිසුම්) වල අතිරික්තයයි. ශුද්ධ මිලදී ගැනුම් හා විකිණුම්වලින්, ශුද්ධ විකුණනලද හා වැඩිපුර විකුණන ලද ප්‍රවණතාවක් ඉතිරි වනවිට වෙළෙන්දෙකුගේ තත්ත්වය මෙයින් අනාවරණය වෙයි.

### පරිපාලිත සමාගම්
(මව් සමාගම ලෙස හැඳින්වෙන) එක් ව්‍යවසායක් විසින් පාලනය කරනු ලබන තවත් ව්‍යවසායක් ආධාරක සමාගම ලෙස හැඳින්වේ.

### අවිනිශ්චිත ගිණුම
පැහැදිලි කිරීමක් පොරොත්තුවෙන් හා නිසි ගිණුමට යොමු කරනතුරු අයිතමයන් තාවකාලිකව රඳවා තබාගන්නා ගිණුමයි.

### හවුල්පාදක ණය
බැංකු කිහිපයක් විසින් එකලාව ණයක් සැපයීමට කැමති නොවන හෝ හැකි නොවන කල්හි, එම බැංකු ඒකාබද්ධව, බද්ධ කාර්යයක් වශයෙන් කටයුතු කිරීමට යොදා ගන්නා ණය වැඩ පිළිවෙළයි. හවුල්පාදක ණය ක්‍රමය ක්‍රියාත්මක කෙරෙනුයේ, තනි බැංකුවක් විසින් පමණක් ණය නිකුත් කිරීමේදී, ස්වකීය ණය සමුච්චයට හානි සිදු නොවනු පිණිස හා මහා පරිමාණයේ ණය ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා ඉටු කරනු පිණිසය.

### කාලීන තැන්පතු
නිශ්චිත කාලපරාසයකට පසුව ආපසු ලබාගත හැකි, පොළියක් ගෙවනු ලබන තැන්පතු ගිණුමකි.

### සමස්ත ප්‍රාග්ධනය
1 වන ස්ථරයේ (කේන්ද්‍රිය) ප්‍රාග්ධනයේ හා 2 වන ස්ථරයේ (අතිරේක) ප්‍රාග්ධනයේ එකතුවයි.

### වෙළඳ මූල්‍ය වත්කම් හා බැරකම්
(1) ප්‍රධාන වශයෙන්ම නුදුරු කාලසීමාවකදී විකිණීම හෝ ප්‍රතිමිලදී ගැනීම සඳහා අත්කරගනු ලැබුවක් හෝ සිදුකරනු ලැබුවක්,

(2) එක්ව කළමනාකරණය කෙරෙන හා කෙටිකාලීන ලාභ ඉපැයීමේ තථ්‍ය රටාවක් මෑතකාලීනව පැවතීම සම්බන්ධ සාක්ෂි සහිත හඳුනාගත් මූල්‍ය උපකරණ කළඹක කොටසක්.

(3) ව්‍යුත්පන්නයක් (නිශ්චය කරන ලද හා ඵලදායක මිල අවදානම් සුරක්ෂිත උපකරණයක ව්‍යුත්පන්නයන් හැරුණු කොට) මත මූල්‍ය වත්කමක් හෝ බැරකමක් වෙළඳාම සඳහා දරනු ලැබෙන ලෙස කාණ්ඩගත කෙරේ.

### ගනුදෙනු පිරිවැය
මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය බැරකමක් අත්කරගැනීම, නිකුත්කිරීම හෝ බැහැරකිරීම කෙරෙහි සෘජුවම පැවරිය හැකි වෘද්ධියමය පිරිවැය.

### මහාභාණ්ඩාගාර බැඳුම්කර
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන, දිගු දාතමක් සහිත සුරැකුමකි. එයට ලැබෙනුයේ කූපන පොළී අනුපාතයකි.

### එකතු කළ අගය
බැංකු සේවාවන් සැපයීමේ පිරිවැය, එසේ බැංකු සේවාවන් සැපයීමෙන් ලැබූ සම්පූර්ණ අදායමින් අඩුකළ පසු ඉතිරිවන ශේෂය, එකතුකළ අගය ලෙස ගැනේ. එම එකතුකළ අගය, සේවා නියුක්තිකයන්ට ද, බදු වශයෙන් රජයට ප්‍රාග්ධනය සැපයූවන්ට ද වෙන් කෙරෙන අතර, ව්‍යාප්තිය හා වර්ධනය පිණිස රඳවාගනු ලැබේ.

### අවදානම් පාදක අගය
නිශ්චිත කාලවකවානුවක් තුළ, වෙළෙඳපොළ පොළියේ හෝ විනිමය අනුපාතිකයේ හෝ අහිතකර සංචලනයන් නිසා සිදුවිය හැකි පාඩුව ඇස්තමේන්තු කළහැකි, අවදානම් කළමනාකරණ ක්‍රමවේදයකි.

### 'වොස්ට්‍රෝ' ගිණුම (Vostro)
එක් බැංකුවක් වෙනත් බැංකුවක් සමග පවත්වාගන්නා, දේශීය ව්‍යවහාර මුදල් ජංගම ගිණුමකි (නොස්ට්‍රෝ ගිණුම සමග සංසන්දනය කරන්න)

### ඵලදා වක්‍රය
පරිණතවීමේ කාර්යයන් ලෙස වෙළඳපොළ පොළී අනුපාතිකය විදහා දක්වන ප්‍රස්තාරයකි. සාමාන්‍යයෙන්, ඵලදා වක්‍රය ඉහළට ඇලව තිබෙන්නකි: උපකරණයේ නියමයන් අනුව පොළී අනුපාතිකය ඉහළ යයි.

# ආයතනික තොරතුරු

## බැංකුවේ නම
මහජන බැංකුව

## නෛතික තත්ත්වය
1961 අංක 29 දරන මහජන බැංකු පනතින් වාණිජ බැංකුවක් වශයෙන් සංස්ථාපිත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

## ප්‍රධාන කාර්යාලය (ලියාපදිංචි කාර්යාලය)
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ.
ගාඩිනර් මාවත,
කොළඹ 02, ශ්‍රී ලංකාව
කේබල් JANABANK
දුරකථන : +94 112327841 (රැහැන් 6),
+94 112446316 (රැහැන් 15),
+94 112481481
විද්‍යුත් තැපෑල: info@peoplesbank.lk
වෙබ්: www.peoplesbank.lk
වැට් ලියාපදිංචි අංකය. 409000037-7000

## විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

KPMG,
(වරලත් ගණකාධිකාරීවරු),
32A, ශ්‍රීමත් මොහොමඩ් මාකන්
මාකර් මාවත,
තැ. පෙ. 186,
කොළඹ 0300, ශ්‍රී ලංකාව

## ලේකම්
රොහාන් පතිරගේ මහතා LLB,
බැංකුකරණය පිළිබඳ MMgt., නීතිඥ

## ආයතනික බැංකු අංශය
තැ. පෙ. 437,
සී.ස.එ.ප්‍ර.ස. (ලේක්හවුස් ගොඩනැගිල්ල)
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව
දුරකථන: +94 112320651-6,
+94 112437239-41, +94 112392101-3
විද්‍යුත් තැපෑල: infocbd@peoplesbank.lk
SWIFT PSBKLKLX

## අක්වෙරළ බැංකු ඒකකය
මහජන බැංකුව, 1 වැනි මහල
ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ.
ගාඩිනර් මාවත,
කොළඹ 02, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112206703,
+94 112206704
ෆැක්ස්: +94 112458752/2458821
ටෙලෙක්ස්: 21500 (PBSWTCE )
විද්‍යුත් තැපෑල: fcbu@peoplesbank.lk
SWIFT PSBKLKLX

## විදේශ පාරිභෝගික සේවා
අංක 59, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112332746,
+94 112334278, +94 112446409
ටෙලෙක්ස්: 21486 PBKFMS CE
විද්‍යුත් තැපෑල: fastcash@peoplesbank.lk
nrfc@peoplesbank.lk,
teletran@peoplesbank.lk
SWIFT PSBKLKLX

## මහජන බැංකුවේ පරිපාලිත සමාගම්
සී/ස පීපල්ස් ට්‍රැවල්ස්
අංක 59, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112470190,
+94 112478385, +94 112396296
ෆැක්ස්: 2434530
ඊ-මේල්: ptravel@peoplesbank.lk
වෙබ් : www.peoplestravels.com

## පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
අංක 1161, මරදාන පාර, බොරැල්ල,
කොළඹ 08
දුරකථනය: +94 112631631
ෆැක්ස්: +94 112631000

## මහජන බැංකුවේ උප පරිපාලිත සමාගම්
**(පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී පරිපාලිත සමාගම්)**
පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
අංක 53, ධර්මපාල මාවත, කොළඹ 03.
දුරකථන: +94 112206406
ෆැක්ස්: +94 112206399

**පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්**
අංක 1161, මරදාන පාර, බොරැල්ල,
කොළඹ 08.
දුරකථන : +94 112631631
ෆැක්ස්: +94 112631000

**පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්**
අංක 1161, මරදාන පාර, බොරැල්ල,
කොළඹ 08.
දුරකථනය: +94 112631631
ෆැක්ස්: +94 112631000

**පීපල්ස් මයික්‍රොෆිනෑන්ස් ලිමිටඩ්**
අංක 1161, මරදාන පාර, බොරැල්ල,
කොළඹ 08.
දුරකථනය: +94 112631631
ෆැක්ස්: +94 112631000

**පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්**
අංක 1161, මරදාන, බොරැල්ල, කොළඹ 08.
දුරකථනය: +94 112631631
ෆැක්ස්: +94 112631000

## මහජන බැංකුවේ ආශ්‍රිත සමාගම්
පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
අංක 21, නවම් මාවත,
කොළඹ 02, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 112300191-4
ෆැක්ස්: +94 112300190

★ Produced by **Smart Media** The Annual Report Company © Copyright Reserved

## මෙම වාර්ෂික වාර්තාව කාබන් නිෂ්ක්‍රීය වාර්තාවකි

සහතික ලත් කාබන් නිෂ්ක්‍රීය සංවිධානයක් වන ස්මාර්ට් මීඩියා වාර්ෂික වාර්තා සමාගම විසින් මෙම මහජන බැංකු වාර්ෂික වාර්තාව නිමවා ඇත. තවද, මෙම වාර්ෂික වාර්තාව නිමැවීමේදී කඩදාසි භාවිතය හා මුද්‍රණය ඇතුළුව ස්මාට් මීඩියා විසින් බාහිර සේවා සපයන්නන්ගෙන් ඉටු කරගන්නා ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස මුදාහැරෙන හරිතාගාර වායු විමෝචනය, ස්ථිර කරන ලද මූලාශ්‍ර මගින් හිලවු කරනු ලැබේ.

www.smart.lk

www.carbonfund.org